වාර්ෂික වාර්තාව 2017

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

සුවිශේෂී වෘත්තාන්තයක : සලකුණ

වාර්ෂික වාර්තාව
2017

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

පටුන

සුවිශේෂී වෘත්තාන්තයක: සලකුණ

04

පූර්වකථනය — **06**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ
සුවිශේෂී ඉතිහාසය — **08**

2017 ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ
වාර්ෂික වාර්තාව ගැන — **09**

2017 කථා පුවත

12

වැදගත් තොරතුරු — **14**

අපගේ කථානායකයන් — **19**

සභාපතිතුමාගේ පණිවිඩය — **20**

සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ
සමාලෝචනය — **26**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ
සුවිශේෂී ව්‍යාපාරික ආකෘතිය — **32**

මෙහෙයුම් පරිසරය — **37**

ඇල්මැති පාර්ශවයන් — **46**

ප්‍රමාණාත්මක කරුණු, අවදානම් සහ
අවස්ථාවන් — **52**

අපගේ උපාය මාර්ගයන් — **63**

කළමනාකරණ සාකච්ඡා සහ
විශ්ලේෂණයන් — **72**

මූල්‍ය ප්‍රාග්ධනය — **73**

ප්‍රධාන ව්‍යාපාර මාර්ග සමාලෝචනය — **85**

බුද්ධිමය ප්‍රාග්ධනය — **92**

නිෂ්පාදිත ප්‍රාග්ධනය — **100**

මානව ප්‍රාග්ධනය — **108**

සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය — **124**

ස්වාභාවික ප්‍රාග්ධනය — **142**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු
මත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සලකුණ — **146**

යහපාලනය — **155**

අධ්‍යක්ෂ මණ්ඩලය — **156**

ආයතනික කළමනාකාරිත්වය — **160**

විධායක කළමනාකාරිත්වය — **162**

ප්‍රධාන කළමනාකරුවන් — **163**

ආයතනික යහපාලනය — **165**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව — **190**

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා
පාරිශ්‍රමික කමිටු වාර්තාව — **193**

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව — **195**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ
කමිටු වාර්තාව — **196**

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව — **198**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ හා උපාය මාර්ග
කමිටු වාර්තාව — **200**

අවදානම් කළමනාකරණ වාර්තාව — **201**

මූල්‍ය වාර්තා

239

මූල්‍ය දින දර්ශනය — **240**

අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව — **241**

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය — **248**

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය — **250**

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව — **252**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්) ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය — **253**

විගණකාධිපති වාර්තාව — **255**

විස්තීරණ ආදායම් ප්‍රකාශය — **256**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය — **258**

හිමිකමේ වෙනස්වීම් දක්වන ප්‍රකාශය — **260**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය — **264**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන — **265**

අතිරේක තොරතුරු

371

නිමැවුම් හා සේවාවන් — **372**

විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇමරිකානු ඩොලර් වලින් — **376**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඇමරිකානු ඩොලර් වලින — **378**

2016 අංක 1 දරන බැංකු පනතේ III උපලේඛනය ප්‍රකාර බාසල් III හෙළිදරව්කිරීම් — **379**

අනිකුත් හෙළිදරව් කිරීම් — **392**

සංඛ්‍යාලේඛණාත්මක දර්ශකයන් 2008-2017 — **397**

තැන්පතු විශ්ලේෂණය — **399**

ගෝලීය වාර්කරණ මුලපිරීම් දර්ශකය — **400**

අනුරූප බැංකු — **404**

විදේශ විනිමය හුවමාරු සමාගම් — **405**

මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව — **408**

ආයතනික තොරතුරු — **412**

දැක්ම

අපගේ ඉතිරිකිරීම් සඳහා වඩාත් විශ්වසනීය හා වැඩිම ඉල්ලුමක් පවතින විකල්පය බවට පත්වීම.

මෙහෙවර

ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් සැපයීම හා බැංකුව පිළිබඳව උනන්දු වන සියලුම පාර්ශ්වයන්ගේ අපේක්ෂාවන් මුදුන් පැමිණවීම.

වටිනාකම්

අපි ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේදී දැඩි විශ්වාසය, අන්‍යෝන්‍ය ගරුත්වය, අවංකභාවය සහ නිර්මාණශීලීත්වය කෙරෙහි තීරණාත්මකව ප්‍රතිචාර දක්වන්නෙමු.

වාර්ෂික වාර්තාව 2017

සුවිශේෂී වෘත්තාන්තයක සළකුණ

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

සැකසුම
ස්මාර්ට් මීඩියා වාර්ෂික වාර්තා සමාගම
ISBN 978-955-1619-13-8

සුවිශේෂී වෘත්තාන්තයක:

සටහන්



පූර්වකථනය

මූල්‍ය අන්තර්ග්‍රහණය මූලික අරමුණ කොටගෙන 1972 දී පාර්ලිමේන්තු පනතක් මගින් එවකට පැවති සාම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ඒකාබද්ධ කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කෙරිණ. ඒ සමඟ අපගේ සුවිශේෂී වෘත්තාන්තය දිග හැරෙන අතර සියවසකට වඩා පැරණි ඉතිරිකිරීමේ උරුමයක් අප සතුවේ.

දිවයිනේ විශාලතම බලපත්‍රලාභී විශේෂිත බැංකුව ලෙස අපි පන්තිය, ස්ත්‍රී පුරුෂභාවය හෝ සමාජ තත්වය නොසලකා සියලු ශ්‍රී ලාංකිකයන් අතර ඉතිරිකිරීමේ සංස්කෘතියක් ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදී සිටිමු. අප සතු මිලියන 19.9 ක්වූ ගිණුම් සමුදාය සමාජයේ සියලු ජන කොටස්වල බැංකුව ලෙස අපගේ හිමිකම සනාථ කරයි.

එහි ආරම්භයේ සිටම ජාතික ඉතිරිකිරීමේ බැංකුව ජාතියට සවිය දෙන ශක්තියේ කුළුණක් ලෙස කටයුතු කරයි. මෙරට ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් ලෙස අපගේ දැක්ම, මෙහෙවර, වටිනාකම්, ස්ථාවරත්වය සහ ශක්තිමත් පදනම මෙන්ම මූල්‍ය ස්ථායීතාවය ළඟාකරගැනීම සඳහා ජාතිය සවිබලගැන්වීමෙහිලා අපගේ කැපවීම මෙහි කවරයේ දැක්වෙන කුළුණ මගින් නිරූපණය කෙරේ.

ක්‍රමයෙන් ගොඩනැඟුණු අපගේ ශක්තියේ කුළුණ මේ වන විට සමස්ත ජාතියටම සෙවණ සදයි. එහෙයින් අපගේ 45 වන සංවත්සරය සමරන මේ මොහොතේ අප ශ්‍රී ලංකාව, මූල්‍ය ක්ෂේත්‍රය සහ ඒ සියල්ලටම වඩා වැදගත් වන, අප අපගේ සුවිශේෂී ඉතිහාසය මුළුල්ලේ ස්පර්ශ කළ ජීවිත මත තබන ලද සලකුණ පිළිබඳව නැවත සිතා බැලීමට උත්සුක වෙමු.

අපගේ සුවිශේෂී වෘත්තාන්තය ලියා තිබෙන්නේ ජනතාව විසින් ජනතාව උදෙසාය. එය සිත්හි තබාගෙන අපි "සුවිශේෂී වෘතාන්තයකඃ සලකුණ" ඔබ වෙත පිරිනමමු.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී ඉතිහාසය

1972 පාර්ලිමේන්තු පනතක් මගින් එවකට පැවති සාම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ඒකාබද්ධ කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කෙරිණ

1979 දිනුම් ඇදීමක් සහිත ඉතුරුම් සහතිකපත් හඳුන්වාදීම

1981 ග්‍රාමීය ජන කොටස් වෙත වඩාත් සමීපවීම සඳහා ජංගම බැංකු සේවය හඳුන්වාදීම

1994 පළමු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය හඳුන්වාදෙන ලදී. මුළු වත්කම් රුපියල් බිලියන 50 සීමාව ඉක්මවීම

1995 ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කෙරිණ

1998 හපන් හා පුංචි හපන් ළමා ඉතිරිකිරීමේ ගිණුම් හඳුන්වාදීම


1999 100 වැනි ශාඛාව නිට්ටඹුවේදී විවෘත කිරීම

ඉතුරුමිතුරු ගිණුම හඳුන්වාදීම

2000 ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලන සමාගම වන *NSB* ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම ස්ථාපිත කරන ලදී

2002 ස්ත්‍රී ගිණුම හඳුන්වාදීම

2003 ජාතික ඉතිරිකිරීමේ බැංකුව ත්‍රිත්ව *A* ෆිච් ණය ශ්‍රේණිගත කිරීම හිමිකරගත් ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම



2004 ජාත්‍යන්තර බැංකු කටයුතු ආරම්භ කිරීම

2008 ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම – *24 x 7*

2011 බැංකුවේ 200 වැනි ශාඛාව මැදවච්චියේදී විවෘත කිරීම

2012 ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය 40 වන සංවත්සරය සමරයි

2013 ශ්‍රී ලාංකික බැංකුවක් විසින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 750 ක විශාලතම බැඳුම්කර නිකුතුව

2014 උසස් අධ්‍යාපන කටයුතු සඳහා ලබාදෙන බුද්ධි පුද්ගලික ණය ක්‍රමය හඳුන්වාදීම

2016 සිය 250 වන ශාඛාව කෝපායිහිදී ආරම්භ කිරීම

ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස නම් කරනු ලැබීම

වෙළඳ මූල්‍ය කටයුතු ආරම්භ කිරීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් රුපියල් බිලියන 06 ක වටිනාකමකින් යුත් සිය ප්‍රථම ණයකරය නිකුත් කරන ලදී

2017 රුපියල් ට්‍රිලියනයක වත්කම් පදනමක් හිමිකරගත් මෙරට ප්‍රථම විශේෂිත බැංකුව බවට පත්වීම

GRI 102-1

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව – 2017 ගැන

මේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සිව්වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවයි. එය 2017 ලිත් වර්ෂයට අදාළව සකස් කර තිබේ. අපගේ ආයතනයේ ආර්ථික, සමාජයීය, පාරිසරික හා ආයතනික පාලන ප්‍රතිඵල සම්බන්ධයෙන් අවබෝධයක් සපයන මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරුවලින් මෙම වාර්තාව සමන්විතවේ. මේ වසරේ වාර්ෂික වාර්තාව පසුගිය වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික වාර්තාව වන වාර්ෂික වාර්තාව 2016: සුවිශේෂී වෘතාන්තයක අනුවර්තනයෙහි වාර්තා ශෛලියට සමානතාවක් දක්වයි. මෙම වාර්තාව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාරයට බෙහෙවින් වැදගත් වන පුද්ගලයා හා අන්‍යෝන්‍ය වශයෙන් පරායත්ත වන සාධක අතර වන සබඳතාවය පැහැදිලිව හා සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි.

"සුවිශේෂී වෘතාන්තයක: සලකුණ" කියවන්නේ කෙසේද

"සුවිශේෂී වෘතාන්තයක: සලකුණ" කතන්දරයක් ලෙස ගලා යයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1972 දී ආරම්භ කිරීමේ සිට එහි සුවිශේෂී වෘතාන්තය ඒ ඔස්සේ දිග හැරේ. "පූර්විකාව" ලෙස නම් කර තිබෙන මෙම වාර්තාවේ පළමු කොටස මගින් වාර්තාව පිළිබඳව හැඳින්වීමක් ඉදිරිපත් කර තිබේ. එහි දෙවන කොටස "2017 කතා පුවත" නමින් නම් කර ඇති අතර සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ කාර්යසාධනය, බැංකුව විසින් සිය ප්‍රධාන පරමාර්ථ සාක්ෂාත් කරගන්නා ලද්දේ කෙසේද, අනාගත අභියෝග ජයගැනීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සූදානම් වන ආකාරය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමස්ත ජාතිය හා ජනතාව තුළ කුමන ආකාරයේ හැඟීමක් ජනිත කළේද යන්න සම්බන්ධයෙන් තොරතුරු එමගින් ලබාදෙයි. ඉන්පසුව ඔබට හමුවන්නේ "ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී ව්‍යාපාරික ආකෘතිය" යන මැයෙන්වූ පරිච්ඡේදයයි. ඒ ඔස්සේ බැංකුවේ භූමිකාව සහ වටිනාකම් නිර්මාණය සඳහා බැංකුවේ සම්පත් භාවිතය පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම හා අදාළ ක්‍රියාවලිය, ප්‍රමාණවත්භාවය සහ උපායමාර්ගික දිශානතිය කෙරෙහිද එම පරිච්ඡේදයෙන් අවධානය යොමු කර තිබේ. "යහපාලනය" මැයෙන් දිග හැරෙන පරිච්ඡේදය බැංකුවේ ආයතනික පාලනය පිළිබඳව තොරතුරු සපයන අතර ඊට පසුව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාව මුද්‍රිත හා පීඩීඑෆ් (PDF) මාධ්‍යයෙන් ඉදිරිපත් කර තිබේ. එය www.nsb.lk යන අපගේ වෙබ් අඩවියේ පළ කර ඇත.

තිරසාරභාවය

තිරසාරභාවය නමැති මූලධර්මය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගවල ඇතුළත් කර තිබෙන අතර එය සමාජයට වටිනාකම් නිර්මාණය කිරීමේ සහ ප්‍රාග්ධන උත්පාදන ක්‍රියාවලියේ පදනම සකස් කරයි. බැංකුව තමන් විසින් ජනිත කරනු ලබන සමාජ, ආර්ථික සහ පාරිසරික සලකුණ ඇගයීමට ලක් කරන අතර ඊට අදාළව බැංකුව ක්‍රියාත්මක වන සමාජය සහ පරිසරය කෙරෙහි එමගින් ඇති කෙරෙන සෘණාත්මක බලපෑමක් වේ නම් එය වළකාලීම සඳහා පියවර ගනී. එබැවින් තිරසාරභාවය මූල්‍ය වාර්තාකරණය සමඟ අසීමිතව බද්ධ කරගන්නා ලද අතර ඒ සම්බන්ධයෙන් වෙනම සමාලෝචනයක් මෙම වාර්ෂික වාර්තාවේ දක්වා නොමැත.

GRI 102-10, 45, 46

වාර්තාවෙන් ආවරණය වන තේමා සහ එහි අන්තර්ගත කරුණු

පිළිවෙළින් "බැංකුව" සහ "සමූහය" යනුවෙන් නිසි පරිදි සඳහන් කර තිබෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ පූර්ණ අයිතිය බැංකුව සතු වන එහි පරිපාලිත සමාගම වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම මෙම වාර්තාවෙන් ආවරණය වේ. 2014 වාර්ෂික වාර්තාවේ ව්‍යුවහයට අනුකූලව බැංකුවේ හා සමූහයේ ප්‍රධාන මූල්‍ය සාධක පිළිබඳව සාකච්ඡා කර තිබෙන අතර නිශ්චිතව සඳහන් කර නොමැති නම් මූල්‍ය නොවන සාධක සාකච්ඡාවට ලක් කර තිබෙන්නේ බැංකුව සම්බන්ධයෙනි.

මෙම වාර්තාව ඔස්සේ බැංකුවේ වැදගත් කටයුතු කෙරෙහි අවධානය යොමු කර තිබේ. එය, කෙටි කාලයේදී, මධ්‍ය කාලයේදී හා දිගු කාලයේදී ගනුදෙනුකරුවන් උදෙසා වටිනාකම් නිර්මාණය කිරීමට බැංකුව සතු හැකියාව කෙරෙහි මෙම සාධක කෙතරම් දුරකට බලපවත්නේද යන්න මත පදනම්වූ තක්සේරුවකි. මෙම වාර්තාවේ 52 පිටුවෙන් ආරම්භ වන ප්‍රමාණාත්මක කරුණු, අවදානම සහ අවස්ථාවන් නිර්මාණය කිරීම යන පරිච්ඡේදය යටතේ ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කර තිබේ.

GRI 102-12, 48, 49, 50, 51, 52, 54

අනුකූලතාවය

අප බැංකුවේ 2017 වාර්ෂික වාර්තාව 2017 ජනවාරි 1 වන දින සිට දෙසැම්බර් 31 දක්වා වන මාස 12 ක කාලපරිච්ඡේදය ආවරණය කරන අතර මූල්‍ය කටයුතු හා තිරසාරභාවය පිළිබඳව වාර්තාකිරීමේදී අපි අපගේ සාමාන්‍ය වාර්ෂික වාර්තාකරණ ශෛලිය අනුගමනය කළෙමු. බැංකුවේ පෙර වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේදී අපි ගෝලීය වාර්තාකරණය පිළිබඳ මුලපිරීම්හි Global Reporting Initiative (GRI) මාර්ගෝපදේශ අනුගමනය කළෙමු. තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය සඳහා අප මෑතකාලීනව ප්‍රකාශයට පත් කරන ලද ගෝලීය වාර්තාකරණ මුලපිරීම්හි ප්‍රමිතීන් අනුගමනය කළෙමු. ඒ අනුව මෙම වාර්තාව සකස් කර තිබෙන්නේ ගෝලීය වාර්තාකරණ මුලපිරීම්: ප්‍රධාන විකල්ප (Global Reporting Initiative: Core Options) වලට අනුකූලවය. බැංකුවේ සමස්ත ව්‍යාපාරික මෙහෙයුම්හි එන්ද්‍රීය කොටසක් ලෙස එය බැංකුවේ පවතින බාහිර හා අභ්‍යන්තර පාලන හා සහතික කිරීමේ පද්ධති වලට යටත්ව සිදු කර ඇත.

පෙර වර්ෂ වල වාර්ෂික වාර්තා හා සසඳන කළ මෙම වාර්ෂික වාර්තාවෙන් ආවරණය කර ඇති කරුණු හා අංශ සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්කම් දක්නට නොමැත. බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2017 මාර්තු 28 දිනැති නවතම වාර්ෂික වාර්තාවෙන් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මාස 12 ක කාලපරිච්ඡේදය ආවරණය කෙරිණ. නැවත වර්ගීකරණය කරන ලද හෝ සඳහන් කරන ලද සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු අදාළ පරිච්ඡේද වලින් අනාවරණය කිරීම හා විස්තර කිරීම සිදු කර ඇත.

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියාමනයන් හා මාර්ගෝපදේශ සහ දේශීය ආදායම් බදු

දෙපාර්තමේන්තුවේ රෙගුලාසි හා නියමයන් බැංකුවේ ක්‍රියාකාරකම් නියාමනය කරන මූලික ව්‍යවස්ථා වේ. පෙර පරිද්දෙන්ම මෙම වාර්තාවේ අන්තර්ගත මූල්‍ය තොරතුරු, අදාළ නීති, රෙගුලාසි හා ප්‍රමිතීන් සමඟ අනුකූල වන අතර 239 පිටුවෙන් ඇරඹෙන මූල්‍ය වාර්තා පිළිබඳ පරිච්ඡේදයේ දැක්වෙන වාර්තා හා ප්‍රකාශන කිහිපයක් ඔස්සේ ඒ බව ප්‍රකාශ කර තිබේ. මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන මූලාශ්‍රයන් මගින් සපයා ඇති සංකල්ප, මූලධර්ම හා මාර්ගෝපදේශ අවශ්‍ය හා සුදුසු පරිදි උපයෝගී කරගන්නා ලදී.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් [Sri Lanka Accounting Standards issued by The Institutie of Charthered Accountants of Sri Lanka (CA Sri Lanka)]
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතන පාලනය පිළිබඳ යහභාවිත සංග්‍රහය (Code of Best Practices on Corporate Governance issued by the CA Sri Lanka)
- ගෝලීය වාර්තාකරණ මුලපිරීම් තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණ මාර්ගෝපදේශ ගෝලීය වාර්තාකරණ මුලපිරීම් ප්‍රමිතීන් (Global Reporting Initiative (GRI) Sustainability Reporting Guidelines GRI Standards)

  [www.globalreporting.org]
- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුව The International Integrated Reporting Council (IIRC) Framework

  [www.theiirc.org]
- ස්මාර්ට් ඒකාබද්ධ වාර්තාකරණ ක්‍රමවේදය Smart Integrated Reporting Methodology

  [www.smart.lk]

බාහිර පාර්ශ්වයන්ගේ සහතිකය

මෙම වාර්තාව සකස් කිරීමේදී බැංකුව සියලු නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ අනුකූලවී තිබේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රජයේ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර, තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණයට අදාළ නිරවද්‍යතාවය පිළිබඳ සහතිකය KPMG Sri Lanka ආයතනය වෙතින් ලැබී තිබේ.

GRI 102-53

විමසීම්

මෙම වාර්තාව සම්බන්ධයෙන් ඔබේ අදහස් හා යෝජනා අප අගය කරන අතර ඒවා මුදල් හා සැලසුම් අංශය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 255, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට යොමු කළ හැකිය.
(විද්‍යුත් ලිපිනය: nsbgen@nsb.lk)

2017 කතා පුවත

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සියලු ක්ෂේත්‍රයන්හි සලකුණක් තැබීමට සමත්වූ ඓතිහාසික ජයග්‍රහණ රැසකින් 2017 කතා පුවත සමන්විත වේ. රුපියල් ට්‍රිලියනයක වත්කම් පදනමක්, බැංකු ඉතිහාසය තුළ එදා මෙදාතුර අත්කරගත් රුපියල් බිලියන 14 ක ඉහළම බදු පෙර ලාභය සහ රුපියල් බිලියන 9 ක ඉහළම බදු පසු ලාභය වාර්තා කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව අභිමානයෙන් යුතුව සිය 45 වන සංවත්සරය සැමරීය. එසේම 2017 වර්ෂයෙදී සිය අක්‍රිය ණය අනුපාතය 1.3% ක් දක්වා අඩු කරගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත්වූ අතර එය බැංකු ක්ෂේත්‍රයේ පැවති අඩුම අගයන් අතර විය.

බැංකුවේ සභාපතිතුමා සිය පණිවිඩය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් වාර්තා කරන ලද විශිෂ්ට කාර්යසාධනය පිළිබඳව සිය ප්‍රීතිය ප්‍රකාශ කරන අතරතුර "බාධාකාරී" තාක්ෂණික ප්‍රවණතා විසින් සමස්ත ක්ෂේත්‍රය කෙරෙහි ඇතිකරන බලපෑම් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමටද උත්සුක වී ඇත. එසේම ක්ෂේත්‍රය ඩිජිටල්කරණය වීම ඔස්සේ නිර්මාණය වන මූල්‍ය පාරිසරික පද්ධතිය පිළිබඳව නිරතුරුව අවධියෙන් සිටීමේ වැදගත්කමද එතුමා විසින් සිය පණිවිඩයෙන් අවධාරණය කරනු ලබයි. එමෙන්ම, බැංකුව ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව හා ස්ථාවරව රැඳී සිටීමට නම් සෑම ගනුදෙනුකරුවෙකුගේම අවශ්‍යතා හා අපේක්ෂාවලට ගැළපෙන ආකාරයේ වඩා හොඳ සහ නව මූල්‍ය නිමැවුම් සහ සේවා සිය පාර්ශ්වකරුවන් වෙත ලබාදිය යුතු බවද සභාපතිතුමා අවධාරණය කරයි.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීතුමා සිය සමාලෝචනය මගින් පැහැදිලි කරනු ලබන්නේ බැංකුව විසින් ළඟා කරගන්නා ලද මෙම ජයග්‍රහණ බැංකුව විසින් අනුගමනය කරන ලද විචක්ෂණශීලී හා ප්‍රායෝගික උපායමාර්ගික දිශානතියේ ශක්තිමත්භාවය සනාථ කරන සාක්ෂි වන බවත් රාජ්‍ය බදු සහ මූල්‍ය ප්‍රතිපත්තිවල සිදුවූ සංශෝධන මධ්‍යයේ බෙහෙවින් තරඟකාරී වාතාවරණයක් තුළ සිය ව්‍යාපාර කටයුතු මෙහෙයවීමෙන් බැංකුව විසින් එම ජයග්‍රහණ යථාර්ථයක් බවට පත් කරගන්නා ලද බවත්ය. ෆිච් රේටින්ගස් ලංකා ආයතනය වෙතින් "AAA (lka)" ණය ශ්‍රේණිගත කිරීම අඛණ්ඩව 15 වන වරටත් හිමි කරගත් මෙරට එකම බැංකුව බවට පත්වීමට 2017 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය. එමෙන්ම බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ආයතනය මගින් ශ්‍රී ලංකාවේ පස්වන වටිනාම සන්නම් නාමය ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව වර්ගීකරණය කරන ලදී.

වසර තුළදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘතාන්තය දිග හැරුණේ කෙසේද යන්න 2017 කතා පුවත මගින් පැහැදිලි කෙරේ. බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම්හි ස්වභාවය සහ එමගින් ආවරණය වන ක්ෂේත්‍ර, උපායමාර්ගික දිශානතිය සහ එහි වර්ධනයේ සහ පරිණාමයේ ප්‍රධාන අවස්ථා ඒ අතර කැපී පෙනේ. එසේම වර්ෂයට අදාළ බැංකුවේ කැපී පෙනෙන මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු, විනිවිදභාවයකින් යුත් මූල්‍ය තොරතුරු සහ බැංකුවේ පාර්ශ්වකරුවන් සම්බන්ධ අනෙකුත් සියලු වැදගත් තොරතුරුද මෙහි ඇතුළත්වේ. ඉදිරි අභියෝග ජයගැනීම සඳහා බැංකුවේ සූදානම පිළිබඳවද එහි සාකච්ඡා කර තිබෙන අතර බැංකුවේ අනාගතය දෙසද ඉන් අවධානය යොමු කර තිබේ.

මේ "සුවිශේෂී වෘතාන්තයක: සලකුණ" හි 2017 කතා පුවතයි.

වැදගත් කොරතුරු

GRI102-7

වැදගත් මූල්‍ය තොරතුරු

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2017	2016	වෙනස %	**2017**	2016	වෙනස %
වර්ෂයේ ප්‍රතිඵලය (රුපියල් මිලියන)						
දළ ආදායම	**107,817**	87,399	23.36	**108,056**	88,039	22.74
මූල්‍ය වැටි සහ බදු පෙර ලාභය	**17,522**	16,094	8.87	**17,236**	16,209	6.34
බදු පෙර ලාභය	**14,029**	13,303	5.46	**13,645**	13,397	1.85
ආදායම් බදු වියදම්	**4,419**	3,805	16.14	**4,595**	3,835	19.82
බදු පසු ලාභය	**9,610**	9,498	1.18	**9,050**	9,562	(5.36)
වසර අවසානය වන විට මූල්‍ය තත්ත්වය						
කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු සාමාන්‍ය කොටස්)	**40,222**	32,246	24.73	**41,266**	33,787	22.14
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	**737,213**	657,280	12.16	**737,213**	657,280	12.16
මූල්‍ය ආයෝජන – කල්පිරීම සඳහා රඳවාගත්	**544,273**	505,824	7.60	**547,924**	507,625	7.94
දළ ණය සහ ලැබිය යුතු දෑ	**390,323**	325,543	19.90	**389,036**	324,744	19.80
මුළු වත්කම්	**1,012,103**	911,704	11.01	**1,018,795**	921,603	10.55
සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)						
ඉපැයුම් (මූලික)	**15.50**	29.68	(47.78)	**14.60**	29.88	(51.14)
ඉපැයුම් (diluted)	**15.50**	29.68	(47.78)	**14.60**	29.88	(51.14)
ශුද්ධ වත්කම් අගය	**60.03**	52.01	15.43	**61.59**	54.49	13.02
අනුපාතික						
ශුද්ධ පොළී ආන්තිකය	**2.59**	2.89	(10.38)	**2.60**	2.89	(10.38)
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම	**26.52**	29.37	(9.70)	**24.12**	28.21	(14.51)
සාමාන්‍ය කොටස් මත ආදායම	**1.46**	1.51	(3.42)	**1.41**	1.51	(6.67)
ඉපැයීම් වල වර්ෂ අනුරූප වර්ධනය	**1.18**	9.52	(87.64)	**(5.36)**	8.27	(164.79)
ව්‍යවස්ථාපිත අනුපාතික						
ද්‍රවශීල වත්කම් (%) – අවම අවශ්‍යතාව 20%	**73.44**	72.56	1.21	**N/A**	N/A	–
ද්‍රවශීල ආවරණ අනුපාතිකය (%) – අවම අවශ්‍යතාව 80% 2017 (70% – 2016)	**376.18**	393.96	(4.51)	**N/A**	N/A	–
ප්‍රාග්ධන අවශ්‍යතා – බාසල් III						
බාසල් III – ස්ථර – 1 – අවම අවශ්‍යතාව 7.75%	**11.93**	11.31	5.48	**12.65**	12.03	5.15
බාසල් III – මුළු ප්‍රාග්ධන – අවම අවශ්‍යතාව 11.75%	**15.31**	13.86	10.46	**16.00**	14.54	10.04

මූල්‍ය ඉලක්ක සහ ජයග්‍රහණ – බැංකුව

මූල්‍ය දර්ශකය	ඉලක්ක 2017	ජයග්‍රහණය **2017**	2016	2015	2014	2013
ශුද්ධ පොළී ආන්තිකය (%)	2.66	**2.59**	2.89	3.32	2.98	1.74
සාමාන්‍ය කොටස් මත ආදායම	1.35	**1.46**	1.51	1.51	1.46	0.39
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම (%)	27.67	**26.52**	29.37	29.37	30.20	5.15
ආදායමේ වර්ධනය	23.72	**23.36**	10.24	10.24	18.78	23.95
වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය)	11.06	**1.18**	9.52	9.52	479.98	(68.54)
සමස්ත වත්කම් වල වර්ධනය (%)	11.23	**11.01**	7.50	7.50	19.12	28.61
ප්‍රාග්ධන අවශ්‍යතා – බාසල් III						
බාසල් III – ස්ථර – 1- අවම අවශ්‍යතාව 7.75%	7.75% ට වැඩි	**11.93**	11.31	N/A	N/A	N/A
බාසල් III – මුළු ප්‍රාග්ධන - අවම අවශ්‍යතාව 11.75%	11.75% ට වැඩි	**15.31**	13.86	N/A	N/A	N/A

GRI102-7

මූල්‍ය නොවන වැදගත් තොරතුරු



මූල්‍ය ප්‍රාග්ධනය

රුපියල් මිලියන 107,817
උත්පාදිත සෘජු ආර්ථික වටිනාකම

රුපියල් මිලියන 4,623
ව්‍යාපාරික සහකරුවන්

රුපියල් මිලියන 78,445
තැන්පත්කරුවන්

රුපියල් මිලියන 6,887
සේවා නියුක්තිකයන්

රුපියල් මිලියන 13,442
රජය

රුපියල් මිලියන 20.0
ජනතාව

රුපියල් මිලියන 4,400
රඳවාගත් සෘජු ආර්ථික වටිනාකම

රුපියල් මිලියන 103,417
බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම



බුද්ධිමය ප්‍රාග්ධනය

ඇමරිකන් ඩොලර් මිලියන 168
සන්නම් වටිනාකම

5 වන වටිනාම
සන්නම් නාමය
(බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් වර්ගීකරණය)

රුපියල් මිලියන 319
පරිගණක මෘදුකාංග සඳහා ආයෝජනය

S & P වෙතින් B + Stable
ෆිච් රේටින්ග්ස් වෙතින් B + Stable
ගෝලීය ශ්‍රේණිගත කිරීම්

ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් වෙතින් AAA (lka)
ජාතික ශ්‍රේණිගත කිරීම



නිෂ්පාදිත ප්‍රාග්ධනය

ශාඛා 253	ප්‍රාදේශීය කාර්යාල 9
තැපැල් කාර්යාල 4,062	Lanka Pay ඔස්සේ ATM 4,000
හුවමාරු මධ්‍යස්ථාන 33	සම්බන්ධිත බැංකු 14 ජාත්‍යන්තර සබඳතා



මානව ප්‍රාග්ධනය

4,470
සමස්ත කාර්ය මණ්ඩලය

216 සමස්ත බඳවාගැනීම්	**6:5** ස්ත්‍රී/පුරුෂ අනුපාතිකය (සියළු ස්ථර වල)
රුපියල් මිලියන 34.4 පුහුණු කිරීම් සඳහා සමස්ත ආයෝජන	**96.7%** රඳවාගැනීමේ අනුපාතිකය



සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය

මිලියන 19.9
සමස්ත ගිණුම් සංඛ්‍යාව

රුපියල් මිලියන 78,445 ගනුදෙනුකරුවන්ට ගෙවන ලද පොළිය	**රුපියල් මිලියන 20** ආයතනික සමාජ සත්කාරක වැඩසටහන්වල සමස්ත ආයෝජනය
225,950 දුරකතනය ඔස්සේ සිදු කරන ලද විමසීම්	**147** සැපයුම්කරුවන්



ස්වාභාවික ප්‍රාග්ධනය

රු. මිලියන 1.7
NSB වන වගා ව්‍යාපෘතිය සඳහා අයෝජන

25,000 NSB හි වන වගා ව්‍යාපෘතිය ඔස්සේ බෙදාහරින ලද පැළ සංඛ්‍යාව	**902** නිකුත් කරන ලද පාරිසරික ණය සංඛ්‍යාව
රුපියල් මිලියන 686 පාරිසරික ණය ඔස්සේ ලබාදී තිබෙන මුළු මුදල	**මිලියන 3.5** 2016 වසරට සාපේක්ෂව ඉතිරි කරන ලද කඩදාසි ප්‍රමාණය

ගිගාජූල් 27,614
බලශක්ති පරිභෝජනය

අපගේ කතා නායකයන්



GRI102-14

සභාපතිතුමාගේ පණිවිඩය

පසුගිය වසර 45 මුළුල්ලේ ලියැවුණු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘතාන්තයේ තවත් ආකර්ශණීය පරිච්ඡේදයක් ලෙස 2017 වර්ෂය හඳුන්වාදිය හැකිය. අපගේ 2017 කතා පුවත සියලුම ක්ෂේත්‍රයන්ට දැනෙන ආකාරයේ විශිෂ්ට ජයග්‍රහණ රැසකින් සමන්විත වන අතර, අපගේ වත්කම් පදනම රුපියල් ට්‍රිලියනය පසුකිරීම, එවන් අගයක් සටහන් කිරීමට සමත්වූ දිවයිනේ ප්‍රථම විශේෂිත බැංකුව බවට පත්වීම සහ රුපියල් බිලියන 9.6 ක ඉහළම බදු පසු ලාභය වාර්තා කිරීම ඒ අතර කැපී පෙනේ. 1972න් ඇරඹි අපගේ සුවිශේෂී වෘතාන්තයේ තවත් අනභිබවනීය පරිච්ඡේදයකට මුල පුරන මෙම පැසසුම් සහගත ප්‍රතිඵල ගෝලීය යහපරිචයන් පවත්වාගැනීම කෙරෙහි වන අපගේ කැපවීම සහ ආදර්ශමත් පාලනය මනාව ප්‍රදර්ශනය කරයි. ඉදිරි වසර තුන තුළ අපගේ ව්‍යාපාර කටයුතු වල ගමන්මග සනිටුහන් කරන 2017–2019 ත්‍රෛවාර්ෂික ව්‍යාපාර සැලැස්ම සමගින් සවිමත්වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අනාගතයට මුහුණ දීමට සූදානමින් සිටී.

ජාතිය මත සලකුණක් තබමින් ...

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘතාන්තය අපගේ මිලියන 20 ක ගිණුම් හිමි පාඨකයන්ගෙන් ඔබ්බට ගොස් සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවිත ස්පර්ශ කරයි. රජයට අයත් බැංකුවක් ලෙස අප ජාතික ආර්ථිකය තුළ ගැඹුරින් මුල් බැසගෙන සිටින අතර අපටම සුවිශේෂීවූ ආකාරයකට අපි ජාතිය වෙනුවෙන් අපගේ සේවය ලබා දෙන්නෙමු. 2017 දී පමණක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව බදු, අයබදු හා ලාභාංශ වශයෙන් රුපියල් බිලියන 13.4 ක් රජය වෙත ලබාදී තිබේ. ආර්ථික හා සමාජයීය ව්‍යාපෘති ඔස්සේ වටිනාකම් නිර්මාණය කිරීම සඳහා රජය විසින් එම අරමුදල් සංචලනය කරන ලදී. ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ අපගේ ගනුදෙනුකරුවන් ජාතිය ගොඩනැගීමෙහිලා දායක වන අතරම, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහ තිරසාරභාවය පවත්වාගැනීමට උපකාරී වේ.

"බාධාකාරී" වාතාවරණයක් තුළ අදාළ බව රැකගනිමින් ...

අපි 2017 වර්ෂයේදී අප ලැබූ ජයග්‍රහණ සමරන මේ මොහොතේ "ස්ථිරසාර" සහ "බාධාකාරී" තාක්ෂණික ප්‍රවනතා ඔස්සේ සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකය පිළිබඳවද මනා අවධානයකින් සිටිමු. රජයට අයත් විශේෂිත බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්ෂේත්‍රය තුළ නිරතුරුව අවධානයට පාත්‍ර වන ඒකකයක් ලෙස අඛණ්ඩව රැඳී සිටීම අත්‍යවශ්‍යය. ක්ෂේත්‍රය ඩිජිටල්කරණය වීම ඔස්සේ නව මූල්‍ය පරිසර පද්ධතියක් නිර්මාණය වෙමින් පවතී. අප හඳුනාගන්නා පරිදි වෙළඳපළ තුළ අඛණ්ඩ අවධානය දිනාගැනීම සඳහා සෑම ගනුදෙනුකරුවෙකුගේම අවශ්‍යතා සහ බලාපොරොත්තු වලට ගැළපෙන ආකාරයේ නව්‍ය සහ වඩා හොඳ මූල්‍ය නිමැවුම් හඳුන්වාදීම මගින් අප අපගේ පාර්ශවකරුවන් සමඟ භෞතිකව හා තත්කාලීනව සම්බන්ධ විය යුතුය.

NSB iSaver

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී හා නිර්මාණශීලී නිමැවුම වන iSaver, මේ නව මූල්‍ය පරිසරය තුළ පවත්නා කාර්යක්ෂම, අවම පිරිවැයක් සහිත නව වෙළඳපළ අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් අනුගමනය කරනු ලබන උපායමාර්ගය පිළිබිඹු කරන ප්‍රමුඛ නිදසුනක් ලෙස සඳහන් කළ හැකිය. එසේම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධානතම ඩිජිටල් නිමැවුම වන iSaver ශ්‍රී ලාංකිකයන් අතර ඉතිරිකිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමේ අපගේ අභිලාෂය මල්ඵලගන්වයි. ඒ යටතේ මුදල් ඉතිරිකිරීම සඳහා වඩා පහසු, ප්‍රවේශ විය හැකි හා නවෝත්පාදක ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව SLT මොබිටෙල් ආයතනය සමඟ අත්වැල් බැඳගැනීමට කටයුතු කළේය. NSB iSaver, රටපුරා විසිරී තිබෙන 16,000 කට අධික mCash නියෝජිතයන් මගින් ඕනෑම වෙලාවක, ඕනෑම ස්ථානයක සිට මුදල් ඉතිරිකිරීමට අපගේ ගනුදෙනුකරුවන් දිරිගන්වයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආදර්ශ ශාඛාව

NSB Connect යන සන්නම් නාමය සහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආදර්ශ ශාඛා ව්‍යාපෘතිය අතිශය තරඟකාරී නූතන මූල්‍ය පරිසර පද්ධතිය තුළ නිරන්තරයෙන් අවධානයට ලක් වන හා අත්‍යවශ්‍ය වන සාධකයක් ලෙස රැඳී සිටීම සහ බැංකුව පිළිබඳ ධනාත්මක සළකුණක් ජනිත කිරීම උදෙසා වන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගික ක්‍රියාවලිය සනාථ කරන තවත් උදාහරණයකි. ඩිජිටල් බැංකුකරණ සේවා සඳහා වෙන්වූ "ස්මාර්ට්" කලාපයක් (Smart Zone) සහිතව අපගේ ආදර්ශ ශාඛා සංකල්පය 2017 දී බොරලැස්ගමුව ශාඛාවේදී ක්‍රියාත්මක කෙරිණ. 2018 වසර තුළදී මෙම සංකල්පය ශාඛා 50 කදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

තරඟ පිටිය

ස්වාභාවික විපත්වල බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වර්ෂයේදී අපේක්ෂිත වර්ධන මට්ටමට වඩා පහළ ආර්ථික වර්ධන වේගයක් වාර්තා කළේය. එය 3.1% කි. උද්ධමනය හේතුවෙන් ජනතාව වෙත එල්ලවන පීඩනය අවම කිරීම සඳහා 2017 වසරේ පළමු කාර්තුව තුළ මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම මධ්‍යයේ වුවද, පුද්ගලික පරිභෝජනය සහ ආයෝජනය ඉහළ මට්ටමක පවත්වාගැනීමට උපකාර වෙමින් ණය වර්ධනය ශක්තිමත්ව පැවතිණ. ශ්‍රී ලංකාව, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මෙහෙයවන වැඩසටහන් විසින් යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඔස්සේ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට සහ මධ්‍ය කාලීන වර්ධනයක් ළඟා කරගැනීමට අපේක්ෂා කරයි. දළ දේශීය නිෂ්පාදිතයට 5.7% ක දායකත්වයක් ලබාදෙන ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය මෙරට මූල්‍ය අතරමැදිකරණය, මූල්‍ය අන්තර්ග්‍රහණය සහ ආර්ථික වර්ධනය උදෙසා පහසුකම් සැලසීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. සමස්තයක් ලෙස බැංකු ක්ෂේත්‍රය ලාභදායීතාවය හා තැන්පතු පදනම සම්බන්ධයෙන් වර්ධනයක් අත්කරගත් අතර, සතුටුදායක ද්‍රවශීල වත්කම් අනුපාතිකයක් පවත්වාගැනීමට සමත්විය.

2019 ජනවාරි මාසයේ සිට බාසල් III කාර්යරාමුව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත. මෙය අවධානම් වලට මුහුණදීම සඳහා බැංකුව සතු හැකියාව ශක්තිමත් කරනු ඇති අතර, ක්ෂේත්‍රය තුළ ඒකාබද්ධකරණය (consolidation) ක්‍රියාත්මක කිරීමට මග පාදනු ඇත. එසේම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් යෝජනා කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 (SLFRS 9) 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම බැංකුවල හානිකරණ සඳහා වෙන්කිරීම් ඉහළ නැංවීමට හේතුවනු ඇත.

අවධානම් කළමනාකරණය හා අනුකූලතාවය පිළිබඳ සංස්කෘතියක් ප්‍රචලිත කිරීමට ආධාර වන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉහළ ආයතනික පාලන ප්‍රමිතීන් ක්ෂේත්‍රයේ වර්ධනය වන අවධානම් කළමනාකරණ කාර්ය රාමු පිළිබඳව අවබෝධ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බැංකුවට අවස්ථාව ලබාදී තිබේ. බාසල් III කාර්යරාමුව නිර්දේශිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සූදානමක් ලෙස ප්‍රධාන වශයෙන් බාසල් III ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ද්‍රවශීල අවශ්‍යතා සමඟ අඛණ්ඩව අනුකූලවීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කටයුතු කරයි.

අපගේ මූල්‍ය සලකුණ

ඉහතින් සඳහන් කරන ලද පරිදි 2017 වසර තුළදී අප විසින් පසුකරන ලද පැසසුම් සහගත මූල්‍ය සන්ධිස්ථාන කිහිපයක සංයෝජනයෙන් අපගේ මූල්‍ය සලකුණ නිර්මාණයවී තිබේ. 2017 වර්ෂය තුළදී 1.3% ක අක්‍රීය ණය අනුපාතිකයක් වාර්තා කිරීමට සමත්වූ අතර, එය බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍යයට පහළ මට්ටමේ පවතින අඩුම අගයකි. ඉන් පිළිබිඹු වන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශිෂ්ට වත්කම් ගුණාත්මකභාවයයි. පොළී වියදමේ සිදුවූ සැලකිය යුතු වර්ධනයේ හා එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොළී ආන්තිකයේ සිදුවූ පහළයාමෙහි බලපෑම ව්‍යාපාර පරිමාවේ ඇතිවූ සැලකිය යුතු වර්ධනය මගින් අවම කෙරිණ. ඒ අනුව, පොළී ආදායම රුපියල් බිලියන 100 ඉක්මවීය. තවත් කැපී පෙනෙන මූල්‍ය ජයග්‍රහණයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතිකය 15.3% ක් දක්වා ඉහළ ගිය අතර, එය රාජ්‍ය බැංකු ක්ෂේත්‍රයේ පැවති ඉහළම අගයන් අතර විය.

ඉතුරුම් සඳහා පවත්නා සුරක්ෂිතම ස්ථානය බවට පත්වෙමින් රජයේ වගකීම සහිත එකම බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ ඉන් ඉපැයෙන පොළිය සඳහා 100% ක රාජ්‍ය ආරක්ෂාව පිරිනමයි. බැංකුවේ ස්ථාවරත්වය සහ විශ්වසනීයභාවය පිළිඹිබු කරමින් අඛණ්ඩව 15 වන වරටත් ෆිච් රේටින්ග්ස් ආයතනය විසින් AAA ශ්‍රේණිගත කිරීම බැංකුවට ලබාදී තිබේ. එසේම බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ආයතනය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ 5 වන වටිනාම සන්නම් නාමය ලෙස ස්ථානගත කළ බවද මා දැනුම් දෙන්නේ සතුටිනි. මෙම සම්මාන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මනා පාලනය සහ ශක්තිමත් උපායමාර්ගික දිශානතියට සාක්ෂ්‍ය වන අතර, අප විසින් ශ්‍රී ලාංකික මූල්‍ය ක්ෂේත්‍රය තුළ තබන ලද සළකුණ තහවුරු කරයි. අපගේ අදාළ බව රැකගැනීම, සබඳකම් පවත්වාගැනීම සහ සේවා සැපයීමෙහි නිරතවීම සඳහා වන අපගේ පරිශ්‍රමය මෙතෙකින් අවසන් නොවන අතර, අපගේ පාර්ශවකරුවන්ට වටිනාකම් නිර්මාණය කරදීම උදෙසා අපි අනාගතයේදීද අඛණ්ඩව කැපවෙමු.

ගෝලීය වේදිකාව තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තැබූ සළකුණ

අර්බුදකාරී ගෝලීය ආර්ථික වාතාවරණය පහව යාමත් සමග 2017 වර්ෂයේදී ලෝක ආර්ථිකය 3% ක ආර්ථික වර්ධන වේගයක් ළඟා කරගනිමින් යළිත් ශක්තිමත්වූ අතර, එය 2011 වසරේ සිට මේ දක්වා වාර්තා කරන ලද ඉහළම ආර්ථික වර්ධනය වේ. ගෝලීය ආර්ථිකයේ මෙම චක්‍රීය ප්‍රකෘතිකරණය ඉදිරි වසර කිහිපය ඇතුළත පවතිනු ඇතැයිද, නැගී එන වෙළඳපළ සහ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික වේගවත් කරනු ඇතැයිද අපේක්ෂා කෙරේ. ඒ අනුව, පාරිභෝගික භාණ්ඩ අපනයනය නැවත යථා තත්ත්වයට පත්වීම හේතුකොටගෙන එම වෙළඳපළ සහ ආර්ථික 2018 වර්ෂය තුළදී 4.5% ක වර්ධන වේගයක් ළඟා කරගනු ඇති අතර, 2019/20 කාලපරිච්ඡේදය තුළදී 4.7% ක සාමාන්‍යයක් වාර්තා කරනු ඇත.

ව්‍යාපාර පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම අරමුණු කරගෙන ජාත්‍යන්තර බැංකුකරණය සහ වාණිජ සේවා ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සලකුණ එතෙරට ගෙන යන ලදී. වසර ගණනාවක් මුළුල්ලේ ගොඩනැගුණු පුළුල්වූ ජාත්‍යන්තර බැංකුකරණ සබඳතා ජාලයකට වර්තමානයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව හිමිකම් කියයි. අරාබි ජාතික බැංකුව, සවුදි අරාබියා හුවමාරු සමාගම සහ සිංගප්පූරුවේ DBS බැංකුව වැනි ප්‍රමුඛපෙළේ ජාත්‍යන්තර මූල්‍ය ආයතන ඒ අතර වේ. 2016 වසර හා සසඳන කල, 2017 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආමුඛ ප්‍රේෂණ 33% ක දැවැන්ත වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 26 ක් ලෙස සටහන් විය. එසේම 2017 දෙසැම්බර් 31 දිනට විදේශ මුදල් තැන්පතු පදනම රුපියල් බිලියන 9.4 ක් බවට පත්ව තිබිණ. වසර තුළදී රුපියල් මිලියන 221ක වටිනාකමකින් යුත් ණයවර ලිපි නිකුත් කිරීම ඔස්සේ වෙළඳ මූල්‍ය සේවා ව්‍යාපාරය වර්ධනය විය. ඉදිරියේදීත් අපගේ ජාත්‍යන්තර බැංකු කටයුතු සහ විදේශ සබඳතා ජාල පුළුල් කරගැනීම පිණිස ආමුඛ හා ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා ප්‍රමුඛපෙළේ වෙළඳපළවලට පිවිසීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

තිරසාරභාවය පිළිබඳ සලකුණක් තැබීම සඳහා ...

තිරසාරභාවය පිළිබඳ මූලධර්ම අපගේ උපායමාර්ගය තුළ ගැබ්වී තිබෙන අතර, එකී මූලධර්ම අපගේ ව්‍යාපාරය සහ අප විසින් සිදුකරණු ලබන සියලු කටයුතු වල පදනම වේ. අපි, අප විසින් ජනිත කරනු ලබන සාමාජික, ආර්ථික සහ පාරිසරික සලකුණු ඇගයීමට ලක් කරන අතර අප ක්‍රියාත්මක වන සාමාජය හා පරිසරය කෙරෙහි ඇතිවිය හැකි ඕනෑම අහිතකර බලපෑමක් වළක්වාලීමට පියවර ගන්නෙමු. පසුගිය වර්ෂයේදී අපි දිවයින පුරා පුනර්ජනනීය බලශක්තිය ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කළ අතර, NSB Eco ණය ක්‍රමය වැනි හරිත බැංකුකරණ ක්‍රම ක්‍රියාත්මක කළෙමු. 2017දී එවැනි මුලපිරීම් වලට දායකත්වය ලබාදෙන අතරම, බැංකුව විසින් ක්‍රියාත්මක කරනලද NSB වනවගා ව්‍යාපෘතිය ඔස්සේ අප විසින් වායුගෝලයට මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය අවම කිරීමටද අපි පියවර ගත්තෙමු. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ 93 වැනි "ලෝක සකසුරුවම් දිනය" නිමිත්තෙනි. NSB වන වගා ව්‍යාපෘතිය යටතේ 2020 වන විට පැළ මිලියනයක් බෙදාහැරීමට අපේක්ෂිතය. මේ වසරේදී පමණක් අපි දිවයින පුරා පැළ 25,000 ක් බෙදාහැරීමට කටයුතු කළෙමු.

එමෙන්ම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන්ද අප විසින් සහය පළ කරන ලද අතර, අපගේ ව්‍යාපාරය හා මෙහෙයුම් සමග සෘජුව සම්බන්ධ වන තිරසාර සංවර්ධන ඉලක්ක ආමන්ත්‍රණය කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු. ජාතික ඉතිරිකිරීමේ බැංකු ඉතිහාසයේ ප්‍රථම වතාවට මූල්‍ය නොවන වාර්තා සඳහා ස්වාධීන තහවුරු කිරීමේ වාර්තාවක් ලබාගැනීමට අපට හැකිවිය. තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමෙහිලා අපගේ කැපවීම හා අඛණ්ඩ ප්‍රයත්නය අපගේ වාර්ෂික වාර්තාවෙන් පැහැදිලි කෙරේ. (පිටු අංක 146 බලන්න) මෙම ගෝලීය අභියෝගවලට මුහුණදීම සඳහා දේශීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටම් වලදී බහුපාර්ශවකරුවන්ගේ ඵලදායී සහයෝගය අත්‍යාවශ්‍ය බව අප විසින් හඳුනාගන්නා ලද අතර, එහිලා අප සමඟ අත්වැල් බැඳගන්නා ලෙස අපි අපගේ සියළු පාර්ශවකරුවන්ට ඇරයුම් කරන්නෙමු.

අනාගතය දකිමින් ...

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘතාන්තයට වසර 45 ක් පමණක් වූවද අපි වසර 180 කට වඩා පැරණි මූල්‍ය උරුමයකට හිමිකම් කියන්නෙමු. අපගේ විචිත්‍රවත් ඉතිහාසය තුළ අප නිරතුරුවම ගනුදෙනුකරුවන්ගේ අවධානය දිනාගත් අතර, අපි ඉදිරියටත් ඒ ආකාරයෙන්ම කටයුතු කිරීමට හැමවිටම උත්සුක වන්නෙමු. අපගේ උපායමාර්ගික පරමාර්ථ යොමුවී තිබෙන්නේ අපගේ සියළුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධවෙමින් ඔවුන්ට සේවා සැපයීමෙහි නිරතවීම කෙරෙහිය. අපගේ ව්‍යාපාරය පුළුල් කරගැනීමේ ඉලක්කය සමඟ අපි තිරසාර වර්ධනය, අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කරගැනීම සහ අපගේ ගනුදෙනුකාර සේවය ශක්තිමත් කරගැනීම සඳහා පවත්නා අවස්ථා සොයා යන්නෙමු. අති නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණික යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා අයෝජනය කිරීම ඔස්සේ අපගේ ඩිජිටල් ඉඩහසර පුළුල් කරගැනීම කෙරෙහිද අපි අවධානය යොමු කරමු. අවසාන වශයෙන් විවිධත්වය, සංවෘතභාවය සහ විනිවිදභාවය ගුරුකොට ගනිමින් අපගේ පාර්ශවකරුවන්ට අඛණ්ඩව වටිනාකම් සැපයීමට අපි සැදී පැහැදී සිටිමු.

කෘපවීම අගයමින් ...

දැඩි කැපවීමෙන් හා හිතෛෂීභාවයෙන් යුතුව කටයුතු කරන සාමාන්‍යාධිකාරීතුමා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ප්‍රමුඛ අපගේ කණ්ඩායමට ප්‍රථමයෙන්ම මාගේ ස්තුතිය පිරිනමමි. මේ වසරේදී වාර්තාවූ විශිෂ්ට කාර්යසාධනය යථාර්ථයක් වූයේ ඔවුන්ගේ කැපවීම හා බැංකුව කෙරෙහි වන හිතෛෂීභාවය නිසාමය. එසේම අප වෙත ලබාදුන් වටිනා මගපෙන්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෝදර සාමාජිකයන් වෙත කෘතඥතාව පළ කරන අතර, අපගේ ගනුදෙනුකරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ දායකත්වය මම බෙහෙවින් අගය කරමි. දීපව්‍යාප්ත තැපැල් කාර්යාල වෙතින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලබාදෙන වටිනා සහය වෙනුවෙන් තැපැල්පතිතුමා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි. අවසාන වශයෙන්, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාශයේ ලේකම්තුමා සහ අමාත්‍යාංශ නිලධාරීන්, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා සහ නිලධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සහ නිළධාරීන්, නීතිපතිතුමා, විගණකාධිපතිතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාලන අධිකාරීන්හි ප්‍රධානීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් මගේ කෘතඥතාව පුද කරමි.



අස්චින් ද සිල්වා
සභාපති
2018 මාර්තු 12



සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ සමාලෝචනය

2017 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි සියළු ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි එන්ද්‍රීය වර්ධනයක් සහ විශිෂ්ට මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කරමින් සිය 45 වන සංවත්සරය සැමරීය. බැංකුව විසින් මෙකී වැදගත් සන්ධිස්ථාන පසු කරන ලද්දේ රාජ්‍ය බදු හා මූල්‍ය ප්‍රතිපත්තිවල සිදුවූ වෙනස්කම් සහ අතිශය තරඟකාරී ව්‍යාපාර පරිසරයක් මධ්‍යයේ අපගේ ව්‍යාපාර කටයුතු මෙහෙයවමිනි. එම සාධක බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රායෝගික හා විචක්ෂණශීලී උපායමාර්ගික දිශානතියට සාක්ෂ්‍ය වේ. තරඟකාරී වෙළඳපොළ අභියෝග හමුවේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව, විශේෂිත බැංකුවක් ලෙස, ශ්‍රී ලංකාව තුළ ඉතිරිකිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමෙහිලා එහි සුවිශේෂී කාර්යභාරය අඛණ්ඩව ඉටු කරනු ඇත.

ඓතිහාසික කාර්යසාධනයක්

බැංකුව සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කර ගතවූ 45 වසක් වැනි ඉතා කෙටි කාලපරිච්ඡේදයක් තුළදී එහි වත්කම් පදනම සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් ට්‍රිලියනයක් වැනි ප්‍රමුඛ අගයක් වාර්තා කිරීමට සමත්විය. 2016 වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 79.9 ක නැතහොත් 12.2% ක ශුද්ධ වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 737.2 ක් බවට පත්වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු පදනම බැංකුවේ වත්කම් වල සිදුවූ 11.0% ක වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. එසේම පුද්ගල හා ආයතනික කාණ්ඩ දෙකටම අදාළව බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹ 19.8% ක වර්ධනයක් සමඟින් රුපියල් බිලියන 388 ක් බවට පත්විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 5.5% ක වර්ධනයක් සමඟින් මෙතෙක් වාර්තා කළ රුපියල් බිලියන 14.0 ක ඉහළම බදු පෙර ලාභය සහ රුපියල් බිලියන 9.6 ක ඉහළම බදු පසු ලාභය තවත් ඓතිහාසික ජයග්‍රහණයක් ලෙස හඳුන්වාදිය හැකිය. රාජ්‍ය සුරැකුම් වෙළඳපළ තුළ අපගේ ස්ථානය පසක් කරමින් වෙළඳාම සඳහා වූ රාජ්‍ය සුරැකුම්හි ආයෝජනය කිරීම ඔස්සේ උපයාගත් රුපියල් බිලියන 1.1 ක ලාභය සමඟ බැංකුවේ ව්‍යාපාරික පරිමාව සැලකිය යුතු අයුරින් ඉහළයාම මෙම විශිෂ්ට කාර්යසාධනයට මග පෑදීය. එමෙන්ම, පසුගිය වසර තුන මුළුල්ලේ අඛණ්ඩව රුපියල් බිලියන 13 කට වඩා වැඩි බදු පෙර ලාභයක් වාර්තා කර තිබේ.

ගාස්තු හා කොමිස් ආදායම, වෙළඳාම් කටයුතු මගින් ශුද්ධ ලැබීම්, මූල්‍ය ආයෝජන සහ වෙනත් මෙහෙයුම් ආදායම යන කොටස් වලින් සැදුම්ලත් පොළී නොවන ආදායම 2016 දී වාර්තාවූ රුපියල් බිලියන 1 ට සාපේක්ෂව 337.8% ක ප්‍රශංසනීය වර්ධනයක් සමඟින් රුපියල් බිලියන 4.4 ක් ලෙස සටහන් විය. පොළී වියදමේ සිදුවූ ඉහළයාම හේතුවෙන් ඇතිවූ බලපෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොළී ආන්තිකය පහළයාමෙහි බලපෑම ව්‍යාපාරික පරිමාවේ ඇතිවූ ඉහළයාම මගින් අවම කෙරිණ. එහි ප්‍රතිඵලයක් ලෙස පොළී ආදායම රුපියල් බිලියන 103.4 ක් දක්වා ඉහළ ගියේය.

තවත් ඉතිහාසගත වාර්තාවක් සනිටුහන් කරමින් 2016 දී 1.6% ක් ලෙස සටහන්වූ බැංකුවේ දළ අක්‍රීය ණය අනුපාතිකය 1.3% ක් දක්වා පහළ ගිය අතර, එය බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමේ පැවති අඩුම අගයකි. ණය හා අත්තිකාරම් වල සිදුවූ වර්ධනය දළ අක්‍රීය ණය අනුපාතිකය පහලයාමට හේතුවූ අතර, එය බැංකුවේ මනා ණය කළඹ කළමනාකරණය, වත්කම්හි ගුණාත්මකභාවයේ විශිෂ්ඨත්වය සහ විවක්ෂණශීලී අවධානම් කළමනාකරණය විදහා දක්වයි. බැංකුවේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතිකය 15.3% ක පැසසුම් සහගත මට්ටමක පවතින අතර, එය රාජ්‍ය බැංකු ක්ෂේත්‍රයේ වාර්තාවූ ඉහළම අගයකි.

තත්කාලීන හා භෞතික සලකුණ පුළුල් කරමින්...

වසර 180 කට වැඩි මූල්‍ය උරුමයක් සමඟ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්ෂේත්‍රයේ ඇතිවූ බාධාකාරී පරිවර්තන රැසකට සාර්ථකව මුහුණදී තිබේ. වර්තමානයේ ජංගම දුරකතන, අන්තර්ජාල හා ඩිජිටල් බැංකුකරණ සේවාවන්හි ව්‍යාප්තියත් සමඟ ලොව පුරා බැංකු ක්ෂේත්‍රය සීඝ්‍රයෙන් ඩිජිටල්කරණය වීම ඔස්සේ සාම්ප්‍රදායික ශාඛා බැංකුකරණය යල්පැනගිය සංකල්පයක් බවට පත් කර නොමැති බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව මැනවින් අවබෝධ කරගෙන සිටී. නූතන තාක්ෂණයට අපගේ මෙහෙයුම් කෙරෙහි "බාධාකාරී" බලපෑමක් ඇති කිරීමට ඉඩ ලබාදීම වෙනුවට ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා හා අපේක්ෂා සපුරාලීම සඳහා තරඟකාරී ඩිජිටල් බැංකු සේවා සපයන අතරම අපගේ පවතින ශාඛා ජාලය නව තාක්ෂණික ක්‍රමවේද සමඟින් වැඩි දියුණු කිරීමට අපි පියවර ගත්තෙමු. පසුගිය වසර කිහිපය තුළ අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය ගනුදෙනුකරුවන්ට භෞතිකව මෙන්ම තත්කාලීනවද වඩා හොඳ බැංකුකරණ අත්දැකීමක් තිළිණ කිරීමෙහිලා දායකවූ අතර, සමාජයේ සෑම ජන කොටසකටම සේවා සැපයීමට බැංකුවට හැකියාව ලැබිණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සිය ශාඛා ජාලය ශාඛා 253 ක් දක්වා ඉහළ නංවන ලදී. අපගේ පුළුල්වූ දීපව්‍යාප්ත සේවා කවුළු අතරට 4,062 ක්වූ තැපැල් කාර්යාල ජාලයද ඇතුළත් වේ. එසේම, SLT මොබිටෙල් ආයතනය සමඟ එක්ව NSB iSaver නමින් හඳුන්වාදෙනු ලැබූ නව තාක්ෂණික ඩිජිටල් නිමවුම රටපුරා විසිරී සිටින 16,000 කට අධික mCash නියෝජිතයන් මාර්ගයෙන් මුදල් ඉතිරිකරීමේ අවස්ථාව අපගේ ගනුදෙනුකරුවන් වෙත උදාකරදී තිබේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආදර්ශ ශාඛා (Model Branch) සංකල්පය NSB Connect නමින් 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවන ලද අතර, 2018දී එය දිවයින පුරා පිහිටි ශාඛා 50 කදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2017 වර්ෂයේදී බැංකුවේ ප්‍රාදේශීය මෙහෙයුම් ව්‍යුහය ප්‍රතිසංවිධානය කරන ලද අතර, ඒ යටතේ බැංකුවේ සියළු ශාඛා ප්‍රාදේශික 09 කට බෙදා වෙන් කෙරිණ. තවද, 2017 වර්ෂයට අදාළව ශාඛාවල කාර්යසාධනය සහ ශාඛා මගින් සැපයෙන සේවාව පිළිබඳ ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය ඇගයීම සඳහා ගනුදෙනුකරුවන්ගේ සංසද සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරන ලදී.

ඉගෙනීමේ සංස්කෘතිය ඉදිරියට ගෙන යමින්...

අපගේ අඛණ්ඩ සාර්ථකත්වය උදෙසා අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් පවත්වාගැනීම අත්‍යාවශ්‍ය බව අපි හඳුනාගත්තෙමු. අපගේ වාර්ෂික පුහුණු වැඩසටහන්, දැනුම බෙදාගැනීමේ වැඩසටහන්, බැංකුවේ සමුච්චිත ඥාණ සම්භාරය සහ අත්දැකීම් සමගින් ශක්තිමත්වූ අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළ ඉගෙනුම් ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට අපට හැකිවූ බව මා පවසන්නේ ආඩම්බරයෙනි. වසර 10 කට වැඩි සේවා කාලයකට හිමිකම් කියන වැඩි පිරිසකගෙන් සැදුම්ලත්, කැපවීමෙන් හා හිතෛෂීභාවයෙන් යුතුව කටයුතු කරන, කුසලතා පූර්ණ අපගේ සේවක මණ්ඩලය ඉදිරි අනාගතයේදී ව්‍යාපාරික නායකයන් බවට පත්වීම සහ අපගේ පාර්ශවකරුවන් වෙත වඩා හොඳ වටිනාකමක් ලබාදීම අරමුණු කරගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පවත්නා ඉගෙනුම් සංසකෘතිය මහත් උද්යෝගයෙන් යුතුව වැළඳගත්හ.

2017 වර්ෂයේදී, දේශීය හා විදේශීය පුහුණු සැසි වලින් සමන්විත පුහුණු වැඩසටහන් 252 ක් වෙනුවෙන් රුපියල් මිලියන 34.4 ක් ආයෝජනය කර තිබෙන අතර, පුහුණු පැය 45,347 ක් ඊට ඇතුළත් විය. එක් සේවා නියුක්තිකයෙකු සඳහා වෙන් කෙරුණු පුහුණු පැය ගණනේ සාමාන්‍යය පැය 12 ක්වූ අතර, එම වැඩසටහන්වලට සහභාගීවීමේ අනුපාතිකය 88% ක් ලෙස සටහන් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය සේවා නියුක්තිකයන් 53 ක් සඳහා විදෙස් පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා තිබේ. අපගේ සුවිශේෂී ඉගෙනුම් සංස්කෘතිය පවත්වාගැනීමේ අරමුණ පෙරදැරිව පුහුණු වැඩසටහන් වෙනුවෙන් අඛණ්ඩව ආයෝජනය කිරීමට අපි නිරතුරුව උත්සුක වෙමු.

කාන්තාව සවිබලගැන්වීම උදෙසා...

මෙරට ජනගහනයෙන් අඩකට වඩා වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන කාන්තාව සවිබලගැන්වීම, ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන ආර්ථිකයක් බවට පත්වීම සඳහා යන ගමනට මහත් පිටුබලයක් සපයන බව අපි අවබෝධ කරගතිමු. ඒ අනුව අපගේ විශේෂිත නිමැවුම් ඔස්සේ මෙන්ම ශ්‍රම බලකායට දායකත්වය සපයන කාන්තාවන් බලගැන්වීම මගින්ද, කාන්තාව සවිබලගැන්වීම සඳහා අපි සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කළෙමු. අපගේ සමස්ත ශ්‍රම බලකාය තුල 58% ක කාන්තා නියෝජනයක් සමග සෑම මට්ටමකදීම 6:5 ක හිතකර ස්ත්‍රී:පුරුෂ අනුපාතිකයක් පවත්වාගැනීමට අපි සමත්වීමු. ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ස්ත්‍රී/පුරුෂ භාවය මත පුද්ගලයන්ට වෙනස් ලෙස නොසලකන, සියළුදෙනාටම සම අවස්ථා සහතික කරන සේව්‍යයෙක් ලෙස හඳුන්වාදිය යුතුය.

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් අපගේ ප්‍රධාන පෙළේ නිමැවුමක් වන ස්ත්‍රී ඉතිරිකිරීමේ ගිණුම 2017 වර්ෂයේදී, නැවත හඳුන්වාදෙන ලදී. මෙය 2017 වසරේදී බැංකුව විසින් ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධනය සහ සංචලනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ එක් අදියරකි. එහිදී ස්ත්‍රී ගිණුම සඳහා සන්නම් නාම කළමනාකරුවෙකු පත්කරන ලද අතර, නව ප්‍රතිලාභ සමඟින් මෙම නිමැවුම නැවත හඳුන්වාදෙන ලදී. අපි ඉදිරියේදීත් මෙවැනි විවිධ ක්‍රමවේද ඔස්සේ කාන්තාව සවිබලගැන්වීමෙහිලා අපගේ දායකත්වය ලබාදීමට කටයුතු කරමු.

අනාගතය දකිමින්...

ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීම උදෙසා වන අපගේ උපායමාර්ගය ජාත්‍යන්තර වෙළඳපළ තුළ අපගේ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන ජාත්‍යන්තර මට්ටමෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අප මෙහෙයවීය. ඒ අනුව, 2017 වර්ෂයේ ජාත්‍යන්තර වෙළඳපළ තුල වාර්තාවූ ස්ථාවර වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස ජනිතවූ වෙළඳපළ අවස්ථා උපරිම ලෙස උපයෝජනය කිරීමට අපි සැදී පැහැදී සිටිමු. ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් වෙතින් වැඩි ප්‍රේෂණ ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීම සඳහා යුරෝපීය, කැනඩා සහ එක්සත් ජනපද වෙළඳපළ වලට ප්‍රවිශ්ඨ වීමට සැලසුම් සකස් කර තිබේ. පසුගිය වසර තුන තුළ දැවැන්ත වර්ධනයක් සටහන් කළ විදේශ ප්‍රේෂණ වෙළඳපළ කොටස ඉහළ නංවාගැනීමටද අපේක්ෂා කෙරේ.

අපගේ ඉතුරුම් නිමැවුම් කළඹ පුළුල් කිරීම කෙරෙහිද අප අවධානය යොමු කිරීමට කටයුතු කරන අතර, ලොව වටා සිදු කෙරෙන ගනුදෙනු වලදී ඉහළ ආරක්ෂාවක් සහතික කරන මාස්ටර් කාඩ් සහ වීසා චිප් ඩෙබිට් කාඩ්පත් නිකුත් කිරීම අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. එසේම ශ්‍රී ලංකා සේවින්ග්ස් බැංකුව අත්පත් කරගැනීමට අවශ්‍ය මූලික කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කෙරිණ. අත්පත්කරගැනීමේ ක්‍රියාවලියට අදාළ මූල්‍ය තත්ත්ව විශ්ලේෂණය සම්පූර්ණ කර තිබෙන අතර, අදාළ සියළු ක්‍රියාවලි අවසන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු අරඹා තිබේ.

අපගේ 2017-2019 ත්‍රෛවාර්ෂික ව්‍යාපාර සැලැස්ම අනුව යමින් පුද්ගල බැංකුවක් ලෙස අපගේ සලකුණ පුළුල් කිරීමට කටයුතු කෙරේ. අපගේ ඩිජිටල් බැංකුකරණ සේවා පුළුල් කිරීමට අදාළ මූලපිරීම් සහ iSaver සහ NSB Reach වැනි නව තාක්ෂණික නිමැවුම් සමඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2018 වසරේදී අපගේ ප්‍රමුඛතම කාර්යයක් වනු ඇත. අපටම සුවිශේෂීවූ ආකාරයකට සාම්ප්‍රදායික සහ මෙරට ජනතාවට වඩා සමීප බැංකු සේවා සමඟ නූතන ඩිජිටල් නිමැවුම් හා සේවා සංයෝජනය කරමින් ශ්‍රී ලාංකික ජන සමාජයේ සියලු ජන කොටස් නියෝජනය කරන අපගේ ගනුදෙනුකරුවන් වෙත නවමු බැංකුකරණ අත්දැකීමක් ලබාදීම අපගේ අභිප්‍රායයි.

කැපවීම අගයමින් ...

අපගේ 2017 කතා පුවත සුවිශේෂී එකක් බවට පත් කිරීම උදෙසා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ සියළු දෙනා ඇගයීමට මම මෙය අවස්ථාව කර ගනිමි. සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාගේ කළමනාකරණ කණ්ඩායමට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ ආදර්ශමත් පාලනය වෙනුවෙන් මගේ කෘතඥතාව පුද කරමි. අවසාන වශයෙන්, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාශයේ ලේකම්තුමා සහ අමාත්‍යාංශ නිලධාරීන්, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා සහ නිලධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සහ නිළධාරීන්, තැපැල්පතිතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය, නීතිපතිතුමා, විගණකාධිපතිතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාලන අධිකාරීන්හි ප්‍රධානීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙතද මගේ කෘතඥතාව පුද කරමි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක මණ්ඩලයේ කැපවීම හා හිතෛෂීභාවය, අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය සහ අපගේ පාර්ශවකරුවන්ගේ සහයෝගය නොවන්නට අපගේ 2017 සාර්ථකත්වයේ කතා පුවත යථාර්ථයක් නොවනු ඇත. 2017 වර්ෂය අපගේ සුවිශේෂී වෘතාන්තයේ තවත් එක් චිත්තාකර්ෂණීය පරිච්ඡේදයක් බවට පත්කිරීම වෙනුවෙන් ඔබ සියලු දෙනාට ස්තුතියි.



එස්. ඩී. එන්. පෙරේරා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
2018 මාර්තු 12

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී ව්‍යාපාරික ආකෘතිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී අභිලාෂය වන ඉතුරුම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමත්, එමගින් දේශයට සේවයක් හා දායකත්වයක් සැලසීමත් ශ්‍රී ලාංකික සමාජයේ සියලුම පාර්ශවවල අවශ්‍යතා සපුරාලන සේවයක් සැපයීමත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී ව්‍යාපාරික ආකෘතියෙහි මූලික පදනම නිර්මාණය කරයි.

අපගේ දැක්ම, මෙහෙවර, අගයන් සහ උපාය මාර්ගික සැලසුම් මගින් පෝෂණය වුණු අප බැංකුවේ වටිනාකම් උත්පාදන ක්‍රියාදාමය පිළිබඳ විශ්ලේෂණයක් අපගේ මෙම ව්‍යාපාරික ආකෘතිය මගින් සැපයෙයි. අපගේ මෙහෙයුම් පරිසරය මගින් අපගේ බැංකු මෙහෙයුම් සිදුකෙරෙන සන්දර්භය, දේශීය හා ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් මෙන්ම සමස්තයක් ලෙස ක්ෂේත්‍රයෙහි දක්නට ලැබෙන ප්‍රවනතා පිළිබිඹු කෙරෙයි. ඊට අමතරව ක්ෂේත්‍රය තුළ පවතින අභියෝග අවස්ථා හා අනාගත හැඩරුව ද මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගතය.

උනන්දුව දක්වන පාර්ශ්ව යන පරිච්ඡේදය හරහා අප සතු වටිනාකම් උත්පාදනය කිරීමේ හැකියාව මත සැළකිය යුතු බලපෑමක් ඇති කරන ඇල්මැති කණ්ඩායම් පිළිබඳවත් එකී කණ්ඩායම් හා සම්බන්ධ වීමේ අපගේ ක්‍රමවේදත් සංක්ෂිප්තව දක්වා ඇත. එමෙන්ම අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඇල්මැති පාර්ශ්වයන්ගේ බලපෑමත් 2017 වර්ෂයේදී එම පාර්ශ්ව උදෙසා බැංකුව විසින් අගය උත්පාදනය කළ ආකාරය ද මෙහි ඇතුළත්ය.

සක්‍රීය ඇල්මැති පාර්ශ්ව නියුතුවීම් සමඟ අපගේ ව්‍යාපාරික ආකෘතිය ඇගයීම, අපගේ සැලකිය යුතු නිකුතු, සහ අගය එකතු කිරීම් හා හානි කිරීම් අංග හැඩගැස්වනු ලබයි. මෙකී අංශ සහ සැළකිය යුතු සාධක මගින් පැන නගින අවදානම් හා අවස්ථා බැංකුවේ උපායමාර්ගික සැලසුම් නිර්මාණයට මුල වෙයි. අපගේ උපායමාර්ගය යන පරිච්ඡේදයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාරික සැලසුම් සහ බැංකුවේ උපායමාර්ගික දිශානතිය සංක්ෂිතව දක්වනු ලබයි.

මූලික සම්පත් සහ සම්බන්ධතා

වටිනාකම් උත්පාදනය

ආයතනික යෙදුම්

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 73-89

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු අංක 100-105

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු අංක 92-99


සමාජයීය යෙදුම්

මානව ප්‍රාග්ධනය
පිටු අංක 108-121

සමාජයීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
පිටු අංක 124-139

ස්වාභාවික ප්‍රාග්ධනය
පිටු අංක 142-145

ආයතනික යහපාලනය



අවදානම් කළමනාකරණ සහ අනුකූලතාව

මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යය සාධන (නිමැවුම)

ආර්ථිකය

බදු පසු ලාභය - රු. බි. 9.6
වත්කම් පදනම - රු. ට්‍රි. 1.01
ගෙවන ලද පොළිය - රු. බි. 78.4
මුදාහරින ලද ණය - රු. බි. 187.3
රජයට දක්වන දායකත්වය - රු. බි. 13.4

ශාඛා - 253
තැපැල් ජාලය - 4,062
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර - 286
තොරතුරු සංනිවේදන
තාක්ෂණ සේවා ආයෝජනය - රු. මි. 712.4

සමාජයීය

සේවක ප්‍රතිලාභ - පිටු අංක 114
පිරිනැමූ උසස්වීම් - 824
සේවක ශක්තිය - 4470
නව බදවාගැනීම් - 216
පුහුණුවීම් හි ආයෝජනය - රු.මි. 34.4
පුහුණු පැය - 45,347
සේවක රැඳවුම් අනුපාතය - 96.7%

සන්නම් අගය - ඇ.ඩො.මි. 168
සන්නම් ශ්‍රේණිගත කිරීම - 5 වන වටිනා සන්නම් නාමය
ලංකා ෆිච් ශ්‍රේණිගත කිරීම - ත්‍රිත්ව ඒ (ලංකා)
එස් ඇන් පී ගෝලීය ශ්‍රේණිගත කිරීම - බී + ස්ථාවර
ෆිච් ශ්‍රේණිගත කිරීම් - බී + ස්ථාවර

පරිසරය

ගිණුම් සංඛ්‍යාව - රු. මි. 19.9
ප්‍රජා සංවර්ධන ආයෝජන - රු. මි. 20.4
සමාජයට දක්වන දායකත්වය - පිටු අංක 135

බෙදාහරින ලද පැළ සංඛ්‍යාව - 25,000
ප්‍රදානය කළ ආයෝජන - රු. මි. 1.8
ප්‍රදානය කළ පරිසර හිතකාමී ණය - 902
පරිසර හිතකාමී ණය වල වටිනාකම - රු. මි. 686

ඇල්මැති පාර්ශ්වයන් සඳහා උත්පාදිත අගයන් (ප්‍රතිපල)

කොටස් හිමියන්

මූල්‍ය ස්ථාවරත්වය
දක්වන දායකත්වය

ගනුදෙනුකරුවන්

වර්ධනය කළ ව්‍යාපාරික ශක්‍යතාවය
වැඩිදියුණු කළ ප්‍රවේශය සහ පහසුව,
මූල්‍ය අන්තර්ග්‍රහණය,
කාර්යක්ෂම ගනුදෙනුකාර සේවය,
විස්තිරණ නිමැවුම් කළඹ,
ඩිජිටල් නිමැවුම්

සේවා නියුක්තිකයන්

සේවා නියුක්තික නිරතවීම් ඉහළ මට්ටම ආරක්ෂිත රාජකාරී පරිසරය,
දේශීය රැකියා උත්පාදනය,
සේවක තෘප්තිය හා පක්ෂපාතීත්වය

නියාමකයින් හා රාජ්‍ය ආයතන

ප්‍රජා සංවර්ධන
අනුකූලතාව පිළිබඳ නිදසුන් සපයන ක්‍රම සංස්කෘතියක්


සැපයුම්කරුවන් හා සේවා සපයන්නන්

සැපයුම් කරුවන් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම

සමාජය හා පරිසරය

අපගේ ව්‍යාපාරික කටයුතු වලින් පරිසරයට ඇති අහිතකර බලපෑම අවම කිරීම
බලශක්ති කාර්‍යක්ෂමතාවය
වගකීම් සහගත ආයතනික පුරවැසියන්
පුනර්ජනනීය බලශක්ති උදෙසා යොමු වීම
දේශීය සහ ජාතික ඉතුරුම් වර්ධනය සඳහා සහය වීම

අපගේ උපායමාර්ගික ධාවකයන්



මෙහෙයුම් පරිසරය

මෙහෙයුම් පරිසරය වූ කලී බැංකුවට බලපානු ලබන සියළු බාහිර හා අභ්‍යන්තර සාධකවල එකතුවකි. ගෝලීය හා දේශීයව ක්‍රියාත්මක සමාජ - ආර්ථික හා දේශපාලන ප්‍රවණතා බැංකුවේ උපායමාර්ගික තීරණ සහ මූල්‍ය කාර්යසාධනය වෙත බලපෑමක් එල්ල කරනු ලබන බව නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සවිඥානික පසුවෙති. 2017 වර්ෂය තුළ ක්ෂුද්‍ර හා සාර්ව පාරිසරික ප්‍රවණතා සම්බන්ධයෙන් මෙම පරීච්ඡේදය මගින් කරුණු දැක්වීමක් සිදු කෙරෙති.

ගෝලීය ආර්ථිකය

ගෝලීය ආර්ථික අර්බුදය සංසිඳීමත් සමගින් 2017 වර්ෂයේ දී ගෝලීය ආර්ථිකය ශක්තිමත්විනි. 2011 වසරින් පසුව ඉහළම වර්ධන අනුපාතයක් වාර්තා කරමින් ගෝලීය ආර්ථික වර්ධන අනුපාතය 3% ක් ලෙස සනිටුහන් විය.

ඉදිරි වර්ෂවලදී ලෝක ආර්ථික වර්ධනය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂිතය. ගෝලීය නිමවුම 2017 වසරේදී 3.7% කින් වර්ධනය වූ බවට ඇස්තමේන්තු ගත වූ අතර ගෝලීය වර්ධනය පුරෝකථනය 3.9% දක්වා සංශෝධනයවිනි. මෙමගින් ගෝලීය වර්ධන වේගයේ ඉහළම මෙන්ම මෑතකදී අනුමත වූ ඇ.ඒ. ජනපද බදු ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් අපේක්ෂිත බලපෑම ද පිළිබිඹු වෙයි.

අපේක්ෂිත ක්‍රියාකාරිත්වය ඉක්මවූ හා වඩාත් ප්‍රබල ප්‍රාග්ධන වියදම් හේතුවෙන් හා බාහිර ඉල්ලුම ප්‍රබලවීම මත 2017 වසරේදී ඇ.ඒ. ජනපද ආර්ථික වර්ධනය 2.3 කින් වර්ධනය වීමත් සමග දියුණු ආර්ථිකයන් කිහිපයක සීඝ්‍ර ක්‍රියාකාරිත්වය මෙම වර්ධනයට බලපාන ලදී.

සියලුම ප්‍රධාන පෙළේ ආර්ථිකයන්හි වර්ධනය සීඝ්‍රතාවයකින් සිදු වන අතර යූරෝ භාවිත කලාපයෙහි මෙම වර්ධනය අපේක්ෂිත සීමාව බොහෝ සේ ඉක්මවමින් 2.4% ක් විය. තවත් කැපී පෙනෙන ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළ සංවර්ධිත ආර්ථිකයක් වූ ජපානයෙහි 2017 වර්ධනය 1.7 % ක් විය. ඉහළ දේශීය ඉල්ලුම, පාරිභෝගික වියදම් ආවරණය මෙන්ම දිරිගැන්වීමේ රාජ්‍ය අයවැය ප්‍රතිපත්ති මෙම වර්ධනයට උපකාරී විය.

2017 වසරේදී ගෝලීය ආර්ථික වර්ධනයෙන් හරි අඩකට ආසන්න වශයෙන් දායකත්වය දැක්වූයේ ඊසානදිග හා දකුණු ආසියාව වන අතර මෙහිදී 1/3 ක පමණ තනි දායකත්වය එනම් 6.8% ක් චීනය විසින් සපයන ලදී. ආර්ජන්ටිනාව, බ්‍රසීලය, නයිජීරියාව, හා රුසියාව යන රාජ්‍යයන්හි ආර්ථික අවපාතය අවසන් වීමද 2016-2017 අතර කාලසීමාවතුළ ගොලීය වර්ධන වේගය ඉහළ නැංවීමට බලපාන ලද සාධක විය. ගෝලීය වෙළඳාම්හි පරාවර්ථනය මගින් හා ආයෝජන තත්ත්වයන්හි වර්ධනීය බව ද මීට හේතු සාධක විය.

ඉදිරි දැක්ම

සංවර්ධනයට බාධා පමුණුවනු ලබන කල්ගතවුනු බාධක මුලිනුපුටා දැමීම, ආර්ථික විවිධාංගීකරණය, අසමානතා අවම කිරීම, අවම කාබන් පියසටහන් සහිත ආර්ථික වර්ධනය යනාදී දීර්ඝ කාලීන සාධක කෙරෙහි සැලකිලිමත් වූ ප්‍රතිපත්තීන් වෙත යොමු වුනු අවධානය ඇතැතිව ක්‍රියා කිරීමේ අවස්ථාවක් පවත්නා දියුණු ගෝලීය ආර්ථික තත්ත්වයන් හමුවේ රටවල් වලට හිමිවේ. මීළඟට ඇති අභියෝගය වන්නේ මෙම වර්ධනය මධ්‍යම කාලීන අපේක්ෂා මුදුන්පත් කර ගැනීම පිණිස සහය වන පරිදි ඵලදායක ආයෝජනයන්හි තිරසාර හා වර්ධනාත්මක ලෙස යෙදවීමයි.

2018-19 වර්ෂයන්හිදී සංවර්ධනය වෙමින් පවතින ආසියාව 6.5% ක පමණ වර්ධන වේගයක් අත්පත් කරගනු ඇත. චීනයතුළ මෙම වර්ධනය ක්‍රමක්‍රමයෙන් සීමා වනු ඇතැයි අපේක්ෂිතය. ඉන්දියාවේ වර්ධනය 2018-19 අතරතුර ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරෙයි. අනික් අතට නැගී එන වෙළඳපළ සහ සංවර්ධනය වන ආර්ථිකයන්හි වර්ධනය 2018 වර්ෂයේ දී 4.5% දක්වා ළඟා වෙමින් 2019-20 අතරතුර කාලසීමාවේදී 4.7% ක සාමාන්‍යයක් රඳවාගනු ඇත. ඇ එ ජනපදය, ප්‍රංශය හා ජපානය යනාදී සංවර්ධිත ආර්ථිකයන් හමුවේ වර්ධනීය තත්ත්වයක් අත්පත් කරගනු ඇති බවට අපේක්ෂිතය. සංවර්ධිත ආර්ථිකයන් 2017 වර්ෂයේ පැවති ආකාරයේ වර්ධන මට්ටමක් රඳවා ගනු ඇතැයි අපේක්ෂිතය.

කෙසේවුවද අනාගත අවදානම් බවින් මුළුමනින් දුරස්ථ නොවන බවට ලකුණු පෙන්වයි. මූල්‍ය වෙළඳපල වෙනස්වීම් අසාමාන්‍ය ලෙස අඩු වූ අතර වත්කම් මිල බොහෝ සේ ඉහළ වටිනාකමකින් යුතු විය. මේ කරුණු වෙළඳපල ක්ෂණික ගැලපීම් පෙන්නුම් කරයි.

වෙළඳ ආරක්ෂක වර්ධනය හා භූගෝල ප්‍රදේශ අනුව දේශපාලන ගැටුම් ඉහළයාම මගින් අහිතර බලපෑමක් එල්ලවී ආර්ථික තත්ත්වයන් යථා තත්ත්වයට පත්වීම දුෂ්කර කළ හැකිය. දීර්ඝකාලීනව ගත් විට, ප්‍රතිදාන වර්ධනයට ඇති ශක්‍යතාව අපේක්ෂිත ආකාරයට වඩා තියුණු අන්දමින් පසුබැසීම තුලින් ගෝලීය ආර්ථිකයට හදිසි ආර්ථික අභියෝගවලට මුහුණ දීමේ හැකියාව හීනවීම ද දරිද්‍රතාව අඩුකිරීම හා ජීවන මට්ටම් ඉහළ නැංවීමේ අවකාශයට බාධා පැමිණිය හැකිය.

ශ්‍රී ලාංකික ආර්ථිකය

2017 වර්ෂයතුළ ශ්‍රී ලංකාවේ වර්ධනය 3.1 % ක් ලෙස වාර්තා විය. මෙය වූ කලී නියගයෙන් හා ගංවතුරින් සිදුවූ හානි මත ජූනි මස සිදුකළ ප්‍රරෝකථනයට වඩා අඩු වර්ධනයකි. 2017 වර්ෂයේ මුල් භාගය තුළ උද්දමන පීඩනය අඩු කිරීම උදෙසා මූල්‍යමය ප්‍රතිපත්ති දැඩි කෙරුණද ආයෝජන හා පෞද්ගලික පරිභෝජනයට සහනයක් වෙමින් ණය වර්ධනය ශක්තිමත් මට්ටමක පැවතිණි.

විශේෂයෙන්ම විදුලි සංදේශ, මූල්‍ය සේවා, මානව සෞඛ්‍ය, රක්ෂණ සහ තොග හා සිල්ලර ව්‍යාපාර අතින් සේවා අංශයේ දායකත්වය 2016 වර්ෂයේ පැවති අගයට වඩා 3.2% ක වර්ධනයක් සමගින් 55.8% ක් ලෙස වාර්තා විය.

ඉදිකිරීම්, පතල් කැනීම් හා ගල්කොරි, නිෂ්පාදන අංශය යනාදියෙන් සමන්විත ඇති කාර්මික ක්‍රියාකාරකම්වල දායකත්වය 27.2% ක් වූ අතර 3.9% ක වර්ධනයක් වාර්තා කරමින් ධනාත්මක බලපෑමක් කරන ලදී. කෙසේ වුවද කෘෂිකාර්මික අතින් ගත් විට 0.8% ක අඩුවීමක් සනිටුහන් විය. පසුගිය වසර 2 ක කාලසීමාව තුළ පැවති දැඩි නියං තත්ත්වය හා ගංවතුර ආපදා මීට හේතු වූ අතර එහි ප්‍රතිඵල ලෙස ආර්ථික වර්ධනය ද සීමා විය. ආනයන වියදම් ඉහළයාම, ණය සේවා ගෙවීම් මත විදේශ වෙත මුදල් ගලායාම සහ රාජ්‍ය සුරැකුම්පත්වල සිදු කරන විදේශ ආයෝජන අඩුවීම හේතුවෙන් 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිට ඇ.එ. ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2% කින් අගය අවප්‍රමාණය විය.

උද්ධමනය

දැඩි මූල්‍ය ප්‍රතිපත්ති සහ ආහාර ද්‍රව්‍යවල සහ ආනයනය කළ භාණ්ඩ මිල ඉහළයාම මත ණය වර්ධනය මන්දගාමීවීම මධ්‍යයේ වුවත්. 2017 වර්ෂයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ බලශක්තිය, ආහාර ආදී පාරිභෝගික අයිතම ඇතුළත් උද්ධමනය 7.3% ක මට්ටමේ විය. තෝරාගත් සෞඛ්‍ය ආශ්‍රිත අයිතම සඳහා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීමේ දී ලබාදී තිබූ බදු නිදහස් කිරීම් ඉවත් කරමින් එකතුකළ අගයමත බදු පරිමාව පුළුල් කෙරිණි. මෙම අනුපාතිකය 2016 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි 11% සිට 15% දක්වා ඉහළ නැංවුණු අතර 2017 වර්ෂය තුලදී එය මුළුමනින්ම දියත් කෙරිණි.

මූල්‍ය ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහයෝගය ඇතිව දීර්ඝ කළ අරමුදල් පහසුකම් යටතේ 2016 වර්ෂයේ ජූනිමස පටන් තුන් අවුරුදු ප්‍රතිසංස්කරණ වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි. මෙම වැඩසටහනෙහි පළමු භාගයේ ප්‍රධානතම ප්‍රතිඵල වූයේ සාර්ව ස්ථාවරත්වය හා ප්‍රධාන පෙළේ බදු ප්‍රතිසංස්කරණ ද්විත්වයක් සිදු කිරීමයි. ඒ අනුව, උද්දමනය පාලනය කිරීමට මෙන්ම මූල්‍යමය පීඩනය හා ණය සමස්තය පාලනය කරනුවස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති වඩාත් දැඩි කෙරිණි. 2017 මාර්තු මාසයේදී ප්‍රතිපත්තිමය අනුපාතික මූලික අංක 25 කින් ඉහළ නැංවුණු අතර එමගින් ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතිකය සහ ස්ථාවර ණය පහසුකම් අනුපාතිකය 7.25% සිට 8.75% දක්වා පිළිවෙලින් වර්ධනය විය. අනුක්‍රමයෙන් වාණිජ බැංකුවල තැන්පතු අනුපාතිකය හා ණය අනුපාතිකය සමග සංකලනය වෙමින් වෙළඳපළ පොලී අනුපාතික වර්ෂයේ මුල් භාගය තුළ ඉහළ යන ලදී. මෙම ප්‍රවණතාවය ආපසු හරවමින් කෙටිකාලීන අනුපාතික අඩුවීම් ලෙස ගැලපෙමින් වර්ෂයේ දෙවන භාගය තුළ දේශීය මූල්‍ය වෙළඳපළ තුළ ද්‍රවශීලතා වර්ධනයක් පිළිඹිබු කරන ලදී. 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළ ප්‍රාථමික වෙළඳපලෙහි භාණ්ඩාගාර බිල්පත් මත ප්‍රතිලාභ සීග්‍රයෙන් වර්ධනය විය. අරමුදල් සම්පාදනය සඳහා රජයෙහි ඉල්ලුම ඉහළ යාම ද මීට හේතු විය.

බාහිර අංශය

2017 වසරතුළ දිවයිනෙහි සමුච්චිත අපනයන ඉපයීම් පෙර නොවූ විරූ ඉහළ අගයක් වූ ඇ. ඩො. බිලියන 11.4 ක් වාර්තා කරන ලදී. මෙය 2016 වර්ෂයේ අගයේ සිට 10.2% න වර්ධනයක් වන අතර 2014 වර්ෂයේ දී අත්කරගත් මෙතෙක් පැවති ඉහළම අගය වූ ඇ. ඩො. බිලියන 11.1 ඉක්මවා යාමකි. තේ, පෙට්‍රෝලියම් නිමැවුම්, නිමි ඇඳුම් කුළුබඩු හා මත්ස්‍ය ආහාර මේ සඳහා ප්‍රමුඛ වශයෙන් දායක විය. යුරෝපීය වෙළඳපළට මත්ස්‍ය අපනයනය සම්බන්ධයෙන් පනවා තිබූ සම්බාධක ඉවත් කිරීමත් සහ ජීඑස්පී + බදු සහනය යලි ලබා ගැනීමට හැකිවීම, මෙරට අපනයන ඉපයීම් වර්ධනය කර ගැනීම සඳහා මඟපාදන ලදී. වර්ෂය වෙනුවෙන් අදාළ වූ ආනයන වියදම ඇ.ඩො. බිලියන 20.98 දක්වා 9.4% කින් සීග්‍ර ලෙස වර්ධනය විය. මේ අනුව ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මිල ගණන් මත වැඩි ඉන්ධන, සහල්, රත්රන් සහ මූලික ලෝහ වර්ග ආනයනය හේතු විය. දිවයිනෙහි වෙළඳ පරතරය 2016 දී පැවති ඇ. ඩො. බිලියන 8.87 සිට 9.62 දක්වා වැඩිවීමට ද එය තුඩුදෙන ලදී. ප්‍රමුඛතම විදේශ විනිමය ආදායම් මාර්ගය වූ සේවක ප්‍රේෂණ ද ඇ. ඩො. බිලියන 7.2 දක්වා 1.1% ක ප්‍රතිශතයකින් පහත වැටුණි. මැද පෙරදිග රටවල අහිතර භූගෝලීය හා දේශපාලන තත්ත්වයන් සහ දියුණු ආර්ථිකයන්හි හා නැගී එන වෙළඳපල තුල දක්නට ලැබුණු මන්දගාමී බාහිර ආර්ථික ප්‍රතිසාධනය මීට හේතු වන ලදී.


රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

පෙර වර්ෂයේ වාර්තා වූ ප්‍රතිශතය එනම්, 14.2% සිට දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස අදායම 2017 දී 13.8% දක්වා පහත වැටුණි. බදු නොවන ආදායම 2016 වසරේ වූ 1.9% සිට 1.2% දක්වා අඩු වීම මීට හේතු විය. පුනරාවර්තන වියදම් වල අඩුවීම හේතුකොටගනිමින් 2016 වර්ෂයේ අදාල කාලසීමාවතුල පැවති ප්‍රතිශතය වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් 19.6% සිට 2017 වර්ෂයේ දී මුළු වියදම් සහ ශුද්ධ ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 19.3% දක්වා පහත බසින ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අයවැය පරතරය පසුගිය වසරේ අදාල කාල සීමාවට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයෙන් 5.4% සිට සමාලෝචිත වර්ෂය තුළ 5.5% දක්වා මද වැඩිවීමක් පෙන්වීය.

රාජ්‍ය ණය

දළදේශීය නිෂ්පාදිතයෙන් 79.3% ක ප්‍රතිශතයකින් සමන්විත ශ්‍රී ලංකා රාජ්‍ය ණය කාලපීය සෙසු රටවල් හා සසඳන විට ඉහළ මට්ටමක පවතී. තවද, විශේෂයෙන්ම බාහිර ණය අතින් ගත්විට, දර්ශක ගණනාවකින් ණය කළඹ දුර්වලවී තිබේ. ඉහළ මධ්‍යම ආදායම් තත්ත්වය දක්වා ශ්‍රී ලංකාව පරිවර්ථනයවීම තුල වැඩි වශයෙන් වානිජ ණය කොන්දේසි මත ණය ලබා ගැනීම තුලින් පිරිවැය සහ අවදානම ඉහළ යාම සිදුවී ඇත.


වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය



වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය	2017	2016
කෘෂිකාර්මික	-0.8	-3.8
කාර්මික	3.9	5.8
සේවා	3.2	4.7
දළ දේශීය නිෂ්පාදිතය	3.1	4.5

වාණිජ බැංකුවල ණය හා තැන්පතු අනුපාතික 2017

[%]



ඉදිරි දැක්ම

දළ දේශීය නිෂ්පාදිතය 5% දක්වා වර්ධනයවීමේ අපේක්ෂාව අනුව 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර බවක් උසුලනු ඇති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දැක්මයි. ඉන්දියාව හැරුණුවිට, දේශීය ඉල්ලුම තවදුරටත් ඉහළ මට්ටමේ පවතින අතර අපනයන ව්‍යාපාරයද යළි දියුණුවීම තුළ අප කලාපයේ ආර්ථික වර්ධනය වර්ෂයකට 5.9% ක සාමාන්‍යයක් යටතේ ස්ථාවර බවක් පවත්වා ගනු ඇති බවට අපේක්ෂා කෙරේ.

ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහන් මගින් සහයෝගය ලබන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අනුව සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් රඳවා ගනිමින් මධ්‍ය කාලීන වර්ධන විභවතාවට රුකුල් දෙයි. දැනට සිදුවන අයවැය ස්ථාවරත්වය හමුවේ, රාජ්‍ය ණය ප්‍රමාණය අඩු වනු ඇතැයි අපේක්ෂිතය. එමගින් විභවතා වර්ධනයට සහය වන මානව ප්‍රාග්ධන ආයෝජන කෙරෙහි මහජන ප්‍රතිපාදන වෙන් කිරීමටත් අයවැය පරිමාව වැඩිකර ගැනීමටත් අප රටට හැකි වනු ඇත.

රජය මගින් ආදේශ කරනු ලැබූ විදේශ විනිමය සහන මගින් විදේශ විනිමය අනුපාතිකවල නම්‍යශීලීභාවය තව දුරටත් දියුණු කිරීම සහ ප්‍රාග්ධනයෙහි නිදහස් ප්‍රවාහය දිරිමත් කිරීම සහ තව තවත් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඉවහල් වන හුවමාරු සංචිත මනාව කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. අයවැය පරතරය අඩු කිරීමේ අරමුණ පෙරදැරිව හා බදු අනුකූලතාව සරල කරනු වස් 2017 වර්ෂයේ ඔක්තෝබර් මස සම්මත කර ගන්නා ලද දේශීය ආදායම් පනත මගින් යටිතල පහසුකම් සඳහා ආයෝජන ඇතුළු වර්ධනය ඉහළ නංවාලීමට අවශ්‍ය වියදම් සඳහා සහයක් ලෙස අතිරේක ආදායම් සංචලනයට මග සැලසෙනු ඇත.

තවද, ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම පිණිස සෘජු විදේශ ආයෝජන ප්‍රතිපත්තියකට සිදු කරනු ලබන වෙනස්කම්, අයවැය ස්ථාවරත්වය පිණිස රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම, වඩාත් සංගත අපනයන උපායමාර්ගයක් සම්පාදනය කිරීම, ජාත්‍යන්තර සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම යනාදිය දීර්ඝකාලීන ආර්ථික සංවර්ධනය සහ දිවයිනෙහි වර්ධන විභවතාව කෙරෙහි සැලකියයුතු අන්දමින් බලපානු ඇත.

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී ජාත්‍යන්තර බැංකු 12 ක්, බලපත්‍රලාභී දේශීය වාණිජ බැංකු 13 ක්, සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින් සමන්විත වේ. මෙම ආයතන ඒවායෙහි වත්කම් සංචිතය මත පදනම්ව විශාල, මධ්‍යම හා කුඩා බැංකු ලෙස වර්ගීකරණය කර ඇත. ඉන් ප්‍රමුඛතම බැංකු 6, තැන්පතු, ණය, හා අත්තිකාරම් වත්කම් වලින් බහුතර කොටසකට (රු.බි.500 ඉක්ම වූ වත්කම්) හිමිකම් කියනු ලබයි. ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා ක්ෂේත්‍රය දේශීය නිෂ්පාදිතයෙන් 5.7% කට හිමිකම් කියනු ලබන අතර මූල්‍ය ආර්ථික වර්ධනයට මැදිහත්වීම් තුලින් පහසුකම් සැලසීම අතින් තීරණාත්මක කාර්‍යභාරයක් ඉටු කරලනු ලබයි. රජයේ ප්‍රාදේශීය සංවර්ධන න්‍යාය පත්‍රය අනුව, මූල්‍යමය අන්තර්ග්‍රහණය ඉහළ නැංවීමේ දී වැදගත් භූමිකාවක් රඟ දැක්වීම තුළින් හා දිවයින පුරා ව්‍යාප්තවන පරිදි දරාගත හැකි මූල්‍ය විසඳුම් වෙත ළඟා වීමේ අවස්ථාව සැලසීම තුලින් බැංකු ක්ෂේත්‍රය වැදගත් මෙහෙයක් ඉටු කරලනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්ධනය

ණය සහ ආයෝජන කළඹෙහි ව්‍යාප්තිය හේතුකොට ගනිමින් 2016 වර්ෂයේ දී වාර්තා වූ 10.8% ක වර්ධනයට සාපේක්ෂව 2017 වර්ෂාවසානය වන විට බැංකු ක්ෂේත්‍රයේ සමස්ථ වත්කම් ප්‍රමාණය රු. ට්‍රිලියන 10.3 දක්වා 13.77% තෙක් වර්ධනය විනි. ඉහළ වෙළඳපළ පොලී අනුපාතික මධ්‍යයේ වුවද, ප්‍රවාහන, වෙළඳ, සංචාරක හා නිෂ්පාදන ක්ෂේත්‍රයන් කරා අරමුදල් මුදා හැරීම මගින් 16.2% කින් ඉහළ නැංවුණු සමස්ථ ණය හා අත්තිකාරම් අංශය, බැංකු ක්ෂේත්‍රයේ විශාලතම සංචිතයයි.

ලාභදායීත්වය

2017 වර්ෂයතුල බැංකු ක්ෂේත්‍රය විසින් රු. බිලියන 138.9 ක බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත් විය. මෙය වූ කලී 2016 වර්ෂයේ අදාල කාල සීමට සාපේක්ෂව 19.2% ක වර්ධනයකි. ශක්තිමත් ශුද්ධ පොලී අදායම හා එක්වුණු සැලකියයුතු ප්‍රාග්ධන ලාභ මෙන්ම වඩාත් සාර්ථක පිරිවැය කාර්යක්ෂමතා, මෙම සාධනීය කාර්යසාධනයට ඉවහල් වූ ප්‍රමුඛතම සාධකයන් විය. ක්ෂේත්‍රයෙහි වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ පිළිවෙලින් 2.0% සහ17.6% ක අගයන් සනිටුහන් කරන ලදී.

වත්කම්වල ගුණාත්මකභාවය

2017 දෙසැම්බර් මස අවසාන වන විට සඳහන් වූ අක්‍රීය ණය අනුපාතිකය 2.5% ක් වූ අතර, මෙය 2016 දී වාර්තා වූ 2.6% ට වඩා අඩුවීමකි. අක්‍රීය ණය ප්‍රමාණය රු. බිලියන 160.7 දක්වා රු. බිලියන 18.4 කින් වර්ධනය වීම හමුවේ වුවද, ණය කළඹෙහි ඉහළ වර්ධනය සහ බැංකුව විසින් අනුගමනය කරනු ලැබූ අයකර ගැනීමේ ක්‍රමවේදය අක්‍රීය ණය අනුපාතය පහළ යාමට මූලික වන ලදී.

අරමුදල් තත්ත්වය

අරමුදල් සම්පාදනයෙහිලා ප්‍රධානතම ප්‍රභවය වූ තැන්පතු, බැංකු ක්ෂේත්‍රයෙහි මුළු වත්කම් ප්‍රමාණයෙන් 71.9% ක් නිරූපනය කරනු ලබයි. කාලීන තැන්පතු සඳහා වැඩි වන පොලී අනුපාතික පවතින තත්ත්වක් තුළ 2017 වර්ෂාවසානය වන විට ක්ෂේත්‍රයෙහි මුළු තැන්පතු සංචිතය 17.5% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 7.4 ක් දක්වා වර්ධනය විනි. ක්ෂේත්‍රයෙහි ණය ගැනීම් රු. ට්‍රිලියන 1.6 දක්වා 5.3% කින් අඩු විනි. වර්ෂය තුල ප්‍රතිපත්ති අනුපාතික මූලික අංක 25 කින් ඉහළ නැංවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ නිවේදනයක් සමග රුපියල් ණය ගැනීම්වල සිදු වූ අඩු වීම මීට හේතු සාධක විය.

ප්‍රාග්ධනීකරණය


නව බාසල් 111 නියාමනයන් ක්‍රියාත්මකවීමත් සමග ඉහළ ප්‍රතිශතයක ගුණාත්මක ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් බැංකු ක්ෂේත්‍රය වෙත එල්ල වන පීඩනය ඉහළ ගොස් ඇත. කිසියම් අහිතකර බලපෑම් මගින් එල්ල වියහැකි කම්පන දරාගතහැකි මට්ටමට ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්ථරයක් වර්ෂය පුරාම පවත්වාගෙන යාමට බැංකු සමත්විය. කෙසේ වුවද ණය ව්‍යාප්තියත් සමග මෙම ප්‍රාග්ධන මට්ටම පහත වැටීම පසුව සිදුවිනි. 2016 වර්ෂයේ අදාල කාලසීමාවේ සනිටුහන් වූ 12.6% හා 15.6% බැගින් වූ ප්‍රතිශත වලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්ථර 1 අවදානම් බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය සහ සමස්ථ අවදානම් බර තැබූ ප්‍රාග ්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය පිළිවෙලින් 12.4% සහ 15.2% ලෙස වාර්තා විය.

ද්‍රවශීලතාවය

ක්ෂේත්‍රයෙහි ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක මට්ටමක පවත්වාගනු ලැබූ අතර ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය වන 20% ප්‍රතිශතයට වඩා ඉහළින් 27.2% ක මට්ටමේ පවත්වා ගනු ලැබිණි. මේ අතරතුර ද්‍රවශීල වත්කම් හා මුළු වත්කම් අතර අනුපාතය 28.3% ක් ලෙස වාර්තා විය.


වත්කම් හා ණය වර්ධනය

[%]



තැන්පතු හා ණය ගැනීම් වර්ධනය

[%]



ඉදිරි දැක්ම

පහත දැක්වෙන ප්‍රතිපත්ති සංශෝධන හා මාර්ගෝපදේශ හරහා බැංකුවල ශක්තිමත් බව සුරක්ෂිත කර ගැනීමටත් ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමන සහ අධීක්ෂණ රාමුව සවිමත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. වඩාත් පුළුල් නියාමන අවශ්‍යතා මගින් බැංකුකරණ කටයුතු වල පිරිවැය ඉහළ යෑම ද ණය වර්ධනය මන්දගාමී වීමටද තුඩු දෙනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 සැලසුම් - ප්‍රධාන මුලපිරීම්

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9 (මූල්‍ය උපකරණ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය නිකුත් කර ඇති අතර එය 2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මකය. ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම මත සිදුවන හානිකරණ පිරික්සුම උදෙසා "දැරූ අලාභ ආකෘතිය" වෙනුවට "අපේක්ෂිත අලාභ ආකෘතිය" ආදේශ කිරීම මගින් බැංකුවල හානිකරණ ප්‍රතිපාදන සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට අපේක්ෂිතය.

- බාසල් 111 නියාමන පරිපූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමේ දී, 2019 ජනවාරි මස සිට දේශීය පද්ධති අනුව වැදගත් බැංකු සඳහා අවම සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ප්‍රතිශතය 14% වනු ඇත. මෙලෙස යෝජිත අවම ප්‍රාග්ධන අවශ්‍යතාවල වර්ධනයත් සමග බැංකු වෙත දැඩි පීඩනයක් එල්ල වනු ඇත. වඩාත් ශක්තිමත් හා ක්‍රියාශීලී බැංකු ක්ෂේත්‍රයක් බවට මෙම ක්ෂේත්‍රය පරිවර්ථනය කරනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවා ඇත. අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නැංවීම තුලින් ශ්‍රී ලංකාව තුල බාසල් 111 රාමුව ක්‍රියාත්මක කිරීමටත් බැංකු සතු අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීමටත් මෙන්ම ඒ ඔස්සේ බැංකු ක්ෂේත්‍රයතුල ඒකාබද්ධවීම සඳහාත් මඟ පෑදෙනු ඇත. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 වන දින පටන් ක්‍රියාත්මක වන පරිදි දැනට පවතින බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව පහත පරිදි වනු ඇත.

වත්මන් බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව

බැංකු වර්ගය	අවම ප්‍රාග්ධන අවශ්‍යතාව රු. බි.
දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකු	20.0
දේශීය බලපත්‍රලාභී විශේෂිත බැංකු	7.5

- නව දේශීය ආදායම් බදු හඳුන්වාදීම සිදුකරනු ලැබ ඇත්තේ සෘජු බදු ඉහළ නැංවීමේ අදහසිනි. දැනට පවතින බොහෝ බදු සහන ඉවත් කිරීමත් ඒ සමගින් රාජ්‍ය සුරැකුම්පත් මත පනවන කල්පිත බදු ඉවත්කිරීමත් හා ණය ආපසු ගෙවීම්දී 0.02% ක ගාස්තුවක් හඳුන්වා දීමත් මගින් බැංකුවල බදු වගකීම සැලකියයුතු ලෙස වර්ධනය වනු ඇත.

- ආර්ථිකයෙහි ප්‍රාග්ධන ගනුදෙනු තවදුරත් ලිහිල් කිරීම පිණිස නව විදේශ විනිමය කළමනාකරණයක් හඳුන්වාදීම.

- මූල්‍ය බුද්ධිමය පරිසරය වඩාත් ශක්තිමත් කිරීමේ අදහස පෙරදැරිව ත්‍රස්තවාදය සඳහා අරමුදල් සැපයීම වැළැක්වීමටත් මුදල් විශුද්ධීකරණය වැළැක්වීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ අංශ සවිබල ගන්වනු ලැබීමට නියමිතය.

- 4.6% අතර පරාසයක්තුල උද්ධමනය රඳවා ගැනීමට ඉලක්ක කර ගනිමින් ආර්ථිකයෙහි මිල ගණන්වල ස්ථාවරභාවය සුරක්ෂිත කර ගැනීමට ඉවහල් වන පරිදි සඵලදායී නම්‍යශීලී උද්ධමන ඉලක්කගත රාමුවක් හඳුන්වා දීම.

- දේශීය බැංකුකරණ ඒකකවල වත්කම් පමණක් පදනම් කරගත් පෙර පැවති නියෝග වෙනුවට අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ බැංකුවක මුළු වත්කම් මත පදනම්ව විදේශ විනිමය ණය ගැනීම් සීමා නිසි ලෙස හැඩ ගැන්වීමටත් මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු මත මේ වන විටත් විධාන නිකුත් කර ඇත.

- ගෙවීම් පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම හා අවම වශයෙන් මුදල් මත යැපෙන සමාජයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

- රාජ්‍ය බැංකුවල මෙන්ම රජයේ ශේෂ පත්‍රය මත සාධනීය බලපෑමක් ඇති කරලන පරිදි රජයට අයත් ප්‍රධාන ව්‍යාපාරවල ඉදිරි මූල්‍ය අලාභ අඩු කරලනු වස් රජයට අයත් ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීම කෙරෙහි ඇති රජයේ කැපවීම.

GRI 102-40

ඇල්මැති පාර්ශ්වයන්

අපගේ ඇල්මැති පාර්ශවයන්ගේ නියුතුවීම් ක්‍රියාවලිය

විවිධාංගීකරණය වූ වගකීම් සහගත මූල්‍යමය සේවා සපයන්නෙකු වශයෙන් අප හට අපගේ ඇල්මැති පාර්ශවයන් පවත්වනු ලබන සමීප සම්බන්ධතා බෙහෙවින් වැදගත් වෙයි. අපගේ ඇල්මැති පාර්ශ්වයන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකම් උත්පාදනය කරනු ලබන තිරසාර වර්ධනයක් අත්පත් කර ගැනීම තුලින් ඇල්මැති පාර්ශ්වයන්ගේ ජීවිතවල වෙනසක් ඇති කිරීමටත් මෙන්ම අපගේ මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන ප්‍රජාව තුල යහපත් වෙනසක් ඇති කිරීමටත් අපි කැපවී සිටිමු.

තිරසාර වටිනාකම් නිර්මාණය කරනු පිණිස අප සතු දීර්ඝ කාලීන ව්‍යාපාරික සැලසුම් අපගේ ඇල්මැති පාර්ශවයන් උනන්දුව දක්වන අංශ හා යා කර තිබේ. ඇල්මැති පාර්ශ්වයන් හා සඵලදායී නියුතුවීම් මගින් දිගුකල් පවතින සම්බන්ධතා ගොඩනැගීමට ද වඩාත් සාර්ථක සේවාවක් සැලසීම මෙන්ම වඩාත් යහපත් අත්දැකීම් ඇල්මැති පාර්ශවකරුවන් හට ලබා දීමට ද අවස්ථාව උදාවේ. සංවාදතුලින් ලබාගත් ඇල්මැති පාර්ශ්වයන්ගේ ප්‍රතිචාර, එකිනෙකා හා සහයෝගයෙන් කටයුතු කිරීම හා වෙනත් ක්‍රමවේද (පහතින් දක්වා ඇති), අපගේ ව්‍යාපාර පුරා ව්‍යාපත්ව ඇති සමාජයීය, පාරිසරික, යහපාලන අවදානම් හා අවස්ථා ඇගයීමට ලක් කරන අතරම ඇල්මැති පාර්ශවයන්ගේ අභිමතාර්ථ ඉටු කිරීමට ද අපට උපකාරී වේයි.

අපගේ ඇල්මැති පාර්ශවයන්ගේ නියුතුවීම් ක්‍රියාවලිය අවස්ථා තුනකින් සමන්විත වේ.

1 ඇල්මැති පාර්ශව හඳුනාගැනීම

2 ප්‍රධාන ඇල්මැති පාර්ශවයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛත්වය ලබා දීම

3 නියුතුවීම් ක්‍රමවේද



ඇල්මැති පාර්ශ්ව හඳුනාගැනීම


ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි උනන්දුව දක්වන පුද්ගලයන් සහ ආයතන විවිධත්වයෙන් යුක්තය. අපගේ ඇල්මැති පාර්ශවයන් වන්නේ, අපගේ ක්‍රියාකාරකම්, නිමැවුම් හා සේවාවන් බලපානු ලබන එමෙන්ම අනෙක් අතට අපගේ මෙහෙයුම්, උපාය මාර්ග, හැසිරීම සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි උනන්දුවන කණ්ඩායම් සහ පුද්ගලයින්ය. අප විසින් නිරතුරුව සම්බන්ධතා ගොඩනගා ගැනීමට සහ පවත්වා ගැනීමට වෙර දරන ඇල්මැති පාර්ශව අයත්වන පුළුල් කණ්ඩායම් හයක් පහත පරිදි අප විසින් හඳුනා ගනු ලැබ ඇත.

කොටස් කරුවන්	ගනුදෙනුකරුවන්	සේවකයින්	නියාමකයින් සහ රාජ්‍ය ආයතන	සැපයුම් කරුවන් සහ සේවා සපයන්නන්	සමාජය හා පරිසරය

GRI 102-42

ප්‍රධාන ඇල්මැති පාර්ශ්ව හඳුනාගැනීම සහ ප්‍රමුඛත්වය ලබා දීම

බැංකුවේ කටයුතු සඳහා ඔවුන්ගේ දායකත්වය පදනම් කරගනිමින් අප විසින් අපගේ ඇල්මැති පාර්ශ්වයන් ප්‍රමුඛතා අනුපිළිවෙලින් හඳුනාගෙන තිබේ. ඇල්මැති පාර්ශවයන් උදෙසා වටිනාකම් නිර්මාණය කරනු පිණිස මෙන්ම ඒ ඒ ඇල්මැති පාර්ශවයන් අතර පැන නගින ගැටුම්කාරී විය හැකි ප්‍රමුඛතා තුලනය කිරීම පිණිස අපගේ ඇල්මැති පාර්ශ්වයන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් පිළිබඳ අපි නිරන්තර අධීක්ෂනයෙන් යුතුව පසු වෙමු. "මෙන්ඩෙලොව්" අනුකෘතිය ප්‍රස්ථාර උපයෝගී කර ගනිමින් අපගේ ප්‍රධාන ඇල්මැති පාර්ශ්ව හඳුනා ගැනීම සිදුකරනු ලැබේ.



නියුතුවීමේ ක්‍රමවේද

ඇල්මැති පාර්ශ්වයන්ගේ නියුතුවීම් වූ කලී අපගේ දීප ව්‍යාප්ත ව්‍යාපාරික කටයුතු, අපගේ උපායමාර්ග, වාර්ෂික වාර්තාකරණ ක්‍රියාවලිය සහ ක්‍රියාකාරකම්හි ප්‍රමුඛතම අංගයකි. නියුතුවීමේ ක්‍රමෝපායයන් දේශීය, කලාපීය හා ජාතික මට්ටමේ කණ්ඩායම් හා රැස්වීමේ සිට අපගේ ගනුදෙනුකරුවන් හා සැපයුම් කරුවන් සමගින් අඛණ්ඩව සංවාදයක් පවත්වා ගැනීම දක්වා පරාසයකට අයත් වෙයි. විවිධ වූ අපගේ ඇල්මැති පාර්ශ්ව වෙත සක්‍රීය සවන්දීම, ඔවුන් සමගින් විවෘත සංවාදයන්ට එළඹීම හා ඔවුන්ගේ අදහස් හා ගැටළු වලට ප්‍රතිචාර දැක්වීම අපි ඉතා වැදගත් කොට සලකමු.

එක් එක් ඇල්මැති පාර්ශ්වයන්ට අදාල ප්‍රධාන අංශවල සාරාංශයක් සහ 2017 ව ර්ෂයේ දී අපගේ ඇල්මැති පාර්ශ්වයන්ගේ නියුතුවීම් හෙලි කරන වගුවක් පහත දැක්වේ.



ගනුදෙනුකරුවන්

- තනි පුද්ගලයින්
- ආයතන
- සමාගම්
- ව්‍යවසායකයින්



සේවා නියුක්තිකයන්

- ස්ථිර සේවකයින්
- කොන්ත්‍රාත් සේවකයින්
- බාහිර ආයතන හරහා සේවය ලබාගන්නා සේවකයින්
- වෘත්තීය සමිති



කොටස් හිමියන්

- මුදල් අමාත්‍යාංශය විසින් නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා රජය



සැපයුම් කරුවන් හා සේවා සපයන්නන්

- සැපයුම්කරුවන්
- උපයෝගීතා සේවා සපයන්නන්
- වෙනත් සේවා සපයන්නන්



නියාමකයින් සහ රාජ්‍ය ආයතන

- ශ්‍රී ලංකා මහ බැංකුව
- පොදු ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- විගණකාධිපති දෙපාර්තමේන්තුව
- වෙනත් රාජ්‍ය හා වෘත්තීය ආයතන



සමාජය හා පරිසරය

- සමස්තයක් වශයෙන් සමාජය
- පීඩනයක් එල්ල කරන කණ්ඩායම්
- මාධ්‍ය

නියුතුවීමේ ක්‍රමවේදය	නියුතුවීමේ වාර ගණන									අවශ්‍යතා හා අපේක්ෂා
	අවශ්‍ය පරිදි	නිරතුරුව	වරින්වර	වාර්ෂිකව	කාර්තුමය වශයෙන්	මාසිකව	සතිවශයෙන් වරක්	නිතිපතා කළ පරිදි	අඛණ්ඩව	
එක් පුද්ගලයෙකු ඉලක්ක කරගත් සම්මුඛ සාකච්ඡාවක්	●									විශිෂ්ඨ ගනුදෙනුකාර සේවාව, දීප ව්‍යාප්ත පිවිසුම් පහසුව, අවම සංකීර්ණත්වය හා වැඩි නම්‍යශීලිත්වය, නවීන මූල්‍ය සේවා/විසඳුම්, මුදල්මය බැංකුකරණය සඳහා වටිනාකමක්, වගකීම් සහගත බැංකුකරණ සේවා, රහස්‍ය භාවය, විශ්වාසනීයත්වය සහ වගවීම, සිය ආයෝජන සඳහා, සුරක්ෂිතතාව සිත්ගන්නා සුළු සේවා සැපයුම් ස්ථාන
ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන	●									
ඇමතුම් ස්ථාන	●									
ආයතනික අවස්ථා	●									
ආයතනික වෙබ් අඩෙවිය	●									
ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්		●								
ආයතනික සමාජ වගකීම් හා බැඳුනු ක්‍රියාකාරකම්	●									
ප්‍රවර්ධනාත්මක වැඩසටහන්			●							
මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය	●									
සමාජ මාධ්‍ය ජාලා		●								
විධිමත් රැස්වීම්			●							තරඟකාරී පාරිශ්‍රමික ව්‍යුත්තීය සංවර්ධනය හා ප්‍රගතිය ඵලදායී කාර්යසාධන කළමනාකරණය සම අවස්ථා ආරක්ෂිත ධනාත්මක හා දිරිගන්වන සුළු රාජකාරී පරිසරය ව්‍යුත්තීය හා ජීවන සමබරතාව සාමූහික කේවල් කිරීම හඳුනා ගැනීම හා දිරිගැන්වීම දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම ක්‍රමවේදය පුද්ගලික හා ව්‍යුත්තීයමය වශයෙන් වර්ධනයවීමට අඛණ්ඩ පුහුණු අවස්ථා රැකියා සුරක්ෂිතතාව අනුප්‍රාප්තික සැලසුම
අවිධිමත්/එක්වරම කැඳවනු ලබන රැස්වීම්	●									
සමාලෝචන රැස්වීම්	●									
කාර්යසාධන ඇගයීම්			●							
අභ්‍යන්තර විවරනිකාව					●					
මෙහෙයුම් කටයුතු පිළිබඳ චක්‍රලේඛ හා උපදෙස්	●									
පුහුණු වැඩසටහන්		●								
අභ්‍යන්තර පරිගණක ජාලය		●								
සුභසාධන අවස්ථා හා ක්‍රියාකාරකම්		●								
සාමූහික ගිවිසුම් මත කේවල් කිරීම							●			
වාර්ෂික වාර්තාව				●						තිරසාර කාර්යසාධනය තිරසාර ඉදිරි ගමනකට උපාය මාර්ග රාජ්‍ය සුරැකුම්පත් හා ව්‍යාපෘතිවල ආයෝජන ආයතනික යහපාලනය අවදානම් කළමනාකරණය නීති හා රෙගුලාසිවලට අනුකූලවීම රජයට දක්වන දායකත්වය
මූල්‍ය ප්‍රකාශන					●					
ආයතනික වෙබ් අඩවිය		●								
මාධ්‍ය ප්‍රකාශන හා පුවත්පත් නිවේදන	●									
ප්‍රසම්පාදන සැලසුම				●						ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම කාලීන ගෙවීම් ප්‍රසම්පාදන පරිචයන්හි විනිවිදභාවය වගකීම් සහගත ප්‍රසම්පාදන බාහිර සේවය ලබා ගැනීම ඉදිරි ව්‍යාපාරික අපේක්ෂා, විශ්වාසනීයත්වය හා වගකීම්සහගතබව දීර්ඝ කාලීන හවුල් කරුවන් ගනුදෙනු කිරීමේ පහසුව තිරසාර ව්‍යාපාරික සබඳතා
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	●									
සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් සමග රැස්වීම් ක්‍රියාවලිය	●									
ක්ෂේත්‍ර පරීක්ෂාව	●									
ටෙන්ඩර් නිවේදන	●									
නිමැවුම් නිරූපනය	●									
තොරතුරු/නිවේදන ප්‍රකාශයට පත් කිරීම	●									
විධාන හා චක්‍රලේඛ										බැංකුවේ කාර්ය සාධනය සියළු නෛතික හා රෙගුලාසිමය අවශ්‍යතා හා අනුකූලවීම ක්ෂේත්‍රයෙහි හා නියාමන අංශයේ රාජකාරී කණ්ඩායම්වලට දක්වන සක්‍රීය දායකත්වය වගකීම් සහගත බදු ගෙවන්නෙකුවීම යහපාලන පරිචයන් අවදානම් කළමනාකාරිත්වය තිරසාර ව්‍යාපාරික පරිචයන්
මූල්‍ය ප්‍රකාශන						●		●		
ව්‍යවස්ථාපිත පරීක්ෂණ			●							
නියාමන පරීක්ෂණ	●									
නියාමකයින්ගේ නියෝජිතවරුන් සමග සම්මුඛ සාකච්ඡා/	●									
රැස්වීම් කාර්මික හමු/රැස්වීම්	●									
ක්ෂේත්‍රගත සුපරීක්ෂණය	●									
සේවා සැපයුම් මාධ්‍ය									●	සමාජ වගකීම් හා සම්බන්ධ ක්‍රියාකාරකම් රැකියා අවස්ථා මූල්‍යමය අතින් අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ප්‍රජා සංවර්ධනය සදාචාර සම්පන්න ව්‍යාපාර ක්‍රියාවලින්
ආයතනික වෙබ් අඩවිය									●	
ඇමතුම් මධ්‍යස්ථානය									●	
පුවත්පත් නිවේදන	●									
සම්මන්ත්‍රණ හා මාධ්‍ය වැඩසටහන් අනුග්‍රාහකත්ව	●									
මහජන සම්බන්ධතා හා ක්‍රියාකාරකම්	●									
රාජ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම	●									
ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති	●									

අපගේ ඇල්මැති පාර්ශ්වයන් වෙනුවෙන් වටිනාකම් උත්පාදනය කිරීම

ජා.ඉ.බැ. සමාජ - ආර්ථික පරිසර පද්ධතියක කොටස්කරුවෙකු බැවින් අප කෙරෙහි උනන්දුව දක්වන පාර්ශ්ව සමඟ පවත්වනු ලබන මනා සම්බන්ධතා මත අපට යැපීමට සිදු වන බව අප විසින් වටහා ගෙන ඇති කරුණකි. ඇල්මැති පාර්ශ්වයන්ගේ භූමිකාව අප අගය කරනු ලබන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ජනිත කරවන බලපෑම් සහගත සම්බන්ධතා පෝෂණය කර ගැනීමට අපි කැපවී සිටිමු.

මෙම කාරණා සැලකිය යුතු වන්නේ ඇයි	අප විසින් වටිනාකම් උත්පාදනය කරනු ලබන ආකාරය			
ගනුදෙනුකරුවන්	ගනුදෙනුකරුවන් අපගේ ව්‍යාපාරයෙහි කේන්ද්‍රස්ථානය වන අතර ඔවුන් ලාභදායී හා තිරසාර ව්‍යාපාරයක් ඇති කරගනු පිණිස අවශ්‍ය පදනම සපයයි. ණය ගනුදෙනු මූල්‍යනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් මූලාශ්‍ර ගනුදෙනුකරුවන් විසින් ලබාදෙයි.	තැන්පතු හා ආයෝජන ආරක්ෂා කර ගන්නා අතරම ප්‍රතිලාභ වර්ධනය කිරීම	වඩාත් කාර්යක්ෂම සේවා මාධ්‍යයන් ඉදිරිපත් කිරීම සහ වඩාත් අඩු මිලට වඩාත් පහසුදායී බැංකුකරණ විසඳුම් සැපයීම	අපගේ ගනුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලිය හැකි නවීන විසඳුම් වර්ධනය කිරීම
සේවකයන්	අපගේ ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන්නේ අපගේ සේවක සාමාජිකයන්ගේ කුසලතා, අත්දැකීම් හා ක්‍රියාකාරකම් මගිනි. අපගේ සේවකයන් රාජකාරිය පිළිබඳ සිතන පතන හා හැඟෙන ආකාරය, ගනුදෙනුකාර තෘප්තිමත්භාවයේ මට්ටම හා ඍජුවම බැඳී පවතී.	අපගේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ප්‍රජාව වෙතින් පුද්ගලයින් බඳවා ගැනීම.	ඔවුන් විසින් එකතු කරන ලබන වටිනාකම් උදෙසා ආකර්ෂණීය පාරිශ්‍රමික හා ප්‍රතිලාභ පිරිනැමීම. කුසලතා, පුහුණුවීම් සහ සංවර්ධන මූලපිරීම් ක්‍රියාත්මක කිරීම. අපගේ ශ්‍රම බලකාය අභිප්‍රේරණය කිරීම හා වඩාත් දිරිගැන්වීම	
කොටස් හිමියන්	එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය, ආර්ථිකයෙහි මූල්‍ය ස්ථාවරත්වය හා අභියෝගවලට මුහුණදීමේ හැකියාව ඉහළ නැංවීමට ප්‍රධාන දායකත්වය සපයන්නෙකු ලෙස බැංකුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරයි.	අපගේ ආයතනික බදු, සේවක මණ්ඩලයේ උපයන විට බදු ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනයෙහිලා සහභාගීත්වය තුළින් රාජ්‍ය අයවැය සඳහා අර්ථාන්විතව දායකවීම.	වර්ධනය වන ආදායම් උපයෝගී කර ගනිමින් තිරසාර මූල්‍ය ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීම (පාරිසරික සීමාවන්ට ගරු කරන අතරතුර). අපගේ පිරිවැය පදනම ප්‍රශස්තකරණය කරමින් අවදානම් කළමනාකරණය කිරීම සහ අපගේ වියදම් කළමනාකරණය කිරීම.	අලාභ ආශ්‍රිත අවදානමට එරෙහිව විශ්වාසය හා ආරක්ෂාව ස්ථාපිතවන පරිදි සුරක්ෂිත හා ස්ථාවර බැංකුකරණ පද්ධතියක් සඳහා දායක වන ශක්තිමත් ශේෂපත්‍රයක් පවත්වා ගැනීම.
නියාමකයින් සහ රාජ්‍ය ආයතන	බැංකුකරණ ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය බලපත්‍ර සැපයීම.	ආරක්ෂිත හා ස්ථාවර බැංකුකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවැසි තිරසාර බැංකුකරණ පරිචයන් සහ නියාමන අනුකූලතා උපයෝගී කර ගැනීම.	පද්ධතියක අවදානම් අවම කරලීම පිණිස නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම. බැංකුව කෙරෙහි ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය සහතික කිරීම හා කීර්තිනාමයට අවදානමක් සිදු වීමට ඇති ඉඩකඩ අඩුකිරීම	කාලෝචිත හා විස්තරාත්මක නියාමන යාවත්කාලීන කිරීම් හා හෙළිදරව් කිරීම් සැපයීම.
සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්	අපගේ මෙහෙයුම් සංවර්ධනය කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය විශේෂඥ උපකාරක සේවා සහ උපකරණ සපයනු ලබයි. අපගේ හැකියාව මත බලපෑම් කළ හැකි භාණ්ඩ හා සේවා පිරිවැය කාර්යක්ෂම කිරීම.	සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ මනා, අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභජනක සම්බන්ධතා පවත්වා ගැනීම.	ප්‍රධාන පෙළේ සැපයුම්කරුවන් සමඟ ඍජු සන්නිවේදනයක් නිරන්තරයෙන් පවත්වා ගැනීමට හැකි අවම කාලසීමාව තුළ කොන්ත්‍රාත් ලබාදීම සහ ගෙවීම් අප්‍රමාදීව සිදු කිරීම.	
පරිසරය හා සමාජය	සමාජයීය වශයෙන් අපගේ අදාළත්වය, ආයතනයක් ලෙස අපගේ රඳා පැවැත්මට සහ සාර්ථකත්වයට අනිවාර්ය පදනම වන අතර එය අපගේ අභිමතාර්ථය හා දැක්මට පාදක වන සාධකයකි. දීර්ඝකාලීනව ගත්විට ව්‍යාපාරයේ අඛණ්ඩ ස්වශක්තතාවය පිළිබඳ එමගින් සහතික කෙරෙයි. අපගේ ඉලක්කය අපගේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ප්‍රජාව සහ පරිසරය වෙත ධනාත්මකව හා හිතකර ලෙස දායක වීමයි.	ආර්ථිකමය අගය හුවමාරු කර ගැනීමෙහිලා ප්‍රධාන වන ගනුදෙනුවලට අවශ්‍ය ප්‍රධාන රුකුළක් බවට පත්වීම.	උත්පාදනය කරනු ලබන ස්ථාවර හා ස්ථිර රැකියා, සමාජ සංවර්ධනයට සහ ජීවන මට්ටම නංවාලීමට ඉවහල් වෙයි.	බලශක්ති කාර්යක්ෂමතාව සහ පාරිසරික සංරක්ෂණය ප්‍රවර්ධනය කරනු පිණිස නිමැවුම් හා සේවාවන් හඳුන්වාදීම.

2017 වර්ෂයේ දී අප වටිනාකම් නිර්මාණය කළ ආකාරය

නව ණය ප්‍රදානය කිරීම් රු. බි. 187.3 දක්වා ව්‍යාප්ත කිරීම සිදු විනි. අපගේ තැන්පත්කරුවන් හට රු. බි. 60.2ක පොළී අප විසින් ගෙවන ලදී. ශාඛා හා සම්බන්ධීකම් වඩාත් පහසු හා ගුණාත්මකබව අතින් එක හා සමාන බව අන්තර්ජාල බැංකුකරණ	හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මඟින් මුදල් හාරග ැනීම් සිදු කරන අතරතුර අපගේ ශාඛා ජාලය 253 දක්වා ඉහල නංවන ලදී. අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන නවීන විසඳුමක් ලෙස සහ දරාගත හැකි මිල ගණන් සහිත නිමැවුම් සඳහා ප්‍රවේශය	සැපයීමෙන් මූල්‍ය අන්තර්ග්‍රහනයට අවස්ථාව සැලසෙන පරිදි 'අයිසේවර්' හඳුන්වාදෙන ලදී. CEFTS ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ගෙවීම් සිදු කිරීම හරහා ගෙවීම් ප්‍රමාදයන් අවම කෙරිනි. 'ලංකා පේ' සම්බන්ධතාව ඔස්සේ ගනුදෙනුකාර සේවා ස්ථාන වර්ධනය කෙරිණි.
ස්ථීර හා කොන්ත්‍රාත් සේවක කාණ්ඩ වලට නව රැකියා අවස්ථා 216 ක් උත්පාදනය කිරීම. සමස්ථ වටිනාකම් බෙදාහැරීම සැලකුවිට ඉන් 6.4% ක් නිරූපණය වන පරිදි සේවකයන් හට රු. බි. 6.9 ක අගයට සරිලන වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීම.	පුහුණු හා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු. මි. 34.4ක් ආයෝජනය කිරීම. ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 58% දක්වා වර්ධනය වීම. වයස අවු. 30ට වඩා අඩු තරුණ පරපුර 38% ක් නියෝජනය කරනු ලබන අප සේවක මණ්ඩලය හේතුවෙන් අප විසින්	ආරම්භ කරන ලද ඩිජිටල් පරිවර්තනයට මුහුණදීමේ දී අප ආයතනය වඩාත් හොඳින් ස්ථානගත කෙරෙයි.
බදු හා ගාස්තු යනාදියෙන් අප විසින් රජයට දක්වන ලද දායකත්වය රු. බි. 8.3 ක් වූ අතර එය සමස්ත වටිනාකම් ව්‍යාප්තියෙන් 7.7% කි. මීට අමතරව, රජය විසින් ලාභාංශ වශයෙන් රු. බි. 5.1 ක් ලබා ගන්නා ලදී.	උසස් මට්ටමේ මූල්‍ය ප්‍රතිඵල වාර්තා කරන ලදී. එනම්, බදු පෙර ලාභය 5% කින් වර්ධනය විණි. මුළු වත්කම් ප්‍රමාණය රු. ට්‍රිලියනය ඉක්මවන ලදී. පිරිවැයට ආදායම අනුපාතය 38% දක්වා පහත බසින ලදී.	
අඛණ්ඩව 15 වන වරටත් ෆිච් රේටින්ග්ස් ලංකා වෙතින් ත්‍රිත්ව 'ඒ' ශ්‍රේණිගත කිරීම හිමිකර ගන්නා ලදී. රු. බි. 7.9 ක බදු දායකත්වයක් සැපයීම. රජයේ අරමුදල් සැපයීමේ අවශ්‍යතාවලට සහය වශයෙන් 60% කට වඩා රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කිරීම.	අනුකූලතා අවදානමක් කිසි විටෙකත් උද්ගත නොවන පරිදි කටයුතු කිරීමේ ප්‍රවේශයක් අප විසින් යොදාගැනිනි. ශ්‍රී ලංකා මහ බැංකු අවශ්‍යතාවය වන 7.75% ඉක්මවා 11.93% ක ස්ථර I අනුපාතයක් රඳවා ගනිමින්, බාසල් III අවශ්‍යතා වල ප්‍රධාන අංග සියල්ල හා අනුකූලවීම හෝ ඒ සම්බන්ධයෙන්	ප්‍රගතියක් අත්කර ගැනීම එමෙන් ම 2017 ශ්‍රී ලංකා මහ බැංකු අවම (සියලු මුදල් වර්ග) අවශ්‍යතා ඉලක්කය වූ 80% ක් ඉක්මවා අප විසින් 376.18% ක් ද්‍රවශීලතා ආවරණ අනුපාතය අතින් අප ලඟා වී ඇති අතර 2018 වන විට NSFR අනුකූලතා සැපයීම අතින් 100% ක් සපුරාලීමේ ඉලක්කය වෙත දැනටම පා නගමින් සිටී.
විදුලිය, ජලය සහ විදුලි සංදේශ සැපයුම්කරුවන් ඇතුළත්ව අපගේ උපයෝගීතා සේවා සැපයුම් වෙනුවෙන් අප විසින් රු.මි. 295 ක ගෙවීමක් සිදු කර ඇත. අපගේ සැපයුම්කරුවන්ගෙන් 100%ක් ම දේශීය සැපයුම්කරුවෝ වෙති.		
රු.මි. 19.14 ක් ඉක්මවූ යටිතල පහසුකම් මූල්‍යනය බැඳීම් වාර්තා කරන ලදී. නිවාස 6486 ක් සඳහා මූල්‍යනය අප විසින් සම්පාදනය විය. ගනුදෙනුකරුවන්ට සිය විදුලිබිල අවම කර ගැනීමටත් බලශක්ති සංරක්ෂණයටත් ඉවහල් වන අන්දමේ	ණය නිමැවුම් ලෙස නිවාස වලට සූර්යශක්ති සවි කිරීමට ණය සැපයීම සඳහා පුනර්ජනනීය බලශක්ති ණය 902 ක් පිරිනැමිණි. ප්‍රජා සංවර්ධනය ව්‍යාපෘති සඳහා වෙන් කෙරුණු ආයෝජනය රු. මි. 20.4 කි.	අපගේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හා ප්‍රතිලාභ හිමිකරුවන් පිළිබඳ විස්තරාත්මකව පිටු අංක 135 මඟින් දක්වේ. එන්.එස්.බී. 'ඇග්‍රෝ ෆොරස්ට්‍රි' ව්‍යාපෘතිය යටතේ පැළ 25,000 ක් දිවයින පුරා බෙදා හැරිණි.

2018 හා ඉන් ඔබ්බට ඉදිරි දැක්ම

ගනුදෙනුකරුවන් කේන්ද්‍රීත අපගේ උපායමාර්ග තුළින් සරල, පහසු, කාර්යක්ෂම සේවාව, නවීන නිමැවුම් සහ තරඟකාරී ලෙස මිල නියම කරන ලද නිමැවුම් ඔස්සේ වඩාත් උසස් ගනුදෙනුකාර අත්දැකීම් සැපයීමට අප කැපවී සිටිමු. වඩාත් දියුණු විශ්ලේෂණයන්, පාරිභෝගික අත්දැකීම් සැලසුම්කරණය, සඵලදායී	ව්‍යාපාර කළමනාකරණය සහ වඩාත් ආකුමණශීලී වෙළෙඳපොළ සහ වාණිජකරන ප්‍රවේශයන්ට අදාළ අපගේ ශක්‍යතාවයන් ගොඩනගා ගනිමින් ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය හා සේවා අත්දැකීම් වැඩිදියුණු කිරීමට අපි ඉලක්ක කරමු.
අපගේ අවධානය යොමු වන්නේ අපගේ ප්‍රබෝධවත්, ක්‍රියාශීලී කණ්ඩායම් උපාය මාර්ගය හරහා අපගේ සේවක නියුතුවීමෙහි සඵලදායී බව ඉහළ නැංවීමටත් එමඟින් සේවක අත්දැකීම් නිති සංවර්ධනයටත්ය.	
ශක්තිමත් හා ලාභදායී ව්‍යාපාරක් මඟින් අපගේ සේවක මණ්ඩලය හා මෙහෙයුම් මත අඛණ්ඩ ආයෝජනයන් සිදු කිරීමේ පෙළඹුම් ඇති කරලන අතර එහි ප්‍රතිඵල ලෙස සමස්තයක් වශයෙන් අප සමාජයට හා	ගනුදෙනුකරුවන් හට වටිනාකම් උත්පාදනය කෙරෙනු ඇත. අවදානම් හා අනුකූලතා සංස්කෘතිකමය උපාය මාර්ග උපයෝගී කර ගැනීම තුළින් තිරසාර කාර්ය සාධනයක් ජනිත කරවීමට අප අඛණ්ඩව නියැලෙන්නෙමු.
අප විසින් බොහෝ වූ නියාමන හා අනුකූලතා අවශ්‍යතා කාලීනව ක්‍රියාත්මක කරන්නෙමු.	සක්‍රීය ප්‍රාග්ධන කළමනාකරණ සහ අවදානම් හා අනුකූතා උපාය මාර්ගය තුළින් රජය සහ නියාමන ආයතන සමඟින් සක්‍රීයව සහ පාරදෘශ්‍යභාවයෙන් යුතුව කටයුතු කිරීම අපගේ ප්‍රයත්නයයි.
වගකීම් සහගත හා සමාජයීයව කැපවුණු බැංකුවක් වීම තුළින් විශිෂ්ඨත්වය සඳහා උත්සාහ දරන වගකිවයුතු ආයතනයක් ලෙසින් අපගේ සැපයුම්කරුවන් සමඟ සහයෝගී සම්බන්ධතාවයක් අඛණ්ඩව පවත්වා ගනිමු.	
අපගේ ආයතනික පුරවැසිභාවය අනුව අප ව්‍යාපාර සඳහා යොදවන සම්පත් වගකීමෙන් යුතුව හැසිරවීමටත් සමාජයේ අවශ්‍යතා සමඟ අප අවශ්‍යතා තුලනය කර ගැනීමටත් අපි කැප වෙමු.	සමාජයීයව කැපවුණු හා වගකීම් සහගත වූ අප බැංකුවේ උපාය මාර්ග හරහා තිරසාර බවට අදාල පරිචයන්ට යොමු වූ අවධානය වැඩි දියුණු කිරීමෙහි අපි අඛණ්ඩව නිරත වන්නෙමු.


GRI102-11 GRI 103-1, 2, 3

ප්‍රමාණාත්මක කරුණු, අවදානම් සහ අවස්ථා

සමාජ - ආර්ථික සහ පාරිසරික බලපෑම් හමුවේ බැංකුව විසින් යන ගමන් මග හෙළි කරන ජා.ඉ. බැංකුවේ කළමනාකරණ ප්‍රවේශ ආකෘතිය මෙම පරිච්ඡේදය මගින් ගෙන හැර පායි. එහි දී බැංකුවේ ප්‍රමාණවත් බවට අදාළ කරුණු තීරණය කරනු ලබන හා ඒ පිළිබඳ සාකච්ඡාවට බඳුන් කෙරෙන ක්‍රියාවලියද සැකෙවින් දක්වා ඇත.

ව්‍යාපාරකරණය පිළිබඳ අපගේ ඒකාබද්ධ ප්‍රවේශයට අනුව අප ප්‍රමාණවත්බව දකින්නේ උපයෝගී කරගන්නා මෙවලමක් වශයෙනි. කෙටි, මධ්‍ය හා දිගුකාලීනව වටිනාකම් උත්පාදනය කිරීම පිණිස අප සතු හැකියාවට වැඩිම බලපෑමක් ඇති කරලන කරුණු අපගේ ප්‍රමාණවත්බවට අදාළ කරුණු මගින් දැක්වේ. පරිණාමය වන ඇල්මැති පාර්ශ්වයන්ගේ අවශ්‍යතාවයන් හා පැනනගින නව ප්‍රවණතා හා සංවර්ධනයන් ප්‍රමාණවත්බවට අදාළ කරුණු තීරණය කරනු ලබයි.

අපගේ වාණිජ ස්වශක්‍යතාව, සමාජමය භූමිකාව, සහ ඇල්මැති පාර්ශ්වයන් හා අප සතු සම්බන්ධතාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරලීමට හැකියාවක් ඇත්නම් එම සාධකය ප්‍රමාණවත් බවට අප සලකනු ලබයි. ප්‍රමාණවත් බව හඳුනාගැනීමේ හා තීරණ ගැනීමේ අපගේ ක්‍රියාවලියට අප ව්‍යාපාර ආකෘතිය (පිටු අංක 34), අපගේ මෙහෙයුම් පරිසරය (පිටු අංක 37), ඇල්මැති පාර්ශව නියුතුවීම් (පිටු අංක 48), මෙන්ම අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළින් පැන නගින කරුණු ද (පිටු අංක 201) ඇතුළත් වේ.




ව්‍යාපාරයට සහ ඇල්මැති පාර්ශ්වයන්ට බලපානු ලබන මට්ටමේ වැදගත්කම අනුව සහ එකිනෙක අතර පවතින සම්බන්ධතාවන්ගේ ප්‍රමාණය අනුව ප්‍රමුඛතා ලැයිස්තුගත කරන ලද ප්‍රමාණවත්බව අධ්‍යයනය තුළින් අප විසින් හඳුනාගත් ජා.ඉ. බැංකුවට බෙහෙවින්ම බලපාන සාධක මෙම ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රස්තාරය මගින් දක්වා ඇත. බැංකුවේ හඳුනාගත් සැලකිය යුතු අංග, ගෝලීය වාර්තාකරණ දර්ශක ප්‍රමිතීන් මඟින් මෙන්ම ගෝලීය වාර්තාකරණ දර්ශක ප්‍රමිතීන් නොවන නිර්දේශිත මාතෘකා හා සැසඳෙන අයුරු මෙහිලා නිරූපිතය.

GRI 102-47

ගෝලීය වාර්තාකරණ මූලපිරීම් දර්ශක	බැංකු මෙහෙයුම් වලට ඇති වැදගත්කම	සීමාව	ප්‍රමාණවත් බව	
			බැංකුවට	ඇල්මැති පාර්ශ්වයන් හට
ගෝ.වා. මූ. දර්ශක 200 - ආර්ථික				
201 ආර්ථික කාර්ය සාධනය	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
202 වෙළඳපළ නියෝජනය	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
203 වක්‍ර ආර්ථික බලපෑම	වැඩි	ප්‍රජාව	වැඩි	වැඩි
204 ප්‍රසම්පාදන පරිචයන්	අඩු	අභ්‍යන්තර	වැඩි	අඩු
205 දූෂණ විරෝධී බව	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
206 එදිරි තරඟකාරී හැසිරීම	අඩු	ප්‍රජාව	අඩු	අඩු
ගෝ.වා. මූ. දර්ශක 300 - පාරිසරික				
301 ද්‍රව්‍ය	අඩු	අභ්‍යන්තර	අඩු	අඩු
302 බලශක්තිය	සාමාන්‍ය	අභ්‍යන්තර	සාමාන්‍ය	සාමාන්‍ය
303 ජලය	සාමාන්‍ය	අභ්‍යන්තර	සාමාන්‍ය	සාමාන්‍ය
305 විමෝචන	අඩු	අභ්‍යන්තර	සාමාන්‍ය	සාමාන්‍ය
306 අපවාහන සහ අපද්‍රව්‍ය	සාමාන්‍ය	පාරිසරික	අඩු	සාමාන්‍ය
307 පාරිසරික අනුකූලතාව	අඩු	පාරිසරික	අඩු	සාමාන්‍ය
ගෝ.වා. මූ. දර්ශක 400 - සමාජයීය				
401 සේවා නියුක්තිය	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
403 වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව	සාමාන්‍ය	අභ්‍යන්තර	සාමාන්‍ය	සාමාන්‍ය
404 පුහුණුව හා අධ්‍යාපනය	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
405 විවිධත්වය සහ සමාන අවස්ථාව	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
406 නොවෙනස් ලෙස සැලකීම	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
407 සාංගමික හැසිරීම සහ සාමූහික කේවල් කිරීම	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
413 දේශීය ප්‍රජාවන්	සාමාන්‍ය	ප්‍රජාව	සාමාන්‍ය	සාමාන්‍ය
415 මහජන ප්‍රතිපත්ති	අඩු	ප්‍රජාව	අඩු	සාමාන්‍ය
416 ගනුදෙනුකාර සෞඛ්‍ය හා ආරක්ෂාව	සාමාන්‍ය	ගනුදෙනුකරුවන්	සාමාන්‍ය	වැඩි

ගෝලීය වාර්තාකරණ මූලපිරීම් දර්ශක	බැංකු මෙහෙයුම් වලට ඇති වැදගත්කම	සීමාව	ප්‍රමාණවත් බව	
			බැංකුවට	ඇල්මැති පාර්ශ්වයන් හට
417 අලෙවිකරණය සහ නම් කිරීම	වැඩි	අභ්‍යන්තර/ ගනුදෙනුකරුවන්	වැඩි	වැඩි
418 ගනුදෙනුකාර රහස්‍යභාවය	වැඩි	ගනුදෙනුකරුවන්	වැඩි	වැඩි
419 සමාජ ආර්ථික අනුකූලතාවයන්	සාමාන්‍ය	ප්‍රජාව/පාරිසරික	සාමාන්‍ය	වැඩි
වෙනත් මාතෘකා				
අ) අවදානම් කළමනාකරණය සහ ව්‍යාපාර අඛණ්ඩතාව	වැඩි	අභ්‍යන්තර	වැඩි	වැඩි
ආ) ඩිජිටල්කරණය සහ මාධ්‍ය ප්‍රශස්ථ ලෙස උපයෝගීකරගැනීම	වැඩි	අභ්‍යන්තර/ ගනුදෙනුකරුවන්	වැඩි	වැඩි
ඇ) ආයතනික සමාජ වගකීම් පිළිබඳ ක්‍රියාකාරකම්	සාමාන්‍ය	බාහිර	සාමාන්‍ය	සාමාන්‍ය



වාර්තාවේ සෙසු පරිච්ඡේද වලට ඇති සම්බන්ධතාව වැඩි දියුණු වන පරිදි අප විසින් මෙකී සැලකිය යුතු කරුණු පහත සඳහන් කාණ්ඩ 6 යටතේ දක්වා ඇත.

1. වෙනස්වන සුළු හා අවිනිශ්චිත සමාජ - ආර්ථික පරිසරය
2. වර්ධනය වන නියාමන පරිසරය, යහපාලන හා අවදානම් කළමනාකරණය හා නව උත්පාදන නියාමන
3. දුලබ හා පරිණාමය වන කුසලතාවල අවශ්‍යතාවයන්
4. ක්ෂේත්‍රය තුළ තරඟකාරී බව රැක ගැනීම සහ තිරසාර කාර්යසාධනයක් පවත්වා ගැනීම
5. ශීඝ්‍ර තාක්ෂණික සංවර්ධනයන්
6. වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතාවයන්

එම සාධකවල බලපෑම් තක්සේරු කිරීම තුළින් හා වටිනාකම් උත්පාදනයට බාධා පමුණුවීමේ ශක්‍යතාවය ඇති සාධක අවම කිරීම සඳහා උපායමාර්ග යොදා ගැනීම තුළින් මෙන් ම වැඩි වශයෙන් වටිනාකම් උත්පාදනය කිරීම පිණිස ඇති අවස්ථා වලින් උපරිම ඵල නෙලා ගැනීම පිණිස කළමනාකාරීත්වයේ මැදිහත්වීම මගින් මේ සම්බන්ධයෙන් විසඳුම් සොයනු ලැබේ.

බැංකුවේ ප්‍රවර්තන සැලකිය යුතු සාධක පිළිබඳ විස්තරාත්මක සටහනක් මතු දැක්වෙන අතර සැලකිය යුතු සාධක මගින් පැන නඟින අවදානම් හා අවස්ථා, වටිනාකම් උත්පාදනය කෙරෙහි ඒවායේ බලපෑමේ හැකියාව, සහ අපගේ ව්‍යාපාරික ප්‍රතිචාර යනාදිය ඊට අන්තර්ගත වේ. බලපෑමෙහි ප්‍රබලතාව, හා අප මුහුණ දෙන අවදානම් හා අවස්ථාවන් එළඹීමේ සම්භාවිතාව මත අපගේ උපාය මාර්ගික ප්‍රතිචාර තීරණය වේ.

වෙනස්වන සුළු හා අවිනිශ්චිත සමාජ-ආර්ථික පරිසරය

සාර්ව ආර්ථික සාධක, ව්‍යාපාර වල තිරසාරබව පවත්වා ගැනීම සහ වෙළඳපළ ඉලක්ක මුදුන්පත්කර ගැනීමට අප සතු හැකියාව කෙරෙහි බලපායි. උද්ධමනය, පොළී අනුපාත සහ මුදල් හුවමාරු කිරීමේ අනුපාත මත පදනම් වූ ගෝලීය හා දේශීය ආර්ථිකයෙහි වෙනස්වන සුළු ස්වභාවය අප මෙහෙයුම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරවයි. රුපියල මත ඇතිවන පීඩනය, ආනයනික භාණ්ඩ මත ශීඝ්‍රයෙන් ඉහළ නගින උද්ධමනය, තව දුරටත් පහළ බසින රත්‍රන් මිල ගණන් යනාදී හේතුකොට ගෙන ශ්‍රී ලාංකික ආර්ථිකයට අසීරු අභියෝග රැසක් එල්ලවෙමින් පවතී. ඉතා ඉහළ ණය මට්ටම්, පරිභෝජනයට ගත හැකි ආදායමෙහි ප්‍රමාණය අඩු වීම, ශීඝ්‍රයෙන් ඉහළ යන බලශක්ති මිල හා ඉහළ යන උද්ධමනය හේතුවෙන් පාරිභෝගිකයන් තවදුරටත් පීඩනයට පත් වේ.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
අවදානම්	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයේ මන්දගාමී බව, උද්ධමනය ඉහළයාම හා පොළී හා විනිමය හුවමාරු අනුපාතිකවල වෙනස්වන සුළු බව ව්‍යාපාරික අවදානම් වැඩිකළ හැකිය.	දළ දේශීය නිෂ්පාදිතයෙහි මන්දගාමී බව පාරිභෝගික වැය කිරීම්වලට බලපාන අතර, එය ණය ඉල්ලුම්කරුවන්ට පාරිභෝගික ණය හා ආයතනික ණය ක්‍රියාකාරකම් වලට බලපානු ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයෝජනවලටද බලපායි. උද්ධමනය ඉහළ යාමත් සමඟ දළ දේශීය නිෂ්පාදිත වර්ධනයේ මන්දගාමී බව, වැයකළ හැකි/ පරිභෝජනය කළ හැකි අදායමට ද ඉතිරිකිරීමේ හැකියාවටද බලපෑම් එල්ල කරන බැවින් එමගින් අඩු තැන්පතු සංචලනයකට ඉඩ කඩ සැලසෙයි. ඉහළ යන උද්ධමනය මගින් පිරිවැය අතින් පීඩනයක් ද බැංකුවේ මෙහෙයුම් වියදම් ඉහළ යාම ද සිදුවෙයි. ඉපයීම් වර්ධන ශක්‍යතාව කෙරෙහි හා ප්‍රාග්ධන උත්පාදනය කෙරෙහි ඍණාත්මකව බලපාන අතරම අරමුදල් සැපයීමේ පිරිවැය ඉහළ යාමේ අවදානම සහ අක්‍රමවත් ණය අනුපාතිකද ඉහළ නංවයි.	අවදානම් අවම කිරීමට සහ අවස්ථා උදාකර ගැනීමට නිශ්චිත පියවර සලසමින් සාර්ව ආර්ථික තත්ත්වයන්ට තුඩු දෙන වෙනස්කම් වලට අබාධිව ප්‍රතිචාර දැක්වීම. සුදුසු තැන්පතු වර්ග හා මිශ්‍ර ණය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් මිලකරණ යාන්ත්‍රණයක් ඉදිරිපත්කිරීම. දූරදර්ශී අවදානම් කළමණාකරණ ප්‍රවේශ සහ නිසි වෙළඳපළ අංශ තුළ අපගේ අවදානම් අභිරුචි රාමුව හමුවේ ලාභදායිතාව රැකගැනීම. ව්‍යාපාර සහ කර්මාන්ත නැඹුරුවට අදාළ වෙළඳපොළ පිළිබඳ තොරතුරු ප්‍රයෝජනයට ගැනීම.
අවස්ථා	පොළී අනුපාතික ඉහළ යන සංසිද්ධියක් හමුවේ ආදායම් උත්පාද පරිමාව වර්ධනය කිරීම. රජය විසින් ක්‍රියාවට නංවනු ලබන යටිතල පහසුකම් සැලසීමේ ව්‍යාපෘති ප්‍රමාණය ඉහළ යාම.	ණය හා අත්තිකාරම් මත අය කරන පොළී අනුපාතික ඉහළයාම, පොළී ආදායම තුළින් ජනනය වන අපගේ ආදායම කෙරෙහි හිතකර ලෙස බලපානු ලබයි. යටිතල පහසුකම් නැංවීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට දායකවීම මගින් ආයතනික ණය කළඹ ව්‍යාප්තිය	ආර්ථික වශයෙන් ඇති විය හැකි පසුබෑම් වලට ඔරොත්තු දිය හැකි වන පරිදි නියාමන නිර්ණායකයන් ඉක්මවූ ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීම හා ප්‍රාග්ධනය අතින් ශක්තිමත් වීම. වගකීම් සහගත ණය දීම සඳහා කැපවුනු ප්‍රවේශයක් අනුගමනය කිරීම. ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කර ගත් සේවාවක් සැපයීම තුළින් අපගේ ගනුදෙනුකාර අවශ්‍යතා අවබෝධ කර ගැනීම, හඳුනාගැනීම හා අවදානම් කළමනාකරණය කිරීම.
ඇල්මැති පාර්ශ්වයන්ගේ සම්බන්ධ වීම		නියාමකයන් සහ රාජ්‍ය ආයතන, ගනුදෙනුකරුවන්, සමාජය හා පරිසරය	
උපායමාර්ගික අවධානය යොමු වන අංශ		ගනුදෙනුකරු, වර්ධනය, මෙහෙයුම්, අවදානම් හා අනුකූලතාව	

වර්ධනය වන නියාමන පරිසරය, යහපාලනය හා අවදානම් කළමනාකරණය සහ නව නියාමන

මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ පැවතිය යුතු අත්‍යවශ්‍ය සාධකයක් වන නියාමනයන් වර්තමානය වන විට දැඩි වෙමින් පවතී. ක්ෂේත්‍රය මෙන්ම ගනුදෙනුකරුවන් යන දෙපාර්ශ්වයම ආරක්ෂා කර ගැනීම පිණිස නියාමන වලට අනුගත වීම සහ ක්ෂේත්‍රයට අදාළ සියලු අවදානම් පාලනය අත්‍යාවශ්‍ය කරුණකි. ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක ශීඝ්‍ර වෙනස්වීම් වලට ලක්වන නියාමන තත්ත්වයන් මූල්‍ය සේවා සපයන්නන් සතු වෙනස්වීම් වලට මුහුණදීමේ හැකියාව හා වේගය කෙරෙහි බලපෑ හැකිය. වර්ධනය වන පිරිවැය හෝ ව්‍යාපාර කිරීමේ දී හට ගන්නා අමතර දුෂ්කරතා ද මීට රුකුල් විය හැකිය. නියාමන අවශ්‍යතාවයන් සහ ආයෝජකයින් විසින් ඉල්ලා සිටින වැඩි ප්‍රතිලාභ හේතුවෙන් මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ ද්‍රවශීලතාව ඉතාම ඉහළ තරඟකාරිත්වයකට මුහුණ දෙයි.

මූල්‍ය වෙළඳපොළ තුළ ස්ථාවරත්වය හා විශ්වාසනීයත්වය රැක ගන්නා අතරතුර ඔවුන් විසින් ගනු ලබන සෑම තීරණයක්ම එක් එක් ගනුදෙනුකරුවන් අභිලාශයට සරිලන තීරණ බවට වගබලා ගැනීම බැංකු වල අවශ්‍යතාවයක් බවට පත් කරමින් ගෝලීය නියාමන රාමු වැඩි වශයෙන් ප්‍රතිපත්ති මත පදනම් වූ හා ප්‍රතිඵල මත මෙහෙයවනු ලබන තැනට පරිවර්තනය වෙමින් පවතී. ස්ථාවර මූල්‍ය පද්ධති සහ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායකත්වය සලසන නියාමන ප්‍රතිසංස්කරණ වෙත අපගේ සහාය පළ කරමු.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
අවදානම්	පහත සඳහන් සාධක ඇතුළත් සැලකිය යුතු ගිණුම්කරණ සහ නියාමන වර්ධනයන් - බාසල් III ක්‍රියාත්මක කිරීම - IFRS 9 ක්‍රියාත්මක කිරීම - දේශීය ආදායම් පනත - විදේශීය විනිමය පනත බැංකුවේ වර්තමාන ව්‍යාපාර ආකෘතියට බලපෑම් එල්ල කළ හැකිය.	නියාමන නිර්ණායන, ආදායම්, පිරිවැය, යන කරුණු වලට බලපාන අතර බැංකුවේ ශේෂ පත්‍රය හැඩගැස්වීම ද සිදු කරයි (ප්‍රතිපාදන සීමාවන් වැඩි කිරීම, ආන්තිකයන් අවම කිරීම). අනුකූලතාව දැක්වීමේ ක්‍රියාවලියේ ඉහළ පිරිවැය, නියාමන වලට අනුකූල නොවීම මත දඬුවම්වලට බඳුන්වීම හා කීර්තිනාමය අවදානමට ලක් වීම. අනුකූලතාව දැක්වීමට අවශ්‍ය ක්‍රියාවලිය තාක්ෂණික භාවිතය හා නව්‍යකරණයට ඇති ආයෝජන හා කාලසීමාව අඩු කරලයි. IFRS 9 ආදේශ කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් පැන නගින හානිකරන වල වෙනස්වන සුළු බව ප්‍රතිපාදන සැලසීමේ මට්ටම් ඉහළ නැංවීමට ද මධ්‍යම කාලීන සිට දිගු කාලීනව ගත් විට අවදානමෙහි පිරිවැය ඉහළ යාමට ද තුඩු දිය හැකිය.	නියාමන වෙනස්වීම් හඳුනා ගැනීමට, ඇගයීමට සහ ප්‍රතිචාර දැක්වීමට විස්තීරණ, කාලීන හා සම්බන්ධීකරණයෙන් යුතු ප්‍රවේශයක් අනුගමනය කිරීම. පරිණාමය වන රාමු අවබෝධ කර ගැනීම සහ නොපමාව සහ උචිත ලෙස සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ වාර්තා කිරීම. නියම කර ඇති කාල සීමාව තුළ දී ක්‍රියාත්මක කළ හැකි වන පරිදි අභ්‍යන්තර ආකෘති හා ක්‍රියාවලි සමාලෝචනය කර යළි හැඩ ගැස්වීම තුළින් අදාල රෙගුලාසි හා නීති වලට අනුකූල වීම. අල්ලස් දීම හා ගැනීම සහ වෙනත් දූෂණ ක්‍රියා වැළැක්වීම පිණිස දූෂණ විරෝධී, මුදල් විශුද්ධිකරණ විරෝධී හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීමට විරෝධී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
අවස්ථා	ගනුදෙනුකාර සුරක්ෂිතතාව හා ආයතනික ආචාරධර්ම පද්ධතිය කෙරෙහි යොමු වුනු ඉහළ අවධානය මගින් ආර්ථික අවපාතයන් හා පසුගාමී අවස්ථාවල දී ශක්තිමත් ශේෂ පත්‍රයක් තිරසාරව පවත්වා ගැනීමටත් ආර්ථිකය වර්ධනය වන අවස්ථාවල දී ආයතනයේ වර්ධනය මනාව ස්ථානගතවීමට ද හැකියාව සලසයි.	වඩාත් හොඳ කළමනාකරණයට, ඉහළ කාර්යක්ෂමයතාවට සහ ඇතැම් අංශ වල දී අඩු අවදානම තුඩු දෙන කාර්යක්ෂම පාලන ආකෘතීන්.	
සම්බන්ධිත ඇල්මැති පාර්ශව		නියාමනයන්, රාජ්‍ය ආයතන සහ ගනුදෙනුකරුවන්	
උපායමාර්ගික අවධානය යොමු වූ අංශ		ගනුදෙනුකරු, වර්ධනය, මෙහෙයුම්, අවදානම්, අනුකූලතාවය සහ ප්‍රසිද්ධිය	

දුලබ හා පරිණාමය වන කුසලතා වල අවශ්‍යතාවයන්

සේවක සාමාජිකයන් අපගේ ව්‍යාපාරයෙහි අත්‍යන්ත පාර්ශ්වයක් වන අතර අප සතු සමීප සම්බන්ධතාවයක් රඳවා ගන්නා ගනුදෙනුකාර සේවා ආකෘතියෙහි මූලික පුරුකයි. බැංකුකරණ හා මූල්‍ය සේවා දිගින් දිගටම පරිණාමය වෙමින් පවතින අතර තවදුරටත් සංකීර්ණ වෙමින් ද පවතී. විශිෂ්ඨ සේවාවක් සැපයීම, ශේෂපත්‍ර වර්ධනය මෙහෙයවීම අතරතුර සංකීර්ණ අවදානම් කළමණාකරණය, කොටස් හිමියාගේ වටිනාකම් වැඩි කිරීම, ද්‍රවශීලතාව සහ නුබුන්වත්කම පවත්වා ගැනීම සඳහා ඉහළම මට්ටමේ කුසලතා, ගනුදෙනුකාර කේන්ද්‍රිය බව සහ විශ්ලේෂණාත්මක හැකියාවෙන් යුතු සේවක පිරිසක් අවශ්‍ය වේ.

අපගේ උපායමාර්ගය හා අනුගත වන පරිදි නිමැවුම් හා සේවා සැපයීමේ දී අපගේ කාර්යමණ්ඩල සාමාජිකයන් අතිශය වැදගත් වෙයි. නිවැරදි පුහුණුව හා කුසලතා සහිතව නිවැරදි පුද්ගලයින් නිවැරදි ව ස්ථානගත කිරීම අපගේ සාර්ථකත්වයට හා නව්‍යකරණයට අනිවාර්‍යයයෙන් අවශ්‍ය වෙයි. අපගේ කණ්ඩායම් සාමාජිකයින් නිසි පරිදි කළමනාකරණය නොකළහොත් ගනුදෙනුකාර තෘප්තිමත්භාවයට අහිතකර ලෙස එය බලපානු ලැබීමේ අවදානමට අපට මුහුණ පෑමට සිදු වන අතර වෙළඳපළ තුල අපගේ තරඟකාරී බවට
ඉන් හානියක් වනු ඇත. ශ්‍රී ලංකාව තුල විශේෂිත කුසලතා අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවශ්‍යතාව සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතු කොටගෙන විශේෂයෙන් බැංකුකරණය හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වඩාත් සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීම පිණිස දැඩි තරඟකාරී මට්ටමක් උද්ගත වී තිබේ.

එබැවින් අපගේ උපායමාර්ගික අරමුණු ඉටුකරගැනීම උදෙසා හා අප ආයතනික වටිනාකම් වැළඳගැනීම සඳහා අපගේ කාර්යමණ්ඩල සාමාජිකයන් බලගැන්වීම ද හඳුනාගැනීමද සිදු කෙරෙන බවට වගබලා ගත යුතුය.
ශීඝ්‍රයෙන් වෙනස්වෙමින් යන ලෝකය ජය
ගැනීමට අවශ්‍ය කරන කුසලතා හා අනුවර්තනයවීම් සංවර්ධනය කර ගැනීමට මෙන් ම සිය උපරිම ශක්‍යතාවන් කරා ළඟා වීමට අවශ්‍ය අවස්ථා අපි අපගේ කණ්ඩායම් සාමාජිකයන් හට ලබා දෙන්නෙමු.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
අවදානම්	විශේෂිත කුසලතා සපිරි පුද්ගලයින් බඳවා ගැනීමේදී ශ්‍රම වෙළඳපළ තුල පවතින දැඩි තරඟකාරිත්වය සහ ඉතා උසස් කුසලතා පිරි පුද්ගලයින්ගේ විගමනය සේවකයන් පරිවර්තනය කර ගැනීම හා කුසලතා පරතරය දුරලීම පරිණාමය වෙමින් පවතින තාක්ෂණික සංවර්ධනයන් හේතුවෙන් වත්මන් සේවක කුසලතා හා ඉදිරි අවශ්‍යතාවල ඉල්ලුම රාජකාරී - දිවි සමබරතාව	සේවකයන් පරිවර්තනය කර ගැනීමට සහ කුසලතා පරතරය දුරලීමෙන් අවැසි කුසලතාපූර්ණ බව ළඟා කර ගැනීම සඳහා පුහුණු හා සංවර්ධන වැඩසටහන් මත අබණ්ඩව ආයෝජනය කිරීම. විශේෂිත ක්ෂේත්‍රයන් සඳහා අතිශයින් කුසලතා පිරි සේවකයින් බඳවා ගැනීමේ දී ඇතිවන පිරිවැය පීඩනය සහ දැනට හා ඉදිරියට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන්වල පිරිවැය ප්‍රමාණය කුසලතා පරතරය හා කුසලතාවෙන් තොරබව, ගනුදෙනුකාර අත්දැකීම් හා තෘප්තියට අහිතකර ලෙස බලපෑම	කුසලතා හා හැකියාවන් පිරි පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් රඳවා ගැනීමට වගකීම් සහගත බඳවාගැනීම් හා වේතන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම කාර්යසාධනය මත මෙහෙයවනු ලබන සංස්කෘතියක් බිහි කිරීම : පුද්ගල සංවර්ධන වැඩසටහන් හා බැඳුණු සාධාරණ හා විනිවිධභාවයෙන් යුතු කාර්යසාධන කළමනාකරණය රාජකාරී ඉටු කිරීමේ නව මාර්ග සහ ඒ ඒ පුද්ගලයා අනුව නිමැවූ සේවක ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සක්‍රීය හැකියා හා අනුප්‍රාප්තික සැලසුම්
අවස්ථා	නිවැරදි ආකල්ප සමඟින් හොඳම කුසලතා ආකර්ෂණය කර ගැනීමට ඇති හැකියාව අපගේ සේවකයන් තාක්ෂණයට හුරු, නවමු ලෙස සිතන පුද්ගලයින් බවට පරිවර්තනය	සේවක අත්දැකීම් හා ඊට සමගාමී වටිනාකම් ප්‍රස්තුත පිළිබඳ වැඩි වන අපේක්ෂාවන්	අපගේ උපායමාර්ග ක්‍රියාවට නැංවීමට සහ හැකියාවන් පෝෂණය කිරීමට විවිධත්වයෙන් යුත් හා හැකියාවැති ශ්‍රම බලකායක් සිටීම, අපගේ වෙනස්වනසුළු සමාජ-ආර්ථික පරිසරයෙහි ඇති වෙනස්කම් වලට මුහුණ දීමේ දී වේගවත්ව හා සුචල්‍ය ප්‍රතිචාර දක්වීමට ඉවහල් වෙයි.
ඇල්මැති පාර්ශ්වයන්ගේ සම්බන්ධ වීම්		සේවක අත්දැකීම් හා ඊට සමගාමී වටිනාකම් ප්‍රස්තුත පිළිබඳ වැඩි වන අපේක්ෂාවන්	
උපායමාර්ගික අවධානය යොමු වූ අංශ		සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්, ගනුදෙනුකරු, පුද්ගලයින්, වර්ධනය, මෙහෙයුම්, අවදානම් හා අනුකූලතාව හා ප්‍රසිද්ධිය	

ක්ෂේත්‍රය තුළ තරඟකාරී බව රැකගැනීම සහ තිරසාර කාර්යසාධනයක් පවත්වා ගැනීම

ලාභදායීතාව රැකගනිමින් අපගේ ව්‍යාපාරය වර්ධනය කරගැනීමෙහිලා අපගේ ඇල්මැති පාර්ශ්වයන්ගේ සහයෝගය හා පක්ෂපාතීත්වය අවශ්‍ය වෙයි. ශ්‍රී ලාංකිකයන් තුළ ඉතිරිකිරීමේ සංස්කෘතියක් ගොඩනැංවීම පිණිස ස්ථාපිත කරන ලද විශාලතම සුවිශේෂී බැංකුව වන අප ආයතනයේ තිරසාර බව රැඳී පවතින්නේ රටට එක් කරලන ආර්ථික අගය අනුවයි. වෙනස් අයුරින් ඇගයීමට ලක්වන, අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙන වැදගත් ප්‍රතිඵලයක් ලබාගැනීමට තුඩු දෙන ඔවුන්ගේ ප්‍රධාන අපේක්ෂා හා අභිලාෂය පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

ව්‍යාපාර සිදු කිරීමේ දී ගනුදෙනුකාර අවශ්‍යතා හා අභිලාශ කෙරෙහි ඇති කරන නියාමන හා තාක්ෂණික වෙනස්කම් මත මූලිකව මෙහෙයවනු ලැබ මූල්‍ය සේවා ක්ෂේත්‍රය නිරන්තරයෙන්ම නව්‍යකරණය අත්දකිනු ලබයි. නවක බඳවාගැනීම් සම්බන්ධයෙන් පැනවෙන නියාමන නිර්ණායක වැඩිවීම මගින් ක්ෂේත්‍රයට පිවිසෙන නවක සේවක සංඛ්‍යාව සීමා වන නමුත් විකල්ප විසඳුම් ඉදිරිපත්කිරීමට යොමු වන බැංකු නොවන මූල්‍ය ආයතනවල තරඟකාරීත්වය වැඩි වී ඇත.

ඩිජිටල් යුගය මගින් බැංකුකරණ ක්ෂේත්‍රය පරිවර්තනයට බඳුන් වී ඇත. ගනුදෙනුකරුවන් විසින් බැංකු මත තබා ඇති අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. සිය අවශ්‍යතා අනුව වඩාත් සඵලදායී විකල්ප තොරාගැනීම සඳහා ගනුදෙනුකරුවෝ බලගැන්වී සිටිති.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
අවදානම්	වැඩිවන තරඟකාරීත්වය වෙළඳපළ කොටස අඩුවීම ව්‍යාපාර පරිමාව දුර්වල වීම පිරිවැය පදනම කළමණාකරණය ඩිජිටල් මාධ්‍යයේ තරඟකාරීත්වය	තරඟකාරීත්වය හේතුවෙන් ආදායම් හා ලාභදායීතාව පහළ බසියි. පිරිවැය පදනම ඉහළයාම ආන්තික සීමා කරවයි. ගනුදෙනුකරුවන් අත්පත්කර ගැනීමේ සහ රඳවාගැනීමේ පිරිවැය ඉහළ යාම.	දැනට බැංකුවේ ගනුදෙනුකරුවකු වන අයට වෙනත් නිමැවුම් හා සේවා අලෙවි කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම සහ නව නිමැවුම් සැලසුම් කිරීම පිරිවැය පදනම පරීක්ෂාකාරීව හා විනයානුකූලව කළමනාකරණය කිරීම, අරමුදල් සැපයීම හා ආයෝජන මිශ්‍රණය සඳහා නිසි මිල තැබීමේ යාන්ත්‍රණයක් යොදා ගැනීම
අවස්ථා	ආදායම් ධාරා විවිධාංගීකරණය නිපුණත්වය හා සිය භූමිකාවෙහි අදාළත්වය පවත්වාගැනීම සඳහා නව්‍යකරණය වීමට ආයතනවලට	රාජ්‍ය සුරැකුම්හි ආයෝජන මත ඇති යැපෙන සුළු බව අඩුකර ගැනීම සහ ගාස්තු පදනම් වූ ආදායම වර්ධනය කර ගැනීම. ගනුදෙනුකරුවන් කේන්ද්‍රකොට කටයුතු කිරීමට ඉඩ පාදා ගැනීම.	ශාඛා කේන්ද්‍ර කොටගත් ආකෘතියෙන් වඩාත් ලාභදායී ස්වයං සේවා සහිත බහුවිධ මාධ්‍ය සේවා ආකෘතියකට මාරුවීම පිරිවැය කාර්යක්ෂමව හා නව ආයෝජන ධාරා උත්පාදනය කරන අතරතුර ආදායම් උත්පාදන ධාරිතාව තිරසාර ලෙස පවත්වා ගැනීම සන්නාම පිළිබඳ කීර්තිනාමයට රුකුල්දීම
ඇල්මැති පාර්ශ්වයන්ගේ සම්බන්ධ වීම්		නියාමකයන් සහ රාජ්‍ය ආයතන, ගනුදෙනුකරුවන් සහ සේවකයන්	
උපායමාර්ගික අවධානය යොමු වූ අංශ		ගනුදෙනුකරු, වර්ධනය, මෙහෙයුම් හා කීර්තිනාමය	

ශීඝ්‍ර තාක්ෂණික සංවර්ධනය

මූල්‍ය සේවා ක්ෂේත්‍රය හරහා ව්‍යාප්ත වෙමින් පවතින තාක්ෂණික විප්ලවය සුවිසල් පරිණාමීය විභේදනයන් ඇති කරවයි. වැඩි වශයෙන් ඩිජිටල්කරණය වන ලොවක ආයතනයක් වශයෙන් අපගේ අදාළත්වය හා භූමිකාව සනාථ කරනු පිණිස අප විසින් සක්‍රීයව විභේදනය හා නව්‍යකරණය යන සාධක වැළඳගනිමින් සිටින අතර අපගේ ගනුදෙනුකරුවන් උදෙසා වඩාත් හොඳ අගයක් සැපයීම පිණිස නවීන පාර්ශ්වකරුවන් සමඟ එක්ව කටයුතු කරන්නෙමු. මූල්‍ය සේවා වඩාත් පහසුදායී, අදාළ හා පිරිවැය අතින් සඵලදායී කළ හැකි විධික්‍රම සොයා ගැනීම අපගේ ප්‍රයත්නයයි.

පසුගිය වර්ෂ කිහිපය පුරාවට අප විසින් ආයතනය සතුව පැවති පද්ධති පැරණි ආදේශ කරමින් තොරතුරු තාක්ෂණ මුහුණුවර නවීකරණය කරනු පිණිස නව ආයෝජන සිදු කරනු ලැබිණි. එමගින් සයිබර් අපරාධ වලට මුහුණදීමට අප සතු හැකියාව ද බලගැන්වී ඇති අතර අපගේ ව්‍යාපාර ඒකක හරහා ඒකාබද්ධවීම දියුණු වී තිබේ.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
•	• ක්ලවුඩ් කම්පියුටින්ග් (Cloud Computing) විශාල දත්ත පරිමාණ (Big Data), ප්‍රතිවර්ධිත විශ්ලේෂණ (Advance Analytics), යාන්ත්‍රික ඉගෙනුම, අබණ්ඩව වර්ධිත වාර්තා ලැයිස්තු, තාක්ෂණය, කෘතිම බුද්ධිය සහ ජෛව මිනුම්, (biometrics) යනාදී විභේදන තාක්ෂණික ක්‍රමෝපායයන් වැඩිවීම මත ගනුදෙනුකාර හැසිරීම වෙනස් වීම. • රහස්‍යභාවයට හා සයිබර් ආරක්ෂණයට ඇතිවන තර්ජන • තොරතුරුවල වර්ධනය වන වටිනාකම සාම්ප්‍රදායික නොවන තරඟකරුවන් මූල්‍යමය නිමැවුම් බෙදාහැරීම සහ අතරමැදියන් නොවීම මගින් වෙළඳපොළ කොටස් ග්‍රහණය කර ගැනීමට උත්සාහ කිරීම	තරඟකාරී ක්ෂේත්‍රයන් තුළ අදාළ බව හා සිය භූමිකාව රැක ගනිමින් රැඳීමට නවමු තාක්ෂණයට අනුවර්ථනය වීම හෝ නව්‍යකරණය වීමට අනිවාර්යයෙන් සිදු වීම. ඩිජිටල් තාක්ෂණයට සහ ආරක්ෂක පද්ධති සඳහා ඉහළ ප්‍රාග්ධන ආයෝජනයක් දැරීමට සිදු වීම. තාක්ෂණය, සහ තොරතුරු කළමනාකරණය කිරීමේ සංකීර්ණත්වය සහ සයිබර් අවදානම වර්ධනය ආරක්ෂක පද්ධතිවල ඇතිවිය හැකි බිඳවැටීම් මෙහෙයුම් කටයුතු අඩාල වීමට, ආරක්ෂාව බිඳවැටීමට හා කීර්තිය පළුදුවීමට හේතු විය හැකිය.	ඩිජිටල් සන්නිවේදන මාධ්‍ය වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම් ප්‍රශස්තකරණය ස්වයංක්‍රීය හා ඩිජිටල්කරණය කළ අභ්‍යන්තර ක්‍රියාවලීන් තාක්ෂණික මුහුණුවර, ක්‍රියාවලි හා පාලන මත කෙරෙන අබණ්ඩ ආයෝජනය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම
අවස්ථා	කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම වඩා අඩු පිරිවැයට වේගවත්ව සේවා සැපයීම ඩිජිටල්කරණයේ නව ප්‍රවණතා	ගනුදෙනුකරුවන් කේන්ද්‍රකොටගත් සේවා සැපයුම් මාධ්‍යවලට මාරුවීම තුළින් සමස්ත පිරිවැය අඩුවීම නව ආදායම් ධාරා උත්පාදනය කිරීමේ හැකියාව ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමේ සහ කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව අපගේ සයිබර් ආරක්ෂාව තර කිරීම, ගනුදෙනුකරුවන් හට විශ්වාසය ගෙන දෙන සාධකයක් වනු ඇත.	
ඇල්මැති පාර්ශ්වයන්ගේ සම්බන්ධ වීම්		නියාමකයන් සහ රාජ්‍ය ආයතන, ගනුදෙනුකරුවන්, සේවකයන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්	
උපායමාර්ගික අවධානය යොමු වූ අංශ		ගනුදෙනුකරු, වර්ධනය, මෙහෙයුම්, අවදානම් සහ අනුකූලතාව, ප්‍රසිද්ධිය සහ පුද්ගලයන්	

වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතාවයන්

අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අවබෝධකර ගැනීම තුළින් සහ එකී අවශ්‍යතාවලට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම මගින් ගනුදෙනුකරුවන් සමඟ තෘප්තිමත්, දීර්ඝකාලීන සම්බන්ධතාවයන් ගොඩනඟා ගැනීම අපගේ අභිලාශයයි. අපගේ ශාඛා ජාලය තුළින්, ජංගම හා අන්තර්ජාල බැංකුකරණ මාධ්‍ය ඔස්සේ සපයනු ලබන බැංකුකරණ පහසුකම් පිළිබඳ අත්දැකීම් වඩාත් යහපත් හා සිත්ගන්නාසුළු කිරීමට අපි අඛණ්ඩ පරිශ්‍රමයක යෙදෙමු. අපගේ වටිනාකම් මත ගොඩනැගුණු අප ආයතන සංස්කෘතියෙහි අරමුණ වන්නේ අප විසින් ගනු ලබන සෑම තීරණයකදී ම ගනුදෙනුකරුවන්ගේ සුභසිද්ධියට මුල් තැන දෙමින් සියළු අවස්ථාවලදී අප ගනුදෙනුකරුවන් හට සාධාරණත්වයෙන් සලකනු ලබන බව සහතික කර ගැනීමයි.

අවදානම් අවස්ථා		වටිනාකම් උත්පාදනය මත බලපෑම්	උපායමාර්ගික ප්‍රතිචාරය
අවදානම්	විවිධ බැංකු වල නිමැවුම්, සේවා වල ගුණාත්මකබව හා මිලකරණය පිළිබඳ ගනුදෙනුකාර දැනුවත්බව, ගනුදෙනුකාර පක්ෂපාතිත්වය අඩු කිරීමට මෙන්ම ගනුදෙනුකරුවන් එක් එක් බැංකුවට මාරු වීමට හේතු වෙයි. ගනුදෙනුකාර අපේක්ෂා වැඩි වීම	ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගැනීමේ සහ රඳවා ගැනීමේ පිරිවැය වැඩිවීම නව්‍යකරණය හා ඩිජිටල්කරණය යනාදියෙහි ඉහළ ආයෝජනය ස්වයං සේවා පහසුකම්, ගනුදෙනුකාර සම්බන්ධතාවල සහ ව්‍යාපාරික ආකෘතියෙහි ස්වභාවය වෙනසට බඳුන් කරලයි. පරිභෝජනය සඳහා ණය දීමේ පරිමාව ඉහළ නැංවීම	ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීම සහ ඵලදායී ලෙස ඊට ප්‍රතිචාර දක්වීම තුළින් දිගු කාලීන සබඳතා ගොඩනැංවීම ශාඛා ජාලය හා ජංගම දුරකථන, අන්තර්ජාල බැංකුකරණ සේවා මගින් සපයන ගනුදෙනුකාර අත්දැකීම් අඛණ්ඩව දියුණු කිරීම උපදේශක පුහුණුව ලබාදීම සහ උපදේශනය විශේෂාංගීකරණයෙහි මූලික අංගයක් බවට පත් කිරීම බහුවිධ මාධ්‍ය උපයෝගී වන ගනුදෙනුකාර කේන්ද්‍රීය ආකෘතියකට මාරු වීම
අවස්ථා	උපදෙස් සඳහා වැඩිපුර අවශ්‍යතාව සමාජය හා පරිසරය මත හිතකර බලපෑමක් ඇති කිරීම	තිරසාරව ව්‍යාපාරික කටයුතුවල නියැලීමට අපේක්ෂා කරන සමාජයේ ආත්ම ශක්තිය ඉහළ නැංවීම මූල්‍ය උපදෙස් හා බෙදීම් මත පදනම් වන වටිනාකම් ප්‍රස්තුත ඔස්සේ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය වැඩි කිරීම.	වගකීම් සහගත ලෙස ණය දීම, මූල්‍යමය අන්තර්ග්‍රහණය කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ තිරසාර බව සවිමත් කිරීම. ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීමට සදාචාර සම්පන්න ලෙස ක්‍රියා කිරීම.
ඇල්මැති පාර්ශ්වයන්ගේ සම්බන්ධ වීම		නියාමකයන් සහ රාජ්‍ය ආයතන ගනුදෙනුකරුවන් හා සේවකයන්	
උපායමාර්ගික අවධානය යොමු වූ අංශ		ගනුදෙනුකරු, වර්ධනය, මෙහෙයුම්, අවදානම් හා අනුකූලතා සහ කීර්තිය	

අපගේ උපාය මාර්ග

කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් වටිනාකම් උත්පාදනය කරන තිරසාර සැලසුම් ව්‍යාපාරයක් පවතින බවට වගබලාගැනීමට අපගේ උපාය මාර්ග සැලසුම් කරනු ලබයි. "ඔබගේ ඉතුරුම් සඳහා වඩාත් විශ්වාසනීය සහ වැඩිම ඉල්ලුමක් පවතින විකල්පය" බවට පත්වීම. අපගේ දැක්ම වන අතර උපාය මාර්ග වලින් එය ශක්තිමත් වේ. 2017-2019 සඳහා ඉදිරිපත්කර ඇති නව ත්‍රෛවාර්ෂික ව්‍යාපාරික සැලසුම මගින් සවිබල ගැන්වුණු බැංකුව, සිය අවධානය යොමු කල යුතු වන ප්‍රධාන උපායමාර්ග හඳුනාගෙන තිබේ. මෙම උපාය මාර්ගික සැලසුම නිර්මාණය කිරීමේ දී කළමණාකාරිත්වයේ විවිධ තල වල නිලධාරීන්ගේ මෙන්ම ආයතනය පුරා පැතිර සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය අනුව සියලු අංශ ඇතුළත් වන අන්දමේ ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. ආයතනික කළමනාකාරිත්වයට අයත් සියලුම සාමාජික මහත්ම මහත්මීන් සමඟ දීර්ඝ සාකච්ඡා වට, සියලුම සේවා කාණ්ඩවලට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සම්බන්ධවුණු සක්‍රීය දායකත්වයක් අවැසි නේවාසික වැඩමුළු, කාර්ය මණ්ඩලයට සිය යෝජනා, අදහස් හා මත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන පර්යේෂණයක් යනාදියෙන් මෙම ප්‍රවේශය සමන්විත විය.

ජා.ඉ.බැ. උපායමාර්ගය, දිගු කාලීන හා මධ්‍ය කාලීන ලෙස දෙවර්ගයකට ගොනු කල හැකිය.

දීර්ඝ කාලීන උපායමාර්ග

අපගේ ආයතනික උපායමාර්ග සැලසුම ඔස්සේ ක්‍රියාත්මක කළ හැකි දීර්ඝකාලීන උපායමාර්ග පහක් බැංකුව විසින් හඳුනා ගනු ලැබිණි. එනම්, ඩිජිටල්කරණය වූ බැංකුවක් වීම, පුද්ගලයින් විසින් මෙහෙයවනු ලැබීම, විවිධාංගීකරණය, නව්‍යකරණය, ශක්තිමත්බව හා තිරසාර බවයි.

ඩිජිටල්කරණය වූ බැංකුවක් වීම

බැංකු ක්ෂේත්‍රය ශීඝ්‍ර වෙනසකට භාජනය වෙමින් පවතින අතර බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ පවතින ඉදිරි වර්ධන අදියරෙහි මූලික පදනම වන්නේ ඩිජිටල්කරණයයි. ඉදිරි වර්ධනය සාක්ෂාත් කරගැනීමට මූලික වන සාධකයක් මෙන්ම අත්‍යාවශ්‍ය ශක්‍යතාවයක් ලෙස ජා.ඉ.බැ. තාක්ෂණය සලකනු ලබයි. සමාජ හා ජනවිකාශ ආකෘතීන් වල සිදුවන වෙනස්කම් හා අත්වැල් බැඳගත් ගනුදෙනුකරුවන්ගේ පරිණාමය වන ඉල්ලුම් මෙන්ම ඉදිරි ආර්ථික දැක්ම ද ඩිජිටල්කරණය සඳහා ආයෝජනය කරනු ලැබීමට බැංකුව වෙත පීඩනයක් ඇති කරනු ලබයි. ඉදිරි කාර්යාල ඒකක සංවර්ධනය කිරීම හා පසුපස කාර්යාල පද්ධතීන්වලට අනුයුක්ත ක්‍රියාවලීන් නවීකරණය තුළින් බැංකුව විසින් ඉදිරිපස සිට පිටුපස දක්වා වූ එනම්, එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා නව්‍යකරණය කිරීමේ මාධ්‍යයක් උපයෝගී කරගනිමින් ඩිජිටල්කරණය බැංකුවට එක්කරනු ඇත. ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත්, බහුවිධමානයන්ගෙන් යුත් සේවා සැපයුම් මාධ්‍ය යන පැහැදිලි උපාය මාර්ග ඇතුළත් ඩිජිටල්කරණ මාධ්‍ය ඔස්සේ වැඩි සේවා සලසනු වස් නිමැවුම් හා සේවා නවීකරණය කරමින් කාර්යක්ෂම නමාශීලී තොරතුරු තාක්ෂණය යටිතල පහසුකම් මගින් අලෙවිකරණ සහාය ලබන පරිපූර්ණ ඩිජිටල්කරණ උපායමාර්ගයක් සම්පාදනය කිරීම බැංකුවේ අරමුණයි.

පුද්ගලයන් විසින් මෙහෙයවනු ලැබීම

අපගේ අගයන් පිළිබඳ ඒ හා සමාන හැඟීමකින් කටයුතු කරන, බැංකුවේ සාර්ථකත්වය උදෙසා පෞද්ගලික වගකීමක් ඇතිව ක්‍රියා කරන පුද්ගලයින් අපගේ දැක්ම සාක්ෂාත් කරගනුවස් අත්‍යාවශ්‍ය වේ. වත්මන් එමෙන්ම ඉදිරි අවශ්‍යතා සපුරාලීමට සුදුසු කුසලතා හා ආකල්ප, සියලුම කාර්යමණ්ඩල සාමාජිකයන් සතු බවට බැංකුව සහතික කර ගැනීම අවශ්‍ය වේ. මන්ද යත් ක්ෂේත්‍රයෙහි වත්මන් සන්දර්භය තුළ අනිවාර්යය සාධකයක් වන්නේ නිරන්තර වෙනස සහ සචලතාව වන හෙයිනි. ඩිජිටල්කරණය සඳහා යන පරිවර්තනයේ දී අනිවාර්ය සාධකයක් වන්නේ, සචලතාව නම්‍යශීලීභාවය, ස්වාධිපත්‍ය සහ නව්‍යකරණයයි. ඒ මගින් විවෘත බව, අවස්ථාවන් හා විශ්වාසය යන කරුණු පදනම් වූ පරිසරයක් නිර්මාණය කෙරෙන අතර වෙනස් වීම් වලට අනුගත වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද ඉන් සැලසෙයි. ආයතනයක ක්‍රියාවලීන් ඩිජිටල්කරණය වීම, ඩිජිටල්කරණ විසඳුම් උපයෝගී කර ගැනීම, උපායමාර්ගික සංස්කෘතික මාරුවීම්, වඩාත් ගනුදෙනුකාර කේන්ද්‍රීය හා ඒකාබද්ධ ප්‍රවේශයකට ගමන් කිරීම යනාදී කරුණු පුද්ගල හැසිරීම් හා කුසලතාවලට පරිවර්තනීය ලෙස බලපෑම් එල්ල කරනු ලබයි. එබැවින්, සේවක පිරිස් වෙනස්වීම් වලට හුරුකිරීමටත්, සේවා විශිෂ්ඨත්වයෙන් යුත් සංස්කෘතියක් ප්‍රවර්ධනයටත්, අවදානම් හා අනුකූලතා පිළිබඳ දැනුවත් කිරීමටත් ඔවුන්ගේ වෘත්තීය ජීවිත පුරාවට වඩාත් සාර්ථක වීමට අවශ්‍ය පරිදි පුහුණුවීම් හා සංවර්ධන අවස්ථා සැපයීමත් කෙරෙහි බැංකුව විසින් කැපවී සිටියි.

විවිධාංගීකරණය

ඉතිරිකිරීම සඳහා වඩාත් විශ්වසනීය සහ වැඩිම ඉල්ලුමක් පවතින ආයෝජන විකල්පය බවට පත් වීමේ ජා.ඉ.බැ. දැක්ම හා අනුගත නව ආයෝජන සහ අවස්ථා වැඩිදියුණු කිරීමේ අදහස පෙරදැරිව එහි ව්‍යාපාරික වපසරිය විවිධාංගීකරණය කිරීමට බැංකුව අරමුණු කරනු ලබයි. ජාතික අයවැය යෝජනාවක් වශයෙන් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අත්පත් කරගැනීම කෙරෙහි ජා.ඉ.බැ. අවධානය යොමු කරන අතර එමගින් ශ්‍රී ලංකා බැංකුකරණය හා පොදු සේවා ක්ෂේත්‍රය සඳහා යොමුවීමට විවිධාංගීකරණය වූ හා වර්ධනීය අවස්ථාවස් ජනිත වනු ඇතැයි ද මූල්‍ය සේවාකරණයේ නව අංශ ඔස්සේ මෙතෙක් වෙළඳපළට ඈඳා නොගත් වෙළඳපළ කාණ්ඩ වෙත ළඟා වීමටත් ඉඩ සැලසෙන බව අපි විශ්වාස කරමු. තවද ආදායම ඉහළ නංවාගැනීමේ අරමුණ පෙරදැරිව නව්‍ය නිමැවුම් හා සේවා වල දායකත්වය ඔස්සේ වර්තමාන තරඟකාරී මෙහෙයුම් පරිසරය තුළ ආදායම් බිහිකිරීමේ නව මාර්ග පිළිබඳව බැංකුව විසින් සොයා බලනු ලබයි.

නව්‍යකරණය

ඩිජිටල් තාක්ෂණය සහ ගෝලීයකරණය මගින් ඇති කරන ලද කැළඹීම් පිළිබඳ සලකා බලන විට ඕනෑම ආයතනයක වර්ධනය, කාර්යසාධනය හා තක්සේරුව සම්බන්ධයෙන් ප්‍රධානතම මෙහෙයුම් සාධකයක් වන්නේ නව්‍යකරණය බැව් පෙනී යයි. මතුවන අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගතහැකි ආකාරයේ ව්‍යාපාර ආකෘති, වටිනාකම් ඉදිරියට ගෙනයාම, සේවා සැපයුම් මාධ්‍ය හා ව්‍යාපාර ක්‍රියාවලි සඳහා අවශ්‍ය නව්‍යකරණ පහසුකම් යථාර්ථයක් බවට පත්කිරීම තුළින් බැංකුව විසින් සිය ගනුදෙනුකරුවන් උදෙසා නව්‍යකරණ විසඳුම් සම්පාදනය කරනු ඇත. නව්‍යකරණය ඔප් නංවන පරිසරයක් බැංකුව තුළ නිර්මාණය කරනු ලබන අතර එමගින් සමාජයට ධනාත්මක බලපෑමක් ඇතිකරලීමට හැකියාව ලැබේ.

ශක්තිමත්බව හා තිරසාර බව

මූල්‍ය ස්ථාවරත්වයේ ප්‍රධානතම සාධකය වන්නේ ශක්තිමත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවරෝධකයන්ය. ප්‍රාග්ධන ශක්තිය ඉහළ නැංවීම හා ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් බවට වර්ධනය මගින් ඇල්මැති පාර්ශ්වයන් හට දිගුකාලීන වටිනාකම් උත්පාදනය කරනු ලබන සවිමත් හා තිරසාර බැංකුවක් ලෙස ගොඩනැගීම කෙරෙහි ජා.ඉ.බැංකුවේ අවධානය නිරතුරුව යොමු වේ. එසේ වුව අප විශ්වාසය කරන කරුණක් වන්නේ තිරසාර බව පවත්වාගත හැක්කේ ප්‍රමාණාත්මක වර්ධනය තුළින් පමණක් නොව දියුණු තියුණු කරන ලද කාර්යක්ෂමභාවය හරහා ද බැව් යන්නයි. අපගේ ඉදිරි පරපුර සඳහා ඉතිරි කළ යුතු දායාදය එලෙසම පවත්වා ගැනීම සඳහා දූරදර්ශී අවදානම් අභිරුචි සීමා සහ නෛතික පනත් සීමා ඇතුළත වර්ධනය වීම අපගේ ප්‍රයත්නයයි. අපගේ අවදානම් හා අනුකූලතා සංස්කෘතිය සවිමත් කර ගන්නා අතරතුර ජාලකරණ සහ ඩිජිටල් මාධ්‍ය ව්‍යාප්තියද අඛණ්ඩව සිදු කරමින්, පුළුල් ව්‍යාප්තියක් සනිටුහන් කර ඇති ශාඛා වලින් උපරිම ප්‍රයෝජන ලබන පරිදි ව්‍යාපාරික කටයුතු ඉහළ නංවමින් අප බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික අංශ ඔස්සේ අපගේ වෙළඳපළ කොටස වර්ධනය කර ගැනීමේ අදිටන අනුව අපි ක්‍රියාත්මක වන්නෙමු.

කෙටිකාලීන - මධ්‍යකාලීන උපායමාර්ග

අපගේ උපායමාර්ගික අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අප බැංකුවේ උපාය මාර්ග සම්පාදන ක්‍රියාවලියේ දී පහත සඳහන් ප්‍රමුඛ උපායමාර්ගික ස්ථම්භ අප විසින් නිර්මාණය කර ඇත.

- **ගනුදෙනුකරුවන් කේන්ද්‍රකොටගත්:**
  ජා.ඉ.බැ. සෙසු බැංකු අතර විශිෂ්ටම තෝරා ගැනීම බවට පත්කරලන අන්දමේ විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීම්, නිමැවුම් හා සේවා පිරිනැමීමත් ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමත් තුළින් අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සහාය වන්නෙමු
- **ක්‍රියාශීලී ප්‍රබෝධජනක කණ්ඩායම්:**
  ක්‍රියාශීලී හා ප්‍රීතිමත් කණ්ඩායම් සාමාජිකයින් එබඳුම ගනුදෙනුකරුවන් බිහිකිරීමට උරදෙයි. අපගේ තරඟකරුවන් වෙතින් අපව ඔසවා තබන අපගේ කණ්ඩායම් සාමාජිකයන් මත ආයෝජනය කිරීමට අපි කැපවී සිටිමු.
- **තිරසාර කාර්ය සාධනය:**
  පාරිභෝගික ණය අංශයේ ව්‍යාපාරික ධාරිතාව වැඩි කිරීම සහ තිරසාර තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා අප අවධානය යොමු වේ.
- **වගකීම සහ සාමාජීය බැඳීම**
  වගකීම් සහගතවීම සහ සාමාජයීය ලෙස කැපවීම මුල්බැසගත් සමාජ වටිනාකම් සහිත විශේෂිත බැංකුවක් ලෙස ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් අපගේ දායකත්වය නිබඳව සපයයි
- **දූරදර්ශී අවදානම් හා අනුකූලතා සංස්කෘතිය:**
  බැංකුව ආරක්ෂිතව පවත්වාගැනීම සඳහා අවදානම් කළමනාකරණ අතින් දූරදර්ශී ප්‍රවේශයක් ස්ථාපිත කිරීමට අපි කැපවෙමු.
- **මෙහෙයුම් කටයුතුවල විශිෂ්ටත්වය:**
  අනභිභවනීය ගනුදෙනුකාර හා සේවක අත්දැකීමක් පිරිනමනු වස් අපගේ මෙහෙයුම් හා අභ්‍යන්තර ක්‍රියාවකින් අප විසින් අඛණ්ඩව ප්‍රමිතිගත කිරීමත් සරල කිරීමටත් කැපවෙමු.
- **ප්‍රශස්ථ ප්‍රාග්ධන කළමනාකරණය:**
  අපගේ ප්‍රාග්ධන ශක්තිය වැඩිකරමින් මනා ද්‍රවශීලතත්ත්වයක් ගොඩනගමින් මූලික පදනම වර්ධනය කරගැනීමට අපි අඛණ්ඩව යොමු වූයෙමු.

සම්පත් යෙදවීම

ආයතනික උපාය මාර්ග ක්‍රියාවට නැංවීමේදී අතිශය තීරණාත්මක කරුණක් වන්නේ සම්පත් යෙදවීමයි. ජා.ඉ.බැ. විසින් එය සතුවන මූල්‍ය, බුද්ධිමය, නිෂ්පාදිත, මානව, සාමාජීය, හා සම්බන්ධතා සහ ස්වභාවික ප්‍රාග්ධනය යන බහුවිධ ප්‍රාග්ධන දූරදර්ශීව යොදා ගනිමින් ඇල්මැති පාර්ශ්වයන් සඳහා තිරසාර වටිනාකම් නිර්මාණය කරයි. සියලු ප්‍රාග්ධන ස්ථර හරහා සමසේ සම්පත් යෙදවීම අරමුණු කරගනිමින් අපගේ උපාය මාර්ගය නිර්මාණය කර තිබේ. අපගේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය හා මූල්‍ය නොවන සම්පත් යොදාගැනීමේදී ප්‍රතිලාභ වලට බලපාන නෛසර්ගික හුවමාරුවීම් පිළිබඳ පුළුල් දැක්මක් ඇතිව ජා.ඉ.බැ. කටයුතු කරයි.

ගනුදෙනුකරුවන් කේන්ද්‍රකොටගත්

ප්‍රධාන මූලපිරීම් 2017

ගනුදෙනුකාර සේවා ස්ථාන ව්‍යාප්තිය

වඩාත් වැඩි පහසුකම් සැපයීම

නව නිමැයුම් ඉදිරිපත් කිරීම

එකතුකල වටිනාකම් සහිත සේවා සැපයීම

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු අංක 102

ගනුදෙනුකාර ප්‍රාග්ධනය
පිටු අංක 126-131

2018 ඉදිරි දැක්ම

යොමුව : මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 86

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු අංක 105

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පිටු අංක 139

තිරසාර කාර්ය සාධනය

ප්‍රධාන මූලපිරීම් 2017

ආදායම් උත්පාදන ධාරිතා වර්ධනය

ඉපැයීම් වල වර්ධනයක් අත්පත් කරගැනීම

තැන්පතු සංචිතය හා ණය කළඹ පුළුල් කිරීම

ප්‍රමාණාත්මක වර්ධනය හා අත්පත් කරගැනීම සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීම

පාඩු ලබන ශාඛා, ලාභ ලබන ශාඛා බවට පරිවර්ථනය කිරීම

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

යොමුව : සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. සමාලෝචනය
පිටු අංක 30

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 73-89

2018 ඉදිරි දැක්ම

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 86-89

විශිෂ්ට මෙහෙයුම් කාර්ය සාධනය

ප්‍රධාන මූලපිරීම් 2017

කාර්යක්ෂමතාව ඉහළ නංවා පිරිවැයට ආදායම් අනුපාතය අවම කිරීම

මෙහෙයුම් සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත ආයෝජනය වඩාත් හොඳ සේවාවක් සැපයීමට

තරගකාරිවීමට අපගේ පිරිස්, පද්ධති හා ක්‍රියාවලි මත ආයෝජනය ණය ගුණාත්මක බව වර්ධනය

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

යොමුව : මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 77 හා 82

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු අංක 96-99

2018 ඉදිරි දැක්ම

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු අංක 105

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු අංක 99

මූල්‍යමය ප්‍රාග්ධනය
පිටු අංක 88

ක්‍රියාශීලී, ප්‍රබෝධජනක කණ්ඩායම

ප්‍රධාන මූලපිරීම් 2017

ප්‍රධාන මූලපිරීම් 2017
කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් ගොඩනැගීම

උපායමාර්ගික හා ව්‍යාපාර සැලසුම් ක්‍රියාවලියකට සහභාගී වීමට සේවකයන් උනන්දු කරවීම

තීරණාත්මක, වෘත්තීමය හා නායකත්ව කුසලතා පුහුණුවීම් සැලසීම

පුළුල් පරාසයක සංවර්ධන වැඩසටහන් වෘත්තීමය විභාග ජය ගැනීමට සේවකයන් උනන්දු කරවීම

රාජකාරියට බාහිර ක්‍රියාකාරකම් හා ප්‍රතිලාභ පිරිනැමීම තුළින් සේවක සුභසිද්ධිය වර්ධනය

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

යොමුව : මානව ප්‍රාග්ධනය
පිටු අංක 112-118

2018 ඉදිරි දැක්ම

මානව ප්‍රාග්ධනය
පිටු අංක 121

වගකීම් සහගත සහ සාමාජීය ලෙස කැපවීම

ප්‍රධාන මූලපිරීම් 2017

ප්‍රජාව සහ පරිසරයට සහාය දැක්වීම තුළින් ආදර්ශවත් ආයතනික වගකීම් පරිචයන් ඇති කිරීම

ප්‍රධාන ඇල්මැති පාර්ශ්වයන් සමග ප්‍රායෝගික නිරතවීම් ඇල්මැති පාර්ශ්වයන්ගේ විශ්වාසය ගොඩ නැගීම

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 80

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
පිටු අංක 135-139

ස්වභාවික ප්‍රාග්ධනය
පිටු අංක 143-145

2018 ඉදිරි දැක්ම

සමාජයීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
පිටු අංක 139

ස්වභාවික ප්‍රාග්ධනය
පිටු අංක 145

ප්‍රශස්ත ප්‍රාග්ධන කළමනාකාරිත්වය

ප්‍රධාන මූලපිරීම් 2017

ප්‍රධාන මූල පිරීම් 2017
නව නියාමන අවශ්‍යතා අපේක්ෂා කිරීම හා ඊට අනුගත වීම තුළින් ප්‍රාග්ධන කළමනාකරණය වත්කම් සංචිතය වැඩිදියුණු කිරීම

අක්‍රමවත් වත්කම් අවම කිරීම

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 77, 82,84

අවදානම් කළමනාකරණ වාර්තාව
පිටු අංක 236-238

2018 ඉදිරි දැක්ම

සභාපතිතුමාගේ පණිවිඩය
පිටු අංක 23

අවදානම් කළමනාකරණ වාර්තාව
පිටු අංක 237

දූරදර්ශී අවදානම් සහ අනුකූලතා සංස්කෘතිය

ප්‍රධාන මූලපිරීම් 2017

ප්‍රධාන මූලපිරීම් 2017
මනා වත්කම් හා වගකීම් කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම හා බල ගැන්වීම

සක්‍රීය ලෙස අවදානම් ඇගයීම හා අවම කිරීම සහ සඵලදායී පාලන පද්ධති පවත්වාගැනීම

නියාමන අවබෝධතා මූලපිරීම් සහ අනිවාර්ය අනුකූලතා පුහුණු වීම්

2017 වර්ෂයේ ලැබූ ජයග්‍රහන

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 84

මානව ප්‍රාග්ධනය
පිටු අංක 119

සමාජ සහ සම්බන්ධතා
පිටු අංක 125

අවදානම් කළමනාකරණ වාර්තාව
පිටු අංක 201/238

2018 ඉදිරි දැක්ම

ඇල්මැති පාර්ශ්වයන්
පිටු අංක 51

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 88-89

යොමුව: අවදානම් කළමනාකරණය පිටු අංක 237

හුවමාරු වීම් මගින් අවසන් වියහැකි මෙම ක්‍රියාවලියේදී සමබරතාවයක් ඇතිකරගැනීම පිණිස බැංකුව ප්‍රයත්නයක් ගනු ලබයි. දූරදර්ශී සම්පත් යෙදවුම සහ කළමනාකරණය මගින් තිරසාර වර්ධනයේ වැඩිදියුණුවත් ළඟාකරගත හැකි වේ.

සම්පත්	අපගේ සම්පත් කළමනාකරණය කරන අයුරු	යොමුව
කාර්යමණ්ඩලය	උපායමාර්ගික මූලපිරීම් වලට සහයක් වන පරිදි හා ව්‍යාපාරික අවශ්‍යතා ඉටුකරගත හැකි ලෙස අපගේ කාර්ය මණ්ඩලය වර්ධනය කරගනු ලැබිණි. පුනුනුවිම් ඔස්සේ කුසලතා වර්ධනය ද සිදු කෙරිණි.	මානව ප්‍රාග්ධනය පිටු අංක 108
ගනුදෙනුකාර සම්බන්ධතා	ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම තුළින් හා අප වෙතින් ඔවුන් ලබන සේවා අතිදැකීම් වැඩිදියුණු කිරීම තුළින් අප ආයතනය කෙරෙහි ගනුදෙනුකාර පක්ෂපාතීත්වය වර්ධනය කර ගනිමු. තාක්ෂණය යෙදවීම තුළින් ගනුදෙනුකාර පදනම කාර්යක්ෂම ලෙස ඉහළ නැංවීමට කටයුතු කරමු.	ගනුදෙනුකාර ප්‍රාග්ධනය පිටු අංක 126
තාක්ෂණය	අපගේ ව්‍යාපාරික ව්‍යාපෘතියට අප බැංකුවේ තොරතුරු තාක්ෂණ පදනම උපකාරීවන බවට වගබලා ගැනීමට තාක්ෂණය මත ආයෝජනය කෙරිනි. මේ වසරේ සිට අපගේ ආයෝජනයන් මූලික තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ සිට ඩිජිටල් මාර්ග ගොඩනංවා ගැනීම සඳහා වෙනස් වී ඇත්තේ පාරිභෝගික අත්දැකීම් ඉහළ නැංවීමටයි.	නිෂ්පාදිත ප්‍රාග්ධනය පිටු අංක 103 බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 96
සමාජය හා වෙනත් සම්බන්ධතා	අපගේ නෛතිකභාවය, කීර්තිය හා විශ්වාසනීයත්වය පදනම් කර ගනිමින් අපගේ සම්බන්ධතා ගොඩ නගන ලදී.	සමාජයීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය පිටු අංක 124
යටිතල පහසුකම්	අප විසින් ශාඛා ව්‍යාප්තිය ප්‍රශස්ත ලෙස මෙහෙයවමින් ගනුදෙනුකාර සේවාවද ව්‍යාප්ත කරන ලද අතර අප ශාඛාවන් සේවා මාධ්‍යයන් වෙතින් විකුණුම් මධ්‍යස්ථාන බවට පරිවර්ථනය කරන ලදී. මුදල් ආපසු ගතහැකි සේවා ස්ථාන සංඛ්‍යාව ඉහළ නැංවූ අතර පවතින ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය වඩාත් පාරිභෝගික පහසුව දනවන වේගවත් මට්ටමකට දියුණු කරන ලදී.	නිෂ්පාදිත ප්‍රාග්ධනය පිටු අංක 102
ස්වභාවික සම්පත්	හරිත ගොඩනැගිලි මූලපිරීම් වලට එළඹීමෙන් අප විසින් පරිසරයට ඇති කරන බලපෑම අවම කිරීමට කටයුතු කෙරිණි. හරිත සංකල්පය බැංකුකරණ මූලපිරීම් හඳුන්වාදීම	ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 142
මූල්‍ය ප්‍රාග්ධනය	වාර්තාගත ඉපැයීම සහිත තවත් වර්ෂයක් බවට පත්වීම තුළින් බෙදාහැරිය හැකි මූල්‍ය වටිනාකම් නිර්මාණය කෙරිණි. අපගේ මූල්‍ය අඛණ්ඩතාවය ශක්තිමත් කිරීම සඳහා ලාභ රඳවා ගැනීම තුළින් බාසල් III ප්‍රාග්ධනය ප්‍රමාණවත්බවේ අවශ්‍යතාවය වැඩි විය.	මූල්‍ය ප්‍රාග්ධනය පිටු අංක 73
තැන්පතු සංචිතය	අතිශය දැඩි තරගකාරීත්වයක් හමුවේ වුවද අපගේ ගනුදෙනුකාර තැන්පතු වර්ධනය කර ගැනුණි.	මූල්‍ය ප්‍රාග්ධනය පිටු අංක 83

ප්‍රාග්ධන අවශ්‍යතා කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයේදී ජා.ඉ.බැ. විසින් සක්‍රීය, ඒකාකාරීව ක්‍රියාත්මක සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අනුගමනය කරයි. 2017 වර්ෂය තුළදී එක් එක් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් අදාළ මූලික හුවමාරුවීම් පහත දැක්වේ.

මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනයේ වර්ධනයත් මෙහෙයුම් කාර්යක්ෂමතාවල වර්ධනයක් මගින් සියලු ප්‍රාග්ධනයන්හි ව්‍යාප්තියක් ජනිත විය. කෙසේ වුවද, අවම ප්‍රාග්ධන මට්ටමක් පවත්වාගනු පිණිස වූ බැංකුවේ අවශ්‍යතාව, බැංකුකරණ මාධ්‍ය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති හා වෙනත් ක්‍රියාකාරකම් වෙත යොමු කල ආයෝජනය පහත වැටීමට හේතු වනු ඇත.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

දිවයින පුරා පිහිටි ගනුදෙනුකාර සේවා සැපයුම් ස්ථාන පුළුල් කිරීම, අපගේ ප්‍රාග්ධනය අඩු වීමට හේතු වී ඇත. ඉදිරි අනාගතයේ දී මූල්‍යමය ප්‍රතිලාභ අත්පත් කරගැනීමට තුඩුදෙන පරිදි අප ව්‍යාපාරික කටයුතු ඉහල නැංවීමට මෙය අත්‍යවශ්‍ය ආයෝජනයක් ලෙස බැංකුව සලකයි. මෙහිදී පාරිසරික වශයෙන් ඇතිවිය හැකි කිසියම් අහිතකර බලපෑමක් වේ නම්, එය අවම කරනු පිණිස පාරිසරික අතින් හිතකර, තිරසාර පරිවයන් උපයෝගී කර ගැනීමත් දැනටමත් පවතින යටිතල පහසුකම් දියුණුකර ගැනීමත් ආදී දූරදර්ශී ක්‍රියාදාම බැංකුව විසින් ගන්නා ලදී.

බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය උදෙසා කරනු ලබන ආයෝජන හරහා බැංකුවේ මෙහෙයුම් විශිෂ්ටත්වය, අභ්‍යන්තර ක්‍රියාවලීන්, සහ පද්ධතීන් උසස් මට්ටමකට ගෙන ඒමට අවස්ථාව සැලසේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උදෙසා බැංකුවේ ආයෝජනය හේතුකොට ගෙන නිෂ්පාදිත ප්‍රාග්ධනය හා බුද්ධිමය ප්‍රාග්ධනයට හිතකර බලපෑමක්ද මූල්‍ය ප්‍රාග්ධනයට අහිතකර බලපෑමක්ද එල්ල විය.

මානව ප්‍රාග්ධනය

නව බඳවාගැනීම්, උසස්වීම්, සෞඛ්‍ය ප්‍රතිලාභ සහ සේවක සුබ සිද්ධිය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලැබූ මුලපිරීම් මානව ප්‍රාග්ධනයට, සමාජ සහ සම්බන්ධතා ප්‍රවර්ධනයට හිතකර ලෙසත් මූල්‍ය ප්‍රාග්ධනයට අහිතකර ලෙසත් බලපානු ලැබිණි. එමෙන්ම සේවක පුහුණු කිරීම් වෙනුවෙන් බැංකුව විසින් කරන ලද ආයෝජන, අප ආයතනයේ බුද්ධිමය ප්‍රාග්ධනය වර්ධනයට හේතු විය.

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

අඛණ්ඩ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති හරහා සමාජය හා පරිසරය උදෙසා කරන ලද ආයෝජන වල ප්‍රතිඵල ලෙස කෙටිකාලීනව අපගේ මූල්‍ය ප්‍රාග්ධනය ශක්තිමත් කරලීමට හැකිවිය. මෙකී මුලපිරීම්, ආර්ථික හා පාරිසරික තිරසාර බවට මග පාදනු ඇත.

ස්වභාවික ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය අතින් අපගේ මෙහෙයුම් වල ව්‍යාප්තිය, ස්වභාවික ප්‍රාග්ධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇතිකරයි. එබැවින් පුනර්ජනනීය සම්පත් භාවිතය, කාර්යක්ෂම බලශක්ති කළමනාකරණය, කඩදාසි රහිත සන්නිවේදනය, හරිත සංකල්ප ගොඩනැගිලි, සූර්ය කෝෂ සවිකිරීම යනාදී ප්‍රධාන මුලපිරීම් වලට එළැඹීමෙන් පරිසරය කෙරෙහි එල්ලවන අහිතකර බලපෑම් අවම කිරීමට බැංකුව විසින් කටයුතු කෙරෙයි.

අතීත නව ඩිජිටල් ලොවක් කරා...

බැංකු ක්ෂේත්‍රය ඩිජිටල්කරණයවීමත් සමග නව මූල්‍ය පරිසරයක් නිර්මාණය වන බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වටහාගත් කරුණකි. අපට අදාළ භූමිකාව සෑම විටකම ඉටු කරමින් ඩිජිටල්කරණය මගින් ඇති කරන පරතරය අවම කරන අතරම දිගුකල් රැඳෙන සලකුණක් තැබීමට නම් අප හට අපගේ ඇල්මැති පාර්ශවයන් සමග භෞතිකව මෙන්ම තත්කාලීන ආකාරයෙන්ද සම්බන්ධවී අපගේ කාර්යභාරයෙහි නියැළිය යුතු බවයි.



කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

මූල්‍ය ප්‍රාග්ධනය


මූල්‍ය ප්‍රාග්ධනය යනු වෙනත් ප්‍රාග්ධනයන් බවට පරිවර්ථනය කිරීමෙන් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා භාවිත කරන අරමුදල් සංචිතයකි. මෙම ප්‍රාග්ධනය මූල්‍යනය (හිමිකම් හා ණය) සහ මෙහෙයුම් (තැන්පතු) මගින් රැස් කර ගැනේ. එසේ උත්පාදිත අරමුදල්, මෙහෙයුම් සහ ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති සඳහා අනුමත අවදානම් තුළ තිරසාර ප්‍රතිලාභ නිපදවීමට සහ අවම නියාමන අවශ්‍යතා සපුරාලීමට යොදාගනු ලැබේ.

දළ විශ්ලේෂණය

වසර 2017 ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා අතිශය වැදගත් වසරක් වූයේ, වසර අවසානය වන විට බැංකුව සිය විශිෂ්ඨම මූල්‍ය කාර්යසාධනයෙහි වාර්තාගත ඉහළම බදු පෙර ලාභය රු.බිලියන 14.0 සහ බදු පසු ලාභය රු. බිලියන 9.6 ක් වාර්තා කරමිනි. බැංකුව ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රවල සමස්ත වර්ධනයක් පෙන්වීය. ව්‍යාපාර පරිමාවේ කැපී පෙනෙන වර්ධනයක් වූයේ රු. බිලියන 1.1 ක රජයේ සුරැකුම්පත් වෙළෙඳාම මෙම කාර්යසාධනය සඳහා දායක වෙමිනි. ශක්තිමත් අලෙවිකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම, සන්නම ශක්තිමත් කිරීම සඳහා ආයෝජන සහ විචක්ෂණශීලී අවදානම කළමනාකරණය කිරීම වැනි වෙනත් සාධක මෙම ජයග්‍රහණවලට දායක විය. පොළී පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොළී ආන්තිකය අඩු වීම, ව්‍යාපාර පරිමාව සැලකිය යුතු ලෙස ඉහළ යාමෙන් සමනය විය. ඒ අනුව පොළී ආදායම රු. බිලියන 103.4 ක් විය.

රුපියල් ට්‍රිලියනයක වත්කම් පදනමක් ඇති පළමු බලපත්‍රලාභී විශේෂිත බැංකුව බවටද ජාතික ඉතිරිකිරීමේ බැංකුව පත් විය. එය තවත් සුවිශේෂී සන්ධිස්ථානයකි. බැංකුවේ ණය කළඹ කළමනාකරණය සහ විශිෂ්ඨ වත්කම් ගුණාත්මක භාවය මැනවින් විදහා දක්වමින්, දළ අක්‍රීය ණය අනුපාතය 1.3% ක් දක්වා පහළ බැස ඇති අතර, එය බැංකු ක්ෂේත්‍රයේ අඩුම අගයන්ගෙන් එකකි. ආමුඛ ප්‍රේෂනවල වර්ධනය වන වෙළඳපොළ කොටස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විසින් තබන ලද විශ්වාසයට සාක්ෂියකි.

අක්‍රිය ණය අනුපාතය (දළ) බැංකුව සහ ක්ෂේත්‍රය



වසර	බැංකුව %	ක්ෂේත්‍රය %
2013	7.0	5.6
2014	7.6	4.2
2015	3.5	3.2
2016	1.6	2.6
2017	**1.3**	**2.5**

ආදායම් වාර්තා විශ්ලේෂණය

ආදායම් වාර්තාවේ සාරාංශය

අයිතමය	2017	2016	වැඩිවීම/ (අඩුවීම්) රු.මි.	වර්ධනය %
පොළී ආදායම	**103,400**	86,390	17,010	19.69
පොළී වියදම	**78,445**	60,923	17,522	28.76
පොළී නොවන ආදායම	**4,417**	1,009	3,408	337.80
මෙහෙයුම් වියදම්	**11,047**	10,344	703	6.80
හානිකරණ ගාස්තු	**693**	(100)	793	795.37
බදු පෙර ලාභය	**14,029**	13,303	726	5.46
බදු	**7,913**	6,596	1,317	19.96
බදු පසු ලාභය	**9,610**	9,498	112	1.18

GRI201-1

උත්පාදිත ඍජු ආර්ථික අගය හා බෙදාහැරීම

	2017 රු. මිලියන	2016 රු. මිලියන
උත්පාදිත ඍජු ආර්ථික අගය:	**107,817**	87,399
මෙහෙයුම් වියදම්	**4,643**	3,613
තැන්පත්කරුවන්	**78,445**	60,923
සේවකයන්	**6,887**	6,235
ප්‍රාග්ධනය සපයන්නන්	**5,111**	12,026
ලාභාංශ හැර රජය	**8,331**	7,225
රඳවාගත් ඍජු ආර්ථික අගය	**4,400**	(2,623)
බෙදා හරින ලද ඍජු ආර්ථික අගය	**103,417**	90,022

ශුද්ධ පොළී ආදායම

බැංකුවේ දළ ආදායම 23.4% කින් රු.බිලියන 107.8 දක්වා වැඩි වීමට මුළු ආදායමෙන් 95.9% ක් නියෝජනය කළ පොළී ආදායමෙහි ප්‍රබල වර්ධනය හේතු වූ අතර පෙර වසරෙහි වාර්තාගත රු. බිලියන 86.4 පොළී ආදායම සමග සසඳන විට 19.7% කින් එනම් රු. බිලියන 103.3 කින් වැඩි දියුණු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ණය සහ අත්තිකාරම් කළඹේ පුළුල් වර්ධනය සහ රජයේ සුරැකුම්පත්වල පොළී ආදායමය.

33.9% ක සැලකිය යුතු වැඩිවීමක් සමගින්, ණය සහ අත්තිකාරම්වලින් උත්පාදිත පොළී ආදායම 2016 දී වාර්තාගත රු. බිලියන 32.7 ට සාපේක්ෂව රු. බිලියන 43.8 ක් විය. පොළී ආදායම, බැංකුවේ පොළී ආදායමෙන් 56.9% කි. එය 2016 වසරේ වාර්තා කළ රු. බිලියන 53.1 ක් වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොළී ආදායමට සාපේක්ෂව 11.0% ක වර්ධනයත් සමග 2017 වසරේ රු. බිලියන 58.9 ක් වාර්තා කරමින් වැඩිම දායකත්වයක් අඛණ්ඩව සපයයි.

පොළී ආදයම පසුගිය වසරේ වාර්තාගත රු. බිලියන 60.9 ට සාපේක්ෂව රු. බිලියන 78.4 ක් දක්වා 28.8% කින් වැඩි වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රු. බිලියන 60.2 ක් වන වෙනත් ගනුදෙනුකරුවන් හේතුවෙන් වූ 35.6% ක පොළී වියදම් වැඩිවීමය. 2017 දී පොළී වියදම්වල සැලකියයුතු ලෙස ඉහළ යාමක් දක්නට ලැබුණ අතර එයට හේතු වූයේ කෙටිකාලීන තැන්පතුවලට ඉහළ ප්‍රතිමිලකරණයක් සමග පොළී අනුපාතවල ඉහළ යාමය.

ණය සහ අත්තිකාරම් මත පොළී ආදායමට සහ කල්පිරෙන තෙක් දරා සිටින රජයේ සුරැකුම්පත්වල (HTM) ආයෝජන පොළී ආදායමට වඩා පොළී වියදම බෙහෙවින් ඉහළ යාම ශුද්ධ පොළී ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර ශුද්ධ පොළී ආන්තිකය අඩපණ විය. මේ අනුව සමස්ත මෙහෙයුම් ආදායමෙන් 85.3% ක් වූ බැංකුවේ ශුද්ධ පොළී ආදායම ආන්තික වශයෙන් 2.0%කින් 2016 රු. බිලියන 25.5 සිට 2017 රු. බිලියන 25.0 දක්වා පහත වැටී අතර ශුද්ධ පොළී ආන්තිකය (NIM) ද පසුගිය වසරේ වාර්තා කළ 2.9% සිට 2.6% දක්වා පහත වැටී ඇත.

පොළී නොවන ආදායම

පොළී නොවන ආදායම ගාස්තු සහ කොමිස් ආදායම, මූල්‍ය ආයෝජන වෙළඳාමෙන් ශුද්ධ ලාභය/අලාභය හා අනෙකුත් මෙහෙයුම් ආදායමෙන් සමන්විත දළ ආදායමෙන් 1.1% කට දායක වන ලදී. ඉහත සඳහන් සියලු සංරචකවලින් වාර්තා වූ සුවිශේෂී ප්‍රගතිය බැංකුවට පොළී නොවන ආදායමෙහි 337.8% ක ආකර්ෂණීය වර්ධනයක් ලබා ගැනීමට හැකියාව ලබා දුන්නේ 2016 වාර්තාගත රු. බිලියන 1.0 ට සාපේක්ෂව රු. බිලියන 4.4 ක් වාර්තා කරමිනි.

- ගාස්තු සහ කොමිස් ආදායම 20.4% කින් රු .මිලියන 783.8ක් දක්වා වැඩි වූ අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ණය වලින් ලබාගත් ගාස්තු සහ කොමිස් මුදල් වන අතර එය වසර තුළ දී 23.3% ක වර්ධනයක් වාර්තා කරමින් රු. මිලියන 675.4 දක්වා වර්ධනය විය.

- 352.4% ක වර්ධනයක් සමගින් වෙළෙඳ කළඹින් ලැබූ ශුද්ධ ලාභය රු. බිලියන 1.2 ක් වූයේ පෙර වසරේ රු. මිලියන 39.3 ක අලාභයට එදිරිව වන අතර පොළී අනුපාත වෙළඳපොළ මිලට ලකුණු කිරීමෙන් ඉපයූ ප්‍රතිලාභ මීට හේතු විය.


- අනෙකුත් මෙහෙයුම් ආදායම 381.5% වර්ධනයත් සමග රු.බිලියන 1.7 දක්වා පෙර වසරේ වාර්තාගත රු. මිලියන 357.3 ට එදිරිව ඉහළ ගොස් ඇත්තේ විනිමය අනුපාතවල වෙනස්වීම් වලින් ඇති වන ලාභය, විකිණිය හැකි මූල්‍ය ආයෝජනවලින් ලැබෙන ලාභාංශ හා පාලිත සමාගම්වලින් ලැබූ ලාභාංශ සමග එක්වීමෙනි.

මුළු මෙහෙයුම් ආදායම

ගාස්තු හා කොමිස් ආදායමේ වැඩිවීම්, ආයෝජන වෙළඳාමින් ලද ශුද්ධ ආදායම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වලින් ශුද්ධ ලාභය ශුද්ධ පොළී ආදායමේ පහත වැටීම ඉක්මවා සමස්ත මෙහෙයුම් ආදායම 11.1% කින් රු. බිලියන 29.3 ක් දක්වා 2016 වසරේ රු. බිලියන 26.3 සිට වර්ධනය වීමට හේතු වූ ප්‍රධාන සාධක විය. පොළී නොවන ආදායමෙන් මුළු මෙහෙයුම් ආදායමට දැක්වූ සාපේක්ෂ දායකත්වය සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ ඉහළ යාමට කොටස් සහ පොළී අනුපාත වලට අදාළ උපකරණවලින් උපලබ්ධි නොවූ ලැබීම් සහ උපලබ්ධි වූ ලැබීම් හේතු විය.

මුළු මෙහෙයුම් ආදායම

[රු. මිලියන]




	2013 රු. මිලියන	2014 රු. මිලියන	2015 රු. මිලියන	2016 රු. මිලියන	2017 රු. මිලියන
ශුද්ධ පොළී ආදායම	10,107	21,380	26,983	25,467	**24,955**
අනෙකුත් ආදායම	1,097	3,512	678	359	**3,634**
ශුද්ධ ගාස්තු හා කොමිස්	195	286	364	513	**674**

ණය කළඹ වර්ධනයට සාපේක්ෂව හානිකරන ප්‍රතිපාදන රු. මිලියන 792.9 කින් වැඩිවීම වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය වීම සහ පූර්ව ක්‍රියාකාරී අවදානම් කළමණාකරන ප්‍රවේශයන් නිසා හිලව් විය. මෙය අනපේක්ෂිත අලාභ ආවරණය කරගැනීම සඳහා අවරෝධකයක් තබා ගැනීමට හැකිවන පරිදි බැංකුවේ ප්‍රතිපාදන ආවරණය වර්ධනය කරගැනීමට ඉවහල් විය.

මෙහෙයුම් වියදම්


මෙහෙයුම් වියදම් 6.8% ක වැඩි වීමක් දැක්වූයේ පෙර වසරේ වාර්තා ගත රු. බිලියන 10.3 ට සාපේක්ෂව රු. බිලියන 11.0 ක් පෙන්වමිනි. මෙහෙයුම් වියදම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නව බඳවා ගැනීම් මෙන්ම දිගුකාලීන දුක් ගැනවිලි විසඳීමට සහ කර්මාන්ත සාමය පවත්වා ගැනීමට බාහිර සේවාස්ථ සේවකයන් ස්ථීර සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිසා සේවක පිරිවැය 10.4% කින් වැඩි වීමය. කෙසේ වෙතත් මෙහෙයුම් වියදම්වල වැඩිවීම 7.3% ක් වන රටේ සාමාන්‍ය උද්ධමන අනුපාතිකයට පහලින් මෙන්ම පිළිගත හැකි මට්ටමේ අයවැය අපේක්ෂාවන් තුළ පවත්වාගෙන යන බව සඳහන් කිරීම සැලකිය යුතු කරුණකි. 2016 දී 39.6% ක් වූ එකතුකළ අගය මත බදු අනුපාතයට මෙම වසරේ 38% වුවද, කර්මාන්ත සමානයන්ට සාපේක්ෂව එය පහළින් පවතී. එකතුකළ අගය මත බදු වියදම හැර පිරිවැයට ආදායම අනුපාතික ආකර්ශණීය අගයක පවත්වා ගැනීමට බැංකුව එහි වියදම් විචක්ෂණශීලීව කළමනාකරණය කළේය.

මෙහෙයුම් වියදම් සංයුතිය



වියදම්	2017		2016		වර්ධනය
	රු. මිලියන	%	රු. මිලියන	%	%
සේවක පිරිවැය	**6,887**	**62.3**	6,235	60.3	10.45
අනෙකුත් පරිපාලන වියදම්	**4,161**	**37.7**	4,109	39.7	1.26
	11,047	**100.0**	10,344	100.0	6.80

ආදායමට පිරිවැය අනුපාතය




වසර	පිරිවැයට ආදායම් %
2013	62.2
2014	36.7
2015	37.4
2016	39.7
2017	**38.0**

බදුකරණය

සෘජු හා වක්‍ර බදු වශයෙන් රජයට බැංකුවේ දායකත්වය 19.9% කින් ඉහළ ගියේ පසුගිය වසරේ බිලියන 6.6 ක් වූ එය 2017 වසරේදී බිලියන 7.9 ක් වෙමිනි. මෙයට රු.බිලියන 4.4 ක ආදායම් බදු සහ මූල්‍ය සේවා මත අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු රු.බිලියන 3.5ඇතුළත් විය. මූල්‍ය සේවා මත අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු වසර තුළදී බිලියන 3.5 ක් දක්වා රු. බිලියන 2.8 සිට වැඩි වූයේ 25.2% ක වැඩිවීමක් වාර්තා කරමිනි. 2016 නොවැම්බර් මස සිට බලපැවැත්වූ සහ 2017 දී මුළුමනින්ම බලාත්මක වූ 11% සිට 15% දක්වා මූල්‍ය සේවා මත අගය එකතු කළ බදු වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ආදායම් බදු සඳහා මූල්‍ය සේවා මත අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු අඩු කිරීමට ඉඩ නොදීම හේතුවෙන් වසර සඳහා වන ආදායම් බදු 16.1% කින් රු. බිලියන 4.4 දක්වා පෙර වසරේ වාර්තාගත බිලියන 3.8 ට සාපේක්ෂව වැඩි විය.

බදු




වසර	එකතු කළ අගය මත බදු රු. මිලියන	ජාතිය ගොඩනැගීමේ බදු රු. මිලියන	ආදායම් බදු රු. මිලියන
2013	624	-	1,095
2014	1,745	291	3,606
2015	2,062	375	4,361
2016	2,406	386	3,805
2017	**3,083**	**411**	**4,419**

ලාභදායීතාව

මේ වසරේදී බැංකුව එහි ඉතිහාසයේ ඉහළම බදු පෙර ලාභය වන රු. බිලියන 14.0, 2016 රු. බිලියන 13.3 සිට 5.5% කින් වර්ධනයක් වාර්තා කළේය. බදු පෙර ලාභය වැඩි දියුණු වුවද, බදු පසු ලාභය රු. බිලියන 9.5 සිට 2017 රු. බිලියන 9.6 දක්වා 1.2% ආන්තිකයින් වැඩි වූයේ ආදායම් බදු ප්‍රතිශතයන් ඉහළ මට්ටමක තිබියදීමය. ණය හා අත්තිකාරම් කළඹේ පුළුල් වීම හේතුවෙන් පොළී ආදායමේ වර්ධනය සහ පොළී නොවන ආදායමෙහි වැඩිවීම ශුද්ධ පොළී ආන්තිකයෙහි පහළ යාම සහ හානිකරණ පාඩු සහ බදුවල වැඩිවීම මධ්‍යයේ උවද ඉහළම ලාභය වාර්තා කිරීමට බැංකුවට හැකියාව ලබා දුන්නේය.

11.0% ක වත්කම් වර්ධනයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය 1.5% ක මට්ටමක පවත්වාගෙන යන ලදී. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 26.5% පසුගිය වසරේ වාර්තා වූ 29.4% ට වඩා අඩු වූයේ රු. බිලියන 4.5 ක් වූ දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය පිළිබඳ අතිරික්තය හේතුවෙනි.

බදු පෙර ලාභය හා බදු පසු ලාභය




වසර	බදු පෙර ලාභය රු. මිලියන	බදු පසු ලාභය රු. මිලියන
2013	2,279	1,184
2014	10,472	6,867
2015	13,034	8,672
2016	13,303	9,498
2017	**14,029**	**9,610**

ජාතියට දක්වන ලද දායකත්වය

ජාතියේ ඉතිරිකිරීමේ බැංකුව ලෙස ජාතියේ සංවර්ධනය සඳහා බදු ගෙවීම්වලට අමතරව බැංකුව විසින් විශේෂ ගාස්තු, භාණ්ඩාගාරයට ලාභාංශ, ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය සපයමින් ජාතික සංවර්ධනයට අඛණ්ඩව දායක වී ඇත. රජයට බැංකුවේ දායකත්වය 2017 වසරේදී රු. බිලියන 13.4 දක්වා පෙර වසරේ වාර්තාගත රු. බිලියන 19.2 ට සාපේක්ෂව වාර්තා විය. වසර තුළදී බැංකුව රු. බිලියන 5.1 ක සැලකිය යුතු ලාභාංශ ප්‍රමාණයක් එහි කොටස් හිමියන් වන, ශ්‍රී ලංකා රජයට ගෙවා ඇති අතර එය 2016 දී ගෙවූ රු. බිලියන 12.0 ට වඩා 57.5% කින් අඩු වූයේ තිරසාර සංවර්ධනය සඳහා ලාභය රඳවා ගැනීමට ගත් තීරණය හේතුවෙනි.

ජාතියට දක්වන ලද දායකත්වය



අයිතමය	2017 රු. මිලියන
එකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු	**3,494**
ආදායම් බදු	**4,419**
භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ ගාස්තුව	**320**
ලාභාංශ	**5,111**
ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය	**96**
එකතුව	**13,440**

මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය

වත්කම්

මූල්‍ය තත්ත්ව සාරාංශය

	2017 රු. මිලියන	2016 රු. මිලියන	2017 %	2016 %
මුළු වත්කම්	**1,012,103**	911,704	**100**	100
මූල්‍ය ආයෝජනය - කල්පිරෙන තෙක් රඳවාගත්	**544,273**	505,824	**53.78**	55.48
වෙනත් පාරිභෝගිකයන්ට - ණය සහ ලැබිය යුතු	**360,310**	291,977	**35.60**	32.03
බැංකුවට - ණය සහ ලැබිය යුතු	**27,715**	31,834	**2.74**	3.49
වෙළඳාම සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	**6,472**	20,291	**0.64**	2.23

බැංකුව මෙම වසරේදී රු. ට්‍රිලියනයක වත්කම් සන්ධිස්ථානය පසු කළේ 2016 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කළ බිලියන 911.7 ක වත්කම් 11.0% කින් වර්ධනය කර ගනිමිනි. රුපියල් ට්‍රිලියනයක වත්කම් අත්පත් කරගත් ප්‍රථම බලපත්‍රලාභී විශේෂිත බැංකුව බවට ජාතික ඉතිරිකිරීමේ බැංකුව පත්වූ අතර වසර 45 කට පෙර එහි ස්ථාපිත කිරීමේ සිට සාපේක්ෂව කෙටි කාලපරිච්ඡේදයක් තුල ට්‍රිලියනයක වත්කම් පදනමක් ලබා ගත් පළමු ශ්‍රී ලාංකික බැංකුව බවට ද එය පත් විය. මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීමේ ශක්තිමත් භාවය පිළිබිඹු කරමින්, පොළී උපයන ණය කළඹ සහ මූල්‍ය ආයෝජන සමස්ත වත්කම් පදනමෙන් 95% කට වඩා වැඩි විය.


2017 වසර තුළදී බැංකුවේ ණය සහ ආයෝජන කළඹ රු. බිලියන 92.1 කින් වර්ධන වේගය 10.5% ක් සහිතව ඉහළ ගිය අතර එයට ප්‍රධානවම දායක වූයේ රු. බිලියන 64.2කින් වැඩි වූ ණය සහ අත්තිකාරම්වල මුළු වැඩිවීමය. එය ණය සහ අත්තිකාරම්වල මුළු වැඩිවීමෙන් 69.7% කි. කෙසේ වෙතත් මෙම වැඩිවීම ළඟා කර ගන්නා ලද්දේ ප්‍රාග්ධන ලාභ උපලබ්ධි අරමුණ සඳහා විකුණන ලද වෙළඳ ආයෝජන සහ විකිණීමට හැකි ආයෝජන කළඹෙහි රු. බිලියන 14.3 ක සෘණ වර්ධනය තිබියදීය. මෙයට තැන්පතුවලට රජයේ සුරැකුම්පත් අනුපාතය 2016 දී 66.4% සිට 2017 වසර අවසානය වන විට 62.1% දක්වා පහත වැටීම සාක්ෂි දරයි.

ණය සහ ලැබීම්

මුළු වත්කම් පදනමෙන් 53.8% ක කොටසක් ඉක්ම වූ, කල් පිරීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන, වත්කම් සංයුතිය තුළ පසුගිය වසරේ සාපේක්ෂව නොවෙනස්ව පැවතුනි. සමස්ත වත්කම් පදනමෙන් ණය සහ ලැබීම් 38.3% කි. අනෙකුත් පාරිභෝගිකයන්ට ණය සහ අත්තිකාරම් පෙර වසරේ රු. බිලියන 292.0 සමග සසඳන විට මේ වසරේ රු. බිලියන 360.3 දක්වා 23.4% ප්‍රබල වර්ධන වේගයකින් වර්ධනය වී ඇත. ඊට ආයතනික ණය වෙතින් ඉහළ ගිය ණය ඉල්ලුම මෙන්ම සිල්ලර ණය වර්ග වන පුද්ගල ණය, තැන්පතුවලට එරෙහිව ණය සහ උකස් අත්තිකාරම් බැංකුවේ ශුද්ධ ණය සහ අත්තිකාරම්, වෙළඳපොළ කොටස 2016 දී 5.7% සිට මේ වසර අවසානය වන විට 5.9% දක්වා වැඩිදියුණු කර ගැනීමට ආධාර විය. යටිතල පහසුකම්, නිවාස සහ ඉදිකිරීම්, අධ්‍යාපන

යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් කර්මාන්ත අංශ ගණනාවකට ණය සහ ලැබීම් කළඹ විවිධාංගීකරණය කර ඇත.

ණය වර්ධනය



වසර	ණය කළඹ රු. මිලියන	වර්ධනය %
2013	166	2.4
2014	223	33.8
2015	272	22.0
2016	324	19.2
2017	**388**	**19.8**

ආයෝජන

කල්පිරීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන ආන්තිකව 7.6% කින් රු. බිලියන 544.3 දක්වා පෙර වසරේ වාර්තාගත බිලියන 505.8ට එරෙහිව ඉහළ ගියේය. කෙසේ වෙතත් ඉහළ ප්‍රතිලාභ උත්පාදනය කරන ණය සහ අත්තිකාරම් දෙසට විවිධාංගීකරණය කිරීම සඳහා ආයෝජන විකිණීම සහ වෙළඳපොළ විචලනයන්ට නිරාවරණය වීම සීමාකිරීම හේතුවෙන් වෙළඳ ආයෝජන කළඹේ මූල්‍ය වත්කම් 2016 වසරේ රු.බිලියන 20.3 ට සාපේක්ෂව 2017 වසරේ රු. බිලියන 6.5 දක්වා 68.1% කින් පහත වැටුනි. තවද, ප්‍රාග්ධන ලාභ උපලබ්ධ කරමින් වසර තුළ සිදු කළ විකුණුම්වල ප්‍රතිඵලයක් ලෙස විකිණිය හැකි ආයෝජන කළඹ රු. බිලියන 0.5 කින් අඩු විය.

වත්කම්වල ගුණාත්මකභාවය

බැංකුවේ මධ්‍යස්ථ අවදානම් පිවිසුම හේතුවෙන් ණය සහ අත්තිකාරම්වල සිදු වූ සැලකිය යුතු වර්ධනය නිසා පිළිවෙළින් කර්මාන්තයට අදාළ දළ හා ශුද්ධ අක්‍රිය ණය අනුපාතය වන 2.5% සහ 1.3% අනුපාතවලට සාපේක්ෂව බැංකුවෙහි අක්‍රිය ණය අනුපාත මනාව පහළින් සිටියේය. පසුගිය වර්ෂයේ වාර්තා කළ 36.1% ප්‍රතිශතය හා සසඳන කල ප්‍රතිපාදන ආවරණය 46.0% දක්වා වැඩි විය. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට දළ හා ශුද්ධ අක්‍රිය ණය අනුපාත පිළිවෙලින් 1.3% හා 1.2% දක්වා 2016 වාර්තා වූ 1.6% සහ 1.5% සමග සසඳන කළ වැඩි දියුණු වීමක් ඇත.

වගකීම්


පාරිභෝගික තැන්පතුවල පුළුල්වීම හේතුවෙන් පසුගිය වසරේ වාර්තා වූ රු. බිලියන 879.5 මුළු වගකීම් 2017 අවසානය වන විට රු.බිලියන 971.9 දක්වා 10.5% ක වර්ධනයක් වාර්තා කරයි. අරමුදල් සංයුතියෙන් 72.8% ක විශාල කොටසක් ගනුදෙනුකාර තැන්පතුවලින් මූල්‍යනය වී ඇති අතර අනෙකුත් වත්කම් ප්‍රධානවම ණයට ගැනීම් මගින් මූල්‍යනය වී ඇත. අරමුදලේ සංයුතිය 2016 වසරට සාපේක්ෂව 2017 වසර තුළ නොවෙනස්ව පැවතුණි.

තැන්පතු

බැංකුවේ තැන්පතු පදනම එහි ඉහළම සංචලනය සමග මුළු තැන්පතු පදනම රු. බිලියන 737.2 දක්වා රු. බිලියන 79.9 කින් වර්ධනය වෙමින් පෙර වසරේ තැන්පතු පදනම වූ රු. බිලියන 657.3 ට සාපේක්ෂව 2017 දී 12.2% ක වර්ධනයක් වාර්තා විය. රු. බිලියන 549.0 දක්වා ස්ථාවර තැන්පතුවල 14.2% ක ප්‍රබල වර්ධනය රු.බිලියන 188.2 ඉතුරුම් තැන්පතුවල 6.7% ක වැඩිවීම සමග සසඳන කල තැන්පතු මිශ්‍රණයෙහි කාලීන තැන්පතු 2016 දී 73.2% සිට සමාලෝචනය යටතේ ඇති කාල පරිච්ඡේදය තුළ 74.5% දක්වා වැඩිවීමට හේතු විය.

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම වෙනුවට ණය මුදාහැරීම සඳහා මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගැනීම හේතුවෙන් 2017 වර්ෂය අවසානයේදී 66.4% සිට 62.1% දක්වා රජයේ සුරැකුම්පත්වලට තැන්පතු අනුපාතිකයෙහි අඩුවීම සැලකිය යුතු ජයග්‍රහණයකි. මෙය පෙර වසරේදී වාර්තාගත 44.1% ට සාපේක්ෂව 47.0% ක ණය තැන්පතු අනුපාතයක් සඳහා හේතු විය.

තැන්පතු වර්ධනය



වසර	තැන්පතු පදනම රු. බිලියන	වර්ධනය %
2013	502	9.7
2014	554	10.4
2015	596	7.5
2016	657	10.3
2017	**737**	**12.2**

ණයට ගැනීම්

ගනුදෙනුකරුවන්ගේ තැන්පතු හැර දෙවන විශාලතම අරමුදල් මූලාශ්‍රය වන ණයට ගැණුම්, මුළු අරමුදල් මූලාශ්‍රවලින් 22.2% කි. ණය ගැනීම් සඳහා ප්‍රධාන දායකයින් වූයේ අන්තර්ජාතික බැඳුම්කර, යටත්කාලීන වගකීම් සහ ප්‍රතිමිලදී ගැනුම් (REPO) ගිවිසුම් යටතේ විකුණනු ලැබූ සුරැකුම්පත් වන අතර 5.2% ක ආන්තික වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 224.1 දක්වා ළඟා වූයේ 2016 දී රු. බිලියන 213.2 සිටය.
මෙම වර්ධනයට මූලිකවම හේතු වූයේ 13.2% කින් රු.බිලියන 61.3 ක් දක්වා 2016 රු. බිලියන 54.1 සිට වැඩි වූ ප්‍රති මිලදී ගැනුම්ය (REPO).

ප්‍රාග්ධනය

කොටස් හිමිකරුවන්ගේ අරමුදල් රු. බිලියන 40.2 දක්වා රු. බිලියන 32.2 සිට 24.7% කින් වර්ධනයක් සමගින් වැඩි වූ අතර එයට රු. මිලියන 500 ක ප්‍රාග්ධනීතකරණය කළ හිමිකම් නොකී තැන්පතු සංචිත, රු. බිලියන 4.5 ක සහ ප්‍රත්‍යාගණන අතිරික්ත සංචිතය සහ රු. බිලියන 7.0 ක් වූ වෙනත් සංචිත හේතු විය. හිමිකම් වත්මන් වසර අවසානය වන විට සමස්ත වත්කම්වලින් 4.0% ක් පමණ මූල්‍යනයට උපයෝගී කර ගන්නා ලද අතර, 2016 දෙසැම්බර් වාර්තා කළ 3.5% මූල්‍යනයට සාපේක්ෂව වර්ධනයකි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා බැංකු කර්මාන්තය වෙත 2017 ජූලි 1 දින සිට බලාත්මක වන පරිදි බාසල් III හඳුන්වා දෙන ලදී. 2019 ජනවාරි 01 වන දිනට සම්පූර්ණ වන පරිදි මාස 18 ක කාලපරිච්ඡේදයක් තුළ අදියර තුනකින් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇති අතර එහිදී බැංකුව සිය පළමු ස්ථර ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය 10% ක පවත්වා ගෙන යා යුතු අතර එහි මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 14% ක පවත්වගනු ඇත. 2017 අවසන් වන විට බැංකුවේ ස්ථර 1 සහ 2 ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාත පිළිවෙළින් 11.9% සහ 15.3% වූ අතර එය පිළිවෙලින් 7.75% සහ 11.75% වන ස්ථර I සහ ස්ථර II අවම නියාමන සීමාවන්ට මනාව ඉහළින් පවත්වා ගන්නා ලදී.

20% ක ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතයට සාපේක්ෂව බැංකුවේ ද්‍රවශීලතා අනුපාතය 73.4% ක ඉහළ අගයකින් පැවතුනි. බාසල් III ට අනුකූලව උසස් තත්වයේ ද්‍රවශීල වත්කම් ලබා ගැනීමේ හැකියාව විස්තර කරන ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2017 වර්ෂය අවසානයේ දී 376.2% ක් වන අතර එය ව්‍යවස්ථාපිත අවම ද්‍රවශීලතා අනුපාතය 80% ට වඩා ඉතා ඉහළ අගයක් ගනී. මහ බැංකුව විසින් නීර්ණය කර ඇති නිර්වචන අනුව ස්ථාවර අරමුදල් සැපයුම පදනම් කර ගනිමින් බැංකුව සෞඛ්‍ය සම්පන්න වේ. 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය 135% ක් වූ අතර එය අවම අවශ්‍යතාවය වන 100% සාපේක්ෂවය.

ප්‍රධාන ව්‍යාපාරික අංශ සමාලෝචනය

අපගේ විවිධාංගීකරණයවූ සහ තිරසාරවූ ව්‍යාපාරික ආකෘතිය තුලින් සමාජයේ සෑම තරාතිරමකටම අයත් අපගේ පාරිභෝගිකයන් වෙනුවෙන් අපි නවීන මූල්‍ය නිමැවුම් හා සර්ව සම්පූර්ණ සේවාවන් සලසන්නෙමු. බණ්ඩිත ව්‍යාපාරික අංශ සමගින් මෙහෙයුම්, සේවා සහ නිමැවුම් විවිධාංගීකරණය නිසා විවිධවූ අවශ්‍යතා සහිත ජනතාවට සේවය සැලසීමට අපට හැකියාව ලැබී ඇත. අපගේ ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රවල මනා කළමනාකරණය වඩා හොඳ කාර්යසාධනයක් සහ ප්‍රාග්ධන වර්ධනයක් සඳහා මග පාදා ඇත. අපගේ ප්‍රධාන ව්‍යාපාරික අංශයන්හි අසාර්ථකවීම් ආදායම්, ලාභ සහ වටිනාකම් වල භෞතික අහිමිවීම් සඳහා මග පාදන බවට අපි දැනුවත්ව සිටිමු. සියළු ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි බැංකුවේ ප්‍රධාන භූමිකාව තිරසාර හා ශක්තිමත් කරගැනීමට අපට හැකියාව ලැබී ඇත. අපගේ ප්‍රධාන ව්‍යාපාරික අංශ නම්:



ශාඛා බැංකුකරණය



ජාත්‍යන්තර බැංකුකරණය හා වෙළඳ සේවා



භාණ්ඩාගාරය



ආයතනික ණය



ශාඛා බැංකුකරණය : දිවයින පුරා අපගේ සන්නාමය තහවුරු කිරීම

තාත්වික බැංකුකරණය සීඝ්‍ර ලෙස උපයෝගී කරගැනීම හා ස්වයං සේවා සහ බැංකු ක්ෂේත්‍රය ඩිජිටල්කරණය කිරීම නිසා ගණුදෙනුකරුවන් වැඩි ප්‍රමාණයක් අන්තර්ජාල හෝ ජංගම දුරකථන බැංකුකරණය හරහා ඔවුන්ගේ බොහෝ ගණුදෙනු ඉටු කරගැනීමට පෙළඹී සිටිති. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගය, ඩිජිටල් පරිවර්ථනය හා සමපාත වන අතර අප තව දුරටත් ගණුදෙනුකරුවන් තුල ඇති කරන හැඟීම කෙරෙහි අවධානයෙන් සිටිමු.

අපගේ ගණුදෙනුකරුවන් සමාජයේ සෑම ස්ථරයකටම අයත් වූවන් වන අතර ඉන් බොහෝ පිරිසක් තවමත් සාම්ප්‍රදායික බැංකුකරණය ප්‍රිය කරති. ඩිජිටල් අනාගතය පිළිගැනීමට අපි සූදානම්ව සිටින අතර ගනුදෙනුකරුවන් හා මුහුණට මුහුණ හමුවීම විශේෂයෙන් අලෙවිය හා සම්බන්ධ උපදෙස් හා ස්වයං සේවා සඳහා නොගැළපෙන සංකීර්ණ ගණුදෙනු ආශ්‍රිතව වඩාත් යහපත් ප්‍රතිඵල අත් කරදෙන බවට අපි තව දුරටත් විශ්වාස කරමු.

ශාඛා 253 කින් සමන්විත අපගේ ශාඛා ජාලය ශක්තිමත් එකක් වන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛා බැංකුකරණය වඩාත් පුළුල් වපසරියක නිමැවුම් හා සේවා සපයනු ලබයි. අපගේ තැන්පතු නිමැවුම ඉතුරුම් තැන්පතු රැසකින් මෙන්ම කාලීන තැන්පතු වලින්ද යුක්ත වේ. අපගේ පුද්ගල ණය කළඹට පුද්ගලික ණය, අධ්‍යාපනික ණය, නිවාස ණය, වාහන ණය, තැන්පතු ණය සහ උකස් අත්තිකාරම් අයත්වේ.

2017 වසර සඳහා උපායමාර්ගික ඉලක්ක වූයේ අඩු පිරිවැය තැන්පතු වර්ධනය සහ අරමුදල් උපරිම ලෙස භාවිත කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම හා බහු-මාර්ගික මූලෝපායක් තුලින් අපගේ සන්නාමය දියුණු කිරීමයි. 2017 වසරේදී ශාඛා බැංකුකරණය මුහුණ දුන් සමාජ-දේශපාලනික සංරෝධනයන් හා ආර්ථික ප්‍රතිපත්ති අභියෝග සඳහා මෙහෙයුම් වාතාවරණය නමැති කොටස යටතේ 39 වන පිටුවේ අඩංගු දළ විශ්ලේෂණය වෙත යොමු වන්න.

2017 වසරේ අපගේ ක්‍රියාකාරකම්

ශාඛා බැංකුකරණය වැඩි දියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා වසර පුරා ප්‍රධාන ප්‍රවේශ කිහිපයක් ක්‍රියාත්මක කෙරිණ. ඒවා මෙසේය.

ප්‍රාදේශීය කාර්යාල ශක්තිමත් කිරීම සඳහා දැනට පවතින ප්‍රාදේශික පද්ධතිය ප්‍රාදේශික නවයක් යටතේ ප්‍රතිසංස්කරණය කිරීම.

ඩිජිටල් බැංකුකරණය සඳහා වෙන් කළ කලාපයක් සහිත ආදර්ශ ශාඛා සංකල්පය 2017දී හඳුන්වාදීම පාරිසරික ණය හා ශාඛා පුනර්ජනනීය බලශක්තිය භාවිතයට යොමුවීම ඇතුළත් හරිත බැංකුකරණ ප්‍රවේශය වසර තුල්දී ක්‍රියාත්මක කිරීම.

NSB iSaver, NSB රිච්, NSB පාරිසරික ණය හා සොදුරු පියස නිවාස ණය යන නව නිමැවුම් ආරම්භ කර ශාඛා ජාලය තුල ප්‍රවර්ධනය කිරීම

2017 වසරේ අපගේ කාර්යසාධනය

සමාලෝචනයට ලක් කෙරෙන කාලය තුල බැංකුව විසින් රුපියල් බිලියන 75 ක් රැස් කරගෙන ඇති අතර එය බැංකු ඉතිහාසය තුල ලබාගත් ඉහළම තැන්පතු ප්‍රමාණය වේ. 12.2% ක වර්ධන වේගයක් සමඟින් තැන්පතු පදනම රුපියල් බිලියන 737 ක් දක්වා ළඟා විය. මේ කැපී පෙනෙන ජයග්‍රහණයේ ප්‍රධාන දායකයා වූයේ රුපියල් බිලියන 62.6 ක් වූ අයතනික තැන්පතු වලින් ජනිතවූ 13.5% ක වර්ධනයකින් යුත් කාලීන තැන්පතුය. ඉතුරුම් එක්රැස් කිරීම 7.3% ක වර්ධන වේගයක් වාර්තා කරමින් රුපියල් බිලියන 12.8 දක්වා ඉහළ ගියේය.

ශ්‍රී ලංකා මහ බැංකු නියාමන වලින් අනතුරුව වෙළඳපොල තුල නිර්මාණයවූ දැඩි ද්‍රවශීලතාවය මධ්‍යයේ පුද්ගල ණය 20.0% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 213.8 දක්වා ළඟා විය. එහි මූලික දායකත්වය පුද්ගලික ණයදීම් වන අතර ගතවූ වසර තුල එය 37.3% කින් වර්ධනය විය. උකස් අත්තිකාරම් ප්‍රමාණය 15% කින් වර්ධනය වී 2016 වසරේ ලැබූ සෘණ වර්ධනය ආපසු හැරවිය. ඉහළ යන පොලී අනුපාත වටපිටාවක් තුල දිගු කාලීන ස්ථාවර තැන්පතු සඳහා වන ඉල්ලුම 24.8% කින් ඉහළ ගොස් ඇත.

අනාගතය දෙස බැලීමක් ...

ගණුදෙනුකරුවන්ගේ අත්දැකීම් වර්ධනය කිරීමට හා වඩාත් විනිවිදභාවයකින් යුක්තව නිමැවුම් සැපයීම සඳහා අප විසින් අපගේ බහු සන්නාම හා බහු - මාර්ගික ප්‍රවේශය ඉදිරියටත් උපයෝගී කරගනු ඇත. ආදර්ශ ශාඛා සංකල්පය හා හරිත බැංකුකරණ ප්‍රවේශය තව දුරටත් පුළුල් කෙරෙනු ඇති අතර වසර තුල ඇතැම් නිමැවුම් හා සේවා නැවත හඳුන්වාදීමට කටයුතු කෙරෙනු ඇත. සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු වස් පාරිභෝගික සේවා අත්දැකීම් ඇගයීම සඳහා නව මිනුම්කරණ ක්‍රියාත්මක කරනු ඇත. උසස් ප්‍රමිතියෙන් යුත් විවිධාංගීකරණයවූ පාරිභෝගික අත්දැකීමක් ගණුදෙනුකරුවන්ට ලබාදීම සඳහා බැංකුව විසින් 2018 වසර තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රවේශයන් අතර ඉහත ක්‍රියාමාර්ග කැපී පෙනේ.

ජාත්‍යන්තර බැංකුකරණය : අපගේ ගෝලීය සලකුණ සටහන් කරමින්...

අපගේ ජාත්‍යන්තර බැංකුකරණ අංශය සතුව පුළුල් අන්තර්ජාතික බැංකු සබඳතා ජාලයක් පවතින අතර අපි අක් වෙරළ අවශ්‍යතා මෙන්ම වෙරළ සේවාදායක හා මූල්‍ය ආයතන අවශ්‍යතාද සපුරාලන්නෙමු. 2017 වසරේ ජාත්‍යන්තර වෙළඳපොළ තුල ස්ථාවර වර්ධනයක් සමග විදේශයන්හි පැවති අසීමිත ව්‍යාපාරික අවස්ථාව ඔස්සේ ප්‍රතිලාභ අත්කරගත හැකි සුවිශේෂී ස්ථානයකට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජාත්‍යන්තර බැංකුකරණ අංශය රැගෙන ගොස් ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පුද්ගලික/රාජතාන්ත්‍රික සහ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්, ස්ථාවර තැන්පතු ගිණුම්, අභ්‍යන්තර/බාහිර ප්‍රේෂණ සේවා සහ වෙළඳ මූල්‍ය පහසුකම් සපයනු ලැබේ. අපි ණයවර ලිපි, නාවුක සහතික, ණයවර ලිපි යටතේ ආනයන බිල්පත් එක් රැස් කිරීමේ පදනම යටතේ ආනයන බිල්පත් ද ලබාදෙන්නෙමු.

විවිධ දේශීය හා විදේශීය අලෙවිකරණ ප්‍රවර්ධනය තුලින් සැපයුම් මාර්ග ශක්තිමත් කිරීම, ව්‍යාපාර වර්ධනය, වෙළඳ මූල්‍ය පහසුකම් සංවර්ධනය සහ අපගේ ගණුදෙනුකරුවන් දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය 2017 වසර සඳහාවූ අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට අයත්වේ.

2017 වසරේදී ජාත්‍යන්තර බැංකුකරණය මුහුණ දුන් භූගෝලීය හා දේශපාලනික සංරෝධනයන් හා ගෝලීය ආර්ථික අභියෝග පිළිබඳව මෙහෙයුම් ව්‍යාපාරණ අංශය යටතේ 37 වන පිටුවේ දළ විශ්ලේෂණය වෙත යොමු වන්න.

2017 වසරේ අපගේ ක්‍රියාකාරකම්

අපගේ ප්‍රේෂණ අංශය තුල නව සබඳතා ගොඩ නංවාගැනීමට හා අරාබි ජාතික බැංකුව, සවුදි අරාබි හුවමාරු මධ්‍යස්ථානය සහ සිංගප්පූරුවේ ඩීබීඑස් බැංකුව සමග දැනට පවත්නා සබඳතා අඛණ්ඩව ඉදිරියට ගෙන යාම සඳහා පසුගිය වසරේ ආරම්භ කළ වැඩපිළිවෙල ඉදිරියට ගෙන ගියෙමු. අපි විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල හා ඒ හා සමාන වෙනත් ආයතන සමග විවිධ අලෙවිකරණ වැඩසටහන් හා සංස්කෘතික උළෙල සංවිධානය කිරීමෙන් ශ්‍රී ලාංකේය විගමණික සේවා නියුක්තිකයන් අතර අපගේ ප්‍රේෂණ සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා එකතු වූයෙමු. මෙවැනි වැඩසටහන් ශ්‍රී ලංකාව තුලද ක්‍රියාත්මක කෙරුණි. අනාගත සංක්‍රමණික සේවකයන් උදෙසා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු වැඩසටහන්ද පැවැත්වූයෙමු. වෙළඳ මූල්‍ය ව්‍යාපාර පුළුල් කිරීම සහ ජපානයේ ප්‍රේෂණ ව්‍යාපාර අංශයට ඇතුළත්වීම අරමුණු කරගනිමින් අපි ජපානයේ ටෝකියෝ බැංකුව සමග සබඳතා ආරම්භ කළෙමු.

2017 වසරේ අපගේ කාර්යසාධනය

2004 වසරේ ජාත්‍යන්තර බැංකුකරණ අංශය ආරම්භ කළදා පටන් 2016 වසරේ වාර්තා කළ 1.8% ක ප්‍රේෂණ වෙළඳපොල කොටස් ප්‍රතිශතයට සාපේක්ෂව අපි පසුගිය වසරේ 2.4% ක වෙළඳපොල කොටස් ප්‍රතිශතයක් හිමිකරගැනීමට සමත් වූයෙමු. 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ විදේශ තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 9.4 ක් විය. ජාත්‍යන්තර බැංකුකරණ අංශය 33%ක විදේශ ප්‍රේෂණ වර්ධන ප්‍රතිශතයක් වාර්තා කරමින් රුපියල් බිලියන 26.0 ක මට්ටමට ළඟා විය. රුපියල් මිලියන 221.0 ක් වාර්තා කරමින් වෙළඳ මූල්‍ය ව්‍යාපාරය 2017 වසර තුලදී ශක්තිමත් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පහසුකම් හරහා කරන ලද බාහිර ප්‍රේෂණ වටිනාකම රුපියල් මිලියන 340.0 කි.

අනාගතය දෙස බැලීමක් ..

ගෝලීය ව්‍යාපාර සබඳතා මෙන්ම ව්‍යාපාර පරිමාව වැඩි කරගැනීම තුලින් අපගේ ගෝලීය සම්බන්ධකම් පුළුල් කරගැනීමට අපි තව දුරටත් කටයුතු කරන්නෙමු. පාරිභෝගික පහසුව වැඩි කිරීම සඳහා තෝරාගත් තැපැල් කාර්යාල හරහා 2018දී අපි අපගේ ප්‍රේෂණ සේවා තව දුරටත් වැඩි දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමු. අභ්‍යන්තර හා බාහිර ප්‍රේෂණ සඳහා කැපී පෙනෙන රටවල වෙළඳපොලට ඇතුළත් වීමටද අපි අපේක්ෂා කරමු. ජාත්‍යන්තර බැංකුකරණ අංශයේ වත්මන් ජාත්‍යන්තර ජාලය තව දුරටත් පුළුල් කෙරෙනු ඇත. රජයේ ආයතන, වෙළඳ සංගම් හා රථ වාහන අලෙවිකරුවන් සමග සිදු කරන වැඩපිළිවෙල තුලින් වෙළඳ සේවා වෙත ළඟාවීමේ අවස්ථාව සැලසෙනු ඇත.



භාණ්ඩාගාරය : මූල්‍ය හා සුරක්ෂිතතාව පවත්වාගෙන යාම

අපගේ ව්‍යාපාරවල මූල්‍ය සුරක්ෂිතතාව හා ස්ථාවරත්වය පවත්වාගෙන යාමේදී භාණ්ඩාගාරය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. දැඩි තරඟකාරී වාතාවරණයක කටයුතු කිරීමේදී ශක්තිමත් භාණ්ඩාගාර රාමුවක් මූල්‍ය හා ව්‍යාපාර අවස්ථා උපරිම ලෙස භාවිතයට ගැනීම සහතික කරයි. අපගේ භාණ්ඩාගාරය ප්‍රශස්ත ක්‍රමවේද හා කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ක්‍රම හරහා කළමනාකරණය කෙරෙන අතර ක්‍රමවේද නියාමන අවශ්‍යතා කෙරෙහි අනුකූලවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු භාණ්ඩාගාරය මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරන අතර පොලී අනුපාත, ද්‍රවශීලතාව,විදේශ විනිමය හා ලාභාංශ අවදානම් ප්‍රඥාගෝචරව කළමනාකරණය කිරීමේ වගකීම දරයි. භාණ්ඩාගාරය මුදල් වෙළඳපොල, රජයේ සුරැකුම්පත්වල හා හිමිකම් සුරැකුම්පත්හි ආයෝජනය හා ඉදිරි කාලීන කොන්ත්‍රාත් වැනි ව්‍යුත්පන්න මෙවලම් භාවිත කිරීමට ක්‍රියාකාරී ලෙස සහභාගී වේ.

භාණ්ඩාගාර අංශයේ මූලික උපායමාර්ගික ප්‍රමුඛතාව වූයේ ලාභය, අවදානම හා වර්ධනය තුලනය කිරීමයි. ඉහළ ප්‍රතිලාභ අත්කරදෙන ආයෝජන වර්ධනය කිරීමේ අරමුණෙන් නියාමන නිර්දේශ පවත්වාගෙන යන අතර තැන්පතු මත රජයේ සුරැකුම්පත්හි ආයෝජන අනුපාතය අඩු කිරීමද අපට පැවරී ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශ විනිමය පනත හඳුන්වාදීම හා භාණ්ඩාගාර කටයුතු සඳහා එහි බලපෑම සහ අනෙකුත් අදාළ තොරතුරු සඳහා පිටු අංක 40 හා මෙහෙයුම් වාතාවරණ කොටසට යොමු වන්න.

2017 වසරේ අපගේ ක්‍රියාකාරකම්

මුදල් හා බැංකු ශේෂ තුලනය උපරිම ලෙස භාවිතයට පහසුකම් සැලසීමේ අරමුණින් ශාඛාවල අරමුදල් මනාව කළමනාකරණය කිරීමට වාණිජ බැංකු සමග නව සබඳතා ගොඩ නගා ගැනීම තුලින් ද්‍රවශීලතාවය වර්ධනය කරන ලදී. නව ආයතනික ගණුදෙනුකරුවන් හා බැංකු සමග සම්බන්ධීකරණය හරහා ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනු ආශ්‍රිත අපගේ මෙහෙයුම් වඩා සාර්ථක ලෙස සිදු කළෙමු. 2017 තුල බොහෝ ආයතනික අරමුදල් පොදු ව්‍යාපාර අරමුදල් සහ බැංකු අරමුදල් භාණ්ඩාගාරයේ ආයෝජනය කළ බව සඳහන් කරන්නේ සතුටිනි. වත්කම් හා වගකීම් කළමනාකරණ ඒකකයක් පිහිටුවීම තුලින් බැංකුවේ භාණ්ඩාගාර කටයුතු ශක්තිමත්වී ඇත.

2017 වසරේ අපගේ කාර්යසාධනය

රජයේ සුරැකුම්පත් ආුවමාරු කටයුතු වලට සම්බන්ධ වීමෙන් 2017දී අපි මෙතෙක් ලබා ඇති ඉහළම ලාභයවූ රුපියල් මිලියන 1,083.8 ක අගයක් වාර්තා කිරීමට සමත් වූයෙමු. එය බැංකුව විසින් මෙතෙක් අත්කරගෙන ඇති ඉහළම බදු පසු ලාභයවූ රුපියල් බිලියන 9.6 ට දායක විය. රජයේ සුරැකුම්පත් වලින් ලද ආදායම රුපියල් බිලියන 58.9 ක්වූ අතර එය 2016 වසරට වඩා 11.0% ක වර්ධනයකි. මේ ආදායම බැංකුවේ සමස්ත පොලී ආදායමෙන් 56.9% ක් විය.

අනාගතය දෙස බැලීමක් ...

භාණ්ඩාගාර කටයුතු තව දුරටත් විධිමත් කිරීමේ හා මෙහෙයුම් විශිෂ්ටතාවය අත්කරගැනීමේ අරමුණින් 2018 වසරේදී අපි නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීමට කටයුතු කරමු. මේ භාණ්ඩාගාර කළමනාකරණ ප්දධතිය බැංකුවේ වත්කම් වගකීම් කළමනාකරණ ක්‍රමවේදය ශක්තිමත් කිරීමට දායක වේ. මිළදී ගැනීම් හා විවිධාංගීකරණය තුලින් හිමිකම් සුරැකුම්පත් කළඹ සීමා කිරීමටද අපි අපේක්ෂා කරමු. මුදල් කළමනාකරණය වඩාත් ක්‍රමවත් කිරීම සඳහා අපි නව ශාඛා මුදල් කළමනාකරණ ක්‍රමවේදයක්ද හඳුන්වා දෙන්නෙමු.



ආයතනික ණය : ආයතනික මූල්‍ය අවශ්‍යතා සපුරාලීම

ආයතනවල මූල්‍ය අවශ්‍යතා හඳුනාගෙන තිබෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික ණය අංශය සියළු ආයතනික අවශ්‍යතා සඳහා විශිෂ්ට සේවයක් සලසයි. සබඳතා කළමනාකරණය පිළිබඳව සමෝධානික ප්‍රවේශයක් හා ව්‍යුහාත්මක මූල්‍ය විසඳුම් තුලින් වඩාත් ගුණාත්මක සේවයක් සැලසීම සඳහා අපගේ ආයතනික ගණුදෙනුකරුවන් ක්‍රියාත්මක වන අංශ පිළිබඳව ගැඹුරු අවබෝධයක් අපගේ නිළධාරීන් සතුවේ. ව්‍යාපෘති මූල්‍යකරණය හා ණය සම්මේලනය කිරීම හරහා මහා පරිමාණ ව්‍යාපෘති සඳහා අරමුදල් සැලසීමෙන් ආයතනික ණය අංශය ආයෝජකයන්ට සහය වේ.

ආයතිනක ණය අංශය භාරකාර සහතික, පුද්ගලික ස්ථාපනය හා ණයකර නිකුත් කිරීම පිළිබඳවද වගකීම් දරයි. 2017 වසර සඳහා අපගේ ප්‍රධාන ඉලක්කය වූයේ ව්‍යාපෘති වල ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම සහ අපගේ ආයතනික ණය ලබාදීමේ වපසරිය පුළුල් කිරීමයි.

2017 වසරේ අපගේ ක්‍රියාකාරකම්

මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රයත්නයෙන් උද්දීපනයවූ දේශීය ආර්ථිකය තුල ව්‍යාපෘති සඳහා ණය ලබාදීම හා මූල්‍ය පහසුකම් සැපයීම දිනෙන් දින ඉහළ යන අවශ්‍යතාවක් විය. එම අවශ්‍යතාවය ඉටු කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය අංශය සමත් විය. රුපියල් බිලියන 8 ක ආයෝජන දායකත්වයක් තුලින් අපි සෙත්සිරිපාය ගොඩනැගිලි ඒදියර III ඒකාබද්ධිත ණය ගිවිසුමට සහභාගී වීමු. සභාධිපත්‍ය ගොඩනැගිලි සඳහා නිවාස ණය සැපයීම අපි අඛණ්ඩව සිදු කළෙමු. රුපියල් බිලියන 17 ක ආයෝජන දායකත්වයක් සමගින් අපි මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා අරමුදල් සැපයීමටද සහභාගී වූයෙමු. එමෙන්ම, ස්විස් අභියෝගතා ක්‍රමය (Swiss Challenge Scheme) යටතේ දැනට තිබෙන අධිවේග මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් සම්පාදනයටද අපි දායකත්වය ලබා දුන්නෙමු.

2017 වසරේ අපගේ කාර්යසාධනය

ගතවූ වසර තුල අපි ආයතනික ණයදීම් වල 20.2% ක ආකර්ශණීය ප්‍රගතියක් අත්කර ගතිමු. එහි මුළු වටිනාකම රුපියල් බිලියන 28.3 කි. මේ වර්ධනය අත්කරගැනීමට හැකි වූයේ ප්‍රධාන වශයෙන් රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීමෙනි. රාජ්‍ය නොවන ආයතන වෙත ලබා දුන් ණය රුපියල් බිලියන 7.6 ක ආකර්ශනීය අගයකින් ඉහළ ගියේය. ඒ ශ්‍රී ලංකාවේ දැවැන්තම සමාගම් අත්පත් කරගැනීමවූ හේලිස් සමාගම විසින් සිංගර් (ශ්‍රී ලංකා) අත්කරගැනීම සඳහා වූ ණය ඒකාබද්ධයට දායකවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ලබා දුන් දායකත්වය රුපියල් බිලියන 4.0 කි. බැංකුවල නැවත ගෙවීමේ හැකියාව ඉහළ නැංවූ වෙළඳපොලෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාවය හේතුවෙන් බැංකු වලට ණය ලබාදීම 14.6% කින් පහත වැටුණි.

අනාගතය දෙස බැලීමක් ...

නව පාරිභෝගිකයන් වෙත ළඟාවීම සඳහා ආයතනික ණය අංශය තව දුරටත් විවිධාංගීකරණය කෙරෙනු ඇති අතර රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අඛණ්ඩවම මූල්‍ය සහය සලසනු ඇත. 2018 වසරේදී නව ණය වර්ග හඳුන්වාදෙනු ඇති අතර අවදානම් - පාදක මිළ ප්‍රතිපත්තිය ශක්තිමත් කෙරෙනු ඇත.

ජාතිය මත දිගුකල් පවත්නා සළකුණක් තබමින් ...

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘතාන්තය අපගේ ගිණුම් මිලියන 19.9 ක්වූ පාඨකයන්ගෙන් ඔබ්බට ගොස් සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත වෙත සමීප වී තිබේ. අප ජාතික ආර්ථිකය තුල ස්ථාවරව මුල් බැසගෙන සිටින අතර අපටම ආවේණික වූ ආකාරයකට අපි ජනතාවට සේවය සපයන්නෙමු.



බුද්ධිමය ප්‍රාග්ධනය



ඇමරිකානු ඩොලර් මිලියන 168 සන්නාම වටිනාකම	**5 වැනි වටිනාම** සන්නාමය Brand Finance ශ්‍රේණිගත කිරීම	**AAA (lka)** ෆිච් රේටින්ග්ස් ලංකා ආයතනයේ ජාතික ශ්‍රේණිගත කිරීම
B + ස්ථාවර S & P ග්ලෝබල් ශ්‍රේණිගත කිරීම	**B + ස්ථාවර** ෆිච් ශ්‍රේණිගත කිරීම	**තැන්පතු හා එහි පොලිය මත 100% රජයේ සහතිකය**
17.5% වසර 15ට වඩා වැඩි අත්දැකීම් සහිත සේවකයන්	**258** වසර 25 - 35 ක සේවා කාලයක් සම්පූර්ණ කරන සේවකයන්	**972** බැංකුවේ සේවය කරන උපාධිධාරීන්

ඉතා වැදගත් ව්‍යාපාරික වාසි මූලාශ්‍රයක් වන ගණුදෙනුකරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කෙරෙන්නේ කෙසේද යන්න පිළිබඳව බැංකුව සතු දැනුම, බුද්ධිමය ප්‍රාග්ධනය යනුවෙන් අදහස් කෙරේ. එය බොහෝවිට ස්වභාවයෙන් ස්පර්ශීය නොවන අතර යහපත් පාලනයේ සෘජු ප්‍රතිඵලයක් වන මූල්‍ය නොවන අංශයන්හි පුළුල් වපසරියක් ආවරණය කරනු ලබයි. වටිනාකම් නිර්මාණය කිරීම සඳහා බැංකුව විසින් භාවිත කරනු ලබන ආයතනගත දැනුම, පාරිභෝගික විශ්වාසය, සන්නම් හා කීර්ති නාමය, අභ්‍යන්තර පද්ධති, මෘදුකාංග හා අභ්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිතීන් පිළිබඳ ප්‍රතිපත්ති හා ආයතනික සංස්කෘතිය වැනි සාධක එයට ඇතුළත් වේ.

"සුවිශේෂී" ජාතික ඉතිරිකිරීමේ බැංකු සන්නාම

"අද්විතීය" ජාතික ඉතිරිකිරීමේ බැංකු සන්නාමය 1972 දී ජනතාවට හඳුන්වාදෙනු ලැබූ තැන් සිට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සියළුම ශ්‍රී ලාංකිකයන් අතර පොදු ව්‍යවහාරයක් බවට පත්ව ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලැබෙන බොහෝ සම්මාන හා ඇගයීම් වලින් සෑම වසරකම අපගේ සන්නාමය ශක්තිමත් වේ. අපි 2017දී වසර 15 ක් පුරා අඛණ්ඩව ෆිච් රේටින්ග්ස් ලංකා ආයතනයේ AAA (lka) ශ්‍රේණිගත කිරීම ලබාගත් එකම ශ්‍රී ලාංකික බැංකුව බවට පත් වූයෙමු. ඊට අමතරව, බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ආයතනය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ පස්වැනි වටිනාම සන්නාමය ලෙස නම් කරන ලදී.

සන්නාම ප්‍රවර්ධන ප්‍රවේශ

වසර පුරා සන්නාම ප්‍රවර්ධන අභ්‍යාස රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මේවා ප්‍රචාරණය, උත්සව, ප්‍රදර්ශණ, අනුග්‍රාහකත්ව සහ විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් වශයෙන් විවිධාකාර විය.

වෙළඳ ප්‍රචාරණය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික සන්නාමය ගොඩ නැංවීම උදෙසා අපි අපගේ නිමැවුම්, ජනමාධ්‍ය, දැන්වීම් පුවරු, සමාජ ජාලා වෙබ් අඩවි හා අනෙකුත් වෙබ් අඩවි පාදක ප්‍රචාරණය සහ රටපුරා බස් නැවතුම්පොළ ආදියෙහි ප්‍රචාරණය සිදු කළෙමු. මේ ආකාරයේ ප්‍රචාරණ ක්‍රම අපගේ සන්නාමය ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ ක්ෂේත්‍රයේ පොදු ව්‍යවහාරයක් බවට පත් කර තිබෙන අතර අපගේ අභිලාෂය වන්නේ සමාජයේ සියළු ජන කොටස් ආවරණය වන පරිදි පුළුල් ජන පිරිසකට ජීවිතයේ සෑම අවස්ථාවක දීම සේවය සැලසීමය.

අනුග්‍රාහකත්වය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විවිධ ජාතික,සමාජයීය හා සංස්කෘතික අංග සඳහා අනුග්‍රාහකත්වය හා සම අනුග්‍රාහකත්වය දක්වා ඇත. ජාතික වෙසක් උත්සවය, ගංගාරාම ඇසළ පෙරහැර, තිස්සමහාරාම පොසොන් පෙරහැර සහ කෝට්ටේ පෙරහැර යන විවිධවූ ආගමික අවස්ථා සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමට අපි රුපියල් මිලියන 27 ක් වැය කර ඇත්තෙමු. මෙම ක්‍රියාමාර්ග අපගේ සන්නාම ප්‍රතිරූපය හා මහජන සබඳතා වර්ධනය කරගැනීමට අපට උපකාරී විය.

විශේෂ උත්සව හා ප්‍රදර්ශණ

අපගේ සුවිශේෂී නිමැවුම් ප්‍රවර්ධනය කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2017 වසර පුරා ප්‍රදර්ශණ හා උත්සව රැසකට සහභාගී විය. 2017 වසරේ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් එක් එක් දිස්ත්‍රික්කයෙන් ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 15 දෙනා ඇගයීම සඳහා වාර්ෂික හපන් ශිෂ්‍යත්ව ප්‍රදාන උත්සවය නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණි. එඩෙක්ස් එක්ස්පෝ, කැදැල්ල 2017, තිරසාර බලශක්ති ප්‍රදර්ශණය, කළමිබු ප්‍රොපර්ටි ෂෝ සහ ලයිෆ් ස්ටයිල් වෙළඳ සැණකෙළියටද ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහභාගී විය.

විශේෂ ප්‍රවර්ධන වැඩසටහන

හපන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව හරහා හපන් ගිණුම් ආරම්භ කිරීමේ වැඩසටහන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පවත්වන ලදී. අපි දිවයින පුරා හපන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ 144 ක් පැවැත්වූයෙමු. වැඩි විස්තර සඳහා පිටු අංක 138 වෙත යොමු වන්න.

සම්මාන හා ඇගයීම්

මෑතකදී නිමාවට පත්වූ 2017 ආර්ක් (ARC) වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී අපගේ 2016 වාර්ෂික වාර්තාව සම්මානයට පාත්‍රවූ අතර එහිදී බැංකු : සේවා හා ණය අංශයෙන් සභාපතිතුමාගේ ලිපියට රන් සම්මානයද මූල්‍ය දත්ත හා ලිඛිත අන්තර්ගතය සඳහා ලෝකඩ සම්මාන දෙකක්ද හිමි විය. ඊට අමතරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී අපගේ 2016 වාර්ෂික වාර්තාවට රිදී සම්මානයද දකුණු ආසියානු ෆෙඩරේෂණ සම්මාන උළෙලේදී රාජ්‍ය අංශ බැංකුකරණ ආයතන අංශයෙන් දෙවන ස්ථානයද දිනාගැනීමට සමත් විය.

GRI102-16

ආයතනික වටිනාකම්

පසුගිය වසර 45 පුරා වැඩි දියුණු කරන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික හර පද්ධතිය බැංකුවේ මූලික වටිනාකම් නිර්වචනය කිරීමට හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සංස්කෘතිය හා දැක්ම හැඩගැස්වීමට උපකාරී වේ. මේ වටිනාකම් ජාතික ඉතිරිකිරීමේ බැංකු අනන්‍යතාවයේ සාරයයි. එමෙන්ම ඒවා අපගේ හවුල්කාර සබඳතා සඳහා මග පෙන්වන බැංකුවේ දර්ශනය නියෝජනය කරයි.

විශ්වාසය :

අදාළ සියළුදෙනාගේ අභිලාෂයන් කෙරෙහි පූර්ණ විශ්වාසය තබමින් සබඳතා ගොඩ නැංවීම

අන්‍යෝන්‍ය ගරුත්වය

සෑම පුද්ගලයෙකුගෙ ම වටිනාකම් හඳුනාග ැනීම සහ සියළුම දෙනාට ගෞරවයෙන් සැලකීම

අවංකභාවය :

අපගේ සියළු කටයුතු හා තීරණවලදී අවංක, අවල හා විනිවිදභාවයෙන් යුක්ත වීම.

නිර්මාණශීලීත්වය :

නවීන සංකල්ප නිරතුරුව සොයා යන අතර පවත්නා භාවිතයන්ට නිරතුරුවම අභියෝග කිරීම

ආරක්ෂාව :

ප්‍රජා අවශ්‍යතා ඉටු කිරීමට හා ඔවුන්ගේ වටිනාකම් ආරක්ෂා කිරීමට නිරතුරුවම ඥානාන්විත තීරණ ගැනීම.

ආයතනික සංස්කෘතිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවතින ආයතනික සංස්කෘතිය අපගේ වටිනාකම් හා මෙහෙවර සමග අනුරූප වේ. එය විශිෂ්ට වෘත්තීයවේදය, කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, පාරදෘශ්‍යභාවය, විවිධත්වය හා පුද්ගලයන් අතර ගෞරවය යනාදියෙන් සැදුම්ලත් සංස්කෘතියකි.

බඳවාගැනීම්, ප්‍රහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් වැනි කටයුතු වලට අපි අපගේ වටිනාකම් හා ඇදහිලි කාවද්දන්නෙමු. ශක්තිමත් අනුකූලතා හා පාලන ස්ථරයන් සමග පෞද්ගලික වගකීම් හා සාමූහික තීරණ ගැනීම පෝෂණය කරන ශක්තිමත් කණ්ඩායමක් ගොඩනැංවීම අපගේ අභිප්‍රායයි. විවිධ පසුබිම් සහිත දක්ෂ සේවකයන් අතර සමීප සුහදත්වයක් ප්‍රවර්ධනය කරන සංස්කෘතියක් අප විසින් නිර්මාණය කර ඇත. අපගේ ආයතනික සංස්කෘතිය අපගේ දිගු කාලීන සාර්ථකත්වයේ මධ්‍යය වේ.

එසේම, බැංකුවේ සමස්ත දැක්ම යථාර්ථයක් බවට පත් කරගැනීම සඳහා සෑම පුද්ගලයෙක්ම සෘජුව සම්බන්ධ වන සහ වගවන බැංකුවේ කණ්ඩායම් සංස්කෘතිය ප්‍රවේශමෙන් පෝෂණය කිරීමට අපි කටයුතු කළෙමු. ඈත කඳුකරයේ අතිශයින් ග්‍රාමීය පෙදෙසක පිහිටි තැපැල් කාර්යාලයේ සිට කොළඹ පිහිටි අපගේ අධ්‍යක්ෂ මණ්ඩල ශාලාව දක්වා වන සියළු මට්ටම් වල සේවයේ නියුතු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක මණ්ඩලය බැංකුව කෙරෙහි ඉතා හිතෛෂීභාවයෙන් යුතුව කටයුතු කරයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පවත්නා පවුල පිළිබඳ මෙම හැඟීම පෝෂණය කිරීම සඳහා අපි වසර පුරාවට විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කළෙමු. බැංකු ඉතිහාසයේ ප්‍රථම වතාවට සියළුම ජාතික ඉතිරිකිරීමේ බැංකු කාර්යමණ්ඩලයේ සහභාගීත්වයෙන් අප කාර්යමණ්ඩල දිනය 2017 පෙබරවාරි මාසයේදී සුගතදාස ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. එමෙන්ම අපි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ක්‍රීඩා සංගමය, බෞද්ධ සංගමය, ක්‍රිස්තියානි සංගමය, සුභසාධක සංගමය සහ කලා කවය ඔස්සේ තව දුරටත් කණ්ඩායම් හැඟීම් වර්ධනය වන ආකාරයේ ක්‍රියාකාරකම්හි නිරතවීම දිරිමත් කරමු.

ව්‍යාපාර ආචාරධර්ම සහ අවංකභාවය

ජාතියේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුව ලෙස අපගේ ව්‍යාපාර, බැංකුකරණයෙන් ඔබ්බට යන බව අපි විශ්වාස කරමු. සමස්ත සමාජය තුල වෙනසක් ඇති කිරීම සහ අපගේ සේවක මණ්ඩල සාමාජික සාමාජිකාවන්, ගණුදෙනුකරුවන් සහ ජාතිය වෙනුවෙන් සේවය කිරීම ඒ තුල අන්තර්ගත වේ. අපි අපගේ පාර්ශවකරුවන් වෙනුවෙන්වූ අපගේ ආචාරධර්මීය වගකීම අවබෝධ කරගෙන සිටිමු. ව්‍යාපාර ආචාර ධර්ම සහ අඛණ්ඩතාවය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ක්‍රියාකාරී පරිසරය සකස් කරන ප්‍රධාන සාධක වේ. අපි අපගේ අභ්‍යන්තර ප්‍රමිති, සංග්‍රහ සහ පාලන යාන්ත්‍රණය සහ නියාමන හා අනුකූලතා අවශ්‍යතා නිරන්තරයෙන් සමාලෝචනය කරන අතර ඒවා ක්ෂේත්‍රයේ යහපරිචයන්ට අනුකූලව වැඩි දියුණු කිරීමට කටයුතු කරමු.

ආයතනගත දැනුම

වසර 180 කට වැඩි කාලයක් මුළුල්ලේ ජාතියට සේවා සැපයීම තුලින් අපගේ ආයතනගත දැනුම ජනිතවේ. අප විසින් ස්ථාපිත කරනු ලැබ තිබෙන ක්‍රියාවලි සහ පරිචයන් දශක ගණනාවක් මුළුල්ලේ විකාශනය වී තිබේ. වසර 10 කට වඩා වැඩි කාලයක් බැංකුව සමග සිටි සේවා නියුක්තිකයන් වැඩි පිරිසකගෙන් සැදුම්ලත් අපගේ පළපුරුදු කාර්ය මණ්ඩලය ප්‍රධාන වශයෙන් අපගේ ආයතනගත දැනුම කෙරෙහි සිය දායකත්වය දක්වයි. රජයේ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන දිවයිනේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුව ලෙස මූල්‍ය ක්ෂේත්‍රයේ යහපරිචයන් අනුගමනය කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත්ව ඇත. අපගේ ඉතිරිකිරීමේ උරුමය සහ අත්දැකීම් උපයෝගී කරගනිමින් බැංකුව සමාජයේ සියළු ජනකොටස් සඳහා නවෝත්පාදක ඉතිරිකිරීමේ විසඳුම් නිර්මාණය කරදී තිබේ.

අපගේ ඉහළ විධායක නිළධාරීන් ක්ෂේත්‍රයේ සිය වසර 15 කට වැඩි පළපුරුද්ද, මනා මෙහෙයුම් දැනුම පවත්වා ගැනීම සඳහා දායක වේ.සුදුසුකම් සපුරන ලද හා මනා පුහුණුවක්ලද අපගේ කණ්ඩායම් සාමාජිකයන් අපගේ මෙහෙයුම්හි ප්‍රාණ නාලිය ලෙස හඳුන්වාදිය හැක. 2017 වර්ෂයේදී අපගේ කාර්යමණ්ඩල රඳවාගැනීම් අනුපාතිකය 96.7% ක් ලෙස සටහන් විය. 2017 දෙසැම්බර් 31 දිනට අපගේ කාර්යමණ්ඩල සේවකයෝ 1156 ක් බැංකුව සමග දස වසරක සේවා කාලයක් සම්පූර්ණ කළහ. පළපුරුදු සහ දැනුමෙන් පරිපූර්ණ සේවකයන් බැංකුව තුල රඳවාගැනීමෙහිලා අපගේ ශක්‍යතාවය එමගින් පැහැදිලි වේ.

ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය

ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය, සිය වර්ධනය හා ක්ෂේත්‍රය තුල දිගු කාලීන සාර්ථකත්වය උදෙසා බැංකුවකට අවශ්‍ය වන ප්‍රධානතම සාධකයකි. රජය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇති ජනතාවගේ තැන්පතු සහ ඉන් ඉපැයෙන පොළිය සඳහා 100% ක ව්‍යවස්ථාපිත වගකීමක් සපයනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට සුරක්ෂිතම බැංකුව ලෙස ස්ථානගත කෙරිණ. ඊට අමතරව ආදර්ශමත් ආයතනික යහ පාලනය, අවදානම් කළමනාකරණ රාමුව, ව්‍යාපාරික ආචාරධර්ම සහ වටිනාකම් ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය රඳවාගැනීමෙහිලා දායක වී තිබේ.

2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද හා වැඩි දියුණු කරන ලද පද්ධති

සුරක්ෂිත, ආරක්ෂාකාරී සහ විශ්වසනීය බැංකු පද්ධතියක් සහතික කිරීමෙහිලා අපගේ කාර්යභාරය ශක්තිමත් කරනු පිණිස අපගේ පද්ධති හා පටිපාටිවල දැඩි බව වැඩි දියුණු කිරීම හා පවත්වාගැනීම වෙනුවෙන් අප විසින් විවිධවූ මුලපිරීම් ක්‍රියාවට නංවනු ලැබීමු. අපගේ සේවා නියුක්තිකයන්, ගණුදෙනුකරුවන් සහ ව්‍යාපාරික සහකරුවන් සඳහා ව්‍යාපාරික හා කාර්යප්‍රවාහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනයට ලක් කෙරෙන කාල පරිච්ඡේදය තුලදී නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපි පියවර ගත්තෙමු. අපගේ තොරතුරු තාක්ෂණ පද්ධති හා ක්‍රියාවලි කාර්යක්ෂම මෙන්ම ප්‍රත්‍යස්ථිත බවත් අපගේ ගනුදෙනුකරුවන්ට සේවා සැපයීම සඳහා ඵලදායීව සහාය වන බවත් තොරතුරු තාක්ෂණ පරිසරය පිළිබඳව සිදු කෙරෙන අඛණ්ඩ සමාලෝචන ඔස්සේ සහතික කෙරේ. ගණුදෙනුකරුවන්ගේ වෙනස් වන අවශ්‍යතා කෙරෙහි වඩා හොඳින් ප්‍රතිචාර දක්වන අතරතුර ක්ෂේත්‍රය තුල අපගේ මෙහෙයුම් විශිෂ්ටතාවය පවත්වාගැනීම සඳහා අපගේ වැඩි දියුණු කරන ලද පද්ධති හා ක්‍රියාවලි උපකාර වේ.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS)

තාක්ෂණික බිඳවැටීම්, ස්වාභාවික විපත්, මානව වැරදි හෝ හිතාමතා සිදුකරන ලද ක්‍රියාවන් හේතුවෙන් ආනාගතයක සිදුවන ප්‍රධාන පෙලේ බිඳවැටීමකට පසු ව්‍යාපාරයේ අඛණ්ඩතාවය සහතික කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා ක්‍රමවේද සමුදායන් මගින් ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය සකස් කර තිබේ. එය බැංකුවේ සමස්ත කළමනාකරණ පද්ධතියේ කොටසකි. එය ආයතනයක් විසින් භාවිත එහි ව්‍යාපාර අඛණ්ඩතා හැකියාවන් ස්ථාපිත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, මෙහෙයවීමට, සමාලෝචනය කිරීමට, පවත්වා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට භාවිත කරනු ලබන එකිනෙකට බද්ධ වූ සාධක සමුදායකි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව වාර්ෂිකව සිය ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය සමාලෝචනය කරන අතර එහි ප්‍රතිඵල මත පදනම්ව අවශ්‍ය හා අදාළ වෙනස්කම් සිදු කරනු ලැබේ. TIA - 942 ස්ථර 3 මත පදනම්ව මෑතක දී ප්‍රධාන ස්ථානයට බැහැරව ස්ථාපිත කරන ලද ආපදා ප්‍රතිසාධන පහසුකම වසර තුළ දී බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සාමාන්‍යතාව ඉහළ නැංවීම සඳහා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාමාර්ගය වේ.

තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS)

තෙවන පාර්ශව විසින් බැංකුව අතට පත් කරන ලද මූල්‍ය තොරතුරු, බුද්ධිමය දේපල, සේවා නියුක්තිකයින්ගේ විස්තර තොරතුරු වැනි ගනුදෙනුකරුවන්ගේ දත්ත සහ වත්කම්වල සුරක්ෂිතතාවය කළමනාකරණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය භාවිත කරනු ලබයි. ISO 27001:2013 මත පදනම්වන ISMS පාලන ව්‍යුහය විධායක හා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු වලින් සමන්විත වන පරිදි ස්ථාපිත කර තිබේ. එමගින් හඳුන්වාදෙන ලද ක්‍රියාවලි සහතික කිරීම සඳහා සුදුසු තත්ත්වයකට පත් කෙරේ. මෙයට අමතරව සිදුවීම් කළමනාකරණය සඳහා ව්‍යවසායක විසඳුම් සඳහා බද්ධ කරමින් සිදුවීම් ආශ්‍රිත දැනුවත්භාවය හා තර්ජන ආශ්‍රිත බුද්ධි ශක්‍යතාව ද ශක්තිමත් කෙරේ. අනාගතයෙහි බැංකු තුල අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම අරමුණු කරගෙන මෙම මූලික පියවර ගනු ලැබේ.

මධ්‍යගත බැංකුකරණ විසඳුමක්

බැංකුවේ දැනට පවතින බැංකුව විසින් සකස් කරන ලද මධ්‍යගත බැංකුකරණ විසඳුම් වෙනුවට ක්ෂේත්‍ර පරිවයන්ට අනුකූලව වඩා පුළුල් හා ඵලදායී ආකාරයෙන් තොරතුරු තාක්ෂණ සේවා ක්‍රියාත්මක කෙරෙන මධ්‍යගත බැංකුකරණ විසඳුමක් ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත. අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය සමගින් අපගේ ගනුදෙනුකරුවන් වෙත වටිනාකම් සහ පහසුව සැපයීම සඳහා මෙම මූල්‍ය සේවා විසඳුම උපකාරී වනු ඇත. සමාලෝචනය කෙරෙන වර්ෂයතුල දී මෙම විසඳුමට අදාල මූලික කටයුතු අවසන් කෙරිණ.

ලේඛන කළමනාකරණ පද්ධතිය

2017 වර්ෂයේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සියලුම ශාඛාවල ලේඛන කළමනාකරණ පද්ධතිය ක්‍රියාවට නංවන ලදී. මෙම පද්ධතිය මගින් ලේඛන සොයා ගැනීම සහ ඒවා තහවුරු කිරීම වඩා පහසුකර තිබෙන අතර අපගේ ශාඛා ජාලය ආශ්‍රිත මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට සමත්වී ඇත.

මානව සම්පත් කළමනාකරණ කාර්යය ස්වයංක්‍රීය කිරීම

බඳවා ගැනීම්, උසස්වීම්, පැමිණීම්, නිවාඩු නිරීක්ෂණය, කාර්යසාධන ඇගයීම, පරිපාලනය ඒකාබද්ධ කිරීම සහ ප්‍රතිලාභ පරිපාලනය වැනි මානව සම්පත් කාර්යයන් ස්වයංක්‍රීය කෙරෙන අතර මානව සම්පත් ක්‍රියාවලි හා කාර්යයන් විධිමත් කිරීම ඔස්සේ බැංකුවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒකාබද්ධ කෙරෙනු ඇත.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයේ ස්විචය වැඩිදියුණු කිරීම

බැංකුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයේ ස්විචය වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කරන ලද අතර ක්‍රමයෙන් පුළුල් වන අපගේ හා ගනුදෙනුකාර පදනම සඳහා පහසුකම් සැපයීමට කාඩ්පත් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කරන ලදී. ලංකා පේ සමග සම්බන්ධවීමේ පහසුව සමගින් මුදල් රහිත සමාජයක නවීන පහසුකම් අත්විඳීමට දැන් අපගේ ගනුදෙනුකරුවන්ට හැකියාව ලැබී තිබේ.

ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහන

කාර්යාලයීය පරිසරයේ තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය සමග එකතුව ජාතික ඉතිරිකිරීමේ බැංකු පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ශාඛාවල හා ප්‍රධාන කාර්යාලයේ එස්-5 සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා අත්පොත් සකස් කරන ලදී. "සයිතොන්" සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ශාඛා 17 ක් සහ අංශ 02 ක් තෝරාගෙන තිබේ. "සයිතොන්" සංකල්පයේ ආදර්ශ ශාඛාව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බොරලැස්ගමුව ශාඛාව සංවිධානය කරන ලද අතර ඒ සඳහා ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයේ තහවුරුව අපේක්ෂිතය.

EMV සහතිකය (යුරෝපේ මාස්ටර් කාඩ් සඳහා වීසා)

ඊඑම්වී (EMV) යනු ප්‍රධාන පෙළේ ණය කාඩ්පත් නිකුත් කරන්නන් හා ජාල විසින් භාවිත කරනු ලබන ලෝක ව්‍යාප්ත තහවුරු කරගැනීම් ප්‍රමිතියකි. එය වංචා සඳහා මුහුණදීම සහ කාඩ්පත් භාවිත කෙරෙන පරිසරයක වන සංවේදී දත්ත ආරක්ෂා කර ගැනීම අරමුණුකරගත් ගෝලීය මුල පිරීමකි. කාඩ්පත් හිමියන්ගේ දත්ත ගබඩා කරගන්නා සහ ආරක්ෂා කරන මයික්‍රොප්‍රොසෙසර් චිපයක් අන්තර්ගත කරන ලද ගෙවීම් උපකරණ මෙම තාක්ෂණය ඔස්සේ හඳුන්වා දී තිබේ. මාස්ටර් කාඩ්පත් සඳහා EMV සහතිකය ලබා ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය. ලොව වටා සිදුකෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් ඉහළ සුරක්ෂිත භාවයක් දැක්වීමට ඒ සමග ගනුදෙනුකරුවන්ට අවස්ථාව උදා වෙනු ඇත.

ණය ශ්‍රේණිගත කිරීම හා ලකුණු ලබා දීම

ණය අවදානම කෙරෙහි බලපාන සාධක නිරන්තරයෙන් විශ්ලේෂණය කිරීම ඔස්සේ ණය අවදානම මැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ලෙස බැංකුව විසින් ණය ශ්‍රේණිගත කිරීම හඳුනාගන්නා ලදී. 2017 වර්ෂයතුල දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව පුද්ගල ණය සඳහා ණය ශ්‍රේණිගත කිරීමේ සහ ලකුණු ලබා දීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම අවසන් කෙරිණි.

මූල්‍ය විශුද්ධීකරණ විසඳුම (Anti-money laundering solution)

ඕනෑම නීති විරෝධී ක්‍රියාකාරකමක් හඳුනා ගැනීම සහ වාර්තා කිරීම සඳහා මුදල් විශුද්ධිකරණ විසඳුමක් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුව සේවා සපයන්නෙකු සමග සම්බන්ධ විය. ඕනෑම මූල්‍ය විශුද්ධිකරණ ක්‍රියාකාරකමක් වළක්වාලීම සඳහා ගනුදෙනු හඳුනාගැනීම සහ නිරීක්ෂණය කිරීම උදෙසා වන බැංකු ව්‍යාප්ත ප්‍රවේශයක් මුදල් විශුද්ධිකරණ විසඳුම තුල අන්තර්ගත වේ.

ප්‍රතිපත්ති

අපගේ නිහඬ දැනුම කුසලතා හා අත්දැකීම් වෙතින් පැන නගින අපගේ ප්‍රතිපත්ති හා කාර්යරාමු අපගේ සේවා මට්ටම් හා ආර්ථික පරිමාණ වැඩි දියුණු කිරීම සඳහා උපකාරවන ඒකාබද්ධ හා අඛණ්ඩ ක්‍රියාත්මක කිරීම් ප්‍රාග්ධන ප්‍රතිසම්පාදනය ආචාර ධර්ම සංග්‍රහය බාහිර පාර්ශවයන්ගේ සේවය ලබා ගැනීම සන්නිවේදනය වත්කම් හා වගකීම් කළමනාකරණය ආයෝජනය තොරතුරු ආරක්ෂණ අවදානම කළමනාකරණය ආශ්‍රිතව අප විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති අප අපගේ වටිනාකම් කෙරෙහි සැබෑ ලෙසට අනුගත වන බවත් අපගේ ඒදිනෙදා මෙහෙයුම් කාර්‍යක්ෂම හා ඵලදායී ආකාරයකින් සිදු කරන බවත් සහතික කරයි.

තොරතුරු ආරක්ෂණය

තොරතුරු ආරක්ෂණය බැංකුවේ සියලු තොරතුරු තාක්ෂණ/ඩිජිටල් මෙහෙයුම් කෙරෙහි බෙහෙවින් වැදගත් වේ. 2017 මාර්තු මාසයේ දී අපි ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු බඳවාගත් අතර ස්වාධීන තොරතුරු තාක්ෂණ ආරක්ෂණ අංශයක් ස්ථාපිත කරන ලදී. ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුව වාර්තා කරන අතර ශ්‍රී ලංකා ටෙක්සර්ට් ආයතනයේ සහය ඇතිව තොරතුරු තාක්ෂණ ආරක්ෂණ අංශය විසින් තොරතුරු තාක්ෂණ සමාලෝචන සිදු කරනු ලබයි. බැංකුව ආරක්ෂණය ආශ්‍රිත සිදුවීම් නිරීක්ෂනය සඳහා සිම් (SIEM) විසඳුම ලබාගත් අතර 2017 දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා අන්ත ලක්ෂ (END POINT) ආරක්ෂණ විසඳුම ක්‍රියාත්මක කරන ලදී. තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද බැංකුව විසින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර ඊට අදාල ප්‍රධාන කාර්යයන් 2017 දෙසැම්බර් වන විට අවසන් කෙරිණ. ඊට අමතරව, 2017 දී බැංකුව ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති කාර්යරාමුවක් ක්‍රියාත්මක කරන ලද අතර බැංකුව සඳහා තොරතුරු ආරක්ෂණ සහතිකයක් ලබා ගැනීම පිණිස වන මූලික පියවර ක්‍රියාවට නංවන ලදී. 2017 වර්ෂයේ ආරම්භ කෙරුනු ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රයේ වූ දත්ත ආරක්ෂණ ප්‍රමිති ව්‍යාපෘතිය 2018 තෙවන කාර්තුව තුලදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

අනාගතය දෙස නෙත් හෙලමින්

අපගේ පාර්ශවකරුවන් සමග සන්නිවේදනය කිරීම සඳහා පවත්නා වේගවත්, විශ්වාසදායී සහ වඩා කාර්යක්ෂම ක්‍රමවේදය ලෙස අප ඩිජිටල් අවකාශ කෙරෙහි විශ්වාසය තබා තිබෙන අතර අපගේ සියලු පද්ධති සහ ක්‍රියාවලි සුරක්ෂිත, වේගවත් හා උසස් තත්ත්වයකින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අපි අඛණ්ඩව ඒ ආශ්‍රිතව ආයෝජන සිදු කිරීමට සැමවිටම උත්සුක වන්නෙමු. අපගේ නිහඬ දැනුම හා විශේෂඥතාව සමග ක්‍රියාවට නැංවීමට සැලසුම් කර තිබෙන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති, ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් ඩිජිටල් තාක්ෂණය බලගැන්වූ බැංකුවක් බවට පත්වීමෙහි පදනම වනු ඇත. එය දීර්ඝ, සංකීර්ණ හා වියදම් අධික ක්‍රියාවලියක් වුවද ලොව වේගයෙන් ඩිජිටල්කරණය වන පසුබිමක අපගේ තරඟකාරිත්වය ඉහළ නැංවීම උදෙසා එය අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස අපි දකිමු.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

සේවා සැපයීම සහ එහි අභිලාෂ සාක්ෂාත් කර ගැනීම උදෙසා බැංකුව සතුව පවතින භෞතික හා තාක්ෂණික වස්තු බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය වේ. වෙනත් පාර්ශ්ව විසින් නිෂ්පාදිත වත්කම් හා අභ්‍යන්තරිකව නිෂ්පාදිත වත්කම් ඊට අයත් වන අතර මෘදුකාංග වැනි බුද්ධිමය ප්‍රාග්ධනය එහි ඇතුලත් නොවේ. මෙම වත්කම් නිසි පරිදි කළමනාකරණය කර ගැනීම අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ ලාභදායීතාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන හෙයින් නිෂ්පාදිත ප්‍රාග්ධනය බැංකුවේ සාර්ථකත්වය උදෙසා අත්‍යාවශ්‍ය සාධකයකි.

GRI 102-4, 6

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රවේශය

සමාජයේ සියලු ජනකොටස් වෙත සිය සේවය ලබාදෙන බැංකුවක් ලෙස දිවයින පුරා විසිරුනු ශාඛා 253 ක්, තැපැල් කාර්යාල 4,062 ක් සහ මාස්ටර් කාඩ් හා වීසා ඩෙබිට්කාඩ් පහසුකම පිරිනැමෙන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය සමගින් ශක්තිමත් වූ බෙහෙවින් පුළුල් වූ ප්‍රවේශයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුවේ.
එසේම ප්‍රාදේශික පද්ධතිය සම්බන්ධයෙන් වඩා කාර්යක්ෂම අධීක්ෂණයක් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා වසර තුළ දී සියලු ශාඛා ප්‍රාදේශික නවයකට බෙදා වෙන් කරන ලදී. අපි මෙරට අනාගත ගෙවීම් ක්‍රමවේද යථාර්ථයක් කරන ජාතික ගෙවීම් ක්‍රම ජාලය වන ලංකා පේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ස්විචයෙහි පාර්ශ්වකරුවෙක් වෙමු.

ශ්‍රී ලංකාව පුරා විසිරී තිබෙන ජාතික ඉතිරිකිරීමේ බැංකු සේවා කවුළු

ශාඛා

253

ප්‍රාදේශීය කාර්යාල

9

තැපැල් කාර්යාල

4062

ලංකා පේ හරහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර


4,000

එන් එස් බී අයි සේවර් සේවාව සපයන දිවයින පුරා සිටින එම්කෑෂ් නියෝජිතයන්

16,000

එන්එස්බී රීච් යටතේ ක්‍රියාත්මක පොස් යන්ත්‍ර

300



ප්‍රාදේශිකය	ශාඛා සංඛ්‍යාව
මධ්‍යම	30
නැගෙනහිර	21
වයඹ	30
උතුර	21
තැපැල් පරිපාලන	23
සබරගමුව	25
දකුණ	32
බස්නාහිර 1	34
බස්නාහිර 2	37
මුළු එකතුව	253

ප්‍රාදේශිකය	ශාඛා සංඛ්‍යාව
අම්පාර	8
අනුරාධපුර	12
බදුල්ල	6
මඩකලපුව	7
කොළඹ	43
ගාල්ල	13
ගම්පහ	25
හම්බන්තොට	10
යාපනය	14
කලුතර	12
මහනුවර	17
කෑගල්ල	10
කිලිනොච්චිය	1
කුරුණෑගල	17
මන්නාරම	2
මාතලේ	4
මාතර	12
මොණරාගල	6
මුලතිව්	2
නුවරඑළිය	7
පොළොන්නරුව	3
පුත්තලම	8
මුළු එකතුව	253

ජාත්‍යන්තරය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රවේශය අපගේ ජාතික දේශ සීමා අභිබවයි. ජාත්‍යන්තර මුදල් හුවමාරු සමාගම් සමග බැංකුව පවත්වාගෙන යන සබඳතා ලොව ඕනෑම තැනක සිට ලාභදායී සහ සුරක්ෂිත මුදල් ප්‍රේෂණ සඳහා අවස්ථාව උදා කර දී තිබේ. බැංකුව අඩු පිරිවැය සහිත, සහ වේගවත් මුදල් හුවමාරු සේවාවන් වන ස්විෆ්ට් (SWIFT) සහ යුරෝජයිරෝ ජාල වල සාමාජිකයෙකි. අපගේ ප්‍රේෂණ සේවාව වන එන්එස්බී යූ ට්‍රස්ට් (U-Trust) විදෙස් රටවල සිට මුදල් ප්‍රේෂණ ආකර්ශණය කරගනී. හුවමාරු මධ්‍යස්ථාන 33 ක් හා අනෙකුත් බැංකු 14 ක් සමග බැංකුව සබඳතා පවත්වයි.

පසුගිය වර්ෂය තුල අප විසින් ස්ථාපිත කරගන්නා ලද නව සබඳතා සමගින් අපගේ ප්‍රේෂණ සේවාව තව දුරටත් වර්ධනය කර ගැනීමට අපට හැකිවනු ඇත. 2017 වර්ෂයේ දී අපි අරාබි නැෂනල් බැංකුව සෞදි අරාබියා හුවමාරු සමාගම සහ සිංගප්පූරුවේ ඩීබීඑස් බැංකුව සමග සබඳතා වලට අවතීර්ණ වීමු. එක්සත් ජනපදය කැනඩාව එක්සත් රාජධානිය සහ නවසීලන්තය වැනි රටවල සිට ආමුඛ හා ප්‍රතිමුඛ ප්‍රේෂණ ආශ්‍රිත ජාත්‍යන්තර වෙළඳපල වලට පිවිසීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සැලසුම් කරයි.

භෞතික යටිතල/පහසුකම්

ශාඛා පුළුල් කිරීම

ගනුදෙනුකරුවන් සඳහා පවතින සේවා කවුළු ආශ්‍රිත සුවිසල් ජාලයන් ඔස්සේ අපි ගනුදෙනුකරුවන්ට අප සමග සබඳතා පැවැත්වීමට පහසුකම් සැලසීමට කටයුතු කළෙමු. ක්ෂේත්‍රයේ ප්‍රමිති වලට අනුකූලව බැංකුව නවීකරණය කරන ලද ශාඛා ජාලයත් සමගින් එහි භෞතික සලකුණ පුළුල් කර තිබේ. 2017 දී තවත් ශාඛා 3 ක් ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා ජාලයට එක් කෙරිණ. ඒ කොළඹ සිටි ප්ලස් ශාඛාව පේරාදෙණිය සහ පිලියන්දල වේ. අපගේ ප්‍රවේශය සහ ගනුදෙනුකරුවන් සඳහා වන සේවා කවුළු තව දුරටත් පුළුල් කරමින් දිවයින පුරා පිහිටි ප්‍රධාන උපායමාර්ගික ස්ථාන අපි හඳුනාගත්තෙමු.

ජාතික ඉතිරිකිරීමේ බැංකු ආදර්ශ ශාඛාව

නවීන බැංකුකරණ සේවා සැපයීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමට බැංකු ක්ෂේත්‍රයේ සිදුවෙමින් පවත්නා සීඝ්‍ර ඩිජිටල්කරණය විසින් අත්‍යාවශ්‍ය කරුණක් බවට පත් කරනු ලැබ ඇත. එකී කාරණය සිත්හි දරා ගනිමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එන්එස්බී කනෙක්ට් යන සන්නම් නාමය සහිතව ආදර්ශ ශාඛා සංකල්පය ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ ඩිජිටල් බැංකු සේවා සඳහා විශේෂිත වූ ස්මාර්ට් කලාපයක් ස්ථාපිත කිරීම සහ ශාඛා ගොඩනැගිලි ආශ්‍රිත බාහිර හා අභ්‍යන්තර අලංකරණ කටයුතු සිදු කෙරිණ. එස් පහ වැඩසටහන ද ශාඛාව වල ක්‍රියාත්මක කෙරින. ආදර්ශ ශාඛා සංකල්පය මූලික වශයෙන් බොරලැස්ගමුව ශාඛාව ආශ්‍රිතව ක්‍රියාත්මක කෙරිණ. 2018 වර්ෂයේ දී තවත් ශාඛා 50 ක දී මෙම සංකල්පය දියත් කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සැලසුම් කර තිබේ. මෙම මූලපිරීම්හි සාර්ථකත්වය දිවයින පුරා පිහිටි අපගේ සේවා කවුළු ඔස්සේ ගනුදෙනුකරුවන් වෙත වැඩි වටිනාකමක් තිලිණ කිරීමට හේතුවනු ඇත.

හරිත බලශක්තිය සඳහා ආයෝජන

2017 වර්ෂයේ දී අපි පුනර්ජනනීය බලශක්තිය වෙනුවෙන් ආයෝජනය කිරීමට පියවර ගත්තෙමු. 2017 වසර තුල දී අපගේ ශාඛා 5 ක් සඳහා සූර්ය බල ශක්ති පැනල සවි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරිණ. 2018 වසර තුල දී හරිත බලශක්තිය උපයෝගී කර ගන්නා අපගේ ශාඛා සංඛ්‍යාව 50 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිතය. එසේම බලශක්තිය ඉතිරිකිරීම් සහ සූර්ය ශක්තිය භාවිතයට ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සංවිධානය කෙරේ.

ඩිජිටල් යටිතල පහසුකම්

ඩිජිටල්කරණය යනු බැංකු ක්ෂේත්‍රය තුල ස්ථාවර වෙනස්කම් ඇති කිරීමයි. තාක්ෂණික යටිතල පහසුකම් පද්ධති හා ක්‍රියාවලි මෙන්ම බැංකුකරණය කෙරෙහි වන අපගේ ප්‍රවේශය ද සීඝ්‍රයෙන් වෙනස් වෙමින් තිබෙන ඩිජිටල් ලෝකය සමග උරෙනුර ගමන් කළ හැකි පරිදි යලි සකස් කළ යුතුය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි ඩිජිටල් යටිතල පහසුකම් වර්ධනය කිරීමට පුළුල් ලෙස පියවර ගෙන තිබේ.

ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සුවිසල් ප්‍රාග්ධන ආයෝජනයන් අවශ්‍ය බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව හඳුනාගෙන තිබේ. තාක්ෂණයට ලැදි අපගේ ගනුදෙනුකරුවන්ට විශිෂ්ඨ මට්ටමක සේවාවක් හා පහසුවක් තිළිණ කිරීම සඳහා මෙම ආයෝජනය සිදු කළ යුතු බව ද අපි හඳුනාගතිමු. බැංකු ක්ෂේත්‍රයේ ඩිජිටල්කරණය වර්ධනය වන තරඟකාරිත්වයක් ද ජනිත කර ඇත.
ආයතනික පරිගණක ජාලය සඳහා ඊළඟ පරම්පරාවේ ගිනි පවුරු (Firewall) ආරක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම EMV ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය වැඩිදියුණු කිරීම අනුකූලතාවය සහතික කිරීම සඳහා ශාඛාවල සහ ප්‍රධාන කාර්යාලයේ IP ආරක්ෂක කැමරා පදනම් කරගත් ආරක්ෂණ නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ශාඛා සඳහා කුඩා ප්‍රමාණයේ පරිගණක සැපයීම බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රධාන ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේ.

"ස්මාර්ට්" කලාපය ස්ථාපිත කිරීම

මුදල් තැන්පතු යන්ත්‍රයක් හා ඩිජිටල් සලකුණු යන්ත්‍රයක් සහිතව ඩිජිටල් බැංකු සේවා වෙනුවෙන් වෙන් වූ ස්මාර්ට් කලාපයක් ප්‍රථමයෙන්ම එක් කෙරුනේ එන්එස්බී සිටි ප්ලස් ශාඛාවට ය. අපගේ ආදර්ශ ශාඛා සංකල්පය සමග මැනවින් සංයෝග වන මෙම පහසුකම අපගේ අනෙකුත් සියලු ශාඛා ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

අයි සේවර් හඳුන්වාදීම

ගනුදෙනුකරුවන්ට සිය ගිණුම්වල පහසුවෙන් මුදල් තැන්පත් කිරීමට හැකියාව ලබා දෙමින් එස්එල්ටී මොබිටෙල් එම්කෑෂ් සමග මෙම විප්ලවීය ඩිජිටල් නිමැවුම හඳුන්වා දෙන ලදී. දිවයින පුරා විසිරී සිටින 16000 කට අධික එම්කෑෂ් නියෝජිතයන් වෙතින් මෙම සේවාව ලබාගත හැක.

මෘදුකාංග ශා දෘඩාංග වැඩිදියුණු කිරීම

පරිගණක පද්ධතිය ආශ්‍රිතව ඇතිවිය හැකි ප්‍රහාර සහ සයිබර් තර්ජන වළක්වාලීම සහ අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන පරිගණක පද්ධතියේ මතකය සහ ගිනිපවුර ආරක්ෂණ පද්ධතිය නවීකරණය කරන ලදී. 2017 වර්ෂය තුල දී තැපැල් බැංකු ඒකක සඳහා කුඩා පරිගණක 1000 ක් සහ පාස්පොත් මුද්‍රණ යන්ත්‍ර 400 ක් මිල දී ගනිමින් ඩිජිටල් යටිතල පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කෙරිණ.

ඔරැකල් දත්ත සමුදා යන්ත්‍රය

ඔරැකල් දත්ත සංචිත මෘදුකාංගයෙහි ක්‍රියාකාරිත්වය සඳහා පවත්නා විශිෂ්ඨතම කාර්යසාධනයන් සහිත ඉතා සුලභ සහ සුරක්ෂිතම තාක්ෂණය ඔරැකල් එක්සාඩේටා ලෙස හඳුන්වාදිය හැකිය. අන්තර්ජාලය සමග සම්බන්ධ වෙමින් විවිධ සේවා ඉටුකර දෙන ක්ලව්ඩ් රෙඩි (Cloude Ready) පහසුකම සහ වෙනත් කිසිදු පද්ධතියකට ළඟාවිය නොහැකි ආකාරයේ ඔරැකල් දත්ත සංචිත කාර්යසාධනයක් සහතික කරන ඔරැකල් මෘදුකාංගය සමග බද්ධව ක්‍රියාත්මකවීම සඳහා මෙම පද්ධතිය ප්‍රශස්ථ අයුරින්, නිර්මාණය, සංයෝජනය හා පරීක්ෂා කිරීම සිදු කර ඇත.

බැංකුව තුල දැනට ක්‍රියාකාරීව පවත්නා විවිධ පරිගණක පද්ධති ආශ්‍රිත අවශ්‍යතා සහ ඊට අදාළව ඉදිරියේ දී පැන නගින අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඔරැකල් එක්සාඩේටා යන්ත්‍රය මිල දී ගන්න ලදී. ජාතික ඉතිරිකිරීමේ බැංකුව එක් විකුණුම්කරුවෙක් සහිත ආකෘතියක් අනුගමනය කරන හෙයින් වැඩි කාර්යයන් ප්‍රමාණයක් ඉටු කර ගැනීම සඳහා දත්ත සංචිත කිහිපයක් පමණක් භාවිතයෙන් මෘදුකාංග බලපත්‍ර සඳහා වන පිරිවැය අවම කර ගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබේ. එසේම සියළු මයික්‍රොසොෆ්ට් නිමැවුම් සඳහා අමතර ප්‍රතිලාභ සහිතව බලපත්‍ර ලබා ගැනීමට ද බැංකුවට හැකි විය. ඔරැකල් එක්සාඩේටා සහ සියළු මයික්‍රොසොෆ්ට් ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම බැංකුවේ සියළු ඩිජිටල් මුලපිරීම් ඉදිරියට ගෙන යාමට ආධාර වනු ඇත.

වැඩිදියුණු කළ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය (CMS)

බැංකුව විසින් මාස්ටර් කාඩ් (EMV) චිප් සහිත හරපත් නිකුත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමෙන් පසු පෞද්ගලික හඳුනා ගැනීමේ අංකය (PIN) ගනුදෙනුකරු වෙත ආරක්ෂිත කෙටි පණිවිඩයක් මගින් දැනුම් දීමට මෙන්ම හරපත් ගනුදෙනු සීමාව කළමනාකරණය කර ගැනීම ගනුදෙනුකරු වෙත පැවරීමට ද හැකියාව ලැබෙනු ඇත. නව සැසඳුම් විසඳුම් අත්පත් කර ගනිමින් බැංකුව මාස්ටර් කාඩ්පත් සහ වීසා කාඩ්පත් ගනුදෙනු ස්වයංක්‍රීය කිරීමට ද කටයුතු කර තිබේ.

සෘජු වීසා සම්බන්ධතාවය

වීසා හි ජාත්‍යන්තර ගෙවීම් ක්‍රම ජාලය උපයෝගී කරගෙන තත්කාලීනව ගෙවීම් සිදු කිරීමට වීසා සෘජු සම්බන්ධතාවය ඔස්සේ අවස්ථාව උදාවේ. වීසා වෙතින් ලබාදෙන සුරක්ෂිත ගෙවීම් ජාලය ඔස්සේ සිදු කරන ගෙවීම් මූලික කරගත් ව්‍යාපාර සහ පුද්ගලයන් වෙතින් පුද්ගලයන් වෙත ගෙවීම් කිරීම සඳහා මෙමගින් පහසුකම් සැලසේ.

අනාගතය දෙස බැල්මක්

නිරන්තරයෙන් වෙනස්වන ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හේතුවෙන් පැන නගින අනාගත අභියෝග වලට මුහුණ දීම සඳහා බැංකුව එහි භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමෙහි දැඩිව යෙදී සිටී. ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් පුළුල් කරන හා සේවා සැපයීමේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමේ ක්‍රියාවලි වැඩි දියුණු කිරීමේ හා කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ව්‍යාපෘති බැංකුව විසින් ආරම්භ කරනු ඇත. මීගමුව, නුගේගොඩ, රාගම සහ බණ්ඩාරවෙල ශාඛා සඳහා නව ගොඩනැගිලි ඉදි වෙමින් පවතී. එසේම දෙයියන්දර, පන්නල සහ වැලිවේරිය ප්‍රදේශවල නව ශාඛා ස්ථාපිත කිරීම සඳහා නව ගොඩනැගිලි ඉදි කෙරෙන අතර 2018 දී විවෘත කිරීමට නියමිතය.

ජාත්‍යන්තර සීමා හරහා වේගයෙන් ව්‍යාප්ත වන අන්තර්ජාලය ඔස්සේ සිදුවන ගනුදෙනු විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රය මගින් පිළිඹිබු කෙරේ. සුරක්ෂිත සහ ආරක්ෂාකාරී පරිසරයක් තුල ව්‍යාපාරික ගනුදෙනු මෙහෙයවීම සඳහා අවස්ථාව සලසන ආරක්ෂාකාරී විද්‍යුත් වාණිජ පහසුකම් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබීමට නියමිතය.

ඊළඟ පරම්පරාව බල ගැන්වීම සඳහා කාන්තාව සවිබල ගැන්වීම

කාන්තාවන් සඳහාම විශේෂයෙන් සකස් කරන ලද එන්එස්බී ස්ත්‍රී ගිණුම විවිධ මූල්‍ය තත්ත්වයන් යටතේ මූල්‍ය නිදහස සමඟ සෑම ස්ථරයකටම අයත් ශ්‍රී ලාංකික කාන්තාව සවිබල ගන්වයි.



GRI 102-8

මානව ප්‍රාග්ධනය



සමස්ත ශ්‍රම බලකාය **4,470**	**සමස්ත බඳවා ගැනීම්** **216** (සේවක මණ්ඩලයෙන් 5.3%)	**උසස්වීම්** **824**
සේවක පාරිශ්‍රමික **රු. මි. 6,887**	**ස්ත්‍රී පුරුෂ අනුපාතිකය** **6 : 5** (සියළු මට්ටම් වලදී)	**සේවා නියුක්තිකයන්ගේ කාර්යසාධන ඇගයීම්** **100%**
පුහුණු වැඩසටහන් සංඛ්‍යාව **252**	**පුහුණු සඳහා සමස්ත ආයෝජන** **රු.මි. 34.4**	**පුහුණු පැය** **45,347**


සේවා නියුක් තිකයන් සඳහා පුහුණු පැය **12**	**රඳවා ගැනීමේ අනුපාතිකය** **96.7%**	**සේවා නියුක්තිකයන්ගේ පිරිවැටුම** **3.3%**	**සාමූහික ගිවිසුම මගින් ආවරණය කෙරෙන සේවා නියුක්තිකයන්** **99.7%**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් අපගේ ජාතිය වෙනුවෙන් සිදුකරනු ලබන සේවාව පිටුපස තිබෙන ප්‍රධාන සාධක අතර කැපවීමෙන් කටයුතු කරන අපගේ කණ්ඩායම කැපී පෙනේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පවතින පවුල පිළිබඳ හැඟීම හා ආකල්පය නිර්මාණය කිරීමට දායක වන බෙහෙවින් කුසලතා පූර්ණ, කැපවීමෙන් සේවයේ නිරතවන, හිතෛෂී පුද්ගලයන්ගෙන් බැංකුවේ කාර්යමණ්ඩලය සමන්විත වේ. ඉහළ සතුටක් හා කාර්යසාධනයන්ට හේතුවන අපගේ කණ්ඩායමේ තෘප්තිමත්භාවය සහතික කිරීම උදෙසා රාජකාරිය හා ජීවිතය අතර තුලනයක් ඇති කිරීමේ අවශ්‍යතාවය අපි අවධාරනය කරමු.

රජයේ ආයතනයක් වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව ආදර්ශමත් ආයතනික පුරවැසියෙකි. අපි සියලු කාර්යමණ්ඩල සාමාජිකයන්ට සම අවස්ථා සහතික කරන සේවායෙක් වන අතර ගත වූ කාලය මුළුල්ලේ විවිධ හා සර්වග්‍රාහී කාර්යාල පරිසරයක් අප විසින් නිර්මාණය කරනු ලැබ තිබේ. අපගේ කණ්ඩායම වෙත පිරිනැමෙන තරඟකාරී වැටුප්, ප්‍රතිලාභ, සෞඛ්‍ය සේවා සහ වන්දි සමගින් පරිපූර්ණ සේවා නියුක්ති අත්දැකීමක් ලබාදීම ඔස්සේ අපි අපගේ සේවා නියුක්තිකයන් සතුටින් තැබීමට පෙරමුණ ගත්තෙමු. විවෘත කිසිදු භේදයකින් තොර, සුරක්ෂිත සහ නම්‍යශීලී කාර්ය පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සාර්ථක වී තිබේ.

2017 දී, ස්ථීර සේවා නියුක්තිකයන් 3,803 ක් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවා නියුක්තිකයන් 667 ක් සමගින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පවුලේ සමස්ත සාමාජිකයන් සංඛ්‍යාව 4470 ක් විය. අපගේ ශ්‍රම බලකායෙන් 70% ක් අවුරුදු 25-39 වයස් සීමාවේ පසුවෙති. වසර තුල දී අප නව සාමාජිකයන් 216 ක් ජාතික ඉතිරිකිරීමේ බැංකු පවුලට බඳවාගත්තෙමු. 2017 වසරේ දී ලබාදෙන ලද සමස්ත උසස්වීම් සංඛ්‍යාව 824 කි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථීර සේවකයන් 99.7% ක් සාමූහික කේවල් කිරීමේ ගිවිසුමක් මගින් ආවරණය වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලව එක් සේවා ස්ථානයක වසර 5 කට වැඩි කාලයක් සේවයේ නියුතු වූ සේවකයන් 318 දෙනෙක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දී ඇත.


සමස්ත කාර්යමණ්ඩල ප්‍රබලතාව



සමස්ත කාර්යමණ්ඩල ප්‍රබලතාව	සේවක සංඛ්‍යාව
ස්ථීර සේවකයන්	3,803
කොන්ත්‍රාත් සේවකයන්	667


ජාතික ඉතිරිකිරීමේ බැංකුව — චාර්ෂික වාර්තාව — 2017

ස්ත්‍රී පුරුෂ විශ්ලේෂණය




ස්ත්‍රී පුරුෂ විශ්ලේෂණය	සේවක සංඛ්‍යාව
ස්ත්‍රී	1,578
පුරුෂ	2,225
එකතුව	3,803

වයස විශ්ලේෂණය



අවුරුදු 25 ට අඩු	සේවක සංඛ්‍යාව
අවුරුදු 25 ට අඩු	317
25-30	1,438
31-40	1,253
41-50	415
අවුරුදු 50 ට වැඩි	380
එකතුව	3,803

සේවක ශ්‍රේණි කාණ්ඩ විශ්ලේෂණය



A – ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය (සාමාන්‍යාධිකාධිකාරි/ විධායක නිලධාරි,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්)
B – කළමනාකරුවන් (I, II, III-I, III-II ශ්‍රේණි)
C – විධායක (III-III, IV ශ්‍රේණි)
D – මාණ්ඩලික සහකාර (V/VI ශ්‍රේණි)
E – කාර්යාල සහයක (VII ශ්‍රේණි කාණ්ඩය)

සේවක ශ්‍රේණි කාණ්ඩ විශ්ලේෂණය	සංඛ්‍යාව	%
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය (සාමාන්‍යාධිකාධිකාරි/ විධායක නිලධාරි,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්)	20	0.5
කළමනාකරුවන් (I, II, III-I, III-II ශ්‍රේණි)	580	15.3
විධායක (III-III, IV ශ්‍රේණි)	1,190	31.3
මාණ්ඩලික සහකාර (V/VI ශ්‍රේණි)	1,848	48.6
කාර්යාල සහයක (VII ශ්‍රේණි කාණ්ඩය)	165	4.3
එකතුව	3,803	

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රේණිය	ස්ත්‍රී	පුරුෂ
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය (සාමාන්‍යාධිකාධිකාරි/විධායක නිලධාරි,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්)	13	7
කළමනාකරුවන් (I, II, III-I, III-II ශ්‍රේණි)	299	281
විධායක (III-III, IV ශ්‍රේණි)	507	683
මාණ්ඩලික සහකාර (V/VI ශ්‍රේණි)	598	1,250
කාර්යාල සහයක (VII ශ්‍රේණි කාණ්ඩය)	161	4

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා කාලය විශ්ලේෂණය	අවුරුදු 3 ට අඩු	අවුරුදු 3-6 අතර	අවුරුදු 6-10	අවුරුදු 10 ට වැඩි
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය (සාමාන්‍යාධිකාධිකාරි/විධායක නිලධාරි,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්)	2	1	2	15
කළමනාකරුවන් (I, II, III-I, III-II ශ්‍රේණි)	30	16	100	434
විධායක (III-III, IV ශ්‍රේණි)	308	116	346	420
මාණ්ඩලික සහකාර (V/VI ශ්‍රේණි)	923	571	250	104
කාර්යාල සහයක (VII ශ්‍රේණි කාණ්ඩය)	137	4	0	24

GRI 401-1 GRI 202-2

ජාතික ඉතිරිකිරීමේ බැංකුව දැඩි බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කරනු ලබයි.

තරඟකාරී වෘත්තීය කුසලතා වලින් හෙබි විභව අයදුම්කරුවන් හඳුනා ගැනීම සඳහා වන දැඩි බඳවා ගැනීමේ පටිපාටියක් බැංකුව සතුවේ. ජාතිය, වාර්ගිකත්වය, ආගම, වයස, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ශාරීරික නොහැකියාවන් මත පදනම් නොවී කිසිවෙකුට විශේෂ සැලකීමක් හෝ වෙනසක් සිදු කිරීමෙන් තොරව තනතුරු පිරිනැමීම සහතික කරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව බඳවා ගැනීම් ප්‍රතිපත්තියක් මානව සම්පත් සංවර්ධන අංශය විසින් අනුගමනය කරනු ලබයි. අපගේ ශ්‍රම බලකායේ සියලු මට්ටම් වලදී 6:5 ක හිතකර ස්ත්‍රී පුරුෂ අනුපාතයක් පවත්වා ගැනීමට අප සමත්වීම මගින් අප සියළු දෙනාට සම අවස්ථා හිමිකර දෙන සේව්‍යයෙක් බව සනාථ වේ.

බඳවා ගැනීමේ ක්‍රියාවලියට ඇතුලත් වන තරඟකාරී විභාග සහ ඊට පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ විනිවිධභාවයෙන් යුතුව සිදු කෙරේ. තෝරාගත් අයදුම් කරුවන් වසරක පරිවාස කාලයක් සම්පූර්ණ කළ යුතුය. අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය දේශීය සමාජය නියෝජනය කරන පිරිසක් වෙති. ස්ථීර හා කොන්ත්‍රාත් සේවකයන් ද ඇතුළුව 2017 වර්ෂය තුල දී සිදු කරන ලද නවක බඳවා ගැනීම් 216 ක් වූ අතර (මුළු සේවක සංඛ්‍යාවෙන් 5.3%) ඉන් බහුතරය පිවිසුම් අවස්ථාවේ දී සිදු කෙරිණ.

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	මුළු අගය
25 ට අඩු	30	76	106
26-35	21	53	74
36-45	9	22	31
45 ට වැඩි	2	3	5
එකතුව	62	154	216
ප්‍රතිශතය	29	71	100

සැබෑ වෘත්තිකයන් නිර්මාණය වන්නේ පුහුණුව හා සංවර්ධනය තුලිනි.

බෙහෙවින් තරඟකාරී ක්ෂේත්‍රයක් තුල විශිෂ්ඨත්වය, උපායමාර්ගික ඉලක්ක හා වාසි ලඟා කර ගැනීමෙහිලා නිසි පුහුණුව ලද උගත් ශ්‍රම බලකායක් තීරණාත්මක සාධකයකි. දැනට ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සිය රාජකාරි අවශ්‍යතා මෙන්ම අනාගත වගකීම් සපුරාලීමට සමත් සැබෑ වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමට උපකාරී වේ.

සිය සේවකයන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඔවුන්ට දේශීය හා විදේශීය පුහුණුව, අනුග්‍රාහකත්වය, සහ අධ්‍යාපන දිරි දීමනා ලබා දෙයි. එසේම පුහුණු වැඩසටහන් හේතුවෙන් සේවකයන්ගේ සමස්ත අත්දැකීම්, නියුක්ත භාවය සහ වෘත්තීය සුහදත්වය වර්ධනය වන බව අපි අවබෝධ කරගතිමු.

පුහුණු අවස්ථා විශ්ලේෂණය

සේවකයන්ගේ පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා වන ක්‍රියාවලිය පුහුණු අවස්ථා විශ්ලේෂණය ලෙස හැඳින්වේ. අවශ්‍ය කුසලතා හඳුනා ගැනීම, දැනට තිබෙන කුසලතා මට්ටම තක්සේරු කිරීම සහ පුහුණුවක් අවශ්‍ය වන ක්ෂේත්‍ර තීරණය කිරීම මෙම ක්‍රියාවලියට ඇතුලත් වේ. වාර්ෂික පුහුණු සමීක්ෂණය, අදාල අංශ ප්‍රධානීන් ශාඛා කළමනාකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සමග උපදේශන සැසි පැවැත්වීම, ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සමාලෝචනය කිරීම, කාර්යසාධන ඇගයීම සහ පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය ආශ්‍රිත ප්‍රශ්නාවලි වැනි විවිධ ක්‍රමවේද ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් භාවිතයට ගන්නා ලදී. රැකියාවේ නියුතු අතරතුර පුහුණුව, ආයතනය තුල පුහුණුව, බාහිර පුහුණුව හෝ විදේශීය පුහුණුව වැනි විවිධ ආකාරයේ පුහුණු අතුරින් බැංකුවට අවශ්‍යවන පුහුණු වැඩසටහන් මොනවාද යන්න පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයෙහි ප්‍රතිඵල අනුව තීරණය කෙරේ.

GRI 404-1, 2

2017 වර්ෂයේ දී පුහුණුව හා සංවර්ධනය

තාක්ෂණික කුසලතා වර්ධනය සඳහා පුහුණුව සහ ප්‍රේරණය, රැකියාවේ නියුතු අතරතුර පුහුණුව ඇතුළු විවිධ ආකාරයේ පුහුණු වැඩසටහන් අපගේ සේවානියුක්තියන් වෙත ලබාදීම ඔස්සේ සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට අපට හැකි වූ අතර එය ඔවුන්ගේ වෘත්තීය ජීවනචක්‍රය පුරාවට මහඟු පිටුබලයක් සපයනු ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පවතින කාර්ය සංස්කෘතිය තුලට ක්‍රමයෙන් අන්තර්ග්‍රහණයවීම සඳහා නවක සේවයකයන්ට එම ප්‍රේරණ වැඩසටහන් උපකාරකරයි. අපගේ ප්‍රධාන අරමුණ වනුයේ අපගේ ආයතනයට මෙන්ම ජාතියට වටිනාකම් ජනිත කිරීමට සමත් ව්‍යාපාරික නායකයන් නිර්මාණය කිරීමයි.

2017 වර්ෂයේ දී දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා රු.මි. 34.4 කට වඩා වැඩි ආයෝජනයක් කරන ලදී. එමගින් පුහුණු වැඩසටහන් 252 ක් සඳහා අරමුදල් සැපයූ අතර 2017 වසර සඳහා පුහුණු පැය 45,347 ක් සටහන්විය. එම වැඩසටහන් 252 අතුරින් 118 ක් ආයතනය තුල පැවති අතර 120 ක් ආයතනයට බාහිරව පැවැත්විණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවකයන් 53 ක් සඳහා විදේශීය පුහුණු වැඩසහන් 14 ක් පවත්වන ලදී. එක් සේවානියුක්තිකයෙක් සඳහා වූ සාමාන්‍ය පුහුණු පැය සංඛ්‍යාව 12 ක් වූ අතර සහභාගිත්ව අනුපාතිකය 88% කි.

පුහුණු වැඩසටහන් සඳහා යොදවන ලද ප්‍රාග්ධනය සහ එක් සේවානියුක්තිකයෙක් සඳහා වූ සාමාන්‍ය පුහුණු පැය සංඛ්‍යාව පසුගිය වසරවලට සාපේක්ෂව ඉහළ නංවමින් පුහුණුව හා සංවර්ධනය ආශ්‍රිතව අඛණ්ඩව ආයෝජන සිදුකරන ලදී. භූගෝලීය සීමාවලින් ඔබ්බට ගොස් ස්වකීය පහසුව හා කැමැත්ත පරිදි අධ්‍යාපන කටයුතු වල නිරත වීමට අවස්ථාව සලසන වෙබ් මුළුව වැඩසටහන් වැඩිදියුණු කිරීමට අපි උත්සුකවෙමු. මේ ආකාරයට වෘත්තීය සංවර්ධනය උදෙසා අපි අඛණ්ඩව ආයෝජනය කරමු.

වැඩසටහන් සඳහා වඩා වැඩි ප්‍රාග්ධන යෙදවීම සහ එක් සේවකයෙකුට ලැබුණු පුහුණු පැය ගණන පෙර වර්ෂවලට වඩා වැඩිවීම තුලින් පුහුණුව සහ සංවර්ධනය සඳහා අපගේ ආයෝජනයන් දිගින් දිගටම වර්ධනය විය. සේවකයන්ට විවිධ ස්ථානවල සිටිමින් හැදෑරීමට හැකිවන පරිදි, ලබන වසරේ සිට වෙබ් මාර්ගයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම තුලින් පුහුණු සහ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන් වැඩි දියුණු කිරීමට අප උත්සාහ කරමු. අප අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයෙහි දිගින් දිගටම ආයෝජනය කරමු.

GRI 401-1

සේවක රඳවා ගැනීම සහ පිරිවැටුම : අප ශ්‍රී ලංකාවේ උද්යෝගිමත් සේවායෙකි

ශ්‍රී ලංකාවේ උද්යෝගිමත් සේවායෙක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවරය අපගේ කීර්තිය සේවක හිතකර ප්‍රතිපත්ති සහ ආයතනික සංස්කෘතිය ඔස්සේ ගෙවීගිය කාලය මුළුල්ලේ ශක්තිමත් ලෙස සකස්වී තිබේ. 2017 වර්ෂයේ දී අපි ක්ෂේත්‍රයේ සාමාන්‍යට වඩා ඉහළ සේවක රඳවා ගැනීමේ අනුපාතිකයක් ලඟා කර ගත්තෙමු. එය අපට විසල් ජයග්‍රහණයක් වන අතර සේවා නියුක්තිකයන් පෝෂණය කරන සුරක්ෂිත කාර්ය පරිසරයක් සහ සංස්කෘතියක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල ස්ථාපිත කරන ලද බව එයින් පෙනී යයි. අපගේ පැසසුම් සහගත සේවක රඳවා ගැනීමේ අනුපාතිකය 96.7% ක් ලෙස සනිටුහන් වූ අතර වසර සඳහා අපගේ පිරිවැටුම් අනුපාතිකය 3.3%කි.

වයස්කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව
අවුරුදු 25 ට අඩු	1	0	1
26-35	2	5	7
36-45	1	4	5
අවුරුදු 45 ට වැඩි	67	23	90
මුළු එකතුව	71	32	103
ප්‍රතිශතය	69	31	100

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් අපගේ කණ්ඩායම වෙත ලබාදෙන ප්‍රතිලාභ සහ දිරිදීමනා මෙන්ම බැකුව තුල පවත්නා හිතකර කාර්ය පරිසරය අපගේ ඉහළ රඳවා ගැනීමේ අනුපාතිකයට ප්‍රධාන වශයෙන් දායකවේ. එමගින් සේවකයා අප සමග රැඳෙන අපට හිතෛෂී පුද්ගලයෙක් බවට පත්කෙරේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පවතින පවුල පිළිබඳ හැඟීම සාමාන්‍ය සේවක හිතෛෂීභාව අභිබවයි. වසර තුල දී සේවයෙන් විශ්‍රාම ගිය සේවකයන්ට අමතරව සේවකයන් 15 දෙනෙක් පමණක් අප වෙතින් නික්මයාම ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල අප විසින් නිර්මාණය කරන ලද තිරසාර කාර්ය සංස්කෘතියට සාක්ෂි සපයයි.

GRI 202-1 GRI 401-2, 405-2

ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි සේවකයන්ට අසීමිත ප්‍රතිලාභ ලබාදෙයි.

අනෙකුත් රාජ්‍ය බැංකුවල චේතන හා අනුරූපව සහ ජාතික අවම චේතන මට්ටම අභිබවමින් අපි තරඟකාරී වැටුප් අපගේ සේවකයන් වෙත පිරිනමමු. චේතන හා පාරිශ්‍රමික ක්‍රමවේද සම්බන්ධයෙන් ව්‍යාත්තීය සමිති හා සේවකයන් සමග නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වේ. පාරිශ්‍රමික ක්‍රමවේද නිශ්චය කිරීමේ දී සම වැටුප් ප්‍රතිපත්තියක් ඇත. වර්ෂය අවසානයේ දී අපි වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවන අතර බැංකුවේ ඉලක්ක ගත අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා සමත්වී නම් විශේෂ ඉලක්ක ප්‍රසාද දීමනාවක් ද ගෙවනු ලැබේ.

සේවකයන් වෙත ලබාදෙන ප්‍රතිලාභ වලට සෞඛ්‍ය සේවා සැලැස්මක්, සහන පොලී අනුපාත යටතේ පිරිනැමෙන නිවාස, වාහන, පරිගණක, පාරිභෝගික හා ආපදා ණය ක්‍රම අතුලත් වේ. වසර තුල දී බැංකුව රු.මි. 1,069 ක මුළු වටිනාකමක් සහිත නිවාස ණය පහසුකම් 384 ක් කාර්යමණ්ඩල සාමාජිකයන් වෙත ලබාදී තිබේ. 2017 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල නිවාස ණය ශේෂය රු.මි. 5634 කි.

විශ්‍රාම සැලසුමක්, ප්‍රවාහන සහ නවාතැන් සහනාධාර, ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ විභාග සමත්වීමේදී ගෞරව ගෙවීමත්, වරලත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය, වරලත් මූල්‍ය විශ්ලේෂණ වැනි ව්‍යාත්තීය සංවිධාන වල සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාර්යමණ්ඩල සාමාජිකයන්ට හිමිවන තවත් ප්‍රතිලාභවේ.

එසේම සේවකයාට තමන් වසර තුල දී භාවිතයට නොගත් වෛද්‍ය හා ප්‍රසාද නිවාඩු මුදල් කිරීමේ හැකියාව ද ලබා දී තිබේ. අපි ඔවුන්ට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදලෙහි ප්‍රතිලාභ මෙන්ම පාරිතෝෂික ද ලබාදී තිබේ. අවසාන වශයෙන් අපගේ සේවකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ මෙන්ම මරණ පාරිතෝෂික ද හිමිවේ.

GRI 201-3

විශ්‍රාම ප්‍රතිලාභ: අපගේ සියලු සේවානියුක්තියන් වෙත රැකවරණය සැලසේ.

අපගේ සියලු ස්ථිර සේවකයන් සේවකයා විසින් දායකත්වය නොදක්වනු ලබන විශ්‍රාම සැලසුම් මගින් ආවරණය වන අතර පත්වීම් දිනය අනුව ඒවායේ කොන්දේසි හා වගන්ති එකිනෙකින් වෙනස්වේ. (1995 ඔක්තෝබර් 01 දින හෝ ඊට පසුව බැඳුනු සේවකයන් වෙනත් ආකාරයක විශ්‍රාම ක්‍රමයකට හිමිකම් කියයි)

අපගේ සේවානියුක්තිකයන් වෙත හිමිවන විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සතරකි. ඒ විශ්‍රාම අරමුදල (ක්‍රමය I හා ක්‍රමය II) සේවක දායකත්වය සහිත වැන්දඹු හා අනත්දරු අරමුදල (ක්‍රමය II සඳහා පමණි) සහ සේවක දායකත්වය සහිත වෛද්‍යාධාර ක්‍රමයවේ. විශ්‍රාම සැලසුම් වගකීම ගෙවීම සඳහා ස්ථාපිත කර තිබෙන අරමුදල පූර්ණ වශයෙන් රක්ෂණයකර තිබේ. අදාල නිශ්චිත විශ්‍රාම සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීම සඳහාවන පිරිවැය, ප්‍රක්ෂිප්ත ඒකක

සම්භාර ආයු ගණන තක්සේරු කරන ක්‍රමවේදය භාවිතයෙන් ගණනය කෙරෙන අතර 1995 ඔක්තෝබර් 01 වන දිනට පෙර බැංකුවට බඳවාගත් සේවකයන් තක්සේරු කරන ලද විශ්‍රාම අරමුදල (ක්‍රමය I) අයත්වේ. වසර තුල දී විශ්‍රාම අරමුදලට (ක්‍රමය I) වෙත දක්වන ලද දායකත්වය රු.මි. 392 ක් වූ අතර අරමුදල් නොයෙදූ වගකීම රු.මි. 2751 ක් ලෙස සටහන් විය.

1995 ඔක්තෝබර් 01 වන දින හෝ ඊට පසු බැංකු සේවයට බැඳුණු සේවා නියුක්තිකයන් විශ්‍රාම අරමුදලට (ක්‍රමය II) ඇතුලත් වේ. වසර තුල දී බැංකුව විසින් විශ්‍රාම අරමුදල (ක්‍රමය II) වෙත දක්වන ලද දායකත්වය රු.මි. 97.2 ක් වූඅතර, දළ වැටුපෙන් 12% ක් බැංකුව විසින් විශ්‍රාම අරමුදලට (ක්‍රමය II) ලබා දී තිබේ.

විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමය සහ වැන්දඹු හා අනත්දරු අරමුදල සේවක දායකත්වය සහිත ක්‍රමවේ. වර්ෂය අවසානයට බැංකුව වෛද්‍යාධාර ක්‍රමයට රු.මි. 96 කින් දායක වී තිබෙන අතර අරමුදලක් රහිත වගකීම රු.මි. 961 ක් ලෙස සටහන් විය. විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමය වෙත දැක්විය යුතු දායකත්වය වයස අනුව තීරණය කෙරේ. වැන්දඹු හා අනත්දරු අරමුදල සඳහා දායකත්වය තීරණය කෙරෙන්නේ සේවකයාගේ මූලික වැටුප අනුවය. අරමුදලේ සාමාජිකයන් සිය මූලික වැටුපෙන් 5% ක දායකත්වයක් ලබා දිය යුතුය.

සේවා නියුක්තිකයන්ගේ නියුක්තභාවය හා සුභසාධනය

සුභසාධන වැඩසටහන් මගින් සේවකයන්ගේ සුභසාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇතිකරන අතරම කණ්ඩායමක් ලෙස කාර්යයේ නියුක්තවීම සංසක්තික බව සහ සමස්ථ කාර්ය සාධනයේ සැලකියයුතු වර්ධනයක් ද ඇති කෙරේ.

එහි ඉතිහාසයේ ප්‍රථම වතාවට සියළුම ජාතික ඉතිරිකිරීමේ බැංකු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් 2017 පෙබරවාරි මාසයේ දී "එන්එස් බී කාර්යමණ්ඩල දිනය" පැවැත්විණි.

කාර්යමණ්ඩල සාමාජිකයන් අතර ආගමික සහජීවනය වර්ධනය කිරීම සඳහා සුභසාධක සංගමය විසින් වෙසක් භක්ති ගීත, අවුරුදු පොල සහ නත්තල් කැරොල් වැනි විවිධ බහු ආගමික වැඩසටහන් හා අවස්ථා වසර පුරාම සංවිධානය කරනු ලබයි. සෑම වසරකදීම කාර්යමණ්ඩල සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් අවුරුදු උත්සවයක් ද පැවැත්වේ. ප්‍රාදේශීය මට්ටමින් පැවති ක්‍රීඩා උත්සව වලින් අනතුරුව අවසාන ක්‍රීඩා උත්සවය නුවරදී පැවැත්විණි. සේවක මණ්ඩල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ක්‍රිකට්, පාපන්දු, වොලිබෝල් ආදී විවිධ ක්‍රීඩා කණ්ඩායම් ද බැංකුව සතු වේ. වසර මුළුල්ලේ සංවිධානය කෙරෙන විවිධ ආයතනික සමාජ සත්කාරක වැඩසටහන් සඳහා ද අපගේ සේවා නියුක්තිකයන් සිය දායකත්වය සපයයි. එමෙන්ම, බැංකුව සේවකයන් සඳහා පුස්තකාල පහසුකම් සපයන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකු ක්‍රීඩා සංගමය බැංකුවේ ප්‍රධාන කාර්යාලයීය පරිශ්‍රය තුල ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානයක් ගෙනයයි.

සේවක මණ්ඩලයේ දරුවන්ගේ අධ්‍යාපන (අ.පොෙ.ස. සා/පෙළ, අ.පොෙ.ස. උ/පෙළ හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය) හා ක්‍රීඩා හා විෂය බාහිර ක්ෂේත්‍ර වැනි අධ්‍යාපනික නොවන ජයග්‍රහණ අගය කිරීම සඳහා වාර්ෂිකව දූ දරු කුසලතා ඇගයීමේ උත්සව පැවැත්වේ. එසේම අපගේ සේවක මණ්ඩල සාමාජික සාමාජිකාවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි ප්‍රකට කරන ලද හිතෛෂීභාවය වෙනුවෙන් අපගේ කෘතඥතාවය පළ කිරීමේ අරමුණ පෙරදැරිව වසර 25 සහ වසර 35 ක අඛණ්ඩව සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් ඇගයීම උදෙසා වාර්ෂිකව ස්වර්ණ ප්‍රණාම සම්මාන උළෙල සංවිධානය කෙරේ. 2017 දී සේවා නියුක්තිකයන් 21 ක් සිය අඛණ්ඩ සේවා කාලය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වූ අතර ඉන් 15 දෙනෙක් වසර 35 ක සේවා කාලයක් සම්පූර්ණ කළ අය වෙති.

අපගේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ආපන ශාලාවෙන් සහන මිල ගණන් යටතේ සේවකයන්ට ආහාර සැපයෙන අතර ශාඛා හා අංශ මගින් සංවිධානය කරන එක් දින චාරිකා වෙනුවෙන් බැංකුව මූල්‍ය සහය සපයයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ හොඳ මෙන්ම නරක කාලවල දී ද ඔවුන් සමග අත්වැල් බැඳ ගැනීමට උත්සුක වේ. සේවකයෙකුගේ මරණයක දී යැපෙන්නන් වෙත මූල්‍ය සහය ලබා දීමට බැංකුව කටයුතු කරයි.

රාජකාරි හා ජීවිතය අතර තුලනය ප්‍රවර්ධනය කිරීම

අපගේ සේවා නියුක්තිකයන් හට සිය පෞද්ගලික ජීවිතයේ සියලු වැදගත් සාධක කෙරෙහි අවධානය යොමු කිරීමට හැකි වන පරිදි රාජකාරිය හා ජීවිතය අතර තුලනයක් ඇති කිරීම සඳහා අපගේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සූක්ෂම කළමනාකරණ ක්‍රමවේද උපයෝගී කරගනී. විදේශ සංචාර සඳහා අනුග්‍රාහකත්වය සැපයීම, ජනප්‍රිය සංචාරක ප්‍රදේශවල නවාතැන් පහසුකම් සැපයීම සඳහා සංචාරක බංගලා ස්ථාපිත කිරීම සහ මව් පදවිය ලබන අපගේ කාර්යමණ්ඩල සාමාජිකාවන් සඳහා දරු උපතේ සිට මාස 06 ක් ගතවන තුරු කිරි පැයක් ලබාදෙමින් නම්‍යශීලී රාජකාරි පිළිවෙලක් සකස් කරදීම වැනි අවස්ථා ඔස්සේ අපි අපගේ සේවක මණ්ඩලයට සිය පෞද්ගලික කටයුතු සඳහා සහාය වීමට උත්සුක වෙමු.

බැංකුව 2017 දෙසැම්බර් වන විට දිවයිනේ විවිධ ප්‍රදේශවල නිවාඩු නිකේතන 15 ක් ස්ථාපිත කර තිබිණ. අනුරාධපුර, නුවර, කතරගම, අම්බලන්තොට, නුවර එළිය, (බංගලා දෙකක් ඇත) මහියංගණය, ගාල්ල, බණ්ඩාරවෙල, බදුල්ල, දඹුල්ල, චාවාකච්චේරිය, බෙලිඅත්ත, මාරවිල ආදී ප්‍රදේශවල එම නිකේතන පිහිටා ඇත. මේ වසරේ දී දියතලාව ප්‍රදේශයේ නව සංචාරක බංගලාවක් විවෘත කෙරිණ. 2018 වසර තුල දී කතරගම නව සංචාරක බංගලාවක් විවෘත කිරීම ඔස්සේ අපගේ සංචාරක බංගලා ජාලය තව දුරටත් පුළුල් කිරීමට අපේක්ෂිතය.

දෙමව්පිය නිවාඩු

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ ආඥා පනත ප්‍රකාරව කාන්තා සේවා නියුක්තිකයන් මාතෘ නිවාඩු ලැබීම සඳහා හිමිකම් ලබයි. අපගේ කාර්යමණ්ඩල සාමාජිකාවන්ට කිසිදු බාධාවකින් තොරව ප්‍රසූත නිවාඩු හා ආශ්‍රිත වරප්‍රසාද ලබා දීමට අවස්ථාව සලසා දී තිබේ. එසේම ප්‍රසූත නිවාඩු අවසානයේ යලි සේවයට වාර්තා කිරීම සඳහා ද අවශ්‍ය පහසුකම් සැලසේ. අදාල කාර්යමණ්ඩල සාමාජිකයන්ට ද දින තුනක පීතෘ නිවාඩු හිමිවේ.

GRI 404-3

කාර්යසාධනය කළමනාකරණය කිරීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා වන සාධාරණ විනිවිදභාවයෙන් යුතු කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් අප සතුවේ. එය අඛණ්ඩ ක්‍රියාවලියකි. සෑම වසරකදී ම අපගේ සේවකයන් පූර්ව නිශ්චිත නිර්නායක පද්ධතියක් ආශ්‍රයෙන් ඇගයීමට ලක් කෙරේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කර තිබෙන්නේ සේවකයන්ගේ කාර්යසාධන අඩුලුහුඬුකම් සහ පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමේ අරමුණ පෙරදැරිවය. වැටුප් වර්ධක, උසස්වීම්, ප්‍රසාද දීමනා සහ පාරිශ්‍රමික සඳහා මෙම කාර්යා සාධන ඇගයීම් වල ප්‍රතිපෝෂණය උපයෝගි කර ගැනේ.

බැංකුව තුල කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ගොඩනැගීම අරමුණු කරගෙන ප්‍රධාන කාර්යසධන දර්ශක මත පදනම්ව පුලුල් කාර්යසාධන කළමනාකරණ සහ ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා බැංකුව මේ වන විට අවශ්‍ය පියවර ගැනීමෙහි නිරතව සිටී. එය ක්‍රියාත්මක කිරීමේ පළමු අදියර ලෙස එම ක්‍රමවේදය ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම වෙත හඳුන්වා දීමට නියමිතය. 2018 වර්ෂයේ සිට එම ක්‍රමවේදය බැංකුව තුල ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම පරමාර්ථ පෙරදැරි කරගෙන මෙම නව ක්‍රමවේදය පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව කාර්යමණ්ඩල සේවකයන් 378 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා තිබේ.

සේවකයන්ගේ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම

කළමනාකාරිත්වය විසින් සේවක අපේක්ෂා ඉටු නොකිරීම හේතුවෙන් දුක්ගැනවිලි පැනනගී. එවැනි දුක්ගැනවිලි නිසිකලට හා ඊට ප්‍රධාන වශයෙන් හේතු වූ සාධකයට හැකිතාක් සමීප ආකාරයකින් ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් හඳුනාගනු ලැබ තිබේ. බැංකුව මේ සම්බන්ධයෙන් ක්‍රමවේද දෙකක් උපයෝගී කරගනී. ඒ යම් දුක් ගැනවිල්ලක් ඉහළ මට්ටමේ සිට පහල මට්ටම දක්වා වන ව්‍යුහය ඔස්සේ විසඳාලන "පාදික ඉනිමඟ" ක්‍රමවේදය සහ මානව සම්පත් කමිටුව විසින් නම් කරන ලද ස්වාධීන පාර්ශ්වයක් විසින් දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් කටයුතු කෙරෙන "විවෘත ද්වාරය" ප්‍රතිපත්තියයි. සියලු දුක්ගැනවිලි සම්බන්ධයෙන් සාධාරණ හා අපක්ෂපාතී ආකාරයෙන් කටයුතු කෙරේ. සමාජයේ සියලු ජන කොටස් සඳහා වන බැංකුව ලෙස අපගේ ස්ථානය හඳුනා ගනිමින් බැංකුව සියලු කාර්යමණ්ඩල රැස්වීම් ඉංග්‍රිසි සිංහල හා දමිළ බසින් හැසිරවීම සිදුකරයි. සියලුම චක්‍රලේඛ හා ප්‍රචාරණ වැඩසටහන් ජාතික භාෂා තුනෙන්ම සිදු කෙරේ.

වංචා සහ නීති විරෝධී ක්‍රියා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය

වංචා සහ වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳව කටයුතු කිරීම සඳහා ක්‍රියාකාරී කාර්ය රාමුවක් නිර්මාණය කිරීම අරමුණු කරගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය ස්ථාපිත කර තිබේ. මෙවැනි ක්‍රියාකාරකම් වලක්වාලීම, හඳුනාගැනීම, වාර්තා කිරීම, නිරීක්ෂනය කිරීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම ඉන් ආවරණය කෙරේ. ගිණුම්කරණය, මූල්‍ය වාර්තාකරණය සහ අභ්‍යන්තර පාලනය ආශ්‍රිත අනිසි ක්‍රියා සම්බන්ධයෙන් සිය මතය ප්‍රකාශ කිරීමට බැංකුවේ සේවකයන්ට අවස්ථාව හිමිවේ.

වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව

අපගේ සේවකයන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කරගැනීම අපගේ වගකීමයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සෞඛ්‍ය මූලපිරීම්වලින් කොටසක් ලෙස සේවක සෞඛ්‍ය වර්ධනය උදෙසා දියත් කරන ලද වැඩසටහන් කිහිපයක්ම වේ. ප්‍රධාන පෙළේ පෞද්ගලික රෝහලක් මගින් පවත්වාගෙන යනු ලබන ගෘහස්ථ වෛද්‍ය මධ්‍යස්ථානයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත. මෙම වෛද්‍ය මධ්‍යස්ථානයේදී මසකට දෙවරක් විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදේශණය මගින් ප්‍රතිකාර ලබා ගත හැක. මීට අමතරව ප්‍රධාන පෙළේ පෞද්ගලික රෝහල් මගින් වරින් වර වෛද්‍ය සායනද පවත්වනු ලබයි.

තවද වෘත්තීය සම්පත් දායකයින් විසින් ආතති කළමනාකරණය, අක්ෂි ප්‍රතිකාර හා හෘදය ආශ්‍රිත රෝග නිවාරණය සම්බන්ධයෙන් විධිමත්ව පවත්වනු ලබන සම්මන්ත්‍රණවලට සහභාගීවීමේ අවස්ථාද අපගේ සේවක මණ්ඩලයට හිමිවේ. සේවක වෛද්‍යධාර යෝජනා ක්‍රමය යටතේ වෙන් කරනු ලබන ප්‍රමාණ තීරණය කරනු ලබන්නේ සාමූහික ගිවිසුම මගිනි. මීට අමතරව බරපතල රෝගාබාධ වලදී සේවකයන්ට අවශ්‍ය සහාය සපයන බරපතල රෝගාබාධ ආවරණයක්ද ක්‍රියාත්මක වේ.

සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමවලට අමතරව බැංකුවේ සියළුම ස්ථීර සේවකයන් බැංකුවේ වන්දි ප්‍රතිලාභ ක්‍රමය මගින්ද ආවරණය වන අතර ඒ යටතේ රාජකාරී අවස්ථාවලදී පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ආබාධිත තත්වයට පත් වන හෝ මරණයට පත් වන අවස්ථාවක් උදාවුවහොත් රුපියල් මිලියනයක උපරිමයට යටත්ව එකී සේවකයාගේ යැපෙන්නන් හට වන්දි හිමි වේ. 2017 වර්ෂය තුලදී වාර්තා වූයේ රැකියාවට සම්බන්ධ එක් අනතුරක් පමණි.

බැංකුව ආරක්ෂාකාරී රාජකාරී ස්ථානයක් බවට සහතික කරනු පිණිස අනුගමනය කළ යුතු ආරක්ෂාවට අදාළ ක්‍රියාමාර්ග කළමනාකරණය සඳහා දැඩි උපදෙස් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආරක්ෂක අංශය විසින් සෑම ශාඛාවක් සඳහාම පත්කර ඇති ආරක්ෂක නිලධාරීන් වෙත සපයනු ලබයි. මෙම උපදෙස් හදිසි අනතුරු සංඥා පද්ධති හා ආරක්ෂක කැමරා පද්ධති නඩත්තු කිරීමේ සිට ශාඛා කාර්ය මණ්ඩලය යම් හදිසි අවස්ථාවක් පාලනය කරන අයුරු පිළිබඳව දැනුවත් කිරීම දක්වා විවිධත්වයෙන් යුතුය. මේ අනුව, සුරක්ෂිත රාජකාරී ස්ථානයක් නිර්මාණය කිරීම පිණිස අවශ්‍ය පුළුල් ආරක්ෂක සැලසුමක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුවේ.

GRI102-41 GRI407-1

නිදහස් කිරීම හා සාමූහික කේවල් කිරීම

බැංකුව තුල ක්‍රියාත්මක වන වෘත්තීය සමිති අතරට ජාතික සේවක සංගමය, ලංකා බැංකු සේවක සංගමය, විධායක නිළධාරීන්ගේ සංගමය හා සමස්ත ලංකා බැංකු සේවක සංගමය ඇතුළත් වේ. ගෙවුණු වසර ගණනාව තුලදීම ජාතික ඉතිරිකිරීමේ බැංකු කළමනාකාරීත්වය හා වෘත්තීය සමිති අතර පැවති සම්බන්ධතාව ඉතා යහපත් වූවක් බව සතුටින් වාර්තා කළ යුතු වේ. අපගේ සේවකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එහි වෘත්තිය සමිති සමග සුහදශීලී රැස්වීම් පවත්වනු ලබයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ සාමූහික කේවල් කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය කේන්ද්‍රවී ඇත්තේ සේවක නියුතුවීම් දිරිගැන්වීම සම්බන්ධයෙනි. සියළුම ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයන් සාමූහික ගිවිසුමෙහි කොටස්කාරීත්වය දරයි. වර්ෂ තුනකට වරක් තීරණය කරනු ලබන සාමූහික ගිවිසුම් මගින් වේතන හා අනෙකුත් ප්‍රතිලාභ පිළිබඳ තීරණයකට එළඹෙයි. බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන එළදායී හා පාරදෘශ්‍ය ප්‍රතිපත්ති හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය තුල සාමූහික කේවල් කිරීම අතින් හෝ කාර්මික සම්බන්ධතා අතින් කිසිදු උල්ලංඝණයවීමක් දක්නට නොලැබිනි.

2017 වර්ෂයේදී මුහුණදුන් අභියෝග

ඕනෑම ආයතනයක මානව ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම වූ කලී අතිශය සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත්වීමේ ඉඩකඩ වැඩිය. එමෙන්ම මානව සම්පත් එළදායීව කළමනාකරණය කිරීම, වඩාත් සාංගමික, වඩාත් ඵලදයක හා වැඩිමනත් නියුතුවීමකින් හෙබි ආයතනයක් බිහිවීමට තුඩු දෙන බැව් පෙනී යයි. මානව ප්‍රාග්ධනයට අදාළව ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙම වර්ෂය පුරාවට විවිධවූ අභියෝග රැසකට මුහුණ දී තිබේ.

තාක්ෂණික නවෝකරණයට යොමුවීම හේතුවෙන් බැංකු ක්ෂේත්‍රය ඩිජිටල්කරණය වීම අප බැංකු ක්ෂේත්‍රය මුහුණපෑ එක් මූලිකම අභියෝගයකි. තාක්ෂණික නවෝකරණය අතින් සීමිත අත්දැකීම් සහිත මුහුකුරා ගිය ශ්‍රම බලකායක් සිටීම අප හට ගැටළුකාරී තත්වයක් නිර්මාණය කරන සුළුය. බැංකුවේ නව ඩිජිටල්කරණ පරිසරයට සරිලන ශ්‍රම බලකායක් සකසනු පිණිස පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අභියෝගයක් එල්ලවූ අතර වඩාත් උසස් තාක්ෂණික භාවිතයට පහසුකම් සලසන (Smart Zone) කලාපයක් සහිත ආදර්ශ බැංකුවක් සඳහා මුලපිරීම තුලින් බැංකුවට හා එහි සේවකයන්ට ඉදිරි අනාගතයේදී ඩිජිටල් පරිවර්ථනයට යොමුවීමට පෙර සූදානමක් සපයනු ඇත.

දිවයිනෙහි සහස්‍රයේ තරුණ පරම්පරාව අප බැංකුව වෙත ආකර්ෂණය කර ගැනීම සහ කළමනාකරණය කිරීම අප මුහුණ දුන් තවත් අභියෝගයකි. සහස්‍රයේ තාරුණ්‍යය ආකර්ෂණය කර ගත හැකි අලෙවිකරණ වැඩසටහන් දියත් කිරීම තුළින් තරුණ කොටස් අරමුණු කරගත් නිමැවුම් හඳුන්වා දෙන ලදී. නුදුරු අනාගතයේදී අපගේ මෙම මුලපිරීම්වල සාර්ථකත්වයේ ඵල නෙළා ගත හැකි වෙතැයි සිතමු. ලාභදායීතාවයට ඇති නොනවතින ඉල්ලුම හා

ක්ෂේත්‍රය තුළ වැඩිවෙමින් පවතින තරඟකාරිත්වය මත සිය ආදායම සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කිරීමට මූල්‍ය ආයතන වෙත දැඩි පීඩනයක් එල්ල වෙයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපි මෙම ප්‍රවණතා පිළිබඳව දැනුවත්ව සිටිමු. තිරසාර බවට අදාළ සියලුම ආකෘතීන් පිළිබිඹු කරන සුළු ආයතනයක් ගොඩනැගීම අප අරමුණයි.

තවත් අප මුහුණ දුන් අභියෝගයක් වුයේ නව ප්‍රධාන කාර්යසාධන දර්ශක පදනම් කරගත් ඇගයීම් ක්‍රමය හඳුන්වාදීමත් සමඟිනි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පවුල තුළ මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ මූලික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව මෙම ඇගයීම ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් ආරම්භ කිරීමට නියමිතය.

අනාගතයේ පැතිකඩක්

වැඩි වැඩියෙන් තාක්ෂණික නැඹුරුතාවයෙන් යුත් නවක ගනුදෙනුකාර පරපුරක අවශ්‍යතා පරිපූර්ණ කිරීමට අප ගන්නා ප්‍රයත්නයේදී එළඹෙන වර්ෂය තුළ අපගේ ප්‍රමුඛතා ලැයිස්තුවෙහි සඳහන් කරුණු අතර ඩිජිටල් මාධ්‍ය උපයෝගී කර ගනිමින් අඛණ්ඩව සේවකයන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම ඉහළින්ම සඳහන් වනු ඇත. සේවක අනුභූතින් හා නියුතුවීම් පෝෂණය කරමින් ද සේවකයින්හට සිය වෘත්තීයෙහි අයිතිය සතුකර ගැනීමට බලගන්වමින් ද වෘත්තීය සංවර්ධනය හරහා සෑම පුද්ගලයෙකුම සතු උපරිමය ඔවුන් වෙතින් ලබා ගැනීමට අපි කැප වන්නෙමු.

අප විසින් තබන ලද සලකුණ හද ගැස්මක් පාසා මිනිය හැකි වූවකි ...

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සුවිශේෂී වෘත්තාන්තය හතළිස් පස් වසක් පුරා දිගහැරෙන අතර අප සතු මූල්‍යමය උරුමය වසර 180 ක් ඉක්මවා දිව යන්නකි. අපගේ සුවිශේෂී හද ගැස්ම අප දේශය පුරා රැව් දුන් අයුරින්ම අපගේ කීර්තිමත් ඉතිහාසය පුරාවට අප විසින් දේශයේ හදගැස්ම ද හඳුනා ගනු ලැබිණි.



සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



මුළු ගිණුම් සංඛ්‍යාව **මිලියන 19.9**	ගනුදෙනුකරුවන්ට ගෙවූ පොළී මුදල **රු.මි. 78,445**	විකුණුම් ස්ථාන බැංකුකරණ ගනුදෙනුවල වටිනාකම **රු.මි. 10,513**
විකුණුම් ස්ථාන ගනුදෙනුකරුවන් වෙත ලබාදුන් ණය වටිනාකම **රු.මි. 10,513**	ආයතනික සමාජ වගකීම් උදෙසා සිදුකරන ලද ආයෝජන **රු.මි. 20**	දුරකථනය ඔස්සේ ලද විමසීම් සංඛ්‍යාව **225,950**
වෙබ් චැට් ඔස්සේ ලද විමසීම් සංඛ්‍යාව **43,895**	ස්ත්‍රී ගිණුම් සංඛ්‍යාව **767,656**	නිකුත් කරන ලද කාඩ්පත් සංඛ්‍යාව **234,500**
13 වන හපන් ශිෂ්‍යත්ව ප්‍රණාම වැඩසටහනේ දී ඇගයීමට ලක් කළ සිසුන් සංඛ්‍යාව **214**	ගංවතුර ආපදා සහන සඳහා වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික සමාජ මෙහෙවර යටතේ සහන ලැබූ පිරිස **පාසල් 50** **සිසුන් 5,000**	හපන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව **සම්මන්ත්‍රණ 144** **සිසුන් 72,000**

අපගේ ආරම්භයේ පටන් විශ්වාසය මත පදනම් වූ සමීප සබඳතා ගොඩ නැංවීම, වටිනාකම් බෙදා හදා ගැනීම, ප්‍රජාවට දායකවීම සහ පරිසරය රැක ගැනීම යනාදිය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආචාරවිධි පෝෂණය කළ හර පද්ධති විය. ප්‍රජාවන් ඇල්මැති කණ්ඩායම් සහ වෙනත් ජාල හා අප අතර ඇති සම්බන්ධතාව, සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනයට ඇතුළත්ය.

මෙකී ප්‍රාග්ධනය පවත්වා ගැනීමෙහිලා සහ වර්ධනය කර ගැනීමෙහිලා ප්‍රධාන ඇල්මැති පාර්ශව හා අන්තර් ක්‍රියාකාරිත්වය, ඔවුන්ගේ ගැටළු පිළිබඳ සැලකිලිමත්වීම සහ ඔවුන්ගේ විශ්වාසය දිනාගැනීම යනාදිය කේන්ද්‍රස්ථාන වෙයි. නියාමකයන්, රජය (අපගේ ප්‍රධානතම කොටස්කරු), ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ අනෙකුත් ආයතන හා අප අතර ඇති සම්බන්ධතාව එක හා සමාන ලෙස වැදගත් බව අපි හඳුනාගෙන සිටිමු. අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්, සමාජයේ විවිධ පැතිකඩ වෙත බලපෑම් එල්ල කරනු ලබයි. එහෙයින් අපගේ සම්බන්ධතා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරනු ලබන පිණිස අවශ්‍ය උපායමාර්ග හා පද්ධති අප විසින් ක්‍රියාවට නංවනු ලැබේ. අපගේ ව්‍යාපාරික තිරසාරභාවයේ සංකලිත කොටසක් වන හෙයින් අපි සමාජ යහපත හා ප්‍රජා බලගැන්වීම උදෙසා දායක වන්නෙමු.

නියාමන ප්‍රාග්ධනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අප අන් සියල්ලන්ටම ඉහළින් විනිවිදභාවය අගය කරනු ලබන අතර අවශ්‍ය පරිචයන් හා නියාමන අවශ්‍යතා සමග මුළුමනින්ම අනුකූලවීමට අපි කැප වන්නෙමු. රජයට අයත් බැංකුවක් වශයෙන් අප බැංකුකරණ පනත, මුදල් පනත, මූල්‍ය විශුද්ධිකරණ පනත, විනිමය පාලන පනත, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙනත් නියාමන මගින් දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව අනුගමනය කරනු ලබයි. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ විධාන වලට අනුකූල වෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සිය මෙහෙයුම්වලට අදාළ තොරතුරු කාලීනව වාර්තා කරනු ලබයි.

ඉහත කරුණු වලට අමතරව බැංකුව විසින් ඊට අදාළ අමාත්‍යාංශය වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සමග අඛණ්ඩ සංවාදයක් පවත්වා ගනියි. තවද මුදල් අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අධීක්ෂණ මණ්ඩලය සහ පාර්ලිමේන්තුව සමග බැංකුව කටයුතු කරනු ලබයි.

GRI 205-2, 3 **GRI 206-1**

අනුකූලතා සංස්කෘතිය

වර්තමාන ව්‍යාපාරික සන්දර්භය තුළ අනපේක්ෂිත අවදානම්වලට මුහුණදීමට ආයතනය සතු සූදානම මනින මිනුම්දණ්ඩක් බවට අනුකූලතාව පත් වී තිබේ. රාජ්‍ය බැංකුවක් වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ආදර්ශ ආයතනික පුරවැසියෙකු ලෙස තමා සතු කාර්යභාරය පිළිබඳව දැනුවත්ව සිටියි. අපගේ විනිවිදභාවය සහ යහපරිචයන් පිළිපැදීම යන සාධක, අනුකූලතා සංස්කෘතියක් ස්ථාපිත කිරීමට ඉවහල් වී ඇත. අනුකූලතා සංස්කෘතිය පිළිබඳ ආයතනයේ කළමනාකාරීත්වයේ පටන් පහළ සේවකයන් දක්වා කළමනාකරණ ධූරාවලිය

ඔස්සේ සන්නිවේදනය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් යහපාලනයේ උසස් ප්‍රමිතීන් ඒකාබද්ධ කිරීම තුළින් යහපරිචයන් හා අවැසි නියාමන අවශ්‍යතාවලට මුළුමනින් අනුකූලවීමට අපි කැප වන්නෙමු. අනුකූලතාවයෙහි ප්‍රමිතීන් හා පරිචයන් පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම, අනුකූලතා සංස්කෘතිය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වෙයි. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දූෂණ, ඒදිරි තරඟකාරී හැසිරීම, ඒකාධිකාරී පරිචයන් හා නිමැවුම් සහ සේවා භාවිතයට අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතු කොටගෙන දඩ මුදලකට හෝ මූල්‍ය නොවන සම්බාධකයකට යටත් නොවිණි.

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

අප ගනුදෙනුකරුවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රාණ නාලය බඳු වෙයි. අපගේ ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීම උදෙසා යොමු වුණු ගනුදෙනුකාර - කේන්ද්‍රීය උපාය මාර්ගයක් අප විසින් අනුගමනය කෙරෙයි. බැංකුකරණයේ නවතම ප්‍රවණතා අනුගමනය කිරීම, ගනුදෙනුකාර සේවා අපේක්ෂා ඉටු කරලීම, ගනුදෙනුකාර පහසුව සැලසීම සහ ගනුදෙනුකාර තෘප්තිමත්භාවය මැන බැලීම යනාදිය තුළින් උසස් ගුණාත්මක ගනුදෙනුකාර අත්දැකීමක් සැපයීම කෙරෙහි ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැප වී සිටියි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ගෙවුණු කාලපරිච්ඡේදය තුළ බහුවිධ මාධ්‍ය ප්‍රවේශයක් ඔස්සේ ගුණාත්මක ගනුදෙනුකාර අත්දැකීම් සමුදායක් නිර්මාණය කර ඇත. අපගේ පුළුල් එමෙන්ම ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කෙටගත් නිමැවුම් කළඹ ශ්‍රී ලාංකික සමාජයේ සියලුම කොටස් ආවරනය වන පරිදි නිර්මිතය.

පුළුල් ශාඛා ජාලය ඔස්සේ සහ ජංගම හා අන්තර්ජාල බැංකුකරණ හා වෙනත් ඩිජිටල් උපාංග ඔස්සේ සැපයෙන අපගේ ඉහළ ගුණාත්මක බවින් යුතු සේවාව මගින් ගනුදෙනුකරුවන් වඩාත් සරලව, අඛණ්ඩව හා සෘජුව බැංකුව සමගින් කටයුතු කිරීමට මග සලසයි.

සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා වූ බැංකුවක්

ජාතික ඉතිරිකිරීමේ බැංකුව වූ කලී සමාජයේ සියලුම කොටස් වලට සේවය සපයන ආයතනයකි. එය හුදු ආදර්ශ සාධකයක් නොව යථාර්ථයකි. අප රටෙහි බැංකුකරණ සේවා ලබා නොගන්නා සහ බැංකුකරණ සේවා අවම වශයෙන් භාවිත කරන පිරිස ඇතුළු සියළුම පුරවැසියන් හට සේවය කිරීම තුළින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි ජාතික මෙහෙවරට සත්‍ය වශයෙන්ම දායක වෙයි. බැංකුවේ තැන්පතු සංචිතය 12.2% ක සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කරමින් රු.බි.737.2 දක්වා වර්ධනය විය. එමෙන්ම බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹ 20.0% ක වර්ධනයක් සමගින් රු.බි.388 දක්වා වර්ධනය විණි. මෙකී කැපී පෙනෙන සංඛ්‍යාත්මක අගයන් මගින් ශ්‍රී ලංකාව තුළ ඉතිරිකිරීමේ සංස්කෘතියක් ස්ථාපිත කිරීමට අපගේ ඇති කැපවීම පෙන්වන අතර ගනුදෙනුකාර හා තැන්පතු සංචිතවල වර්ධනය මගින් විද්‍යමාන වන්නේ ගනුදෙනුකරුවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත තබන ලද විශ්වාසයයි.


ශ්‍රී ලංකාව තුළ ඇති ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් වශයෙන් අප විසින් අපගේ බොහෝ ගනුදෙනුකරුවන් සමග ඔවුන්ගේ ජීවිත පුරාවටම පාහේ දිවෙන ශක්තිමත් හා පරම්පරා ගණනක් යා වුණු සම්බන්ධතාවක් ගොඩනගා ගෙන සිටිමු. විවිධත්වයෙන් යුත් අවශ්‍යතා හා අරමුණු සහිතව විවිධ ජන කොටස්වලට සේවය කිරීමේදී අප විසින් පහත සඳහන් නිමැවුම් හා සේවා පිරිනමනු ලැබෙයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නිමැවුම් කළඹ

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නිමැවුම් හා සේවාවල සම්පූර්ණ ලැයිස්තුවක් අතිරේක තොරතුරු දැක්වෙන පරිච්ඡේදයෙහි පිටු අංක 372 හි දක්වා ඇත.

ගනුදෙනුකරුවන්ට ගෙවන ලද පොළිය


[රු. බිලියන]



වර්ෂය	2013	2014	2015	2016	2017
තැන්පතු මත ගෙවන ලද පොළිය	49,416	41,500	36,257	44,366	60,162

ණය කළඹ නිමැවුම් අනුව විශ්ලේෂණය කිරීම

[%]



බැංකුකරණය වඩාත් පහසුදායක කිරීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සිය ගනුදෙනුකරුවන්හට පහසුදායක, ප්‍රවේශ විය හැකි හා පහසු බැංකුකරණ පහසුකම් සැලසෙයි. කාලය ඉතිරි කරගත හැකිවීම හා ගිණුම කළමනාකරණය කිරීම, පහසු ණය පහසුකම් ලබා ගැනීම හෝ මූල්‍ය ගනුදෙනු පිළිබඳ වාර්තාවක් තබා ගැනීම යනාදී එක් එක් ගනුදෙනුකාර අවශ්‍යතාවලට සරිලන පරිදි අප ගනුදෙනුකාර සේවා සැලසුම් කර තිබේ. අපගේ 250 ඉක්ම වූ ශාඛා ජාලය, විකුණුම් ස්ථාන බැංකුකරණ සේවා ස්ථාන, අන්තර්ජාල හා එස් එම් එස් බැංකුකරණය සහ කාඩ්පත් භාවිත කිරීමේ විකල්ප මාලාවක් ඇතුළු පුළුල් සේවා සැපයුම් ව්‍යාප්තියක් අප සතුව පවතී.

විකුණුම් ස්ථාන බැංකුකරණය - NSB රීච්

බැංකුකරණ සේවා අවම වශයෙන් භාවිත කරන පිරිස් වෙත සිය අසමසම නිමැවුම් හා සේවා ගෙනයාම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විකුණුම් ස්ථාන බැංකුකරණය හඳුන්වා දෙන ලදී. බැංකුවේ ශාඛා 253 ක් ඔස්සේ අතින් ගෙන යා හැකි බැංකුවේ විකුණුම් ස්ථාන බැංකුකරණ යන්ත්‍ර 300 ක් ක්‍රියාත්මක අතර මිලියන 6.6 ක ගනුදෙනු ඔස්සේ රු.බි.10.5 ක සංචලනයක් මේ ඔස්සේ සිදු කෙරිණි. ගනුදෙනුකරුවන්ට බැංකු සේවා අවශ්‍ය කවර තැනකදි හෝ කවර වේලාවකදී හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවාවට වඩාත් පහසුම අයුරින් ප්‍රවේශවීමට පහසුකම් සලසමින් විකුණුම් ස්ථාන බැංකුකරණ යන්ත්‍ර රැගත් බැංකු නිලධාරීන් ඈත ගම් දනව්වල පවා ජනයා එක් රැස්වන ස්ථාන කරා ගමන් කරයි. ස්වයං රැකියා සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමේ අරමුණින් අපගේ විකුණුම් ස්ථාන බැංකුකරණ ගනුදෙනුකරුවන්ට NSB රීච් යටතේ ණය පහසුකම් සැලසීම දක්වා ඉදිරි පියවරක් අප තබා තිබේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2017 නොවැම්බර් මස අරඹන ලදුව මාසයක් වැනි කෙටි කාලසීමාවක් තුළ එලෙස බෙදා හරින ලද ණය සංඛ්‍යාව 44 ක් වන අතර ණය වටිනාකම රු.මි.13.5 කි. තවද අපගේ ගනුදෙනුකරුවන්ට විකුණුම් ස්ථාන බැංකුකරණ යන්ත්‍ර හරහා උපයෝගීතා බිල් ගෙවීමේ පහසුකම ද ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සලසන ලදී.

පළාත	ගනුදෙනු සංඛ්‍යාව	වටිනාකම රු.මි.
මධ්‍යම	677,690	1,080
නැගෙනහිර	610,455	781
උතුරුමැද	364,415	714
වයඹ	728,490	1,370
උතුර	890,316	1,011
සබරගමුව	528,034	765
දකුණ	753,998	1,061
ඌව	377,005	597
බස්නාහිර	1,727,826	3,133
සමස්ථ එකතුව	6,658,229	10,513



ඩිජිටල් බැංකුකරණය

ශාඛාවක් විසිත්ත කරමින් බැංකුකරණයේ යෙදීමට වඩා ඩිජිටල්කරණය ඔස්සේ ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුවන් හා ව්‍යාපාර වැඩි කැමැත්තක් දක්වන හෙයින් ඩිජිටල් බැංකුකරණයට ඇති ඉල්ලුම ඉහළ යයි. විවිධාංගීකරණය වූ ව්‍යාපාරික අංශ ඔස්සේ ගනුදෙනුකරුවන් හට වඩාත් ඵලදායී ඩිජිටල් නිමැවුම් හා සේවා සැපයීම පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්ෂේත්‍රය තුල ඩිජිටල්කරණය කෙරෙහි යොමුවී සිටියි. මෙමගින් ශාඛා කේන්ද්‍රීත ආකෘතියක සිට ගනුදෙනුකාර ආකෘතියක් දක්වා සිදුවන පෙරළියක් ඔස්සේ ගනුදෙනුකරුවන් හට සිය පෞද්ගලික අවශ්‍යතාව හා කැමැත්ත මත තමාටම තෝරා ගැනීම් සිදු කිරීමටත් ගනුදෙනුකරන මාධ්‍ය නොකඩවා වෙනස් කිරීමටත් අවස්ථාව උදාවේ. අපගේ අන්තර්ජාල හා එස් එම් එස් බැංකුකරණය ඔස්සේ වඩාත් වැඩි ප්‍රවේශයක් හා පහසුකමක් සැපයෙන අතර, සෑම වර්ෂයක් පාසාම එක්වන නව අයිතම මගින් අපගේ ඩිජිටල් නිමැවුම් කළඹ වඩාත් ශක්තිමත් කරයි. ශ්‍රී ලාංකිකයන් අතර වඩාත් යහපත් ඉතුරුම් සංස්කෘතියක් සඳහා දිරිදෙන සඵලදායී ඩිජිටල් නැමැවුම්වලට සාර්ථක නිදසුනකි. "එන්. එස්. බී. අයිසේවර්" අනාගත ගනුදෙනුකරුවන්හට සේවය කරනු පිණිස අපගේ ඩිජිටල් ශක්‍යතාවයන් ව්‍යාප්ත කිරීමට අදහස් කරමු.

කාඩ්පත් සේවා

ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් එහි ගනුදෙනුකරුවන්හට විකල්ප කාඩ්පත් මාලාවක් ඉදිරිපත් කෙරෙයි. එමෙන්ම 2017 වර්ෂයේ දී බැංකුව විසින් එහි හර කාඩ්පත් නිමැවුම් හා සේවා පද්ධතිය තවදුරටත් වැඩි දියුණු කළ අතර නිමැවුම් නම්‍යකරණය ඔස්සේ සිය ඩෙබිට් කාඩ්පත් ව්‍යාපාරයෙහි සීඝ්‍ර වර්ධනයක් ළඟා කර ගන්නා ලදී. අපගේ දීපව්‍යාප්ත ශාඛාහි ගිණුම් ඔස්සේ මෙයට පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ඔස්සේ අප ගනුදෙනුකරුවන්හට මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම සිදු කළ හැකිය. එකිනෙකට සම්බන්ධ ඉතිරිකිරීම් ගිණුම් ඔස්සේ කාඩ් හෝ වීසා ඩෙබිට් හරහා අප ගනුදෙනුකරුවන්හට සිය ගනුදෙනු සාර්ථක කර ගැනීමට ද හැකි වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එන්. එස්. බී. ඊසි කාඩ් හරහා පිරිනැමෙන වටිනාකම් තව දුරටත් පවත්වා ගැනීම ද වර්ධනය කිරීමට ද සමත් විය. අමතර ගාස්තු වන වාර්ෂික ගාස්තු, ප්‍රමාද ගාස්තු හා හිඟ මුදල් වලට අදාළ ගාස්තු වලින් තොරව බැංකුවේ ස්ථාවර තැන්පතු හිමියන්හට ණය පහසුකම් ලබා ගැනීමට "ඊසි කාඩ්" හරහා ඉඩකඩ සැලසේ.

ගනුදෙනුකාර අනුභූතීන් වැඩිදියුණු කිරීම සඳහා ගනුදෙනුකාර සේවා සැපයීම

විශිෂ්ට ගනුදෙනුකාර සේවාවක් සැපයීම මගින් ගනුදෙනුකාර අනුභූතීන් වැඩිදියුණු කිරීම කෙරෙහි ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැප වෙයි. විවිධ වාර්තා ඔස්සේ ගනුදෙනුකාර දුක්ගැනවිලි වෙනුවෙන් ක්‍රියාත්මකවීමට අප සූදානම්ය.

ගනුදෙනුකරුවන් හා බැංකුව අතර ද්විපාර්ශ්වික සන්නිවේදනයට ඉඩ පුළුල් කරනු පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකු ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබේ. මේ ආකාරයේ සෘජු සන්නිවේදනයක් මගින් වඩාත් වැඩි වටිනාකමක් ජනනය වී ඇති අතර එමගින් ගනුදෙනුකාර අත්දැකීම් ද වඩාත් උසස් තලයකට ගෙන එනු ලබයි. වඩාත් හොඳම ගනුදෙනුකාර සේවාවක් සලසනු පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථාන සතියේ දින 7 ම විසිහතර පැයේම විවෘත කර පවතී. ලැබෙන ඇමතුම් මුල් අවස්ථාවේදී නියෝජිතයන් විසින් හසුරුවනු ලබන අතර කිසියම් විසඳිය යුතු ගැටළුවේ නම්,ඒ සියල්ල ඉන් අනතුරුව අදාළ අංශ ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ. ගනුදෙනුකරුවන්හට යොමු අංකයක් ලබාදෙන අතර එමගින් කරනු ලබන පැමිණිලිවල වාර්තාවක් තබාගත හැකි වේ. ගනුදෙනුකාර පැමිණිලි හා ඒවා විසඳීමට ගනුලබන ක්‍රියාමාර්ග පිළිබඳ මාසිකව පිළියෙල කරනු ලබන වාර්තාවක් කළමනාකාරීත්වයට යොමු කෙරෙයි.

ශාඛා 253 කින් හෙබි අපගේ දීප ව්‍යාප්ත ජාලයේ මනාව පුහුණු වූ කාර්යමණ්ඩල සාමාජිකයන්හට සිය ගැටළු සෘජුවම ඉදිරිපත්කිරීමට ගනුදෙනුකරුවන්හට හැකිය. අදාල නිමැවුම් හා සේවා පිළිබඳ අවශ්‍ය ඕනෑම තොරතුරක් ලබා දීමට ඔවුන් පුහුණු කර ඇති අතර ඕනෑම පැමිණිල්ලක් නිසි ලෙස හැසිරවීමට ද ඔවුන් සමත්ය. අපගේ ගනුදෙනුකරුවන්ගේ පරිහරණය උදෙසා ගනුදෙනුකාර අදහස් ඉදිරිපත් කළ හැකි "යෝජනා පෙට්ටි" (Suggestion Box) ද ශාඛාවල පවත්වාගෙන යනු ලබයි.

නිමැවුම් විස්තර ණය අනුපාතික තැන්පතු අනුපාතික හා කළමනාකාරීත්වයේ දුරකථන අංක යනාදිය පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු රැගත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෙබ් අඩවිය මත www.nsb.lk හරහා ද ගනුදෙනුකරුවන්හට අප හා සම්බන්ධ විය හැකිය. එසේම ගනුදෙනුකරුවන්ට අපගේ අනෙකුත් ඩිජිටල් මාධ්‍ය විද්‍යුත් තැපෑල, ස්කයිප් හා වෙබ් චැට් ද භාවිතා කළ හැකිය.

	2017	2016
දුරකථන ඔස්සේ ලද විමසීම් සංඛ්‍යාව	**225,950**	200,045
වෙබ් අඩෙවි ඔස්සේ ලද විමසීම් සංඛ්‍යාව	**43,895**	40,009
ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව	**176**	184
විසඳන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව	**28**	26
කාඩ්පත් වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව (විකුණුම් ස්ථාන බැංකුකරණය)	**1,968**	1,673
කාඩ්පත් වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව (කාඩ්පත් පිළිබඳ විමසීම්)	**1,534**	1,608
ශ්‍රී ලංකා මහබැංකුව වෙත කළ පැමිණිලි සංඛ්‍යාව	**None**	None
මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත කළ පැමිණිලි සංඛ්‍යාව	**None**	None
ඇමතුමකට පිළිතුරුදීම සඳහා ගතකළ කාලය (සාමාන්‍යයක් ලෙස)	**<30 තත්පර**	< 30 තත්පර
විද්‍යුත් තැපෑල හරහා ලද විමසීම් සංඛ්‍යාව	**1,963**	1,968

GRI418-1

ගනුදෙනුකරුවන්ගේ රහස්‍යභාවය

අප සතු තොරතුරු වඩාත් උසස් ගනුදෙනුකාර සේවාවක් සැපයීම පිණිස අප හට උපකාරී වන අතර අපගේ ඉහළම ප්‍රමුඛතාව වන්නේ අප ගනුදෙනුකරුවන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම තුළින් දින ගන්නා අප ගනුදෙනුකාරභවතුන්ගේ විශ්වාසයයි. ඔබේ තොරතුරු ආරක්ෂා කර ගැනීම පිණිස අප විසින් නවතම තාක්ෂණයන්හි අයෝජනය කරනු ලබයි. එසේම පවතින ආරක්ෂක ක්‍රියාපටිපාටි තවදුරටත් වර්ධනය කරගනු පිණිස වන ක්‍රියාවලීන් හා අප කණ්ඩායමට පුහුණුව ලබාදීම ද සිදුවේ. තවද, ජාතික ඉතිරිකිරීමේ පනතේ අනිවාර්ය අංගයක් ලෙස "ගනුදෙනුකාර රහස්‍යභාවය" ඇතුළත්කොට තිබේ. 2017 වර්ෂය තුල ගණුදෙනුකාර රහස්‍යභාවය බිඳවැටීම හෝ ගනුදෙනුකාර දත්ත අස්ථානගතවීම් සම්බන්ධයෙන් පැමිණිලි වාර්තා නොවීය.

GRI417-2,3

නිමැවුම් හා සේවා වගකීම්

තැන්පතු හා ණය නිමැවුම් වලට අදාළ පොලී අනුපාතික ගාස්තු සහ මුදල් හුවමාරු අනුපාතික යනාදී අදාළ සියලුම තොරතුරු ශාඛාවල ප්‍රදර්ශනාත්මක තිර ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හා ආයතනික වෙබ් අඩෙවිය හරහා අප ගනුදෙනුකරුවන් හට පැහැදිලිව දක්වනු ලබයි.
ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවලට අනුකූලව පිළියෙල කළ ගනුදෙනුකාර ප්‍රඥප්තියට අනුව අප නිමැවුම් හා සේවාවලට අදාළ කොන්දේසි හා නියමයන් ගනුදෙනුකරුවන්හට නිසි ලෙස සන්නිවේදනය කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු නිමැවුම් හා සේවා නම්කරණය හෝ අලෙවිකරණ සන්නිවේදන මාර්ගෝපදේශයට අදාළ අනුකූලනොවීම් අවස්ථා කිසිවක් වාර්තා නොවීය.

GRI102-13

ක්ෂේත්‍රගත ජාල

අපගේ ව්‍යාපාරික සම කණ්ඩායම් හා ව්‍යාපාරික ජාලය සමග අඛණ්ඩව නියුතු කාර්යභාරය ඔස්සේ සමස්ථ ක්ෂේත්‍රගත ශක්තිමත් කිරීමේ ප්‍රධාන භූමිකාවක් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් වන අප විසින් ඉටු කරනු ලබයි. අප නොකඩවා ක්ෂේත්‍රයෙහි වැඩමුළු හා කාර්මික සංවාදයන්ට සහභාගීවීම තුළින් අප රටෙහි සමාජ හා ආර්ථික දියුණුව උදෙස දායක වන්නෙමු. පොදු ජනතාව හා ක්ෂේත්‍රයෙහි කොටස්කරුවන් හා නියුතුවන කාර්යභාරය හරහා පහත සඳහන් ආයතනවල සාමාජිකත්වය බැංකුව විසින් දරනු ලැබෙයි.

- ජාතික වාණිජ මණ්ඩලය
- සී/ස ලංකා ක්ලියර් සමාගම
- ලංකා සේව්‍ය සම්මේලනය
- ජගත් අන්තර් බැංකු මූල්‍ය විදුලි සංදේශ සංගමය
- ශ්‍රී ලංකා ස්විෆ්ට් පාරිභෝගික කණ්ඩායම
- යුරෝපී ගෝලීය ගෙවීම් ප්‍රජාව
- ලෝක ඉතිරිකිරීමේ බැංකු ආයතනය

2017 වර්ෂයේ පවත්වන ලද අලෙවිකරණ ව්‍යාපෘතිය

සෑම වර්ෂයක දීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් දිවයින පුරා භාවිත ගනුදෙනුකාර සේවා සැපයුම් ස්ථාන ආවරණය කරමින් පවත්වනු ලබන අලෙවිකරණ ව්‍යාපෘති පැවැත්වීම තුළින් ගනුදෙනුකාර තෘප්තිය හා සේවාවේ ව්‍යාප්තිය වර්ධනය කරනු ලබයි. අප ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන සහනවලින් අපගේ අලෙවි ව්‍යාපෘති සමන්විතය. පර්යේෂණ ඔස්සේ ගනුදෙනුකාර අවශ්‍යතා හඳුනා ගනු ලබන ජාතික ඉතිරිකිරීමේ බැංකු අලෙවිකරණ කණ්ඩායම ඒ අනතුරුව අලෙවිකරණ උපායමාර්ග සැලසුම් කරනු ලබයි. ඉන් අනතුරුව වර්ෂයතුල අලෙවිකරණය කළයුතු විශේෂ නිමැවුම් හා සේවා පිළිබඳ කණ්ඩායම විසින් තීරණය කරනු ලැබ උපායමාර්ග ක්‍රියාකාරකම් බවට පරිවර්තනය කෙරෙයි.

2017 වර්ෂයේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ගනුදෙනුකාර සේවා ව්‍යාප්තිය හා තෘප්තිමත්බව වැඩිදියුණු කරනු පිණිස විශේෂ අලෙවිකරණ මුලපිරීම් මාලාවක් දියත් කෙරිණි. 2017 වර්ෂය පුරා පැවති ජාතික ඉතිරිකිරීමේ බැංකු ප්‍රධාන අලෙවිකරණ හා ඩිජිටල් මාධ්‍ය අලෙවිකරණ වැඩසටහන් පහත දැක්වේ.

"එන්. එස්. බී. අයිසේවර්"

"එන්. එස්. බී. අයිසේවර්" හඳුන්වාදෙනු ලබන අවස්ථාවට සමගාමීව දිවයින පුරා අපගේ 253 ක් වූ ජාතික ඉතිරිකිරීමේ ශාඛාවල ඊට ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කෙරිනි.

"එන්. එස්. බී. යූ ට්‍රස්ට්"

දේශීය ආර්ථිකයට සිය දායකත්වය සපයනු ලබන ශ්‍රී ලාංකික සංක්‍රමණික ප්‍රජාව අතර අතිශයින් ජනප්‍රිය විදේශ විනිමය ප්‍රේෂණ සේවාවකි, "එන් එස් බී යූ ට්‍රස්ට්" මෙම සේවාව තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා හා වොල්ට්‍රාන්ස්, අල් රාජ් බැංකුව, මැදපෙරදිග විනිමය හුවමාරු ආයතන යනාදිය තුළින් ලැබෙන ප්‍රේෂණ ඉහළ නංවනු පිණිස දෙවන වරටත් "සල්ලි එහෙන්, තෑගි මෙහෙන්" කුසපත් ඇදීම අප විසින් දියත් කරන ලදී. මීට අදාළ ප්‍රචාරක වැඩසටහන්වලට ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය මෙන්ම වෙළඳ දැන්වීම් ද ඇතුලත් විය. ස්කූටර්, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, හෝම් තියටර් සිස්ටම්, ටැබ්, එල්. ඊ. ඩී. ටීවී, ජංගම දුරකථන හා පාපැදි ජයග්‍රාහයක් 60 දෙනෙකු අතරේ බෙදා දෙන ලදී.

"ස්ත්‍රී"

2017 ජනවාරි මස 19 වන දින කොළඹ පැවති උත්සවයක දී ජාතික ඉතිරිකිරීමේ බැංකු "ස්ත්‍රී" ඉතිරිකිරීමේ ගිණුම අපගේ කාන්තා පාරිභෝගිකයන්හට නව ශක්තියක් වෙමින් සාර්ථකව නව එකතුකළ අගයන් හා ප්‍රතිලාභ සමග යළි හඳුන්වා දෙන ලදී. මෙහිදී වැඩිවැඩියෙන් ඉතිරිකළ තැනැත්තියන් අතර තිළිණපත්, ජීවන පැවැත්ම පිළිබඳ කෘතීන් හා කුඩ බෙදා දුන් අතර "ස්ත්‍රී" ඉතිරිකිරීමේ ගිණුම ප්‍රවර්ධනය පිණිස දීප ව්‍යාප්ත ප්‍රවර්ධනාත්මක ව්‍යාපෘති සංවිධානය කෙරිනි.

හපන්

හපන් යනු වයස අවුරුදු 16 ට අඩු දරුවන් වෙනුවෙන් නියමිත ඉතිරිකිරීමේ නිමැවුමකි. තරඟකාරී වෙළඳපල හමුවේ හපන්, පුංචි හපන් හා තැපැල් හපන් යන ළමා ඉතිරිකිරීමේ ගිණුම් ප්‍රචලිත කිරීම පිණිස 2017 මැයි 15 වන දින සිට නව ත්‍යාග ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ අතරම පැන්සල් පෙට්ටි, කුඩ, වතුර බෝතල් හා වැහි ආවරණ ඇතුලත් විය.

ගනුදෙනුකරුවන් ඩිජිටල් බැංකුකරණයේ නියුතුකරවා ගැනීම

ක්ෂේත්‍රයතුළ හමුවන සීඝ්‍ර ඩිජිටල්කරණය හේතුකොට ගනිමින් අපගේ නිමැවුම් හා සන්නම් අප විසින් අලෙවිකරණ ආකාරය වෙනස්වී තිබේ. මේ වන විට යම් සන්නාමයක් සමාජ ජාල මාධ්‍ය ඔස්සේ ප්‍රචාරයක් සහිතවීම අත්‍යාවශ්‍ය කරුණකි. ඩිජිටල් අලෙවිකරණය යනු යම් සේවාවක් හෝ සන්නම් නාමයක් යොදා ගත හැකි සියලු ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ අලෙවිකරණයයි. පිරිවැය අතින් වාසි සහගත, ඉලක්කගත, මිනිය හැකි ඩිජිටල් අලෙවිකරණයෙහි වාසිදායක බව මෙන්ම ඔබේ පාරිභෝගිකයන් හා සම්බන්ධවීමටත් ඔවුන් එක් එක් සන්නම් වලට ප්‍රිය කරන්නන් බවට පරිවර්ථනය කර ගැනීමටත් උපකාරීවන වැදගත් සමාජ මාධ්‍ය මෙවලමක් බවට සමාජ මාධ්‍ය පත්වී ඇති බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව හඳුනාගෙන තිබේ. ඩිජිටල් බැංකුකරණය හරහා ගනුදෙනුකරුවන් වෙත බැංකු ක්‍රියාදාම පිළිබඳ මනා දැනුමක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සපයනු ලබයි. අපගේ වෙබ් අඩවියට අමතරව සියලු ආයතනික තොරතුරු හා ප්‍රවෘත්ති අප විසින් සමාජ මාධ්‍ය මගින් ගනුදෙනුකරුවන් වෙත සන්නිවේදනය කරනු ලබයි.

2017 වර්ෂයේ දී අප විසින් අපගේ ඩිජිටල් අලෙවිකරණ උපායමාර්ග නවමු මගකට යොමු කළ අතර අන්තර්ජාලය ඔස්සේ අපගේ සේවා ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාදාමයක් අරඹන ලදී. මෙහිදී "ෆේස්බුක් " "යූ-ටියුබ්" හා"ලින්ක්ඩ් ඉන්" යනාදී සමාජ මාධ්‍ය ජාලා හරහා 2017 වර්ෂයේ අගෝස්තු මස සිට අපගේ ප්‍රවර්ධන දියත් කෙරිනි.



www.facebook.com/
NSBSLOfficial



https://www.linkedin.com/
company/nsbslofficial/



www.nsb.lk



https://twitter.com/NSBSLOfficial



https://www.youtube.com/channel/
UCv5lA_fM2_L8fd9xObUlhuQ

GRI 102-9

ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය

අපගේ හවුල්කරුවන් සමග ගොඩනගන සබඳතාව, අප ව්‍යාපාරික කටයුතු මෙහෙයවනු ලබන ක්‍රියාවලියෙහි ප්‍රධානතම අංගයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව සලකනු ලබයි. ගෙවුනු කාලවකවානුව තුළ අපගේ ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ගෙවීම් පදනම මත සේවය සපයන පෞද්ගලික ආයතන, අනුරූප බැංකු හා අනෙකුත් සමග ශක්තිමත්, ඵලදායී හා දීර්ඝ කාලීන සබඳතා අප විසින් ගොඩනගා ඇත. රාජ්‍ය බැංකුවක් වශයෙන් ආදර්ශවත් ආයතනික පරිචයක් අනුගමනය කිරීමටත් පවත්වා ගැනීමටත් වගකීමක් අප සතු වේ. අපගේ දේශීය හා අන්තර්ජාතික ව්‍යාපාරික හවුල්කරුවන් හා කටයුතු කිරීමේදී විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්තියක් අප විසින් අනුගමනය කෙරෙයි.

බාහිර ආයතන වෙතින් සේවය ලබා ගැනීමේ ප්‍රතිපත්තිය

"බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරික මෙහෙයුම් ගෙවීම් පදනම මත පෞද්ගලික ආයතන වෙතින් ලබා ගැනීම" යන 2012 අංක 2 දරන බැංකු පනතේ විධානය ප්‍රකාර අපගේ මීට අදාළ ප්‍රතිපත්තිය සම්පාදනය කර ඇත. වෙනත් ආයතනවලින් ලබා ගැනීම වඩාත් වාසිදායක හෝ අවශ්‍ය යැයි බැංකුව විසින් සලකනු ලබන අවස්ථාවලදී බැංකුව විසින් මූලික නොවන මෙහෙයුම් ක්‍රියාකාරකම් අනුගමනය කරනු පිණිස මෙම ප්‍රතිපත්තිය සකස් කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ පැලනය ඇතුළු බැංකුවේ සේවා බාහිර ආයතන වෙතින් ලබා ගැනීමේ දී සැලකියයුතු කරුණු මෙම ප්‍රතිපත්තිය යටතේ සාකච්ඡායට බඳුන් කෙරෙයි.

සන්නිවේදන ප්‍රතිපත්ති

රජයට අයත් ප්‍රමුඛපෙළේ මූල්‍ය ආයතනයක් වශයෙන්, බැංකුවේ ආයතනික සන්නිවේදනයන්හි අත්‍යාවශ්‍ය ලක්ෂණ අතර කාලීනබව, නිරවද්‍යතාව, පරිපූර්ණබව හා සෑම අතින්ම බැංකුකරණ කටයුතුවලට අදාළබව යන කරුණු අඩංගුවිය යුතුය. බැංකුව විසින් සිදුකරනු ලබන සියලුම මාධ්‍යයන් සන්නිවේදනයන් හා ලිපි ගනුදෙනු වගකීමෙන් හා වගවීමෙන් යුතුව කළ යුතුය. ඉහත කී අරමුණු ඉටුකර ගැනීම පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අධ්‍යක්ෂ මණ්ඩල අනුමත සන්නිවේදන ප්‍රතිපත්තියක් පවතී.

GRI 204-1

ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

පිරිවැය ප්‍රශස්ථව කළමනාකරණය කරන අතරතුර මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාවට නැංවීමට පහසුකම් සලසනුවස් අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ හා සේවා පිළිබඳ වගබලාගැනීම, අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියෙහි සමස්ථ අරමුණ වේ. මේ උදෙසා ප්‍රමිතිගත හා කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අප විසින් ක්‍රියාත්මක කරනු ලබයි. තිරසාර බවේ ප්‍රතිපත්ති හා අනුකූලවන බවට සහතිකවීම පිණිස අප ගැනුම්කරුවන් දැඩි ප්‍රමිතීන්වලට අනුගත විය යුතු වේ. එහෙයින් බැහැර සේවා ලබා ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී සහ කොන්ත්‍රාත් කටයුතුවල දී විනිවිදභාවය සහතික කර ගැනීමට මෙම ප්‍රතිපත්තිය ඉවහල් වේ.

අපගේ ප්‍රසම්පාදන අත්පොත, රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අනුකූල වෙයි. මෙම ප්‍රසම්පාදන අත්පොත යටතේ විවිධ අධිකාරී බලතල ඇතුළු ප්‍රසම්පාදන කමිටු ත්‍රිත්වයක් ක්‍රියාත්මක වෙයි. මෙම ක්‍රියාවලියෙහි කොටසක් ලෙස බැංකුව විසින් එහි සියලුම නිමවුම් දේශීයව පදනම් වූ සැපයුම්කරුවන් වෙතින් ලබා ගන්නා ලදී. සෑම වර්ෂයකදීම වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කර ඒ අනුවප්‍රසම්පාදන සිදු කරනු ලබයි. ස්ථාවර වත්කම් මිලදී ගැනීම, පාරිභෝගික අයිතම, තොරතුරු තාක්ෂණය හා මෘදුකාංග යටිතල පහසුකම්, ත්‍යාග භාණ්ඩ, මුද්‍රණ කටයුතු, නඩත්තු හා ඉදිකිරීම් සේවා, හා විශේෂ අවස්ථා වල දී උපදේශන සහය යනාදී සේවාවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් බාහිර ආයතන වෙතින් සපයා ගනු ලබයි.

සබඳතා කළමනාකරණය

සමාලෝචිත වසර තුල දී බැංකුව විසින් සිය ව්‍යාපාරික හවුල්කරුවන් සමග පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා මුලපිරීම් කිහිපයක්ම ඇති කරගන්නා ලදී. 2017 දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව මේ අතින් ගත් මුලපිරීම් පහත පරිදි වේ.

- ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා ඔවුන් අතර පවතින සම්බන්ධතාය ශක්තිමත් කර ගනු පිණිස විදෙස් නියෝජිතායතන හා විනිමය හුවමාරු මධ්‍යස්ථාන විසිත්ත කිරීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගනුදෙනුකාර සංචිතයට වඩාත් උසස් ගුණාත්මක ගනුදෙනුකාර සේවයක් සැලසීම පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ව්‍යාපාරික සම්බන්ධතා නිලධාරීන් විදේශ විනිමය හුවමාරු මධ්‍යස්ථානවල කාර්යමණ්ඩලය හා එක්ව ක්‍රියාකිරීම
- ලොව පුරා ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල දී හා වෙනත් ආයතනවල දී පැවති සංස්කෘතිකාංගවල දී අලෙවිකරණ ව්‍යාපෘති කිහිපයක් දියත් කිරීම.
- ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු සැසි කිහිපයක් සංවිධානය කිරීම.
- නව වෙළඳපල ආකර්ෂණය කර ගැනීම සඳහා බඳවා ගැනීම් සිදු කරන ආයතන සමග සබඳතා පැවැත්වීම.
- පාරිභෝගික ව්‍යාපාර හා ව්‍යාපාරික අංශ මූල්‍යායතන සඳහා මෝටර්රිය තැරැව්කරුවන් සමග සබඳතා ගොඩනැගීම.

GRI413-1

ඉතිරිකිරීමේ බැංකුව සිය ප්‍රජාවතුල සැබෑ සලකුණක් තබයි.

රාජ්‍ය බැංකුවක් වශයෙන් ආදර්ශමත් ආයතනික පුරවැසියෙකු වීමේ වගකීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුය. එහෙයින් තිරසාර ව්‍යාපාර කටයුතුවල නිරතවීම තුළින් සමාජ වටිනාකම් නිර්මාණය කිරීමටත් ඒ මගින් අප සමාජය හා පරිසරය කෙරෙහි අප විසින් ඇති කෙරෙන බලපෑම පිළිබඳවත් අප දැනුවත් වෙමු. 1972 වර්ෂයේ දී අප ආයතනය ස්ථාපිත කළ තැන් පටන්, අප විසින් අප මෙහෙයුම් කටයුතු සිදු කරන ප්‍රජාව, පරිසරය, කාර්යමණ්ඩලය හා ගනුදෙනුකරුවන් සමග දීර්ඝකාලීන වටිනාකම් බෙදා හදා ගතිමු. අප සභාපතිතුමාගේ පණිවිඩයේ සඳහන් පරිදි අප උපායමාර්ගික දිශානතිය හා මෙහෙයුම්හි කේන්ද්‍රස්ථානය, තිරසාර බවයි. රාජ්‍ය ආයතනයක් ලෙසින් සෙසු ව්‍යාපාරික ප්‍රජාවට අප විසින් නිදසුනක් සැපයිය යුතු වන්නෙමු.

අපගේ ගනුදෙනුකරුවන්, සේවා නියුක්තිකයන්, ප්‍රජාවන්හි හා පරිසර පද්ධතියෙහි සුභසාධනය සම්බන්ධයෙන් හා අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් මගින් ඇතිකරලන සමාජීය හා පාරිසරික බලපෑම් සලකා බැලීම අප සතු බැඳීමක් ලෙස අප සලකන්නෙමු. සියලු සමාජ ආර්ථික පාරිසරික හා සමාජ සාධක අපගේ ව්‍යාපාරික ආකෘතිය හර ව්‍යාපාරික ක්‍රියාදාම හා තීරණ වලට ඒකාබද්ධව පවතී. අපගේ අවසන් ඉලක්කය වන්නේ සමාජ වටිනාකම් හා ආයතනික වටිනාකම් යන ද්විත්වයම නිර්මාණය කරලීමයි.

සෑම වර්ෂයේදීම ඉතිරිකිරීමේ බැංකුව විසින් ප්‍රජා සේවා හා සංවර්ධන ව්‍යාපෘති රාශියක් සංවිධානය කෙරෙයි. මීට අමතරව, සමාජ සුභසාධනය ඉහළ නංවන, ජාතික සෞඛ්‍ය සේවාව නගා සිටුවන, අධ්‍යාපනය නංවාලන සහ සෙසු සමාජ, සංස්කෘතික හා ආගමික අංශයේ විවිධ වැඩසටහන් ඇතුළත්ය. 2017 වර්ෂයතුල ක්‍රියාත්මක වූ එබඳු වැඩසටහන් පහත දැක්වේ.

GRI 203-1

ජාතීන්ගේ ශක්‍යතා ගොඩනැගීම පිළිබඳ අපගේ සංකල්පය

මධ්‍යම අධිවේගී මාර්ගය යනාදී විශාල පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය පිරිනමා තිබේ. ප්‍රවේශ හැකියාව හා ගමානාගමන පහසුකම් ඉහළ නැංවීම හා සංවර්ධන කටයුතු වර්ධනයවීම තුලින් බස්නාහිර පළාතතුල පමණක් කර්මාන්ත ව්‍යාප්තවීමේ ප්‍රවණතාව මෙමගින් අඩුවනු ඇත. තවද අධිවේගී මාර්ග ඉදිකිරීම තුලින් ආර්ථික වර්ධනය උදෙසා දිවයිනෙහි උතුරු හා මධ්‍යම පළාත් සතු විභවතාව වැඩිදියුණු වනු ඇත.

සමාජ සුභසාධනය අතින් අපගේ සලකුණ

කළුතර දිස්ත්‍රික්කය තුළ ගංවතුර සහන සැලසීම පිණිස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික සමාජ වගකීම් මෙහෙවර

ක්ෂණික ගංවතුර ගැලීම් වලට තුඩුදුන් අහිතකර කාලගුණ තත්ත්වයන්ගේ බලපෑමට කළුතර දිස්ත්‍රික්කය ලක් වූ බැවින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව අධ්‍යාපන අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා එකතුව අසරණ වූ පිරිස් උදෙසා ගංවතුර ආධාර මෙහෙයුමක් දියත් කරන ලදී.

50 කට අධික පාසැල් යළි ගොඩනැංවීම මගින් 5000 ක් ඉක්මවූ පාසැල් දරුවන්හට සෙත සැලසීම කෙරෙහි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික සමාජ මෙහෙවර යොමු විනි. මේ යටතේ ගංවතුර මගින් හානි පැමිනුණු පාසැල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය, පොත්පත් 24 ක් පැන් 8 ක් පැන්සල් 6 ක් මකන 3 ක් අඩිකෝදුවක් සහිත පාසැල් උපකරණ කට්ටල බෙදා දීම ද සිදුකෙරිනි.

එමෙන්ම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට හා සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින පාසැල් සිසුන් හට අධ්‍යාපන සම්මන්ත්‍රණ, බුලත්සිංහල, බදුරලිය හා මතුගම පළාත්වල පැවැත්වීම ද මෙම මෙහෙවර යටතේ ඉටු කෙරිනි. ඒ ඒ පළාත්වල පිහිටි ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා විසින් ආපදාවට ලක් වූ පැසැල් පිළිබඳ ලැයිස්තුවක් ලබාදුන් අතර ඔවුන්ගේ නිර්දේශයන් ද මෙම මෙහෙවර ක්‍රියාත්මක කිරීමට පෙර සලකා බලන ලදී.

ඒ අනුව, අදාල පළාත් අධ්‍යාපන කාර්යාලවල අනුමැතිය සහිතව අදාළ ආපදාවට ලක්වූ පාසැල් විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් කළයුතු විය.

බැංකුව විසින් රු.මි. 5 ක් සහ බැංකු කාර්යමණ්ඩලයේ දිනක වැටුප ලෙස රු.මි. 3.8 ක දායකත්වයකින් එක්රැස් වූ සමස්ථ දායකත්ව මුදල රු.මි. 9 ක් විය. ගංවතුර සහන වැඩසටහන උදෙසා වැය වූ සමස්ථ පිරිවැය රු.මි.4.2 ක් වූ අතර සෙසු රු.මි. 4.5 ක ශේෂය ඉදිරියේ දී පැන නැගිය හැකි ජාතික තලයේ ව්‍යාපෘතියක් උදෙසා ප්‍රයෝජනයට ගත හැකි පරිදි ආයතනික සමාජ වගකීම් අරමුදලෙහි තැන්පත් කොට ඇත.

2017 ජාත්‍යන්තර වැඩිහිටි දිනය

දුක්ඛිඩා හා අනාගතය ගැන සංකා වලින් තොරව සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගෙන යනු පිණිස වැඩිහිටියන්හට අවශ්‍ය සහනය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හඳුනාගනු ලැබ සිටියි. "අනාගතයට පියනැගීම" යන තේමාව යටතේ ජාත්‍යන්තර වැඩිහිටි දිනය 2017 ඔක්තෝබර් මස 1 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සමරනු ලැබිණි. සමාජ බලගැන්වීමේ හා සමාජ සුභසාධන අමාත්‍යාංශය සමගින් වැඩිහිටියන් සඳහා වූ ජාතික කාර්යාංශය මගින් මෙම උත්සව සංවිධානය කරනු ලැබූ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙහි ප්‍රධාන අනුග්‍රාහකත්වය දරන ලදී.

මෙම උත්සවයේ දී වයස අවුරුදු 100 ඉක්මවූ වැඩිහිටියන් මෙන්ම දරුවන් 14 දෙනෙකුට වඩා මෙලොව එළිය දැකීමට සැලැස් වූ වයස අවුරුදු 75 ඉක්මවූ කාන්තාවන් ඇගයීමට ලක් කෙරිනි. මෙම උත්සවය සඳහා බැංකුවේ අනුග්‍රහය රු. 600,000/- ක් වූ අතර ශත වර්ෂයක් ඉක්ම වූ වැඩිහිටියන් 235 දෙනෙකුට රු. 2,000/- ඉක්ම වූ තිළිණයන් පිරිනමන ලදී. සෑම කණ්ඩායමකම වැඩිහිටියන් දස දෙනෙකුට විශේෂ ත්‍යාග 10 ක් පිරිනැමුණු අතර පිරිනැමූ ත්‍යාගවල මුළු පිරිවැය රු. 490,000/- ක් විය.

මෙත්සරණ ශිෂ්‍යත්ව

මීතොටමුල්ල නාය යාම මගින් ආපදාවට ලක් වූ පාසැල් සිසුනට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී. නාගරික සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා "ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා" විසින් අනුග්‍රාහකත්වය දක්වන ලද මෙත්සරණ ශිෂ්‍යත්ව වැඩසටහන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2017 නොවැම්බර් 16 වන දින පැවැත්විනි. එහි දී රු. 25,000/- බැගින් වටිනා ශිෂ්‍යත්ව දරුදැරියන් 107 දෙනෙකු අතර ප්‍රදානය කෙරුණු අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දායකත්වය රු.මි. 1.2 කි.

මියගිය සහ ආබාධිත රණවිරුවන් වෙනුවෙන් වෙන්වුණු විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය

ආරක්ෂක අමාත්‍යාංශය හා රණවිරු සේවා අධිකාරිය විසින් මියගිය හා ආබාධිත රණවිරුවන් උදෙසා නිවාස 750 ක ව්‍යාපෘතියක් දියත් කරන ලදී. අලුතින් ඉදිකළ නිවාස 300 ක් සහ අර්ධ වශයෙන් ඉදිකළ නිවාස 450 ක මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව දායකත්වය රු.මි. 1.2 කි.

බොරැල්ල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් අතර ත්‍යාග පාර්සල් බෙදා හැරීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් කොළඹ වාසය කරන අඩු ආදායම්ලාභී පවුල්වල දූදරුවන් අතර ත්‍යාග පාර්සල් 3000 ක් බෙදා හරින ලදී. මෙම ත්‍යාග 1 ශ්‍රේණියේ හා ප්‍රාථමික සිසු දරුවන් අතර බෙදූ දුන් අතර ව්‍යාපෘතිය උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකු ආයෝජනය රු.මි. 2.1 කි.

අධ්‍යාපනය මත අපගේ සලකුණ

අඛණ්ඩව 13 වන වසරටත්ජාතික ඉතිරිකිරීමේ බැංකුව හපන් ශිෂ්‍යත්ව ප්‍රණාම වැඩසටහන සංවිධානය කරනු ලබයි.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ දී විශිෂ්ඨ දස්කම් පාන සිසුන් දිරිගැන්වීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් මෙම උත්සවය වාර්ෂිකව සංවිධානය කරනු ලබයි. මෙම ශිෂ්‍යත්ව ප්‍රධානෝත්සවය හපන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාවේ කූටප්‍රාප්තියයි. 13 වන හපන් ශිෂ්‍යත්ව ප්‍රණාම වැඩසටහන 2017 ඔක්තෝබර් 31 වන දින නෙළුම් පොකුණ ශාලාවේ දී පැවැත්විනි.

මෙහිදී ප්‍රණාම ලැබූ සිසුන් 214 අතරින් 13 දෙනෙකු ඉගෙනුම් ආබාධ සහිත දූදරුවන්ය. මේ අනුව ඉගෙනුම් ආබාධ සහිත දූ දරුවන්ගේ කැපවීම හා පරිශ්‍රමය ඇගයීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඉදිරිපත් වූ අතර ඒ සඳහා රු. 195,000/- ක් වැය වුනි.

17 වන වාර්ෂික හපන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව

දිවයිනෙහි ඉදිරි නියමුවන් හා ජාතික අධ්‍යාපනයට සහයොගය දක්වනු වස් ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුලපිරීමෙහි එක් අංගයක් වන්නේ හපන් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාවයි. 2017 දී දිවයින පුරා සම්මන්ත්‍රණ 144 ක් පැවැත්වූ අතර ඊට සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 72,000 කි. මේ සඳහා සිංහල මෙන්ම දමිළ මාධ්‍ය සිසුන් ද සහභාගි වූ අතර එකී සම්මන්ත්‍රණ ප්‍රසිද්ධ ගුරුවරුන් විසින් මෙහෙයවනු ලැබේ. 2001 වර්ෂයේ පටන් නොකඩවා දියත් කෙරුණු මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වර්ෂයේ ආයෝජනය රු.මි.3.4 කි.

නැණෝදා අධ්‍යාපනික සංවර්ධන වැඩසටහන

අධ්‍යාපන කලාප 15 ක් ආවරණය වන පරිදි හා මධ්‍යම පළාත් මහනුවර, මාතලේ හා නුවරඑළිය යන නගර ආවරණය වන පරිදි සමාන්‍ය පෙළ සිසුන් උදෙසා සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ මාලාවක් වූ මේ යටතේ පැවැත්වූ සමස්ත සම්මන්ත්‍රණ සංඛ්‍යාව 30 ක් ද ජාතික ඉතිරිකිරීමේ බැංකුව දායකත්වය රු.2,946,400/- ක් ද විය.

සෞඛ්‍ය සේවා මත අපගේ සලකුණ

"හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා"

වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයන් අතරින් මිලියන 2 කට අධික පිරිසක් වයස අවුරුදු 60 ඉක්මවූවන් වන අතර ඉන් 500,000 ක් පමණ දරිද්‍රතා සීමාවෙන් පහළ සිටියි. නිසි වෛද්‍යාධාර හා අක්ෂි පහසුකම් ඔවුන්ට ලැබෙනුයේ ඉතා සීමා සහිතව බැවින් "හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා" වෙතින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික පළාත්වල වෛද්‍ය පහසුකම් හිඟ වයෝවෘද්ධිකයන් සඳහා ජංගම වෛද්‍ය සායන සංවිධානය කරනු ලබයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් මෙහි තෝරාගත් වැඩසටහන් සඳහා අනුග්‍රාහකත්වය දරනු ලබයි. මේ යටතේ අක්ෂි පරීක්ෂණ, අක්ෂි කාච පරිත්‍යාග කිරීම, ඇස් කණ්නාඩි ප්‍රදානය කිරීම හා ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදු කරනු ලබයි.

අඩු වරප්‍රසාදලාභී වැඩිහිටියන්ට අවශ්‍ය වෛද්‍යාධාර සපයනු පිණිස නවතම වෛද්‍ය උපකරණ වෛද්‍යවරුන් හෙදියන් රැගත් බස් රියක් දිවයිනේ දුෂ්කර පළාත් වෙත ධාවනය කරනු ලබයි. මෙයට ඔසු සලක් ද නොමිලේ බෙදහරිනු ලබන ඇස් කණ්නාඩි රාශියක් ද අයත් වන අතර නොමිලේ පුද්ගලයින් 150 කට පමණ ප්‍රතිකාර කිරීමට හැකි වේ.

2017 වර්ෂයේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ජංගම වෛද්‍ය හා අක්ෂි කඳවුරු 9 ක් රු.මි. 1.8 ක ආයෝජනයකින් පවත්වා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 1500 කට සෙත සලසන ලදී. කළුතර තංගල්ල ගාල්ල ගල්ගමුව මීරිගම කුරුණෑගල කුලියාපිටිය හා හෙලමැද යන ප්‍රදේශයන්හි හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා වෙතින් අක්ෂි සායන පවත්වනු ලැබිණි.

ඔඩ්ඩුසුඩාන් හි පවත්වන ලද කොළඹ "ෆෙන්ඩ් ඉන් නීඩ්" සමාජයේ ජංගම වෛද්‍ය කඳවුර

ජාතික ඉතිරිකිරීමේ බැංකුවවිසින් "ෆෙන්ඩ් ඉන් නීඩ්" සමාජය හා ඒකාබද්ධව ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ජංගම වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී. මෙම කඳවුර මගින් 1500 කට අධික පිරිසක් සිය අක්ෂි ශ්‍රවනේන්ද්‍රිය පරීක්ෂාවක් ද දියවැඩියා පරීක්ෂාවක් ද සිදු කරගන්නා ලදී. එසේම අවශ්‍ය පුද්ගලයින් 20 දෙනෙකු සඳහා කෘතිම පාද සවි කරන ලදී. කඳවුර සඳහා බැංකුවේ දායකත්වය රු. 389,000 කි.

අනාගතයේ පැතිකඩක්

අපගේ සේවකයින් ගනුදෙනුකරුවන් සමාජය හා පරිසරය සහ වෙනත් ඇල්මැති පාර්ශව සමග අපගේ සබඳතා හරහා වටිනාකම් නිර්මානය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රියාත්මක වනු ලබයි. ඉදිරි වර්ෂවල දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය ගනුදෙනුකාර අනුභූතීන් වඩාත් ඔප් නැංවීමට බහුවිධ මාධ්‍ය ප්‍රවේශක් තව දුරටත් සැලසුම් කිරීම අපේක්ෂා කරයි. ඒ උදෙසා ප්‍රධාන කාර්යාලය සහ සමස්ථ ශාඛා ජාලය සම්බන්ධවන ගනුදෙනුකාර ප්‍රතිචාර කළමනාකරණ විසඳුම් පද්ධතියක් ඇමතුම් මධ්‍යස්ථානයේ දී ස්ථාපිත කරනු ලබනු ඇත. මේ මගින් ගනුදෙනුකාර දුක්ගැනවිලි වලට නිසි ප්‍රතිචාර දැක්වීම සහතික කරගත හැකිය. තවද ජාතික ඉතිරිකිරීමේ බැංකුව තව දුරටත් ඩිජිටල්කරණයට යොමුවනු ඇති අතර ඒ මගින් එහි ඩිජිටල් නිමැවුම් හා සේවා පිරිනමනු ඇත. එමෙන්ම, ජාතික ඉතිරිකිරීමේ බැංකු අලෙවිකරණ උපායමාර්ග ද නවීකරණය කෙරෙනු ඇත. අප ආයතනය වෙතින් දැනට පිරිනමනු ලබන පුළුල් නිමැවුම් මාලාව පිළිබඳ අප ගනුදෙනුකරුවන් දැනුවත් කරනු පිණිස අප අලෙවිකරණ කණ්ඩායම විසින් විවිධ මාධ්‍ය හා ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය භාවික කරනු ඇත. මේ යටතේ අප අලෙවිකරණ අංශය විසින් දියත් කරනු ලබන සියලුම නිමැවුම් හා සේවා ඇතුලත් නව අලෙවිකරණ සැලසුමක් මත තැන්පතු සංචලනය වර්ධනය කර ගැනීමට ද ගනුදෙනුකාර සංචිතව ඉහළ නැංවීම හා වඩාත් පුළුල් පාරිභෝගික පිරිසක් දිනා ගැනීම පිණිස අරමුණු කරගනු ලැබේ.

එහි මූලාරම්භයේ පටන්ම ජාතික ඉතිරිකිරීමේ බැංකුව දීප ව්‍යාප්ත වශයෙන් එහි සේවය ලබන ප්‍රජාවන්ගේ සංකලිත පාර්ශවයක් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සිය ආයතනික වගකීම් ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු පිණිස හා වහාම හැඩ ගස්වනු පිණිස ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ සහය අනුව ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්තියක් හා මාර්ගෝපදේශ සකස් කරනු ඇත. මෙබඳු ප්‍රතිපත්තියක් මගින් පෙරළා ප්‍රජාව වෙත තවත් සේවය කළ හැකි වනු ඇත. ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික අවශ්‍යතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනාගත ආර්ථික හා සාමාජ තිරසාරබව උදෙසා මෙහෙයවනු ලබන අතර දීර්ඝ කාලීන වටිනාකම් උත්පාදනය කිරීමෙහි ද තව දුරටත් නියැලෙනු ඇත.

වෘක්ෂයක් රෝපණය කරනුයේ හුදු තමා උදෙසා නොව මතු පරපුර උදෙසාය...

93 වන ජගත් සකසුරුවම් දිනය සමරනු පිණිස මුල පුරන ලද පාරිසරික සංරක්ෂණ උදෙසා වෙන්වුණු අපගේ ප්‍රමුඛතම ව්‍යාපෘතිය වන එන්. එස්. බී. කෘෂි වන වගා ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය වන විට පැළ මිලියනයක් බෙදා හරිනු ලබනු ඇත.



ස්වාභාවික ප්‍රාග්ධනය

භෞතික යෙදවුම් ද්‍රව්‍ය අවම ලෙස භාවිතා කරන සේවා මූලික කරගත් ආයතනයක් වශයෙන් බැංකුවේ මෙහෙයුම් කටයුතු මගින් උපද්‍රව ගෙනන සුළු අපද්‍රව්‍ය උත්පාදනය හෝ විමෝචන යනාදී අංශ වලින් පරිසරය කෙරෙහි සෘජු බලපෑමක් එල්ල නොවෙයි. කේසේ වුවද, වගකීම් සහගත රාජ්‍ය ආයතනයක් ලෙසින් අනාගත පරපුර උදෙසා ස්වාභාවික සම්පත් සහ පරිසරය සංරක්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ අප දැනුවත්ව සිටිමු.

ලිපිද්‍රව්‍ය, ස්ථාවර වත්කම් හා අලෙවිකරණ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය හැරණුවිට ප්‍රවාහනය කළ යුතු ද්‍රව්‍ය අප විසින් නිශ්පාදනය නොකරන අතර එම ද්‍රව්‍ය මගින් ඇතිකරලන පාරිසරික බලපෑම අවම මට්ටමක පවතී. අපගේ ව්‍යාපාරික පරිශ්‍රයන් ද ප්‍රවේසමෙන් තෝරා බේරා ගනිමින් ඒ මගින් පරිසරය මත ඇතිකරලන බලපෑම අවම කරලන පරිදි ඉදිකරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක මගින් මග පෙන්වන පරිදි ශ්‍රී ලංකා රජය විසින් තිරසාර මුලපිරීම් රැසක් ක්‍රියාවට නංවා ඇත. රාජ්‍ය ආයතනයක් ලෙස හා වගකිවයුතු ආයතනික සාමාජිකයෙකු ලෙස මෙකී මුලපිරීම් සඳහා අපගේ සහය පළ කිරීමට අප ප්‍රතිඥා දී ඇත. ජෛව පද්ධතිය මත ඇති කෙරෙන බලපෑම සම්බන්ධයෙන් අප සවිඥාණික අතර අනාගත පරපුර සඳහා ස්වාභාවික සම්පත් ද පරිසරය ද රැකගනු පිණිස අප විසින් බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි.

ඩිජිටල්කරණය වෙත යොමුවීම මගින් පරිසරයට උපකාරී වීම

පසුගිය වසර කිහිපය පුරාවට නවීන ඩිජිටල් නිමැවුම් ඉදිරිපත් කිරීම හා ඩිජිටල් පරිචයන් අනුගමනය කිරීම මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඩිජිටල් බැංකුකරණ සේවා ආයෝජනය කරන ලදී. ඩිජිටල්කරණය ඔස්සේ කඩදාසි භාවිත පද්ධති, ගබඩා කිරීමේ අවශ්‍යතා ස්වයංක්‍රීයවම ඉවත් වන අතර ශේෂ වන කාබනික පියසටහන් ද අවම කරලයි.

එන්. එස්. බී. අයිසේවර්

එන්. එස්. බී. අයිසේවර් හඳුන්වා දීමත් සමග එක් බොත්තමක් එබීමෙන් පමණක් මුදල් ඉතිරිකිරීමට කෙනෙකුට අවස්ථාව සැලසේ. මෙය කඩදාසි භාවිතය දුරලීමට ද අන් මාර්ගවලින් සම්පත් පාරිභෝජනය අඩු කරලීමට ද ඉවහල් වනු ඇත.

වෙනත් ඩිජිටල් මුලපිරීම්

කඩදාසි භාවිතයෙන් තොර ආයතනයක් බිහිකිරීම පිණිස පහත සඳහන් මුලපිරීම් හඳුන්වා දී ඇත.

- මුද්‍රිත ගිණුම් ප්‍රකාශ වෙනුවට විද්‍යුත් ලිපි මගින් ගිණුම් ප්‍රකාශ ලබා ගැනීමට අප ගනුදෙනු කරුවන් දිරි ගන්වන්නෙවමු
- අන්තර්ජාල, ජංගම සහ එස් එම් එස් බැංකුකරණය ප්‍රවර්ධනය මගින් සියලු බැංකුකරණ කටයුතු වලදී බලශක්තිය හා සම්පත් ඉතිරිකර ගැනීම
- අන්තර්ජාල හා සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ඩිජිටල් අලෙවිකරණය වර්ධනය කිරීමටත් පරිසරයට බලපෑම් එල්ල කරනු ලබන සෙසු අලෙවිකරණ මාධ්‍ය භාවිතය අඩු කිරීම

හරිත සංකල්ප බැංකුකරණ මුලපිරීම්

බලශක්ති සකසුරුවම් ගොඩනැගිලි

සෑම මෙහෙයුම් කටයුත්තකදීම බලශක්ති සකසුරුවම් වන මාර්ග කිහිපයක් තෝරා ගැනීමට බැංකුව යොමු වී ඇත. 2017 දී ශාඛා 5 ක සූර්ය පැනල සවි කරන ලද අතර මෙලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රමක්‍රමයෙන් පුනර්ජනනීය බලශක්ති භාවියට යොමු වෙමින් පවතී. ශාඛාවක් තුළ විද්‍යුත් උපකරණ ආරක්ෂා කර ගැනීම පිණිස සූර්යබලශක්ති පද්ධති සමග අකුණු වළකන ආධාරක සවි කරනු ලබයි. එමෙන්ම අප විසින් ප්‍රධාන කාර්යාලය තුළ භාවිත වන වායුසමීකරණ යන්ත්‍ර වඩාත් බලශක්ති සකසුරුවම් යන්ත්‍ර බවට පරිවර්තනය කර ඇත.

හරිත සංකල්ප ණය මුලපිරීම්

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදුලි හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් දියත් කරන ලද සූර්යබල සංග්‍රාමය නම් වන ප්‍රජාව පදනම් කරගත් විදුලි උත්පාදක ව්‍යාපෘතියකට දායකවීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය හා සී/ස ලංකා විදුලිබල සමාගම හා පාර්ශවකරුවෙකු වන ලදී. අවශ මූල්‍ය සහය ලබා දෙමින් පුනර්ජනනීය බලශක්තිය වෙත මාරුවීමට අවැසි ශ්‍රී ලාංකිකයන්හට තම ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එන් එස් බී "ඉකෝ ලොන්" හරහා උපකාරී වෙති. මෙම ව්‍යාපෘතිය මගින් විදුලි බිල ඉතිරිකර ගැනීමටත් එම ප්‍රතිලාභයට අමතරව ජාතික ධාරිතාවයට දායක වීමට අවස්ථා ගනුදෙනුකරුවන්හට හිමිවේ. ගනුදෙනුකරුවන්හට ශුද්ධ ගිණුම්කරණ ක්‍රමය හෝ "නෙට් ප්ලස්" ක්‍රමය යනාදිය අතරින් තමා කැමති විකල්පය තෝරාගත හැකිය.

GRI 302-1

බලශක්ති පරිභෝජනය

අප භාවිත කරනු ලබන මූලික බලශක්ති ප්‍රභවය විදුලිබලය වන අතර එය දැනට මුළුමනින්ම සපුරාලනු ලබන්නේ ජාතික විදුලි ජාලකය මගිනි. වර්ෂය සඳහා අපගේ විදුලි පරිභෝජනය ගිගාජූල් 27,614 ක් විය. අපගේ ශාඛා පරිශ්‍රයන්හි විදුලි සූර්ය පැනල සවි කිරීම තුළින් බලශක්ති පරිභෝජනය පහත දැමීමට අපේක්ෂිතය. තවද, එල් ඊ ඩී විදුලි බල්බ භාවිතය, භාවිත නොකරන අවස්ථාවල දී ඉලෙක්ට්‍රෝනික උපකරණ විසන්ධි කිරීම අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම මුද්‍රිත කඩදාසි භාවිතය යනාදී බලශක්ති පරිභෝජනය අඩු කරන හා ද්‍රව්‍යමය භාවිතය යුක්තිසහගත ලෙස අඩු කළ හැකි උපාය මාර්ගවල වැදගත්කම අවධාරණය කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරුවම බැංකුවේ කාර්යමණ්ඩලයට පවත්වනු ලබයි.

වෙනත් බලශක්ති ඉතුරුම් මුලපිරීම්

ශාඛා හා කාර්යාල ගොඩනැගිලිවල සිදුකෙරෙන අපගේ මෙහෙයුම් අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් පරිසරයට ඇති කරන සෘජු බලපෑම තීරණය වෙයි. අපද්‍රව්‍ය කළමනාකරණය, කාර්යක්ෂම බලශක්ති පරිභෝජනය සහ ජලය හා කඩදාසි ඇතුළු සම්පත් සංරක්ෂණය පිණිස අප විසින් ගෙන ඇති මුලපිරීම් පහත සැකෙවින් දක්වා ඇත.

- පුනර්ජනනීය නොවන බලශක්ති පරිභෝජනය අවම කිරීමේ හා සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම නිරතුරුව කාර්යමණ්ඩලය වෙත සන්නිවේදනය කිරීම
- ශාඛා ගොඩනැගිලි ඉදි කිරීමේ දී ස්වාභාවික පරිසරයට සිදුවන හානිය අවම කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව උපරිම උත්සාහයක් ගනු ලබයි.
- එල් ඊ ඩී තිර සහිත පරිගණක පමණක් භාවිත කිරීම
- ස්වාභාවික දිරාපත්වන ද්‍රව්‍ය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රචාරණයට යොදා ගනී
- නිවාස ණය ප්‍රදානය කිරීමට ප්‍රථම එම ඉදිකිරීම් සඳහා ප්‍රාදේශීය පළාත් ආයතන වෙතින් දෙනු ලබන නෛතික අවසරය ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පිරික්සනු ලබයි
- සාමාන්‍ය බැංකු ව්‍යාපාර හෝරා සඳහා පමණක් වායුසමීකරණ භාවිතය සීමා කිරීම
- සී එෆ් සී රහිත වායුසමීකරණ ඒකක පමණක් බැංකුව විසින් භාවිත කරනු ලබයි

ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුල පුරන කෘෂි වන වගාව : 2020 වන විට පැළ මිලියනයක්

අප සැවොම දන්නා පරිදි රුක් ලතා අපගේ දිවි පැවැත්මට අත්‍යාවශ්‍ය සාධකයකි. ඒ අනුව දැනට ශේෂව පවතින වනාන්තර සහ අප විසින් රෝපණය කරනු ලබන රුක්ලතා වල එකතුවෙන් අප වසන ලොව වඩාත් හිතකර භූමියක් වනු ඇත. පස සාරවත් හා ශක්තිමත් කරන තුරුලතා ගෝලීය උණුසුම අඩු කරමින් බලශක්තිය ඉතිරි කරදෙන, සෙවණ සිසිලස සලසන අතරම දහස් ගණනක් වූ ජෛව විශේෂිත වලට නිජබිමක් ද නිර්මාණය කරයි.

එමෙන්ම නාගරික ප්‍රදේශයනිහි ඕසෝන මට්ටම අඩු කිරීමට ද තුරුලතා දායක වෙයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කෘෂි වගාව පාරිසරික සංවර්ධනය උදෙසා වෙන්වුණු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමුඛතම ව්‍යාපෘතියවේ. මෙම ව්‍යාපෘතිය ඇරඹුනේ 93 වන ලෝක සකසුරුවම් දිනයේ දී වන අතර 2020 වන විට පැළ මිලියනයක් වගා කිරීම සඳහා බෙදා හැරීම එහි සැලසුමයි. පරිසරය රැකගන්නා අතරතුර නව ආදායම් මාර්ග නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරිව පොල් වගා කිරීමේ මණ්ඩලය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ "ධන සවිය" වැඩසටහන සමග ඒකාබද්ධව මෙම වැඩසටහන දියත් කරන ලදී. බැංකුව විසින් එහි දීප ව්‍යාප්ත

ශාඛා ජාලය හරහා ගම්මිරිස් පැළ හා පොල් පැළ 25,000 ක් බෙදා දෙන ලදී. මෙහි දී සෑම ශාඛාවක් වෙතම ගනුදෙනුකරුවන්හට බෙදා දීම සඳහා පැළ 100 ක් බැගින් ලබා දුන් අතර එම පැළ ලබා ගැනීම සඳහා සමාජ තත්ත්වය, ජීවන මට්ටම හෝ වයස් භේදයකින් තොරව පුරවැසියන් සක්‍රීයව ඉදිරිපත් වනු දක්නට ලැබිණි.

අභියෝග

- ලාභ උත්පාදනය සහ මූල්‍යමය නුඹුන්වත්බව අත්‍යවශ්‍ය සාධක වන ක්ෂේත්‍රයක බලශක්ති කාර්යක්ෂමතාව අතින් ඉහළ උපායමාර්ග හා පුනර්ජනනීය බලශක්තිය භාවිත පද්ධති ක්‍රියාත්මක කිරීමට වැයවන ඉහළ ප්‍රාග්ධන ආයෝජනයන් බැංකුවට මුහුණ දීමට සිදුවන අභියෝගයන්වේ.
- නිසි ලෙස කසල කළමනාකරණය ක්‍රියාත්මක කිරීමත් එහි ප්‍රථිඵල මිනීමේ ක්‍රමයත් වැඩි දියුණු කළ යුතු වේ.
- ඉවතලන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම
- නවක සේවකයන් බඳවාගනු ලබන හා නව ශාඛා ඉදිකරනු ලබන අඛණ්ඩව ව්‍යාප්ත වන ව්‍යාපාරයක් වශයෙන් බලශක්ති පරිභෝජනය අඩු කිරීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුහුණදුන් තවත් අභියෝගයකි

අනාගතය දෙස විපරමක්

පරිසරය සුරැකීමට අප කැපවන අතර අප විසින් ඉතිරි කරනු ලබන කාබන් පිය සටහන අවම කිරීම අප ආයතනයේ ප්‍රවේශයකි. පරිසරයට හිතකර ලෙස බලපානු ලබන විසඳුම් වන මාධ්‍ය බැංකුකරණ පද්ධතිය, දත්ත කළමනාකරණ පද්ධතිය හා ඩිජිටල් බැංකුකරණය උදෙසා ස්වයංක්‍රීය බැංකුකරණ සේවා ශක්තිමත් කිරීමෙහි අපි අඛණ්ඩව නියැළෙමු. තවද කඩදාසි භාවිතය අවම කරන අති නවීන ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර ස්ථාපිත කිරීමට අපි අපේක්ෂා කරමු. එමෙන්ම වඩාත් බලශක්තිය ඉතුරු කරන සුළු කාර්යක්ෂම කාර්යාල පරිශ්‍ර දියුණු කිරීම, "වෙබිනාර්" හරහා පුහුණුවීම් ලබා දීම හැකි සෑම අවස්ථාවක දීම විදුලි සංදේශ සේවය හා ටෙලි සම්මන්ත්‍රණ පහසුකම් යොදා ගැනීම අපගේ අපේක්ෂාවයි. 2018 වන විට සූර්ය ශක්තියෙන් මෙහෙයවනු ලබන ශාඛා සංඛ්‍යාව 50 දක්වා වැඩි කිරීමට ද ක්‍රියා කෙරෙයි. එසේම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක, අපගේ උපාය මාර්ග, ව්‍යාපාරික තීරණ හා මෙහෙයුම් හා අනුගත කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීමට අඛණ්ඩව සිදුවේ.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක මත බැංකුවේ සලකුණ


ගෝලීය අසමතුලිතතා, අනාරක්ෂිතතා හා අසාධාරණකම් ආමන්ත්‍රණය කිරීම පිණිස 2030 වන විට නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක නිර්මාණය කෙරිණි. තිරසාර නිෂ්පාදන සහ පරිභෝජනය සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණයට ප්‍රමුඛත්වය දෙන අතරතුර මෙකී ඉලක්ක වලට සංවර්ධනයේ, ආර්ථික, සමාජීය හා පාරිසරික පැතිකඩ ඇතුළත් වේ.

අපගේ සභාපතිතුමාගේ පණිවුඩයේ සඳහන් පරිදි ජාතික ඉතිරිකිරීමේ බැංකු උපාය මාර්ග, ව්‍යාපාරික මෙහෙයුම්, යටිතල පහසුකම් යනාදිය තිරසාර බව යන සාධකය සමග ඇදී තිබේ. තිරසාර, අවම කාබන් පියසටහන් සහිත හා මූල්‍ය අන්තර්ග්‍රහණය සපිරි අනාගතයක් වෙත පිය නගන ගමනේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍රයෙහි භූමිකාව මැනවින් වටහාගෙන සිටියි. එහෙයින් ගෝලීය තිරසාර අරමුණු පැහැදිලිව හා පරිපූර්ණව සන්නිවේදනය කරනු ලබන ගෝලීය රාමුවක් අප බැංකුව පිළිගැනීමට රිසි අතර එය සාක්ෂාත් කර ගැනීම පිණිස දැනටමත් කටයුතු කරමින් සිටිමු.


අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සියල්ලම තිරසාරබව යන සංකල්පය හා ඒකාබද්ධ කිරීමෙහිලා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රියා කරනු ලබයි. හිතකර, ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑමක් ඇතිකරලීමට සමත් ශක්‍යතා සපිරි අවස්ථාවන් හඳුනා ගැනීමට හා ග්‍රහණය කර ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු කර තිබේ. ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශ වෙත ඇතිකරන සුභවාදී බලපෑම උපරිම තලයකට ගෙන එනු පිණිස තිරසාර සංවර්ධනය පිළිබඳ අපගේ දැඩි ප්‍රසාදයට සමාන අදහස් දරන පුද්ගලයන්, ආයතන හා ප්‍රජා සමග අපි හවුල්කරුවන් වන්නෙමු. 2030 වර්ෂය වන විට එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට දායක වන අවස්ථා හඳුනා ගැනීම අප නිබඳව සිදු කරමු.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ දායකත්වය පහත සඳහන් රූ සටහන් මගින් සංක්ෂිප්තව දක්වයි. අපගේ ව්‍යාපෘති හා වැඩසටහන් විවිධාකාර තිරසාර සංවර්ධන ඉලක්ක වලට ගැලපෙන හෙයින් වඩාත් පරිපූර්ණ අදහසක් ඉදිරිපත් කළ හැකි වන පරිදි අදාල තිරසර සංවර්ධන ඉලක්ක අප විසින් අදාළත්වය පරිදි ගොනු කරනු ලැබිණි.







විශාලතම බලපතුලාභී විශේෂිත බැංකුව වශයෙන් අපි සියළුම ශ්‍රී ලාංකිකයන් තුල ඉතුරුම් සංස්කෘතියක හැඩ ගැස්වීම සිදු කරනු ලබන අතර මූල්‍ය අන්තර්ග්‍රහණය උදෙසා ක්‍රියා කරන්නෙමු. නව රැකියා උත්පාදනය, ප්‍රජා සේවා හා සංවර්ධන ව්‍යාපෘති උත්පාදනය, මූල්‍ය උපකාර සඳහා ප්‍රවේශ සැපයීම තුලින් අප ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම, ග්‍රාමීය රැකියා අවස්ථා උත්පාදනය අපගේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුලින් ඔවුන්ගේ ආදායම් පරිමාව ඉහළ නැංවීමෙන් වක්‍ර රැකියා උත්පාදනය යනාදිය මගින් මෙකී ඉලක්ක වලට ළඟා වීමට නැත් කරමු. වර්ෂය තුල පහත ව්‍යාපෘතිවලට මූල පුරන ලදී.




රැකියා ස්ථානයේ සෞඛ්‍ය සේවා සඳහා ආයෝජන කිරීමෙන් හා විවිධ ප්‍රජා සේවා ව්‍යාපෘති හරහා යහපත් සෞඛ්‍ය හා සුභසිද්ධිය නගා සිටුවීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව ක්‍රියා කරයි. අපගේ සේවකයින්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට පුළුල් වෛද්‍යාධාර ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් යටතේ සෞඛ්‍ය සේවා ප්‍රතිලාභ හිමි වන අතර අපගේ වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්තිය සුරක්ෂිත රාජකාරී පරිසරයකට දායක වෙයි. අප විසින් රැකියා හා ජීවන තුලිතතාව ප්‍රවර්ධනය කෙරෙන අතර සේවක සුභසිද්ධිය ඉහළ නැංවීමට සහය හා ප්‍රතිලාභ පිරිනමනු ලබයි. එමෙන්ම වෙනස් වූ ඉගෙනුම් අවශ්‍යතා ඇති දරුවන් හා වැඩිහිටියන්ගේ සෞඛ්‍ය හා සුභසාධනය සහතික කරනු පිණිස මානුෂික ප්‍රවේශයක් රැගත් වැඩසටහනකට අපගේ අනුග්‍රහය සකසා ඇත. අප විසින් ශ්‍රී ලංකාවේ කීර්තිමත් ආයතන හා පාර්ශවකරුවන් විවිධ සෞඛ්‍ය කඳවුරු වලට අනුග්‍රාහකත්වය සපයා ඇත. අදාල තිරසාර සංවර්ධන ඉලක්ක අරමුණු කරගනිමින් පහත ව්‍යාපෘති පවත්වා ඇත.




සියළු ශ්‍රී ලාංකිකයන්හට සාක්ෂරතාවය හා අධ්‍යාපනය ලැබීමට ඇති සෑම අවස්ථා දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය මුලපිරීම් මගින් අධ්‍යාපනය ඔසවා තැබීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැපවී සිටියි. අප සතු විශේෂිත භූමිකාව හරහා මූල්‍යමය සාක්ෂරතාව දියුණු කිරීමටත් ඉතිරිකිරීමේ අගය සහ මුදල් කළමනාකරණය කිරීමේ අගය පිළිබඳ සියළුම ශ්‍රී ලාංකිකයන් දැනුවත් කිරීමට ද කැප වෙමු. අපගේ පුළුල් ශාඛා ජාලය හා සම්බන්ධ සේවක සාමාජිකයන් හරහා මූල්‍ය කළමනාකරණ විශේෂඥතා අප ගනුදෙනුකරුවන් හා බෙදා ගනු ලැබෙයි. තවද ශ්‍රී ලාංකිකයන්හට සිය අධ්‍යාපනය සැලසුම් කර ගැනීමට හා ඊට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස උපකාරී වෙමින් අපගේ නිමැවුම් කළඹ, ඉතුරුම් හා ණය නිමැවුම් භාවිතය හා ඒ සඳහා ඇති ප්‍රවේශය ව්‍යාප්ත කරලයි. එමෙන්ම අප විසින් වාර්ෂිකව අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම ද හොඳම කාර්ය සාධනයක් පෙන්නුම් කරන්නන් ඇගයීම ද සිදු කෙරෙයි. ඒ අතරම දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් මගින් අපගේ සේවකයින්ගේ වෘත්තීය සුදුසුකම් ඔප් නැංවීම සඳහා නිති ආයෝජනය කරන්නෙමු. ගුණාත්මක අධ්‍යාපනයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක අනුව 2017 වර්ෂයේ දී මෙහි සඳහන් වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මාන උළෙල යනාදිය පැවැත්වීනි.



කාන්තාවන් බල ගැන්වීම තුලින් අනාගත පරපුර බලගැන්විය හැකි බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්වාසයයි. අපගේ සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනයෙහි සඳහන් කර ඇති අයුරින් අපගේ සේවක සංයුතිය තුළ සිටින කාන්තාවන් බලගැන්වීම මගින් සහ විශේෂිත නිමැවුම් හරහා කාන්තාවන් බලගැන්වීමෙහිලා අප විසින් පරිපූර්ණ ප්‍රවේශයකට මුලපුරා ඇත. සම අවස්ථා සපයන සේවා දායකයෙකු වන අප ආයතනය ස්ත්‍රී පුරුෂබව අනුව වෙනස්කොට සැලකීමක් සිදු නොකරනු ලබයි. නායකත්වය ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට කාන්තා සහභාගිත්වය නිම්වන බවට අප සහතික කරගනු ලබයි. මාතෘ හා පීතෘ නිවාඩු මෙන්ම නවක මව්වරුන් සම්බන්ධයෙන් අපගේ ප්‍රතිපත්ති කාන්තා සේවා නියුක්තිකයන්ට පහසුකම් සලසනු ලබයි. එමෙන්ම සියළු ස්ථර වල 6:5 මනා ස්ත්‍රී පුරුෂ අනුපාතයක් සහිත අප ආයතනයේ සමස්ත ශ්‍රම බලකායෙන් 58% ක් සපිරී ඇත්තේ කාන්තාවන්ගෙන් බව ද කිව මනාය. එමෙන්ම කාන්තා වෙළඳපල ද සුවිශේෂී වටිනාකම් ප්‍රස්තුත ලෙස සලකන අප සෑම සමත් තලයකම සිටින ශ්‍රී ලංකික කාන්තාව විවිධාකාර වූ මූල්‍ය වාතාවරණයන්ට මුහුණ දීමේදී මූල්‍යමය නිදහස අත්විඳීමත් බලගැන්වීම පිණිස "ස්ත්‍රී" ඉතිරිකිරීමේ ගිණුම වැනි කාන්තාව වෙනුවෙන්ම සැලසුම් කරන ලද නිමැවුම් ඉදිරිපත් කරන්නෙමු.



දේශීය මූල්‍ය ආයතනවල ධාරිතාව ශක්තිමත් කිරීම මගින් අප විසින් සමාජයේ සියලුම ස්ථරවල සිටින ශ්‍රී ලාංකිකයන්ට සහ දේශයට සේවය සැලසීමට අපට හැකි විය. 253 ක් වූ දීප ව්‍යාප්ත ශාඛා ජාලය, 4000 ඉක්මවූ තැපැල් කාර්යාල හා විකුණුම් ස්ථාන බැංකුකරණය (POS) හරහා දිවයිනෙහි බැංකුකරණයේ නොයෙදෙන හා ඉතා සීමිත ලෙස බැංකු සේවා ලබා ගන්නා පිරිස් වෙත බැංකු හා මූල්‍ය සේවා වෙත පිවිසීමේ අවස්ථාව අප පුළුල් කර තිබේ. එමෙන්ම අප විසින් සෘජුවම රැකියා අවස්ථා සැපයෙන් අතර අපගේ මූල්‍යමය ව්‍යාපෘති හරහා වක්‍රව රැකියා උත්පාදනය සිදුවේ. රජය සමග පාර්ශ්වකරුවෙකු වීම හරහා දිවයිනෙහි ප්‍රමුඛ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇත.



අපගේ සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩයේ සඳහන් පරිදි ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සමාජයීය, ආර්ථික හා ජෛවීය අංශවල ඇති සලකුණු ඇගයීමට ලක් කෙරෙන අතර අපගේ මෙහෙයුම් ආශ්‍රිතව සමාජය හා පරිසරය කෙරෙහි එල්ල වන අහිතකර බලපෑම අවම කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. දේශගුණ විපර්යාස සහ තිරසර ප්‍රජා නිර්මාණය කිරීමට අපගේ කැපවීමට සාක්ෂි සපයමින් විවිධ වැඩසටහන් සඳහා අප මුල පුරා ඇත. හරිත සංකල්පය බැංකුකරණය තුලින් මෙම දීප ව්‍යාප්ත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වලට ලබාදෙන සහයෝගය තුළින් පිරිමැසුම්දායී බලශක්ති යෙදවුම් ප්‍රවර්ධනයට අපි දායක වෙමු. අප භාවිත කරන බලශක්ති මිශ්‍රණයෙහි පුනර්ජනනීය බලශක්ති කොටස සැලකිය යුතු ලෙස වර්ධනය කරන ලදී. එමෙන්ම වගකීම් සහගත පාරිභෝජන පරිචයක් තුළින් බලශක්ති භාවිත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ද කටයුතු කරමු. ඩිජිටල් යටිතල පහසුකම් හා ඩිජිටල් නිමැවුම් හඳුන්වාදීමට ගන්නා ආයෝජන තුලින් කඩදාසි රහිත අඩු කාබන් ප්‍රතිදානයකට මග පාදයි. මෙම ක්ෂේත්‍රයේ ඩිජිටල් කරණය තිරසාර නගර හා ප්‍රජා නිර්මාණය සඳහා අවශ්‍ය නව්‍යකරණය ද මෙහෙයවනු ලබනු ඇත.



NSB කෘෂි වන වගාව : ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් දිවයින පුරා ගම්මිරිස් පැළ හා පොල් පැළ 25,000 ක් බෙදා දෙන ලදී

භෞතික වශයෙන් යොදාගනු ලබන ද්‍රව්‍ය අවම ලෙස උපයෝගී වන සේවා සැපයුම් ආයතනයක් වශයෙන් අපද්‍රව්‍ය ජනනය හෝ විමෝචන අතින් පරිසරයට ඇති කෙරෙන බලපෑම අවම මට්ටමක පවතින බව අපි දනිමු. එනමුදු ගොඩබිම මත සහ දිය යට ජීවීන් සංරක්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව අපි සවිඥාණික වෙමු. ඒ අනුව ෑඛ ණය සහ හරිත සංකල්ප බැංකුකරණ මූලපිරීම් යනාදී අපගේ නවීන මූල්‍ය උපකරණ පාරිසරික සංරක්ෂණයට දායකත්වය සපයයි. එමෙන්ම නව ගොඩනැගිලි ඉදිකිරීමේදී පරිසරය කෙරෙහි එල්ල වන බලපෑම අවම කිරීමට ද අපි වගබලා ගනිමු. තවද 2017 දී ප්‍රජා මූලික රුක් රෝපණ ව්‍යාපෘතියකට අප විසින් මුල පුරන ලදී. එමගින් 2020 වර්ෂය වන විට පැළ මිලියනයක් බෙදා හැරීමට සැලසුම් යොදා ඇත. එන් එස් බී කෘෂි වන වගාව යටතේ පැළ 25,000 ක් දිප ව්‍යාප්තව බෙදාහැර ඇත.



සාමකාමී හා සියළුදෙනා ඇතුළත් සමාජයක් නිර්මාණය කිරීම තුළින් සැමගේ ජීවත්වීමේ ගුණාත්මකබව ඉහළ නැංවීම කෙරෙහි ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැපවී සිටියි. ආදර්ශවත් ආයතනික පුරවැසියෙකු වශයෙන් සියලු නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලවීමටත් අපගේ ව්‍යාපාරික කටයුතු සාධාරණ පාරදෘෂ්‍ය හා සදාචාර සම්පන්න ලෙස සිදු කිරීමටත් යොමු වෙමු. සැපයුම්කරුවන් හා අනෙකුත් ආයතන සමග අප කරන ගනුදෙනුවලදී සහ සන්නිවේදනයට ද මෙම ආචාර ධර්ම ඇතුලත් සංස්කෘතිය පාදක වේ. රජයට අයත් ආයතනයක් වශයෙන් වෙනත් රාජ්‍ය ආයතන, රජය, පෞද්ගලික හා ජාත්‍යන්තර ආයතන සමග ශක්තිමත් පාර්ශවකරුවෙකු ලෙස අප කටයුතු කරමු. ආචාර සම්පන්න ව්‍යාපාරික පරිචයන් අනුගමනය කරනු ලබන බවට වගබලා ගැනීම පිණිස අචාර ධර්ම පද්ධතිය, ගතුකිමේ ප්‍රතිපත්තිය, අල්ලස් හා දූෂණ ප්‍රකාශ සහ වෙනත් ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති අප විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

GRI 102-56

Independent Assurance Report to National Savings Bank

KPMG
(Chartered Accountants)
32A, Sir Mohamed Macan Markar Mawatha,
P. O. Box 186,
Colombo 00300, Sri Lanka.

Tel : +94 - 11 542 6426
Fax : +94 - 11 244 5872
: +94 - 11 244 6058
: +94 - 11 254 1249
Internet : www.kpmg.com/lk

We have been engaged by the Directors of National Savings Bank ("Bank") to provide reasonable assurance and limited assurance in respect of the Sustainability Indicators as identified below for the year ended 31 December 2017. The Sustainability Indicators are included in the National Savings Bank's Integrated Annual Report for the year ended 31 December 2017 (the "Report").

The Reasonable Assurance Sustainability Indicators covered by our reasonable assurance engagement are:

Assured Sustainability Indicators	Integrated Annual Report Page
Financial Highlights	15

The Limited Assurance Sustainability Indicators covered by our limited assurance engagement are:

Limited Assurance Sustainability Indicators	Integrated Annual Report Page
Sustainability performance indicators – Non-Financial Highlights	16-18
Information provided on the following capitals	
Financial	73-84
Intellectual	92-99
Manufactured	100-105
Human	108-121
Social and Relationship	124-139
Natural	142-145

Our Conclusions

Our conclusion has been formed on the basis of, and is subject to, the matters outlined in this Report. We believe that the evidence we have obtained is sufficient and appropriate to provide a basis for our conclusions.

Reasonable Assurance Sustainability Indicators

In our opinion, the Reasonable Assurance Sustainability Indicators, as defined above, for the year ended 31 December 2017 are, in all material respects, prepared and presented in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

Limited Assurance Sustainability Indicators

Based on the limited assurance procedures performed and the evidence obtained, as described below, nothing has come to our attention that causes us to believe that the Limited Assurance Sustainability Indicators, as defined above, for the year ended 31 December 2017, have not in all material respects, been prepared and presented in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

KPMG, a Sri Lankan partneßhip and a member firm of the KPMG network of independent member firms affiliated with KPMG International Cooperative ("KPMG International"), a Swiss entity.

M.R. Mihular FCA
T.J.S. Rajakarier FCA
Ms. S.M.B. Jayasekara ACA
G.A.U. Karunaratne FCA
R.H. Rajan ACA
P.Y.S. Perera FCA
W.W.J.C. Perera FCA
W.K.D.C Abeyrathne FCA
R.M.D.B. Rajapakse FCA
C.P. Jayatilake FCA
Ms. S. Joseph FCA
S.T.D.L. Perera FCA
Ms. B.K.D.T.N. Rodrigo FCA

Principals - S.R.I. Perera FCMA(UK), LLB, Attorney-at-Law, H.S. Goonewardene ACA
Ms. C.T.K.N. Perera ACA

KPMG

Management's Responsibility

Management is responsible for the preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators and the Limited Assurance Sustainability Indicators in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

These responsibilities includes establishing such internal controls as management determines are necessary to enable the preparation of the Reasonable Assurance Sustainability Indicators and the Limited Assurance Sustainability Indicators that are free from material misstatement whether due to fraud or error.

Management is responsible for preventing and detecting fraud and for identifying and ensuring that the Bank complies with laws and regulations applicable to its activities.

Management is also responsible for ensuring that staff involved with the preparation and presentation of the description and Report are properly trained, information systems are properly updated and that any changes in reporting encompass all significant business units.

Our Responsibility

Our responsibility is to express a reasonable assurance conclusion on the Bank's preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators and a limited assurance conclusion on the preparation and presentation of the Limited Assurance Sustainability Indicators included in the Report, as defined above.

We conducted our assurance engagement in accordance with Sri Lanka Standard on Assurance Engagements SLSAE 3000: Assurance Engagements other than Audits or Reviews of Historical Financial Information (SLSAE 3000) issued by The Institute of Chartered Accountants of Sri Lanka.

We have complied with the independence and other ethical requirements of the Code of Ethics issued by The Institute of Chartered Accountants of Sri Lanka.

SLSAE 3000 requires that we plan and perform the engagement to obtain reasonable assurance about whether the Reasonable Assurance Sustainability Indicators are free from material misstatement and limited assurance about whether the Limited Assurance Sustainability Indicators are free from material misstatement.

Reasonable Assurance Over Reasonable Assurance Sustainability Indicators

The procedures selected in our reasonable assurance engagement depend on our judgement, including the assessment of the risks of material misstatement of the Reasonable Assurance Sustainability Indicators whether due to fraud or error.

In making those risk assessments, we have considered internal controls relevant to the preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators in order to design assurance procedures that are appropriate in the circumstances, but not for the purposes of expressing a conclusion as to the effectiveness of the Bank's internal controls over the preparation and presentation of the Report.

Our engagement also included assessing the appropriateness of the Reasonable Assurance Sustainability Indicators, the suitability of the criteria, being the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines, used by the Bank in preparing and presenting the Reasonable Assurance Sustainability Indicators within the Report, obtaining an understanding of the compilation of the financial and non-financial information to the sources from which it was obtained, evaluating the reasonableness of estimates made by the Bank, and re-computation of the calculations of the Reasonable Assurance Sustainability Indicators.

KPMG

Limited Assurance on the Assured Sustainability Indicators

Our limited assurance engagement on the Limited Assurance Sustainability Indicators consisted of making enquiries, primarily of persons responsible for the preparation of the Limited Assurance Sustainability Indicators, and applying analytical and other procedures, as appropriate. These procedures included:

- interviews with senior management and relevant staff at corporate and selected site level concerning sustainability strategy and policies for material issues, and the implementation of these across the business;
- enquiries of management to gain an understanding of the Bank's processes for determining material issues for the Banks's key stakeholder groups;
- enquiries of relevant staff at corporate and selected site level responsible for the preparation of the Limited Assurance Sustainability Indicators;
- enquiries about the design and implementation of the systems and methods used to collect and report the Limited Assurance Sustainability Indicators, including the aggregation of the reported information;
- comparing the Limited Assurance Sustainability Indicators to relevant underlying sources on a sample basis to determine whether all the relevant information has been appropriately included in the Report;
- reading the Limited Assurance Sustainability Indicators presented in the Report to determine whether they are in line with our overall knowledge of, and experience with, the sustainability performance of the Bank;
- reading the remainder of the Report to determine whether there are any material misstatements of fact or material inconsistencies based on our understanding obtained as part of our assurance engagement.

The procedures performed in a limited assurance engagement vary in nature and timing from, and are less in extent than for, a reasonable assurance engagement, and consequently the level of assurance obtained in a limited assurance engagement is substantially lower than the assurance that would have been obtained had a reasonable assurance engagement been performed. Accordingly, we do not express a reasonable assurance conclusion on the Limited Assurance Sustainability Indicators.

Purpose of Our Report

In accordance with the terms of our engagement, this assurance report has been prepared for the Bank for the purpose of assisting the Directors in determining whether the Bank's Reasonable and Limited Assurance Sustainability Indicators are prepared and presented in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines and for no other purpose or in any other context.

Restriction of Use of Our Report

Our report should not be regarded as suitable to be used or relied on by any party wishing to acquire rights against us other than the Bank, for any purpose or in any other context. Any party other than the Bank who obtains access to our report or a copy thereof and chooses to rely on our report (or any part thereof) will do so at its own risk. To the fullest extent permitted by law, we accept or assume no responsibility and deny any liability to any party other than the Bank for our work, for this independent assurance report, or for the conclusions we have reached.



Chartered Accountants
Colombo

14 April 2018

යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය



අස්වින් ද සිල්වා මහතා

සභාපති

අස්වින් ද සිල්වා මහතාගේ විවිධාකාරවූ බැංකුකරණ අත්දැකීම් වසර 16 කට වඩා වැඩි අතර ඊට ශ්‍රී ලංකාවේ හා සිංගප්පූරුවේ ඇමරිකන් එක්ස්ප්‍රස් හි අධ්‍යක්ෂ/ආයතනික බැංකුකරණය ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු රැසක් ඇතුලත් වේ. ඔහුගේ විෂය ක්ෂේත්‍රයන්ට මූල්‍ය, ණය, ආයතනික මූල්‍ය උපදෙස් හා ආයතනික බැංකුකරණය අයත් වේ.

මීට අමතරව ඔහු ශ්‍රී ලංකාවේ හා මාල්දිවයිනෙහි ඇමෙක්ස් ට්‍රැවල් රිලේටඩ් සර්විසස් හි දේශීය කළමනාකරු ලෙස ද සේවය කර ඇත.

තවද ද සිල්වා මහතා ඇමෙක්ස්හි ගෞරවාන්විත ගුණාත්මක භාවය සඳහා සභාපතිගේ සම්මානයෙන් ද පිදුම් ලබා ඇත. ද සිල්වා මහතා සමූහ මූල්‍ය අධ්‍යක්ෂ ලෙස වසර හතරක් ඇසෝසියේටඩ් මෝටර්වේස් සමාගමේ සේවය කර ඇති අතර සෙලින්කෝ ඉතිරිකිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද සේවය කර ඇත. 2015 පෙබරවාරි 09 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති ධූරයට පත්වීමට පෙර සැලකිය යුතු කාලයක් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි එන්.ආර්.එම්.ඒ සමූහයේ ව්‍යාපාර බුද්ධි තොරතුරු අංශයේ සාමාන්‍යාධිකාරී ලෙස සේවය කර ඇත.

තවද, ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි පූර්ණ පරිපාලිත සමාගමක් වන එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ සභාපති ලෙස ද සේවය කරයි.

කේ. පී. එම්. පී. ආයතනයේ ද සේවය කර ඇති ඔහු වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ (CA Sri Lanka) අධි සාමාජිකයෙක් (FCA) වන අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු (FCMA UK) සහ ඕස්ට්‍රේලියාවේ CPA ආයතනයේද අධි සාමාජිකයෙකි. (FCPA)



ඩී. එල්. පී. ආර්. අබේරත්න මහතා

අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අබේරත්න මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිධාරියෙකු ද (1991) කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද (2010), කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී ශාස්ත්‍රපති උපාධියක්ද උසුලයි. 2012 දෙසැම්බර් 02 දින සිට ශ්‍රී ලංකා තැපැල්පති තනතුර දරන්නේ අබේරත්න මහතාය. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 22 ක අත්දැකීම් ඔහු සතුය. 2005-2008 දක්වා මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්, 2009-2010 දක්වා ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, සංචාරක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (2010) සහ ආසියානු සංවර්ධන බැංකුවේ ගැටුම් ආශ්‍රිත කලාප හදිසි අවදානම් ව්‍යාපෘතියේ සමාජ/ස්ත්‍රී පුරුෂ සහ නැවත පදිංචි කිරීමේ විශේෂඥයෙකු වශයෙන් ඔහු සේවය කර ඇත.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. එසේම ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා මූල්‍ය කළමනාකරණ අංශයේ උපදේශක කමිටුවේ බාහිර සාමාජිකයෙකු ද වේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු පත්වූයේ 2012 පෙබරවාරි 09 වනදාය. 2012 මැයි 23 සිට 2012 අගෝස්තු 05 දක්වා කාලය තුල ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වැඩ බලන සභාපති ලෙස ද සේවය කර ඇත.

ඔහු එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.



ඒ. කේ. සෙනෙවිරත්න මහතා

අධ්‍යක්ෂ

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. 2018 ජනවාරි සිට සෙනෙවිරත්න මහතා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරයි.

සෙනෙවිරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා (විශේෂ) (ගෞරව) උපාධිධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ධාරියෙකු මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකුද වේ.

ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වූයේ 1995 දීය. වසරක සේවාස්ථ පුහුණු කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 1996 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහු පත්කරන ලද අතර 2006 වර්ෂයේදී එම අමාත්‍යාංශයේ ම ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. 2015 දී ඔහු මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්විය. 2018 දී ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත් වන තෙක්ම ඔහු එම තනතුර දැරීය.

වර්තමානයේ ඔහු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ලංකා නැව් සංස්ථාව, ඩිලාරු ලංකා කරන්සි සහ සෙකියුරිටි ප්‍රින්ට්ප්‍රයිවට් (පුද්ගලික) සමාගම යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරයි.



සුරංග නාඋල්ලගේ මහතා

අධ්‍යක්ෂ

නාඋල්ලගේ මහතා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත්වූයේ 2015 පෙබරවාරි මස 09 වනදාය. ඔහු බැංකු ක්ෂේත්‍රයේ වසර 36 කට වැඩි අත්දැකීම් සහිත විශ්‍රාමික බැංකු විධායක නිලධාරියෙකි.

ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකු හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකුකරණ සහ මූල්‍ය පිළිබඳ සහතිකපත්‍ර ලාභියෙකි.

ඔහු මුදල් අමාත්‍යාංශයේ කර්මාන්ත සබඳතා පිළිබඳ හිටපු සහකාර ලේකම්වරයෙකු හා ජාතික කම්කරු උපදේශන කවුන්සිලයේ හිටපු සාමාජිකයෙකු වේ. නාඋල්ලගේ මහතා කම්කරු අධ්‍යයනය ජාතික ආයතනයේ හා ජොබ්ස් නෙට් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද සේවය කර ඇත.

ඔහු එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යාව ගණනය කිරීමේ කොමිසමේ සාමාජිකයෙකු ද වේ.



අජිත් පතිරණ මහතා

අධ්‍යක්ෂ

අජිත් පතිරණ මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ (BASL) ලේකම් වරයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, නීතිඥ සංගම් කමිටු ගණනාවක සභාපතිධූරයන් ද දරා ඇත.

නීතිවේදියෙකු වන පතිරණ මහතා ක්ෂේත්‍රයේ වසර 27 කට අධික අත්දැකීම් ඇත්තෙකි. ඔහු නිල නොලත් මහේස්ත්‍රාත්වරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු හා අපරාධ නීතිය පිළිබඳ වෘත්තීය නීතිඥවරයෙකු ද වන හෙයින් දිවයිනේ අධිකරණයන්හි විභාගවූ ප්‍රසිද්ධ නඩු රැසක් වෙනුවෙන් පෙනී සිට ඇත.

පතිරණ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූයේ 2015 මාර්තු 20 වනදාය.

ඔහු එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද සේවය කරයි.



චන්දිම හේමචන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ

හේමචන්ද්‍ර මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූයේ 2015 නොවැම්බර් මස 2 වනදාය. ඔහු එක්සත් රාජධානියේ මිඩ්ල්සෙක්ස් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර ගණිතය හා පරිගණක විද්‍යා උපාධිධාරියෙකි. ඔහු බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි (FBCS) අධි සාමාජිකයෙක්, ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ (MACS) සාමාජිකයෙක් හා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයෙහි (APB) සාමාජිකයෙකුද වේ.

ඔහු 2011 වර්ෂයේ සිට මැලේසියාවේ බර්හැඩ් හි පිහිටි සයිකොම් ආයතනයේ ප්‍රධාන තාක්ෂණික නිලධාරියා ලෙසද කටයුතු කරයි. වසර 26 කට වැඩි අත්දැකීම් සපිරි තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදියෙකු වන ඔහු එක්සත් රාජධානියේ, මැලේසියාවේ, ශ්‍රී ලංකාවේ සහ කෙන්යාවේ පුළුල් දැනුම් සම්භාරයක් හා දක්ෂතා කැටිවූ මහා පරිමාණ හා තාක්ෂණික වශයෙන් ඉතා සංකීර්ණ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා දායක වී ඇත.

සයිකොම් ආයතනයට එක්වීමට ප්‍රථම ශ්‍රී ලංකාවේ පැරණිතම හා විශාලතම රක්ෂණ සේවා සපයන්නෙකු වන රජය සතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන නිලධාරියා වශයෙන් ඔහු සේවය කර ඇත.

එමෙන්ම ඔහු තුළ ඇති තොරතුරු සන්නිවේදන තාක්ෂණය, මෘදුකාංග සංවර්ධනය සහ සංකීර්ණ ICT ව්‍යාපෘති සාර්ථකත්ව කළමනාකරණය කිමේ හැකියාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දායාද කර ඇත. තවද, ඔහු රාජ්‍ය සහ පෞද්ගලික ආයතන රැසකට උපදේශන සේවාවන් ලබාදී ඇති අතර, දැනට උපදේශකයෙකු ලෙස ශ්‍රී ලංකා උපදේශන මණ්ඩල තුනක සේවය කරනු ලබයි.

මුල් අවධියේදී ඔහු එක්සත් රාජධානියේ බ්‍රිටිෂ් හාර්ට්ෆෝර්ඩ් ෆෙයාර්මවුන්ට් ඉංජිනියරින්ග් හි පද්ධති විශ්ලේෂකයෙකු ලෙස සේවය කළ අතර ඉන් අනතුරුව ඔහු ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුවේ ප්‍රධාන කළමනාකරු -තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT), හැටන් නැෂනල් බැංකුවේ - තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහ බැංකු මෙහෙයුම් ප්‍රධානී (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී) ස්ටැන්ඩර්ඩ් බැංකු සමූහයේ නැගෙනහිර අප්‍රිකානු මූලස්ථානය වන කෙන්යාවේ සී. එෆ්. සී. ස්ටැන්බික් බැංකුවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රධානී ලෙස කටයුතු කර ඇත.



අනිල් රාජකරුණා මහතා

අධ්‍යක්ෂ

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූයේ 2015 නොවැම්බර් මස 02 වන දිනය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ (එල්. එල්. බී. පළමු කොටස) උපාධිධාරියෙකි. වසර 22 ක අත්දැකීම් සහිත නීතිවේදියෙකු වන ඔහු ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ බණ්ඩාරනායක කේන්ද්‍රයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි.

ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරන දෙවන වාරය මෙය වන අතර, 2002 - 2004 කාලයේ දී ඔහු බැංකුවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත.

එස්. ඩී. එන්. පෙරේරා මහතා

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 16 වන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස එස්. ඩී. එන්. පෙරේරා මහතා පත් කෙරුනේ 2015 මාර්තු 12 වනදාය. සාමාන්‍යාධිකාරී ලෙස පත්වීමට ප්‍රථම ඔහු වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කරන ලද අතර, දශක තුනකට ආසන්න කාලයක් ඔහු බැංකුවේ සියළුම ක්‍රියාකාරී අංශ ආවරණය වන පරිදි සේවය කර ඇත.

පෙරේරා මහතා වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකු හා බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි. ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ සහතිකලත් තොරතුරු පද්ධති විගණක නිලධාරියෙකුද වේ.

ඔහු එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂවරයෙකි.

පෙරේරා මහතා රජරට සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වසර 10 කට අධික කාලයක් කටයුතු කර ඇත.

අනුපමා මුහන්දිරම් මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීතීඥවරියක වන අනුපමා මුහන්දිරම් මහත්මිය එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියක, මනිපාල් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියක හා ශ්‍රී ලංකාවේ නීති අධ්‍යාපනය පිළිබඳ සංයුක්ත කවුන්සිලයේ බැංකු සහ රක්ෂණ නීතිය පිළිබඳ පශ්චාත් නීතීඥ ඩිප්ලෝමාධාරිනියක ද වේ.

2016 දෙසැම්බර් 06 වැනි දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ධූරයට පත්වීමට ප්‍රථම, 2015 නොවැම්බර් මස සිට 2016 දෙසැම්බර් දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහකාර ලේකම්වරිය ලෙස කටයුතු කර ඇත. 2015 වසරේ සිට 2017 දක්වා එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේද අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

ඇයගේ බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඇති වසර 22 ක සේවා කාලයෙන් වසර 18 කට වැඩි කාලයක් ඇය සේවය කළේ මහජන බැංකුවෙහි නීති නිලධාරිනියක සහ අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරියක වශයෙනි.

මුහන්දිරම් මහත්මිය සබරගමුව විශ්ව විද්‍යාලයෙහි වාණිජ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියකි. එමෙන්ම ඇය ශ්‍රී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/ සමාගම් ලේකම්වරුන්ගේ සංවිධානයේද නිර්මාතෘ ලේකම්වරියයි.

ආයතනික කළමනාකාරිත්වය



එස්. ඩී. එන්. පෙරේරා මහතා
සාමාන්‍යාධිකාරී/
ප්‍රධාන විධායක නිලධාරී



ජගත් ගමනායක මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



කේ. රවීන්ද්‍රන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පර්යේෂණ හා සංවර්ධන)



එම්. පී. ඒ. ඩබ්ලිව්. පීරිස් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)



ඒ. සී. ගමගේ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පාරිභෝගික ණය)



ජී. වී. ඒ. ඩී. ඩී. සිල්වා මෙනෙවිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(භාණ්ඩාගාර)



එම්. කිරිදරන් මහතා
උපදේශක (නීති)



ජී. ඒ. ලයනල් මහතා
උපදේශක (භාණ්ඩාගාර)
(2018 ජනවාරි 02 දින දක්වා)



කේ. බී. විජයරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල් හා සැලසුම්)



සී. එස්. ජේසුඩියන් මෙනෙවිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)



බී. පී. ජේ. ගුණසේකර මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ජාත්‍යන්තර බැංකු)



පී. ඒ. අබේසූරිය මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)



කේ. කේ. වී. වී. එල්. ඩබ්ලිව්. කරුණාතිලක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවිකරණ)



ජී. ඩබ්ලිව්. ඊ. ජයවීර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(විගණන)
(2018 ජනවාරි 01 දින සිට)

විධායක කළමනාකාරිත්වය



පී. එස්. වසන්තතිලක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ සැලසුම් සහ උපකාරක සේවා)
(2018 පෙබරවාරි 12 සිට විශ්‍රාම ලබා ඇත)



කේ. පී. ඩී. එම්. ද සිල්වා මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



එච්. ආර්. සිල්වා මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
(2018 පෙබරවාරි 20 සිට විශ්‍රාම ලබා ඇත)



කේ. එම්. ඩබ්. එම්. කරුණාරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)



එම්. ටී. ඒ. ජේ. එෆ්. ගෝමිස් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



එම්. ඒ. ගෝමස් මිය
සහකාර සාමාන්‍යාධිකාරී (සැලසුම්)



එම්. එන්. ඒ. ප්‍රනාන්දු මෙනෙවිය
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සංවර්ධන)



ජේ. එච්. ටී. චන්ද්‍රරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

ප්‍රධාන කළමනාකරුවන්

ප්‍රාදේශීය කළමනාකරුවන්

1

ඒ. එල්. ඒ. හලීම්
ප්‍රාදේශීය කළමනාකරු - නැගෙනහිර

2

එච්. එම්. එස්. එල්. ප්‍රනාන්දු මිය
ප්‍රාදේශීය කළමනාකරු
බස්නාහිර 1

3

ඩී. ඩී. වික්‍රමසිංහ මිය
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
දකුණ

4

කේ. කමලනාදන්
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
වයඹ

5

එච්. ආර්. කරුණාමුනි මිය
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
බස්නාහිර 2

6

වී. එම්. එස්. සඳලතා මිය
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
මධ්‍යම

7

යූ. වත්තුහේවා
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
සබරගමුව

8

එන්. බහීරදන්
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු
උතුර

ශාඛා කළමනාකරණ

9

ඩබ්ලිව්. පී. යූ. ඒ. ද සිල්වා මිය
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ

10

ඩබ්ලිව්. එම්. ආර්. බී. වීරකෝන්
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ

ශාඛා මෙහෙයුම්

11

ආර්. ඒ. එන්. එන්. විජේසිංහ මිය
ප්‍රධාන කළමනාකරු
හෝමාගම ශාඛාව

12

ඒ. ජේ. ද මැල් මිය
ප්‍රධාන කළමනාකරු
පානදුර ශාඛාව

13

ඒ. එම්. සී. අත්තනායක මිය
ප්‍රධාන කළමනාකරු
මහනුවර ශාඛාව

14

ඒ. එච්. චන්ද්‍රදාස
ප්‍රධාන කළමනාකරු
ගම්පහ ශාඛාව

15

සී. එන්. ඒකනායක මිය
ප්‍රධාන කළමනාකරු
නගර ශාඛාව

16

එම්. එම්. එම්. මන්සූර්
ප්‍රධාන කළමනාකරු
කල්මුණේ ශාඛාව
(2018 මාර්තු 22 දින සිට විශ්‍රාම ලබා ඇත.)

17

යූ. මුණසිංහ
ප්‍රධාන කළමනාකරු
බත්තරමුල්ල ශාඛාව

18

ඩී. සී. ඔලබොඩුව
ප්‍රධාන කළමනාකරු
කිරිබත්ගොඩ ශාඛාව

19

එම්. එන්. සී. පෙරේරා
ප්‍රධාන කළමනාකරු
හලාවත ශාඛාව

20

පී. එම්. තිලකරත්න බණ්ඩාර
ප්‍රධාන කළමනාකරු
බදුල්ල ශාඛාව

21

ඩබ්. ඒ. කේ. විජේරත්න
ප්‍රධාන කළමනාකරු
මාතර ශාඛාව

22

එස්. බී. සුරංග
ප්‍රධාන කළමනාකරු
ගාල්ල ශාඛාව

විගණන හා සුපරීක්ෂණ

23

පී. ඒ. පෙරේරා
ප්‍රධාන කළමනාකරු
විගණන හා සුපරීක්ෂණ

කාඩ්පත් මධ්‍යස්ථානය

24

කේ. ඩී. කේ. කේ. විජයවර්ධන
ප්‍රධාන කළමනාකරු
කාඩ්පත් මධ්‍යස්ථානය

ආයතනික ණය/ පාරිභෝගික ණය

25

පී. ටී. ඒ. පෙරේරා
ප්‍රධාන කළමනාකරු - ණය

26

කේ. ජී. දමයන්ති මිය
ප්‍රධාන කළමනාකරු - ණය
(2018 පෙබරවාරි 28 දින සිට විශ්‍රාම ලබා ඇත.)

27

ඒ. බී. සී. ආර්. විජේපාල
ප්‍රධාන කළමනාකරු - උකස් ණය

28

ආර්. සී. සමරසිංහ මිය
ප්‍රධාන කළමනාකරු - ණය

මුදල් හා සැලසුම්

29

එස්. එස්. ජේ. පී. එස්. ද සිල්වා මිය
ප්‍රධාන කළමනාකරු - මුදල්

30

එච්. එස්. පී. රණවීර
ප්‍රධාන කළමනාකරු - මුදල්

මානව සම්පත් සංවර්ධන

31

කේ. එස්. වීරසේන
ප්‍රධාන කළමනාකරු - පුහුණුකිරීම්

32

කේ. ඒ. පී. පෙරේරා
ප්‍රධාන කළමනාකරු - සේවක මණ්ඩල (2018 ජනවාරි 26 දින සිට විශ්‍රාම ලබා ඇත.)

තොරතුරු තාක්ෂණ

33

ජී. එම්. එස්. පී. ප්‍රනාන්දු
ප්‍රධාන කළමනාකරු - තොරතුරු තාක්ෂණ

34

එම්. සී. රාජපක්ෂ
ප්‍රධාන කළමනාකරු - තොරතුරු තාක්ෂණ

35

ඒ. කේ. එල්. ඉලේසිංහ
ප්‍රධාන කළමනාකරු - ජාලකරණ හා සන්නිවේදන

36

එල්. සී. සේනානායක
ප්‍රධාන කළමනාකරු - දෘඩාංග

37

ඒ. පී. ආර්. ද සොයිසා
ප්‍රධාන කළමනාකරු - තොරතුරු තාක්ෂණ ආරක්ෂණ

ජාත්‍යන්තර බැංකු කටයුතු

38

එම්. වී. ජී. සුසිල් කුමාර
ප්‍රධාන කළමනාකරු - ජාත්‍යන්තර බැංකු කටයුතු

භාණ්ඩාගාර

39

එච්. එම්. ජී. ජී. ජේ. හේරත්
ප්‍රධාන කළමනාකරු - භාණ්ඩාගාර

40

එස්. ඩබ්. ඒ. වීරසිංහ මිය
ප්‍රධාන කළමනාකරු - භාණ්ඩාගාර

අනුකූලතා, නීතිය සහ අවදානම්

41

අයි. කේ. එල්. සසී මහේන්ද්‍රන් මිය
ප්‍රධාන කළමනාකරු - අනුකූලතා

42

ආර්. පී. ඒ. එම්. පී. රාජනායක මිය
ප්‍රධාන කළමනාකරු - අවදානම් කළමනාකරණ

43

එම්. ඒ. පී. මුහන්දිරම් මිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

පර්යේෂණ හා සංවර්ධන

44

එම්. ඩබ්. කේ. සී. ද සිල්වා
ප්‍රධාන කළමනාකරු - පර්යේෂණ හා සංවර්ධන

උපකාරක සේවා

45

සී. ඩබ්ලිව්. පතිරණ මිය
ප්‍රධාන කළමනාකරු - සැපයුම්

46

කේ. ටී. එස්. එස්. ගුණවර්ධන
ප්‍රධාන කළමනාකරු - ආරක්ෂක

47

ඩී. එම්. සී. පී. බී. දිසානායක
ප්‍රධාන කළමනාකරු සාමාන්‍යාධිකාරී අංශය

48

ඩී. එල්. පී. අබයසිංහ
ප්‍රධාන කළමනාකරු - එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

49

කේ. ඒ. ආර්. ගුණතිලක
ප්‍රධාන කළමනාකරු සුභසාධන

ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය යනු කොටස් හිමිකරුවන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙනුවෙන් ආයතනයක් පාලනය කරනු ලබන නීතිරීති ක්‍රියාවලියයි. යහපාලන රාමුව හරහා බැංකුව සංවර්ධනය, නියාමනය හා පාලනය කරනු ලබයි. මහජන විශ්වාසය පවත්වා ගනිමින් හා තැන්පත්කරුවන් ආරක්ෂා කර ගැනීමේ වගකීම බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවලට ඇත. ආයතන අධීක්ෂණය, තැන්පත්කරුවන්ගේ අභිවෘද්ධිය ආරක්ෂා කර ගැනීම, ආයතනික යහපාලනය තුලින් සාම්ප්‍රදායික මූල්‍ය ආයතන කෙරෙහි ඇති මහජන විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම ඌණ පූරණය කරන අතරම පරිපූර්ණත්වය හා විශ්වාසනීයත්වය සඳහා ද දායක වේ.

ආයතනික යහපාලනය බැංකුවේ මෙහෙයුම් කටයුතු සඳහා සවිමත් පදනමක් සපයන බවත් ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්කරුවන් සහ අනෙකුත් සියලුම උනන්දුව දක්වන පාර්ශ්වයන් සමග යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට ඉවහල් වන බවත්, මෙන්ම ආයතනික යහපාලනය, කාර්යක්ෂමතාවය හා ස්වාධීනත්වය ඉහළ නැංවීමෙහිලා වැදගත් මෙවලමක් ලෙසත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරනු ලබයි.

ඉතිරිකිරීම් හා ආයෝජන සඳහා වඩාත්ම විශ්වාසදායක හා වැඩි දෙනාගේ කැමැත්ත බවට පත්වීමේ බැංකුවේ දැක්මෙහි අංගයක් ලෙස බැංකුවේ යහපාලනය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව උසස් නිර්ණායකයන් නිර්දේශ කර ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විශ්වාස කරන්නේ ආයතනික යහපාලනය ආරම්භ විය යුත්තේ බැංකුවේ ආයතනික සංස්කෘතිය හා වටිනාකම් තුළින් බවත් ඒවා ලිඛිත නීතිවලට හා ප්‍රමිතීන්ට සීමා නොවිය යුතු බවත් ය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ යහපාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගොඩනැගී ඇත්තේ අවංකභාවය, සාධාරණත්වය, සදාචාර සම්පන්න බව හා ආචාරධර්ම, නීති/නියාමන අනුකූලතා, විනිවිදභාවය හා ප්‍රශස්ත වෘත්තීමයභාවය වැනි මූලික එහෙත් ඉතා වැදගත් ගුණාංග හා ලක්ෂණ මතය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය කටයුතු කරගෙන යෑමේදී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් ආරම්භ වී සියලුම මෙහෙයුම් ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සාමාජිකයන් දක්වා ආයතනික යහපාලන අගයට ඉහළම ප්‍රමුඛත්වය ලබා දේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉතාමත් උසස් ව්‍යාපාරික අවංකභාවය සඳහා හා සදාචාරාත්මක ගුණධර්ම කෙරෙහි කැප වී සිටින අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුකරණ පනත, බැංකුකරණ පනත, මූල්‍ය පනත, මූල්‍ය වාර්තාකරණ පනත, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, විදේශ විනිමය පනත සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කර ඇති නියාමන, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කර ඇති ඉතා උසස් ආයතනික යහපාලන පරිචයන් සහ අනෙකුත් නියාමන ක්‍රමවේදයන් සමග පූර්ණ ලෙස අනුකූලවී ඇති අතර ඉතා උසස් ව්‍යාපාරික පරිචයන් පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා මහ බැංකුව වරින්වර නිකුත් කරන උපදෙස් හා ඒවායේ සංශෝධන/යාවත්කාලීන කිරීම් සිය කාර්යක්ෂම යහපාලනය උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් මනා ලෙස පිළිපදිනු ලබයි.

බැංකුව සිය කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පුවත්පත්වල පළ කරන අතර සිය මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පාර්ලිමේන්තුවෙහි සභාගත කරයි. එමෙන්ම බැංකුකරණ පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සියලු ශාඛාවන් වෙත ලබා දේ. බැංකු කටයුතු පවත්වාගෙන යාමේදී පොදු ජනතාවගේ අභිවෘද්ධිය සුරක්ෂිත බවට මින් සහතික කෙරේ. මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබන අතර ඊට අමතරව වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන විසින් තෝරාගත් ශාඛා විගණනය කරනු ලබයි. මෙතුලින් සිය වගවීමේ කර්තව්‍යය ඉටු කිරීමේදී බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් හි විනිවිදබව හා විශ්වසනීයත්වය වැඩි දියුණු කරයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික යහපාලන ව්‍යුහය පහත දැක්වෙන මූලධර්ම මත පදනම්ව ඇත.

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සියළුම මට්ටම්වල කටයුතු කළමනාකරණය කිරීමේදී වගකීම සහ වගවීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද උප කමිටු මගින් ඔවුන්ට පවරා ඇති විශේෂිත වගකීම් අධීක්ෂණය කෙරෙන බවට සහතිකවීම.
- බැංකුවේ ව්‍යාපාරික අරමුණු ඉටු කිරීමට උපකාරී වන ප්‍රශස්ත කළමනාකාරී ව්‍යුහය නිර්ණය කිරීම.
- ව්‍යාපාරික අරමුණු හා ජාතික ඉතුරුම් හි සැබෑ අරුත අතර සමබරතාව පවත්වාගැනීම සහ යෝග්‍ය පරිදි ඉහල කළමනාකරණය අතර වගකීම් බෙදාදීම.
- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශක්තිමත් බව හා සුරක්ෂිත බව සහතික කිරීම සඳහා විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ව්‍යාපාරික ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ සුහදශීලී සම්බන්ධයක් පවත්වාගනිමින් නව අදහස් ඉදිරිපත් කිරීම හා එවන් අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදීම.
- යහපාලන රෙගුලාසි වලට අවනතවීම සහ අනුකූලවීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල පාලන අධිකාරී සමග සාකච්ඡාවලට සක්‍රීය ලෙස දායකවීම.
- අභ්‍යන්තර විගණනය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණ කාර්යයන් ඇතුලු අභ්‍යන්තර පාලන පද්ධති අධීක්ෂණය ව්‍යාපාර කටයුතු වලින් බැහැරව ස්වාධීනව ඉටු කිරීම.
- ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි සියලු අවශ්‍යතා, නීතිරීති හා නියෝගවලට අනුකූලවීම.
- බැංකුවේ මූලික කාර්යයන් පවත්වාගෙන යාමේ දී සමාජයීය වගකීම නිරතුරුව අවධාරණය කිරීම.

බැංකුවට අදාළ වන සියලු විධිවිධාන හා මාර්ගෝපදේශ වලට බැංකුව අනුකූල වන බව සහතික කිරීම සඳහා බැංකුවේ අනුකූලතා අංශය කැපවී සිටී. අනුකූලතා අංශය නිරන්තරයෙන් වෙනස්වන අනුකූලතා පරිසරය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත වන අතර නිකුත් කෙරෙන නව නියාමන නිසි පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත සන්නිවේදනය කෙරෙන බව සහතික කිරීම සඳහා හැමවිටම අදාළ අංශ/ශාඛා සමග එක්ව ඒ සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීමට උත්සුක වේ. මෙම අංශය විනිවිදභාවය හා විශ්වාසනීයභාවය සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වීසින් නිසි පරිදි විගණනය කෙරෙන බවට, පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙන බවට මෙන්ම ඒවා නියමිත කාලරාමුව තුළ මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කෙරෙන බවටත් සහතික කිරීම සඳහා පසුවිපරම් ක්‍රියාමාර්ග ගනී. එමෙන්ම අනුකූලතා කාර්යයේ ස්වාධීනත්වය තහවුරු කරනු පිණිස අනුකූලතා අංශය, රජයේ විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික විගණනය සහ අභ්‍යන්තර විගණනය යන ස්වාධීන විගණනයන්ට ලක් කෙරේ.

2017 වසරේදී අනුකූලතා අංශය විසින් ප්‍රති මුදල් විශුද්ධිකරණ (AML) පද්ධතිය ලබාගත් අතර එය ක්‍රියාවට නැංවීම ආරම්භ කරන ලදී. අනුකූලතා පිළිබඳ අවබෝධයට ප්‍රමුඛත්වය දෙන ලද අතර ඉහළ දැනුමක් ළඟා කර ගැනීම උදෙසා ශාඛා මට්ටමේ පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන ලදී. පොදු අනුකූලතා, ප්‍රති-මුදල් විශුද්ධිකරණ පද්ධතිය සහ අදාළ නීති සහ නියාමන පිළිබඳව අනුකූලතා අංශය විසින් කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් පුහුණු කරන ලදී. වසර 2017 සඳහා අනුකූලතා අංශය විසින් සාර්ථක අනුකූලතා සංස්කෘතියක් ඉලක්ක කරගත් එහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නංවන ලදී. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (RPT) තොරතුරු පිළිබඳව ගත් කළ අනුකූලතා අංශය තොරතුරු තාක්ෂණ අංශය හා එක්ව අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා නව තොරතුරු ග්‍රාහක ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. එම ක්‍රමවේදය යටතේ RPT වාර්තාකරණය වඩා ඵලදායී වී ඇති අතර 2017 අනුකූලතා අංශයේ ඉලක්ක ළඟා කර ගත් වසරකි.


මාර්ගෝපදේශ 3 (6) ට අනුකූලව බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුව වාර්තා කරන අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු 6 ක් ස්ථාපනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුව යන මෙම උප කමිටු හය ඔවුන්ගේ විෂය පථයට අයත් වන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජු නිර්දේශ ඉදිරිපත් කිරීමේ

අධිකාරිත්වයෙන් යුක්තය. අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ ප්‍රමාණවත් බව සහ පූර්ණභාවය පිළිබඳව විමර්ශනයට හා තීරණ ගැනීම, මූල්‍ය තොරතුරු හා ඒවායේ පූර්ණත්වය, ක්ෂේත්‍රයේ මූලික අවදානම් සාධක සහ නිශ්චිත අවදානම් සාධක හා බැංකුවේ ආයතනික යහපාලනය යනාදිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දෙයි. ආයතනික යහපාලන ක්‍රමවේදයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණාත්මක මෙහෙයුම් ක්ෂේත්‍ර මෙහෙයුම් මට්ටම් වලට පැවරීමකින් තොරව සිය විෂය පථය තුල රඳවාගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුව සභාපතිගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ අධිකාරිත්වය හා වගකීම් වෙන් වෙන්ව දක්වා ඇත.

ආයතනික යහපාලන සැලැස්ම GRI 102-18

ඉහළ මට්ටමේ උපායමාර්ග හා මඟපෙන්වීම් නිර්දේශ කිරීම, අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය ආදිය මගින් බැංකුවේ සමස්ත වගකීම භාරගන්නා හා අධීක්ෂණය කරනු ලබන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීම පවරා ඇත්තේ තමන් නායකත්වය දෙන හා හා මාර්ගෝපදේශකත්වය ලබාදෙන ආයතනික කළමනාකරණ කණ්ඩායම හරහා අධිකාරී බලය ක්‍රියාවට නංවන ප්‍රධාන විධායක නිලධාරියා වෙතය.

ආයතනික යහපාලන ව්‍යුහය



ආයතනික කළමනාකරණ කමිටුව	– CMC	මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව	– ORMC
වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව	– ALCO	නිමැවුම් සංවර්ධන කමිටුව	– PDC
ආයෝජන කමිටුව	– IC	මානව සම්පත් කමිටුව	– HRC
ණය කමිටුව	– CC	ආයතනික ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)	– CPC-Major
කාර්යසාධන විමර්ශන කමිටුව	– PRC	ආයතනික ප්‍රසම්පාදන කමිටුව (අප්‍රධාන)	– CPC-Minor
ශාඛා මෙහෙයුම් කමිටුව	– BOSC	ටෙන්ඩර් සහ නව ආයෝජන කමිටුව	– TNIC
තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව		හිමිකම් ප්‍රාග්ධන ආයෝජන කමිටුව	– EC
අලෙවිකරණ කමිටුව	– MKTC		

2017 වසර තුළ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය

සහභාගි වූ අධ්‍යක්ෂවරයාගේ නම	පත්වූ දිනය	සහභාගිවීමට හිමිකම් ඇති වාර ගණන	සහභාගි වූ වාර ගණන
අස්වින් ද සිල්වා මහතා – සභාපති	2015 පෙබරවාරි 9 වන දින පත්විය.	16	16
ඩී එල් පී ආර් අබේරත්න මහතා – නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	2012 පෙබරවාරි 9 වන දින පත්විය.	16	14
සුරංග නාවුල්ලගේ මහතා – අධ්‍යක්ෂ	2015 පෙබරවාරි 9 වන දින පත්විය.	16	16
අජිත් පතිරණ මහතා – අධ්‍යක්ෂ	2015 මාර්තු 20 වන දින පත්විය.	16	14
ඒ කේ සෙනවිරත්න මහතා – නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	2015 මැයි 27 වන දින පත්විය.	16	14
චන්දිම හේමචන්ද්‍ර මහතා – අධ්‍යක්ෂ	2015 නොවැම්බර් 2 වන දින පත්විය.	16	13
අනිල් රාජකරුණා මහතා – අධ්‍යක්ෂ	2015 නොවැම්බර් 2 වන දින පත්විය.	16	16

2007 අංක 12 දරණ බැංකු කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පනතේ නියෝග ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කරන ලද අනුකමිටු වල විෂය පථය, ක්‍රියාකාරකම් හා 2017 වසර තුල පැමිණීම මතු දැක්වේ.

1. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂයය පථය වන්නේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය පවත්වා ගැනීම, බැංකු වාර්ෂික වාර්තාවේ අඩංගු සහ බැංකුවේ කාර්තුමය මූල්‍ය තොරතුරු වාර්තා සහ ගිණුම් සමාලෝචනය කිරීම සහ එහි ඇතුලත් වැදගත් මූල්‍ය වාර්තාකරණ තීරණ සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීමයි.

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන 2007 අංක 12 දරන නියෝගයෙහි යහපාලන නිර්දේශ 3(6)(ii) යටතේ නියම කර ඇති නීති වලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති විගණන ප්‍රඥප්තියට හා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව කමිටුවේ කටයුතු මෙහෙයවන විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි. 1995 අංක 28 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (i) වගන්තියෙහි ප්‍රතිපාදන යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනු කමිටුව ඇතුළු සියලු අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සාමාජිකයින් හා ඉහත සඳහන් කළ අධ්‍යක්ෂවරු 07 දෙනා අතරින් නියමිත සුදුසුකම්, කුසලතා හා අත්දැකීම් සහිත පුද්ගලයන් කමිටු සාමාජිකයින් ලෙස තෝරා ගැනේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියෙහි සඳහන් විෂය පථයේ සීමා ඇතුළත කමිටුව කටයුතු කෙරෙයි. ප්‍රඥප්තියට අනුව කමිටුවේ ක්ෂේත්‍රය වන්නේ (අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය (ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යභාරයෙහි කාර්යක්ෂමතාව (ඇ) බැංකුවේ බාහිර විගණන ක්‍රියාවලියෙහි කාර්යසාධනය (ඈ) බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි කාර්යසාධනය පිළිබඳ වගකීම් ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීමයි.

එමෙන්ම මෙම කමිටුව බැංකුව තුල අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පුළුල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන බව හා එම පද්ධතියේ කාර්යක්ෂමතාව තහවුරු කරමින් බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතිය ඇගයීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම සඳහා පවතින ක්‍රමවේදයේ කාර්යක්ෂමතාවය සහ කළමනාකාරීත්වයේ විමර්ශනවල ප්‍රතිඵල සමාලෝචනය කිරීම හා නීති හා රෙගුලාසිවලට අනුගත නොවුනු අවස්ථා පිළිබඳව පසුවිපරම් කිරීම ඔස්සේ බැංකුව නෛතික මෙන්ම නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම සම්බන්ධයෙන්ද කමිටුව තක්සේරුවක යෙදෙයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව පිටු අංක 190 සිට 192 දක්වා ඇත.

2. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරීට සහ ප්‍රධාන කළමනාකාරීත්වයට ඉලක්ක ලබා දෙන අතර, එකී ඉලක්ක ළඟා කර ගැනීමෙහිලා ඔවුන් දක්වන ලද කාර්ය සාධනය ද කලින් කලට ඇගයීමට ලක් කරමින් ඒ අනුව කාර්යසාධනය මත චේතන, ප්‍රතිලාභ සහ අනෙකුත් දීමනා සංශෝධනය කරනු ලබයි. බැංකුව වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන උපාය මාර්ගයන් ප්‍රවර්ධනය හා විමර්ශනය මෙන්ම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ද ඇතුළු මානව සම්පත් හා අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සමග උපදේශක කාර්යභාරයක් ඉටු කිරීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවට පැවරී ඇති මූලික වගකීම් වලට ඇතුළත් වේ.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කරනු ලබන අවස්ථාවල්දී හැර අනෙකුත් සියලු කමිටු රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් තොරතුරු ලබාදෙන අතර ඒවාට සහභාගි වෙයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි. සාමූහික ගිවිසුම මගින් තීරණය කරනු ලබන චේතන හැරුණු කොට අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ වැටුප් දීමනා, හා අනෙකුත් මූල්‍ය ගෙවීම් ඇතුළු චේතන සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණය කිරීම කමිටුව සතු වගකීමකි.

ජ්‍යෙෂ්ඨ විධායක ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය හා සම්බන්ධ සියළු වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, ප්‍රවේශ, වැටුප් ව්‍යුහ නියමයන් හා කොන්දේසි කමිටුව විසින් විමර්ශණය කෙරේ. මෙම ක්‍රියාදාමයේ දී බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් අවශ්‍ය තොරතුරු හා නිර්දේශ ලබාගැනේ. කමිටුව තෙමසකට වරක් රැස්වන නමුත් අවශ්‍යතාවය අනුව රැසවීම් කැඳවනු ලැබේ. 2017 වසර තුළ පවත්වා ඇති රැස්වීම් ගණන 10 කි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පිටු අංක 193 සිට 194 දක්වා ඇත.

3. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සිය කටයුතු සහ තීරණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළයුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවෙහි ලේකම් ලෙස ද කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීමට සහ පත්කිරීමට අදාළ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාර නිලධාරී තනතුරුවලට පත්වීමට හෝ උසස් කරනු ලැබීමට යෝග්‍ය වීම සඳහා අවශ්‍ය සුදුසුකම්,අත්දැකීම් හා ප්‍රධාන ගුණාංග වැනි උපමාන තීරණය කිරීම සිදු කරනු ලබයි. කාර්ය මණ්ඩල සාමාජිකයන් නම් කිරීමට අදාළ ප්‍රතිපත්ති හා උපායමාර්ගික කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධීක්ෂණය, ඇගයීම හා තීරණ ගැනීමට අමතරව නියාමන අධිකාරීන් ගේ පත් කිරීම් හා නම් කිරීමේ කොන්දේසි සමග බැංකුවේ අනුකූලතාවය සහතික කරන ප්‍රතිපත්ති හා ක්‍රියාවලි පිළිබඳ පොදු පාලනයක් පැනවීම ද අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ වගකීමකි.

නාමයෝජනා කමිටු වාර්තාව පිටු අංක 195 හි දක්වා ඇත.

4. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කළමණාකාරීත්ව තොරතුරු සහ සුදුසු අවදානම් දර්ශක උපයෝගී කර ගනිමින් ණය, වෙළඳපල, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික ඇතුළු බැංකුව මුහුණ දෙන සියලු අවදානම් තක්සේරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. කමිටුවට විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහ අවදානම් කළමනාකරණ ප්‍රධානී යන අය ඇතුලත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතා ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා මෙම කමිටුව විසින් සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිය ප්‍රඥප්තියට අදාළ යෝජනා සඳහා අනුමැතිය සපයනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරීක්ෂණය කළයුතු යෝජනා/වාර්තා නිර්දේශ කරනු ලබයි.

ණය කළමනාකරණ කමිටුව හා වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව ආදී සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඇගයීම තුලින් නිශ්චිත අවදානම් සඳහා පිලියම් යෙදීම සහ කමිටුව විසින් නිර්ණය කර ඇති සීමා තුල එකී අවදානම් සංඛ්‍යාත්මකව සහ ගුණාත්මකව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාලෝචනයෙහි යෙදෙයි. බැංකුවේ ප්‍රතිපත්ති, රෙගුලාසි හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් නිර්ණය කරන විචක්ෂණශීලී මට්ටම ඉක්මවා යන අවදානම් ඇතොත් එවන් සුවිශේෂී අවදානම් වල බලපෑම අවම කිරීම සඳහා ක්ෂණික හා පිළියම්කාරී පියවර ගත යුතුය.

මෙම විෂයය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාව සහ/හෝ නිශ්චිත මාර්ගෝපදේශ ලබාගැනීම සඳහා අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අඛණ්ඩව ඉදිරිපත් කෙරෙන බව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව තහවුරු කරනු ලබයි. ව්‍යාපාරික කටයුතු වලට අදාළ සෑම ක්ෂේත්‍රයකදීම බැංකුව නීතිරීති, රෙගුලාසි, නියාමන, මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර පාලන හා අනුමත ප්‍රතිපත්තිවලට අනුගතව කටයුතු කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා කමිටුව විසින් ස්වාධීන අනුකූලතා ක්‍රියාපටිපාටියක් සකස් කර ඇත. අනුකූලතා ක්‍රියාපටිපාටි පවත්වාගෙන යාම සහතික කිරීම හා කමිටුව වෙත කලින් කලට අවශ්‍ය වාර්තා ලබාදීම සඳහා එයටම කැප වූ අනුකූලතා නිලධාරියෙකු ප්‍රධාන කළමනාකරණ පිරිස් අතරින් තෝරා ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව පිටු අංක 196 සිට 197 දක්වා වන කොටසෙහි දක්වා ඇත.

5. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව යනු බැංකුවේ ණය ප්‍රතිපත්තිය හා ආයෝජන ප්‍රතිපත්තිය පිළිබඳ කලින් කලට සමාලෝචනය කිරීමේ වගකීම පැවරී ඇති සහ කමිටුවට පවරා ඇති සීමාවන් තුළ ණය පහසුකම් හා ආයෝජන අනුමත කිරීමෙහි නියුතු අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවකි. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ණය අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කැඳවීම මත මෙම රැස්වීම් වලට සහභාගි විය යුතු අතර අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීම් වලට සහභාගි විය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවට පහත බලතල පැවරී ඇත.

- ක්‍රියා පටිපාටි හා අනෙකුත් ප්‍රතිපත්ති මට්ටමේ ලේඛන ඇතුළු ණය හා ආයෝජනයට අදාළ බැංකුවේ උපායමාර්ගික අරමුණු අනුමත කිරීම හා අධීක්ෂණය
- බලය පැවරිය හැකි සීමා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම
- පවරා ඇති බල සීමාව තුළ ණය කමිටුව හා ආයෝජන කමිටුව විසින් අනුමැතිය/සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- පවරා ඇති බලසීමාවෙන් පිටත ණය කමිටුව හා ආයෝජන කමිටුව විසින් නිර්දේශ කරන ණය හා ආයෝජන යෝජනා අනුමැතිය/සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- අනුමැතිය/සලකා බැලීම සඳහා නව නිමැවුම් හා ක්‍රියා පටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ/ඉදිරිපත් කිරීම
- වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරනු ලබන ණය හා අත්තිකාරම් සහ ආයෝජන මිල නියම කිරීම සහ ආයෝජන උපදේශන අනුමත කිරීම/උපදෙස් දීම
- ණය පරිපාලනය, ණය අයකර ගැනීම, පෙරවරණ කටයුතු, හිමි වූ දේපල අලෙවිය වැනි සියලු කරුණු පිළිබඳව ණය කමිටුවට/ආයෝජන කමිටුවට මග පෙන්වීම/උපදෙස් දීම.
- පිළිගත් නිර්නායකයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය හා නියාමන අධිකාරීන් විසින් නියම කර ඇති සීමා හා පරාමිතීන් ඒදිරිව ණය හා අත්තිකාරම් සහ ආයෝජන කළඹ අධීක්ෂණය කිරීම.
- බැංකුවේ ණය හා අදාළ අවදානම් කළමනාකරණයට යෝග්‍ය ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සහතික කිරීම හා අභ්‍යන්තර පාලන කළමනාකරණ හා තොරතුරු පද්ධති කළමනාකරණය ශක්තිමත් කිරීම

රැස්වීම් වාර්තා සම්මත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කළමනාකරණ කමිටුවේ වාර්තාව පිටු අංක 198 සිට 199 දක්වා වන කොටසෙහි දක්වා ඇත.

6. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රඥප්තිය, 1971 අංක 30 දරන සංශෝධිත ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නියාමන රාමුවට අනුකූලව බැංකුවේ සමස්ත තොරතුරු තාක්ෂණ ව්‍යුහයට අදාළ ඕනෑම කටයුත්තක යෙදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවට පවරා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ සාමාජිකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කමිටුවේ ලේකම් ලෙස ද කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, තොරතුරු තාක්ෂණ විෂය භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරු කැඳවීම මත සෑම රැස්වීමකට ම සහභාගි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවට

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ බැංකුවේ උපායමාර්ගික අරමුණු අනුමත කිරීම හා අධීක්ෂණය, තොරතුරු තාක්ෂණ උපායමාර්ග හා ප්‍රතිපත්ති ලේඛන අනුමත කිරීම හා සමාලෝචනය, අවශ්‍යතාවය පරිදි අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සමග සම්බන්ධීකරණය, හා බැංකුවේ අනුමත උපායමාර්ග තුල නව තාක්ෂණ හාවිතයන් අනුමත කිරීම හා කළමනාකරණය සඳහා බලය ඇත.
- තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවට වගකීම් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව බලතල පැවරිය යුතුය.

සෑම දෙමසකට වරක් හෝ අවශ්‍යතාවය මත කමිටු රැස්වීම් පැවැත්වේ. කමිටුවේ සනපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව පිටු අංක 200 කොටසෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකයින්ගේ සහභාගිත්වය

ආයතනික යහපාලනය අනුව 2017 වසරේදී පැවැත් විය යුතු රැස්වීම් ගණන, පවත්වන ලද රැස්වීම් ගණන හා සාමාජික සහභාගිත්වය පහත දැක්වේ.

නම්	අධ්‍යක්ෂ මණ්ඩල තත්වය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුව
ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුව වර්ෂය තුළ පැවැත්විය යුතු අවම රැස්වීම් ගණන		04	04	02	04	අදාළ නැත	අදාළ නැත
අදාළ වර්ෂය තුල පැවති මුළු රැස්වීම් ගණන		10	10	01	05	08	05
අස්විත් ද සිල්වා මහතා - සභාපති	සභාපති ස්වාධීන නොවන අධ්‍යක්ෂ විධායක නොවන අධ්‍යක්ෂ (සභාපති – මා.ඝ.පා.ක./ණ.ක./තො.තා.උ.ක.)	අදාළ නැත	10 සභාපති 2015 මාර්තු 12 දින සිට	අදාළ නැත	අදාළ නැත	08 සභාපති – 2017 පෙබරවාරි 3 දින සිට	05 සභාපති – 2017 පෙබරවාරි 3 දින සිට
ඩී එල් පී ආර් අබේරත්න මහතා නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන (සභාපති වි.ක./නා.ක.)	10 සභාපති 2015 නොවැම්බර් 30 දින සිට	10	01 සභාපති – 2017 පෙබරවාරි 3 දින සිට	අදාළ නැත	අදාළ නැත	02
සුරංග නාවුල්ලගේ මහතා – අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන	අදාළ නැත	අදාළ නැත	අදාළ නැත	05	අදාළ නැත	අදාළ නැත
අජිත් පතිරණ මහතා – අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන	අදාළ නැත	08	01	අදාළ නැත	02	අදාළ නැත
ඒ කේ සෙනවිරත්න මහතා – නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන (සභාපති – ඒ.ඇ.ක.ක.)	08	අදාළ නැත	01	05 සභාපති 2015 නොවැම්බර් 30 දින සිට	අදාළ නැත	අදාළ නැත
චන්දිම හේමචන්ද්‍ර මහතා – අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන	අදාළ නැත	අදාළ නැත	අදාළ නැත	01	06	05
අනිල් රාජකරුණා මහතා – අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ස්වාධීන නොවන විධායක නොවන	10	අදාළ නැත	අදාළ නැත	02	05	අදාළ නැත

0 = සහභාගිවීම අත්‍යවශ්‍ය වුවත් සහභාගි වී නොමැත

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනුකූලතාව

2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශයන්ට හා පසුකාලීන සංශෝධනයන්ට අනුකූලව සකස් කරන ලද වාර්ෂික යහපාලන වාර්තාව 2017 වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් විය යුතුය.

ඉහත නියෝගයන්ට බැංකුව අනුකූල වී තිබෙන ආකාරය පහත දක්වා ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**	
3 (1) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු පිළිබඳ සහතික වෙමින් බැංකුවේ සුරක්ෂිතභාවය සහ ස්ථාවරත්වය ශක්තිමත් කළ යුතුය.	
3 (1) (i) (අ)	බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීම සහ මේ පිළිබඳව බැංකුවේ සැමට සන්නිවේදනය වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්ණය කරන ලද බැංකුවේ උපාය මාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් පිටු අංක 63 හි සඳහන් පරිදි වේ. මේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති (2017-2019) තුන් අවුරුදු උපාය මාර්ගික සැලසුමට අන්තර්ගත කර ඇති අතර සියලු ශ්‍රේණිවල සේවකයන් දැනුවත් කර ඇත.
3 (1) (i) (ආ)	අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි හා මැනිය හැකි ඉලක්ක සහිත යාන්ත්‍රණයක් අනුමත කිරීම.	අනුකූලවී ඇත. ව්‍යාපාරික උපායමාර්ග දිශානතීන් සහ මැණිය හැකි අරමුණු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තුන් අවුරුදු (2017-2019) උපාය මාර්ගික ව්‍යාපාරික සැලැස්ම ක්‍රියාවට නංවා තිබේ. උපාය මාර්ගික ව්‍යාපාරික සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන හා විමර්ෂණය කරනු ලබයි. උපාය මාර්ගික සැලැස්ම (2018-2020) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 දී අනුමත කරන ලදී.
3 (1) (i) (ඇ)	ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ විචක්ෂණශීලීව අවදානම් කළමනාකරණය සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, මූලික අවදානම්, පාලන ව්‍යුහයන් හඳුනාගැනීම සහ ඒවා මැන බැලීමට ක්‍රමවේද ක්‍රියාවට නැංවීම, මූලික අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරී ඇත. මේ සම්බන්ධයෙන් පහත වාර්තා වැඩිදුර විස්තර සපයයි. • අවදානම් කළමනාකරණ වාර්තාව පිටු අංක 201 සිට 238 දක්වා. • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව පිටු අංක 196 සිට 197 දක්වා.
3 (1) (i) (ඈ)	තැන්පත්කරුවන්, ණයගැතියන්, ණයහිමියන්, කොටස්කරුවන් ඇතුලු සියලුම පාර්ශවකරුවන් සමග සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම අනුමත කිරීම.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (1) (i) (ඉ)	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති හා කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්බව හා විශ්වාසනීයත්වය සමාලෝචනය කිරීම.	අනුකූලවී ඇත.
3 (1) (i) (ඊ)	ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගැනීම හා තනතුරු සඳහා පත් කිරීම.	අනුකූලවී ඇත.
3 (1) (i) (උ)	අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් නිශ්චය කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධිකාරී ක්ෂේත්‍ර හා ප්‍රධාන වගකීම් නිශ්චය කර ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ වගන්ති අංක 07 යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී ක්ෂේත්‍රය පාලනය කරනු ලබයි.
3 (1) (i) (ඌ)	ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට ගැළපෙන පරිදි බැංකු කටයුතු යෝග්‍ය ලෙස අධීක්ෂණය කෙරෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත.
3 (1) (i) (එ)	අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නාමයෝජනා කිරීම සහ පත්කර ගැනීම, ගැටුම් කළමනාකරණය, දුර්වලතා නිර්ණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් ක්‍රියාත්මක කිරීම ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන චර්යාවන්ගේ කාර්යක්ෂමතාවය කලින් කලට ඇගයීම.	අනුකූලවී ඇත. 1995 වසරේ අංක 28 දරණ පනතින් සංශෝධනය කරන ලද 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 වන ඡේදයේ කොන්දේසි වලට අනුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත් කෙරේ. ගැටුම් තිබේ නම් ඒවා නිරීක්ෂණය සඳහා සම්බන්ධිත පාර්ශ්ව සහ ඔවුන්ගේ අභිලාෂයන්ට අදාළ වාර්ෂික ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගැනේ. ගැටෙන අභිලාෂ කළමනාකරණය කිරීම සඳහා අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර තිබේ.
3 (1) (i) (ඒ)	ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා යෝග්‍ය අනුප්‍රාප්ති සැලැස්මක් බැංකුවට තිබෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත.
3 (1) (i) (ඔ)	ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා අවශ්‍යතා පදනම මත ප්‍රධාන කළමනාකරණ පිරිස් නිරතුරුව හමුවීම.	අනුකූලවී ඇත. ක්‍රියාකාරිත්වය, උපාය මාර්ග සහ තම වගකීම් ක්ෂේත්‍රයට අදාළ කරුණුවල ප්‍රගතිය ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල හා ඒවායේ අනු කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කෙරේ.
3 (1) (i) (ඕ)	නියාමන පරිසරය අවබෝධ කරගැනීම සහ බැංකුව විසින් නියාමකයන් සමග ඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව සහතික කිරීම.	අනුකූලවී ඇත.
3 (1) (i) (ඖ)	බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමේදී හා අධීක්ෂණය කිරීමේදී අවශ්‍ය සුපරීක්ෂාකාරී බවින් යුතුව කටයුතු කිරීම.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 37 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වෙයි.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (1) (ii)	මෙම නිර්දේශවල නිර්දේශ අංක 3 (5) ප්‍රකාරව සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී සතු කාර්යභාරය හා වගකීම් නිර්වචනය කිරීම හා අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.	අනුකූලවී ඇත. 1995 වසරේ අංක 28 දරන පනතින් සංශෝධනය කරන ලද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 26 (1) වගන්තියෙන් දක්වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා යෝග්‍ය හා නිසි පුද්ගලයෙකු පත්කරනු ලබන අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී බවට පත්වේ. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කිරීම හා අනුමත කිරීම සිදු කර තිබේ.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිති පතා හමුවිය යුතු අතර ආසන්න වශයෙන් මසකට වරක් වර්ෂයක් තුළ අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්විය යුතුය. එසේ පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවීමට සුදුසුකම් ඇති අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ ක්‍රියාකාරී සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. රැස්වීමකින් තොරව ලිඛිත යෝජනා හෝ ලියවිලි සංසරණය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් හැකිතාක් දුරට වැළකීමට කටයුතු කෙරේ.	අනුකූලවී ඇත.
3 (1) (iv)	අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධන හා අවදානම් කළමනාකරණයට අදාළ කරුණු හා යෝජනා නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රවලට ඇතුළත් කිරීමේ අවස්ථාව සහතික කිරීමට පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වග බලා ගැනෙයි.	අනුකූලවී ඇත.
3 (1) (v)	සියලුම අධ්‍යක්ෂවරුන් හට සහභාගිවීමේ අවස්ථාව සලසමින් අවම වශයෙන් නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින 7 ක පූර්ව දැනුම්දීමක් ලබා දෙන බවට අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් සහතික වෙයි. සියලුම අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ කාලසීමාවක දැනුම් දීමක් සිදු කරනු ලැබේ.	අනුකූලවී ඇත.
3 (1) (vi)	නොකඩවා පූර්වගාමී රැස්වීම් 3 කට සහභාගී නොවූ හෝ මාස 12 ක කාල පරිච්ඡේදය තුල පවත්වන ලද පූර්වගාමී රැස්වීම් වලින් අවම වශයෙන් රැස්වීම් 2/3 ක් සඳහා සහභාගී වී නොමැති අධ්‍යක්ෂවරුන්ගේ අධ්‍යක්ෂ ධූරය අවලංගු වන බවට අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් වග බලා ගැනෙයි.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය පිටු අංක 168 හි දක්වා ඇත. ගත වූ මාස 12 තුල පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට සහභාගි නොවූ හෝ අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි නොවූ කිසිදු අධ්‍යක්ෂවරයෙක් නොමැත.
3 (1) (vii)	1988 අංක 30 දරන බැංකු පනතෙහි 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන ලේකම්වරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙයි.	අනුකූලවී ඇත.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය සහ අදාළ සියලු නීති හා රෙගුලාසි අනුගමනය කෙරෙන බව සහතික කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවා ලබා ගැනීමට සියලු අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා තිබිය යුතුය.	අනුකූලවී ඇත.
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යා යුතු අතර එකී වාර්තා ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට සාධාරණ කාල පරාසයක් තුල සාධාරණ දැනුම් දීමක් මත පරීක්ෂා කිරීම සඳහා විවෘතව තිබිය යුතුය.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය සිය රාජකාරි කටයුතු ඉටුකිරීමේදී සැලකිලිමත් බවින් යුතුව හා විචක්ෂණශීලීව ක්‍රියා කරන්නේද යන්න රැස්වීම් වාර්තාවලින් දැන ගත හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව ප්‍රමාණවත් පරිදි විස්තර සහිත වාර්තා තබාගත යුතුය. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සිදුකරන විවරණවල ගැඹුර ඇගයීම පිණිස නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට ද මෙකී වාර්තා යොමු කළ යුතුය. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවන් හි පහත කරුණු පැහැදිලිව ඇතුලත් විය යුතු හෝ අදාළ විය යුතු හෝ වේ. (අ) සිය විවරණයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිතා කරන ලද දත්ත හා තොරතුරුවල සාරාංශයක්, (ආ) අධ්‍යක්ෂ මණ්ඩල විසින් සලකා බලනු ලැබූ කරුණු, (ඇ) නියමිත අවධානයෙන් හා විචක්ෂණශීලී බවින් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටුකර ඇත්දැයි විදහාපාන කරුණු විමර්ශන සාකච්ඡා සහ විසංවාදී හෝ එකඟ නොවන කරුණු, (ඈ) අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අදාල නීති හා රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය පිළිබිඹු කෙරෙන සාක්ෂි සහ අදාළ විධායකයන්ගේ තහවුරු කිරීම්, (ඉ) බැංකුව නිරාවරණය වී සිටින අවදානම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති දැනුවත්භාවය හා අවබෝධය සහ සම්මත කරගෙන ඇති අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ දළ විශ්ලේෂණය, (ඊ) තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මුතීන්,	අනුකූලවී ඇත.
3 (1) (xi)	සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක විය යුතුය. බැංකුව වෙනුවෙන් ඉටු විය යුතු සිය රාජකාරී ඉටු කිරීම සඳහා යම් අධ්‍යක්ෂවරයෙකුට/අධ්‍යක්ෂවරුන්ට සහාය වනු පිණිස ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ විය යුතුය.	අනුකූලවී ඇත. සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කර ඇත.
3 (1) (xii)	සම්බන්ධිත පාර්ශ්ව හෝ වෙනත් ආයතන සමග කටයුතු කිරීමේදී හා එම ආයතන සමග ගිවිසුම්වලට එළඹීමේදී ද ආයතනය පිළිබඳව ඇති වගකීම් හා සටිටනයන් ඇතිවීමෙන් හෝ පවතින බවට හැඟෙන පරිදි කටයුතු කිරීමෙන් වැළකීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත.
3 (1) (xiii)	බැංකුවේ පාලනය හා එය යා යුතු දිශාව අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි බලාධිකාරිය යටතේ පවතින බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා නිශ්චිතව වෙන් කෙරුණු කටයුතු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවිය යුතුය.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (1) (xiv)	බැංකුව බුන්වත්වීමට ආසන්න හෝ එහි වගකීම් ඉටු කිරීමට අපොහොසත්වීමට හෝ එසේ වීමට ඉඩ ඇති බවට හෝ එහි තැන්පත්කරුවන්ට හා වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට සිදුවන බව පෙනී යන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සම්බන්ධ කිසිදු තීරණයක්/ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව ඒ බව වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය.	අනුකූලවී ඇත. අදාළ වර්ෂය තුලදී එවැනි අවස්ථාවක් පැන නැගුණේ නැත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ ප්‍රතිශතය සහ වෙනත් ආරක්ෂාකාරී පදනම් මත මූල්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති මට්ටම් වලදී බැංකුව ප්‍රාග්ධනිත බව තහවුරු කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගතයුතුය.	අනුකූලවී ඇත. නියාමන අවශ්‍යතාවන්ගේ අනුකූලතාව හා බැංකුවේ නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය හා අනෙකුත් ප්‍රඥාගෝචර පියවර අධීක්ෂණය කෙරෙනු ලැබේ. අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සමග බැංකුව අනුකූල වේ.
3 (1) (xvi)	මෙකී නියමයන් හි තෙවන නියමය හා බැංකුවේ අනුකූලතාවය විදහා දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත් කළ යුතුය.	අනුකූලවී ඇත. යහපාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ 165 වන පිටුවේ දැක්වේ.
3 (1) (xvii)	එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළයුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු අතර එවන් ඇගයීම් වල වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත.
3 (2)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා අඩු හෝ 13 ට වඩා වැඩි නොවිය යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වෙයි.
3 (2) (ii) (අ)	ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවන අධ්‍යක්ෂවරයෙකු හැරුනු කොට වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතුය.	අනුකූලවී ඇත.
3 (2) (ii) (ආ)	2008 ජනවාරි මස 1 දිනට වසර 09 සම්පූර්ණ කර ඇති හෝ 2008 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම එවන් සේවා කාලයක් සම්පූර්ණ කරන අධ්‍යක්ෂවරයෙකු හට 2009 ජනවාරි මස 1 දින සිට ඇරඹෙන ඉදිරි වසර 3 ක උපරිම කාලයක් සඳහා සේවය කළ හැකිය.	අදාළ නොවේ.
3 (2) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මුළු අධ්‍යක්ෂ අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් 1/3 නොඉක්මවන්නේ නම් බැංකුවේ සේවකයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස (මෙහි මින් මතු විධායක අධ්‍යක්ෂ ලෙස හැඳින්වෙන) පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට හැකිය. එවන් අවස්ථාවකදී විධායක අධ්‍යක්ෂ අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය.	අදාළ නොවේ.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (2) (iv)	අවම වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 1/3 ක් හෝ මින් කවර හෝ ඉහළ අගයට සරිලන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතුය.	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (අ) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කෙරෙයි. සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන හා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු වේ.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබන අවස්ථාවේදී එසේ පත් කරන ලද පුද්ගලයාද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන නිර්ණායකයන්ට අනුව පත් කරන ලද අයෙකු විය යුතුය.	අදාළ නොවේ.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් පිළිගත හැකි වෘත්තීමය පසුබිමක් ඇති සහ/හෝ උපායමාර්ග, කාර්ය සාධනය හා සම්පත් ආදී කරුණු සම්බන්ධව ස්වාධීන තීරණයන්ට එලඹිය හැකි අත්දැකීම් හා සුදුසු කුසලතාවයන්ගෙන් සපිරි පිරිසක් විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා අවශ්‍ය තොරතුරු පිටු අංක 156 සිට 159 දක්වා ඇත.
3 (2) (vii)	ඝනපුරණයට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපිරුණද සපැමිණි විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපැමිණි මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩක් නොඉක්මවයි නම් එවන් අවස්ථාවකදී නියමාකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය නොහැකිය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඝනපුරණය 4 කි. එය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩකට වඩා වැඩි වන අතර සියළුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළිදරව් කෙරෙන සියලු ආයතනික සන්නිවේදනයන්හිදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂයෙන් හඳුන්වා දිය යුතුය.	අනුකූලවී ඇත. පිටු අංක 171 සහ 245 වෙත යොමු වන්න.
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිමත්, සැලකිල්ලට භාජනය වූ හා විනිවිද භාවයෙන් යුත් කාර්ය පටිපාටියක් තිබිය යුතුය. එමෙන්ම ක්‍රමවත්ව අනුප්‍රාප්තිකයන් පත්කිරීම පිණිස ද පටිපාටියක් තිබිය යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර 8 (1) (අ) වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ විෂයභාර අමාත්‍යවරයා විසිනි.
3 (2) (x)	ක්ෂණික ලෙස පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන සියලු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන්ගේ ඡන්ද විමසීමකට භාජනය විය යුතුය.	අදාළ නොවේ.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය තනතුරින් ඉල්ලා අස්වන්නේ නම් හෝ ඉවත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, එවන් ඉල්ලා අස්වීමකට හෝ ඉවත් කරනු ලැබීමකට බලපෑ හේතු ද සමග නිවේදනය කරමින් සහ හිමිකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු වේද/නොවේද යන්න සහතික කරමින් ප්‍රකාශයක් නිකුත් කළයුතුය.	අදාළ නොවේ.
3 (2) (xii)	බැංකු අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම එකී බැංකුව, පළමුව සඳහන් කළ බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් පමණක් සිදු කළයුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සේවකයෙකු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොටස් හිමිකාරිත්වය නියෝජනය කරයි.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (3)	**අධ්‍යක්ෂවරුන්ගේ හැකියා හා යෝග්‍ය බව ඇගයීමේ නිර්ණායක**	
3 (3) (i) (අ) සහ (ආ)	අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන තැනැත්තෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවා තිබිය යුතුය.	අනුකූලවී ඇත.
3 (3) (ii)	පුද්ගලයකු බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමිද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂක ධුර නොදැරිය යුතුය.	අනුකූලවී ඇත.
3 (4)	**අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවරන ලද කළමනාකරණ කාර්යභාරය**	
3 (4) (i)	අධ්‍යක්ෂවරුන් විසින් දැනට ක්‍රියාත්මක වන බලතල පැවරීමේ ක්‍රියාපිළිවෙත සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.	අනුකූලවී ඇත.
3 (4) (ii)	සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සතු කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව අවම කිරීමට හෝ ඊට සැළකිය යුතු බාධාවක් වන මට්ටමකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට හෝ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වලට පැවරීම නොකළ යුතුය.	අනුකූලවී ඇත.
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවලට අදාළ වන ලෙස බලතල පැවරීමේ කාර්ය පිළිවෙල පවතින බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර එය සමාලෝචනය කරනු ලබයි.	අනුකූලවී ඇත.
3 (5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**	
3 (5) (i)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා වෙනම පැවතිය යුතු අතර, එකම පුද්ගලයෙකු විසින් ඉටු නොකළ යුතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාව වෙනම පුද්ගලයින් දෙදෙනෙකු විසින් ඉටු කරනු ලැබේ.
3 (5) (ii)	සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන්නේ නම් වඩාත් සුදුසුය. සභාපතිවරයා, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි සීමා නිර්ණයන් ලේඛනගත කිරීමෙන් අනතුරුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතු වේ.	අනුකූලවී ඇත. සභාපතිවරයා විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි ස්වාධීන අධ්‍යක්ෂ වරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීමට ප්‍රතිපාදන නොමැත.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි ආයතනික යහපාලන වාර්තාවෙහි, සභාපතිගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවයද, පවතින සම්බන්ධතාවල ස්වභාවයද හෙළිදරව් කළයුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ හා ප්‍රධාන විධායක නිලධාරීගේ පසුබිම පිළිබඳ තොරතුරු පිටු අංක 156 හි සඳහන් කර ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (5) (iv)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් ඉටු කරන බව හා කාර්යක්ෂමව කටයුතු කරන බව සහතික කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලු ප්‍රධාන හා අවශ්‍ය කරුණු කාලෝචිතව සාකච්ඡාවට බඳුන් කරන බවට වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් කාර්යක්ෂමව ඉටු කරන බවට වගබලා ගනියි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලුම ප්‍රධාන කරුණු කාලීන අයුරින් සාකච්ඡාවට ගැනෙයි.
3 (5) (v)	සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සැකසීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපති සතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් රැස්වීම් න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි.
3 (5) (vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනෙන කරුණු සම්බන්ධයෙන් සියලු අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ඇති බවට මෙන්ම අධ්‍යක්ෂවරුන් වෙත කලට වේලාවට ප්‍රමාණවත් තොරතුරු සැපයෙන බවටද සභාපති විසින් වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත.
3 (5) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීමට සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීමට සහ බැංකුවේ උපරිම යහපත පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම සභාපති විසින් කළ යුතුය.	අනුකූලවී ඇත. සභාපතිගේ භූමිකාව සම්බන්ධ ඇගයීම හා අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය සම්බන්ධ සමස්ත ඇගයීම අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත.
3 (5) (viii)	විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙතින් කාර්යක්ෂම දායකත්වයක් ලබා ගැනීම උදෙසා සභාපති විසින් පහසුකම් සැලසිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සඵලදායි සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.	අදාළ නොවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයෙක් නොමැති හෙයින් අදාළ නොවේ.
3 (5) (ix)	සභාපති ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් සම්බන්ධව හෝ කිසිදු ආකාරයකින් අනෙකුත් විධායක රාජකාරී කටයුතු සෘජු අධීක්ෂණයට ලක්කිරීමෙහි නොයෙදිය යුතුය.	අනුකූලවී ඇත සභාපතිවරයා විධායක නොවන මට්ටමෙන් කටයුතු කරන අතර ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් අධීක්ෂණය කිරීම සඳහා විධායක කාර්යයන්හි නියුක්ත නොවේ.
3 (5) (x)	කොටස්හිමිකරුවන් සමග සඵලදායි සන්නිවේදනයක් පවත්වා ගැනීමට යෝග්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමිකරුවන්ගේ මත/අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කෙරෙන බවට සභාපති වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කෙරෙන තැනැත්තෙකු මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේදී කොටස් හිමිකරුවන් නියෝජනය කෙරෙයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරියා, බැංකුවේ එදිනෙදා සිදුකෙරෙන මෙහෙයුම් හා ව්‍යාපාර කළමනාකරණයේ මුදුන් මට්ටමේ භාරකාරත්වය දරන විධායක ලෙස කටයුතු කරයි.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ කමිටු**	
3 (6) (i)	3 (6) (ii), 3 (6) (iii) 3 (6) (iv) සහ 3 (6) (v) යන නියමයන් මගින් දක්වා ඇති පරිදි සෑම බැංකුවක්ම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු 4 ක් පිහිටු විය යුතුය. ඒ සෑම කමිටුවක්ම සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. සියළුම කමිටු පත් කිරීම ලේකම් විසින් කළ යුතුවේ.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු 06 ක් පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කමිටු හයෙහිම ලේකම් ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ හා උපාය මාර්ගික කමිටුව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සභාපතිවරුන් හරහා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.
3 (6) (ii)	**විගණන කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වේ.**	
3 (6) (ii) (අ)	කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණයේ සහ/හෝ විගණනයෙහි සුදුසුකම් හා අත්දැකීම් සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	අදාළ නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති, විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකි. සියළුම අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව පත් කෙරේ.
3 (6) (ii) (ආ)	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.	අනුකූලවී ඇත.
3 (6) (ii) (ඇ)	පහත කරුණු සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. (i) අදාළ නීතිවලට අනුකූල වෙමින් විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම. (ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම. (iii) අදාල ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම සහ (iv) විගණන හවුල්කරු සමග බැඳීම වසර 5 නොඉක්මවයි නම් සහ පූර්ව කාලසීමාව සම්පූර්ණ කළ දින පටන් වසර 3 ක් ඉකුත්වීමට ප්‍රථම අදාළ විගණන හවුල්කරු හා යලි විගණන බැඳීමකට ඇතුලු නොවන්නේ නම් සේවා කාලය, විගණන ගාස්තු හා විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහකිරීම.	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වශයෙන් කටයුතු කරයි. එබැවින් සඳහන් කර ඇති සියලුම කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත. අදාළ නොවේ.
3 (6) (ii) (ඈ)	අදාළ වන ප්‍රමිති සහ යහභාවිතයන්ට අනුව විගණන ක්‍රියාවලින්හිදි බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂයමූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කමිටුව විසින් සමාලෝචනයට හා අධීක්ෂණයට බඳුන් කළයුතුය.	අනුකූලවී ඇත. විගණකාධිපති බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන බැවින් ස්වාධීනත්වය සහ විෂයමූලිකත්වය පවත්වාගැනීම සිදු වෙයි. විගණන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී රජයේ විගණනකාධිකාරී සමග සාකච්ඡා කරනු ලැබේ.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (6) (ii) (ඉ)	විගණන නොවන සේවා ලබාදීම සඳහා බාහිර විගණකවරයෙකු යොදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළයුතුය.	අදාළ නොවේ.
3 (6) (ii) (ඊ)	කමිටුව විසින් විගණනය ඇරඹීමට ප්‍රථම කමිටුව විසින් විගණනයේ ස්වභාවය හා විෂය පථය පිළිබඳ බාහිර විගණකවරුන් සමග සාකච්ඡා කර අවසන් නිගමනයකට පැමිණිය යුතුය.	අදාළ නොවේ. විගණනයේ විෂය පථය හා සීමාව බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන විගණකාධිපති විසින් නිර්ණය කරනු ලබයි.
3 (6) (ii) (උ)	බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල, වාර්ෂික වාර්තාවේ ගිණුම්වල හා හෙළිදරව් කිරීම පිණිස සකසා ඇති ත්‍රෛමාසික වාර්තාවන්හි විශ්වසනීය බව හා ඒවායෙහි අන්තර්ගත සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ තීරණ අධීක්ෂණය කරනු පිණිස කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනයට බඳුන් කළ යුතුය.	අනුකූලවී ඇත. විගණන කමිටුව විසින් ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සහ හෙළිදරව් කිරීම පිණිස පිළියෙල කර ඇති බැංකුවේ වාර්ෂික වාර්තාව, ප්‍රකාශයට පත්කිරීමට සූදානම් අවස්ථාවේදී සමාලෝචනයට බඳුන් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අවධානය පිණිස අභ්‍යන්තර විගණන අංශය විසින් ලබාදෙන සමාලෝචන වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශයන්හි ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්කම්, ප්‍රධාන තීරණාත්මක ක්ෂේත්‍රයන්හි විචල්‍යයන් ආදිය ඇතුළත් වේ.
3 (6) (ii) (ඌ)	අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ප්‍රශ්න හා ගැටලු සහ ඒ කරුණු ඇතුළුව විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන කරුණක් කමිටුව විසින් සාකච්ඡා කළයුතුය.	අනුකූලවී ඇත.
3 (6) (ii) (එ)	කමිටුව විසින් බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනයට ලක් කල යුතුය.	අනුකූලවී ඇත. මුදල් පනතේ 14 (2) (ඇ) සහ 13 (7) (අ) යන වගන්ති යටතේ නිකුත් කළ බාහිර විගණක වාර්තාව සහ කළමනාකරණ ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් වාර්ෂිකව සමාලෝචනය කෙරෙයි.
3 (6) (ii) (ඒ)	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් කමිටුව විසින් පහත සඳහන් පියවර ගත යුතුය.	
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත්, කාර්ය භාරය හා විෂයපථය ආදියෙහි ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය අධිකාරී බලය දෙපාර්තමේන්තුව සතුව පවතින බවට තෘප්තිමත් වීම.	අනුකූලවී ඇත.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටක අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත යෝග්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.	අනුකූලවී ඇත.
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කිසියම් කාර්ය සාධන ඇගයීමක් සමාලෝචනය කිරීම.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
	(iv) අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා පත්කළ ප්‍රධානියාගේ, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පත්වීමක් හෝ සේවය අවසන් කිරීමක් නිර්දේශ කිරීම හා කුලී පදනම මත සේවය සපයන ආයතන පත් කිරීම/ඉවත් කිරීම නිර්දේශ කිරීම.	අනුකූලවී ඇත. වර්ෂය තුළදී එවැනි අවස්ථා උදා වී නැත.
	(v) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ වෙනත් සමාගම් හරහා සේවා සපයන්නන් ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කෙරෙන බවට වග බලා ගැනීම සහ එලෙස ඉල්ලා අස්වූ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්හට සහ බාහිර සමාගම් හරහා සේවා සපයනු ලබන සේවකයින්හට ඔවුන්ගේ ඉල්ලා අස්වීම් සම්බන්ධ හේතු සැපයීමට අවස්ථාව සැපයීම.	අනුකූලවී ඇත.
	(vi) අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනව සිදුකරනු ලබන බවට සහතිකවීම වස් එහි කටයුතු අපක්ෂපාතීව, ප්‍රවීනත්වයකින් හා නිසි වෘත්තීමය සැලකිල්ලකින් යුතුව සිදු කිරීම.	අනුකූලවී ඇත.
3 (6) (ii) (ඔ)	කමිටුව විසින් සිදුකරන අභ්‍යන්තර විමර්ශනවල මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සැලකිල්ලට ගත යුතුය.	අනුකූලවී ඇත. කමිටුව විසින් අභ්‍යන්තර විමර්ශනවලදී සිදු කරන ලද මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත. පිටු අංක 190 හි ඇති කමිටු වාර්තාව වෙත යොමු වන්න.
3 (6) (ii) (ඕ)	ප්‍රධාන මූල්‍ය නිලධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙකු සාමාන්‍යයෙන් රැස්වීම්වලට සහභාගී වෙයි. විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව කමිටුව විසින් බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් රැස්වීම් 2 ක් හෝ පවත්වා ඇත.	අනුකූලවී ඇත. 2017 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් රැස්වීම් වාර 10 ක් පවත්වා ඇති අතර, රැස්වීම් 08 ක් සඳහා විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු සහභාගිවී ඇත. සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (6) (ii) (ක)	කමිටුවලට, (i) කමිටුවේ බල ක්ෂේත්‍රයට අයත් ඕනෑම කරුණක් පිළිබඳව විමර්ශනය කිරීමේ පැහැදිලි බලයක්; (ii) ඒ සඳහා අවශ්‍ය සම්පත්; (iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව සහ (iv) අවශ්‍ය විටක අදාළ අත්දැකීම් සහිත බාහිර පාර්ශ්වයන්ට ආරාධනා කිරීමේ හා බාහිර පාර්ශ්වයන් වෙතින් වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ අධිකාරිය තිබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට ඕනෑම කරුණක් විමර්ශනය කිරීමට, තොරතුරු ලබාගැනීමට, වෘත්තීමය උපදෙස් ලබාගැනීමට, එහි කාර්යයන් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සපුරා ගැනීම ආදිය සඳහා අවශ්‍ය බලතල ලබා දී ඇත. පිටු අංක 190 හි සඳහන් කමිටු වාර්තාව බලන්න.
3 (6) (ii) (ග)	සාකච්ඡා කළයුතු කරුණු සම්බන්ධව නිසි දැනුම්දීමකින් පසුව නිරතුරුව කමිටුව රැස්ව, එහි වගකීම් හා රාජකාරි ඉටු කිරීම සම්බන්ධ නිගමන වාර්තාකර තබා ගත යුතුය.	අනුකූලවී ඇත. වර්ෂය තුල කමිටුව 10 වතාවක් රැස් වී තිබෙන අතර, ගනු ලැබූ තීරණ වාර්තා කර පවත්වාගෙන ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (6) (ii) (ජ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය.	අනුකූලවී ඇත. යොමු වන්න;
	(i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය පථය පිටු අංක 168 හි ඇතුලත් වේ.
	(ii) වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ	වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව පිටු අංක 171 හි ඇතුලත් වේ.
	(iii) ඒ රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ විස්තර	අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 171 හි දැක්වේ.
3 (6) (ii) (ට)	කමිටුවේ ලේකම් සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයෙහි ප්‍රධානී වන අතර, කමිටු රැස්වීම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරන අතර විස්තරාත්මක කමිටු වාර්තා පවත්වාගෙනයාම සිදු කෙරේ.
3 (6) (ii) (ඩ)	මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතුවලදී සිදුවිය හැකි විෂමාචාර සම්බන්ධයෙන් සේවකයින්ට සිය රහස්‍යභාවය රැකගනිමින් කරුණු දැක්විය හැකි ආකාරය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනය කළයුතුය. ඒ අනුව, එවන් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන හා සාධාරණ විමර්ශන පැවැත්වීම සඳහා සුදුසු පියවර ගන්නා බවටත්, බාහිර විගණකවරුන් සමග බැංකුව පවත්වන සබඳතා අධීක්ෂණය සඳහා වන ප්‍රධාන නියෝජිත අධිකාරිය ලෙස ක්‍රියා කිරීමටත් කමිටුව වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. මෙම සියළුම අංශයන් ආවරණය වන ක්‍රියාවලියක් වන අයථා සිදුවීම් හෙළිකිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත අතර (විස්ට්ල් බ්ලෝවර්) වැදගත් සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඒ ඔස්සේ සොයා බැලීම සඳහා ඉදිරිපත් කෙරේ. බාහිර විගණක සමඟ බැංකුවේ ඇති සම්බන්ධතාවයන් පාලනය කරන මූලිකම අංශය අධ්‍යක්ෂ විගණන කමිටුවයි.
3 (6) (iii)	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.**	
3 (6) (iii) (අ)	බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමණාකාරීත්වයට අදාළ පිරිස් වෙත අදාළ පාරිශ්‍රමික පිළිබඳ ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම.	අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසිනි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වේතන සාමූහික එකඟතා ගිවිසුම මත සහ බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් තීරණය කරනු ලබයි.
3 (6) (iii) (ආ)	කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක ලබාදිය යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව සියලුම දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන හෙයින්ද පත් කරනු ලබන්නේ ඇමතිවරයා විසින් වන හෙයින්ද අධ්‍යක්ෂවරුන්ට මෙය අදාළ නොවේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහාවූ ඉලක්ක හා අරමුණු සකස් කරන්නේ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම පදනම් කරගෙන වන අතර ඒවා ප්‍රධාන කාර්යසාධක දර්ශක හා සම්බන්ධ වේ.
3 (6) (iii) (ඇ)	කමිටුව විසින්, නිර්ණය කරන ලද ඉලක්ක වලට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් වල කාර්ය සාධනය කලින්කලට ඇගයීම සිදු කළ යුතු අතර චේතන, ප්‍රතිලාභ හා කාර්ය සාධනය මත ලබාදෙන වෙනත් දිරිදීමනා සංශෝධනය කිරීමේදී මූලික කරගත යුතු පදනම තීරණය කළ යුතුය.	අනුකූලවී ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (6) (iii) (ඈ)	ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී විය යුතුය.	අනුකූලවී ඇත.
3 (6) (iv)	**නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.**	
3 (6) (iv) (අ)	කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියෙකු සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් තෝරා ගැනීම/පත් කිරීම සඳහා කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කළයුතුය.	අදාළ නොවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. 11 වගන්තිය – අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයෙකු එහි සභාපති වශයෙන් පත් කළයුතු වේ. 26 වගන්තිය – අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙකු බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය. ප්‍රධාන කළමනාකාරිත්වයට අදාල පිරිස් පත් කිරීම අනුකූලයි. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කිරීමේ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලැබේ.
3 (6) (iv) (ආ)	වත්මන් අධ්‍යක්ෂවරුන් යළි තෝරා පත් කිරීම, කමිටුව විසින් සලකා බලා නිර්දේශ කිරීම (හෝ නොකිරීම) සිදු කරනු ලබයි.	අදාළ නොවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කෙරෙයි.
3 (6) (iv) (ඇ)	ප්‍රධාන විධායක නිලධාරී තනතුරට සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු සඳහා තෝරා පත් කිරීමේ හෝ උසස්කිරීමේ සුදුසුකම් සලකා බැලීමේ නිර්ණායක, කමිටුව විසින් සැපයිය යුතුය.	අනුකූලවී ඇත.
3 (6) (iv) (ඈ)	පනතේ සඳහන් පරිදි හා 3 (3) නියමයෙහි අන්තර්ගත නිර්නායක මගින් නිශ්චිත ලෙස දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු හොබවන පිරිස ඊට සුදුසු හා යෝග්‍ය බවට කමිටුව විසින් සහතික විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිළධාරීගේ අත්සන් සහිත දිවිරුම් ප්‍රකාශ සහ සහතික කිරීමේ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් භාරගනී. ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස්වල මෙම ප්‍රකාශ, මානව සම්පත් අංශය විසින් භාරගන්නා අතර යෝග්‍යතාව ඇගයීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරෙයි.
3 (6) (iv) (ඉ)	විශ්‍රාම යාමට නියමිත අධ්‍යක්ෂවරුන් /ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් සඳහා අනුප්‍රාප්තික වැඩ පිළිවෙලක් සහ නව විශේෂඥතාවය/අතිරේක අවශ්‍යතා පිළිබඳව සලකා බලා කමිටුව විසින් වරින්වර නිර්දේශ ඉදිරිපත් කළයුතුය.	අනුකූලවී ඇත. සභාපති, අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන විධායක නිලධාරියාගේ පත්වීම් සම්බන්ධයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන සලසා ඇත. ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.
3 (6) (iv) (ඊ)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපති ධුරය දැරිය යුතුය. ආරාධනය පිට ප්‍රධාන විධායක නිලධාරී හට රැස්වීම් වලට සහභාගි විය හැකිය.	අදාළ නොවේ. කමිටුවේ සභාපතිත්වය දරන්නේ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු විසිනි. සියළුම අධ්‍යක්ෂවරු ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු වන හෙයින් වඩාත්ම සුදුසු අධ්‍යක්ෂවරයා මූලසුනට පත් කෙරේ.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (6) (v)	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වේ.**	
3 (6) (v) (අ)	ප්‍රුඵල් අවදානම් ප්‍රභේද අධීක්ෂණය කරනු ලබන ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස්, ප්‍රධාන විධායක නිලධාරී සහ අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් කමිටුව සමන්විත විය යුතුය.	අනුකූලවී ඇත.
3 (6) (v) (ආ)	කමිටුව විසින් බැංකුවට ඇති සියලුම අවදානම්, එනම්, ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම නිසි අවදානම් දර්ශක හා කළමනාකාරීත්ව තොරතුරු හරහා මාසිකව ඇගයිය යුතුය. අනු සමාගම් හා ඒකාබද්ධ සමාගම්වල අවදානම් කළමනාකරණය, බැංකු පදනම හා සමූහ පදනම යන දෙයාකාරයෙන්ම සිදු කරනු ලබයි.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අවදානම් රුචි සීමා මත පදනම්ව අවදානම් වාර්තා ත්‍රෛමාසිකව ද මාසිකව ද අවදානම් කළමනාකරණ අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.
3 (6) (v) (ඇ)	ණය කමිටුව, වත්කම් වගකීම් කමිටුව ආදී සියලුම කළමනාකරණ මට්ටම්වල කමිටුවල නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා, කමිටුව විසින් සමාලෝචනය කෙරෙන අතර වරින්වර අවදානම් දර්ශක පිළිබඳ වාර්තා කරනු ලබයි.	අනුකූලවී ඇත.
3 (6) (v) (ඈ)	නිශ්චිත අවදානම් වලින් ඇතිවන ප්‍රතිඵල අවම කිරීම සඳහා කමිටුව විසින් නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබයි.	අනුකූලවී ඇත.
3 (6) (v) (ඉ)	යාවත්කාලීන කළ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු අංශ ඇගයීම සඳහා කමිටුව අවම වශයෙන් ත්‍රෛමාසිකව රැස්විය යුතුය.	අනුකූලවී ඇත. අදාළ වර්ෂය තුල කමිටුව පස් වතාවක් රැස්වී තිබේ. රැස්වීම් පිළිබඳ විස්තර හා පැමිණීම පිටු අංක 171 හි දක්වා ඇත.
3 (6) (v) (ඊ)	කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි සහ/හෝ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ විසින් නියම කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට හා ඒ සම්බන්ධයෙන් නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ට එරෙහිව කමිටුව විසින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූලවී ඇත. වසර තුළ එවන් අවශ්‍යතාවයක් පැන නොනැගුණි.
3 (6) (v) (උ)	කමිටුව විසින් සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ/ හෝ උපදෙස් සඳහා අවදානම් ඇගයීම් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.	අනුකූලවී ඇත.
3 (6) (v) (ඌ)	නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාර මෙහෙයුම්වල සියලු ක්ෂේත්‍ර පිළිබඳ අනුමත වූ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් අතුරෙන් තෝරාගන්නා ලද කැපවීමෙන් යුතු අනුකූලතා නිලධාරියකු විසින් අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු අතර, ඒ පිළිබඳව වරින්වර කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූලවී ඇත. අනුකූලතා නිළධාරියෙකු පත් කිරීම ඔස්සේ බැංකුවේ අනුකූලතා ක්‍රියාවලිය ස්ථාපිත කර තිබේ. අනුකූලතා නිළධාරියා විසින් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට බැංකුවේ අනුකූලතාවය හා සම්බන්ධ වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (7)	**සම්බන්ධිත පාර්ශ්වවල ගනුදෙනු**	
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු හා බැංකුව අතර කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් පැන නැගිය හැකි ඕනෑම ආකාරයේ අනිසි ඝට්ටනයක් වැළැක්වීමට අවශ්‍ය පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත යුතුය.	අනුකූලවී ඇත.
3 (7) (ii)	අදාළ පාර්ශවව සමග සිදු කරන ගනුදෙනු වල ස්වභාවය මේ නිර්දේශය තුලින් ආවරණය විය යුතුය.	සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් යටතේ මේ පිළිබඳ තොරතුරු සටහන් අංක 40 හි දක්වා ඇත.
3 (7) (iii)	ඉහත 3 (7) (i) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශ්වයන්ට ලබා දෙන සැලකීමට වඩා වැඩි සැලකීමක් එවන් පාර්ශ්ව වෙත පිරිනැමෙන ආකාරයෙන් ආශ්‍රිත පාර්ශ්ව හා ගනුදෙනුවල නියැලීමෙන් වළකින බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. එවැනි ගනුදෙනු හඳුනාගැනීමට කටයුතු කරන බවට අධ්‍යක්ෂවරුන්ගෙන් ප්‍රකාශ ලබා ගැනේ. ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශ්වයන්ට වඩා වැඩි සැලකීමක් ලබාදෙන ගනුදෙනු ග්‍රහණය කර ගැනීමට ක්‍රමවේදයක් ද සංවර්ධනය කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට කලින් කලට ඒ පිළිබඳව වාර්තා කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික පිළිවෙලට අනුව අදාළ පාර්ශ්ව සමග කරන ලද ගනුදෙනු (ඇතොත්) ඒ පිළිබඳ පිටු අංක 345 හි ඇතුලත් මූල්‍ය ප්‍රකාශනයේ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ හෙළිදරව් කිරීම් මැයෙන් සටහන් අංක 40 මගින් දක්වා ඇත.
3 (7) (iv)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අදාළ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු පිරිසකගේ ඡන්දයෙන් අනුමැතිය ලැබී ඇති විට හැර බැංකුවක් එහි අධ්‍යක්ෂවරයෙකුට හෝ එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට කිසිදු ආකාරයක ප්‍රදානයක් ලබාදීමට කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.
3 (7) (v) (අ)	බැංකුවක් මගින්, යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ පුද්ගලයෙකුගේ සැලකිය යුතු උනන්දුවක් ඇති අරමුණක් වෙනුවෙන් කිසියම් ප්‍රදානයක් ලබාදී ඇති විටක, පසු කාලීනව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වුවහොත් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමෙන් වසරක් ඇතුළත ඒ සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද හැකි වන පරිදි සුදුසු ඇපකරයක් ලබා ගැනීමට බැංකුව කටයුතු කළ යුතුය	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.
3 (7) (vi)	බැංකුවේ කාර්යමණ්ඩලයට අදාළ වන යෝජනා ක්‍රමයක් හැරුණු කොට වෙනත් කිසිදු ආකාරයක ප්‍රදානයක් හෝ "වඩා වාසිදායක සැලකීමක්" ලබාදීමට බැංකුවක් කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.
3 (7) (vii)	ඉහත 3 (7) (v) සහ 3 (7) (vi) යන නියමයන් යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද ප්‍රදානයක් හෝ එවැනි ප්‍රදානයක කිසිදු කොටසක් හෝ ඊට අදාළ වන කිසිදු පොළියක් හෝ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රේෂණය නොකළ යුතු අතර එවැනි අනුමැතියකින් තොරව සිදු කරනු ලබන ඕනෑම ප්‍රේෂණයක් බල රහිත හා ඵල රහිත වේ.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (8)	**හෙළිදරව් කිරීම්**	
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු සම්බන්ධයෙන් සහතික විය යුතුය.	
3 (8) (i) (අ)	අධීක්ෂණ හා නියාමන අධිකාරින් විසින් නිර්දේශ කරනු ලබන ආකෘති වලට අනුකූල වන ලෙස සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළ වන පරිදි වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශ සහ තෙමාසික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම සහ	අනුකූලවී ඇත.
3 (8) (i) (ආ)	එවන් ප්‍රකාශ සංක්ෂිප්තව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුවත්පත්හි පළ කිරීම.	අනුකූලවී ඇත.
3 (8) (ii)	පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බවට සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	
3 (8) (ii) (අ)	නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන උපදෙස් වලට අනුව විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට සඳහන් කෙරෙන ප්‍රකාශයක්.	අනුකූලවී ඇත. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ වාර්ෂික වාර්තාවේ පිටු අංක 241 වෙත යොමුවන්න.
3 (8) (ii) (ආ)	මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීම අරමුණු කරගනිමින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කෙරෙන බව තහවුරු කිරීම සඳහා වන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූලවී ඇත. පිටු අංක 250 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සඳහා අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයට යොමුවන්න.
3 (8) (ii) (ඇ)	ඉහත 3 (8) (ii) (ආ) නියමයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාව පිළිබඳ 2008 දෙසැම්බර් 31 දිනට පසුව පිළියෙල කර ප්‍රකාශයට පත් කළ බාහිර විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගත් බවට සහතිකයක්.	අනුකූලවී ඇත. පිටු අංක 252 හි ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන තහවුරු වාර්තාවට යොමුවන්න.
3 (8) (ii) (ඈ)	අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු	අනුකූලවී ඇත.
	(i) නම්, නිසි යෝග්‍යතාවය සහ දේපල	පිටු අංක 156 හි අධ්‍යක්ෂවරුන් පිළිබඳ පසුබිම් තොරතුරු දක්වා ඇත.
	(ii) බැංකුව සමග ඇති ගනුදෙනු සහ,	පිටු අංක 348 හි ඇති මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 40(d) සටහනට යොමුවන්න.
	(iii) බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික	පිටු අංක 348 හි ඇති මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 40(d) සටහනට යොමුවන්න.
3 (8) (ii) (ඉ)	3 (7) (iii) හි නියම කර ඇති පරිදි, සම්බන්ධිත පාර්ශ්වයන්ගේ එක් එක් කොටසකට ලබාදී ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන. අදාළ පාර්ශ්වවල එක් එක් කොටසකට ප්‍රදානය කර ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළ යුතුය.	අනුකූලවී ඇත බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස පිරිනමා ඇති ශුද්ධ ප්‍රදාන පිළිබඳව පිටු අංක 348 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ අංක 40(e) සටහනෙන් ඉදිරිපත් කර ඇත.

අංශය	මූලධර්මය	අනුකූලතා මට්ටම 2017
3 (8) (ii) (ඊ)	බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වෙත ගෙවන ලද වේතන වල සමුච්චිත අගය සහ වේතන ආදී පුළුල් වර්ගීකරණ යටතේ දක්වා ඇති බැංකුව හා එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් අතර සිදු කෙරුණු ගනුදෙනුවල සමුච්චිත අගය.	අනුකූලවී ඇත. පිටු අංක 348 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ අංක 40(d) සටහන මගින් අදාළ විස්තර දක්වා ඇත.
3 (8) (ii) (උ)	ආයතනික පාලන වාර්තාවන්හි අනුකූලතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගත් බවට සහතිකය.	අනුකූලවී ඇත. බාහිර විගණකවරයාගේ සහතිකය ලබා ගෙන තිබෙන අතර එය පිටු අංක 255 හි දක්වා ඇත.
3 (8) (ii) (ඌ)	දූරදර්ශී උපදෙස්, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සහ කිසියම් සැළකිය යුතු අනුකූල නොවීමේ අවස්ථාවක් නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග යනාදිය ඇතුලත් වාර්තාවක්	අනුකූල වී ඇත. කරුණාකර පිටු අංක 248 හි සඳහන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයට යොමු වන්න.
3 (8) (ii) (එ)	බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුලුහුඩුකම් පිළිබඳ නියාමන හා අධීක්ෂණ කරුණු හෝ බැංකු අධීක්ෂණ අංශයෙහි අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන ලද, මෙකී නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා සහ එසේ මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි නියම කරන ලද එවැනි කරුණු මෙන්ම එම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලැබූ පියවර ඇතුළත් ප්‍රකාශයක්	අදාළ නොවේ. අදාළ වර්ෂය තුළදී මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාව වෙත කිසිදු හෙළිදරව්වක් කළ යුතු බවට උපදෙස් දී නොමැත.
3 (9)	**සංක්‍රාන්තික හා වෙනත් පොදු ප්‍රතිපාදන**	අනුකූල වී ඇත. බැංකුව විසින් අදාළ සංක්‍රාන්තික ප්‍රතිපාදන සමග අනුකූල වී ඇත.

2007 අංක 12 දරන ආයතනික පාලන නියෝගය හා අනුකූලවීමේ අවශ්‍යතාව.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරන නියෝගය හා අනුකූලවීමේ අවශ්‍යතාව සපුරනු වස්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් නිකුත් කළ ක්‍රියා පටිපාටීන් හි නියුතුවීම් වලට යොදාගත හැකි සම්බන්ධිත සේවාවන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 හි දැක්වෙන ප්‍රතිපත්ති අනුව විගණකාධිපති විසින් කාර්ය පටිපාටීන් ක්‍රියාත්මක කර ඇත. 2018 මැයි මස 2 වෙනි දිනැති ඔහුගේ වාර්තාව මගින් දක්වන ලද කරුණු හා ඉහත හෙළිදරව් කරන ලද කරුණු අතර, සැළකිය යුතු වෙනස්කම් නොවූ අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත වාර්තා කරන ලද කරුණු හා සැලකිය යුතු පරස්පරතාවන් හඳුනා නොගැනුණි.

එම්.ඒ.සී.මුහන්දිරම්
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

අස්චින් ද සිල්වා
සභාපති

2018 මැයි මස 2 වන දින
කොළඹදිය.

"අපගේ උසස් තත්ත්වයෙන් යුතු සේවාවන් පුළුල් ශාඛා ජාලයන් සහ ඩිජිටල් කරලියන් හරහා ලබාදෙන අතර, මිලියන 19.9 කට වැඩි ගනුදෙනුකාර ගිණුම් පදනමට පහසු, නිරවද්‍ය, සෘජු බැඳියාවක් එතුලින් ලබා දෙන්නෙමු."

මධ්‍යම ප්‍රාදේශිකය →

1. අලවතුගොඩ
2. බණ්ඩාරවෙල
3. දඹුල්ල
4. දෙල්තොට
5. දිගන
6. ගලගෙදර
7. ගලේවෙල
8. ගම්පොළ
9. ගෙලිඔය
10. ගිනිගත්හේන
11. හාලි-ඇළ
12. හැටන්
13. මහනුවර
14. මහනුවර දෙවන ශාඛාව
15. මහනුවර නගර මධ්‍යස්ථානය
16. කටුගස්තොට
17. මහියංගනය
18. මුල්ගම්පොළ
19. නාවුල
20. නාවලපිටිය
21. පස්සර
22. පේරාදෙනිය
23. පිලිමතලාව
24. පූන්ඩලුඔය
25. පුස්සැල්ලාව
26. රාගල
27. රිකිල්ලගස්කඩ
28. තලවකැලේ
29. වත්තේගම
30. වැලිමඩ

නැගෙනහිර ප්‍රාදේශිකය →

31. අක්කරෙයිපත්තු
32. අම්පාර
33. ආර්යම්පති
34. බඩල්කුඹුර
35. බිබිල
36. බුත්තල
37. චෙන්කලඩි
38. හිඟුරක්ගොඩ
39. කල්මුණේ
40. කලවන්චිකුඩි
41. කන්තලේ
42. මැදිරිගිරිය
43. පළගාමම්
44. පෙරියකල්ලාර්
45. පොතුවිල්
46. සමන්තුරේ
47. සියඹලාන්ඩුව
48. තම්බිලුවිල්
49. උහන
50. වාලච්චේනය
51. වැල්ලවාය

උතුරු ප්‍රාදේශිකය →

52. අච්චුවේලි
53. චන්කානෙයි
54. චාවාකච්චේරි
55. චුන්නාකම්
56. හොරොවිපතාන
57. යාපනය
58. කහටගස්දිගිලිය
59. කරෙයිනගර්
60. කයිට්ස්
61. කැබිතිගොල්ලෑව
62. කිලිනොච්චිය
63. කොඩිකාමම්
64. කෝපායි
65. මල්ලාවි
66. මනිපායි
67. මැදවච්චිය
68. මුලතිව්
69. නෙල්ලිඇඩි
70. පේදුරුතුඩුව
71. තිරුනල්වේලි
72 වන්කාලෙයි

වයඹ ප්‍රාදේශිකය →

73. අලව්ව
74. ආනමඩුව
75. අනුරාධපුරය
76. බිංගිරිය
77. හලාවත
78. දන්කොටුව
79. එප්පාවල
80. ගලෙන්බිඳුනුවැව
81. ගල්ගමුව
82. ගල්නෑව
83. ගිරිඋල්ල
84. හෙට්ටිපොල
85. ඉබ්බාගමුව
86. කැකිරාව
87. කුලියාපිටිය
88. කුරුණෑගල
89. මාදම්පේ
90. මාහෝ
91. මාරවිල
92. මාවතගම
93. මැල්සිරිපුර
94. නාරම්මල
95. නිකවැරටිය
96. නොච්චියාගම
99. පොල්ගහවෙල
98. පුත්තලම
99. රිදීගම
100. තඹුත්තේගම
101. වාරියපොළ
102. වෙන්නප්පුව

සබරගමුව ප්‍රාදේශිකය →

103. අරනායක
104. අවිස්සාවේල්ල
105. බදුරලිය
106. බලත්ගොඩ
107. බුලත්කොහුපිටිය
108. බුලත්සිංහල
109. දැරණියගල
110. ඇඹිලිපිටිය
111. ගොඩකවෙල
112. හංවැල්ල
113. හොරණ
114. ඉංගිරිය
115. කහවත්ත
116. කලවාන
117. කෑගල්ල
118. කිරිඇල්ල
119. කුරුවිට
120. මාවනැල්ල
121. නිවිතිගල
122. පැල්මඩුල්ල
123. රඹුක්කන
124. රත්නපුර
125. රුවන්වැල්ල
126. වරකාපොල
127. යටියන්තොට

දකුණු ප්‍රාදේශිකය →

128. අකුරැස්ස
129. අම්බලන්ගොඩ
130. අඟුණකොළපැලැස්ස
131. බද්දේගම
132. බෙලිඅත්ත
133. දෙණියාය
134. දෙවිනුවර
135. දික්වැල්ල
136. ඇල්පිටිය
137. ගාල්ල
138. හබරාදුව
139. හක්මන
140. හම්බන්තොට
141. හික්කඩුව
142. ඉමදුව
143. කඹුරුපිටිය
144. කරාපිටිය
145. කැකණදුර
146. මාතර
147. මිද්දෙණිය
148. මොරවක
149. නෙළුව
150. පිටිගල
151. සූරියවැව
152. තංගල්ල
153. තිස්සමහාරාමය
154. උඩුගම
155. ඌරගස්මන්හන්දිය
156. ඌරුබොක්ක
157. වලස්මුල්ල
158. වීරකැටිය
159. වැලිගම

බස්නාහිර 1 ප්‍රාදේශිකය →

160. බොරැල්ල
161. දෙල්ගොඩ
162. දිවුලපිටිය
163. ගම්පහ
164. ගනේමුල්ල
165. ප්‍රධාන කාර්යාලයීය ශාඛාව
166. ජා-ඇල
167. කඩවත
168. කඩුවෙල
169. කඳාන
170. කටුනායක
171. කැළණිය
172. කිරිබත්ගොඩ
173. කිරිඳිවැල
174. කොච්චිකඩේ
175. කොටහේන
176. මහබාගේ
177. මාලිගාවත්ත
178. මිනුවන්ගොඩ
179. මීරිගම
180. මුල්ලේරියාව නවනගරය
181. මෝදර
182. නාරාහේන්පිට
132. මීගමුව
184. නිට්ටඹුව
185. පැලියගොඩ
186. පිටකොටුව
187. පූගොඩ
188. රද්දොළුගම
189. රාගම
190. වේයන්ගොඩ
191. වත්තල
192. වැල්ලම්පිටිය
193. යක්කල

බස්නාහිර 2 ප්‍රාදේශිකය →

194. අළුත්ගම
195. අතුරුගිරිය
196. බම්බලපිටිය
199. බණ්ඩාරගම
198. බත්තරමුල්ල
199. බේරුවල
200. බොරලැස්ගමුව
201. නගර ශාඛාව
202. සිටි ප්ලස්
203. දෙහිවල
204. දෙල්කඳ
205. හෝමාගම
206. කහතුඩුව
207. කලුබෝවිල
208. කලුතර
209. කටුබැද්ද
210. කොල්ලුපිටිය දෙවන ශාඛාව
211. කෙට්ටාව
212. මහරගම
213. මාලඹේ
214. මතුගම
215. මීගොඩ
216. මොරටුමුල්ල
217. මොරටුව
218. ගල්කිස්ස
219. නාවල
220. නුගේගොඩ
221. පානදුර
222. පිළියන්දල
223. පිළියන්දල දෙවන ශාඛාව
224. පිටකෝට්ටේ
225. පුවක්අරඹ
226. රාජගිරිය
227. තලවතුගොඩ
228. වාද්දුව
229. වැල්ලවත්ත
230. ලෝක වෙළඳ මධ්‍යස්ථානය

තැපැල් පරිපාලනය →

231. අම්බලන්තොට
232. අම්පාර දෙවන ශාඛාව
233. අනුරාධපුර දෙවන ශාඛාව
234. බදුල්ල
235. මඩකලපුව
236. ඇහැළියගොඩ
237. ගාල්ල දෙවන ශාඛාව
238. ගම්පහ දෙවන ශාඛාව
239. ප්‍රධාන කාර්යාලීය තැපැල්
240. යාපනය දෙවන ශාඛාව
241. කඳුරුවෙල
242. කළුතර දෙවන ශාඛාව
243. මහනුවර තෙවන ශාඛාව
244. කෑගල්ල දෙවන ශාඛාව
245. කුරුණෑගල දෙවන ශාඛාව
246. මන්නාරම
247. මාතලේ
248. මාතර දෙවන ශාඛාව
249. මොණරාගල
250. නාත්තන්ඩිය
251. නුවරඑළිය
252. ත්‍රිකුණාමලය
253. වවුනියාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව



කමිටුවේ සංයුතිය

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් විස්තර ඇතුලත් පහත සාමාජිකයන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමන්විත වේ.

ඩී. එල්. පී ආර් අබේරත්න මහතා - සභාපති
ඒ කේ සෙනෙවිරත්න මහතා - සාමාජික
අනිල් රාජකරුණා මහතා - සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේද ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

ගතවූ වසර තුළ සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
ඩී එල් පී ආර් අබේරත්න මහතා	10	10
ඒ කේ සෙනෙවිරත්න මහතා	10	8
අනිල් රාජකරුණා මහතා	10	10

වගන්ති 3 (6) (ii) සහ එහි අනුප්‍රාප්තික සංශෝධන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. බලපතුලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකුකරණ පනතේ මඟපෙන්වීම්, යහපාලනය සඳහා මහජන ආයතන නිර්දේශ සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයෙන් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ ප්‍රශස්ත ක්‍රියාමාර්ග සංග්‍රහයට අනුකූලව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පත්කර ඇත.

2013 ජූලි 11 දා ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ලබයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ වගන්ති 8 (1) උප වගන්තිය යටතේ පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ඇතුළු සියළුම උප කමිටු සාමාජිකයන් ඉහත සඳහන් කල සාමාජිකයන් 07 දෙනා අතරින් පත්කර ගැනේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, නිපුණතා හා අත්දැකීම් සාමාජිකයන් සතු වේ.

විගණකාධිපතිගේ නියෝජිත ලෙස රජයේ විගණක අධ්‍යක්ෂ නිරීක්ෂකයෙක් ලෙස ආරාධනාව මත අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් 8 කට සහභාගි වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ උපරිම ස්වාධීනත්වය සහතික කරමින් 2017 වසරේ පැවැත්වුණු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලට සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්) සහ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) ආරාධනයෙන් සහභාගි වූහ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර නිරන්තරව සමාලෝචනය කෙරේ. ප්‍රඥප්තියෙන් කමිටුවේ විෂය ක්ෂේත්‍රය පැහැදිලිව නිර්වචනය කර ඇත. සිය වගකීම් ඉටු කිරීමේ දී හා සිය අනවධාන වගකීම් ඉෂ්ට කිරීමේදී කමිටුව පහත ක්ෂේත්‍රයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල පරිපූර්ණත්වය,
(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කටයුතුවල ඵලදායීතාව,
(ඇ) බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතුවල කාර්යසාධනය සහ
(ඈ) බැංකුවේ බාහිර විගණන කටයුතුවල කාර්යසාධනය

ප්‍රඥප්තිය කමිටුවේ ක්‍රියාකරකම් සහ වගකීම් සහ අධිකාරීත්වය ද නියම කර ඇත. කමිටුවේ කාර්යයන් ඉටු කිරීමේ දී හා වගකීම් ඉටු කිරීමේදී ප්‍රඥප්තියට අනුකූල වන ආකාරය තක්සේරු කිරීම සඳහා ප්‍රඥප්තියේ පිරික්සුම් ලැයිස්තුව කමිටුවට සහායවීම සඳහා භාවිතා කෙරුණි.

මූල්‍ය වාර්තාකරණය

කමිටුව විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල පරිපූර්ණත්වය අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම පිණිස සකස් කළ ත්‍රෛමාසික වාර්තා සහ වැදගත් මූල්‍ය වාර්තාකරණ තීරණ ඒවා එළිදැක්වීමට පෙර සමාලෝචනය කරනු ලබයි. ප්‍රධාන තීරක ක්ෂේත්‍ර, ගණකාධිකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාදාමයන්හි වෙනස්කම්, විගණනයෙන් උත්පාදනය වන වැදගත් හැඩගැස්වීම්, අදාළ ගණකාධිකරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය සහ අනෙකුත් නෛතික අවශ්‍යතා කෙරෙහි කමිටුව විසින් අවධානය යොමු කළ යුතුය. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමග කමිටුව 2017 අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වාර්තාව සමාලෝචනය කළ අතර ත්‍රෛමාසික පදනමින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත විමර්ශනය කරන ලදී.

එස්. එල්. එෆ්. ආර්. එස්. 9 ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය

2018 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය මෙවලම් පිළිබඳ එස් එල් එෆ් ආර් එස් 9 ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය පිළිබඳව කමිටුව අධීක්ෂණය කරන ලදී.

අවදානම් හා පාලන විධික්‍රම හඳුනාගැනීම

ව්‍යාපාර මෙහෙයුම් හා මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපාන අවදානම් හඳුනාගැනීම හා ඇගයීම පිළිබඳ වගකීම දරන්නේ බැංකුවේ අධ්‍යක්ෂවරු හා එහි අනු ආයතන විසිනි.

සමස්ත පාලන වාතාවරණයේ ප්‍රමාණාත්මකභාවය සහ කැපී පෙනෙන අවදානම් ක්ෂේත්‍රයන්හි හැසිරවීම් ඇතුළු බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය හා තක්සේරු කිරීම කරනු ලබයි. ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරන ප්‍රමාද දෝෂ සහ වත්කම් අයථා ලෙස අත්පත් කර ගැනීම්, නීති කඩ කිරීම් ආයතන ආචාර ධර්ම පද්ධතියට අනුකූල නොවීම යනාදිය අනාවරණය කර ගැනීමේ බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය සහ තක්සේරු කිරීම සිදු කරයි. මෙහිදී කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමගින් අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්ගේ සොයා ගැනීම් හා නිර්දේශ සමාලෝචනය කෙරේ.

අවදානම් පාදක විගණන ප්‍රවේශයක් බැංකුව විසින් උපයෝගී කර ගන්නා අතර 2007 අංක 12 දරන බැංකු පනත් නියමයේ 3(8) (ii) (ඇ) වගන්තියට අනුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ නිර්දේශ අනුව සකස් කළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ගේ ඵලදායීතාව කමිටුව විසින් තක්සේරු කරන ලදී.

අභ්‍යන්තර විගණන හා පරීක්ෂාව

අභ්‍යන්තර විගණන කටයුතු තමන් විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහතික වේ. එය අභ්‍යන්තර විගණන අයවැය, සම්පත් සැලසුම, ක්‍රියාකාරකම් සහ අභ්‍යන්තර විගණන කටයුතුවල ආයතනික ව්‍යුහය වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විගණන සමගින් එක්ව සමාලෝචනය කරනු ලබයි. එමෙන්ම සිය කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අධිකාරී බලය අංශය සතුව පවතින බවට ද තෘප්තියට පත් වේ.

වාර්ෂික විගණන සැලැස්මට අනුව බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය ශාඛාවල, අංශවල හා අනෙකුත් ඒකක වල විගණන කටයුතුවල නිරත වේ. විගණනයේ සංඛ්‍යාතය තක්සේරු කරන ලද අවදානම් මට්ටම මත තීරණය වේ. විගණන සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කර ඇත. 2017 වසර සඳහා අනුමත කරන ලද විගණන සැලැස්ම 2017 වසර අවසාන වන විට ළඟා කරගෙන ඇත.

අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති හා ක්‍රමවේද සමග අනුකූලතාවය හා අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාව සහතික කිරීමට සහ අනුකූල නොවන අවස්ථාවන් හි සිය නිරීක්ෂණ වාර්තා කිරීමට සහ වැඩි දියුණු කිරීම සඳහා සිය නිර්දේශ ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර විගණන අංශය විගණන පිරික්සුම් පවත්වයි. මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු පිළිබඳ ස්වාධීන හා විෂය මූලික වාර්තාවක් සැලසීමේ අරමුණෙන් විගණන පවත්වා ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් විගණන අංශය සිදු කරන ලද විධිමත් විගණන පිරික්සුම් නිරීක්ෂණ හා තොරතුරු පද්ධති විගණන සමාලෝචනය කර ඇත. එමෙන්ම 2016 නොවැම්බර් සිට 2017 නොවැම්බර් දක්වා කාලය තුල සිදු කල අභ්‍යන්තර විමර්ශණ වාර්තා, බැංකුවේ වංචනික ලෙස මුදල් ආපසු ගැනීම් පිළිබඳ වාර්තා, ගතවූ වසර සඳහා වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)ගේ හා විගණන අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය සාධනය පිළිබඳව සමාලෝචනය කර ඇත.

බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්ය සංග්‍රහය සාමාන්‍යයෙන් අභ්‍යන්තර විගණන කටයුතු පාලනය කරනු ලබන අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයුම් හා ප්‍රතිපත්ති, ප්‍රමිති හා ක්‍රමවේද නිරූපණ සාරාංශ කොට දක්වයි.

සිය කටයුතු ඵලදායී ලෙස හා ස්වාධීනව ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය යොදා ගන්නා ලදී. ප්‍රඥප්තියට අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, ක්‍රියාකාරකම්, වගකීම්, බල අධිකාරිය, වාර්තාකරන ක්‍රමවේද සහ ස්වාධීනත්වය හා විෂය මූලිකත්වය ඇතුලත් වේ.

අභ්‍යන්තර විගණන

ව්‍යවස්ථානුකූලව බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපතිය. මෙම කාලය තුල අවම වශයෙන් දෙවතාවක් බාහිර විගණකවරයා සමග රැස්වීම් පවත්වා ඇත. කමිටුව ස්වාධීනව හමුවීමට, වැදගත් කරුණු පිළිබඳ සාකච්ඡා කර සිය අදහස් පළ කිරීමට ද මෙමගින් අවස්ථාව සැලසුනි. 2017 වසර තුල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව රැස්වීම් 10 ක් පවත්වා ඇති අතර විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ඉන් රැස්වීම් 08 කට සහභාගි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලදී විගණන ක්‍රියාදාමයේ කාර්ය සාධනීය භාවය පිළිබඳව රජයේ විගණන පාලක සමග සාකච්ඡා කෙරුණි. විගණන අරමුණ සඳහා අභ්‍යන්තර විගණකවරයාට අවශ්‍ය සියලු තොරතුරු හා ලිපි ලේඛන ලබා දීමට කමිටුව සහතික විය.

ආචාර ධර්ම හා යහපාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වංචා අවදානම් කළමනාකරණ හා වංචා හෙළි කරන්නන් ආරක්ෂා කරන ප්‍රතිපත්තිය බැංකුවේ අවංකභාවය ආරක්ෂා කරන ප්‍රධාන සාධකයකි. එය බැංකුවේ විනිවිදභාවය හා වැඩි දියුණු කිරීම හා එහි කටයුතු වලට හා කීර්ති නාමයට හානිකර විය හැකි ක්‍රියාකාරකම් වලට එරෙහිව සටන් කිරීමේ ක්‍රමවේදය තහවුරු කිරීමත් වංචා සහ අනෙකුත් ගැටළු සහගත තත්ත්වයන් කලින් හඳුනාගැනීම සඳහා මාර්ගයක් සැලසීමත් අරමුණු කර ගත්තකි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ත්‍රෛමාසික පදනම මත වංචා පිළිබඳ සියලුම සිදුවීම් විමර්ශණය කළ යුතුය. ත්‍රෛමාසික විමර්ශණයේදී කමිටුව එක් එක් වංචාව පිළිබඳ සංඛ්‍යාලේඛන තොරතුරු මෙන්ම අනෙකුත් විස්තර, ඉන්පසු ගෙන ඇති පියවර, සියුම් ලෙස නිරීක්ෂණයට ලක් කරනු ඇති අතර අවශ්‍ය අවස්ථාවන් හිදී වංචාවන්ට අදාළ දණ්ඩ නීති හා නිවාරණ පාර්ශ්ව පිළිබඳව මාර්ගෝපදේශ ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සෑම අවස්ථාවකදීම ඕනෑම මූලික පරීක්ෂණයක හා නිරීක්ෂණයක විස්තර ඉල්ලා සිටීමේ අයිතිය ඇත.

අනුකූලතාව


නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා වූ ක්‍රමවේදයේ කාර්ය සාධනය සහ කිසියම් අනුකූල නොවන අවස්ථාවකදී කළමනාකාරිත්වයේ පරීක්ෂණ හා පසු විපරම් (විනය ක්‍රියාමාර්ග ඇතුළුව) ප්‍රතිඵල කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 වසර සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට නිගමනය කරන ලදී.

වාර්තාකරණය

සිය කටයුතු, ගැටළු හා රැස්වීම් වාර්තා සමගින් අදාළ නිර්දේශ පිළිබඳව කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුව වාර්තා කරයි. අභ්‍යන්තර විගණන, බාහිර විගණන හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාර්ගයක් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සපයයි. කමිටුවේ විෂය ක්ෂේත්‍රය සියලු භෞතික පාර්ශ්වයන් සමග අනුකූල බව කමිටුවේ මතයයි.



ඩී. එල්. පී. ආර්. අබේරත්න
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2018 මාර්තු 12 දින
කොළඹ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව



කමිටුවේ සංයුතිය

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් තොරතුරු ඇතුලත් පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව සමන්විත වේ.

අස්විත් ද සිල්වා මහතා - සභාපති
ඩී එල් පී ආර් අබේරත්න මහතා - සාමාජික
අජිත් පතිරණ මහතා - සාමාජික

මානව සම්පත් සහ වේතන සම්බන්ධ කරුණු සාකච්ඡා වන අවස්ථාවන්හිදී සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී කමිටු රැස්වීම් වලට සහභාගි වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේද ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

රැස්වීම් තුන් මසකට වරක් පැවැත්වෙන නමුත් අවශ්‍යතාවය පරිදි කමිටුව රැස්වීම් පවත්වනු ලබයි. රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

වසර තුළ කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත දැක්වේ.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
අස්විත් ද සිල්වා මහතා	10	10
ඩී. එල්. පී. ආර්. අබේරත්න මහතා	10	10
අජිත් පතිරණ මහතා	10	8

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතෙහි 76 (ජේ) (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකුකරණ පනත් මාර්ගෝපදේශයේ 3 (6) (1) සහ (111) වගන්තිවල ඇතුලත් නියෝග ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව ස්ථාපනය කර ඇත. කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

කමිටුව සාමූහික ගිවිසුම මගින් තීරණය කරනු ලබන වේතන හැරුණු කොට බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීමෙහි වගකීම දරයි.

කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ප්‍රධාන කාර්ය සාධක දර්ශක නියම කරනු ලබයි. ඊට අමතරව නියම කරන ලද ඉලක්ක සහ අරමුණු වලට එරෙහිව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල ක්‍රියාකාරිත්වය කලින් කලට අගයන අතර කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීම් මගින් වේතන සංශෝධන ප්‍රතිලාභ හා අනෙකුත් ගෙවීම් නිශ්චය කරනු ලබයි.

කමිටුව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමෙහි කාර්ය මණ්ඩලයට අදාළ නියම සහ කොන්දේසි වලට අමතරව සියලු වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, නව ප්‍රවේශ, වැටුප් ව්‍යුහය සමාලෝචනය කරනු ලබයි. මෙම ක්‍රියාවලිය තුළ, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙතින් අවශ්‍ය තොරතුරු සහ නිර්දේශ ලබා ගනී.

2017 වසරේ දී ක්‍රියාකාරකම්

2017 වසර තුළ කමිටුව විසින් සිදු කළ සහ සහභාගි වූ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- → බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සහ විනය සංග්‍රහය සමාලෝචනය.
- → 2016 වර්ෂය සඳහා බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල (සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සියළුම උපදේශකවරු, අනුකූලතා නිලධාරී සහ සියලුම සහකාර සාමාන්‍යාධිකාරීවරු) ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇගයීම.
- → බැංකුවේ බදවා ගැනීමේ, හා තෝරා ගැනීමේ ක්‍රමවේදය සමාලෝචනය.
- → බැංකුවේ අවශ්‍යතාවය මත පදනම්ව බඳවා ගැනීම්, උසස්වීම් සහ කාර්ය මණ්ඩල උසස් කිරීම් සමාලෝචනය.
- → බැංකුවේ කාර්ය මණ්ඩල සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට එකතු කළ වටිනාකමක් එක් කිරීම.
- → මානව සම්පත් හා අදාළ කරුණු සම්බන්ධව කාර්ය මණ්ඩලය විසින් යොමු කරන ලද අභියාචනා සලකා බැලීම.

කමිටු රැස්වීම් වාර්තා නිසි පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 වසර සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්ය සාධනය ඵලදායී බවට තීරණය කරන ලදී.



අස්චින් ද සිල්වා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2018 මාර්තු 12
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව



කමිටුවේ සංයුතිය

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් විස්තර දැක්වෙන පහත සඳහන් සාමාජිකයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සමන්විත වේ.

ඩී එල් පී ආර් අබේරත්න මහතා - සභාපති
(2017.02.03 පත්වූ අතර 2017.02.02 දක්වා සාමාජික)

අස්විත් ද සිල්වා මහතා - සභාපති
(2017.02.03 දින ඉල්ලා අස්විය)

අජිත් පතිරණ මහතා - සාමාජික

ඒ කේ සෙනෙවිරත්න මහතා - සාමාජික
(2017.02.03 දින පත් විය.)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි. වසර තුල කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත පරිදි ය.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
ඩී. එල්. පී. ආර්. අබේරත්න මහතා	1	1
අජිත් පතිරණ මහතා	1	1
ඒ කේ සෙනෙවිරත්න මහතා	1	1

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අංක 12 දරන බැංකුකරණ පනතේ මාර්ගෝපදේශ, සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතෙහි වගන්ති 76 (ජේ) (1) යටතේ ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලන රෙගුලාසි වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පිහිටුවන ලද්දේ ප්‍රධාන කළමනාකරණ පිරිස් තේරීමේදී මණ්ඩලයේ අධීක්ෂණය හා පාලනය සහතික කිරීමයි.

කමිටුවේ කාර්යභාරය හා වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තනතරු සඳහා පත් කිරීමේ දී හෝ උසස් කිරීමේදී සලකා බැලිය යුතු සුදුසුකම්, අත්දැකීම් හා ප්‍රධාන ආරෝපණ වැනි තෝරා ගැනීමේ නිර්නායක නියම කිරීම සඳහා වගකිව යුතු වේ.

එමෙන්ම අංක 3 (3) නිර්දේශ යටතේ දී ඇති විශේෂිත නිර්නායක යටතේ අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තනතුරු දැරීම සඳහා සුදුසු බවට කමිටුව සහතික විය යුතුය. අමතර/නව ප්‍රවීනතා අවශ්‍යතාවන් සහ විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙනුවෙන් අනුප්‍රාප්තිකයන් පිළිබඳව ද කමිටුව කලින් කලට සලකා බැලේ.


2017 වසර තුළ ක්‍රියාකාරකම්

ගතවූ වසර තුල කමිටුව සහභාගි වූ හා ක්‍රියාවට නැංවූ වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- 2017 වසර සඳහා බැංකුව වෙනුවෙන් අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම හා අනුමත කිරීම
- බැංකුවේ අනුප්‍රාප්ති සැලසුම සමාලෝචනය
- බැංකු හා බැංකු නොවන විශේෂ ශ්‍රේණි තනතුරු සඳහා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම - සහකාර සාමාන්‍යාධිකාරී (විශේෂ ශ්‍රේණි) තනතුරු සඳහා සම්මුඛ සාකච්ඡා ආරම්භ කිරීම

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 වසර සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදී.



ඩී. එල්. පී. ආර්. අබේරත්න මහතා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව
2018 මාර්තු 12
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව



කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ අවදානම් කළමනාකරණ ප්‍රධානී යන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් විස්තර ඇතුලත් පහත සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයන් වශයෙන් කටයුතු කරයි.

ඒ කේ සෙනෙවිරත්න මහතා - සභාපති
සුරංග නාඋල්ලගේ මහතා - සාමාජික
චන්දිම හේමචන්ද්‍ර මහතා - සාමාජික
(2017.08.14 දින ඉල්ලා අස්විය)
අනිල් රාජකරුණා මහතා - සාමාජික
(2017.08.14 දින පත්විය)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

කමිටු රැස්වීම් ත්‍රෛමාසිකව පැවැත්වෙන නමුත් අවශ්‍යතාවය අනුව රැස්වීම් කැඳවනු ලැබේ. රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

වසර තුල කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත පරිදි ය.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
ඒ කේ සෙනෙවිරත්න මහතා	5	5
චන්දිම හේමචන්ද්‍ර මහතා	3	1
සුරංග නාඋල්ලගේ මහතා	5	5
අනිල් රාජකරුණා මහතා	2	2

2007 අංක 12 දරන බැංකුකරණ පනතේ මාර්ගෝපදේශ, 1988 අංක 30 දරන බැංකු පනතෙහි විධිවිධානයන්ට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලන ක්‍රමවේදයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපනය කර ඇත.

කමිටුවේ කාර්යභාරය හා වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති විෂය ක්ෂේත්‍රයට පහත අංශ ඇතුළත් වේ.

- අවදානම් කළමනාකරණයට සම්බන්ධ සිය වගකීම් ඉටු කිරීමට හා ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීම.
- බැංකුව විසින් අනුමත කර ඇති ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා අවදානම් හා අදාළ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ බැංකුව තුළ අවදානම් කළමනාකරණ රාමුව කලින් කලට යාවත්කාලීන කිරීම
- බැංකුව විසින් මුහුණ දෙන සියලුම ණය, වෙළඳපොළ, මෙහෙයුම් හා උපාය මාර්ගික අවදානම් ප්‍රමාණවත් පරිදි හඳුනාගෙන, මැනගෙන අධීක්ෂණය හා කළමනාකරණය කර ගෙන ඇති බවට සහතිකවීම
- සියලුම බරපතල අවදානම් ක්ෂේත්‍රවල දී ප්‍රධාන කළමනාකරණ පිරිස සමග සමීපව කටයුතු කිරීම සහ කමිටුවට පවරා ඇති වගකීම් රාමුව තුල සුදුසු නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම.

- නව මෙහෙයුම් ප්‍රගතීන්ගේ අවදානම් සහ එම කරුණු වලට අදාළ අනුකූලතා හඳුනාගැනීම, සමාලෝචනය, වාර්තා කිරීම හා නිර්දේශය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති බාසල් III නිර්දේශයන්ගේ ක්‍රියාත්මකභාවය හා අනුකූලතාව සමාලෝචනය කිරීම.

ගතවූ 2017 වසර තුල අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ප්‍රඥප්තිය සමාලෝචනය කර ඇත. කමිටුව බැංකුවට අදාල අවදානම් අනුකූලතාවය පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා හා යෝජනා සමාලෝචනය කරනු ලබයි. සිය විධි නියෝගයන්ට යටත්වන යෝජනා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අනුමැතිය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරීක්ෂණය කළයුතු යෝජනා/වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරනු ලබයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් හා ඒවායේ වැදගත්කම පිළිබඳව අවදානම් කළමනාකරණයට සම්බන්ධ අදාළ පරිච්ඡේදයෙන්/කොටසින් සවිස්තරාත්මක හැඳින්වීමක් ලබා දේ. සිය වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට අවදානම් කළමනාකරණ, අනුකූලතා හා අනෙකුත් මෙහෙයුම් අංශ සහයෝගය ලබා දේ.

2017 වසර තුළ ක්‍රියාකාරකම්

බැංකුවට අහිතකර ලෙස බලපෑ හැකි මෙහෙයුම්, ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය වැනි සියලු ප්‍රධාන අවදානම් කමිටුව විසින් තක්සේරු කරනු ලබයි. අවදානම් කළමනාකරණය සඳහා සිය ව්‍යවස්ථානුකූල හිමිකම් දරන හා නියාමන වගකීම් ඉටු කිරීමේ දී කමිටුව ප්‍රධාන කළමනාකරණ පිරිස් හා අධ්‍යක්ෂ මණ්ඩලය සමග සමීප සබඳතාවයක් පවත්වාගෙන යයි.

ගතවූ වසර තුල කමිටුව සහභාගි වූ හා ක්‍රියාවට නැංවූ වැදගත් කාර්යයන් පහත පරිදි වේ.

- බැංකුවේ අවදානම පිළිබඳ අභිරුචි සීමාව උත්ප්‍රේක්ෂක සීමාව පිළිබඳ වාර්තා සහ බැංකුවේ අවදානම් වල විවිධ අංග (උදාහරණ : ණය අවදානම, වෙළඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම, මානව සම්පත් අවදානම, තාක්ෂණික අවදානම වැනි) ඉස්මතු කරන අනෙකුත් වාර්තා සමාලෝචනය
- විවිධ අවදානම් සීමා සමාලෝචනය හා අවශ්‍ය අනුමැතිය ලබාදීම
- ක්ෂේත්‍රයේ ජාත්‍යන්තරව පිළිගත් න්‍යායන්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව තක්සේරු කිරීමේ ක්‍රමවේදයට අනුකූල විගණන කරුණු හා නියාමන හා නිර්දේශ නියාමනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන නිර්දේශ ඉටු කිරීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාමාර්ග හා ප්‍රමිතීන් ගේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කිරීම
- සිය පිරික්සුම් වලදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙන්වා දෙන ලද අධීක්ෂණ කරුණු පිළිබඳ ප්‍රතිශෝධන ක්‍රමවේදයේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම
- අදාළ පාර්ශ්ව සමග ගනුදෙනු, මූල්‍ය වංචා, වංචා අවදානම් කළමනාකරණය, වංචා හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ආදී බැංකුවේ වැදගත් කරුණු පිළිබඳ සමාලෝචන වාර්තා සමාලෝචනය
- බැංකුවේ අනුකූලතා තක්සේරුව සහ උකස් ණය, මානව සම්පත් කළමනාකරණය, ඔබගේ පාරිභෝගිකයා හඳුනාගන්න ප්‍රතිපත්තිය පවත්වාගෙන යාම වැනි එහි ප්‍රධාන ක්‍රියාකාරකම් සමාලෝචනය
- බාසල් III ප්‍රමිතීන් සමග බැංකුවේ අනුකූලතාවය පිළිබඳ නිරන්තර අධීක්ෂණය හා සමාලෝචනය
- අනුකූලතා වැඩසටහන සහ අනුකූලතා කාර්ය සංග්‍රහය පිළිබඳ වාර්ෂික සමාලෝචනය

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 වසර සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්ය සාධනය ඵලදායී බවට තීරණය කරන ලදී.



ඒ කේ සෙනෙවිරත්න
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2018 මාර්තු 12
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව



කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාරිභෝගික ණය) ආරාධිතයන් ලෙස සහභාගි වේ.

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් විස්තර ඇතුලත් පහත සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරයි.

අස්විත් ද සිල්වා මහතා - සභාපති
අනිල් රාජකරුණා මහතා - සාමාජික
(2017.02.03 පත්වූ අතර 2017.08.14 ඉල්ලා අස්විය)
අජිත් පතිරණ මහතා - සාමාජික
(2017.08.14 පත්විය)
චන්දිම හේමචන්ද්‍ර මහතා - සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත පරිදි ය.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
අස්විත් ද සිල්වා මහතා	8	8
අනිල් රාජකරුණා මහතා	5	5
අජිත් පතිරණ මහතා	3	2
චන්දිම හේමචන්ද්‍ර මහතා	8	6

2007 අංක 12 දරන බැංකුකරණ පනතේ මාර්ගෝපදේශ, සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතෙහි 76 (ජේ) (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සහ සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව ස්ථාපනය කරන ලද්දේ අවශ්‍ය අවස්ථාවන්හි බැංකුවේ ණය ප්‍රතිපත්තිය හා ආයෝජන ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීමට හා පවරා ඇති සීමා තුළ ණය පහසුකම් අනුමත කිරීමේ කටයුතුවල නිරතවීමටය.

කමිටුවේ කාර්යභාරය හා වගකීම්

ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ අනෙකුත් අදාළ ප්‍රතිපත්තිමය මට්ටමේ ලියවිලි ඇතුළු ණය හා ආයෝජන පිළිබඳ බැංකුවේ උපාය මාර්ගික අරමුණු සමාලෝචනය හා නිර්දේශ කිරීම.

ස්ථාවර, යහපත් ණය අවදානම් ප්‍රතිග්‍රහණය හා කළමනාකරණ සංස්කෘතිය ප්‍රවර්ධනය හා සවිබල ගැන්වීම සඳහා බැංකුවේ ණය ප්‍රතිපත්තිය හා ආයෝජන ප්‍රතිපත්තියට අදාළ කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණය තුලින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීම.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ නිර්දේශයන්ට අනුකූලව ණය, අත්තිකාරම් හා ආයෝජන මිල නියම කිරීම, අනුමත කිරීම හා උපදෙස් ලබාදීම.

බැංකුවේ ණය ක්ෂේත්‍රයට අදාළ අවදානම් කළමනාකරණයට සුදුසු ක්‍රම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහ අභ්‍යන්තර පාලන හා කළමනාකරණ තොරතුරු ක්‍රම ශක්තිමත් කිරීම.

2017 වසර තුළ ක්‍රියාකාරකම්

බැංකුවේ ණය හා ආයෝජන දිශානතියේ කාර්යක්ෂම හා ඵලදායී කාර්ය සාධනය සහතික කිරීම සඳහා බැංකුවේ ණය දීම් හා ආයෝජන ප්‍රතිපත්ති හා ණය අවදානම් හා අනුකූල වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන ණය හා ආයෝජන යෝජනා හා අනෙකුත් විශේෂිත ලේඛන කමිටුව විසින් අනුමත කරන ලදී.

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්ය සාධනය ඵලදායී බවට තීරණය කරන ලදී.



අස්වින් ද සිල්වා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

2018 මාර්තු 12
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටු



කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිළධාරි ආරාධනයෙන් කමිටුවට සහභාගි වේ.

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 156 හි පසුබිම් විස්තර ඇතුලත් පහත සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටු සාමාජිකයන් වශයෙන් කටයුතු කරයි.

අස්විත් ද සිල්වා මහතා - සභාපති
ඩී එල් පී ආර් අබේරත්න මහතා - සාමාජික
චන්දිම හේමචන්ද්‍ර මහතා - සාමාජික

රැස්වීම්

රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

වසර තුල කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත පරිදි ය.

නම	සුදුසුකම් ලැබූ වාර ගණන	පැමිණි වාර ගණන
අස්විත් ද සිල්වා මහතා	5	5
ඩී. එල්. පී. ආර්. අබේරත්න මහතා	5	2
චන්දිම හේමචන්ද්‍ර මහතා	5	5

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව පිහිටුවනු ලැබුවේ 2007 අංක 12 දරන බැංකුකරණ පනතේ මාර්ගෝපදේශ, සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතෙහි වගන්ති 76 (ජේ) (1) යටතේ ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනයට අනුකූලවය. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව ස්ථාපනය කරන ලද්දේ තොරතුරු තාක්ෂණය කෙරෙහි බැංකුවේ ඇති විශ්වාසය සහතික කිරීමට හා තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අනුව බැංකුවේ උපාය මාර්ගික ඉලක්ක අධීක්ෂණය කිරීම සඳහාය.

කමිටුවේ කාර්යභාරය හා වගකීම්

නායකත්ව සභාය, ආයතනික ව්‍යුහය හා බැංකුවේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදය, තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය, සම්පත් කළමනාකරණය හා කාර්යසාධන කළමනාකරණය සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පාලන රාමුව ස්ථාපනය හා සමාලෝචනය

බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේදයන්හි ආපදා ප්‍රතිසාධනයේ ප්‍රමාණාත්මකභාවය හා ඵලදායකත්වය සහතික කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකු නිර්දේශයන්ට හා ප්‍රශස්ත අන්තර්ජාතික පිළිගත් පරිචයන්ට අනුව තොරතුරු පද්ධති සුරක්ෂිතභාවයේ ප්‍රමාණාත්මකභාවය හා ඵලදායකත්වය සහතික කිරීම.

2017 වසර තුළ ක්‍රියාකාරකම්

බැංකුවේ උපාය මාර්ග කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා බැංකු කටයුතු වඩ වඩාත් නවීන තාක්ෂණ ක්‍රමවේදයන්ට සමීප කරමින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රමවේද කමිටුව විසින් අනුමත කරන ලදී. එපමණක් නොව පාරිභෝගික දත්ත ආරක්ෂාව පිළිබඳව කමිටුව දැනුවත් අතර තොරතුරුවල සුරක්ෂිතභාවය සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග කමිටුව විසින් සහතික කරයි.

කමිටු ඇගයීම

ස්වයං තක්සේරුව සමගින් කමිටුව 2017 වසර සඳහා ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදී.



අස්විත් ද සිල්වා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව

2018 මාර්තු 12
කොළඹ

අවදානම් කළමනාකරණ වාර්තාව

අවදානම සියළු ව්‍යාපාර සහ උපකාරක ක්‍රියාකාරකම්හි අන්තර්ගත කොටසක් වන හෙයින් වර්තමානයේදී බැංකු ක්ෂේත්‍රය මුහුණදෙන ප්‍රමුඛතම අභියෝගයක් වන්නේ අවදානම හඳුනාගැනීම සහ කළමනාකරණය කරගැනීමයි. එබැවින් එහි ගණුදෙනුකරුවන්ගේ සහ ආයෝජකයන්ගේ අභිලාෂ සාක්ෂාත් කරගැනීමෙහිලා අවශ්‍ය සේවය සැපයීම සහ ඔවුන්ගේ ණය ගෙවීමේ හැකියාව අතර තුලනයක් ඇති කරන ආකාරයෙන් සිය මෙහෙයුම් හා ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කරගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සමස්ත අරමුණ වේ.

අවදානම් හඳුනාගැනීම, ඇගයීම, මැනගැනීම, වර්ගීකරණය කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම ව්‍යාපාර මෙහෙයුම් අතර ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යාප්තියක් සහතික කිරීම උදෙසා බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සකස් කර තිබේ.

පුළුල් පරාසයක පැතිරුණු ආර්ථික අවදානම් සහ ණය, වෙළඳපොල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් අනුකූලතාවය, කීර්තිනාමය වැනි වෙනත් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කෙරෙමින් සහ සුදුසු පරිදි ඒ සෑම ක්ෂේත්‍රයකම නියාමනය හා පාලනය සමග උපායමාර්ගිකව සම්බන්ධ වන අයුරින් බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව ක්‍රියාත්මක කෙරේ. ඵලදායී පාලනයක් සහ ඊට අනුරූප අවදානම් වැළැක්වීමේ ක්‍රමවේද සමගින් පුළුල්වූ අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් බැංකුවේ මෙහෙයුම් සඳහා අදාළ කරගැනේ.

අවදානම් කළමනාකරණය බැංකුවට පමණක් සීමා නොවන අතර එහි පූර්ණ අයිතිය බැංකුව සතු වන පරිපාලිත සමාගම වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමටද එය අදාළ වේ. ඒ එම සමාගම ප්‍රාථමික රාජ්‍ය සුරැකුම් සම්බන්ධයෙන් ප්‍රාථමික ගණුදෙනුකරුවෙකු ලෙස කටයුතු කරන හෙයිනි. සමාගම තුල බැංකුවේ මෙහෙයුම්හි ප්‍රමාණාත්මකතාවය කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුවේ අවදානම් කළමනාකරණය පිළිබඳව මෙම වාර්තාවෙන් තොරතුරු ඉදිරිපත් කර ඇත. (බැංකුව ඒකාබද්ධ වත්කම් සඳහා 99.3% ක හා ඒකාබද්ධ ප්‍රාග්ධනය වෙත 97.5% ක දායකත්වයක් ලබාදී තිබේ.)

කාර්යසාධනයට බලපාන පවතින සහ මතුවෙමින් තිබෙන අවදානම්

පවතින සහ මතුවෙමින් තිබෙන අවදානම් බැංකුවේ වර්තමාන සහ අනාගත කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. නිශ්චිතව සඳහන් කළහොත් එවැනි අවදානම් හේතුවෙන් යම් ව්‍යාපාරයක් එහි වර්තමාන දිශානතියෙන් බැහැරට ගමන් කළ හැකි අතර එහි ලාභදායීතාවය, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය ඇතුළු ප්‍රධාන කාර්යසාධන ක්ෂේත්‍ර කෙරෙහි දැඩි බලපෑමක් එල්ල විය හැකිය.

යම් නිශ්චිත ප්‍රධාන අවදානමක් කෙරෙහි සෘජුව බලපෑ හැකි හෝ ප්‍රධාන අවදානම් එකකට වැඩි සංඛ්‍යාවක් මත බලපෑමක් ඇති කළ හැකි අවදානම් ලෙස මෙම අවදානම් හඳුන්වාදිය හැකිය. ණය අවදානම, වෙළඳපල අවදානම, මෙහෙයුම් අවදානම සහ ද්‍රවශීලතා අවදානම ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් හඳුනාගන්නා ලද ප්‍රධාන අවදානම් වේ.

ක්ෂුද්‍ර හා සාර්ව සන්දර්භයන්ට අදාළව පවතින අවදානම්, අවදානම් කළමනාකරණ කාර්යරාමුව ඔස්සේ හඳුනාගැනීම, ඇගයීම සහ වළක්වාලීම/අවම කිරීම සිදු කර ඇත. එහෙත් මතු වෙමින් තිබෙන අවදානම් බැංකුවට නවක හා අනපෙක්ෂිත වේ. එසේම, ඒ මගින් සිදු විය හැකි අලාභය පූර්ණ වශයෙන් ගණනය කළ නොහැකි අතර එය හඳුනාගැනීම සඳහා ගත වන කාලය පිළිබඳව පුරෝකතනය කිරීම ඉතා අසීරුය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව මතුවෙමින් තිබෙන අවදානම් පිළිබඳ සිය දැනුවත්භාවය යාවත්කාලීන කරගැනීමට නිරන්තරයෙන් උත්සුක වන්නේ නිරතුරුව වෙනස්වන සහ සංකීර්ණ අවදානම් පරිසරය තුල සිය ව්‍යාපාරය මෙහෙයවීම සඳහා එය තීරණාත්මක සාධකයක් වන හෙයිනි.

සිය අවදානම් ඇගයුම් ආකෘති වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා 2017 වර්ෂයේදී බැංකුව විසින් ණය ශ්‍රේණිගත කිරීමේ සහ ලකුණු ලබාදීමේ පද්ධති ස්ථාපනය කරන ලදී. බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා, විදේශ ණය ගැනීම්, මූල්‍ය ව්‍යුත්පන්න සහ බදු රෙගුලාසි වල සිදු වන වෙනස්කම් ආදී නියාමන ප්‍රවණතා කෙරෙහි අනුකූලවීමේ අවශ්‍යතාවය හේතුවෙන් බැංකුව මත පීඩනයක් එල්ල වනු ඇත.

ක්‍රමයෙන් පුළුල් හා දැඩි වන නියාමන, තාක්ෂණික දියුණුව හේතුවෙන් ගණුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉහළයාම සහ නවීන තාක්ෂණය සමග බද්ධ වෙමින් පරිණාමය වන දත්ත විශ්ලේෂණ ක්‍රමවේද ආදී නැගී එන ප්‍රවණතා හේතු කොටගෙන අවදානම් කළමනාකරණයේ භූමිකාව යළි සකස්වනු ඇත. නූතන ව්‍යාපාරික පරිසරය තුල පවත්නා දැඩි අස්ථාවරභාවය සහ සීඝ්‍රයෙන් වෙනස් වන වෙළඳපළ තත්වය මත පදනම්ව බැංකු ක්ෂේත්‍රය පුරා අඛණ්ඩව මෙම අවදානම් වර්ධනය විය.

සිය ව්‍යාපාරික ප්‍රතිඵල කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම් සහ මූල්‍ය තත්වයන් කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අරමුණු කරගෙන බැංකුව විසින් මෙවැනි මතුවෙමින් තිබෙන අවදානම් විශ්ලේෂණය කරනු ලබයි. බැංකුවේ මෙහෙයුම් වලට අදාළව පවතින ප්‍රධාන හා අනෙකුත් අවදානම් සහ මතුවෙමින් තිබෙන අවදානම් මෙන්ම එම අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රවේශය පිළිබඳව මෙම වාර්තාවෙන් සවිස්තරාත්මකව විග්‍රහ කෙරේ.



නියාමන හා අනුකූලතා අවදානම

නියාමන කාර්ය රාමුවේ විෂයය ක්ෂේත්‍රය ගෝලීය වශයෙන් අඛණ්ඩව පුළුල් වෙමින් පවතී. ප්‍රාග්ධනය, උද්‍යාම අනුපාතය, අරමුදල් සැපයීම සහ ද්‍රවශීලතාවය ආදී ක්ෂේත්‍ර වල ඇතිවන නියාමන වෙනස්කම් බැංකුවේ අවදානම් කළමනාකරණය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බවට අපේක්ෂා කෙරේ. දේශීය හා ගෝලීය නියාමන ප්‍රමිතීන් සමග අනුකූලවීමේ අවශ්‍යතාවය නියාමන අධිකාරිය (ශ්‍රී ලංකා මහ බැංකුව) සහ රජය විසින් අඛණ්ඩව අවධාරණය කරනු ලබයි.

නියාමනයන්හි විෂයය ක්ෂේත්‍රය සැලකිය යුතු ආකාරයෙන් පුළුල් වෙමින් තිබෙන හෙයින් පවතින රෙගුලාසි හා අනුකූලවීම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එබැවින් ඉදිරියේදී රෙගුලාසි සම්බන්ධයෙන් ඇති විය හැකි සංශෝධන සමගද අනුකූලවීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සූදානම්ව සිටී.




ව්‍යාප්ති අවදානම

බැංකුවල මෙහෙයුම් කටයුතු වල පවත්නා මූල්‍ය හා සාර්ව ආර්ථික සම්බන්ධතාවය හේතුවෙන් බැංකු වැඩි වශයෙන් කලාපීය හෝ ගෝලීය වශයෙන් සිදුවන පරිවර්තනවල බලපෑමට ලක්වීමේ අවදානමට නිරාවරණයවේ. ඒ අනුව, අහිතකර වෙළඳපළ ප්‍රවණතා බැංකුවක අනෙකුත් ව්‍යාපාරික ක්ෂේත්‍ර හා සම්බන්ධිත පාර්ශ්ව කෙරෙහිද බලපෑම් ඇති කළ හැකි අතර බැංකුවේ මෙහෙයුම් පරිසරය වේගයෙන් හා සැලකිය යුතු අයුරින් අඩාල වීමටද හේතු වනු ඇත. එබැවින්, බැංකුව කෙතරම් දුරකට ව්‍යාප්ති අවදානමට මුහුණදී සිටීද යන්න හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාකාරී අවදානම් වළක්වාලීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාවලි සහ පටිපාටි බැංකුව තුල ස්ථාපිත කර ඇත.




ආකෘති අවදානම

වැඩි වශයෙන් ආකෘති මත පදනම්වීමේදී වඩා හොඳ අවබෝධයකින් කටයුතු කළ යුතු අතර ආකෘති අවදානම කළමනාකරණය කරගත යුතුය. දත්ත වල ගුණාත්මකභාවය, තාක්ෂණික හෝ ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහ සහසම්බන්ධ කිරීමට අදාළ නොගැළපීම් හේතුවෙන් ආකෘති දෝෂ පැන නගී.



සයිබර් ආරක්ෂණ අවදානම

මෘදුකාංග පද්ධති, තොරතුරු තාක්ෂණය සහ ගණුදෙනුකරුවන්ගේ රහස්‍ය තොරතුරු ඇතුළු දත්ත වැඩි වශයෙන් ව්‍යාපාර කටයුතු සඳහා භාවිතයට ගැනීම හේතුවෙන් පසුගිය වසර කිහිපය තුල බැංකු ක්ෂේත්‍රයේ සයිබර් අවදානම සැලකිය යුතු ආකාරයෙන් වර්ධනය වී තිබේ. සයිබර් ප්‍රහාර බැංකුවේ ව්‍යාපාර කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ හැකි හෙයින් සයිබර් ප්‍රහාර වලට එරෙහි ආරක්ෂණය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් බවට පත්ව ඇත.




සටහන 1 : ප්‍රධාන අවදානම් මත පදනම්වූ පවතින අනෙකුත් අවදානම් සහ මතුවෙමින් තිබෙන අවදානම්

ඒකාබද්ධ අවදානම් පාලනය

අවදානම් කළමනාකරණයේ හිමිකම හා වගකීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්හි නිරතව සිටින සෑම පුද්ගලයෙකුටම පැවරී තිබේ. "ත්‍රිත්ව ආරක්ෂණ ආකෘතිය" (Three Lines of Defence) සමග බද්ධවූ මනා ආයතනික පාලන මූලධර්ම බැංකුවේ අවදානම් පාලන කාර්යරාමුව ශක්තිමත් කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ පාලන ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය මට්ටමෙන් ආරම්භවී අවදානම් අභිරුචි ප්‍රකාශනය, ප්‍රතිපත්ති, පවරා ඇති බලතල සහ කමිටු වයුහය ආදිය හරහා බැංකුවේ සෑම ව්‍යාපාරික අංශයක් පුරා ගලා යයි. එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයත්, ව්‍යාපාරික කටයුතුවලදී අවදානමට ලක්වන පාර්ශ්ව හා ඒ අවදානම අනුමත කරන පාර්ශ්ව අතර රාජකාරී පැහැදිලිව බෙදාදැක්වීමත් තහවුරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඊට අයත් අවදානම් කමිටු ක්‍රියාත්මක වන්නේ ඔවුන්ට අදාළ ප්‍රඥප්තිවලට යටත්ව වේ.



සටහන 2: අවදානම් කළමනාකරණය පිළිබඳව බැංකුව සතු හිමිකම හා වගකීම



අධ්‍යක්ෂ මණ්ඩලය

විවිධ අවදානම් කළමනාකරණය කිරීම සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සුදුසු පරිදි ස්ථාපිත කර ඇති බව හා ඒවාට අනුකූල වී ඇති බව සහතික කිරීම සඳහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් ඒකාබද්ධ කාර්යරාමුවක් ස්ථාපිත කර තිබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ට පැවරී ඇති අවදානම් අධීක්ෂණ කාර්ය ඔස්සේ තහවුරු කරගනී.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව තම ව්‍යාපාරික අරමුණු කරා යාමේදී භාර ගැනීමට සූදානම් අවදානම් මට්ටම නොහොත් අවදානම් අභිරුචිය අනුමත කරන අතර එය ක්‍රියාත්මක වන ආකාරයද අධීක්ෂණය කරයි. එසේම, එමගින් සියළු ආකාරයේ අවදානම් සහ වෙළඳපල තත්වයන් අඛණ්ඩව පිළිඹිබු කෙරෙන බව තහවුරු කරගැනීම සඳහා අවදානම් අභිරුචිය සමාලෝචනය කරයි.

එමෙන්ම, මනා අභ්‍යන්තර පාලනයක් සහ සහතික කිරීමේ කාර්යරාමුවක් බැංකුව තුල පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබන අතර අවදානම් පිළිබඳ දැනුවත්වීමේ සංස්කෘතියක් සහ අවදානම් සැලකිල්ලට ගනිමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් බැංකුව තුල නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.



අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සුදුසු අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් නිර්දේශ කිරීම සඳහා එයට පැවරී ඇති අවදානම හා සම්බන්ධ වගකීම් ඉටු කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වෙයි. අවදානම් අභිරුචිය සකස් කිරීම සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය නිර්දේශ කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පැවරෙන ප්‍රධාන වගකීම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව බැංකුව එහි අවදානම් කළමනාකරණ කාර්යරාමුව සමග අනුකූල වන ආකාරය නිරීක්ෂණය කරයි. එය කළමනාකරණ මට්ටමෙන් ක්‍රියාත්මක වන සියළු කමිටු, නියාමන අධිකාරිය සමග පවතින සැලකිය යුතු සම්බන්ධතාවය සහ බැංකුවේ අවදානම් පැතිකඩ හා අදාළ ප්‍රමාණවත්භාවය සමාලෝචනය කරයි.



අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

බැංකුව විසින් භාවිත කරනු ලබන ප්‍රතිපත්ති හා පරිචයන් සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභියෝගයට ලක් කරනු ලබයි. අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ අභ්‍යන්තර විගණන කටයුතු වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය එමගින් නිරීක්ෂණය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තොරතුරුවල ඒකාග්‍රතාවය, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයට ගැනීම හා නෛතික සහ අනුකූලතා ගැටළු නිරීක්ෂණය කිරීම සහතික කරයි. මෙම කමිටුව විසින් අතුරු හා වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරනු ලබයි. බාහිර විගණකවරුන් සිය හෙළිදරව් කරගැනීම් වාර්තා කරනු ලබන්නේද මෙම කමිටුව වෙතය.



කළමනාකරණ කමිටු

ප්‍රධාන අවදානම් කළමනාකරණයට සෘජුව සම්බන්ධ වන කළමනාකරණ කමිටු වන්නේ ණය කමිටුව, වත්කම් හා වගකීම් කමිටුව, ආයෝජන කමිටුව සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවයි.

අනෙකුත් කළමනාකරණ කමිටු වන තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරී කමිටුව, ආයතනික කළමනාකරණ කමිටුව, මෙහෙයුම් කාර්යසාධන සමාලෝචන කමිටුව, අලෙවිකරණ කමිටුව, නිමැවුම් ප්‍රවර්ධන කමිටුව, මානව සම්පත් කමිටුව, ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය, තොරතුරු තාක්ෂණ සමාලෝචන සහ කාඩ්පත් අංශය, පුද්ගලයන්, ක්‍රියාවලි, පද්ධති සහ බාහිර අවදානම් සාධක විසින් ජනිත කරනු ලබන අනෙකුත් අවදානම් කළමනාකරණය කරයි.

සිය මෙහෙයුම් ආශ්‍රිතව පැන නගින ප්‍රධාන සහ අනෙකුත් අවදානම් තක්සේරු කිරීම, නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා අවදානම් කළමනාකරණ කාර්යරාමුව ශක්තිමත් කිරීමට අත්‍යාවශ්‍ය නව පියවර රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් හඳුන්වාදී තිබේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, පටිපාටි සහ පද්ධති ස්ථාපිත කර තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ බාසල් විසින් හඳුන්වාදෙන ලද ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලවය.

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති කාර්ය රාමුව පහත දැක්වෙන ප්‍රතිපත්ති වලින් සමන්විත වේ.

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වෙළඳපල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය
- ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය පිළිබඳ ප්‍රතිපත්තිය

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව අභ්‍යන්තරිකව ක්‍රියාත්මක වන ආරක්ෂණ ස්ථර තුනකින් සමන්විත වේ. නියාමන සහ බාහිර විගණකවරු බැංකුවේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ කාර්යරාමුව ශක්තිමත් කිරීමට ආධාර වන වටිනා උපදෙස් ලබාදෙයි. එය බැංකුවේ පාර්ශ්වකරුවන් වෙත පිරිනැමෙන අමතර තහවුරුවක් වන අතර එම නිසාම එය සිව්වන ආරක්ෂණ ස්ථරය බවට පත්වේ.

1 ආරක්ෂණ ස්ථර

ව්‍යාපාරික කාර්යයන්

සිය ව්‍යාපාරික ක්ෂේත්‍ර ආශ්‍රිතව පවත්නා අවදානම් හඳුනාගනිමින් ඒවා ආමන්ත්‍රණය කිරීමට මෙන්ම මනා පාලන ක්‍රමවේද ක්‍රියාත්මක වන පරිසරයක කටයුතු කිරීමටද ශාඛා/මෙහෙයුම් අංශ වග වේ. ශාඛා/මෙහෙයුම් අංශ වල සේවයේ නියුතු සියළු කාර්යමණ්ඩල ඔවුන් විසින් දරනු ලබන අවදානම් පිළිබඳව දැනුවත්/වගකියන අතර අභ්‍යන්තර පාලන/අවදානම් කළමනාකරණ පරිචයන් සමග අනුකූල වෙති.

2 ආරක්ෂණ ස්ථර

අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යය

අවදානම් කළමනාකරණ අංශය අවදානම් කළමනාකරණ කාර්යරාමුව, ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සකස් කරයි. අවදානම් කළමනාකරණ අංශය ප්‍රධාන ඒකක තුනකින් සමන්විත වේ. ඒ ණය අවදානම් කළමනාකරණ ඒකකය, වෙළඳපළ අවදානම් කළමනාකරණ ඒකකය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකයයි. අවදානම අධීක්ෂණය කරන අංශයක් ලෙස අවදානම් කළමනාකරණ අංශය අවදානම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම, වගකිවයුතු අංශ වෙත ඉදිරිපත් කිරීම සහ වාර්තා කිරීම යන කාර්යයන්ද ඉටු කරයි.

අවදානම් කළමනාකරණ අංශය බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් වලට අදාළ නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල වන ආකාරය අධීක්ෂණය කරයි. රීති, රෙගුලාසි, නියාමන සහ නීති ආදියට අනුකූලව පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සිදු වන බව ඔවුන් විසින් තහවුරු කරනු ලබයි.

අවදානම් කළමනාකරණ සහ අනුකූලතා අංශය ස්වාධීනව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට/අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

3 ආරක්ෂණ ස්ථර

අභ්‍යන්තර විගණන කාර්යය

අවදානම් කළමනාකරණ පරිචයන්, අනුකූලතා කාර්ය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ස්වාධීන හා දෛනික විගණන පැවැත්වීම ඔස්සේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර පාලන ක්‍රමවේද, අවදානම් කළමනාකරණ කාර්ය සහ අනුකූලතා කාර්ය පිළිබඳ ප්‍රමාණවත්භාවය සහතික කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

4 ආරක්ෂණ ස්ථර

නියාමන අධිකාරීන් සහ බාහිර විගණකවරුන්

ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජයේ විගණකවරු බැංකුව වෙත අතිරේක තහවුරුවක් ලබාදෙයි. ඔවුන්ගේ ස්වාධීන සමාලෝචන/විගණන තුලින් ජනිත කෙරෙන කරුණු බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා උපයෝගී කර ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය නියාමන අධිකාරිය විසින් මතු කරන ලද කරුණු කෙරෙහි බැංකුව අනුකූලවී තිබෙන ආකාරය නිරීක්ෂණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරුන් විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාවය නිරීක්ෂණය කරයි.


සටහන 3: අවදානම් කළමනාකරණයේ ආරක්ෂණ ආකෘතිය

අවදානම් අභිරුචිය

අවදානම් අභිරුචි ප්‍රකාශය අවදානම් කළමනාකරණ කාර්යරාමුවේ ප්‍රධාන අංගයකි. බැංකුව සිය අභිමතාර්ථ ඉටු කරගැනීමේදී දැරීමට අපේක්ෂා කරන අවදානම් මට්ටම අවදානම් අභිරුචිය ලෙස හැඳින්වේ. එමගින් ව්‍යාපාරයේ ප්‍රධාන ක්ෂේත්‍ර සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා පිළිඹිබු වේ.

අවදානම් අභිරුචිය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර සැලසුම් ක්‍රියාවලියේ ඒෙන්ද්‍රීය කොටසක් ලෙස හඳුන්වාදිය හැකිය. බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශය එහි ව්‍යාපාර මෙහෙයුම් සහ අවදානම් එකිනෙකට බද්ධ කරමින් වටිනාකම ඉහළ නංවයි. එය දෛනික ව්‍යාපාර මෙහෙයුම් වලදී ව්‍යාපාරික අංශ විසින් දැරීමට සූදානම් අවදානම් මට්ටම පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා ඔවුන්ට පහසුකම් සලසයි. එවිට අවදානම කෙරෙහි අවධානය යොමු කරමින් වැඩි තීරණ ප්‍රමාණයකට එළඹීමට ඔවුන්ට හැකියාව ලැබේ.

බැංකුවේ වටිනාකම් සහ මූල්‍ය තත්වය කෙරෙහි අවම වශයෙන් අහිතකර බලපෑම් ඇති කරන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පරාමිති භාවිත කරමින් බැංකුව ආයතනික මට්ටමේදී අවදානම් අභිරුචිය සකස් කිරීම සඳහා ඉහළ සිට පහළට යන ප්‍රවේශය අනුගමනය කරයි. ආයතනික මට්ටමේදී ප්‍රමාණාත්මක අවදානම් අභිරුචිය මගින් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලතාවය, ලාභදායීතාවය සහ අනෙකුත් විචක්ෂණශීලී අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කෙරේ.



සටහන 4: අවදානම් අභිරුචි කාර්යරාමුව ක්‍රියාත්මක කිරීම


ප්‍රධාන වශයෙන් බැංකුවට ශූන්‍ය අවදානම් අභිරුචියක් පවත්නා අවදානම් ගුණාත්මක ප්‍රකාශ මගින් ආවරණය වේ.

ව්‍යාපාරික මට්ටමේදී ණය, සාමාන්‍ය කොටස්, පොළී අනුපාතය, විදේශ විනිමය වෙළඳාම සහ මෙහෙයුම් ආශ්‍රිත අවදානම් කාණ්ඩ මගින් අවදානම් අභිරුචි සීමා තීරණය කෙරේ.

සීමා වූහ, අයවැය ගත කරන ලද මට්ටම් සහ ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක භාවිතයෙන් වඩා විචක්ෂණශීලී අවදානම් අභිරුචි මට්ටම් ස්ථාපිත කරගැනීම අරමුණු කරගෙන ආංශික සහ නිමැවුම් මට්ටමේදී ඉහළ සිට පහළට යන ප්‍රවේශය සහ පහළ සිට ඉහළට යන ප්‍රවේශය සංකලනය කෙරේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශය වාර්ෂිකව හෝ අවදානම් පරිසරයේ සිදුවූ අනපේක්ෂිත වෙනස්කම් හේතුකොටගෙන වසරකට වඩා අඩු කාලයකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගය, නියාමන අවශ්‍යතා සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සමග අනුකූල වන බව සහතික කරගැනීම එහි අරමුණ වේ. අවදානම් අභිරුචි මට්ටම් තුල රැඳෙමින් අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර එකී වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරාදී ඇත.

ආදායම් අභිරුචි ප්‍රගති වාර්තාව - ආයතනික මට්ටම



සටහන 5

අවදානම් කළමනාකරණ අංශය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පරාමිති භාවිත කරමින් තථ්‍ය කාර්යසාධනය නිරීක්ෂණය කරන අතර එම නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට/අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම්හි කොටසක් ලෙස ණය, වෙළඳපල සහ මෙහෙයුම් අවදානම් පිළිගැනීමට බැංකුවේ අවදානම් අභිරුචිය ඉඩ සලසයි. මෙම ප්‍රධාන අවදානම්, අවදානම් අභිරුචි කාර්යරාමුව මගින් නිශ්චිතව දක්වා තිබෙන මට්ටම් තුල රැඳෙමින් කළමනාකරණය කෙරේ.


ණය අවදානම

කිසියම් ණයකරුවෙකු හෝ ප්‍රතිපාර්ශ්වයක් මූල්‍ය උපකරණයන් සම්බන්ධයෙන් ණය ලබාදෙන ආයතනයක් සමග ඇති කර ගන්නා ලද මූල්‍ය හා ගිවිසුම් ප්‍රකාර වගකීම් නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම/ප්‍රමාද වීම මත ඇති වන මූල්‍ය පාඩුවක් ණය අවදානම ලෙස හැඳින්වේ.

බැංකුව ප්‍රධාන වශයෙන් ණය අවදානම කෙරෙහි නිරාවරණය වනු ලබන්නේ ශේෂ පත්‍රයෙහි සඳහන් අයිතමයන් මත ණය හා ලැබිය යුතු දෑ සහ ණය සුරැකුම්හි ආයෝජනයන්ගෙන් මෙන්ම ශේෂ පත්‍රයෙහි සඳහන් නොවන අයිතමයන් වන ණයවර ලිපි තහවුරු ලිපි ආදිය මගිනි.

ප්‍රතිපාර්ශ්වයන් විසින් ණය නොපියවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම, ගණුදෙනුකරුවන් විසින් ණය නොපියවීමේ අවදානම යන අවදානම් ණය අවදානම යන්නට ඇතුළත් වේ.

ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන හා නොවන අවදානම




සටහන 6

දෙසැම්බර් 31 දිනට	උපරිම නිරාවරණය 2017 රු. '000	උපරිම නිරාවරණය 2016 රු. '000	වෙනස %
මුදල් හා මුදල් වලට සමාන වෙනත් සාධක	**3,849,627**	4,619,699	(17)
බැංකු වල රැඳවූ මුදල්	**23,438,104**	19,013,572	23
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	2,728,445	(50)
වෙනත් මූල්‍ය වත්කම් - වෙළඳ කටයුතු සඳහා රඳවාගත්	**6,472,314**	20,290,588	(68)
බැංකුවලට ණය හා ලැබිය යුතු දෑ	**27,714,565**	31,834,072	(13)
වෙනත් ගණුදෙනුකරුවන්ට ණය හා ලැබිය යුතු දෑ	**360,309,866**	291,976,942	23
මූල්‍ය වත්කම් - අලෙවිය සඳහා පවතින	**5,693,829**	6,227,764	(9)
මූල්‍ය වත්කම් - කල්පිරීම සඳහා රඳවාගත්	**544,273,077**	505,824,398	8
ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන	**973,112,096**	882,515,480	10
ශේෂ පත්‍රයෙන් නිරාවරණය නොවන	**17,060,099**	24,501,480	(30)
ණය නිරාවරණය	**990,172,195**	907,016,960	9

වගුව 1: උපරිම ණය අවදානම් නිරාවරණය


බැංකු වලට හා අනෙකුත් ගණුදෙනුකරුවන්ට ණය හා ලැබිය යුතු දෑ සහ ණය සුරැකුම් වල ආයෝජනය ණය අවදානමේ වඩාත් පැහැදිලි හා ඒ සඳහා ඉහළම දායකත්වයක් දක්වන ප්‍රභවයන් වන අතර එය බැංකුවේ සමස්ත ණය නිරාවරණයෙන් 98% කි. 2017 වර්ෂයේදී බැංකුවේ ණය නිරාවරණය 9% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 990 ක් දක්වා ඉහළ ගියේය. පුද්ගල හා ආයතනික ණය කළඹ පුළුල් කිරීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු සාධක විය.

ණය සහ ලැබිය යුතු දෑ - කළඹ මිශ්‍රය



සටහන : 7


පුද්ගල ණය කළඹ



සටහන : 8

ආයතනික ණය කළඹ

[%]



සටහන: 9

අවදානම් සමාලෝචනය

අවදානම් සාධකය	විස්තරය	නිරීක්ෂණය/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම
ප්‍රතිපාර්ශ්ව විසින් ණය වගකීම පැහැරහැරීමේ අවදානම	බැංකුව සමග එළඹුණු ගිවිසුම් ප්‍රකාරව එකඟවූ පරිදි සිය වගකීම් ඉටු කිරීමට ප්‍රතිපාර්ශ්ව අසමත්වීම හේතුවෙන් ඇති විය හැකි බලපෑම	• පූර්ව අනතුරු හැඟවීමේ දර්ශක නිරීක්ෂණය කිරීම, අක්‍රිය වත්කම් • ණය සමාලෝචනය කිරීමේ යාන්ත්‍රණය	ඉහළ	මධ්‍යස්ථ
සංකේන්ද්‍රණ අවදානම	කර්මාන්ත ක්ෂේත්‍රයක හෝ භූගෝලීය ප්‍රදේශයක ණය ආශ්‍රිත පාර්ශ්වකරුවන්ගේ අසම ව්‍යාප්තිය	• හර්ෆින්ඩල් හර්ෂ්මාන් (HHI) දර්ශකය • සීමා නිරීක්ෂණය • ආතති පරීක්ෂාව	මධ්‍යස්ථ	මධ්‍යස්ථ
ණය නොපියවීමේ අවදානම	ණය පියවන අවස්ථාවේදී සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීමෙන් ඇති විය හැකි අවදානම	• ණය ශ්‍රේණිගත කිරීම/ලකුණු ලබාදීම/ආතති පරීක්ෂාව • සීමා නිරීක්ෂණය	මධ්‍යස්ථ	පහළ
ශේෂවූ අවදානම	අනෙකුත් සියළුම අවදානම් ඉවත් කිරීමෙන්, අවම කරගැනීමෙන් සහ වෙනත් ආකාරයකින් වගවීමෙන් පසුව ශේෂවූ අවදානම් හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම	• සුරැකුම්කරණය • තක්සේරු කිරීම/නැවත තක්සේරු කිරීම නිරීක්ෂණය කිරීම • ණය සඳහා වටිනාකම් අනුපාතික නිරීක්ෂණය කිරීම	මධ්‍යස්ථ	පහළ

*ඉහළ ආතති මට්ටමකදී ඉපයීම් සහ ප්‍රාග්ධනය මත ඇති විය හැකි බලපෑම


වගුව 2: ණය අවදානම සමාලෝචනය

ප්‍රතිපාර්ශ්ව විසින් ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම

එළඹුණු ගිවිසුම් ප්‍රකාරව එකඟවූ පරිදි සිය වගකීම් ඉටු කිරීමට ප්‍රතිපාර්ශ්ව අසමත්වීමේ අවදානම වේ.

ණය අවදානම තුල අන්තර්ගත වඩාත් වැදගත් සාධකය වන ප්‍රතිපාර්ශ්ව විසින් ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම යන්නෙන් අදහස් වන්නේ බැංකුව සමග එළඹුණු ගිවිසුම් ප්‍රකාරව එකඟවූ පරිදි සිය වගකීම් ඉටු කිරීමට ප්‍රතිපාර්ශ්ව අසමත්වීමේ අවදානම වේ.

ණය මුදල සහ අක්‍රිය ණය අනුපාතිකය



සටහන 10


ප්‍රතිපාර්ශ්ව විසින් ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම වළක්වාගැනීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි ණය අවදානම් කළමනාකරණ පරිචයන් පසුගිය වසර කිහිපය තුල මැනවින් කළමනාකරණය කරන ලද බැංකුවේ අක්‍රිය ණය අනුපාතිකය මගින් සනාථ වේ. 2016 දී 2.6% ක් ලෙස සටහන්වූ බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතිකය 2017 වර්ෂය වන විට 1.34% දක්වා අඩු කරගැනීමට බැංකුව හැකියාව ලැබිණි.

සංකේන්ද්‍රණ අවදානම

සමාන ආර්ථික ලක්ෂණ සහිත ප්‍රතිපාර්ශ්ව හෝ නිරාවරණ කිහිපයක් ආශ්‍රිත මෙන්ම එවැනි ප්‍රතිපාර්ශ්ව ස්වභාවයෙන් සමාන ක්‍රියාකාරකම්වල නිරත වන විට හෝ එකම භූගෝලීය ප්‍රදේශයක හෝ සමාන කර්මාන්ත ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වන අවස්ථාවලදී සංකේන්ද්‍රණ අවදානම ඉස්මතු වේ. මන්ද ගිවිසුම්ගත වගකීම් හා අනුකූලවීම සඳහා ඔවුන් සතු සාමූහික හැකියාව එකම ආකාරයෙන් ආර්ථික, දේශපාලනික හෝ වෙනත් පරිවර්තනයන්ගේ බලපෑමට ලක්වන බැවිනි.

ණය කළඹෙහි පවත්නා සංකේන්ද්‍රණය තක්සේරු කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ප්‍රධාන වශයෙන් හර්ෆින්ඩල් හර්ෂ්මාන් (HHI) දර්ශකය භාවිත කරනු ලබයි. රජයේ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා බැංකුව දක්වන දායකත්වය මත පදනම්ව බැංකුව තුල ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය කෙරෙහි මධ්‍යස්ථ අවදානම් අභිරුචියක් පවතී. මහා පරිමාණ ණය පහසුකම් සියල්ලම පාහේ ප්‍රධාන කාර්යාලයේ ණය අංශය මගින් අයදුම් කෙරෙන හෙයින් බස්නාහිර පළාත සම්බන්ධයෙන් ඉහළ භූගෝලීය සංකේන්ද්‍රණයක් පවතී. සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීම සඳහා බැංකුව විසින් කළඹ සම්බන්ධයෙන් වන සංකේන්ද්‍රණ සීමා නිරීක්ෂණය කිරීම සහ ආතති පරීක්ෂාව වැනි ක්‍රියාමාර්ග ගනු ලබයි.


අක්‍රිය ණය අනුපාතිකය ආශ්‍රිත කාල විග්‍රහය



සටහන 11

භූගෝලීය සංකේන්ද්‍රණය


[%]



සටහන 12

ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය

[%]



සටහන 13

ණය නොපියවීමේ අවදානම

යම් ගණුදෙනුවක ප්‍රතිපාර්ශ්වයක් විසින් ණය පියවන අවස්ථාවේදී සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීමේ අවදානම ණය නොපියවීමේ අවදානම ලෙස හඳුන්වාදිය හැකිය. යම් පාර්ශ්ව දෙකක් විසින් ණය පියවීමේ කාලය අතර පවත්නා වෙනස මෙන්ම ණය ගෙවීම පැහැර හැරීම සමගද මෙම අවදානම මතු විය හැකිය.

සාමාන්‍යයෙන් යම් නුවමාරු පද්ධතියක් මගින් සිදු කෙරෙන ණය පියවීමක් අපේක්ෂා කළ පරිදි සිදු නොවීම හේතුවෙන්ද ණය නොපියවීමේ අවදානම මතු වේ. බොහෝවිට මෙය සිදුවන්නේ එක් පාර්ශ්වයක් විසින් තවත් පාර්ශ්වයකට හෝ පාර්ශ්ව කිහිපයක් වෙනුවෙන් වූ සිය නිශ්කාශන වගකීම පැහැර හැරීම හේතුවෙනි. ණය නොපියවීමේ අවදානම නිරීක්ෂණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව පුළුල්වූ සීමා කාර්යරාමුවක් ස්ථාපිත කර ඇත.


ශේෂවූ අවදානම

ශේෂවූ අවදානම පිළිගත හැකි මට්ටමක පවත්වාගැනීම සඳහා ශක්තිමත් පාලන තන්ත්‍රයක් සහ අවදානම් වළක්වාලීමේ ක්‍රමවේද බැංකුවේ අවදානම් පාලන කාර්යරාමුව තුලට අන්තර්ගත කර තිබෙන අතර එහිදී එවැනි අවදානම් වළක්වාලීම සඳහා දැරීමට සිදු වන පිරිවැය සහ ගතවන කාලය කෙරෙහි අවධානය යොමු කර ඇත.

සුරැකුම්කරණය, පුද්ගල ණය ප්‍රතිපත්තිය ප්‍රකාරව ණය සඳහා වටිනාකම් අනුපාතිකය පවත්වාගැනීම සහ ශක්තිමත් ණය අයකරගැනීමේ ක්‍රමවේද වැනි අවදානම වළක්වාලීමේ ක්‍රියාවලි සහ පටිපාටි වලින් සැදුම්ලත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරය මගින් අවදානම් අභිරුචිය තුල රැඳෙමින් බැංකුවේ ශේෂවූ අවදානම කළමනාකරණය කෙරෙන බව සහතික කෙරේ. එසේම, විචක්ෂණශීලී අනුපාත භාවිතයට ගනිමින් සහ ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ ප්‍රාග්ධන වෙන්කිරීම් පදනම් කරගනිමින් බැංකුව ණය අවදානම තක්සේරු කරයි. ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ බැංකුවේ සමස්ත ණය නිරාවරණයෙන් 69.4% කට වැඩි ප්‍රමාණයක ණය බර තැබීම 0% ලෙස සටහන් වන අතර 100% ලෙස ණය බර තැබීම සටහන් වන්නේ 3.7% ක් සඳහා පමණි.

අවදානම් අභිරුචි සීමා කාර්යරාමුව සහ බැංකුවේ පවරන ලද බලතල සීමා ඔස්සේ ණය අවදානම නිරීක්ෂණය කෙරේ. සුපැහැදිලි හා ස්ථාවර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සමගින් ශක්තිමත් අවදානම් පාලන කාර්යරාමුවක් ඔස්සේ බැංකුවේ ණය අවදානම කළමනාකරණය කෙරේ.

අවදානම් පාලනය



සටහන 14: ණය අවදානම් පාලන ව්‍යුහය

ණය අවදානම් පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ආරම්භවී කළමනාකාරීත්වයේ විවිධ ස්ථර අතරින් පහළට විහිදී යයි. ණය අවදානම් කළමනාකරණයේ වගකීම් සහ පාලනය නිශ්චිතව පෙන්වාදීම සඳහා සංසක්ත ණය අවදානම් පාලනයක් එමගින් සහතික කෙරේ.

අවදානම් අභිරුචිය සහ සීමා ව්‍යුහය, ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, පවරන ලද අනුමත කිරීමේ සීමා සහ බැංකුවේ කමිටු ව්‍යුහය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ණය නිරාවරණය අධීක්ෂණය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය අවදානම් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ සහ ණය අවදානම හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ පටිපාටි සකස් කිරීමේ වගකීම ඉහළ කළමනාකාරීත්වයට පැවරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව වෙත පවරා තිබෙන අතර ණය කමිටුව සහ ආයෝජන කමිටුව වැනි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු විසින් එය තව දුරටත් බලගන්වනු ලබයි.

බැංකුවේ අවදානම් අභිරුචිය සහ ප්‍රතිපත්තිමය කාර්යරාමුව තුල සිට ණය අවදානම නිරීක්ෂණය සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ අංශයේ ණය අවදානම් කළමනාකරණ ඒකකය වගවේ. ණය අවදානම් කළමනාකරණ ඒකකය වෙත පැවරී තිබෙන වගකීම් පහත පරිදි වේ.

- ප්‍රතිපත්ති අළුත් කිරීම/යාවත්කාලීන කිරීම
- ප්‍රමාණාත්මක අවදානම් ආකෘති සකස් කිරීම සහ පවත්වාගැනීම
- අවදානම් අභිරුචි සීමා නිරීක්ෂණය
- ගණුදෙනු හා කළඹ මට්ටම් වලදී ණය අවදානම් සමාලෝචනය
- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම
- ප්‍රධාන අවදානම් දර්ශක සහ පූර්ව අනතුරු හැඟවීමේ දර්ශක නිරීක්ෂණය කිරීම
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් ණය කමිටුව, ආයෝජන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම

ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ඵලදායී ණය අවදානම් කළමනාකරණය පුළුල්වූ කළමනාකරණ ප්‍රවේශයක නිරණාත්මක සාධකයක් වන අතර බැංකුවේ දිගු කාලීන සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය කරුණක් වේ.

ණය ගුණාත්මකභාවය සහ ණය අවදානම් නිරාවරණය අවදානම් අභිරුචි මට්ටම් තුල රැඳෙමින් කළමනාකරණය කිරීම ඔස්සේ බැංකුවේ අවදානම අනුව ගණනය කරන ලද ආදායම් අනුපාතිකය උපරිම කරගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය අවදානම් කළමනාකරණයේ ඉලක්කය වේ.

කළඹ මට්ටමේදී මෙන්ම ගණුදෙනු මට්ටමේදී පවතින ණය අවදානම කළමනාකරණය කරගැනීම සඳහා බැංකුව අවදානම් කළමනාකරණ උපකරණ සහ ක්‍රමවේද පද්ධතියක් භාවිත කරයි.

2017 වර්ෂය තුලදී ණය අවදානම් කළමනාකරණය තව දුරටත් ශක්තිමත් කරගැනීම සඳහා බැංකුව විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ණය මෙහෙයුම් සහ ණය අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව ස්ථාපිත කිරීම.
- පුද්ගල ණය පරිපාලන කාර්යය ස්වාධීනව සිදු කිරීමට කැපවූ ණය පරිපාලන ඒකකය ස්ථාපිත කිරීම.
- අවදානම මත පදනම්වූ මිල තීරණ ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ණය ඇගයීම ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ සහ ලකුණු ලබාදීමේ පද්ධති ක්‍රියාත්මක කිරීම.

අවදානම ශ්‍රේණිගත කිරීම

ප්‍රතිපාර්ශ්වයන්ගේ ණය යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා බැංකුව ණය ශ්‍රේණිගත කිරීම භාවිත කරයි. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් පරාමිති වලින් සමන්විත වන අභ්‍යන්තර අවදානම් ආකෘති භාවිතයෙන් ණය යෝග්‍යතාවය තක්සේරු කෙරේ. මේ යටතේ ණය ගෙවන්නා ආශ්‍රිත අවදානම සහ ණය පහසුකමට අදාළ අවදානම තක්සේරු කෙරෙන අතර අභ්‍යන්තර ණය ශ්‍රේණි නමයක් අතුරින් ප්‍රතිපාර්ශ්වයට අදාළ ශ්‍රේණිය ලබාදීම සිදුවේ.

පුද්ගල ණය නිකුත් කිරීමේදී ණය යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව ණය ආශ්‍රිතව ලකුණු ලබාදීම සිදු කරයි. ණය යෝග්‍යතාවය සහ අවදානම සැලකිල්ලට ගනිමින් සියළු ගණුදෙනුකරුවන් අංක එකේ සිට අට දක්වාවූ ලකුණු පරාසයක පිහිටුවනු ලැබේ.

මෙම පද්ධතිය බැංකුවේ පුද්ගල ණය නිමැවුම් ආවරණය කරමින් ශාඛා ජාලය තුල ක්‍රියාත්මක කෙරේ.

පුද්ගල ප්‍රතිපාර්ශ්වයක සිට නිශ්චිත නිමැවුමක් දක්වා වූ පරාසය තුල විහිද යන ණය යෝග්‍යතාවයේ හා අවදානමේ එකම පිළිඹිබුව ලෙස ණය ආශ්‍රිත ලකුණු ලබාදීමේ ක්‍රමවේදය කෙරෙහි බැංකුව විශ්වාසය තබා ඇත. ණය අනුමත කිරීම සහ අවදානම මත මිල තීරණය කිරීම විධිමත් කිරීම සඳහා පහසුකම් සලසන්නෙක් ලෙස මෙම පද්ධතිය ක්‍රියාත්මක වේ.

සුරැකුම් කළමනාකරණය සහ තක්සේරුකරණය

බැංකුව ණය පහසුකම් සඳහා සුරැකුමක් ලෙස ඇප ලබා ගන්නා අතර ඈවර කිරීමේදී මුල් ණය මුදල, පොලිය, නීති ගාස්තු සහ වෙනත් ගාස්තු ආවරණය කරගැනීම සඳහා ප්‍රමාණවත් වටිනාකමකින් එය යුක්ත වන බව බැංකුව සලකයි.


නිශ්චල දේපළ මත නිකුත් කෙරෙන ණය පහසුකම් සඳහා අදාළ වන සුරැකුම් ආවරණ සීමා බැංකුව විසින් නිශ්චිතව අර්ථ දක්වා තිබේ. සියළුම නිශ්චල දේපළ බැංකුවේ ලියාපදිංචිවූ තක්සේරුකරුවන් විසින් තක්සේරු කරනු ලැබේ. එහිදී නිශ්චල දේපළ තක්සේරු කිරීම සහ නැවත තක්සේරු කිරීම සඳහා ප්‍රමිතිගත තක්සේරු නිර්නායක අනුගමනය කිරීමට ප්‍රවීණ තක්සේරුකරුවන් පිරිසකගෙන් සැදුම්ලත් මණ්ඩලයක් බැඳී සිටී. නිශ්චල දේපළ තක්සේරු කිරීම සහ නැවත තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සකස් කර ඇත.

ණය අවදානම් කළමනාකරණ ඒකකය විසින් අවදානම වළක්වාලීම සඳහා ක්ෂණික පියවර ගැනීම අරමුණු කරගෙන පූර්ව අනතුරු හැඟවීමේ දර්ශකයක් ලෙස නැවත තක්සේරු කිරීම සිදු කළ යුතු ණය පහසුකම් නිරීක්ෂණය කරනු ලබයි. එසේම, නිශ්චල දේපළ, උකස් කටයුතු සහ තැන්පතු මත ණය ලබාදීම හා අදාළ ණය සඳහා වටිනාකම් අනුපාතිකය නිරීක්ෂණය කර ණය කමිටුව වෙත වාර්තා කරයි.

2017 වර්ෂයේදී ණය කළඹෙන් 78% ක් නිශ්චල දේපල මත පදනම්වූ අතර ණය සඳහා වටිනාකම් අනුපාතිකය 50%කට වඩා අඩු මට්ටමක පැවතිණ.

ණය කළඹ - සුරැකුම් වශයෙන්

[%]



සටහන 15

දෙසැම්බර් 31 දිනට	2017		2016	
	රු. '000	සංයුතිය (%)	රු. '000	සංයුතිය (%)
ණය සඳහා වටිනාකම් අනුපාතිකය				
50% ට අඩු	**51,515,268**	**78.5**	48,438,163	78.3
51 - 75%	**12,160,610**	**18.5**	11,334,198	18.3
50% ට වැඩි	**1,988,195**	**3.0**	2,110,331	3.4
	65,664,073	**100.0**	61,882,692	100.0

වගුව 3: නිශ්චල දේපල මත ණය ආශ්‍රිත ණය සඳහා වටිනාකම් අනුපාතිකය

ණය සමාලෝචන යාන්ත්‍රණය

ණය ලබාදීමේදී හා ලේඛන ක්‍රියාවලියේ පවතින අඩුලුහුඩුකම් නිසි ලෙස හඳුනාගැනීම සහ ඒවා නිවැරදි කිරීම ඔස්සේ ණය අවදානම වළක්වාලීම සඳහා ඵලදායී උපකරණයක් ලෙස ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය බැංකුව විසින් භාවිත කරනු ලබයි. මෙම ක්‍රියාවලිය මගින් ණය ක්‍රියාවලිය සහ ණය ගුණාත්මකභාවය පිළිබඳ තත්ව සහතිකයක් ලබාදෙයි.


බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා මට්ටමේදී ණය මෙහෙයුම් ආවරණය කිරීම සහතික කරන අතර අනුමත කරන ලද දිනයේ සිට ගතවන මාස තුන ඇතුළත ඉහළ වටිනාකමක් සහිත ණය සමාලෝචනය කොට ණය කමිටුව වෙත වාර්තා කිරීම ණය අවදානම් නිරීක්ෂණ ඒකකය විසින් සිදු කරනු ලබයි.

හානිකරණ විධිවිධානය

දරන ලද පාඩු ක්‍රමවේදය මත පදනම්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව බැංකුවේ හානිකරණ විධිවිධානය ගණනය කෙරේ. ණය ගුණාත්මකභාවය ඉහළ ගියද 2016 වර්ෂයට සාපේක්ෂව බැංකුවේ සාමූහික හානිකරණය සඳහා වන විධිවිධානය 33%න් වර්ධනය විය. 2017 වර්ෂය සඳහා වන විධිවිධාන ආවරණය 46% ක් වන අතර එය අභ්‍යන්තර සීමා වලට සමාන්තරව පවතී.

මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය ඉහළ නැංවීමේ අභිලාෂය සමග ශේෂ පත්‍ර වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් සාධාරණ අගයක් ජනිත කිරීමට අවස්ථාව සලසමින් ශ්‍රී ලංකා මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති 9 (SLFRS 9) 2018 වර්ෂයේදී පළමු වතාවට බැංකුවේ ආදායම් ප්‍රකාශ කෙරෙහි අදාළ කරගැනීමට නියමිතය. මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් අපේක්ෂිත ණය පාඩු හඳුනාගැනීම හේතුවෙන් මෙමගින් ණය පාඩු විධිවිධානය ඉහළ නැංවෙනු ඇත. ඒ අනුව ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කිරීමක් ලෙස නොව අනාගතය පිළිබඳ දැක්මක් ලෙස සකස් කෙරෙනු ඇත.

අක්‍රිය ණය අනුපාතය සහ හානිකරණ විධිවිධානය



සටහන 16

අවදානම් පැවරීම

බැංකුව විසින් අවදානම් පැවරීමේ ක්‍රමෝපායක් ලෙස රක්ෂණය යොදා ගන්නා අතර එහිදී ගිවිසුමකට යටත්ව අවදානම රක්ෂණ ආයතනයක් වෙත පවරනු ලබයි. ණය ගැනුම්කරුගේ ණය යෝග්‍යතාව සැලකිල්ලට ගනිමින් ණය අයකරගැනීම සඳහා වන අතිරේක ආවරණයක් ලෙස බැංකුව හීන වන කාල රක්ෂණාවරණය භාවිත කරයි. එසේම, නිශ්චල දේපළ සුරැකුම් මත පදනම්වූ පුද්ගල සහ ආයතනික ණය ආශ්‍රිත අවදානම් පැවරීම සඳහා නාමික රක්ෂණය සහ ගිනි රක්ෂණය ද යොදා ගැනේ.

සංසිද්ධි විශ්ලේෂණය සහ ආතති පරීක්ෂාව

බැංකුවට බාහිරින් ඇති වන අහිතකර ආර්ථික, දේශපාලනික සහ භෞතික වෙනස්කම් වල ප්‍රතිඵලයක් ලෙස ජනිත වන විවිධ මට්ටමේ උග්‍රතාවන්ගෙන් යුතු අනපේක්ෂිත ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නගින ණය අවදානම තක්සේරු කිරීම සඳහා බැංකුව විසින් සංසිද්ධි විශ්ලේෂණය සහ ආතති පරීක්ෂාව භාවිතයට ගනු ලබයි.

ණය අවදානම සඳහා වන ආතති පරීක්ෂාව බාසල් III යටතේ බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය කෙරෙහි යම් ආර්ථික පසුබෑමක් විසින් ඇති කරනු ලබන බලපෑම තක්සේරු කිරීමට උපකාර වේ. මෙම පරීක්ෂාව මගින් ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ හැකියාව ඉහළ යන මට්ටම තක්සේරු කෙරේ. බැංකුවේ වත්කම් වල ගුණාත්මකභාවය පහළ යාම මෙන්ම අතිරේක විධිවිධාන අවශ්‍යතා හේතු කොටගෙන බැංකුවේ අවදානම අනුව බර තැබූ වත්කම් ඉහළ යනු ඇත.

විස්තර	සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය කෙරෙහි වන බලපෑම හිතකර/(අහිතකර) %		
	පහළ	මධ්‍යම	ඉහළ
ණය අවදානම - ආර්ථික පසුබෑමක් හේතුවෙන් ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව ඉහළයාම (පහළ - 10% - මධ්‍යම 20% - ඉහළ 30%)	(0.12)	(0.24)	(0.36)

වගුව 4: ආතති පරීක්ෂාව - ණය අවදානම

වෙළඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනුවෙන් හැඳින්වෙන්නේ වෙළෙඳපොල මිල ගණන් ආශ්‍රිත වෙනස්වීම් හේතුවෙන් ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන සහ නොවන බැංකුවේ මූල්‍ය වත්කම් සහ වගකීම් වල වටිනාකම උච්ඡාවචනය වීමේ අවදානමයි. මෙම මිල වෙනස්වීම් හටගන්නේ එක් එක් උපකරණයට හෝ ඒවා නිකුත් කරන පාර්ශ්වයට හෝ ප්‍රතිපාර්ශ්වයට ආවේණිකවූ සාධක හේතුවෙන්ද නැතහොත් වෙළඳපල තුල ගනුදෙනු වන සියළු උපකරණ වලට අදාළ සාධක නිසාද යන්න එහිදී නොසැලකේ. එබැවින් වෙළෙඳපොල අවදානම ණය සුරැකුම් වෙළඳපොල, කොටස් වෙළඳපොල, විනිමය වෙළඳපොල සහ භාණ්ඩ වෙළඳපොල යන ප්‍රධාන ආර්ථික වෙළඳපොල සතරෙහි මිල අස්ථායීතාවය සමග බද්ධ වී තිබේ.

මෙම වෙළඳපොලවල මිල උච්ඡාවචනය හේතුවෙන් වෙළඳ හා බැංකු පොත් වල පොලී අනුපාත අවදානම, සාමාන්‍ය කොටස් මිල අවදානම, විනිමය අනුපාත අවදානම සහ වෙළඳ භාණ්ඩ මිල අවදානම හටගනී. බැංකුව වෙළඳ භාණ්ඩ සඳහා ආයෝජනය කිරීමක් සිදු කිරීමක් නොකරන හෙයින් බැංකුව භාණ්ඩ මිල අවදානමට සෘජුවම නිරාවරණය නොවේ. කෙසේ නමුත්, රන් හා බොරතෙල් වැනි වෙළඳ භාණ්ඩ වල මිල ගෝලීය වශයෙන් වෙනස්වීම බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි වක්‍ර බලපෑමක් ඇති කරයි.

පොලී අනුපාත, කොටස් මිල සහ විදේශ විනිමය අනුපාත වල අවාසිගත වෙනස්වීම්, මූල්‍ය උපකරණ වල වෙළඳපොල වටිනාකම, තථ්‍ය සහ ඵලදායී ඉපැයීම් සහ අනාගත මුදල් ප්‍රවාහය පහළ දමනු ලබයි.

දෙසැම්බර් 31 දිනට	රු. '000 (විගණනය කරන ලද)			
	ප්‍රාථමික වෙළඳපොළ අවදානම් සාධක	ඉදිරියට ගෙන ආ මුදල	වෙළඳපොල අවදානම් මිනුම්	
			වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
වෙළඳපොල අවදානමට යටත් වත්කම්				
මුදල් හා මුදල් වලට සමාන වෙනත් සාධක	IRR*	3,849,627	–	**3,849,627**
බැංකු වල රැඳවූ මුදල්	IRR, FX**	23,438,104	–	**23,438,104**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	FX	1,360,714	1,360,714	–
වෙනත් මූල්‍ය වත්කම් - වෙළඳ කටයුතු සඳහා රඳවාගත්	IRR, Equity	6,472,314	6,472,314	–
බැංකුවලට ණය හා ලැබිය යුතු දෑ	IRR	27,714,565	–	**27,714,565**
වෙනත් ගණුදෙනුකරුවන්ට ණය හා ලැබිය යුතු දෑ	IRR	360,309,866	–	**360,309,866**
මූල්‍ය වත්කම් - අලෙවිය සඳහා පවතින	IRR, Equity	5,693,829	5,693,829	–
මූල්‍ය වත්කම් - කල්පිරීම සඳහා රඳවාගත්	IRR	544,273,077	–	**544,273,077**
		973,112,096	**13,526,857**	**959,585,239**
වෙළඳපොල අවදානමට යටත් වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	IRR	180,439	–	**180,439**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	FX	956,937	956,937	
වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු	IRR	737,212,640	–	**737,212,640**
වෙනත් ණය ගැනීම්	IRR, FX	217,955,777	–	**217,955,777**
යටත්කාලීන වගකීම්	IRR	6,006,411	–	**6,006,411**
		962,312,204	**956,937**	**961,355,267**

වගුව 5: වෙළඳපොල අවදානම් නිරාවරණය

** පොලී අනුපාත අවදානම*

*** විදේශ විනිමය අවදානම*

සිය තැන්පතු වලින් 60% ක් රාජ්‍ය සුරැකුම්හි රඳවා තැබීම බැංකුව විසින් ඉටු කළ යුතු අනිවාර්ය අවශ්‍යතාවයකි. රාජ්‍ය සුරැකුම් වෙළඳපළ තුල උච්ඡාවචන හේතුවෙන් හටගන්නා පොලී අනුපාත අවදානමට නිරාවරණය වෙමින් 2017 වර්ෂයේදී බැංකුව විසින් සිය තැන්පතු වලින් 67% ක් හා සමස්ත වත්කම් වලින් 49% ක් රාජ්‍ය සුරැකුම්හි රඳවා තබන ලදී.

බැංකුවේ සමස්ත සමකොටස් ආයෝජනය 2017 වර්ෂයේදී 1% කට වඩා අඩු මට්ටමක පැවතිණ.

බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් අතරට විදේශ විනිමය වෙළඳාම, තැන්පතු භාරගැනීම, ප්‍රේෂණ, ණයදීම, ව්‍යුත්පන්න සහ එක්සත් ජනපද ඩොලර බැඳුම්කර නිකුතුව හේතුවෙන් ඇතිවූ වගකීම් පියවීම අයත්වේ.

සාමාන්‍ය කොටස් යනු බැංකුවේ සමස්ත ආයෝජන වලින් සාපේක්ෂව කුඩා ප්‍රමාණයකි. සමකොටස් වලින් 53% ක් වෙළඳපල ආයෝජන වලද 47% ක් උපායමාර්ගික ආයෝජන වලද පැවතිණ.

අවදානම් සමාලෝචනය

පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, සාමාන්‍ය කොටස් මිල අවදානම ආශ්‍රිතව බැංකුවේ වෙළඳපොල අවදානම සමාලෝචනය කෙරේ. බැංකුව විවිධ ක්‍රමවේද සහ ආකෘති භාවිතයෙන් වෙළඳපොළ අවදානම් පැතිකඩ සමාලෝචනය කරයි.

අවදානම් සාධකය	විස්තරය	නිරීක්ෂණය/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම
පොලී අනුපාත අවදානම				
ප්‍රතිමිලකරණ අවදානම	බැංකුවේ ආයෝජන පොතෙහි වටිනාකම් මෙන්ම බැංකු පොතෙහි අනුපාත සංවේදී, ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන හා නොවන වත්කම් සහ වගකීම් වල අනුපාත වෙනස්වීම හෝ මුදල් ප්‍රවාහ අතර පවත්නා නොගැළපීම්.	• අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම් වලට අදාළ ප්‍රතිමිලකරණ වෙනස්කම් ආශ්‍රිත සීමා නිරීක්ෂණය කිරීම	ඉහළ	ඉහළ
ප්‍රතිලාභ වක්‍ර අවදානම	දිගු කාලීන අනුපාත වෙනස්වීම් වලට වඩා අඩු හෝ වැඩි වශයෙන් කෙටි කාලීන අනුපාත වෙනස්වීමේ අවදානම	• සංවේදිතාවය/අනුපාත කම්පන සමග ආතති පරීක්ෂාව	ඉහළ	ඉහළ
පදනම් අවදානම	සමාන කල්පිරීමේ කාලයක් හෝ ප්‍රතිමිලකරණ දින සහිත අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම්හි පොලී අනුපාත අතර අසමාන විචලන හේතුවෙන් පැන නගින අවදානම	• අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම්හි අනුපාත කම්පන ආශ්‍රිත සංවේදිතාවය	ඉහළ	ඉහළ
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය තත්ව කල්පිරීම ආශ්‍රිත නොගැළපීම් හේතුවෙන් පැන නගින විනිමය අනුපාත වල අහිතකර වෙනස්කම් හේතුවෙන් ඉපයීම් සහ ප්‍රාග්ධනය මත ඇති විය හැකි බලපෑම	• සීමා නිරීක්ෂණය • අවදානමේදී විදේශ විනිමය වටිනාකම • ආතති පරීක්ෂාව	ඉහළ	මධ්‍යස්ථ
කොටස් හිමිකම් අවදානම	සාමාන්‍ය කොටස් වෙළඳපොල මිලෙහි සිදුවන වෙනස්කම් මත පදනම්ව ඇති විය හැකි පාඩු	• අවදානමේදී සාමාන්‍ය කොටස් වටිනාකම • සීමා නිරීක්ෂණය • දෛනික ගනුදෙනු සඳහා පවතින ආයෝජන කළඹ සහ වෙළඳපළ මිළ ගණන් ගනුදෙනුවලට යාවත්කාලීන කිරීම	පහළ	පහළ
වෙළඳ භාණ්ඩ අවදානම	වෙළඳ භාණ්ඩවල (රන්) මිලෙහි සිදු වන වෙනස්කම් හේතුවෙන් ඇති වන ඍණ බලපෑම	• උකස් අත්තිකාරම් සඳහා වන සුරැකුම්වල වටිනාකම කෙරෙහි වන බලපෑම	සෘජුව නිරාවරණය නොවේ.	පහළ

*ඉහළ ආතති මට්ටමකදී ඉපයීම් සහ ප්‍රාග්ධනය මත ඇති විය හැකි බලපෑම

වගුව: වෙළඳපොල අවදානම සමාලෝචනය

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත වල ඇති විය හැකි වෙනස්කම් හේතුවෙන් බැංකුවේ ශුද්ධ වටිනාකම පහළ දැමීමට සමත්, ඉපයීම් හා ප්‍රාග්ධනය පහළ යාමේ අවදානම පොලී අනුපාත අවදානම ලෙස හඳුන්වාදිය හැකිය. බැංකුවේ ආයෝජන පොතෙහි වටිනාකම් මෙන්ම බැංකු පොතෙහි අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම් වල ප්‍රතිමිලකරණ කාල පරිච්ඡේද වල පවත්නා නොගැළපීම් ඔස්සේ පැන නගින පොලී අනුපාත අවදානමටද බැංකුව නිරාවරණය වේ.

බැංකුව මූලික වශයෙන් පොලී අනුපාත ප්‍රතිමිලකරණ වෙනස පිළිබඳ විශ්ලේෂණයක් මගින් පොලී අනුපාත අවදානම තක්සේරු කරයි. නිශ්චිතව දක්වා ඇති කල්පිරීමේ කාල පරාසයක් තුලදී ප්‍රතිමිලකරණය වන ඉපයූ වත්කම්හි පොලී ප්‍රමාණය සහ දරන වගකීම්හි පොලිය අතර වෙනස පොලී අනුපාත ප්‍රතිමිලකරණ වෙනස පිළිබඳ විශ්ලේෂණයක් මගින් තක්සේරු කෙරේ.

	මාස 1ට අඩු රු. මිලියන	මාස 1-3 රු. මිලියන	මාස 3-6 රු. මිලියන	මාස 6-12 රු. මිලියන	අවුරුදු 1-3 රු. මිලියන	අවුරුදු 3-5 රු. මිලියන	අවුරුදු 5ට වැඩි රු. මිලියන
පොළී අනුපාත සංවේදී වත්කම්	24,624	30,922	61,835	199,780	178,933	155,174	310,219
පොළී අනුපාත සංවේදී වගකීම්	199,861	256,153	129,752	316,234	47,012	10,138	2,206
කාල සීමා පරතරය	(175,237)	(225,231)	(67,917)	(116,454)	131,921	145,036	308,013
සමුච්චිත වෙනස	(175,237)	(400,468)	(468,385)	(584,839)	(452,918)	(307,882)	131
සත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම්වල ප්‍රතිශතයක් ලෙස - 2017	(88%)	(88%)	(52%)	(37%)	281%	1,431%	13,966%
සත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම්වල ප්‍රතිශතයක් ලෙස - 2016	(74%)	(89%)	(32%)	(64%)	76%	1,111%	–

වගුව 7: පොළී අනුපාත සංවේදිතා විශ්ලේෂණය

වෙළඳ පොතෙහි පොළී අනුපාත අවදානම

රජයේ සුරැකුම් සහ අලෙවිය සඳහා පවතින මූල්‍ය ආයෝජන කළඹ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වලින් සමන්විත වන අතර වර්ෂය අවසානයේදී පිළිවෙලින් එය රුපියල් බිලියන 4.2 සහ රුපියල් බිලියන 1.2 ලෙස සටහන් විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳ කළඹ මගින් හටගන්නා පොළී අනුපාත අවදානම තක්සේරු කෙරෙන්නේ ආයෝජන කළඹට අදාළ වෙළඳපොල සළුතා තක්සේරුව භාවිතයෙනි. එසේම කළඹ පදනම ත්‍රෛමාසිකව නිරීක්ෂණය කෙරේ.

බැංකු පොතෙහි පොළී අනුපාත අවදානම

බැංකු පොතෙහි වෙළඳපොල අවදානම් කළමනාකරණයට අදාළ ප්‍රධාන කොටස ප්‍රධාන වශයෙන් පොළී අනුපාත සංචලන මගින් ශුද්ධ පොළී ආදායම සහ සාමාන්‍ය හිමිකම් කොටස්වල ආර්ථික වටිනාකම වැනි ඉපයීම් මත ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම හා සම්බන්ධ වේ. මෙම අවදානම බැංකු පොතෙහි වත්කම් හා වගකීම් වල වෙනස්වූ ප්‍රතිමිලකරණ ලක්ෂණ හේතුවෙන් පැන නගී.

හිමිකරු කොටස් අවදානම

ආදායමේ සහ සංචිතයේ ඇති විය හැකි විචලන වලට බැංකුව නිරාවරණය කෙරෙමින් කොටස් වෙළඳපල සාධක හේතුවෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජන හීනවීමේ අවදානම සාමාන්‍ය කොටස්මිල අවදානම ලෙස හැඳින්වේ. සාමාන්‍ය කොටස් මෙන්ම ඒකක භාර වලට අදාළ ලැයිස්තුගත හා ලැයිස්තුගත නොකරන ලද කොටස් උපකරණ වල ආයෝජනය කිරීමෙන් හටගන්නා සමකොටස් ස්ථානීය අවදානමට බැංකුව නිරාවරණය වේ.

බැංකුවේ ලැයිස්තුගත සාමාන්‍ය කොටස් ආයෝජන කළඹ, වෙළඳ හා අලෙවිය සඳහා පවතින මූල්‍ය ආයෝජන යන කළඹ වලින් සමන්විත වේ. කොටස් වල කොපමණ දුරකට ආයෝජනය කෙරෙන්නේද යන්න තීරණය කෙරෙන්නේ බැංකුවෙහි සීමා ව්‍යුහය සහ එහි ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය මගිනි.


	2017		2016		
	පොත් වටිනාකම රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	පොත් වටිනාකම රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	උපලබ්ධි නොවූ ලාභ/(පාඩු) රු. '000
වෙළඳ කළඹ	**3,521,949**	**2,357,336**	4,533,006	3,095,911	(738,575)
විකිණීම සඳහා පවතින කළඹ	**3,107,875**	**4,440,951**	2,753,905	4,123,733	317,218
මුළු එකතුව	**6,629,824**	**6,798,287**	7,286,911	7,219,644	(421,357)

වගුව 8: කොටස් ආයෝජන කළඹ තත්වය

සමාලෝචනයට ලක්කෙරෙන වර්ෂය තුලදී කොටස් වෙළඳපල ක්‍රියාකාරීව පැවති අතර ලැයිස්තුගත සමකොටස් වල ආයෝජනය කිරීම කෙරෙහි දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ උනන්දුව ඉහළ යාමක් දක්නට ලැබිණි. ඒ අනුව, සියළු කොටස් මිල දර්ශකය සහ S &P SL 20 යන මිල දර්ශක පිළිවෙළින් 2% හා 5% ලෙස සටහන්වූ අතර සමකොටස් ආයෝජනය මගින් වාසිදායක ආදායමක් උපයාගැනීමට බැංකුවට හැකියාව ලැබිණ. වර්ෂය තුලදී සමකොටස් ආයෝජනය ඔස්සේ ප්‍රාග්ධන ලැබීම් සහ ලාභාංශ වශයෙන් පිළිවෙලින් රුපියල් බිලියන 225.9 ක් සහ රුපියල් බිලියන 297.1 ක් උපයාගැනීමට බැංකුව සමත් විය. (ලැයිස්තුගත නොකරන ලද ආයෝජන හැර) එය පෙර වර්ෂයේදී වාර්තාවූ අගයට වඩා සැලකිය යුතු වර්ධනයක් සටහන් කරයි.


බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වෙමින් ප්‍රාග්ධනය ඉපයීම සඳහා හිමිකම් නිකුතු සහ ණයකර නිකුතු රැසක් 2017 වර්ෂයේදී සිදු කරන ලදී. එබැවින්, ඉහළ ද්‍රවශීලතාවක් සහිත B & fi කොටස් වල ආයෝජනය කිරීම සඳහා අයෝජකයන් තුල පැවති උනන්දුව 2017 වසර තුලදී ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපල සඵලතා මත පදනම්වූ ආදායම් වර්ධනය විය.

සමකොටස් කළඹිහි සංයුතිය



සටහන 17

කළඹ ආදායම සහ වෙළඳපොල ආදායම



සටහන 18

විදේශ විනිමය අවදානම

අනපේක්ෂිත හා අවාසිදායක විදේශ විනිමය අනුපාත උච්ඡාවචනයෙහි ප්‍රතිඵලයක් ලෙස යම් වත්කමක හෝ ආයෝජන වල සහ විදේශ මුදල් ඒකක භාවිතයෙන් සිදු කෙරෙන ගණුදෙනු වල වටිනාකම අඩු වීමේ අවදානම විදේශ විනිමය අවදානම වේ. 2017 වසර තුළදී එක්සත් ජනපද ඩොලරය හා ශ්‍රී ලංකා රුපියල අතර සාමාන්‍ය අනුපාතය රුපියල් 149.81 හා 153.70 අතර පරාසයක උච්ඡාවචනය විය. (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව) වසර තුළදී රුපියල අවප්‍රමාණය වීම 2.3% ක් ලෙස සටහන් විය.

වෙළඳ හා අනෙකුත් ව්‍යාපාරික මෙහෙයුම් සඳහා නියාමන අනුමැතිය ලබාගැනීමත් සමග බැංකුව විසින් එහි විදේශ විනිමය මෙහෙයුම් පුළුල් කරන ලදී.


බැංකුව විසින් නිකුත් කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 1,000 ක මුළු වටිනාකමකින් යුත් එක්සත් ජනපද ඩොලර් බැඳුම්කර වල මුළු වටිනාකම බැංකුවේ විදේශ විනිමය නිරාවරණය ඉහළ නංවා තිබේ. ප්‍රාග්ධන නිදහස් කිරීමේදී පැන නගින විදේශ විනිමය අවදානම ශ්‍රී ලංකා මහ බැංකුව සමග එළඹෙන ණය වගකීම් ගිවිසුම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජනය සහ රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබාදෙන ණය පහසුකම් මගින් ආවරණය කෙරේ. පිළිවෙලින් 2018 සහ 2019 වර්ෂ වල සිදු කළ යුතු ගෙවීම් සඳහා එමගින් පහසුකම් සැලසේ.

විදේශ මුදල්	මාස 1ට අඩු රු. '000	මාස 1-3 රු. '000	මාස 3-6 රු. '000	මාස 6-12 රු. '000	අවුරුදු 1-3 රු. '000	අවුරුදු 3ට වැඩි රු. '000	මුළු අගය රු. '000
USD	69,623,008	1,669,527	4,672,413	(22,577,603)	(38,257,264)	–	15,130,081
EURO	(262,453)	405,044	350,989	307,925	–	–	801,505
GBP	(122,887)	364,061	217,589	(371,954)	–	–	86,809
SGD	75	–	–	–	–	–	75
AUD	(53,672)	77,254	238,141	(215,090)	–	–	46,633
JPY	(121)	–	–	–	–	–	(121)

වගුව 9: විදේශ විනිමය කල්පිරීමේ වෙනස

විදේශ විනිමය අවදානම සියළු විදේශ මුදල් ඒකක වල අනාවෘත තත්වය හා සම්බන්ධ වේ. බැංකුව, ශුද්ධ විදේශ විනිමය නිරාවරණය සැලකිල්ලට ගනිමින් ප්‍රමිතිගත මිනුම්කරණ ප්‍රවේශය යටතේ විදේශ විනිමය අවදානම උදෙසා ප්‍රාග්ධන වෙන් කිරීම් සිදු කරයි. භාණ්ඩාගාර මෙහෙයුම් ආශ්‍රිත විදේශ විනිමය අවදානමෙහි ප්‍රධාන දර්ශකයක් වන දෛනික ශුද්ධ විවෘත තත්වය නිරීක්ෂණය කෙරෙන අතර නිර්දේශිත මට්ටම නොඉක්මවමින් සහ අදාළ අධිකාරීන්ගේ අනුමැතිය සහිතව එසේ ඉක්මවන අවස්ථා කිහිපයක් පමණක් පවත්වාගනිමින් වසර පුරාවට නිසි පරිදි ඊට අනුකූල වීමට කටයුතු කෙරේ.

අභ්‍යන්තර සීමා වලට සාපේක්ෂව දෛනික ශුද්ධ අනාවෘත තත්වය (NOP)



සටහන 19

පාලන ව්‍යුහය

විචක්ෂණශීලී හා ස්වාධීන වෙළඳපොළ අවදානම් පාලන කාර්යරාමුවක් බැංකුව සතු වන අතර එය බැංකුවේ අවදානම් කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසක් ලෙස හඳුන්වාදිය හැකිය. වෙළඳපොළ අවදානම පාලනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ කමිටු වල ප්‍රධාන වගකීමක් වේ.


බැංකුවේ ලාභදායීතාවය, ප්‍රාග්ධන මට්ටම සහ අවදානම් පැතිකඩ කෙරෙහි වෙළඳපල අවදානම් සාධක විසින් ඇති කරනු ලබන බලපෑම කළමනාකරණය කිරීම සඳහා බැංකුවේ වෙළඳපල අවදානම් අභිරුචිය, මූලධර්ම, ප්‍රතිපත්ති, පටිපාටි, පාලන සහ වාර්තාකරණය නියාමන සහ ක්ෂේත්‍රයේ යහපරිචයන් සමග පූර්ණ වශයෙන් අනුකූල වේ.

බැංකුවේ අවදානම් අභිරුචිය මත පදනම්වූ කාර්යසාධන/අවදානම් පරාමිති තුල රැඳෙමින් ශ්ෂ පත්‍රය කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන කළමනාකරණ මට්ටමෙන් ක්‍රියාත්මක වන ප්‍රධානතම කමිටුව වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවයි. ආයෝජන වල අවදානම කළමනාකරණය කිරීම අරමුණු කරගෙන බැංකුවේ ආයෝජන කළඹ හෝ ඉන් කොටසක් හෝ ආයෝජනය කිරීම හෝ නිරායෝජනය කිරීම අත්‍යවශ්‍ය හෝ සුදුසු යැයි සලකන ලද නම් ආයෝජන කමිටුව විසින් ඒ සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි.

වෙළඳපල අවදානම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත පැහැදිලි හා පුළුල් අවබෝධයක් ලබාදීමේ වගකීම අවදානම් කළමනාකරණ අංශයේ වෙළඳපළ අවදානම් නිරීක්ෂණ ඒකකය වෙත පැවරේ. වෙළඳපල අවදානම් නිරීක්ෂණ ඒකකයේ වගකීම් පහත දැක්වේ.

- තත්ව සීමා නිරීක්ෂණය කිරීම.
- දෛනික සමාලෝචන සිදු කිරීම සහ වෙළඳ කළඹ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම
- ප්‍රමාණාත්මක අවදානම් ආකෘති සකස් කිරීම සහ පවත්වා ගැනීම
- අවදානම් අභිරුචි සීමා සහ භාණ්ඩාගාර සීමා වලට සාපේක්ෂව භාණ්ඩාගාර මෙහෙයුම්, නිරාවරණ සහ
- විශ්ලේෂණය කිරීම
- ගනුදෙනු හා කළඹ මට්ටම්වලදී අනෙකුත් ප්‍රධාන අවදානම් නිරාවරණ නිරීක්ෂණය කිරීම

වෙළඳපල අවදානම් නිරීක්ෂණ ඒකකයේ කොටසක් වන භාණ්ඩාගාර මැදි පෙළ කාර්යාලය බැංකුවේ භාණ්ඩාගාර ඉදිරි පෙළ හා පසු පෙළ කාර්යාල වලින් බැහැරව ස්වාධීනව ක්‍රියාත්මක වන අතර දෛනික පදනමක් මත පූර්ව නිශ්චිත සීමාවන්ට අනුකූලව බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම් ආශ්‍රිත ඓන්ද්‍රීය අවදානම සහ වෙළඳ අවදානම නිරීක්ෂණය කිරීම, තක්සේරු කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම එමගින් සිදු කෙරේ. අදාළ නිරීක්ෂණ ස්වාධීන මතයක් සමගින් ආයෝජන කමිටුව, වත්කම් හා කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කෙරේ.



සටහන 20 : වෙළඳපොල අවදානම් පාලන ව්‍යුහය

වෙළඳපොල අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

සිය අවදානම් අභිරුචිය සමග අනුකූල වන වෙළඳපොල අවදානම් පැතිකඩක් පවත්වාගන්නා අතරතුර බැංකුව වෙළඳපොල අවදානම් නිරාවරණ කළමනාකරණය සහ පාලනය කිරීම සිදු කරයි. කළඹ සහ ගණුදෙනු මට්ටම් වලදී වෙළඳපොළ අවදානම් නිරාවරණ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව පුළුල් පරාසයක විභිදුණු ආකෘති, ක්‍රමවේද සහ මෙවලම් භාවිත කරයි.

සීමා නිරීක්ෂණය

අවදානම පාලනය සහ වළක්වාලීම සඳහා උපකාරී වන ප්‍රධානතම උපකරණයක් වන්නේ මනාව සකස් කරන ලද අවදානම් සීමා කාර්යරාමුවයි. බැංකුව විසින් භාණ්ඩාගාර මෙහෙයුම් නිරීක්ෂණය කිරීම සඳහා අවදානම් අභිරුචි සහ පුළුල්වූ අවදානම් සීමා කාර්යරාමුවක් ස්ථාපිත කර තිබෙන අතර එය භාණ්ඩාගාර මැදි පෙළ කාර්යාලය විසින් ඉටු කරනු ලබයි. මෙම සීමා වාර්ෂික පදනමක් මත හෝ අවදානම් පරිසරය කෙරෙහි බලපෑමක් ඇති වන ආකාරයේ අභ්‍යන්තර හෝ බාහිර සිදුවීමක් ඇතිවූ අවස්ථාවලදී සමාලෝචනයට ලක් කෙරේ. අවදානම් සීමා සහ අවදානම් සීමා කාර්යරාමුව තුල සිටිමින් භාණ්ඩාගාර මෙහෙයුම් වෙළඳපොල අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල/අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු අනුමැතිය ලබාගැනේ.

අවදානම් සීමා, භාණ්ඩාගාර මෙහෙයුම් සහ වෙළඳ හා වෙළඳ නොවන කළඹ ආවරණය කෙරෙන පැහැදිලි අධිකාරී සීමාවලින් සැදී තිබේ. එම සීමා ව්‍යුහය ප්‍රමාණවත් පරිදි කුඩා කොටස් වලින් යුක්ත වන අතර එමගින් බැංකුවේ වෙළඳපල අවදානම ආශ්‍රිත ක්‍රියාකාරකම්හි එළදායී පාලනය සඳහා පහසුකම් සලසන අතර භාණ්ඩාගාර ඉදිරිපෙළ කාර්යාලය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අඛණ්ඩ සමාලෝචනයක් සහ අවබෝධයක් සැපයේ.


භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය පොලී අනුපාත, කොටස් මිල සහ විදේශ විනිමය අනුපාත වල උච්ඡාවචන, අවදානම් සීමා වලට අනුකූලව වඩා සමීපව සහ වැඩි වාර ගණනකදී නිරීක්ෂණය කරයි. විදේශ විනිමය ස්ථානගත කිරීම, රාජ්‍ය සුරැකුම් වෙළඳාම සහ පියවීමේ නිරාවරණ ආශ්‍රිත ප්‍රතිපාර්ශ්වික අවදානම් සීමා දෛනිකව නිරීක්ෂණය කරනු ලබයි. එම සීමා ඉක්මවීම් පිළිබඳව ආයෝජන කමිටුව, එත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

අවදානමේදී වටිනාකම


නිශ්චිත කාල පරාසයක් සහ දෙන ලද විශ්‍රම්භ මට්ටම තුළ වෙළඳපල අනුපාත සහ මිල සංචලනයන්හි ප්‍රතිඵලයක් ලෙස පැන නගින අවදානම් තත්වය හේතුවෙන් ඇති විය හැකි පාඩු තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය වන්නේ "අවදානමේදී වටිනාකම" තක්සේරු කිරීමයි. කොටස් මිල අවදානම සහ විදේශ විනිමය අවදානම කළමනාකරණය කිරීම සහ නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් අභ්‍යන්තරිකව අවදානමේදී වටිනාකම මැනීමේ ආකෘති සකස් කරගන්නා ලදී.

බැංකුව බාසල් III අනුව සාමාන්‍ය කොටස් ආශ්‍රිත අවදානමේදී වටිනාකම සහ විදේශ විනිමය ආශ්‍රිත අවදානමේදී වටිනාකම ගණනය කරන අතර එහිදී 99% ක විශ්‍රම්භ මට්ටමක් සහ දින 10 ක රඳවාගැනීමේ කාල පරිච්ඡේදයක් සැලකිල්ලට ගැනේ. දින 365 ක කාල පරිච්ඡේදයකට අදාල වන ඓතිහාසික දත්ත මේ සඳහා සලකා බැලෙන අතර බැංකුවේ අවදානම් අභිරුචියට අනුකූලව එම දත්ත නිරීක්ෂණය කෙරේ. අනතුරුව අදාළ නිරීක්ෂණ දෛනිකව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර මෙහෙයුම්)/භාණ්ඩාගාර ඉදිරිපෙළ කාර්යාලය වෙත වාර්තා කරනු ලැබේ. අදාළ සීමා ඉක්මවන සෑම අවස්ථාවක්ම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් වත්කම් හා කළමනාකරණ කමිටුව, ආයෝජන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

හිමිකම් කොටස් ආයෝජනයේ අවදානමේදී වටිනාකම



සටහන 21



සටහන 22

සංවේදිතා විශ්ලේෂණය

පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත සහ සාමාන්‍ය කොටස් මිල ආදී එක් එක් වෙළඳපොල සාධක වල සංචලන යම් නිශ්චිත උපකරණ හෝ කළඹ කෙරෙහි ඇති කරන බලපෑම, නිදසුනක් ලෙස ආදායමේ එක් පදනම් කොටසක (0.01%) වෙනස මගින් ඇති කරන බලපෑම සංවේදිතා විශ්ලේෂණය ඔස්සේ මනිනු ලැබේ.

අහිතකර පොලී අනුපාත උච්ඡාවචන හේතුවෙන් වෙළඳ හා බැංකු පොත් කෙරෙහි ඇතිවන බලපෑම හඳුනාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රධාන වශයෙන් සංවේදිතා විශ්ලේෂණය උපයෝගී කරගැනේ. ඒ සම්බන්ධ වාර්තා කලින් කලට වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණය සහ මිල තීරණ සඳහා මෙම වාර්තා ඉතා වැදගත් වේ.

ආතති පරීක්ෂාව

වඩා සංකීර්ණ, එහෙත් ඇති විය හැකි සිදුවීම් හෝ වෙළඳපොල සංචලන විසින් කළඹ වටිනාකම් මත ඇති කරනු ලබන බලපෑම තක්සේරු කිරීම සඳහා වෙළඳපොළ අවදානම් කළමනාකරණ කාර්යරාමුවට අන්තර්ගත කර තිබෙන වැදගත් මිම්මක් ලෙස ආතති පරීක්ෂාව හඳුන්වාදිය හැකිය.

වෙළඳපළ අවදානම් නිරීක්ෂණ ඒකකය බැංකුවේ ආතති පරීක්ෂා ප්‍රතිපත්තියට අනුකූලව ආතති පරීක්ෂා සිදු කරයි. පොලී අනුපාත, කොටස් මිල සහ විදේශ විනිමය අනුපාත වැනි වෙළඳපොළ විචල්‍ය අහිතකර අයුරින් විචලනය වීම හේතුවෙන් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතිකය (බාසල් III) කෙරෙහි ඇති වන බලපෑම වෙළඳපල අවදානම ආශ්‍රිත ආතති පරීක්ෂාව මගින් තක්සේරු කෙරේ. බැංකුවට මුහුණ පෑමට සිදුවිය හැකි අහිතකර බලපෑම් හඳුනාගෙන ඒවා වළක්වාගැනීමට සහ ඊට අදාළව සැලසුම් සහගත තීරණ ගැනීමට ආතති පරීක්ෂාව උපකාරී වේ.

	වෙළඳ රු. '000	අලෙවිය සඳහා පවතින රු. '000	මුළු අගය රු. '000
2017 වර්ෂ අවසානයට කළඹෙහි උපලබ්ධි නොවූ ලාභ/(පාඩු)	220,485	96,503	316,988
වෙළඳපළ සළුතා මත පදනම්වූ වටිනාකමේ වෙනස			
ආදායමේ bps 100 ක වැඩිවීම	(96,657)	(6,267)	(102,924)
ආදායමේ bps 200 ක වැඩිවීම	(190,187)	(12,394)	(202,581)
ආදායමේ bps 100 ක අඩුවීම	99,786.6	6,415	106,202
ආදායමේ bps 200 ක අඩුවීම	202,949.4	12,998	215,947

වගුව 10: ආතති පරීක්ෂාව - වෙළඳ පොතේ පොලී අනුපාතික අවදානම - රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය

සෘණ පරතර මත 100 bps ක අනුපාතික කම්පන		මාස 1 දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	මුළු අගය
ස්වාධීන මට්ටම	සෘණ පරතර මත 100 bps ක අනුපාතික කම්පන	(175,237)	(225,232)	(67,917)	(116,454)	131,921	145,036	308,013	131
	NII මත බලපෑම (රුපියල් මිලියන)	(1,680)	(1,882)	(428)	(303)	–	–	–	(4,293)
ඒකාබද්ධ මට්ටම	පරතරය	(177,093)	(227,378)	(67,706)	(117,598)	133,636	148,347	309,759	1,968
	NII මත බලපෑම (රුපියල් මිලියන)	(1,698)	(1,900)	(427)	(306)	–	–	–	(4,331)

වගුව 11: බැංකු පොතෙහි ආදායම් වක්‍රයේ ආතති පරීක්ෂා තක්සේරුව

විස්තර	සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය කෙරෙහි බලපෑම හිතකර/(අහිතකර) (%)		
	පහළ	මධ්‍යම	ඉහළ
පොලී අනුපාත අවදානම: වෙළඳපල ආදායමේ වැඩි වීම (අඩු 50 bps, මධ්‍යස්ථ 100 bps, ඉහළ 200 bps)	(0.02)	(0.04)	(0.08)
කොටස් මිල අවදානම: වෙළඳපොල මිලෙහි අඩු වීම (අඩු 15%, මධ්‍යස්ථ 20%, ඉහළ 25%)	0.14	0.47	0.57
විදේශ විනිමය අනුපාතය: රුපියල අවප්‍රමාණය (අඩු 5%, මධ්‍යස්ථ 10%, ඉහළ 15%)	(0.57)	(0.87)	(1.16)

වගුව 12: ආතති පරීක්ෂාව - වෙළඳපොල අවදානම


ද්‍රවශීලතා අවදානම

බැංකුව නුඹුන්වත් වූවත් ගෙවීම් සම්බන්ධ වගකීම් නිසි කලට ඉටු කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීල මුදල් ප්‍රමාණයක් පවත්වාගැනීමට හෝ ජනිත කිරීමට නොහැකි වීම හෝ එසේ කළ හැකි වන්නේ සැලකිය යුතු ආකාරයේ අවාසිදායක තත්වයක් යටතේ වීම පාදක කරගෙන හටගන්නා අවදානම ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ.

සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂය තුලදී අවම නියාමන මට්ටම්වලට ඉහළින් සිය ද්‍රවශීලතා තත්වය පවත්වා ගැනීමට බැංකුව සමත් විය. එහිදී බැංකුවේ අවදානම් පැතිකඩ සහ වෙළඳපොල තත්ව සැලකිල්ලට ගනිමින් නියාමන, විචක්ෂණශීලී සහ අභ්‍යන්තර ආතති පරීක්ෂා අවශ්‍යතා වලට අනුකූලව සුදුසු ද්‍රවශීලතා ස්වාරක්ෂක ස්ථාපිත කරන ලදී.

තැන්පත්කරුවන්ගේ සංකේන්ද්‍රණය


[%]



සටහන 23

නිමැවුම සම්බන්ධයෙන් අරමුදල් විවිධාංගීකරණය

[%]



සටහන 24

බැංකුව එහි අරමුදල් මිශ්‍රයේ ප්‍රධාන අංගයක් ලෙස සිය තැන්පතු පදනම ගොඩනැගීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරයි. පුළුල් පරාසයක පැතිරුණු පුද්ගලික හා ආයතනික තැන්පත්කරුවන් සමුදායකට අයත් තැන්පතු වශයෙන් ප්‍රාථමික අරමුදල් ප්‍රභව පවතියි. 2017 වර්ෂයේදී, සමස්ත අරමුදල් ආශ්‍රිත වගකීම් 10.4% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 961.2 ක් ලෙස සටහන්වූ අතර ඉන් 76.7% ක් තැන්පතු වලින් සමන්විත වේ.

සමස්ත තැන්පතු වලින් 84% ක් පුද්ගලික තැන්පත්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන හෙයින් බැංකුව තුල පුද්ගලික තැන්පතු මත ඉහළ සංකේන්ද්‍රණයක් පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ අරමුදල් සංකේන්ද්‍රණය පහළ මට්ටමක පවතී.

බැංකුවේ පරිපාලිතය ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතා වත්කම් වල ඉහළ දායකත්වයක් සහිත අතිශයින් නියාමනය කෙරෙන ප්‍රාථමික වෙළඳ කටයුතු වල නිරතවේ.

පාලන ව්‍යුහය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේදී වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා අවදානම අධීක්ෂණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්‍රවශීලතාවය සහ බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය බැංකුවේ ප්‍රධාන ද්‍රවශීලතා අවදානම් පාලන ලේඛනය වේ. කොටස් ප්‍රවේශය, ප්‍රවාහ ප්‍රවේශය සහ නියාමන අනුපාතික උපයෝගී කරගෙන වෙළඳපල අවදානම් නිරීක්ෂණ ඒකකය විසින් ද්‍රවශීලතා අවදානම නිරීක්ෂණය කරනු ලබයි. එසේම, අරමුණු කරගෙන ද්‍රවශීලතා අර්බුද සහ ණය අර්බුද ආශ්‍රිත අවස්ථා හා ස්වභාවයන් මෙන්ම යම් අර්බුදකාරී අවස්ථාවක වහාම ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය වේගය/කාලය සැලකිල්ලට ගනිමින් කලින් කලට ආතති පරීක්ෂා සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම කළමනාකරණ කමිටුව විසින් ආතති පරීක්ෂාවන්හි ප්‍රතිඵල සහ ද්‍රවශීලතා අනුපාතික වත්කම් හා කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කරනු ලබයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

නියාමකයන් විසින් නිකුත් කරන ලද අදාළ ව්‍යවස්ථාපිත නියාමන සහ අවදානම් අභිරුචි කාර්යාරාමුව සමග අනුකූල වෙමින් බැංකුව ද්‍රවශීලතාවය කළමනාකරණය කරයි. නිරන්තරයෙන් සිය වත්කම් පදනම ශක්තිමත් කිරීම උදෙසා ආධාර වන සුදුසු ද්‍රවශීලතා ප්‍රමාණයක්, විවිධාංගීකරණයක් සහ කාල සීමාවක් බැංකුව සතුව පවතින බව ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය ඔස්සේ සහතික කෙරේ.

බැංකුව බාසල් III අවශ්‍යතා වලට සමාන්තර ව්‍යවස්ථාපිත අනුපාතික සහ යහපරිවයන් උපයෝගී කරගනිමින් සිය ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කරයි.

උපක්‍රමික (කෙටි කාලීන) ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය	ව්‍යුහාත්මක (දිගු කාලීන) ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය	සම්භව්‍යතා ද්‍රවශීල අවදානම් කළමනාකරණය
දවස ඇතුළත ද්‍රවශීලතා තත්ත්ව අධීක්ෂණය කිරීම	ව්‍යුහාත්මක වශයෙන් මනා මූල්‍ය තත්වයක් පවත්වා ගැනීම	පූර්ව අනතුරු හැඟවීම් දර්ශක අධීක්ෂණය කොට කළමනාකරණය කිරීම
ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය අවදානම් අභිරුචියට අනුකූලබව සහතික කරගැනීම අන්තර්බැංකු සහ ප්‍රතිමිල්දී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් වල හිඟ මට්ටම් නිරීක්ෂණය කිරීම	ව්‍යුහාත්මක මට්ටමේ ද්‍රවශීලතා නොගැලපීම් හඳුනාගෙන කළමනාකරණය කිරීම	සම්භව්‍යතා අරමුදල් සැලසුම් පිහිටුවා පවත්වා ගැනීම
දෛනික මුදල් ප්‍රවාහ අවශ්‍යතා නිරීක්ෂණය කිරීම	චර්යාත්මක කළඹකරණය තීරණය කිරීම සහ අදාළ කරගැනීම	දෛනිකව ද්‍රවශීලතා ආතති පරීක්ෂා සහ සංසිද්ධි විශ්ලේෂණ සිදු කිරීම
කෙටි කාලීන මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම	දිගු කාලීන මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම	අවශ්‍ය නම් ද්‍රවශීලතා අවදානම් ආපදා කළමනාකරණ කමිටු කැඳවීම
දෛනික විදේශ විනිමය ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම	විවිධාංගීකරණය කළ අරමුදල් සංචිතයක් පවත්වා ගැනීම	අපේක්ෂිත ආතති මට්ටම් අනුව ද්‍රවශීලතා ස්වාරක්ෂක මට්ටම් ස්ථාපනය කිරීම
වත්කම් හා කළමනාකරණ කමිටුව විසින් දන්වන ලද පරිදි ව්‍යුහාත්මක සහ සම්භව්‍යතා ද්‍රවශීලතා අවශ්‍යතා වලට අනුව තැන්පතු අනුපාත සකස් කිරීම	කාලීන අරමුදල් සැපයීමේ අවශ්‍යතාවය පිළිබඳව දැනුම්දීම	ද්‍රවශීලතා ස්වාරක්ෂක කළඹ විවිධාංගීකරණය කිරීම පිළිබඳ උපදෙස් ලබාදීම
	විදේශ විනිමය ද්‍රවශීලතාවය තක්සේරු කිරීම	බාසල් III ද්‍රවශීලතා අවශ්‍යතා සමග අනුකූලතාවය සහතික කිරීම
	ද්‍රවශීලතා අවදානම් අභිරුචිය ස්ථාපිත කිරීම	
	ද්‍රවශීලතා මිල පිරිවැය සුදුසු පරිදි පැවරීම තහවුරු කරගැනීම	

වගුව 13 : ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රියාවලිය

නියාමන අනුපාතික

බැංකුව කොටස් ප්‍රවේශය, ප්‍රවාහ ප්‍රවේශය සහ නියාමන අනුපාතික උපයෝගී කරගෙන ද්‍රවශීලතා අවදානම නිරීක්ෂණය කරයි.

ව්‍යවස්ථාපිත අනුපාතික යටතේ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය මාසිකව නිරීක්ෂණය කෙරේ.


අවම නියාමන අවශ්‍යතා සමග අනුකූලතාවය සහතික කිරීම සඳහා බැංකුව විසින් බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය 100% කට වඩා වැඩි මට්ටමකද ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය 20% කට වඩා වැඩි මට්ටමකද සාර්ථකව පවත්වා ගන්නා ලදී. බාසල් III ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය මත කෙටුම්පත් ගණනය කිරීමට අනුව බැංකුව අවම නියාමන අවශ්‍යතා මට්ටමට වඩා ඉහළ අගයක් පවත්වා ගෙන ඇත.

ප්‍රවාහ ප්‍රවේශය

ද්‍රවශීලතා පරතර විශ්ලේෂණය ප්‍රවාහ ප්‍රවේශය යටතේ ද්‍රවශීලතා අවදානම තක්සේරු කිරීම සඳහා බැංකුව විසින් භාවිත කරනු ලබන එක් ක්‍රමවේදයකි. ද්‍රවශීලතා පරතර විශ්ලේෂණයේ ප්‍රතිඵල කලින් කලට ගණනය කිරීම සහ නිරීක්ෂණය කිරීම සිදු කෙරෙන අතර සංවේදිතා විශ්ලේෂණය සහ ආතති පරීක්ෂාව සඳහා උපයෝගී කොට ගැනේ.

නියාමන අනුපාතික වල ප්‍රවනතා

[%]



	දෙසැම්බර් 2017 %	දෙසැම්බර් 2016 %	අවම නියාමන අවශ්‍යතාවය %
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය	73.44	72.56	20
ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය - රුපියල්	377.57	379.26	100
ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය - සියළු මුදල් ඒකක	376.18	393.96	100

බැංකුව	මාස 3 දක්වා රු. '000	මාස 3-12 රු. '000	අවුරුදු 1-3 රු. '000	අවුරුදු 3-5 රු. '000	අවුරුදු 5 වැඩි රු. '000	මුළු අගය රු. '000
ගිවිසුම්ගත කල්පිරීමක් සහිත වත්කම්						
මුදල් සහ මුදල් වලට සමාන දෑ	3,849,627	–	–	–	–	3,849,627
ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින ශේෂ	–	–	–	–	–	–
බැංකු වල රඳවා තැබූ මුදල්	4,706,549	18,731,555	–	–	–	23,438,104
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	650	1,360,064	–	–	–	1,360,714
අලෙවිය සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	681,127	1,919,984	535,258	3,335,945	–	6,472,314
බැංකු වලට ණය සහ ලැබිය යුතු දෑ	3,056,673	6,616,175	17,241,717	800,000	–	27,714,565
වෙනත් ගණුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	22,722,801	67,835,029	83,264,461	57,112,104	129,375,471	360,309,866
මූල්‍ය උපකරණ - අලෙවිය සඳහා රඳවාගත්	942	1,172,235	–	26,045	4,494,608	5,693,830
මූල්‍ය උපකරණ - කල්පිරීම සඳහා රඳවාගත්	24,583,892	167,108,102	77,891,419	93,900,259	180,789,405	544,273,077
පරිපාලිතයන්හි ආයෝජන	–	–	–	–	900,000	900,000
දේපළ, පිරියත සහ උපකරණ	–	–	–	–	12,015,376	12,015,376
අස්පෘශ්‍ය වත්කම්	–	–	–	–	380,308	380,308
වෙනත් වත්කම්	712,063	7,168,611	7,173,278	5,004,266	5,637,471	25,695,689
සමස්ත වත්කම්	**60,314,324**	**271,911,755**	**186,106,133**	**160,178,619**	**333,592,639**	**1,012,103,470**
ගිවිසුම්ගත කල්පිරීමක් සහිත වගකීම්						
ප්‍රකාශිත ප්‍රාග්ධනය/වෙන්කරන ලද ප්‍රාග්ධනය	–	–	–	–	6,700,000	6,700,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්	–	–	–	–	3,002,952	3,002,952
රඳවාගත් ඉපයීම්	–	–	–	–	2,228,885	2,228,885
වෙනත් සංචිත	–	–	–	–	28,289,941	28,289,941
වෙනත් බැංකුවලට	180,439	–	–	–	–	180,439
වෙනත් ගනුදෙනුකරුවන්ට	391,222,111	330,921,064	8,725,472	4,138,492	2,205,501	737,212,640
වෙනත් ණය පහසුකම්	64,611,281	115,058,141	38,286,355	–	–	217,955,777
ව්‍යුත්පන්න වගකීම්	956,937	–	–	–	–	956,937
විලම්බිත බදු වගකීම්	–	–	–	–	507,063	507,063
වෙනත් වගකීම්	2,288,755	2,500,117	480,835	474,946	3,317,771	9,062,424
යටත්කාලීන ණය	–	6,411	–	6,000,000	–	6,006,411
සමස්ත වගකීම්	**459,259,523**	**448,485,733**	**47,492,662**	**10,613,438**	**46,252,114**	**1,012,103,470**
කල්පිරීමේ වෙනස	(398,945,199)	(176,573,978)	138,613,471	149,565,181	287,340,525	0
සමුච්චිත වෙනස	(398,945,199)	(575,519,177)	(436,905,706)	(287,340,525)	0	-

වගුව 14: වත්කම් හා වගකීම් කල්පිරීම


කොටස් ප්‍රවේශය

කොටස් ප්‍රවේශය යටතේ ද්‍රවශීලතා අවදානම් දර්ශක වලට පහත දැක්වෙන සාධක අයත්වේ.

- සමස්ත වත්කම් සඳහා ශුද්ධ ණය
- ගණුදෙනුකරුවන්ගේ තැන්පතු සඳහා ණය
- කෙටි කාලීන වත්කම් සඳහා ද්‍රවශීලතා වත්කම්
- සමස්ත වත්කම් සඳහා මිලදීගත් අරමුදල්
- සමස්ත ණය සම්බන්ධ වගකීම්
- (විශාල වගකීම් - තාවකාලික ආයෝජන) සඳහා (උපයන වත්කම් - තාවකාලික ආයෝජන)

කොටස් ප්‍රවේශය යටතේ තක්සේරු කරන ලද බැංකුවේ සමස්ත ද්‍රවශීලතා මට්ටම වසර මුළුල්ලේම ඉහළ අගයක් වාර්තා කළේය. ඉහළ ද්‍රවශීලතාවයක් සහිත රජයේ සුරැකුම් වල සිය තැන්පතු වලින් 60% ක් ආයෝජනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය හේතුවෙන් තැන්පතු අනුපාතිකය සඳහා ණය පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියද ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමක පැවතිණ.

කොටස් ප්‍රවේශය යටතේ අනුපාතික වල ප්‍රවණතා



සටහන 26

ද්‍රවශීලතා හදිසි අවශ්‍යතා සැලසුම

යම් නිශ්චිත හෝ වෙළඳපල අර්බුද අවස්ථා වල බලපෑම දරාගැනීමට බැංකුව සතු හැකියාව ද්‍රවශීලතා හදිසි අවශ්‍යතා සැලසුම මගින් සහතික කෙරේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රියාත්මක ද්‍රවශීලතා හදිසි අවශ්‍යතා සැලසුම පහත දැක්වෙන මාර්ගෝපදේශ මත පදනම්වේ.

- ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව තැන්පතු වලින් 60% ක් රාජ්‍ය සුරැකුම්හි ආයෝජනය කෙරෙන බව සහතික කිරීම (ඉහළ ද්‍රවශීලතාවක් සහිත/අවදානම් රහිත වත්කම්)
- අර්බුදකාරී අවස්ථාවකදී ස්ථාවර ආදායම් සුරැකුම් සහ සාමාන්‍ය කොටස් වෙළඳපල වෙත ප්‍රවේශවීමේ හැකියාව
- ස්ථාවර ආදායම් සුරැකුම් සුරැකුමක් ලෙස යොදා ගනිමින් (ප්‍රති ණය ගැණුම්) සහ බැංකුවේ ඉහළ ණය අනුපාතය භාවිත කරමින් වඩා අඩු පිරිවැයක් යටතේ ණය ගැනීමේ හැකියාව

වෙළඳපල අවදානම් නිරීක්ෂණ ඒකකය නිරන්තරයෙන් ද්‍රවශීලතා අවදානම නිරීක්ෂණය කරමින් ද්‍රවශීලතා දර්ශක සහ ආතති පරීක්ෂා සම්බන්ධයෙන් වාර්තා සපයයි. එම වාර්තා අර්බුදකාරී අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමට උපකාර වන උපායමාර්ග වලට අනුබල දෙන පූර්ව අනතුරු හැඟවීමක් ලෙස ක්‍රියාකරයි. ඉහළ වෙළඳපල ඉල්ලුමක් සහිත රජයේ සුරැකුම් කළඹ මුදල් ප්‍රවාහය ආශ්‍රිත අනපේක්ෂිත ලෙස බිඳවැටීම් සඳහා ආරක්ෂාව සපයයි. විවිධාංගීකරණය සහ ද්‍රවශීලතාවය පදනම් කරගෙන වත්කම් හා කළමනාකරණ කමිටුව විසින් නිශ්චිතව දක්වනු ලබන සීමා තුල රැඳෙමින් මෙම කළඹ කළමනාකරණය කෙරේ.

මෙහෙයුම් අවදානම


මෙහෙයුම් අවදානම බැංකුවේ සියළු ක්‍රියාකාරකම් වලට අදාළ වන අතර ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් නිසා පැන නගින අවදානම ලෙස එය නිර්වචනය කළ හැකිය. නෛතික අවදානම මෙහෙයුම් අවදානමට ඇතුළත් වුවත් කීර්ති නාමය හානි වීමේ අවදානම සහ උපායමාර්ගික අවදානම ඊට අයත් නොවේ.

බැංකුව බාසල් සංග්‍රහය මත පදනම්ව මෙහෙයුම් අවදානම වර්ගීකරණය කිරීම සහ සමාලෝචනය කිරීම සිදු කරයි.


2017 වර්ෂය තුලදී ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති බිඳවැටීම් නිතර නිතර සිදු විය. එය ස්වයංක්‍රීය පරිසරයක් තුල ක්‍රියාත්මක වන සේවා සපයන්නෙකු විසින් සුලභව අත්දකින සංසිද්ධියකි. එම සිදුවීම් දැරිය හැකි උපරිම බිඳවැටීම් කාලපරිච්ඡේදය සීමාවූ හෙයින් ඒවායේ බලපෑම කළමනාකරණය කරගත හැකි මට්ටමක පැවතිණ.

නිරිතදිග මෝසම් සමය තුල ඇතිවූ දරුණු ගංවතුර තත්වය හේතුවෙන් බස්නාහිර, දකුණු සහ සබරගමු ප්‍රාදේශික වල පිහිටි ශාඛා ගණනාවක් බලපෑමට ලක්වූ අතර මේ නිසා "භෞතික වත්කම් වලට සිදුවූ හානිය" ඉතා ඉහළ මට්ටමක පැවතිණ. අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන් පැන නගින වංචා අවදානමද බැංකුව මත සැලකිය යුතු අවදානමක් ජනිත කරයි. ඵලදායී වංචා අවදානම් කළමනාකරණයක් සහතික කිරීම සඳහා ඵලදායී වංචා අවදානම් කළමනාකරණයක් සහ වංචා හෙළිදරව් කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව ඇත.

පාඩු ඇති කරන සිදුවීම් වල සංඛ්‍යාතය



පාඩු ඇති කරන සිදුවීම් වල උග්‍රතාව



IF – අභ්‍යන්තර වංචා
EF – බාහිර වංචා
DPA – භෞතික වත්කම් වලට හානි
BDSF – ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති බිඳවැටීම්
EPWS – සේවා නියුක්තිකයන්ගේ ක්‍රියාකාරකම් සහ රාජකාරී ස්ථානයේ ආරක්ෂාව
CPBP – ගණුදෙනුකරුවන්, නිමැවුම් සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්
EPPM – ක්‍රියාත්මක කිරීම, සැපයීම සහ ක්‍රියාවලි කළමනාකරණය


Frequency – 0% – 2017: EPWS 2016: CPBP, EPWS

Severity – 0% – 2017: BDSF, EPWS 2016: BDSF, EPWS, CPBP

සටහන: 27

සටහන: 28

තථ්‍ය අවදානම් අභිරුචිය අවදානම දරාගැනීමේ මට්ටම



සටහන 29

පසුගිය වසර තුන සඳහා විගණනය කරන ආදායමෙහි සාමාන්‍යයට සාපේක්ෂව 2017 මූල්‍ය වර්ෂය සඳහා මෙහෙයුම් පාඩු 0.19% ක් ලෙස සටහන් විය. බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සඳහා ස්ථාපිත කර තිබෙන පාලන ව්‍යුහයන්, ක්‍රියාවලි සහ පටිපාටි වල මනා සඵලතාවය පිළිඹිබු කරමින් එය අභ්‍යන්තර අනතුරු හැඟවීම් මට්ටමට වඩා ඉතා අඩු මට්ටමක පවතින අගයකි. බැංකුව පසුගිය වසර පහක කාලපරිච්ඡේදය තුලදී මෙහෙයුම් පාඩු ඉතා අවම මට්ටමක පවත්වාගත් බව උපනති රේඛාවෙන්ද පැහැදිලි වේ.

අවදානම් අභිරුචිය තුල රැඳෙමින් මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සහ අවම කරගැනීම සඳහා බැංකුව අඛණ්ඩවම පියවර ගනී.

අවදානම් සමාලෝචනය

අවදානම් සාධකය	විස්තරය	නිරීක්ෂණය/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම*
වංචා අවදානම	බාහිර හෝ අභ්‍යන්තර පාර්ශ්ව විසින් සිදු කරනු ලබන වංචාකාරී ක්‍රියාකාරකම්	• වංචා අවදානම කළමනාකරණය සහ වංචා හෙළිදරව් කිරීමේ ක්‍රියාවලිය • අභ්‍යන්තර පාලන • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය • අලාභ ඇති කරන සිදුවීම් නිරීක්ෂණය • අවදානම් හා පාලන ස්වයං ඇගයීම	ඉහළ	මධ්‍යස්ථ
පද්ධති/තොරතුරු තාක්ෂණ/තොරතුරු ආරක්ෂණ අවදානම	අසාර්ථක සහ ප්‍රමාණවත් නොවන ක්‍රියාවලි, පද්ධති සහ තොරතුරු තාක්ෂණය	• අභ්‍යන්තර පාලන • තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය • ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය • සිදුවීම් වාර්තාකරණය	ඉහළ	මධ්‍යස්ථ
අනුකූලතා අවදානම	නියාමන අවශ්‍යතා සපුරාලීමට අසමත්වීම	• අනුකූලතා වැඩසටහන් සහ පරීක්ෂා කිරීම් • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය • අනුකූලතා අවදානම ආශ්‍රිතව ලකුණු ලබාදීමේ ක්‍රමය	ඉහළ	මධ්‍යස්ථ
නෛතික අවදානම	නෛතික අවශ්‍යතා සමග අනුකූලවීමට අසමත්වීම/ප්‍රමාණවත් පරිදි අනුකූල නොවීම	• සියළු ගිවිසුම්ගත වගකීම් සම්බන්ධ නෛතික තත්වය පැහැදිලි කරගැනීම • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය	මධ්‍යස්ථ	පහළ

*ඉහළ ආතති මට්ටමකදී ඉපයීම් සහ ප්‍රාග්ධනය මත ඇති විය හැකි බලපෑම


සටහන 30: මෙහෙයුම් අවදානම සමාලෝචනය

පාලන ව්‍යුහය

දැනට පවත්නා සහ මතු වෙමින් තිබෙන මෙහෙයුම් අවදානම් වලට සංවේදී පුළුල්වූ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් බැංකුව සතුය. වඩා කාර්යක්ෂම, වැඩි විනිවිදභාවයකින් යුතු ලාභදායී සහ තිරසාර ව්‍යාපාර මෙහෙයුම් ළඟාකරගැනීමට එමගින් අපේක්ෂා කෙරේ. මෙහෙයුම් අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම උදෙසා වන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රවේශය සහ විධිමත් පාලන ව්‍යුහයක් පැහැදිලි කරන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුල බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යරාමුව අන්තර්ගත කර ඇත. එසේම, පහත දැක්වෙන ප්‍රතිපත්තිද මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වේ.

- තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්තිය
- ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම කළමනාකරණය සහ වංචා හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය
- බැහැර සේවය ලබාගැනීමට අදාළ ප්‍රතිපත්තිය

ඵලදායී පාලන ව්‍යුහය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අධීක්ෂණය යටතේ බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යරාමුව බලගැන්වේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහයෙන් මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.



සටහන 31: මෙහෙයුම් අවදානම් පාලන ව්‍යුහය

මෙහෙයුම් අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම සඳහා කළමනාකරණ මට්ටමෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන කමිටුව මෙහෙයුම් අවදානම් නිරීක්ෂණ කමිටුවයි.

ඊට අදාළ පාලන ව්‍යුහය ඇතුළුව මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යරාමුව සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගැනීමේ වගකීම අවදානම් කළමනාකරණ අංශයේ මෙහෙයුම් අවදානම් නිරීක්ෂණ ඒකකය වෙත පැවරේ. මෙහෙයුම් අවදානම් නිරීක්ෂණ ඒකකය වෙත පැවරී තිබෙන වගකීම් පහත පරිදි වේ.

- ප්‍රතිපත්ති සාමාලෝචනය කිරීම/යාවත්කාලීන කිරීම
- අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව, ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක, පාඩු ජනිත කරන සිදුවීම් පිළිබඳ දත්ත උපයෝගී කරගෙන මෙහෙයුම් අවදානම තක්සේරු කිරීම
- ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය කිරීම
- තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය නිරීක්ෂණය කිරීම
- බාහිර පාර්ශ්වයන්ගේ සේවය ලබාගැනීමට අදාළ අවදානම නිරීක්ෂණය කිරීම
- නව නිමැවුම්/ක්‍රියාවලි සමාලෝචනය කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම

මෙහෙයුම් අවදානම කළමනාකරණ ක්‍රියාවලිය

සිය අවදානම් අභිරුචියට සාපේක්ෂව එහි මෙහෙයුම් අවදානම් පැතිකඩ තීරණය කරගැනීමට උපකාර වන ආකාරයේ සමස්ත බැංකුවටම ගැළපෙන කාර්යරාමුවක් මත පදනම්ව බැංකුව මෙහෙයුම් අවදානම කළමනාකරණය කරයි.

මෙහෙයුම් අවදානම සෑම පුද්ගලයෙකුටම, ක්‍රියාවලියකටම හා පද්ධතියකටම ආවේණික වන හෙයින් එම අවදානම යම් නිශ්චිත කණ්ඩායමකට හෝ කම්ටුවකට පමණක් ඵළදායීව කළමනාකරණය කළ නොහැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ නොසැලෙන කැපවීම මතින් ආරම්භවී නිසි දැනුවත්වීම ඔස්සේ සියළු මට්ටම් වෙත ව්‍යාප්ත වන අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිර්මාණය කරනු ලැබ තිබේ.

ශාඛා සහ මෙහෙයුම් අංශ මෙහෙයුම් අවදානමේ ප්‍රාථමික හිමිකරුවන් ලෙස හඳුනාගැනේ. ඔවුන්ට අදාළ වගකීම් ක්ෂේත්‍ර ආශ්‍රිත ආවේණික අවදානම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගැනීම සඳහා අවැසි ප්‍රමාණවත් පුහුණුවක් ඔවුන්ට ලබාදී ඇත.

එබැවින්, මෙහෙයුම් අවදානම සඳහා අදාළ වන පළමු ආරක්ෂණ ස්ථරය ලෙස ක්‍රියාත්මක වන පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් බැංකුව තුල ස්ථාපිත කර තිබේ. පද්ධති පාලන, රාජකාරී බෙදා දැක්වීම, ගනුදෙනු වල නිරවද්‍යභායට අදාළව ද්විත්ව පරීක්ෂාව, බලය පැවරීම සහ තහවුරු කිරීම මගින්, සැසඳීම, විගණන හෝඩුවාවන් සහ විගණන ලොග් පොත් සහ ඒ සෑමටම වඩා වැදගත් වන, නිසි පුහුණු වැඩසටහන් ඔස්සේ සියළු අවදානම් හිමිකරුවන් දැනුවත් කිරීම එකී අභ්‍යන්තර පාලන පද්ධතියට අයත්වේ.

මෙහෙයුම්/අවදානම් කළමනාකරණයට අදාළව අවදානම් කළමනාකරණ අංශය දෙවන ආරක්ෂණ ස්ථරය ලෙසද අභ්‍යන්තර විගණන අංශය තෙවන ආරක්ෂණ ස්ථරය ලෙසද කටයුතු කරයි.

අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සහ අවම කරගැනීම සඳහා උපකාර වන විවිධ ආකාරයේ මෙවලම් සහ තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගෙන බැංකුවේ අවදානම් පැතිකඩ හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සමග මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ වේ.

පාඩු ඇති කරන ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය

මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අයකිරීම් ගණනය කිරීමට අදාළ ඉහළ මට්ටමේ ප්‍රවේශ භාවිතයට ගැනීමෙහිලා පාඩු ඇති කරන අභ්‍යන්තර සහ බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත රැස්කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය විසින් අඛණ්ඩවම අලාභ ඇති කරන ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත රැස්කිරීමෙහි යෙදී සිටින අතර ව්‍යවස්ථාපිත සහ අනෙකුත් වාර්තාකරන සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන බාසල් වර්ගීකරණය මත පදනම්ව මෙහෙයුම් අලාභ වර්ගීකරණය කර තිබේ.

අලාභ ඇති කරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කඩිනම් නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි එම ක්‍රියාකාරකම්හි ස්වභාවය, ඒවාට මූලික වන සාධක සහ ඇතිවීමේ සම්භාවිතාව හඳුනාගැනීම උදෙසා එම ක්‍රියාකාරකම් මනා ලෙස විශ්ලේෂණය කෙරේ.

මෙහෙයුම් අවදානම ආශ්‍රිතව ජාතික ඉතිරිකිරීමේ බැංකුවට තිබෙන්නේ අවම අභිරුචියක් වන අතර අනෙකුත් සියළු ප්‍රධාන මෙහෙයුම් අවදානම් කාණ්ඩ සඳහා දරාගැනීමේ මට්ටම් ස්ථාපිත කර තිබේ.

ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය කිරීම


ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක න්‍යාසය අවදානම් නිරාවරණ මට්ටම්හි වෙනස්කම් නිරීක්ෂණයට අවස්ථාව ලබාදෙන අතර ක්ෂණික අවදානම් වළක්වාලීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපකාර වන පූර්ව අනතුරු හැඟවීමේ දර්ශකයක් ලෙසද ක්‍රියාත්මක වේ.

විගණන ගැටළු කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, නිමැවුම් වල ගුණාත්මකභාවය, ක්‍රියාවලින්හි ගුණාත්මකභාවය සහ අනුකූලතාවය යන ක්ෂේත්‍ර ආවරණය කෙරෙන අවදානම් න්‍යාසයක් ඔස්සේ මෙහෙයුම් අවදානම් පැතිකඩ හඳුනාගැනීම සහ තක්සේරු කිරීම අරමුණු කරගෙන බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක මගින් බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික මෙහෙයුම් සහ උපකාරක සේවා ආවරණය කෙරේ.

පූර්වාර්ථකථිත කඩඉම් සීමා මත පදනම්ව අවදානම තක්සේරු කිරීම සඳහා සෑම ක්ෂේත්‍රයකටම අදාළව ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිශ්චිතව දක්වා ඇත.

මෙම දර්ශකවලට අදාළ කඩඉම් සීමා වාර්ෂිකව හෝ මෙහෙයුම් පරිසරයේ වෙනස් වීම් සැලකිල්ලට ගෙන සංශෝධනය කරනු ලබයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය විසින් මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය කර මෙහෙයුම් අවදානම් කලමනාකරණ කම්ටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කම්ටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.



සටහන 32: ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක කාර්ය රාමුව

අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව

අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා සකස් කරන ලද අභ්‍යන්තර පාලන වලට අනුකූලව සියළු ව්‍යාපාරික ක්ෂේත්‍රයන් ඔස්සේ විහිදෙන මෙහෙයුම් අවදානම සාමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම සඳහා උපයෝගී කරගන්නා ක්‍රමවේදයකි. අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව, ව්‍යාපාරික ක්‍රියාවලි හිමිකරුවන්/පළමු ආරක්ෂණ ස්ථරය ඔවුන්ගේ අවදානම් මැනවින් හඳුනාගනී, යන පරිකල්පනය මත පදනම් වී තිබේ.

ක්ෂණික අවධානය අවශ්‍ය අවදානම් පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීමට ව්‍යුහාත්මක ආකාරයකින් මෙහෙයුම් දුර්වලතා ආමන්ත්‍රණය කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදීමට මෙය උපකාරී වේ.

2017 වර්ෂය තුලදී බැංකුව විසින් තීරණාත්මක ක්‍රියාවලි ආශ්‍රිත මෙහෙයුම් අවදානම වළක්වාගැනීම සඳහා අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව ඵලදායී ලෙස යොදා ගන්නා ලදී.

ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි කළමනාකරණය

ගුණාත්මකභාවයෙන් යුතු ඉහළ ගණුදෙනුකාර සේවාවක් සහතික කිරීම සඳහා ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි පිළිබඳ වාර්තාවක් පවත්වා ගැනීම සහ සම්මත කාල සීමාව තුලදී ප්‍රතිචාර දැක්වීම ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි කළමනාකරණය යන්නට ඇතුළත් වේ.

ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි යනු බැංකුවේ මෙහෙයුම්හි මෙහෙයුම් දුර්වලතා සහ අවදානම් හඳුනාගැනීමේ ප්‍රභවයක් ලෙස මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය විසින් සලකනු ලබයි.

ගනුදෙනුකරුවන්ගේ පැමිණිලිවලට අදාළ දත්ත සහ සොයා ගැනීම්, කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.

නව නිමැවුම් සහ ක්‍රියාවලි අවදානම් තක්සේරුව

නව නිමැවුමක් එහි පරීක්ෂණ මට්ටමේ සිට ක්‍රියාකාරී ව්‍යාපාරික පරිසරයට පිවිසීම විශේෂයෙන් අවදානම් සහගත බව මෑතකාලීනව ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදය සමග පැහැදිලි වේ. නුපුරුදු පරිසරයක් තුල හැසිරීම සඳහා අවශ්‍ය අත්දැකීම් සහ විශේෂඥතාව එවැනි නව නිමැවුමක් සතුව නොමැතිවීම එම අවදානම සඳහා හේතු වේ. එවැනි නිමැවුම් බැංකුව තුළ හඳුන්වාදීම/ක්‍රියාත්මක කිරීමට ප්‍රථම නව නිමැවුම්, මාර්ග සහ ක්‍රියාවලි ආශ්‍රිතව පැන නගින මෙහෙයුම් අවදානමේ ප්‍රභවයන් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය විසින් තක්සේරු කරනු ලබයි. තව දුරටත් එම නිමැවුම් මගින් බැංකුව කෙරෙහි ඇති කරන මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය විසින් එවැනි හඳුන්වාදීම්/ක්‍රියාත්මක කිරීම් වලින් පසුවද සමාලෝචන සිදු කරනු ලබයි.

තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය

තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාළව මතු වෙමින් තිබෙන අවදානම මගහැර තොරතුරු වල නිරවද්‍යභාවය, පාලනය, අඛණ්ඩතාවය සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් සුරක්ෂිත බැංකු සේවාවක් ගණුදෙනුකරුවන් වෙත ලබාදීම අරමුණු කරගෙන තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාළ නීති හා රෙගුලාසි නිරන්තරයෙන් විකාශනය වෙමින් තිබේ.

ක්ෂේත්‍රයේ විශේෂඥතාවය ආධාරයෙන් මූලික ආරක්ෂණ ප්‍රමිතීන් සමග අනුකූලවීම සඳහා බැංකුව විසින් පියවර ගන්නා ලද අතර තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව විසින් එය නිරීක්ෂණය කරනු ලබයි. ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය ISO 270001:2013 මත පදනම්ව සමාලෝචනය කෙරේ. මේ යටතේ, බැංකුවේ මීට අදාළව දැනට ක්‍රියාත්මක පරිචයන් විධිමත් කිරීම සඳහා විශේෂඥ උපදෙස් මත තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සහ පටිපාටි සමාලෝචනය කිරීම සිදුවේ.

මෙහෙයුම් අවදානම් නිරීක්ෂණ ඒකකය විසින් ප්‍රගති සමාලෝචන ඔස්සේ තොරතුරු වල සුරක්ෂිතතාව ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කරනු ලබන අතර වැඩිදුරටත් එය දියුණු කිරීමට අදාළ නිර්දේශ ඇත්නම් ඉදිරිපත් කෙරේ.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති

බැංකුවේ සේවා, නිමැවුම් සහ මෙහෙයුම් බිඳවැටීම් සහ බාධා වලින් තොරව අඛණ්ඩව සැපයිය යුතු බව ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම මගින් හඳුනාගැනේ. පහත දැක්වෙන කරුණු ඇතුළත් ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් ස්ථාපිත කර තිබේ.

- ව්‍යාපාර බලපෑම් තක්සේරුව
- තීරණාත්මක සේවා සහ නිමැවුම්හි අඛණ්ඩ සැපයීමක් සහතික කිරීම සඳහා සැලසුම්, මිනුම් සහ වැඩපිළිවෙල
- පුද්ගලයන්, තොරතුරු, උපකරණ, මූල්‍ය වෙන්කිරීම්, නීති
- උපදේශනය සහ යටිතල පහසුකම් ආරක්ෂණය ඇතුළු
- ව්‍යාපාර අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සඳහා අවැසි සම්පත් හඳුනාගැනීම

බැංකුවේ තීරණාත්මක සේවා/නිමැවුම්, පද්ධති සහ මෙහෙයුම්, බිඳවැටීම් මධ්‍යයේ අඛණ්ඩව සැපයෙන බව තහවුරු කෙරෙන ආකාරයේ ක්‍රියාකාරී සැලැසුම් ක්‍රියාවලියක් ලෙස ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම්කරණය හඳුන්වාදිය හැකි අතර එය වාර්ෂිකව සමාලෝචනය කෙරෙන ව්‍යාපාර කෙරෙහි වන බලපෑම් තක්සේරුවක ප්‍රතිඵල මත පදනම් වේ.

ස්වාභාවික විපත්, හදිසි අනතුරු, විදුලිය හා බලශක්තිය බිඳ වැටීම්, සන්නිවේදන, ගමනාගමන, ආරක්ෂක සහ සේවා ක්ෂේත්‍ර වල සිදුවිය හැකි බිඳ වැටීම්, පරිසර දූෂණය සහ හානිකර ද්‍රව්‍ය ඉහිරුම් වැනි පාරිසරික විපත්, සයිබර් ප්‍රහාර සහ වෙබ් අඩවි හා පරිගණක පද්ධති වලට නීති විරෝධීව ඇතුළුවීම් (අපහාරක ක්‍රියාකාරකම්) වැනි හදිසි අවස්ථා වලට අදාළව ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය තොරතුරු සහ සම්පත්, බැංකුව සතුව තිබෙන බව ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුමක් සකස් කිරීම සහ පවත්වා ගැනීම ඔස්සේ සහතික කෙරේ. එය මූල්‍ය මෙහෙයුම් සහ කීර්ති නාමයට සිදුවන හානි අවම කරයි.

ආපදා ප්‍රතිසාධන සැලැස්ම සාමාන්‍යයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක කොටසක් ලෙස සැලකේ. එබැවින් බැංකුව එහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමට සමාන්තරව ආපදා ප්‍රතිසාධන සැලැස්මක් සකස් කර තිබේ. බැංකුවේ ආපදා මධ්‍යස්ථානය අනපේක්ෂිත අවස්ථාවක මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සමගින් කොළඹින් පිටත ස්ථාපනය කර ඇත. ආපදා ප්‍රතිසාධන සැලැස්ම වෙනස්වන සුළු අතර දෛනිකව යාවත්කාලීන කෙරේ.

අවදානම් පැවරීම

ඵලදායී ලෙස පිරිවැය අවම කරගැනීමේ ක්‍රමවේදයක් හා අවදානම් පැවරීමේ උපායමාර්ගයක් ලෙස බාහිර පාර්ශ්ව සේවයේ යෙදවීම උපයෝගී කරගැනේ. බැංකුවේ බාහිර පාර්ශ්ව සේවයේ යෙදවීමේ කාර්ය ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැහැරි පාර්ශ්ව සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තිය මත පදනම් වේ. මෙය බැංකුවේ ප්‍රතිසම්පාදන මාර්ගෝපදේශ විසින් තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

එලෙස ව්‍යාපාරික මෙහෙයුම් සඳහා බාහිර පාර්ශ්වයන්ගේ සේවය ලබාගැනීම ආශ්‍රිත අවදානම කළමනාකරණය කිරීම වෙනම ඒකකයක් විසින් සිදු කරනු ලබයි. එම කාර්යය විධිමත් ලෙස පවත්වාගෙන යාම හා වාර්තා කිරීම සඳහා එම ඒකකය පිහිටුවා තිබේ.

එලෙස සේවා ලබාගන්නා සේවා සපයන්නන් එම කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට සමත් බව තහවුරු කරගැනීම සඳහා බැංකුව පුළුල්වූ සූක්ෂම සුපරීක්ෂණ ක්‍රියාවලියක් සිදු කරයි.

මෙහෙයුම් අවදානම් පැවරීමේ ක්‍රමවේදයක් ලෙස රක්ෂණය ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. රක්ෂණ සේවා සපයන්නෙකු වෙත ප්‍රධාන රක්ෂණය කළ හැකි අවදානම පැවරීම එහිදී සිදුවේ. ස්වාභාවික විපත්, ගිනි ගැනීම් ආදිය හේතුවෙන් භෞතික වත්කම් වලට හානි සිදුවීම වැනි "දුලභව සිදුවන ඉහළ බලපෑමක්" සහිත සිදුවීම් ආවරණය කිරීම සඳහා රක්ෂණ ප්‍රතිපත්ති භාවිත වේ.

බැංකුවට අදාළ පවතින හා මතුවෙමින් තිබෙන අවදානම් සැකිල්ලට ගනිමින් රක්ෂණ ප්‍රතිපත්තියේ ප්‍රමාණවත්භාවය සමාලෝචනය කෙරේ. මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය රක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ප්‍රතිසාධන ප්‍රවණතාව නිරීක්ෂණය කරන අතර එම නිරීක්ෂණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. 2017 වර්ෂය තුලදී බැංකුවට අත්වන රක්ෂණ ප්‍රතිලාභ උපරිම කිරීම උදෙසා රක්ෂණ ක්‍රියාවලිය කේන්ද්‍රගත කරන ලදී.

ආතති පරීක්ෂාව සහ සංසිද්ධි විශ්ලේෂණය

ඇති විය හැකි මෙහෙයුම් අවදානම් සිද්ධීන්හි බලපෑම හඳුනාගැනීම සඳහා ආතති පරීක්ෂාව සහ සංසිද්ධි විශ්ලේෂණය උපකාර වේ. නිශ්චිත මෙහෙයුම් අවදානම් සංසිද්ධිවල බලපෑම තක්සේරු කිරීම සඳහා සංසිද්ධි විශ්ලේෂණය භාවිත කෙරෙන අතර බැංකුවේ මූල්‍ය තත්වය හා නුඹුන්වත්භාවය කෙරෙහි එකකට වැඩි සංසිද්ධි ගණනක් විසින් ඇති කරනු ලබන බලපෑම හඳුනාගැනීම සඳහා ආතති පරීක්ෂාව ආධාර වේ. පූර්ව නිවාරක අවදානම් වළක්වාලීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා එහි ප්‍රතිඵල මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

විස්තර	සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය කෙරෙහි බලපෑම හිතකර/(අහිතකර) (%)		
	පහළ	මධ්‍යම	ඉහළ
මෙහෙයුම් පාඩු - තථ්‍ය මෙහෙයුම් පාඩුවල උග්‍රතාවය (උපරිම වශයෙන් පසුගිය වසර තුන තුල ඇතිවූ තථ්‍ය සමස්ත උග්‍රතාවය)	(0.03)	(0.05)	(0.07)

පහළ - උපරිම උග්‍රතාවය
මධ්‍යම - උපරිම උග්‍රතාවය මෙන් 1.5 වාරයක්
ඉහළ - උපරිම උග්‍රතාවය මෙන් දෙගුණයක උග්‍රතාවයක්

නෛතික අවදානම

බාසල් නිර්වචනයන්ට අනුව නෛතික අවදානම මෙහෙයුම් අවදානමෙහි කොටසක් වේ. සාවද්‍ය ලෙස සම්පාදනය කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම් සහ ඒවා ක්‍රියාත්මක කිරීම, දඩ සහ දණ්ඩණීය හානි වලට මග පාදන ලිඛිත ගිවිසුම් හෝ ප්‍රමාණවත් ආකාරයේ ලිඛිත ගිවිසුම් නොමැතිවීම හේතුවෙන් පාඩු සිදුවීමේ අවදානම නෛතික අවදානම යන්නට ඇතුළත් වේ. එහෙත් එය ඉහතින් සඳහන් කරන ලද අවදානම් වලට සීමා නොවේ. පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඔස්සේ නෛතික අවදානම කළමනාකරණය කෙරේ.

- ගණුදෙනුකරුවන් හෝ සේවා සපයන්නන් වැනි තෙවන පාර්ශ්ව සමග ගිවිසුම්ගත ව්‍යාපාරික සබඳතා වලට එළඹීමේදී ව්‍යාපාරික මෙහෙයුම් වලට අදාළ සියළු නීති පූර්ණ වශයෙන් සැලකිල්ලට ගන්නා බව සහතික කිරීම.
- එවැනි සියළු ගිවිසුම්ගත සබඳතා අවශ්‍ය ලිපි ලේඛණ මත පදනම් වන බව සහතික කිරීම.
- නිමැවුම් හා ක්‍රියාවලි හඳුන්වාදීමේදී/සමාලෝචනය කිරීමේදී නීති සහ රෙගුලාසි සමග අනුකූලතාවය සහතික කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

නෛතික අවදානම කළමනාකරණය කිරීමේ වගකීම නීති අංශයේ මගපෙන්වීම යටතේ ව්‍යාපාර හිමිකරුවන් වෙත පවරා තිබේ. නීති අංශය බැංකුවේ නීති අවදානම උපායමාර්ගිකව කළමනාකරණය කිරීමෙහි නියුක්තව සිටී.


මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව විසින් නෛතික අවදානම හේතුවෙන් ඇති විය හැකි මෙහෙයුම් ආශ්‍රිත පාඩුසහගත සිදුවීම් කලින් කලට නිරීක්ෂණය කරනු ලබයි.

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම තීරණාත්මක සාධකයක් ලෙස සැලකෙන්නේ අදාළ නීති හා රෙගුලාසි, ආචාර ධර්ම සංග්‍රහය සහ බැංකු ක්ෂේත්‍රයේ පරිචයන් ආශ්‍රිත ප්‍රමිති සමග අනුකූල නොවීම බැංකුවේ මූල්‍ය තත්වය හා කීර්ති නාමය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන හෙයිනි. එබැවින් අනුකූලතා නිළධාරී ප්‍රමුඛ අනුකූලතා අංශය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර බැංකුවේ අනුකූලතා අවදානම වළක්වාලීම සඳහා පියවර ගනී.

වඩා යහපත් අනුකූලතා පරිසරයක් නිර්මාණය කිරීම සහ අනුකූලතා අවදානම වැළක්වීම අරමුණු කරගෙන 2017 වසර තුළදී අනුකූලතා අංශය විසින් පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුකරුවන්ට අදාළ සූක්ෂම සුපරීක්ෂණ ක්‍රියාවලියට අදාළ රෙගුලාසි යටතේ අනුකූලතාවය සම්බන්ධයෙන් අවදානම මත පදනම්වූ ප්‍රවේශය අනුගමනය කිරීම.
- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ අන්තර්ගතය පරිදි අනුකූලතා ඉලක්කය පුළුල් කිරීම.
- දුරස්ථ ප්‍රදේශ වල පිහිටි ශාඛා සහ තීරණාත්මක ශාඛා ආශ්‍රිතව අනුකූලතා තක්සේරු සිදු කිරීම.
- ප්‍රාදේශික සහ ප්‍රධාන කාර්යාලයීය මට්ටමෙන් අනුකූලතා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.



සටහන 33: අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

කීර්ති නාමයට හානි සිදුවීමේ අවදානම

ව්‍යාපාරික පරිචයන් සහ මූල්‍ය තත්වයන් පිළිබඳව පාර්ශ්වකරුවන් තුල පවතින වැරදි ආකල්ප හේතුවෙන් බැංකුවේ ඉපයීම් සහ නුබුන්වත්භාවය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීමේ අවදානම කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම ලෙස හඳුන්වාදිය හැකිය. ප්‍රතිපත්ති, පටිපාටි, ආචාර ධර්ම සංග්‍රහය සහ ව්‍යාපාර ආචාර ධර්ම මගින් කළමනාකරණය කෙරෙන පුළුල් පරාසයක පැතිරුණු අනෙකුත් අවදානම් රැසක් සමග කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම බද්ධවී තිබෙන හෙයින් සාමාන්‍යයෙන් අනෙකුත් සියළුම අවදානම් කළමනාකරණය සඳහා යොදාගන්නා පද්ධති සහ පාලන ක්‍රමවේද ඔස්සේ කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානමද කළමනාකරණය කිරීම පුළුල් ලෙස සිදු කෙරේ.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ආයතනික කළමනාකාරීත්ව විසින් සිදු කරනු ලබන කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය ලක්වේ.


කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම ආශ්‍රිතව ශූන්‍ය අවදානම් අභිරුචියක් බැංකුව සතුවේ. එබැවින් ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක සහ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය වැනි මෙලවම් උපයෝගී කරගනිමින් අවදානම් කළමනාකරණ අංශය විසින් කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම නිරීක්ෂණය කරනු ලබයි. බැංකුව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය යටතේ කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම තක්සේරු කිරීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් මත පදනම්වූ ආකෘතියක් භාවිතා කරයි.

උපායමාර්ගික අවදානම

අසාර්ථක ව්‍යාපාර සැලසුම් හෝ සුදුසු ව්‍යාපාරික සැලසුමක් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම, ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්කම් කෙරෙහි නිසි පරිදි ප්‍රතිචාර දැක්වීමට අසමත්වීම, බැංකුවේ ඉපයීම් සහ ප්‍රාග්ධනය මත අහිතකර බලපෑම් ඇති කරමින් ප්‍රමාණවත් පරිදි සම්පත් වෙන් නොකිරීම හේතුවෙන් පාඩු සිදුවීමේ අවදානම උපායමාර්ගික අවදානම ලෙස හඳුන්වාදිය හැක. මතු විය හැකි අනපේක්ෂිත ව්‍යාපාරික අවස්ථා වල උපයෝජනය මගහැරියාමද උපායමාර්ගික අවදානම යන්නට අයත් වේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දැක්ම,මෙහෙවර සහ අවදානම් අභිරුචියට සමගාමී වන උපායමාර්ගික සැලසුම්කරණය සහ අයවැය ක්‍රියාවලියක් ඔස්සේ උපායමාර්ගය සකස් කිරීමේ වගකීම අංශ ප්‍රධානීන් වෙත පැවරේ. අයහපත් දේශීය හා ජාත්‍යන්තර පොදු ආර්ථික සහ වෙළඳපල තත්වයන් හේතුවෙන්ද උපායමාර්ගික අවදානම පැන නගී. ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමේදී පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු යෙදවුම් ලෙස යොදා ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික අවදානම හා සම්බන්ධ වගකීම අධීක්ෂණය කරයි. එසේම, නිරන්තරයෙන් සිදු කෙරෙන සමාලෝචන ඔස්සේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් උපායමාර්ගික අවදානම අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. බැංකුව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය යටතේ උපායමාර්ගික අවදානම තක්සේරු කිරීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් මත පදනම්වූ ආකෘතියක් භාවිතා කරයි.



සටහන 34: උපායමාර්ගික අවදානමෙහි අංග

ප්‍රාග්ධන කළමනාකරණය

පාර්ශ්වකරුවන්ට ලැබීම් උත්පාදනය කරන අතරතුර විවලන දරාගැනීම සඳහා බැංකුව සතු හැකියාව සහතික කිරීම සඳහා ප්‍රාග්ධන කළමනාකරණය අවදානම් කළමනාකරණ කාර්යාලයේ අභ්‍යන්තර අංගයක් බවට පත් කර ඇත. බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ හා අනුකූලව සිදු කෙරේ.

අවම ප්‍රාග්ධන අවශ්‍යතා සහ ස්ථාරක්ෂක - ස්ථර I

2016 අංක 01 දරණ බැංකු පනතේ නියමය මගින් අවම ප්‍රාග්ධන අනුපාතික ඉහළ නැංවීම සඳහා නිශ්චිත කාලරාමුවක් සමගින් 2017 ජූලි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි බාසල් III යටතේ බලපතුලාභී බැංකු සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා හඳුන්වාදී ඇත. 2019 ජනවාරි 1 වන දින සිට එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ.


බැංකුව 2017 වසර තුලදී ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සඳහා නියම කරන ලද අවම නියාමන අවශ්‍යතා ළඟා කරගැනීමට සමත් විය. 2016 දෙසැම්බර් 31 දිනට 11.31% ක් ලෙස සටහන්වූ සාමාන්‍ය කොටස් - ස්ථර I අනුපාතිකය 2017 දෙසැම්බර් 31 දිනට 11.93% ක අගයක් වාර්තා කරමින් සුළු වශයෙන් ඉහළ ගියේය. සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය ඉහළ යාම සහ ඒකාබද්ධ අරමුදල/ලාභාංශ වෙත දැක්වූ දායකත්වය 2016 වසරේදී වාර්තාවූ රුපියල් බිලියන 12.02 සිට 2017 වර්ෂයේදී රුපියල් බිලියන 5.1 දක්වා අඩු කිරීම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. යෝග්‍ය අතිරේක ස්ථර I ප්‍රාග්ධන මෙවලම් නොමැති හෙයින් බැංකුවේ සාමාන්‍ය කොටස් - ස්ථර I අනුපාතිකය සමස්ත සාමාන්‍ය කොටස් - ස්ථර I අනුපාතිකයට සමාන විය.

අවදානම අනුව බර තබන ලද වත්කම් අවදානම් අභිරුචි සීමා තුල පවත්වා ගැනීම සහ එය නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් පියවර ගන්නා ලදී. 2016 දෙසැම්බර් 31 දිනට 13.86% ක් ලෙස සටහන්වූ සමස්ත ප්‍රාග්ධන අනුපාතිකය 2017 දෙසැම්බර් 31 දිනට 15.31% දක්වා වර්ධනය විය.

බැංකුවේ පරිපාලිතය වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම, සමූහය මට්ටමේදී ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතිකය කෙරෙහි ධනාත්මකව දායකත්වය දක්වයි. 2017 දෙසැම්බර් 31 දිනට සමූහයේ සාමාන්‍ය සමකොටස් - ස්ථර I අනුපාතිකය 12.65%ක් ලෙසද සමස්ත ප්‍රාග්ධන අනුපාතිකය 16.00% ක් ලෙසද සටහන් විය.

ප්‍රාග්ධන මට්ටම - බැංකුව හා සමූහය

[%]



100% ක රාජ්‍ය අයිතිය සහිත ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස බාහිර ප්‍රභවයන් ඔස්සේ ප්‍රාග්ධනය ඉපයීම සඳහා පවතින්නේ සීමාසහිත ඉඩකඩකි. බාසල් III යටතේ පවතින එකම නියාමන ප්‍රාග්ධන මෙවලම වන්නේ භාණ්ඩාගාර ලේකම්වරයා මගින් නිකුත් කරන කොටස් පමණි. 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව බාසල් III යටතේ නියාමන ප්‍රාග්ධනය ලෙස හඳුනාගැනීම සඳහා වන නිර්නායක සපුරාලන සම කොටස් ස්ථර 2 ප්‍රාග්ධනය ඉපයීමට බැංකුවට අවස්ථාව නොමැත. බැංකුවේ ප්‍රාග්ධන මට්ටම ඉහළ නංවාගැනීම සඳහා වන මූලපිරීම්:

- ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතිකය වර්ධනය කරගන්නා තුරු ලාභාංශ ගෙවීම අවම කරගනිමින් ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීම.
- කළඹ නිරීක්ෂණය ඔස්සේ අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සහ අවදානම අනුව සැකසූ ලැබීම් වලට සාපේක්ෂව ඉහළ වටිනාකමක් සහිත ආයෝජන සිදු කෙරෙන බව සහතික කිරීම.
- ප්‍රාග්ධන මට්ටම් කෙරෙහි වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අවදානම අනුව බර තබන ලද වත්කම් මිශ්‍රය සහ අවදානම් පැතිකඩ ආශ්‍රිත වෙනස්කම් නිරීක්ෂණය කිරීම.

ප්‍රාග්ධන මට්ටම් වර්ධනය කරගැනීම සඳහා පාර්ශවකරුවන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කරගෙන බාසල් III නියාමන මගින් පනවන ලද ඉහළ දැමූ ප්‍රාග්ධන ඉල්ලුම හේතුවෙන් උපායමාර්ගික ව්‍යාපාරික අභිමතාර්ථ සපුරාගැනීමෙහිලා මුහුණදීමට සිදු වන අභියෝග පිළිබඳව පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම.

සටහන 35

අනුපාතික	තථ්‍ය 31.12.2016		තථ්‍ය 31.12.2017		අවම නියාමන අවශ්‍යතා 01.07.2017	අවම නියාමන අවශ්‍යතා 01.01.2018	අවම නියාමන අවශ්‍යතා 01.01.2019
	බැංකුව	සමූහය	බැංකුව	සමූහය			
පොදු සමකොටස් ස්ථර I සහ D-SIbS සඳහා ප්‍රාග්ධන අධිභාරය	11.31	12.03	11.93	12.65	6.25	7.375	8.50
ස්ථර I + CCB සහ D-SIb සඳහා ප්‍රාග්ධන අධිභාරය	11.31	12.03	11.93	12.65	7.75	8.875	10.00
සමස්ත ප්‍රාග්ධනය + CCB සහ D-SIbS සඳහා ප්‍රාග්ධන අධිභාරය	13.86	14.54	15.31	16.00	11.75	12.875	14.00

වගුව 14: නියාමන අනුපාතික සහ අවම නියාමන අවශ්‍යතා


ප්‍රාග්ධනය යනු ඉහළ පිරිවැයක් සහිත සම්පතකි. එබැවින් කාර්යසාධනය සහ අවදානම අතර නිසි තුලනයක් පවත්වාගැනීම ඔස්සේ ප්‍රාග්ධනය වඩා හොඳින් කළමනාකරණය කරගැනීමට බැංකුව උත්සුක වේ. එසේම, මෙහෙයුම් කාර්යක්ෂමතාව, වර්ධනය සහ නුඹුනවත්භාවය ළඟා කරගැනීම සඳහා අවදානම් කළමනාකරණ පරිචයන් සහ උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම්කරණය සංයෝජනය කරමින් අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මගින් ඒකාබද්ධ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය - ස්ථර II

සියලු ප්‍රධාන අවදානම් ග්‍රහණය කරගැනීම සඳහා වන මනා අවදානම් කළමණාකරණ කාර්යරාමුවක් මෙන්ම අවදානම් අභිරුචිය, ආතති පරීක්ෂාව සහ ප්‍රාග්ධන සැලසුම්කරණය යන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියට අයත් වේ. බැංකුවේ අවදානම් පැතිකඩට අනුරූපව අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටමක් ස්ථාපිත කරගැනීම සඳහා ව්‍යාපාර කාර්යසාධනය, අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ අවදානම් සංවේදී ප්‍රාග්ධනය වඩා තර්කානුකූල ආකාරයකින් සංයෝජනය කිරීමට එමගින් අවස්ථාව සැලසේ.

අධීක්ෂණ සමාලෝචන සහ ඇගයීම් ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර යහපරිචයන් පවත්වාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු වෙත නිකුත් කරන ලද බාසල් III ස්ථර II මාර්ගෝපදේශ පිළිබඳ නියාමන වලට අනුකූලවූ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුවේ.

බැංකුවට සහ නියාමන යාන්ත්‍රණයට බෙහෙවින් වැදගත් වන මූලධර්ම සතරකින් බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමන්විත වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවදානම ඒකාබද්ධ කරගැනීම, පුළුල්වූ අවදානම් තක්සේරුකරණය, අභ්‍යන්තර පාලන සමාලෝචනය, නිරීක්ෂණය, වාර්තාකරණය සහ අවදානම් ආතති පරීක්ෂාවට ලක් කිරීම මෙම ක්‍රියාවලියට ඇතුළත් වන අතර එය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.



සටහන 36: අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ කාර්යරාමුව

අවදානම් තක්සේරුකරණය ස්ථර I මෙන්ම ස්ථර II අවදානමද ආවරණය කරයි. ස්ථර I නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය හා අදාළ වන අතර ස්ථර II ආර්ථික ප්‍රාග්ධනය හා අදාළ වේ. බැංකුව ස්ථර II යටතේ අවදානම තක්සේරු කිරීම සඳහා ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක ප්‍රවේශද උපයෝගී කරගනී.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අනුව බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ ආවරණය කිරීම සඳහා වන අවශ්‍යතාවය බැංකුව විසින් හඳුනාගන්නා ලදී. පුළුල් ලෙස ලේඛනගත කරන තිබෙන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡාවට බඳුන්කර අනුමත කරනු ලබයි.

අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා - ස්ථර III

වෙළඳපළ තුල ක්‍රියාත්මක වන පාර්ශ්ව වලට බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ අවදානම් නිරාවරණ පිළිබඳව තක්සේරු කරගැනීමට අවස්ථාව ලබාදීම පිණිස බාසල් III කාර්යරාමුවේ සීමා වලට අනුකූලව අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හඳුන්වාදී තිබේ.

2016 අංක 01 දරණ බැංකු පනත ප්‍රකාරව අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා පිටු අංක 379 - 391 දක්වා බලන්න.

මෙම කොටසේ (පිටු අංක 201 - 238) සඳහන් සියළුම හෙළිදරව් කිරීම් විගණනය කරන ලද බව සඳහන් කර නොමැති නම් විගණනය කර නොමැත.

මූල්‍ය වාර්තා

මූල්‍ය දින දර්ශනය – **240**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – **241**

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය – **248**

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය – **250**

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව – **252**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්) ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය – **253**

විගණකාධිපති වාර්තාව – **255**

විස්තීරණ ආදායම් ප්‍රකාශය – **256**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය – **258**

හිමිකමේ වෙනස්වීම දක්වන ප්‍රකාශය – **260**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය – **264**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන් – **265**

මූල්‍ය දින දර්ශනය

මූල්‍ය දින දර්ශනය 2017

2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2017 මැයි 27**
2017 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2017 අගෝස්තු 31**
2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2017 නොවැම්බර් 30**
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි (විගණනය කරන ලද) මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2018 මාර්තු 15**

යෝජිත මූල්‍ය දින දර්ශනය 2018

2018 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2018 මැයි 31**
2018 ජුනි 30 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2018 අගෝස්තු 31**
2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුවෙහි අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2018 නොවැම්බර් 30**
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි (විගණනය කරන ලද) මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	**2019 මාර්තු 29**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍ය කරුණු →

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු පිළිබඳ ඔවුන්ගේ දෙවන සංකලිත වාර්තාව, බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමගින් එක්ව ඉදිරිපත් කරනු ලබනුයේ සතුටිනි. එය බැංකුව මගින් පසුගිය වර්ෂ පුරාද අනාගතයේදී ද වටිනාකම නිර්මාණය කරන්නේ සහ රඳවා ගන්නේ කෙසේද යන්න පිළිබඳව විස්තර වන බැංකුවේ ව්‍යාපාරයෙහි උපායමාර්ගික චිත්‍රයක් ලබා දෙන බව අපි දනිමු.

2018 පෙබරවාරි 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත අනුමත කරන ලද අතර 2018 පෙබරවාරි 09 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරනලදී. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 12 වන දින නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙනලදී. 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධිත වලින් සහ ආයතනික පාලනය පිළිබඳ විධාන වලින් අවශ්‍ය යම් හෙළිදරව් කිරීම් ද මෙම වර්තාවෙහි ඇතුළත් වේ. වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන, විගණකාධිපතිගේ වාර්තාව සමගින් පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2005 ජනවාරි 27 දිනැති චක්‍රලේඛ අංක PED/27 ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට 2018 මැයි 31 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතින් ශ්‍රී ලංකාවේදී සංස්ථාපිත කරනලද අතර 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී.

බැංකුවට අඛණ්ඩව 15 වන වරටත් ෆිච් රේටින්ග් ලංකා (පුද්) සමාගම විසින් AAA (lka) දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීම ලබා දී ඇත. ස්ටැන්ඩර්ඩ් සහ පුවර්ස් සර්විසස් වෙතින් B + ස්ථාවර සහ පිච් ඉන්කොපරේෂන් වෙතින් B+ ස්ථාවර යන ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම බැංකුවට හිමිවිය.

දැක්ම, මෙහෙවර සහ අගයන් →

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ අගයන් මෙම වාර්ෂික වාර්තාවේ 3 වන පිටුවෙහිදී ඇත. සියලු ස්ථීර සේවකයන් බැංකුවේ දැක්ම සහ මෙහෙවර කරා ළඟා වීමේ දැක්මෙන් යුතුව බැංකුවේ ආයතනික චර්යාධර්ම සංග්‍රහයට සහ රජයේ ප්‍රතිඥාවට අනුකූලව කටයුතු කරමින් සිටි.

ප්‍රධාන ක්‍රියාකාරකම් →

බැංකුව →

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලාංකීය ජනතාව අතර ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම සහ එසේ සංචලනය කරනලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත්ය.

පරිපාලිත සමාගම →

NSB අරමුදල් කළමනාකරණ සීමිත සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලයලත් ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස රජයේ සුරැකුම්පත් ගනුදෙනු කටයුතු කිරීමය. මූල්‍ය ප්‍රකාශන සඳහාවූ 40 (ආ) සටහනෙහි මෙය පිළිබඳව විස්තර ලබාදී ඇත. බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකියයුතු වෙනස්වීම් සිදු නොවීය.

ව්‍යාපාර කාර්යසාධනය සමාලෝචනය →

2017 මූල්‍ය වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය සහ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සමාලෝචනයක් සභාපතිතුමාගේ ලිපියේ (පිටු අංක 21) සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයේ (පිටු අංක 27) 2017 කතා පුවත (පිටු අංක 12) සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල (පිටු අංක 256) තුළ දක්වා ඇත. මෙම වාර්තා වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

"එම්" කෑෂ් සේවා ස්ථාන හරහා නම්‍යශීලීත්වය හා පහසුව සපිරි නව ඩිජිටල් පරිසරයක් නිර්මාණය කරනු පිණිස ජාතියේ ජංගම දුරකථන සේවා ප්‍රවර්ධකය වන මොබිටෙල් ආයතනය සමඟ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අත්වැල් බැඳ ගන්නා ලදී. මෙම පහසුකම එන්.එස්.බී. අයි සේවර් යන සන්නම් නාමයෙන් හඳුන්වා දෙනු ලැබූ අතර, ආයෝජනය සඳහා අරමුදල් සැපයීමේ හා ධනය උත්පාදනය කිරීමේ ප්‍රතිඵල ජනනය කරමින් ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ඉතිරිකිරීමේ පුරුද්ද තවදුරටත් ස්ථාපිත කරනු ඇතැයි ඉන් අපේක්ෂිතය.

ජාලය පුළුල් කිරීම සහ අනාගත සංවර්ධනයන් →

දිවයින තුළ බැංකුවේ පැතිරීම පුළුල් කරමින්, සමාලෝචන වර්ෂය තුළ ජාලයට ශාඛා පහක් එක් කරනලදී. වර්ෂය අවසානයේදී බැංකුවට එහි ජාලය තුළ ශාඛා 253 ක් තිබිණි. පාරිභෝගික පහසුව වැඩිදියුණු කරමින් ATM ජාලය තවදුරටත් පුළුල් කරනලදී. බැංකුව වසර තුළ දිවයින පුරා ATM යන්ත්‍ර 7 ක් ස්ථාපනය කරන ලද්දේ NSB පාරිභෝගිකයන්ට ගනුදෙනු කළ

හැකි බැංකුවල සාමාන්‍ය ATM යන්ත්‍ර හැර මුළු ATM යන්ත්‍ර ගණන 286 ක් දක්වා වැඩි කරමිනි. 16,000 ක් ඉක්මවූ "එම්" කෑෂ් සේවා ස්ථාන හරහාද ගනුදෙනුකරුවන්හට අපගේ බැංකු සේවා සඳහා ප්‍රවේශ පහසුකම් සැපයෙයි.

බැංකුව ඉදිරි වර්ෂ තුළදී තාක්ෂණික වැඩිදියුණුවීම් සමග බැඳීමට අදහස් කරයි. මෙය බැංකුවේ ගනුදෙනුකරුවන් සමූහය සඳහා වන පහසුව වැඩි කරනු ඇත. බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සභාපතිතුමාගේ ලිපියේ (පිටු අංක 21), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයේ (පිටු අංක 27) සහ 2017 කතා පුවත (පිටු අංක 12) තුළ දක්වා ඇත.

අඛණ්ඩ පැවැත්ම →

බැංකුවට ඉදිරි අනාගතය තුළ එහි මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර සෑහීමට පත්ව ඇත. තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව ගැන සැලකිය යුතු අවිනිශ්චිතතාවක් ඇති කරන, මෙහෙයුම් සීමා කිරීම හෝ කප්පාදු කිරීමේ සැලසුම් වැනි කිසිවක් පිළිබඳව දැන නොසිටී.

මූල්‍ය ප්‍රකාශන →

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිති/ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) සහ 1988 අංක 30 දරණ බැංකු පනතෙහි නියමයන්ට අනුකූලව පිළියෙළ කර ඇත. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මුදල් සහ සැලසුම් විසින් නිසි පරිදි සහතික කරන ලද අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් විසින් අනුමත කර අත්සන් කරන ලද අතර එය (පිටු අංක 256) දැක්වේ. එය බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් →

2017 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ ප්‍රතිරූපයක් මතුවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරයි. මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 248 තුළ දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනයෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සවිස්තරව පැහැදිලි කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

විගණකවරුන්ගේ වාර්තාව →

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල විගණනය විගණකාධිපති විසින් සිදු කරනලදී. 2017 වසර තුළ විගණනය වසර පුරා කරගෙන යන ලදී. ඔවුන්ගේ වාර්තාවල හඳුනා ගන්නාලද ගැටලු කඩිනම් ක්‍රියාමාර්ග සඳහා නිරන්තරව කළමනාකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිවැරදිබව තහවුරුකර, මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය දත්ත සහ තොරතුරු සහිතව විගණකාධිපතිගේ පරීක්ෂාව සඳහා ලබාදෙන ලදී. මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 255 දක්වා ඇත.

නියාමන අධීක්ෂණ ආයතනයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකුවේ වාර්තා හා කටයුතු වරින්වර පරීක්ෂා කිරීම් සිදුකරනලද අතර ඒවා මහ බැංකුව විසින් නිකුත්කර ඇති උපදෙස් වලට අනුකූලව පවත්වා ගැනීම සිදු කර ඇති බවට එය තහවුරු කරනු ලබයි. තවද එය, උනන්දුවක් දක්වන පාර්ශ්වවල, විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සඳහා මූල්‍ය දර්ශක අවශ්‍ය මට්ටමෙන් පවත්වා ගන්නේද යන්න නිර්ණය කරයි.

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වසර තුළ වෙනස්වීම් →

බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS/SLFRS) අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබයි. වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදාගන්නාලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 265 දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට කිසියම් සැලකිය යුතු වෙනස්කම් වේ නම්, එයද මෙහි ඇතුළත් කර ඇත.

උපායමාර්ගික ව්‍යාපාර සැලසුම →

බැංකුව විසින් 2017 වර්ෂය තුල 2017-2019 උපායමාර්ගික ව්‍යාපාර සැලසුම පදනම් කොටගෙන 2018 සිට 2020 දක්වා නව උපාය මාර්ගික ව්‍යාපාර සැලසුමක් ගොඩනගා ඇත. මෙම ක්‍රියාවලිය තුලින් අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍රයක් සහ උපායමාර්ගික මූලපිරීම් හඳුන්වා දෙනලදී. බැංකුවෙහි අනාගත ගම්‍යතාවය වැඩිකිරීමට උපකාරීවනු ලබන නව ව්‍යාපාර සැලසුමෙහි දක්වා ඇති පරාමිති තුළ කටයුතු කිරීමට බැංකුව උත්සාහ දරයි. නියාමනය පහසු කිරීම අරමුණු කොටගෙන උපාය මාර්ගික ව්‍යාපාර සැලසුමට අනුව සෑම කාර්යය හා සේවා අංශයක් සඳහාම බැලන්ස් ස්කෝ කාඩ් (Balance Scorecard) සමඟ කාර්යසාධන දර්ශකයක් හඳුන්වා දී ඇත.

ආදායම →

2017 දී බැංකුවේ ආදායම රුපියල් මිලියන 107,817 ක් (2016 - රුපියල් මිලියන 87,399) වූ අතර සමූහයේ ආදායම රුපියල් මිලියන 108,056 ක් (2016 - රුපියල් මිලියන 88,039) විය. ආදායම්වල විස්තරය මූල්‍ය ප්‍රකාශන වල සටහන අංක 03 හි දක්වා ඇත.

ප්‍රතිඵල සහ විසර්ජනය →

බැංකුවේ සහ සමූහයේ ආදායම් බදු වලට පෙර ලාභය රුපියල් මිලියන 14,029 ක් සහ රුපියල් මිලියන 13,645 ක් (2016 - රුපියල් මිලියන 13,303 සහ රුපියල් මිලියන 13,397) ක් විය. මෙය බැංකුව සඳහා 5.45% ක සහ සමූහය සඳහා 1.85% ක (2016 - 2.07% සහ 0.94% වැඩි වීම) වැඩිවීමකි.

බැංකුවේ සහ සමූහයේ බදුවලට පසු ලාභය පිළිවෙළින් රුපියල් මිලියන 9,610 ක් සහ රුපියල් මිලියන 9,050 ක් (2016 - රුපියල් මිලියන 9,498 ක් සහ රුපියල් මිලියන 9,562 ක්) ක් විය. මෙය බැංකුව සඳහා 1.18% ක වැඩිවීමක් සහ සමූහය සඳහා 5.36% ක අඩුවීමකි. (2016 - 9.52% සහ 8.27%)

බැංකුවට අදාළ ලාභ පිළිබඳ විස්තර පහත වගුවෙහි දී ඇත:

බදු සඳහා ප්‍රතිපාදන →

බැංකුව සඳහා එහි මෙහෙයුම් මත අදාළ වන ආදායම් බදු අනුපාතය 28% කි. බැංකුවේ මෙහෙයුම් මූල්‍ය සේවා මත 15% ක එකතුකළ අගය මත බද්දකට සහ 2% ක ජාතිය ගොඩනැගීමේ බද්දකට යටත්වේ.

බැංකුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 - "ආදායම් බදු" පිළිබඳ ගිණුම් ප්‍රමිතියට අනුව සියළු හඳුනාගත් තාවකාලික වෙනස්වීම් සඳහා වගකීම් ක්‍රමය පදනම් කොට ගෙන විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සිදු කොට ඇත. ආදායම් බදු සහ විලම්බිත බදු පිළිබඳ තොරතුරු පිළිවෙලින් ගිණුම්කරණ සටහන් අංක 13 හා 29 හි පිටු අංක 289 සහ 324 හි ඇතුලත් කොට ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය →

බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 10ක් වන අතර එය එකක් රුපියල් 10/- ක් වූ සාමාන්‍ය කොටස් බිලියන 1කින් සෑදී ඇත. බැංකුව විසින් 2017 වර්ෂය තුල හිමිකම් නොපෑ සංචිත යොදාගනිමින් භාණ්ඩාගාර ලේකම් වෙත එකක් රු. 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 50 ක් නිකුත් කරන ලදී. 2017 දෙසැම්බර් 31 වන දිනට නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 6.7කි. භාණ්ඩාගාර ලේකම් ඔහුගේ නිල බලයෙන් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සියල්ල රඳවා ගනී.

ණයට ගත් ප්‍රාග්ධනය →

බැංකුව විසින් ඇමරිකන් ඩොලර් මිලියන 750 ක හා 250 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර බැඳුම්කර 2013 හා 2014 දී නිකුත් කරන ලදී. මෙය මෙතෙක් දුරට තනි බැංකුවක් විසින් සිදු කරන ලද ඉහළම විදේශ අරමුදල් ප්‍රමාණයක් විදේශ ආයෝජකයන්ගෙන් ලබා ගත් අවස්ථාව වේ. මේ පිළිබඳ තොරතුරු ගිණුම්කරණ සටහන් අංක 33 හි පිටු අංක 327 හි ඇතුලත් කොට ඇත.

	2017 රු. මිලියන	2016 රු. මිලියන
සියලු වියදම් ගෙවීමෙන් සහ ක්ෂයවීම්, වියහැකි ණය අලාභ සහ අසම්භාව්‍යයන් සඳහා වෙන් කිරීමෙන් පසුව එකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවලට පෙර ලාභය	**17,523**	16,094
මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු	**3,083**	2,405
මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු	**411**	386
ආදායම් බදු සඳහා වෙන්කිරීම්	**4,419**	3,805
බදු පසු ලාභය	**9,610**	9,498

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ යටත්කාලීන වගකීම් රු.බි. 6 කින් සමන්විත විය. රු. 100.00 ක ශ්‍රේණිගත සුරැකුම් නොලත් යටත්කාලීන හා නිදහස් කළ හැකි බැඳුම්කර 2016 දෙසැම්බර් 29 දින පෞද්ගලික ස්ථානගත කිරීමක් ලෙස නිකුත් කරන ලදී. මේ පිළිබඳ තොරතුරු ගිණුම්කරණ සටහන් 35 හි පිටු අංක 339 හි ඇතුළත් කොට ඇත.

කොටස් හිමිකම →

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එකම කොටස්කරුවා වන්නේ ශ්‍රී ලංකා රජයයි.

සංචිත →

බැංකුවේ සංචිත සමන්විත වන්නේ

	2017 රු. මිලියන	2016 රු. මිලියන
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**3,003**	2,522
ප්‍රත්‍යාගණන සංචිතය	**7,793**	3,297
රඳවාගත් සංචිත	**2,229**	2,379
වෙනත් සංචිත	**20,497**	17,848
	33,522	26,046

සංචිතවල වෙනස්වීම් පිළිබඳ තොරතුරු හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයෙහි පිටු අංක 260 දක්වා ඇත.

රජය වෙත දායකත්වය →

බැංකුව 2017 දී රජයට බදු සහ අය කිරීම් වශයෙන් රුපියල් මිලියන 13,440 ක් දායක කර ඇත. (2016 - රුපියල් මිලියන 19,251 කි.) මෙහි ආදායම් බදු රුපියල් මිලියන 4,419 ක් (2016 - රුපියල් මිලියන 3,805), එකතු කළ අගය මත බදු රුපියල් මිලියන 3,085 ක් (2016 - රුපියල් මිලියන 2,406) ජාතිය ගොඩනැගීමේ බදු රුපියල් මිලියන 411 ක් (2016 - රුපියල් මිලියන 386), විශේෂ ගාස්තු රුපියල් මිලියන 320 ක් (2016 - රුපියල් මිලියන 533), ඒකාබද්ධ අරමුදලට දායකත්වය රුපියල් මිලියන 5,111 ක් (2016 - රුපියල් මිලියන 12,026) සහ ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය රුපියල් මිලියන 96 ක් (2016 - රුපියල් මිලියන 95) ඇතුළත් වේ.

තැපැල්පති සඳහා සේවා ගාස්තු →

2017 තැපැල්පති සඳහා සේවා ගාස්තු රුපියල් මිලියන 141 ක් 2016 පරිදි එකම පදනම මත වෙන්කර ඇත.

විශ්‍රාම අරමුදල →

රුපියල් මිලියන 489 ක් (2016 - රුපියල් මිලියන 829) දායක නොවන විශ්‍රාම යෝජනා ක්‍රමයකට සුදුසුකම් ලත් සේවකයන් 6423 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදනය කර ඇත (විශ්‍රාම ගිය සේවකයන් ඇතුළුව).

සංස්ථාපිත තිරසාර බව සහ වගකීම →

සංස්ථාපිත සමාජ වගකීම යටතේ කර ගෙන යන වැඩසටහන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 135 සහ 139 පිටුවල දක්වා ඇත.

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම් →

2017 න් අවසන් වූ වසර සඳහා දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම්වල අගය පිළිවෙළින් රුපියල් මිලියන 15,108 ක් සහ රුපියල් මිලියන 959 ක් විය. (2016 දී එය රුපියල් මිලියන 10,188 ක් සහ රුපියල් මිලියන 639 ක් විය.)

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම් (නොනිමි ප්‍රාග්ධන වැඩ ඇතුළුව) අත්පත් කර ගැනීමට බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම වසර තුළ දී රුපියල් මිලියන 1,109 ක් (2016 - රුපියල් මිලියන 750) වූ අතර සමූහය සඳහා රුපියල් මිලියන 1,111 ක් (2016 - රුපියල් මිලියන 751) විය. ඒවායෙහි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 315 සිට 322 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 27 සහ 28 තුළ දී ඇත.

සින්නක්කර දේපලවල වෙළඳපොළ අගය →

"බලපත්‍රලාභී විශේෂිත වූ බැංකුවල නිශ්චල දේපල ප්‍රත්‍යාගණනය" පිළිබඳ 2014 අංක 01 දරන මහ බැංකු නියමයෙහි 3 කොටස සමග අනුකූලව 2017 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයක් සිදු කරන ලදී.

ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය ඉහත නියමය පරිදි ව්‍යාත්තීය සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් සිදු කරන ලදී. සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම් එහි වෙළඳ පොළ අගයට වඩා නොවැඩි බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

වාර්තාකරණ දිනට පසු සිදුවීම් →

ගැළපුම් අවශ්‍ය වන සිදුවීම් කිසිවක් හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල 46 හි හෙළිදරව් කර ඇති ඒවා හැර, ගිණුම්වල හෙළිදරව් කිරීම් වාර්තාකරණ දිනට පසුව සිදුවී නැත.

අවසන් නොකළ නීතිමය කටයුතු →

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ බැංකුවේ නීතිඥවරුන්ගේ අදහස වන්නේ මූල්‍ය ප්‍රකාශනවල 45 සටහනේ හෙළිදරව් කර ඇති බැංකුවට එරෙහි අවසන් නොකළ නඩු ක්‍රියාමාර්ගයන් බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන බවය.

අධ්‍යක්ෂ මණ්ඩලය →

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ මුදල් අමාත්‍යාංශය සහ තැපැල්පති නියෝජනය කරමින් නිල බලයෙන් පත් වූ සාමාජිකයන් දෙදෙනෙක් ඇතුළුව හත් දෙනෙකුගෙන් සමන්විතය. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි 11(1) වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර මුදල් අමාත්‍යවරයා සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරු හතර දෙනා පත් කරයි. වසර තුළ පහත දැක්වෙන පුද්ගලයන් අධ්‍යක්ෂවරුන් වූ අතර ඔවුන් පිළිබඳ ලුහුඬු විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවෙහි 156 පිටුවෙහි දැක්වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	නිල කාලය	තත්ත්වය
අස්වින් ද සිල්වා, සභාපති	2015.02.09 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
ඩී එල් පී ආර් අබේරත්න (නිලබලයෙන්)	2012.02.09 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
සුරංග නාවුල්ලගේ - අධ්‍යක්ෂ	2015.02.09 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
අජිත් පතිරණ - අධ්‍යක්ෂ	2015.03.20 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
ඒ කේ සෙනෙවිරත්න (නිලබලයෙන්)	2015.05.27 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
චන්දිම හේමචන්ද්‍ර - අධ්‍යක්ෂ	2015.11.02 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන
අනිල් රාජකරුණා - අධ්‍යක්ෂ	2015.11.02 දින සිට	ස්වාධීන නොවන/ විධායක නොවන

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ අනෙකුත් ප්‍රතිලාභ →

2017 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ අනෙකුත් ප්‍රතිලාභ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ 40 සටහනෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු →

බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳ සමස්ත වගකීම සහ වගවීම තමන් වෙත භාර ගන්නා අතරම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ විධානයන්ට සහ අනෙකුත් ව්‍යවස්ථාපිත නීති රෙගුලාසි සමග අනුකූල බව සහතික කිරීමට පහත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ද පත් කර ඇත.

අනිවාර්ය අනුකමිටු හතර සහ ඒවායේ සංයුතිය 2017 දෙසැම්බර් 31වන දිනට පහත පරිදිය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව →

ඩී එල් පී ආර් අබේරත්න	සභාපති (2015.11.30 දින සිට)
ඒ කේ සෙනෙවිරත්න	සාමාජික (2015.06.04 දින සිට)
අනිල් රාජකරුණා	සාමාජික (2015.11.30 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තාව අංක 190 සහ 191 පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව →

අස්වින් ද සිල්වා	සභාපති (2015.03.12 දින සිට)
ඩී එල් පී ආර් අබේරත්න	සාමාජික (2015.03.12 දින සිට)
අජිත් පතිරණ	සාමාජික (2015.11.30 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුවෙහි වාර්තාව අංක 193 සහ 194 පිටුවල පිටුවෙහි දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව →

ඩී එල් පී ආර් අබේරත්න	සභාපති (2017.02.03 දින සිට) සාමාජික (2015.11.30 දින සිට 2017.02.03 දින දක්වා)
අස්විත් ද සිල්වා	සභාපති (2017.02.03 දින දක්වා)
අජිත් පතිරණ	සාමාජික (2015.04.30 දින සිට)
ඒ කේ සෙනෙවිරත්න	සාමාජික (2017.02.03 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවෙහි වාර්තාව 195 පිටුවෙහි දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව →

ඒ කේ සෙනෙවිරත්න	සභාපති (2015.11.30 දින සිට
සුරංග නාඋල්ලගේ	සාමාජික (2015.11.30 දින සිට)
චන්දිම හේමචන්ද්‍ර	සාමාජික (2017.08.14 දක්වා)
අනිල් රාජකරුණා	සාමාජික (2017.08.14 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි වාර්තාව 196 හා 197 පිටුවල දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව →

අස්විත් ද සිල්වා	සභාපති (2017.02.03 දින සිට)
අනිල් රාජකරුණා	සාමාජික (2017.02.03 දින සිට 2017.08.14 දින දක්වා)
චන්දිම හේමචන්ද්‍ර	සාමාජික (2017.02.03 දින සිට)
අජිත් පතිරණ	සාමාජික (2017.08.14 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවෙහි වාර්තාව පිටු අංක 198 සහ 199 දක්වා ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටුව →

අස්විත් ද සිල්වා	සභාපති (2017.02.03 දින සිට)
ඩී එල් පී ආර්. අබේරත්න	සාමාජික (2017.02.03 දින සිට)
චන්දිම හේමචන්ද්‍ර	සාමාජික (2017.02.03 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටු පිටු අංක 200 හි දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් →

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටු රැස්වීම් යන ඒවායින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය මෙම වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ (171 පිටුවේ) දැක්වේ.

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව →

සෘජු සහ වක්‍ර යන දෙයාකාරයෙන්ම, අධ්‍යක්ෂවරුන්ගේ බැංකුව සමග වන ගිවිසුම් පිළිබඳ බැඳියාවන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 40 හි දක්වා ඇත. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශ කර ඇත. අධ්‍යක්ෂවරුන් බැංකුව සමග වෙනත් කිසිදු ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳ සෘජු හෝ වක්‍ර බැඳියාවක් නැත.

සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු →

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාළ කර ගන්නා ලද 'සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි, ගනුදෙනු කිසිවක් තිබේ නම් ඒවාද අධ්‍යක්ෂවරුන් හෙළිදරව් කළ යුතුය. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එම ගනුදෙනු, පිළිබඳව වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 40 හි දැක්වේ.

ප්‍රධාන විධායක නිලධාරී (CEO) →

සාමාන්‍යාධිකාරී බැංකුවෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරේ. සාමාන්‍යාධිකාරීවරයාට අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලට පෙනී සිටීමට, සහ සහභාගි වීමට හිමිකම් ඇත.

මානව සම්පත් →

බැංකුව සිය උසස් තත්ත්වයේ සේවාව ඔස්සේ තිරසාර අගය නිර්මාණය කිරීමට කැප වීමෙන් සහ ඉහළ අභිප්‍රේරණයකින් යුතුව කටයුතු කරන සේවකයන්ගේ උන්නතිය සඳහා සහ ඔවුන්ව රඳවා තබා ගැනීමට අඛණ්ඩව ක්‍රියා කරයි. බැංකුවේ මානව ප්‍රාග්ධනයෙහි සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත. මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා බැංකුව විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි 2017 කතාපුවත 108 පිටුවෙහි විස්තර කර ඇත.

පරිසර සංරක්ෂණය →

බැංකුවේ තිරසාර සංවර්ධනයට සහ වර්ධනයට වැදගත් වන පරිසරය ආරක්ෂා කර ගැනීමට සහ වැඩි දියුණු කිරීමට බැංකුව මූලාරම්භයන් ගෙන ඇත. බැංකුව සහ සමූහය පරිසරයට හානිකර හෝ අනතුරුදායක කිසිදු ක්‍රියාකාරකමක නියැලී නැ

ව්‍යවස්ථාපිත ගෙවීම් →

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ තරමට, රජයට සහ සේවකයන් සම්බන්ධව ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට සැහීමට පත් වෙයි.

අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධති →

අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. මෙම අරමුණ සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවෙහි ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධති ස්ථාපිත කොට ක්‍රියාත්මක කරනු ලබයි. බැංකුව මුහුණදිය හැකි අවදානම් අවම කිරීමට සහ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ හෝ අලාභ වලින් වැළකීමේ සාධාරණ තහවුරුවක් සැපයීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති ප්‍රතිනිර්මාණය කර ඇත. බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම, ගණනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දිගටම සිදු කර ගෙන යන ක්‍රියාවලියක් ඇත. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගෙන ඇති විශේෂිත ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ 201 සිට 238 දක්වා පිටුවල දක්වා ඇත.

ආයතනික යහපාලනය →

බැංකුවේ කළමනාකාරිත්වය තුළ, අධ්‍යක්ෂවරුන් හොඳම සංස්ථාපිත පාලන පරිචයන් සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලවීම සඳහා අවධාරණය යොමුකර ඇත. ඒ අනුව, වරින් වර අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට සහ ගිණුම් කටයුතුහාවය සහ පාරදෘශ්‍යතාව ඉහළ නැංවීමට පද්ධති සහ ව්‍යුහයන් හඳුන්වා දී/වැඩිදියුණු කර ඇත.

නීතිරීති, රෙගුලාසි සහ ආරක්ෂණ අවශ්‍යතා සමග අනුකූල වීම →

බැංකුව සියලු අවස්ථාවලදී එය ජාතික ඉතිරිකිරීම් බැංකු පනත සහ අනෙකුත් සියලු අදාළ විය හැකි නීති රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතා සමග අනුකූල වී ඇත.

රජයේ ඇප වීම →

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කරනු ලබන මුදල් හා ඒ මත ඉපැයෙන පොළිය ආපසු ගෙවන බවට ශ්‍රී ලංකා රජය සහතික වේ.

විගණකවරුන් →

2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



අස්චින් ද සිල්වා
සභාපති



එම් ඒ පී මුහන්දිරම්
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2018 මාර්තු 12 දින
කොළඹදී.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි අනුබද්ධිත ආයතනයද ඇතුළත්ව සමස්ථ බැංකු සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන වගකීම මෙයින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන

බැංකුව සහ එහි අනුබද්ධිත සමාගම විසින් ඒවාට අදාළ සියලුම ගනුදෙනු නිවැරදිව ගිණුම් තැබීම සිදු කරන බවටත් බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම් තැබීමේ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූල වන ආකාරයට පිළියෙළ කරන බවටත් අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුව යමින් මෙම ප්‍රකාශන, බැංකුව සහ එහි පරිපාලිත සමාගම පිළිබඳ සෑම වර්ෂ අවසානයකම සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් ආදිය ඇතුළත් වේ.

බැංකුවේ සහ එහි අනුබද්ධිත ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන මගින් පහත කරුණු සම්බන්ධ සාධාරණ හෙළිදරවුවක් සිදු කෙරේ:

1. 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි අනුබද්ධිත ආයතනයේ මූල්‍ය තත්ත්වය,
2. 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන බැංකුවේ සහ එහි අනුබද්ධිත සමාගමේ මූල්‍ය කාර්යසාධනය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත කරුණු පිළිබඳව සහතිකවීම අත්‍යාවශ්‍ය.

1. මෙහි 265 සිට 370 පිටු දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා ගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති දැනට පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව ප්‍රමාණවත් වන බව සහ මෙකී ප්‍රතිපත්ති නොවෙනස්ව භාවිත කොට ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර ඇති බව.
2. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගනුදෙනුවල ස්වභාවය සහ මූලාංග නිසි පරිදි නිරූපණය වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ හා විචක්ෂණශීලී තීරණයන්ට එළැඹුණු බව.
3. අදාළ වන සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තී නිසි පරිදි අනුගමනය කර ඇති බව.

1971 අංක 38 දරන මුදල් පනතේ, 1988 අංක 30 දරන බැංකු කටයුතු පනතේ සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව බැංකුවෙහි කාර්යයන් හා එහි ව්‍යාපාර කටයුතුවල පරිපාලනය හා පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

බැංකුවේ සහ එහි අනුබද්ධිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති නියමිත ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

තවද, ඕනෑම අවස්ථාවක බැංකුවේ මූල්‍ය තත්ත්වය නිවැරදිව ඉදිරිපත් කළහැකි පරිදි බැංකුව විසින් නිරවද්‍ය ගිණුම් සටහන් නිසි ලෙස පවත්වාගෙනයන බවට තහවුරු කර ගැනීමේ වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

මීට අමතරව, මෙම වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධතාව සහ විෂය මූලික බව සම්බන්ධයෙන් වගකීමද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. (මෙහි 256 පිටුවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන). 2017 වසරට සඳහා වන මෙම වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ඒවාට අදාළ ගිණුම්කරණ පොත් හා අනුකූල වන අතර ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ 1988 අංක 30 දරන බැංකු පනත යන විධානයන්ට අනුකූලව සකස් කර ඇත.

අභ්‍යන්තර පාලන

බැංකුවේ සහ සමූහයේ වත්කම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය සාධාරණ ලෙස ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීම, වංචනික ක්‍රියා සහ වෙනත් අක්‍රමිකතා හඳුනා ගැනීමට ප්‍රමාණවත් සඵලදායි සහ විස්තර සහිත අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම මෙන්ම එම පද්ධතිවල ඵලදායිතාව නිරීක්ෂණය කිරීමට අභ්‍යන්තර විගණනයද ඇතුලත්ව ඵලදායි පද්ධති ස්ථාපිත කිරීමද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා තමන් විසින් සෘජුවම සමාලෝචනය කරන ලද බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මෙම වාර්ෂික වාර්තාවේ 250 පිටුවෙහිද, බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකවරුන්ගේ සහතිකවීමේ වාර්තාව 252 පිටුවෙහිද දැක්වේ.


විගණකාධිපති වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලු වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සුදුසු යැයි ඔවුන් සලකන සියලු පරීක්ෂා කිරීම් සිදු කිරීමට සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් එම අවශ්‍ය පරීක්ෂා කිරීම් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ මතය ඔහු විසින් වාර්තා කළ පරිදි මෙම වාර්ෂික වාර්තාවෙහි 255 පිටුවේ දක්වා ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමේ සහ විශ්වාසයේ තරමට බැංකුව විසින් බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධව ගෙවිය යුතු සියලු බදු, සහ වෙනත් සියලු දන්නා ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් රජයට සහ අනෙකුත් අදළ නියාමන සහ ව්‍යවස්ථාපිත ගෙවීම් වාර්තා කරන දිනට ගෙවා ඇති බව හෝ අදළ තැනදී වෙන් කර ඇති බව තහවුරු කරයි. තවද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ සුරුකුම්පත් සහ විනිමය කොමිසන් සභාව ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික පාලන සංග්‍රහය අනුව සලකා බැලිය යුතු මූල්‍ය තත්වය මෙහෙයුම් කොන්දේසි නෛතික සහ අනෙකුත් කරුණු සලකා බැලීමෙන් අනතුරුව බැංකුව හා සමූහයට නුදුරු අනාගතයක් දක්වා මෙහෙයුම් කටයුතු සිදු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් පවතින බැවින් අඛණ්ඩ පදනම් සංකල්පය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කර ඇත. තවද ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති සියලුම විධිවිධාන වලට අනුකූල බව නිර්ණය කිරීමට අවශ්‍ය සියලුම පියවර ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



එම්. ඒ. පී. මුහන්දිරම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2018 මාර්තු 12
කොළඹදී

මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

මෙම වාර්තාව බැංකු පනතේ 2007 අංක 12 දරන නියෝගයේ, 3 (8) (11) (ආ) වගන්තිය සමග අනුකූලව නිකුත් කර ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ මත පදනම්ව පිළියෙළ කර ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමාණවත් තරම් සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. කෙසේවුවද එවැනි පද්ධතියක් සැලසුම් කරනුයේ පිළිගත හැකි අවදානම් පරාමිතීන් තුල පිහිටා බැංකුවේ වඩා වැදගත් අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණයට විනා බැංකුවේ ව්‍යාපාර අරමුණු මුදුන් පමුණුවා ගැනීමට අපොහොසත්වීමේ අවදානම් දූරු කිරීමට නොවේ. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතීන් මගින් සැපයිය හැකිවන්නේ මූල්‍ය වංචා හෝ අලාභ වලට එරෙහි හෝ කළමනාකරණ හා මූල්‍ය තොරතුරු හා වාර්තාවල ඇති ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වලට එරෙහි පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම ගණනය කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා දිගටම ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇති අතර මෙම ක්‍රියාවලියට ව්‍යාපාර පරිසරයට හෝ නියාමන අවශ්‍යතාවලට සහ අනෙකුත් මාර්ගෝපදේශවල වෙනස් කිරීම් ඇති පරිදි සහ ඇති විට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළත්ය. මෙම ක්‍රියාවලි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සමග අනුකූල බව තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය එම මාර්ගෝපදේශයෙහි දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ මූලධර්ම සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීමට තරම් යහපත් සහ ප්‍රමාණවත් බවද අභ්‍යන්තර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම සහ පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට, බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම, සහ මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, මෙහෙයවීම සහ නිරීක්ෂණය කිරීම මගින් සහාය වෙයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීතාව වරින්වර සමාලෝචනය කිරීමේ පද්ධතියද මණ්ඩලය විසින් පිහිටුවනු ලැබ තිබේ. ඒ මගින් ක්‍රියාත්මක වන ක්‍රියාවලීන් අතර මූලික වන්නේ පහත සඳහන් ක්‍රියාවලීන්ය.

- බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය තහවුරු කිරීමටත්, අනුමත ආයතනික අරමුණු, උපාය මාර්ග, ප්‍රතිපත්තීන් හා ව්‍යාපාර මඟ පෙන්වීම් අනුව බැංකුවේ මෙහෙයුම් සිදුවන බවටත් වගබලා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවනු පිණිස නිශ්චිතව දක්වන ලද ක්ෂේත්‍ර හා කාර්යභාර්යන් සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ අභ්‍යන්තර විගණක අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන ගැටලු වරින්වර සමාලෝචනය කරනු ලබන අතර, එම අඩුපාඩු නිවැරදි කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනියි. බැංකුවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. රජයේ විගණන අධිකාරී වෙත සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
- විගණනයෙහි විෂයපථය සහ ගුණාත්මක බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 190 පිටුවෙහි ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ 2017 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික විගණන සැලසුම පරිදි ශාඛාවල, අංශවල සහ අනෙකුත් ඒකකවල විගණනය සිදු කරයි. විගණනය කරන වාර ගණන තක්සේරු කළ අවදානම් මට්ටම අනුව තීරණය කෙරේ. විගණන සැලසුම සමාලෝචනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සපයනු ලබයි. අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව සහතික කිරීමට විගණන පරීක්ෂා සිදු කරන අතර කිසියම් හෝ අනුකූලතාවක් නොවූ අවස්ථාවන් මතුවූ විට ඒ සම්බන්ධව එහි සොයාගැනීම් වාර්තා කරයි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීමට විගණන සිදු කෙරේ. විගණන වාර්තා මගින් සොයා ගනු ලබන කරුණු සමාලෝචනය සඳහා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කෙරෙයි. කමිටු රැස්වීම්වල සටහන් සමගින්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වාර්තා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ ප්‍රධාන අවදානම්හි සමස්ත කළමනාකරණය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. බැංකුවෙහි ක්‍රියාකාරකම් අදාළ නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස්වලට අනුකූලව සිදු කරන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක්ද ස්ථාපනය කර ඇති අතර, අනුකූල නොවීම පිළිබඳ යම්

ගැටලු, කාලීනව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් තක්සේරුව පිළිබඳ වාර්තාව ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව විසින් කාලීනව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

- බැංකුවේ එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වලදී බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණ සහ අධීක්ෂණය සහතික කිරීමට කළමනාකරණ මට්ටමේ කමිටු ද නිසි සවිබලගැන්වීමක් සමගින් ක්‍රියාත්මකව ඇත. මෙම ඇගයීම් මගින් බැංකුව විසින් යොදන ක්‍රියාවලි පමණක් ආවරණය කරන අතර එහි පරිපාලිතය විසින් කරගෙන යන ක්‍රියාවලී ආවරණය නොකරයි.

2012 වර්ෂයේදී බැංකුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් වලින් සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ආදේශ කර ගන්නා ලදී. එබඳු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ආදේශ කර ගැනීමේ පටන් හඳුනාගැනීම, මිනීම, වර්ගීකරණය හා හෙළිදරව් කිරීම යන අවශ්‍යතා හා අනුකූල වීම උදෙසා ක්‍රියාවලීන් අබණ්ඩව අධීක්ෂණය හා ක්‍රම ක්‍රමයෙන් වැඩිදියුණු කිරීම සිදු විණි. 2018 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ඇරඹෙන මූල්‍ය වාර්තාකරණ කාලසීමා සඳහා අදාළ ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 - මූල්‍ය උපකරණවල බලපෑම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිලිමත් අවධානයක් යොමු කොට ඇත. ල.ගි.ප්‍ර. 39 යටතේ මින් පෙර උපයෝගී කරගත්, දැරීමට සිදුවන ණය පාඩු ආකෘතියට සාපේක්ෂව අපේක්ෂිත ණය පාඩු ආකෘතිය භාවිතයේදී මූල්‍ය උපකරණ මත ඇතිවන හානිකරණ ගණනය කිරීමේදී මෙමගින් සැලකියයුතු බලපෑමක් ඇති වේ. ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර උපදේශක සහාය බැංකුව විසින් ලබාගෙන ඇත. ඒ අනුව ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 සඳහා නිර්ණය අවධිය (මූලික බලපෑම ඇගයීමේ අභ්‍යාසය) සහ ක්‍රියාත්මක කිරීමේ අවධිය (විසඳුම් සංවර්ධන) යන කටයුතු සිදුකර ඇත. ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කළහැකි ආකාරය පිළිබඳ සැලකියයුතු විශ්ලේෂණයක් සිදු කිරීමට බැංකුව විසින් කටයුතු කර ඇති අතර, ඒ අනුව යාවත්කාලීන ගිණුම්කරණ ප්‍රතිපත්තිමය තීරණ ද ගෙන ඇත.

තහවුරු කිරීම →

ඉහත ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳව සාධාරණ සහතිකයක් සැපයීමට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කරඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.


බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කිරීම →

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය බාහිර විගණකවරුන් විසින් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ඇත. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත පදනම්වූ ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 252 පිටුවෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



අස්වින් ද සිල්වා
සභාපති



ඩී. එල්. පී. ආර්. අබේරත්න
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/අධ්‍යක්ෂ



සුරංග නාඋල්ලගේ
අධ්‍යක්ෂ

2018 මාර්තු 12 දින
කොළඹ දී

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. BAF/A/NSB/2017/29

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 27 April 2018

සභාපති

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකවීමේ වාර්තාව

හැඳින්වීම →

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ("ප්‍රකාශය") පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ.

කළමනාකාරීත්වයේ වගකීම →

2007 අංක 12 දරන බැංකු පනත නියෝගයේ 3 (8) (ii) (බී) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශය" ට අනුව ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිති (ශ්‍රී ලං.ස.කා.ප්‍ර.) 3050 ට අනුකූලවීම →

සිදුකරන ලද පරීක්ෂණ මත පදනම්ව මෙම ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයට අදාළ බැංකු ආයතනය සඳහා සහතිකවීමේ වාර්තාව ශ්‍රී .ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් සිදුකරන ලදී.

ඉටුකළ කාර්යයේ සාරාංශය →

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන යන දෙඅංශය මඟින් තහවුරු වන්නේද සහ බැංකුව සඳහා වූ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය මැනවින් පිළිබිඹු කරන්නේ ද යන්න ඇගයීම සඳහා මෙම කාර්යභාරය සිදු කරන ලදී.

ඉටුකරන ලද ක්‍රියාපටිපාටීන්, නියැදි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලි සඳහා උපකාරීවන ලිපිලේඛන මත මූලික වශයෙන් සීමා වේ.

මෙම ප්‍රකාශය තුළින් සියලු අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියාපටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංගයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියාකිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා පිළියම් ලැබේදැයි යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

නිගමනය →

උපයෝගී කරගන්නා ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්වූ, බැංකුවේ මූල්‍ය වාර්තාකරණයට අදාළව අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා එහි ඵලදායීතාවය පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගත් ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධයත් වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශයත් අතර නොගැලපීමක් ඇති බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම් පිළිබඳ ප්‍රකාශය

2017.12.31 දිනට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිතයේ (සමූහයේ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, පහත සඳහන් අවශ්‍යතා හා උපදෙස් වලට අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කර ඇත.

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1971 අංක 38 දරන මුදල් පනත
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතීන් (SLFRSs) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKASs)
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත
- 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය ප්‍රකාශන ආකෘති සහ තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳ නියෝග
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ විශිෂ්ට යහ පරිචයන් ඇතුළත් සංග්‍රහයේ විධානයන්.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 12 දරන පනතේ විධානයන්.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදාගන්නා ලද නිරූපිත ආකෘති සහ සිදුකරන ලද හෙළිදරව් කිරීම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද නිශ්චිත ආකෘති හා අනුකූල වන අතර, 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (LKAS-1) යටතේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ටද අනුකූල වේ.

සමූහය විසින් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංඝතභාවයකින් යුතුව යොදා ගන්නා ලදී. ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණතාවක් සහිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තුවල යොදු ගැනීම බැංකුවේ බාහිර විගණකවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග අනුකූල වීම හා සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් බැහැරවීම් වලදී අවශ්‍ය සෑම විටම සංසන්දනාත්මක තොරතුරු යළි වර්ගීකරණය කර ඇති අතර, එවැනි යළි වර්ගීකරණයන් ඇත්නම් ඒවා විස්තරාත්මකව හෙළිදරව් කර ඇත.

අපි අපගේ උපරිම දැනුමේ තරමට අනුව මෙම වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු, සලකා බලන කාලරිච්ඡේදයට අදාළව සමූහයේ මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ යන සියළුම වැදගත් අංශයන් සාධාරණව නිරූපණය කරන බව තහවුරු කරමු. එමෙන්ම අපි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමූහය සතුව පවතින බවටද මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගෙන ඇති බවටද තහවුරු කරන්නෙමු.

බැංකුවේ සහ එහි පරිපාලිතයේ අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ, සහ පවත්වාගෙන යාමේ වගකීම අප සතුය. වත්කම් සුරක්ෂිත කිරීම, වංචා සහ/හෝ දෝෂ මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ හෙළිදරව් කිරීම හා එකී පාලනයන් සමාලෝචනය කිරීම ඇගයීම හා කාලීනව යාවත්කාලීන කිරීම පිණිස සමූහයට අදාළ වැදගත් තොරතුරු අපහට දැන ගැනීමට හැකි ලෙස තහවුරු කරමින් ඵලදායී අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි නිසි ලෙස පිහිටුවා ඇති බව අපි සහතික කරමු. අපගේ දැනුමට අනුව අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටීන්හි සැලසුම් කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු අඩුලුහුඬුකම් සහ දුර්වලතා නොමැති බවට සහ කළමනාකරණ හෝ අනෙකුත් සේවකයන් සම්බන්ධිත වංචා සිදු නොවූ බවට අපි සැහීමට පත් වෙමු. අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි නිරතුරුව අනුගමනය කරන බව තහවුරු කර ගැනීමට බැංකුවේ අභ්‍යන්තර විගණක අංශය කලින් කලට සමාලෝචනයන් සිදු කරයි.

මූල්‍ය වාර්තාකරණය තුළ අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 250 හි දක්වා ඇත. විගණකාධිපති විසින් බැංකුවේ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනයෙහි කාර්යක්ෂමතාවය විගණනයට භාජනය කර එය පිළිබඳව තත්වාගණනය නොකල මතයක් ඉදිරිපත් කර ඇති අතර එය පිටු අංක 252 හි දක්වා ඇත.

බැංකුවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කර ඇත. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ විගණකාධිපති වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 255 හි ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනෙක් කරුණුද සමඟින්, සියලුම අභ්‍යන්තර විගණන සහ විමර්ශන වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාපටිපාටීන්වල කාර්යක්ෂමතාව සමාලෝචනය කරන ලද අතර වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්ට දැක්වූ අනුකූලතාවයද සමාලෝචනය කළ අතර, එහි විස්තර මෙම වාර්තාවේ පිටු අංක 190 සිට 191 දක්වා විගණන කමිටු වාර්තාවේ ඇත. පරිපූර්ණ ස්වාධීන බව තහවුරු කරනු පිණිස විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන්හට, වැදගත් ඕනෑම කරුණක් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටු සාමාජිකයන් හමුවීමේ පූර්ණ සහ නිදහස් ප්‍රවේශය ඇත. කෙසේ වුවද, ඕනෑම අභ්‍යන්තර පාලන සහ ගිණුම්කරණ පද්ධතියක් මගින් සපයන සහතිකවීම ඇගයීමේ දී එම පද්ධතිවල පවතින ආවේණික සීමාවන් හඳුනාගත යුතුය.

අපගේ උපරිම දැනීමේ තරමට අනුව පහත කරුණු තහවුරු කරන්නෙමු.

- බැංකුව සහ සමූහය සියලු අදාළ විය හැකි නීති සහ රෙගුලාසි සහ මාර්ගෝපදේශ සමඟ අනුකූල වී ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල 351 පිටුවේ 45 සටහනේ හෙළිදරව් කර ඇති කරුණු හැරුණු කොට සමූහයට එරෙහි සැළකිය යුතු නඩු පැවරීම් නොමැත.
- සැළකිය යුතු අනුකූල නොවීමේ අවස්ථා නොමැත.
- බැංකුව සහ සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු, අය බදු සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු වන බදු හා සියලු දායක මුදල් 2017 දෙසැම්බර් 31 වන දිනට ගෙවා ඇති බවට හෝ අදාළ අවස්ථාවලදී වෙන් කිරීම් කර ඇති බවත්ය.

එස් ඩී එන් පෙරේරා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

කේ බී විජයරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල් සහ සැලසුම්)

2018 මාර්තු 12 දින
කොළඹ

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. BAF/A/NSB/FA/2017/22 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 14 March 2018

සභාපති,

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ එහි පරිපාලිතයෙහි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමේද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මතය - බැංකුව

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය - සමූහය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නෛතික හා නියාමන කරුණු පිළිබඳ වාර්තා

1988 අංක 30 දරන බැංකු පනත සහ එම පනතට පසුව සිදුකරන ලද සංශෝධනයන් අනුව අවශ්‍ය තෙරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කර තිබුණි.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	බැංකුව 2017 රු. '000	බැංකුව 2016 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2017 රු. '000	සමූහය 2016 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	3	**107,816,909**	87,399,144	23	**108,055,746**	88,038,610	23
පොළී ආදායම		**103,399,962**	86,390,039	20	**104,245,541**	87,142,784	20
අඩු කළා: පොළී වියදම		**78,444,825**	60,923,221	29	**78,987,596**	61,453,898	29
ශුද්ධ පොළී ආදායම	4	**24,955,137**	25,466,818	(2)	**25,257,945**	25,688,886	(2)
ගාස්තු සහ කොමිස් ආදායම		**782,776**	650,164	20	**785,077**	651,160	21
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		**109,082**	137,432	(21)	**113,037**	140,122	(19)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	5	**673,694**	512,732	31	**672,040**	511,038	32
වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	6	**1,206,408**	(39,270)	3,172	**1,520,740**	(136,897)	1,211
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	7	–	–	–	–	–	–
මූල්‍ය ආයෝජනයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(අලාභ)	8	**707,491**	40,923	1,629	**707,491**	40,923	1,629
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	9	**1,720,272**	357,288	381	**796,897**	340,640	134
මුළු මෙහෙයුම් ආදායම		**29,263,002**	26,338,490	11	**28,955,113**	26,444,590	9
අඩු කළා: ණය සහ අනෙකුත් අලාභ හානිකරණය	10	**693,233**	(99,693)	795	**693,233**	(99,693)	795
ශුද්ධ මෙහෙයුම් ආදායම		**28,569,769**	26,438,183	8	**28,261,880**	26,544,283	6
අඩු කළා: වියදම්							
සේවක මණ්ඩල වියදම්	11	**6,886,505**	6,235,370	10	**6,918,813**	6,266,515	10
වෙනත් වියදම්	12	**4,160,911**	4,108,538	1	**4,107,116**	4,068,918	1
එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලට පෙර මෙහෙයුම් ලාභය		**17,522,354**	16,094,275	9	**17,235,951**	16,208,850	6
අඩු කළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු		**3,082,619**	2,405,618	28	**3,168,299**	2,423,091	31
මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු		**411,016**	385,670	7	**422,440**	388,482	9
එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලට පසු මෙහෙයුම් ලාභය		**14,028,719**	13,302,987	5	**13,645,212**	13,397,277	2
ආදායම් බදු පෙර ලාභය		**14,028,719**	13,302,987	5	**13,645,212**	13,397,277	2
අඩු කළා: ආදායම් බදු වියදම	13	**4,419,019**	3,805,271	16	**4,595,065**	3,834,995	20
වර්ෂය සඳහා ලාභය		**9,609,700**	9,497,716	1	**9,050,147**	9,562,282	(5)
ලාභය බෙදී යන ආකාරය							
බැංකුවේ හිමිකරුවන්		**9,609,700**	9,497,716	1	**9,050,147**	9,562,282	(5)
වර්ෂය සඳහා ලාභය		**9,609,700**	9,497,716	1	**9,050,147**	9,562,282	(5)
ලාභය මත කොටසක ඉපයීම							
සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.)	14	**15.50**	29.68	(48)	**14.60**	29.88	(51)
සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.)		**15.50**	29.68	(48)	**14.60**	29.88	(51)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	බැංකුව 2017 රු. '000	බැංකුව 2016 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2017 රු. '000	සමූහය 2016 රු. '000	සමූහය වෙනස %
වර්ෂය සඳහා ලාභය		**9,609,700**	9,497,716	1	**9,050,147**	9,562,282	(5)
වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු							
ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්							
මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් මත ශුද්ධ ලාභ සහ අලාභ		**290,074**	(137,256)	311	**290,074**	(137,256)	311
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් නැවත අගය කිරීමෙන් ලැබූ ශුද්ධ ලාභ/(අලාභ)		**656,807**	(299,996)	319	**822,050**	(402,955)	304
ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් විකිණීමෙන් ලද සාධාරණ වටිනාකම මත ලාභය		**(690,388)**	46,952	(1,570)	**(690,388)**	46,952	(1,570)
ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කළ යුතු වෙනත් මුළු විස්තීර්ණ ආදායම		**256,492**	(390,300)	(166)	**421,735**	(493,259)	(185)
ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්							
දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත ශුද්ධ ලාභ/(අලාභය)		**4,508,480**	–	100	**4,508,480**	–	100
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ජීවගණක ඇගයීම් ලාභය/(අලාභය)		**(2,072,425)**	2,379,307	(187)	**(2,072,155)**	2,379,640	(187)
ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් මුළු විස්තීර්ණ ආදායම්		**2,436,055**	2,379,307	2	**2,436,325**	2,379,640	2
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු		**2,692,547**	1,989,007	35	**2,858,060**	1,886,381	52
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**12,302,247**	11,486,723	7	**11,908,207**	11,448,663	4
ලාභය බෙදී යන ආකාරය							
බැංකුවේ හිමිකරුවන්		**12,302,247**	11,486,723	7	**11,908,207**	11,448,663	4
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**12,302,247**	11,486,723	7	**11,908,207**	11,448,663	4

265 පිටුවේ සිට 370 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.


මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව			සමූහය		
		2017 රු. '**000**	2016 රු. '000	වෙනස %	**2017** රු. '**000**	2016 රු. '000	වෙනස %
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	16	**3,849,627**	4,619,699	(17)	**3,854,086**	4,627,629	(17)
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	**–**	–	–	**94**	477	(80)
බැංකුවල ඇති තැන්පතු	18	**23,438,104**	19,013,572	23	**23,438,104**	19,013,572	23
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	**1,360,714**	2,728,445	(50)	**1,360,714**	2,728,445	(50)
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	20	**6,472,314**	20,290,588	(68)	**9,389,950**	27,303,207	(66)
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	21	**–**	–	–	**–**	–	–
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	22	**27,714,565**	31,834,072	(13)	**27,971,234**	31,834,072	(12)
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	23	**360,309,866**	291,976,942	23	**358,766,093**	291,178,121	23
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	24	**5,693,829**	6,227,764	(9)	**7,713,852**	8,122,516	(5)
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	25	**544,273,077**	505,824,398	8	**547,924,390**	507,624,954	8
පාලිත සමාගම්වල ආයෝජන	26	**900,000**	150,000	500	**–**	–	–
දේපල, පිරියත සහ උපකරණ	27	**12,015,376**	7,119,651	69	**12,018,679**	7,121,823	69
අස්පෘශ්‍ය වත්කම්	28	**380,308**	157,271	142	**380,655**	157,271	142
විලම්බිත බදු වත්කම්	29	**–**	–	–	**–**	588	(100)
වෙනත් වත්කම්	30	**25,695,689**	21,761,440	18	**25,976,944**	21,890,777	19
මුළු වත්කම්		**1,012,103,470**	911,703,842	11	**1,018,794,797**	921,603,453	11
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	31	**180,439**	115,391	56	**828,433**	2,858,673	(71)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	**956,937**	–	100	**956,937**	–	100
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	32	**737,212,640**	657,280,315	12	**737,212,640**	657,280,315	12
වෙනත් ණය ගැනීම්	33	**217,955,777**	207,039,909	5	**222,771,969**	212,629,427	5
ප්‍රවර්තන බදු වගකීම්		**–**	–	–	**137,344**	17,153	701
විලම්බිත බදු වගකීම්	29	**507,063**	416,180	22	**507,138**	416,180	22
වෙනත් වගකීම්	34	**9,062,425**	8,600,056	5	**9,107,460**	8,608,506	6
යටත්කාලීන වගකීම්	35	**6,006,411**	6,006,411	–	**6,006,411**	6,006,411	–
මුළු වගකීම්		**971,881,692**	879,458,262	11	**977,528,332**	887,816,665	10
හිමිකම							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	36	**6,700,000**	6,200,000	8	**6,700,000**	6,200,000	8
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	37	**3,002,952**	2,522,467	19	**3,002,952**	2,522,467	19
රඳවාගත් ඉපයීම්		**2,228,885**	2,379,307	(6)	**2,805,727**	3,708,614	(24)
වෙනත් සංචිත	38	**28,289,941**	21,143,806	34	**28,757,786**	21,355,707	35
අයිතිකරුවන්ගේ මුළු හිමිකම		**40,221,778**	32,245,580	25	**41,266,465**	33,786,788	22
මුළු හිමිකම		**40,221,778**	32,245,580	25	**41,266,465**	33,786,788	22
මුළු හිමිකම් සහ වගකීම්		**1,012,103,470**	911,703,842	11	**1,018,794,797**	921,603,453	11
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	39	**18,320,312**	24,970,060	(27)	**18,320,312**	24,970,060	(27)

265 පිටුවේ සිට 370 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

සහතික කිරීම

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.




කේ. බී. විජයරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.



අස්වින් ද සිල්වා
සභාපති



ඩී. එල්. පී. ආර්. අබේරත්න
අධ්‍යක්ෂ



එස්. ඩී. එන්. පෙරේරා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2018 මාර්තු 12 දින
කොළඹ දී

හිමිකමේ වෙනස්වීම දක්වන ප්‍රකාශය

බැංකුව →

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000	
2016 ජනවාරි 01 දිනට ශේෂය	3,200,000	2,047,581	3,296,565	
2016 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	–	–	–	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
කාලපරිච්ඡේදය තුළ සංචිත වලට මාරුකිරීම්	–	474,886	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්/නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	3,000,000	–	–	
හිමිකරුවන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	3,000,000	474,886	–	
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,200,000	2,522,467	3,296,565	
2017 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු)	–	–	4,508,480	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	4,508,480	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
කාලපරිච්ඡේදය තුළ සංචිත වලට මාරුකිරීම්	–	480,485	(11,728)	
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්/නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	500,000	–	–	
හිමිකරුවන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	500,000	480,485	(11,728)	
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,700,000	3,002,952	7,793,317	

→

	විකිණීම සඳහා පවතින සංචිතය	ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය	වෙනත් සංචිත	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
	1,631,862	139,106	22,108,709	–	32,423,827
	–	–	–	9,497,716	9,497,716
	(253,044)	(137,256)	–	2,379,307	1,989,007
	(253,044)	(137,256)	–	11,877,023	11,486,723
	–	–	(3,098,147)	2,623,262	–
	–	–	–	(12,026,000)	(12,026,000)
	–	–	–	(94,977)	(94,977)
	–	–	(2,543,992)	–	456,008
	–	–	(5,642,139)	(9,497,716)	(11,664,969)
	1,378,818	1,850	16,466,570	2,379,307	32,245,580
	–	–	–	9,609,700	9,609,700
	(33,581)	290,074	–	(2,072,425)	2,692,547
	(33,581)	290,074	–	7,537,274	12,302,247
	–	–	2,000,000	(2,480,485)	(11,728)
	–	–	–	(5,111,114)	(5,111,114)
	–	–	–	(96,097)	(96,097)
	–	–	392,891	–	892,891
	–	–	2,392,891	(7,687,696)	(4,326,048)
	1,345,237	291,924	18,859,461	2,228,885	40,221,778

සමූහය →

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000	
2016 ජනවාරි 01 දිනට ශේෂය	3,200,000	2,047,581	3,296,565	
2016 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	–	–	–	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
කාලපරිච්ඡේදය තුළ සංචිත වලට මාරුකිරීම්	–	474,886	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්/නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	3,000,000	–	–	
හිමිකරුවන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	3,000,000	474,886	–	
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,200,000	2,522,467	3,296,565	
2017 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	–	–	4,508,480	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	4,508,480	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
කාලපරිච්ඡේදය තුළ සංචිත වලට මාරුකිරීම්	–	480,485	(11,728)	
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ලාභාංශ මත රඳවා ගැනීමේ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්/නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	500,000	–	–	
හිමිකරුවන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	500,000	480,485	(11,728)	
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,700,000	3,002,952	7,793,317	

265 පිටුවේ සිට 370 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

	විකිණීම සඳහා පවතින සංචිතය රු. '000	ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	රඳවාගත් ඉපැයුම් රු. '000	මුළු හිමිකම රු. '000
	1,452,761	139,106	22,582,817	1,285,911	34,004,744
	–	–	–	9,562,282	9,562,282
	(356,003)	(137,256)	–	2,379,640	1,886,381
	(356,003)	(137,256)	–	11,941,922	11,448,663
	–	–	(3,078,293)	2,603,408	–
	–	–	–	(12,027,650)	(12,027,650)
	–	–	–	(94,977)	(94,977)
	–	–	(2,543,992)	–	456,008
	–	–	(5,622,285)	(9,519,219)	(11,666,619)
	1,096,758	1,850	16,960,532	3,708,614	33,786,788
	–	–	–	9,050,147	9,050,147
	131,662	290,074	–	(2,072,155)	2,858,060
	131,662	290,074	–	6,977,992	11,908,207
	–	–	2,090,699	(2,571,184)	(11,728)
	–	–	–	(5,111,114)	(5,111,114)
	–	–	–	(102,483)	(102,483)
	–	–	–	(96,097)	(96,097)
	–	–	392,891	–	892,891
	–	–	2,483,590	(7,880,878)	(4,428,531)
	1,228,420	291,924	19,444,122	2,805,727	41,266,465

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2017 රු. '000	බැංකුව 2016 රු. '000	සමූහය 2017 රු. '000	සමූහය 2016 රු. '000
මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ					
බදු පෙර ලාභය		**14,028,719**	13,302,987	**13,645,212**	13,397,277
ගැලපීම්					
බදු පෙර ලාභයේ ඇතුළත් මූල්‍ය නොවන අයිතමයන්	42	**(1,176,426)**	1,153,639	**(731,037)**	1,271,628
මෙහෙයුම් වත්කම් වල සිදු වූ වෙනස්වීම්	43	**(90,981,284)**	(54,762,416)	**(88,112,777)**	(56,499,933)
මෙහෙයුම් වගකීම් වල සිදු වූ වෙනස්වීම්	44	**81,073,681**	61,611,498	**79,015,251**	64,316,597
බැංකුවල ඇති තැන්පතු		**(4,424,532)**	(6,387,063)	**(4,424,532)**	(6,387,063)
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවූ දායක මුදල		**(881,812)**	(1,390,261)	**(881,812)**	(1,390,261)
ගෙවූ බදු		**(4,328,136)**	(3,893,514)	**(4,383,329)**	(4,005,853)
යටත්කාලීන ණය මත පොළී වියදම්		**780,000**	–	**780,000**	–
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම		**(87,253)**	(104,375)	**(87,253)**	(104,375)
පාලිත සමාගම්වල ආයෝජනය මගින් ලද ලාභාංශ ආදායම		**(172,350)**	(14,850)	–	–
මෙහෙයුම් කටයුතු සඳහා යොදවන ලද ශුද්ධ මුදල්		**(6,169,393)**	9,515,645	**(5,180,277)**	10,598,017
ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ					
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්		**(730,492)**	(450,150)	**(732,376)**	(450,732)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල්		**7,189**	1,948	**7,189**	1,948
විකිණීම සඳහා ඇති ආයෝජනවල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		**1,228,954**	(2,052,611)	**1,268,928**	(2,029,052)
ශුද්ධ අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම්		**(319,428)**	(134,926)	**(319,828)**	(134,926)
හිමිකම් නොපෑ සංචිත අරමුදලෙහි වැඩිවීම/(අඩුවීම)		**(49,054)**	456,008	**(49,054)**	456,008
පාලිත සමාගම්හි ආයෝජනය මගින් ලද ලාභාංශ ආදායම		**172,350**	14,850	–	–
ආයෝජන කටයුතු (වල යෙදවූ) වලින් ලත් ශුද්ධ මුදල්		**309,519**	(2,164,881)	**174,858**	(2,156,754)
මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
යටත්කාලීන ණය මත ගෙවූ පොළිය		**(780,000)**	–	**(780,000)**	–
වෙනත් ණය ලබාගැනීම්		**10,915,868**	14,384	**10,142,542**	(1,074,004)
ලාභාංශ ගෙවීම් මත රඳවාගැනීමේ බදු		–	–	**(84,983)**	–
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/ විශේෂ බදු		**(5,111,114)**	(12,026,000)	**(5,111,114)**	(12,027,650)
යටත්කාලීන ණය නිකුත්කිරීමෙන් ලත් මුදල්		–	6,000,000	–	6,000,000
මූල්‍යන කටයුතු වලින් ලද ශුද්ධ මුදල්		**5,024,754**	(6,011,616)	**4,166,445**	(7,101,654)
මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**(835,120)**	1,339,148	**(838,974)**	1,339,610
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්		**4,504,308**	3,165,160	**4,512,715**	3,173,105
වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමාන දෑ		**3,669,188**	4,504,308	**3,673,741**	4,512,715
මුදල් හා මුදල් සමානයන් අයිතම සැසඳීම					
අතැති මුදල්		**944,759**	691,527	**944,769**	691,537
බැංකුව වෙතැති ශේෂයන්		**2,892,643**	3,881,589	**2,897,093**	3,889,509
ඉල්ලුම් සහ කෙටිකාලීන තැන්පතු		**12,224**	46,583	**12,224**	46,583
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන්		–	–	**94**	477
වෙනත් බැංකුවලට ගෙවිය යුතු – වෙනත් පහසුකම්		**(180,439)**	(115,391)	**(180,439)**	(115,391)
වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමාන දෑ		**3,669,188**	4,504,308	**3,673,741**	4,512,715

265 පිටුවේ සිට 370 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

1. වාර්තාකරණ ඒකකය →

1.1 ආයතනික තොරතුරු →

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ 1972 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය, අංක 255, "ඉතිරිකිරීමේ මන්දිරය", ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

2017 දෙසැම්බර් මස 31 දිනට බැංකුවේ මුළු සේවකයන් සංඛ්‍යාව 4,470 ක් විය. (2016 – 4,384)

සේවා සැපයුම් ස්ථාන ලෙස ශාඛා 253 ක්, පාසල් බැංකු ඒකක 28 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 286 ක් ද බැංකුව සතුව පවතින අතර, තැපැල් කාර්යාල 653 ක් සහ උප තැපැල් කාර්යාල 3,409 ක් නියෝජිත ජාලය ලෙස කටයුතු කරයි.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ →

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට බැංකුව සහ එහි පූර්ණ අයිතියට යටත් එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් නම්වූ පරිපාලිත සමාගම ඇතුළත් වේ.

බැංකුවෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය සතු වේ. බැංකුව සමූහයෙහි අවසන් පරිපාලකයා වේ.

බැංකුවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පාදක වෙයි.

සෑම වසරකදීම පාර්ලිමේන්තුවේදී සභාගත කිරීම පිණිස, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය සඳහා "බැංකුවේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් පිළියෙල කරනු ලබයි.

1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය → GRI 102-2

බැංකුව

පෙර පරිදිම, ශ්‍රී ලාංකික ජනතාව අතර, ඉතිරිකිරීම ප්‍රගුණ කරවීමත් එසේ එක්රැස් කරගන්නා ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත් බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය. තැන්පතු භාර ගැනීම, ආයතනික සහ පාරිභෝගික ණය, ව්‍යාපාර මූල්‍යයනය, රාජ්‍ය ව්‍යාපෘති සඳහා ණය, උකස් ණය, අන්තර්ජාල බැංකුකරණය, එස් එම් එස් බැංකුකරණය යනාදී මූල්‍ය විසඳුම් රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් සැපයෙයි.

පරිපාලිත සමාගම

බැංකුවේ පූර්ණ අයිතියට යටත් පරිපාලිත සමාගමක් වන එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් කටයුතු කරන අතර, රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙහි යෙදී සිටියි.

1.4 ගිණුම් පිළියෙල කිරීමේ පදනම →

1.4.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට සටහන් යනාදියෙන් සමන්විත බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව වන අතර, එය 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන වලටද අනුකූල වේ. මුදල් ප්‍රවාහ තොරතුරු හැරුණු කොට සෙසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනමටය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී භාවිත කරන ලද ආකෘතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා නිර්දේශ කර ඇති ආකෘතියට ද අනුකූල වේ.

1.4.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි හා එහි සංශෝධනවල ප්‍රතිපාදන ප්‍රකාර, බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

1.4.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු මස 12 වන දින අනුමත කරන ලදී.

1.4.4 මිනුම්කරණ පදනම

සාධාරණ අගය මත ගණනය කර ඇති පහත අයිතමයන් හැරුණු කොට බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත:

(i) විකිණීම සඳහා පවතින ආයෝජන

(ii) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

(iii) වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් සහ වගකීම්

(iv) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම්

(v) ඉඩම් හා ගොඩනැගිලි

(vi) නිර්වචිත සේවක ප්‍රතිලාභ සඳහා වන වගකීම්

1.4.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සමූහයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු කොට සියලුම අගයන් ආසන්න දහස් ස්ථානයට වටයා ඇත.

1.4.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ සහ සමූහයේ වත්කම් හා වගකීම්, ඒවායෙහි ස්වභාවය අනුව වර්ගකර, කල්පිරීමේ රටාව හා සාපේක්ෂ ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව ලැයිස්තුගත කර ඇත. බැංකුවේ හා සමූහයේ වත්කම් හා වගකීම් වල කල්පිරීමේ රටාවන්හි විශ්ලේෂණය සටහන් අංක 49 හි දක්වා ඇත.

හඳුනාගත් අගයන් හිලව් කිරීමට, නෛතිකව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එක්වරම වත්කම් උපලබ්ධි කිරීමට සහ වගකීම් පියවීමට අපේක්ෂාවක් ඇති විට පමණක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කළ ශුද්ධ අගය වාර්තා කරයි. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථකථනයක් මගින් අවශ්‍ය හෝ ඉඩ දී ඇති විටක සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් විශේෂයෙන් දක්වා ඇති විටක හැරුණුවිට ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් හිලව් කර නොදක්වයි.

1.4.7 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං.ගි.ප්‍ර.) 01 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම මගින් ඉඩදී ඇති පරිදි අසමාන ස්වභාවයේ හෝ කාර්යයේ අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

1.4.8 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම සඳහා සහ කාලපරිච්ඡේද දෙක සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ප්‍රකාශනයෙහි පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව, විස්තරාත්මකව හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් අරභයා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග අනුරූපවීමට අවශ්‍ය අවස්ථාවල දීද සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කර දක්වා ඇත. පිටු අංක 352 හි මූල්‍ය ප්‍රකාශන වලට සටහන් 47 යටතේ අදාළ විස්තර ඉදිරිපත් කර ඇත.

1.4.9 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව වන පරිදි බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල අගයන් තීරණය කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සම්බන්ධයෙන් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වයට සිදු වේ.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරයි. ගිණුම් ඇස්තමේන්තුවල යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළදී, එම සංශෝධන ඉදිරි කාලපරිච්ඡේදයකට බලපාන්නේ නම්, ඉදිරි කාලපරිච්ඡේදවල දීද ගිණුම්ගත කරනු ලැබේ.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් මත වැඩිම බලපෑමක් ඇති කිරීමට හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ දී යොදාගත් සැලකිය යුතු තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

1.4.9.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත ඉදිරියට පැවතීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල නිරතවීමට එය සතු ශක්‍යතාව පිළිබඳ සෑහීමට පත්වී ඇත.

තවද අඛණ්ඩ පැවැත්ම සඳහා බැංකුවට ඇති හැකියාව පිළිබඳ සැක පහළ වන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් කළමනාකාරිත්වයට හමු වී නොමැත. එහෙයින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තව දුරටත් සිදු කෙරෙයි.

1.4.9.2 මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන්, සක්‍රීය වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි විට, එය තීරණය කිරීම සඳහා ගණිතමය ආකෘති භාවිතය ද ඇතුළත් තක්සේරුකරණ තාක්ෂණය යොදා ගැනෙයි. මෙකී ආකෘති සඳහා යෙදවුම්, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත වෙතින් හැකි අවස්ථාවල දී ලබා ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගයක් ස්ථාපිත කර ගැනීමට තීරණයක් ගත යුතු වේ.

මූල්‍ය උපකරණ අගය කිරීම පිණිස යොදාගන්නා ක්‍රමවේද සහ සාධාරණ වටිනාකම් ධුරාවලිය මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 50 මගින් මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 364 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

1.4.9.3 ණය හා ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ

කේවල හානිකරණ ඇගයීම

ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභ වාර්තා කළ යුතු දැයි තක්සේරු කිරීම පිණිස මූල්‍ය තත්ත්වය පිළිබඳව වාර්තා කරනු ලබන සෑම දිනයකදීම සමූහය විසින් එහි සැලකිය යුතු ණය හා ලැබිය යුතු දෑ පිළිබඳව තනි තනිව සමාලෝචනය කෙරෙයි. අලාභ හානි තීරණය කිරීමේ දී විශේෂයෙන්ම ප්‍රමාණ තක්සේරු කිරීම හා අනාගත මුදල් ප්‍රවාහ තීරණය කිරීමට කළමනාකාරිත්වයේ තීන්දු අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු පදනම් වනුයේ හේතු සාධක පිළිබඳ උපකල්පන ගණනාවක් මත වන හෙයින් අත්විය හැකි ප්‍රතිඵල මීට වෙනස්විය හැකිය.

සාමූහික හානිකරණ ඇගයීම

තනි තනිව තක්සේරු කරන ලද අලාභයක් නොවන ණය හා ලැබිය යුතු දෑ සහ වෙන් වෙන්ව ගත් විට විශාල බලපෑමක් ඇති නොකරන ණය හා ලැබිය යුතු දෑ සියල්ලම, සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් ඇති කාණ්ඩ වශයෙන් සාමූහිකව තක්සේරු කරනු ලබයි. විෂය මූලික සාක්ෂි ඇති නමුත් එහි බලපෑම තවමත් දක්නට නොමැති හානි සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතුදැයි තීරණය කිරීමට එසේ සිදු කරනු ලබයි. සාමූහික තක්සේරු කිරීම් සඳහා ණය කළඹෙහි හිඟ මට්ටම්, ණය උපයෝගීතාවය, ණය හා සුරැකුම් අනුපාතය ආදී දත්ත සහ (විරැකියා මට්ටම්, නිශ්චල දේපල මිල දර්ශක, රටෙහි අවදානම සහ විවිධ කාණ්ඩායම්වල කාර්ය සාධනය ද ඇතුළුව) ආර්ථික දත්ත හා අවදානම් සංකේන්ද්‍රණ වලට බලපාන තීන්දු ද යොදා ගැනෙයි.

මූල්‍ය වත්කම් හානිකරණය පිළිබඳව පිටු අංක 273 හි සටහන් 2.3.6 මගින් තවදුරටත් සාකච්ඡා වෙයි.

1.4.9.4 මූල්‍ය ආයෝජන හානිකරණය – විකිණීම සඳහා පවතින

ණය සුරැකුම්පත්

විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති ණය සුරැකුම් හානිකරණය වී ඇත්දැයි තක්සේරු කරනු පිණිස, සමූහය විසින් සෑම වාර්තා කරනු ලබන දිනකම ඒවා සමාලෝචනය කරනු ලබයි. මේ සඳහා ණය හා ලැබිය යුතු දෑ කේවල ඇස්තමේන්තුකරණයේදී භාවිතා වන තීන්දු වලට සමාන තීන්දු ගැනීම් අවශ්‍ය වෙයි.

හිමිකම් කොටස් මත ආයෝජන

සාධාරණ අගයෙහි සැලකිය යුතු හෝ දිගුකාලීන පහත වැටීමක් ඇති අවස්ථාවලදී විකිණීම සඳහා පවතින හිමිකම් කොටස් ආයෝජන මත හානිකරණ අලාභ ද සමූහය විසින් වාර්තා කරනු ලබයි. මෙහිදී "සැලකිය යුතු" හෝ "දිගු කාලීන" යන්න තීරණය කිරීම සඳහා තීන්දු ගැනීම් අවශ්‍ය වේ. මෙම තීන්දු ගැනීම් වලදී කොටස්වල ඓතිහාසික මිල විචලනය සහ ආයෝජනයේ සාධාරණ අගය එහි පිරිවැයට වඩා අඩුවෙන් පැවති ප්‍රමාණය සහ කාලසීමාව සමූහය විසින් විශේෂයෙන් ඇගයීමට ලක් කරයි.

1.4.9.5 දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

බැංකුවේ හා සමූහයේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ඒවායේ ප්‍රත්‍යාගණනය කල අගයට පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13) "සාධාරණ අගය මැනීමට" අනුකූලව සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විසින් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදවන ලදී.

සින්නක්කර ගොඩනැගිලි සහ ඉඩම්වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමවේද හා ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.4 හි තවදුරටත් විස්තර කර දක්වා ඇත.

1.4.9.6 දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීවකාලය

සමූහය, දේපල, පිරියත හා උපකරණවල අවශේෂ වටිනාකම, ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණ භාවිතා කෙරෙන හෙයින් ඒවායෙහි අගයන් අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

1.4.9.7 විලම්බිත බදු වත්කම්

බදු අලාභ වලට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ එම බදු අලාභ අයකර ගත හැකි බදු වන ලාභ ලැබීමේ හවුතාවක් ඇතිතාක් දුරට පමණි. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කමේ අගය නිර්ණය කිරීම පිණිස අනාගතයේ විය හැකි බදු වන ලාභයන්හි කාලසීමාව හා ප්‍රමාණය සහ අනාගත බදු සැලසුම්කරණ උපායමාර්ග මත පදනම්ව තීරණ ගත යුතුවේ.

1.4.9.8 නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

ආයුගණක තක්සේරු උපයෝගී කරගනිමින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ එම වගකීම්වල වර්තමාන අගය තීරණය කෙරෙයි. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, සේවක මර්ත්‍යතාව හා ඉදිරි විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ඇතිව ආයුගණක තක්සේරුව සිදු කරනු ලබයි.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිර්වචිත ප්‍රතිලාභ වගකීම්වල අපේක්ෂිත කාලසීමාවට අනුරූපව පරිණතවීම් සඳහා ගලපන ලද ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර පොළී අනුපාත, කළමනාකරණය විසින් සලකා බලනු ලැබෙයි.

පොදුවේ භාවිත මර්ත්‍යතා චක්‍ර අනුව මර්ත්‍යතා අනුපාතිකය තීරණය වෙයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක මත ඉදිරි වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය වෙයි. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුකොට ගෙන එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

1.4.9.9 ප්‍රතිපාදන, බැඳියාවන් හා අසම්භාව්‍යයන්

සමූහයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සමූහයට එරෙහි නෛතික හිමිකම් ඉල්ලීම් ඉදිරිපත්වූ විට එම හිමිකම් ඉල්ලීම් සාර්ථක වීමේ ඉඩකඩ සම්බන්ධයෙන්, ප්‍රතිපාදන සැලසීම කළමනාකාරිත්වය විසින් තීරණය කරයි. නීතිමය හිමිකම් සම්බන්ධ ක්‍රියාමාර්ග අවසන් කිරීමට ගතවන කාලසීමාව මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ගලායෑමේ ප්‍රමාණය ද අවිනිශ්චිත වේ. මේ සඳහා ගතවන කාලසීමාව සහ පිරිවැය අවසාන වශයෙන් තීරණය වනුයේ අදාළ නෛතික බලසීමාව මතය.

2. සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති →

විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැර පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙකී මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද වලට එක හා සමානව බලපැවැත්වෙන පරිදි භාවිතා කර ඇත. සෑම අවස්ථාවල දී බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය විසින් ද එලෙසම භාවිත කරනු ලබන අතර, ඉන් පරිබාහිර වන අවස්ථා වෙතොත් ඒ බව හෙළිදරව් කරනු ලැබ ඇත.

2.1 ඒකාබද්ධ කිරීමේ පදනම →

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10) "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 29) "වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාර බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වේ.

2.1.1 පරිපාලිත සමාගම

බැංකුව වෙත පාලනය පැවරෙන දින පටන් පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මුලුමනින්ම ඒකාබද්ධ කෙරෙන අතර, එබඳු පාලනයක් අවසන් වනතුරු ඒකාබද්ධ කිරීම සිදුවෙයි. පාලනයක් පවතින්නේ බැංකුවට එකී පරිපාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි, එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමට බලයක් ඇති විටදීය. ඒකාබද්ධ කිරීමේ දී භාවිතා වන බැංකුවේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන කාලසීමාව සඳහාම ඊට සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් පිළියෙල කරනු ලබයි.

2.1.2 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරනු ලැබූ ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් සමාගම් ශේෂයන්, ආදායම් හා වියදම් මෙන්ම එවැනි අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැන නගින ලද උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ඇත.

2.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂ →

ගනුදෙනු සිදුවූ දිනවලදී පැවති විනිමය අනුපාත භාවිත කරමින් සියළුම විදේශ මුදල් ගනුදෙනු, ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් දැක්වෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනට පවතින මධ්‍යම විනිමය අනුපාතය යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල් වලට යළි පරිවර්තනය කරනු ලබයි. මූල්‍ය අයිතම පියවීම මත හෝ මුලින් වාර්තා කළ අනුපාතයකට වඩා වෙනස් අනුපාත වලට මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින සියලුම විනිමය වෙනස්කම්, එකී වෙනස්කම් පැනනගින කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

ඓතිහාසික පිරිවැය මත විදේශ ව්‍යවහාර මුදලින් මනිනු ලබන මූල්‍ය නොවන අයිතම, ගනුදෙනු සිදුකළ දින වලදී වූ විනිමය අනුපාත භාවිත කරමින් පරිවර්තනය කරනු ලබයි. සාධාරණ අගයට විදේශ ව්‍යවහාර මුදලින් මනිනු ලබන මූල්‍ය නොවන අයිතම, පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාතිකය යොදාගනිමිනි.

විදේශ මුදල් බැංකු ඒකකයෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය වාර්තා කරන දිනයේදී පැවති මධ්‍යම විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි. ඉහත ප්‍රතිපත්තියට අනුව විදේශ මුදල් බැංකු ඒකකයෙහි ගනුදෙනු වාර්තා කර ඇති අතර, ඉන් ජනිතවූ ලාභ/අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

2.3 මූල්‍ය උපකරණ →

2.3.1 මූල්‍ය උපකරණ – මූලික හඳුනාගැනීම්, වර්ගීකරණය සහ පසුව සිදුකරන ලද ගණනය කිරීම්

i. හඳුනාගනු ලබන දිනය

සියලුම මූල්‍ය වත්කම් හා වගකීම්, මූලිකව ගනුදෙනු කරන දිනට එනම්, උපකරණ වල ගිවිසුම්ගත ප්‍රතිලාභ සඳහා සමූහය පාර්ශ්වකරුවකු වන දිනට හඳුනා ගැනේ.

පොදු ලෙජරය පවත්වාගෙන යාමේ දී, ගනුදෙනු කරන දිනට දින 3 කට පසුව එළඹෙන පියවිය යුතු දිනට රාජ්‍ය සුරැකුම්පත් හඳුනාගනු ලබයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙය නිවැරදිව ගණනය කරනු ලබයි.

ii. මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මූලික ගණනය කිරීම

මූලික ගණනය කිරීම් සඳහා මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම තීරණය වනුයේ, මූල්‍ය උපකරණ වල ලක්‍ෂණ හා එම උපකරණ අත්පත් කරගත් හේතුව හා කළමනාකාරිත්වයේ අරමුණ මතය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) හි "මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා මිනීම" ප්‍රකාර ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්, හැරුණු විට සියලුම මූල්‍ය උපකරණ ඒවායේ සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතුකොට ආරම්භයේ දී ගණන කෙරෙයි.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාළ ගනුදෙනු පිරිවැය ලාභාලාභ ගිණුම ඔස්සේ සිදු කරනු ලබයි.

iii. දින 1 ලාභය හෝ අලාභය

ගනුදෙනු කරන මිල, එම උපකරණයටම අදාළව නිරීක්ෂණය කළ හැකි වෙනත් ප්‍රවර්තන වෙළඳපොළ ගනුදෙනුවල සාධාරණ අගයට වඩා වෙනස් වන අවස්ථාවලදී හෝ නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ වෙතින් ලබාගත හැකි දත්ත පමණක් ඇතුළත් විචල්‍ය සහිත ඇගයීමේ තාක්ෂණික ක්‍රම මත පදනම් වූ ගනුදෙනු කරන මිල හා සාධාරණ අගය අතර වෙනස සමූහය විසින් වහාම පොළී ආදායම සහ සේවක මණ්ඩල පිරිවැයෙහි දක්වනු ලබයි. නිරීක්ෂණය කළ නොහැකි දත්ත උපයෝගී කර ගනිමින් සාධාරණ අගය තීරණය කරනු ලබන අවස්ථාවල දී යෙදවුම් දත්ත නිරීක්ෂණය කළ හැකි වන විට හෝ අයිතමය හඳුනා නොගන්නා විට ගනුදෙනු කරන මිල හා ආදර්ශ වටිනාකම අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පමණක් හඳුනාගනු ලබයි.

පොදු යෝජනා ක්‍රමයක් යටතේ සහනදායී පොළී අනුපාතයට සේවකයන්ට ප්‍රදානය කරන ලද ණය වලින් ජනිත වන දින 1 ලාභය සේවකයන්ගේ ඉදිරියට ඇති සේවා කාලය හෝ ණය කාලසීමාව යන දෙකෙන් අඩු අගයට සඵල පොළී අනුපාතය භාවිතයෙන් හඳුනාගනු ලබයි.

2.3.2 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුව මිනීම

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් පහත කාණ්ඩ අතරින් එකක් යටතේ වර්ගීකරණය කෙරෙයි:

- ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්
  (අ) වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්
  (ආ) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්
- කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම්
- ණය සහ ලැබිය යුතු දෑ
- විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

පසුව සිදු කරනු ලබන මූල්‍ය වත්කම් මිනීම ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ.

මූල්‍ය වත්කම් වල වර්ගීකරණය හා පසුව මිනීම් පිළබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය පිටු අංක 292 හි සටහන් අංක 15 හි දැක්වේ.

2.3.2.1 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලට අයත් වේ.

(අ) වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 301 හි සටහන් අංක 20 මගින් දැක්වේ.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න පිළිබඳ විස්තර පිටු අංක 297 හි සටහන් අංක 19 හි දැක්වේ.

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න
ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න පිළිබඳ විස්තර පිටු අංක 297 හි සටහන් අංක 19 හි දැක්වේ.

(ආ) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්

සමූහය විසින් කිසිදු මූල්‍ය වත්කමක් මූලික හඳුනාගැනීමේ දී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කර නොමැත.

2.3.2.2 කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන

කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනවල විස්තර පිටු අංක 314 හි සටහන් අංක 25 හි දක්වා ඇත.

2.3.2.3 ණය සහ ලැබිය යුතු දෑ – බැංකු හා වෙනත් ගනුදෙනුකරුවන්

බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති ණය හා ලැබිය යුතු දෑ පිළිබඳව පිළිවෙලින් පිටු අංක 306 හි පිළිවෙලින් සටහන් 22 සහ 23 මගින් දැක්වේ.

(i) ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්

අනාගතයේ නිශ්චිත දිනක යළි විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගන්නා සුරැකුම්පත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි නොඳක්වයි. උපචිත පොළියද ඇතුළත්ව ගෙවන ලද මුදල, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදීගත් සුරැකුම්පත් යටතේ වාර්තා කර ඇත්තේ ගනුදෙනුවේ ආර්ථික යථානුරූපීභාවය පිළිබිඹු වන පරිදි සමූහය විසින් දුන් ණයක් වශයෙනි. මිලදී ගත් මිල සහ යළි විකුණූ මිල අතර ඇති වෙනස, ඵලදායී පොළී ආදායම් යටතේ වාර්තා කරන අතර, ගිවිසුමෙහි කාලසීමාව පුරාවට සළුල පොළී අනුපාතයට අනුව එය උපචිත වේ.

ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදීගත් සුරැකුම්පත් පිළිබඳ විස්තර පිළිවෙලින් පිටු අංක 305 සහ 306 හි පිළිවෙලින් සටහන් අංක 22 හා 23 මගින් දැක්වේ.

2.3.2.4 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන පිළිබඳ විස්තර පිටු 301 හි සටහන් අංක 24 දී දක්වා ඇත.

2.3.2.5 මුදල් හා මුදල් සමාන අයිතම

මුදල් හා මුදල් සමානයන් පිළිබඳ විස්තර පිටු අංක 296 හි සටහන් අංක 16 හි දැක්වේ.

2.3.3 මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ පසුව මිනීම

මූලික හඳුනාගැනීමේ දී සමූහය විසින් එහි මූල්‍ය වගකීම් පහත කාණ්ඩ අතරින් එකක් යටතේ වර්ගීකරණය කරනු ලබයි:

- ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්
  - (අ) වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වගකීම්
  - (ආ) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම්
- ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් වලට අදාළව පසුව සිදුකෙරෙන මිනීම් ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ. පහත දක්වා ඇති පරිදි සටහන අංක 2.3.3.1 සහ 2.3.3.2 වෙත යොමු වන්න:

2.3.3.1 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම් සහ වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වගකීම්, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම් වලට අයත් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මිනුම්කරන අතර, සාධාරණ අගයේ වෙනස්වීම් ලාභාලාභ ගිණුමට හඳුනාගනු ලබයි.

මූල්‍ය වගකීම් ප්‍රධාන වශයෙන් අත්පත් කර ගෙන ඇත්තේ නුදුරු කාලයේදීම විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ අරමුණින් වන විට හෝ කෙටිකාලීන ලාභාපේක්ෂාවෙන් එක්ව කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹක කොටසක් ලෙස රඳවා තබාගෙන ඇතිවිට ඒවා වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනීම යටතේ ඉදිරිපත් කර ඇති ඉදිරි රැකුම් සම්බන්ධතාවය අනුව ඉදිරි රැකුම් ලෙස නම් නොකරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ද මෙම කාණ්ඩයට අයත් වේ.

වෙළඳාම සඳහා දරා සිටින වගකීම් මත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

සමූහය විසින් මූලික හඳුනාගැනීමේදී කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කර නොමැත.

2.3.3.2 ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්

සමූහය විසින් එළඹ ඇති ගිවිසුම් වලට අනුව, දරා සිටින්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට බැඳියාවක් පවතින විට හෝ බැඳියාවක් පියවීම සඳහා නිශ්චිත හිමිකම් කොටස් සංඛ්‍යාවක් නිශ්චිත මුදලකට හෝ නිශ්චිත වෙනත් මූල්‍ය වත්කම් අගයකට හුවමාරු වන අවස්ථාවක් හැරුණුවිට, සමූහය විසින් නිකුත් කරන ලද ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය වත්කම්, "බැංකු වලට ගෙවිය යුතු", "වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු", "ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්" සහ "ණයපත් නිකුත් කිරීම් හා වෙනත් ණය ගැනීම්" යටතේ වර්ගීකරණය කරන අතර සළුල පොළී අනුපාතික භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සළුල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් එම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. නිකුත් කිරීමට අදාළ වට්ටම් හෝ අධි මිල සහ සළුල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන පිරිවැයද සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සළුල පොළී අනුපාතික ක්‍රමක්ෂයවීම් ආදායම් ප්‍රකාශයෙහි "පොළී වියදම්" යටතේ හඳුනා ගනී. සළුල පොළී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගැනීම අත්හරින විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

i. බැංකු වලට ගෙවිය යුතු දෑ

බැංකු වලට ගෙවිය යුතු දෑ පිළිබඳ විස්තර පිටු අංක 325 හි සටහන් අංක 31 මගින් දැක්වේ.

ii. වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ

වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ පිළිබඳ විස්තර පිටු අංක 325 හි සටහන් අංක 32 මගින් දැක්වේ.

iii. ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරුකුම්පත්

ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරුකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 327 හි සටහන් අංක 33 යටතේ දක්වා ඇත.

iv. වෙනත් ණය ගැනීම් – ණය සුරුකුම්පත් නිකුත් කිරීම

වෙනත් ණය ගැනීම් – ණය සුරුකුම්පත් නිකුත් කිරීම් පිළිබඳ විස්තර පිටු අංක 327 හි සටහන් අංක 33 යටතේ දක්වා ඇත.

v. යටත්කාලීන වගකීම්

යටත්කාලීන වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 339 හි සටහන් අංක 35 යටතේ දක්වා ඇත.

2.3.4 මූල්‍ය උපකරණ යළි වර්ගීකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් – (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ ගණනය කිරීම මගින් අවසර ලැබී ඇති පරිදි සමූහය විසින් ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් "වෙළඳාම සඳහා දරා සිටින" කාණ්ඩයෙන් ඉවත්කර "විකිණීම සඳහා පවතින", "ණය සහ ලැබියයුතු දෑ" හෝ "කල්පිරීම තෙක් දරා සිටින" කාණ්ඩ යටතේ යළි වර්ගීකරණය කරනු ලැබේ. ඇතැම් අවස්ථානුකූලව, මූල්‍ය වත්කම් "විකිණීම සඳහා පවතින" කාණ්ඩයෙන් ඉවත්කර "ණය සහ ලැබියයුතු දෑ", "වෙළඳාම සඳහා දරා සිටින" හෝ "කල්පිරෙන තෙක් දරා සිටින" කාණ්ඩ යටතේ යළි වර්ගීකරණය කිරීමටද සමූහයට අවසර ඇත.

මෙසේ යළි වර්ගීකරණය කිරීම්, යළි වර්ගීකරණය කරනු ලබන දිනට සාධාරණ වටිනාකමට ව්‍යාර්තා කරනු ලබන අතර එය නව ක්‍රමක්ෂය පිරිවැය බවට පත් වේ.

විකිණීම සඳහා පවතින කාණ්ඩයෙන් ඉවතට ගෙන යළි වර්ගීකරණය කරනු ලබන ස්ථාවර කල්පිරීමේ කාලසීමාවක් සහිත (මූල්‍ය වත්කම් මත) නිමිකම්වල කලින් හඳුනාගත් ලාභයක් හෝ පාඩුවක් වේ නම්, සළුල පොළී අනුපාතිකය භාවිතා කරමින් ආයෝජනයෙහි අවශේෂ කාලසීමාව පුරා ලාභ හෝ අලාභ යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය හා අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර යම් වෙනසක් වේ නම්, එයද සළුල පොළී අනුපාතිකය භාවිත කරමින් වත්කමෙහි අවශේෂ කාලසීමාව පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

මූල්‍ය වත්කමක් සතුව ස්ථාවර කල්පිරීමේ කාලසීමාවක් නොමැති අවස්ථාවකදී එබඳු මූල්‍ය වත්කමක් විකුණා හෝ ඉවත් කර ඇති විටක ලාභ හෝ අලාභ යටතේ එම ලාභය/අලාභය දක්වනු ලැබේ. එකී වත්කම පසුව හානිකරණය වී ඇතැයි තීරණය කරනු ලැබුවහොත්, හිමිකමෙහි ව්‍යාර්තා කර ඇති අගය ආදායම් ප්‍රකාශයට නැවත ගෙන යනු ලැබේ.

යම් මූල්‍ය වත්කමක් නුදුරු අනාගතය තෙක් හෝ කල් පිරෙන තෙක් රඳවා ගැනීමේ හැකියාව හා අභිමතය සමූහයට ඇති විටක සමූහය විසින් ණය හා ලැබිය යුතු දෑ යන නිර්වචනයට ගොනු කළ හැකි ව්‍යුත්පන්න නොවූ ගනුදෙනු කළ හැකි වත්කමක් "වෙළඳාම සඳහා දරා සිටින" කාණ්ඩයෙන් ඉවතට ගෙන "ණය හා ලැබිය යුතු දෑ" කාණ්ඩයට යළි වර්ගීකරණය කළ හැකිය. මූල්‍ය වත්කමක් යළි වර්ගීකරණය කර ඇත්නම් හා එකී මුදල් ලැබීම්වල අය කර ගැනීමේ හැකියාව ඉහළ යාම හේතුකොටගෙන අනාගත මුදල් ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු, සමූහය විසින් ඉහළ නංවන්නේ නම්, එම ඉහළ යාමෙහි බලපෑම තක්සේරුවෙහි වෙනසක් ඇති කළ දින සිට සළුල පොළී අනුපාතිකයට කරනු ලබන ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

යළි වර්ගීකරණය කිරීම සිදු කරනු ලබන්නේ කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වන අතර, උපකරණයෙන් උපකරණය යන පදනම මත එම තීරණය ගනු ලැබේ.

මූලික හඳුනා ගැනීමෙන් පසුව සමූහය විසින් කිසිදු මූල්‍ය උපකරණයක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල කාණ්ඩයට යළි වර්ගීකරණය කරනු නොලබයි. එමෙන්ම මූලික හඳුනා ගැනීමේ දී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල යම් මූල්‍ය උපකරණයක් වේ නම්, සමූහය විසින් එබඳු මූල්‍ය උපකරණයක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය යන කාණ්ඩයෙන් ඉවතට ගැනීම සමූහය විසින් සිදු නොකරනු ලබයි.

2.3.5 මූල්‍ය උපකරණ හඳුනාගැනීම අත්හැරීම

(අ) මූල්‍ය වත්කම්

පහත අවස්ථාවලදී සමූහය විසින් මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගනු නොලබයි.

- වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත්වී ඇති විට, හෝ
- වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ ලද මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව මුලුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳෙන බව සමූහය විසින් සහතික වී ඇති විට සහ වත්කමෙහි සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකියයුතු මට්ටමකට වෙනත් පාර්ශ්වයකට පවරා හෝ සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවා ගෙන හෝ පවරා නොමැතිමුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට.

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ මුදල් ප්‍රවාහ මුලුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳීමක් ඇතිකරගත් විට සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවාගෙන හෝ පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් සමූහයේ සහභාගිත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී සමූහය විසින් ආශ්‍රිත වගකීමක්ද හඳුනාගනු ලබයි. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයට පවරන ලද වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලබයි.

පවරන ලද වත්කම මත ඇපකරයක ස්වරූපයෙන් පවතින අබණ්ඩ සම්බන්ධය, වත්කමක මුල් ප්‍රවර්තන අගය සහ සමූහයට යළි ගෙවීමට සිදුවිය හැකි උපරිම අගය යන දෙකෙන් අඩු අගය පිළිබඳ සැලකිල්ලට ගනිමින් මනිනු ලබයි.

(ආ) මූල්‍ය වගකීම්

වගකීම යටතට ගැනෙන බැඳියාව ඉකුත්වී හෝ අවලංගුවී හෝ නිදහස් කර ඇතිවිට මූල්‍ය වගකීම් හඳුනාගැනීම අත් හරිනු ලබයි.

දැනට පවතින මූල්‍ය වගකීමක් එම ණයකරුගේම සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි සහිත වෙනත් වගකීමක් මගින් ප්‍රතිස්ථාපනය වූ විට හෝ දැනට පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු සංශෝධනයකට භාජනය වූ විට, එම ප්‍රතිස්ථාපනය හෝ සංශෝධනය, ප්‍රථම වගකීම හඳුනාගැනීම අත්හැරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමෙහි ප්‍රවර්තන අගය සහ ගෙවූ ප්‍රතිෂ්ඨව අතර වෙනස ලාභාලාභ මගින් හඳුනාගනු ලැබේ.

2.3.6 මූල්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තා කරනු ලබන දිනයකදීම සමූහය විසින් යම් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වූ බවට විෂය මූලික සාක්ෂි ඇත්දැයි තක්සේරු කරනු ලබයි. වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවන සිද්ධියකදී හෝ සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස අගය අඩුවීම පිළිබඳ විෂය මූලික සාක්ෂි ඇති විටදී සහ එහි අලාභ හානියෙන්/හානි වලින් මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයට විශ්වාසනීයව තක්සේරු කළ හැකි බලපෑමක් ඇති විට පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය වී ඇති බවට සලකනු ලබයි.

ණයකරුවකු හෝ ණයකරුවන් කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට හෝ ඔවුන් බංකොළොත් වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් වලට ණය හෝ පොළී හෝ මූලික ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවයක් ඇති බවට හා හිඟ මුදල් වල වෙනස්වීම් හෝ ණය ගෙවීම් පැහැර හැර සහ සමගාමී ආර්ථික තත්ත්වයන්හිදී තක්සේරු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි මිනිය හැකි අඩු වීමක් පෙන්නුම් කරන දත්ත, අගය අඩු කිරීම් වල විෂය මූලික සාක්ෂීන් අතරට ඇතුළත් විය හැකිය.

මූල්‍යමය වත්කම් (හිමිකම් සුරැකුම් ඇතුළුව) හානිකරණය වී ඇති බවට දැක්විය හැකි විෂය මූලික සාක්ෂීන් පහත පරිදි විය හැකිය:

- ණයකරුගේ හෝ ණය නිකුත්කරන්නාගේ සැලකියයුතු මූල්‍යමය දුෂ්කරතා
- ණය පහසුකම් පිළිබඳ කාර්ය සටහන් යළි සකස් කිරීම
- අහිතකර මූල්‍ය අනුපාත සහ තෝලන අනුපාත
- බාහිර ණය වර්ගීකරණ පහත හෙළීම
- ණයකරුගේ පැහැර හැරීම්
- සමූහය විසින් වෙනත් අවස්ථාවකදී නොසලකන කොන්දේසි මත ණය හෝ අත්තිකාරම් ප්‍රතිව්‍යුහගත කිරීම
- ණයකරු හෝ ණය හිමියා බුන්වත් වීමට ඉඩඇති බව පෙන්නුම් කරන දර්ශක
- සුරැකුම් සඳහා සක්‍රීය වෙළඳපොළක් අහිමිවීම හෝ
- සමූහයේ පැහැරහැරීම් හා සහසම්බන්ධවන සමූහයේ ණයකරුවන්ගේ/ණයහිමියන්ගේ ගෙවීම් තත්ත්වයන්ගේ අවාසිදායක වෙනස්වීම් හෝ ආර්ථික තත්ත්වයන්ගේ අවාසිදායක වෙනස්වීම් ආදී සමූහයට අදාළ වන වෙනත් නිරීක්ෂණය කළ හැකි දත්ත.

පොදුවේ ගත්විට, 20% ක අඩු වීමක් සමූහය විසින් "සැලකිය යුතු" ගණයෙහිලා ද මාස 6 ක කාලසීමාව "දීර්ඝ වූ" ගණයෙහිලා ද සලකනු ලබයි. කෙසේ වුවද, නිශ්චිත වාතාවරණයන් යටතේ මීට වඩා අඩු ප්‍රතිශතයක අඩුවීමක් හෝ කෙටි කාලසීමාවක් වුවද යෝග්‍ය විය හැකිය.

i. ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම් හානිකරණය

කේවල සහ සාමූහික හානිකරණ ඇගැයීම පිළිබඳ විස්තර පිටු අංක 286 හි සටහන් අංක 10 මගින් දැක්වේ.

ii. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය පිළිබඳ සවිස්තරාත්මක කරුණු පිටු අංක 310 හි සටහන් අංක 24 මගින් දැක්වේ.

2.3.7 මූල්‍ය උපකරණ වලට අදාළ ආදායම හා වියදම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒම හා ආදායම විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පිටු අංක 282 සිට 291 හි සටහන් අංක 3-14 හි දැක්වේ.

i. පොළී සහ සමාන ආදායම් හා වියදම්

පොළී ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පිටු අංක 282 සිට 291 හි සටහන් අංක 3 හා 4 හි දැක්වේ.

ii. ගාස්තු සහ කොමිස් ආදායම

කොමිස් ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පිටු අංක 284 හි සටහන් අංක 5 හි දැක්වේ.

iii. වෙළඳ කටයුතු වලින් ලද ශුද්ධ ආදායම

වෙළඳ කටයුතු වලින් ලද ශුද්ධ ආදායම/(පාඩුව) පිළිබඳ විස්තර පිටු අංක 285 හි සටහන් අංක 6 යටතේ දක්වා ඇත.

iv. ලාභාංශ ආදායම

ආදායම් ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි. බොහෝ විට මෙය ප්‍රකාශ හිමිකම් සුරැකුම් සඳහා ලාභාංශ රහිත දිනය වේ. ලාභාංශ ආදායම පිළිබඳ විස්තර පිටු අංක 286 හි සටහන් අංක 9 යටතේ දක්වා ඇත.

2.4 දේපල, පිරියත හා උපකරණ →

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 315 හි සටහන් අංක 27 මගින් දැක්වේ.

2.5 අස්පෘශ්‍ය වත්කම් →

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 322 හි සටහන් අංක 28 මගින් දැක්වේ.

2.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය →

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් නොවන වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ හැඟවීමක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම අඩු කරයි.

2.7 සේවක ප්‍රතිලාභ →

2.7.1 නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

2.7.1.1 සේවක විශ්‍රාම අරමුදල I

1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම බැංකුවට බැඳුනු ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා නිර්වචිත විශ්‍රාම සැලසුම් ක්‍රමයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වෙනම පාලනය කෙරෙන අරමුදලක් වෙත බැංකුව විසින් සාමාජිකයන්ගේ දායකත්වය දැක්විය යුතු වේ. පුරෝකථන ඒකක ණය ජීවගණක තක්සේරු කිරීමේ ක්‍රමයක් භාවිතා කරමින් නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙන වෙනම තීරණය කරනු ලබයි. ජීව ගණක ලාභ හා අලාභ ඒවා ඇතිවන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීවගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඒකාබද්ධයට, සීමා වෙයි.

ජීවගණන හා උපදේශන ජීවගණක පිළිබඳව ඇමෙරිකානු ඇකඩමියේ සාමාජික පියල් එස්. ගුණතිලක මහතා FSA (USA) විසින් 2017 දෙසැම්බර් 31 දිනට නවතම ජීව ගණක ඇගයීමක් සිදුකරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ:

පොළි/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	11.00%
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	4.50%
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	6.50%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාව ද සභාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි. සේවක විශ්‍රාම අරමුදල I පිළිබඳ විස්තර පිටු අංක 328 සිට 331 දක්වා සටහන් අංක 34 (අ) 1 හි දැක්වේ.

2.7.1.2 අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීම

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 2,750 ක අතීත සේවා පිරිවැය හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 328 සිට 331 දක්වා සටහන් අංක 34 (අ) 1 හි දක්වා ඇත.

2.7.1.3 සේවක විශ්‍රාම අරමුදල II

1995 ඔක්තෝබර් මස 1 දින හෝ ඉන් අනතුරුව බැංකු සේවයට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා, බැංකුව විසින් අදාළ සාමාජිකයාගේ මාසික දළ වැටුපින් 12% ක දායකත්වයක් වෙනම පාලනය වන අරමුදලක් වෙත මාසිකව දායක කළ යුතු වන නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් බැංකුව විසින් ස්ථාපනය කර මෙහෙයවනු ලබයි.

ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ, ජීවදත්ත ඇගයීම් ක්‍රමයක් භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙනම තීරණය කරනු ලබයි. ජීවදත්ත ලාභ හා පාඩු, ඒවා පැන නගිනු ලබන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම් වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීවගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඒකාබද්ධයට, සීමා වෙයි.

ජීවගණක හා උපදේශන ජීවගණක පිළිබඳව ඇමෙරිකානු ඇකඩමි සාමාජික පියල් එස්. ගුණතිලක මහතා FSA (USA) විසින් 2017 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට යෙදුණු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ:

පොළි/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	11.00%
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	4.50%
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	6.50%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාව ද සභාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල II හි විස්තර පිටු අංක 322 සිට 324 දක්වා සටහන් අංක 34 (අ) 2 මගින් දැක්වේ.

2.7.1.4 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල

2013 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයින් හට ඔවුන්ගේ කැමැත්ත අනුව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව ඇත. බැංකුව විසින් මෙම අරමුදල සඳහා දායක නොවන අතර බැංකු සේවකයන් විසින් ඔවුන්ගේ මූලික වැටුපින් 5% ක් මාසිකව දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

2.7.2 විශ්‍රාම පාරිතෝෂික

සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග 1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු සේවකයින් සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමයට ඇතුළත් වේ. එහෙයින් ඔවුන් සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ හිමිවන අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් නොකියයි. කෙසේ වුව ද, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව පවතී. එහෙයින් වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම යනු ලබන හෝ විශ්‍රාම යාම හැරුණු කොට වෙනත් හේතු මත වසර 05 කට පසු සේවා කාලය අවසන් වන සේවකයින්හට 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ සේවාවසාන පාරිතෝෂික දීමනා හිමිකර ගැනීමේ අවස්ථාව හිමි වේ. මේ යටතේ සිය සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසන් මාසය සඳහා ගෙවන ලද දළ වැටුප මෙන් මාස 1/2 ක අනුපාතයක් යටතේ අඛණ්ඩ සේවයේ නියැළුණු සෑම වසරක් වෙනුවෙන්ම පාරිතෝෂික දීමනා ගෙවනු ලබයි.

කළමනාකාරිත්වයේ අදහස හා පසුගිය අත්දැකීම් වලට අනුව එබඳු සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය විරලය. වාර්තා කරන දිනට සැලකිය යුතු වගකීමක් වාර්තා නොවුවහොත්, සේවා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන වෙන් කරනු නොලබයි. 1983 අංක 12 දරන සේවා පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ඉහත දැක්වූ අන්දමේ සිදුවීමක් මත සේවකයෙකුහට සේවා පාරිතෝෂික ගෙවීම සිදු කළහොත්, එය ගෙවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පාරිතෝෂික වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

2.7.3 පශ්චාත් සේවා වෛද්‍ය ප්‍රතිලාභ

විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. මේ සැලසුම යටතේ ඇති වත්කම් බැංකුවේ සෙසු වත්කම් වලින් ස්වාධීනව පවත්වා ගෙන යනු ලබන අතර, එම අරමුදලෙහි භාරකාර ඔප්පුවෙහි ප්‍රතිපාදන ප්‍රකාර බැංකුවේ කළමනාකාරිත්වය හා සේවකයින් නියෝජනය කරනු ලබන කළමනාකාර/භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලබයි.

වරින් වර සිදු කරනු ලබන ජීවගණක නිර්දේශ මත බැංකුවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර සැලසුම් ක්‍රමය වෙත දායක කරනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 96.1 ක් මේ සඳහා ප්‍රතිපාදනය කර ඇත.

පශ්චාත් සේවා වෛද්‍ය ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 335 සහ 336 සටහන් අංක 34 (අ) 3 මගින් දැක්වේ.

2.7.4 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලසුම් පිළිබඳ විස්තර පිටු අංක 287 හි සටහන් අංක 11 මගින් දැක්වේ.

2.8 වෙනත් වගකීම් →

වෙනත් වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 328 හි සටහන් අංක 34 මගින් දැක්වේ.

2.9 ප්‍රතිපාදන →

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහය හමුවේ ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) ඇති විට හා එකී බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලායාම අවශ්‍යවීම හව්‍ය වන විටක

සහ බැඳීම් ප්‍රමාණයෙහි විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විටකදී ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කිරීමෙන් අනතුරුවය.

2.9.1 වංචා සහගතව මුදල් ආපසු ගැනීම් වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන

2017 දෙසැම්බර් 31 දිනට හඳුනාගනු ලැබූ වංචා සහගත මුදල් ආපසු ගැනීම් වලට අදාළ මුළු වටිනාකම රු. මිලියන 94.7 ක් විය. රු. මිලියන 85.7 ක ප්‍රතිපාදන මේ වනවිටත් ගිණුමෙහි පවතී.

2.10 අසම්භාව්‍ය වගකීම් හා බැදියාවන් →

අසම්භාව්‍ය වගකීම් හා බැදියාවන් පිළිබඳ විස්තර පිටු අංක 344 සහ 345 දක්වා සටහන් අංක 39 මගින් දැක්වේ.

2.11 බදු →

2.11.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු පිළිබඳ විස්තර පිටු අංක 289 හි සටහන් අංක 13 මගින් දැක්වේ.

2.11.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 289 හා 324 හි පිළිවෙලින් සටහන් අංක 13 හා 29 මගින් දැක්වේ.

2.11.3 මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 25 (අ) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ගණනය කෙරෙයි.

ආර්ථික ක්ෂයවීම් හා සේවක පාරිශ්‍රමික සඳහා ගලපන ලද මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය මත 15% ක් මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ලෙස ගෙවිය යුතුවේ.

2.11.4 මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු

2014 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කරනු ලබයි. මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු පදනම මත, මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු 2% ක් ගෙවිය යුතුය.

2.11.5 ආර්ථික සේවා ගාස්තු

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සහ එහි සංශෝධන යටතේ 2006 අප්‍රේල් 01 දින සිට ආර්ථික සේවා ගාස්තුව ගෙවිය යුතු වේ. මීට ප්‍රථම මෙය 2004 අංක 11 දරන මුදල් පනත හා 2005 අංක 11 දරන මුදල් පනත යටතේ 2004 අප්‍රේල් 01 දින සිට 2006 අප්‍රේල් 01 දින දක්වා ක්‍රියාත්මක විය. අදාළ පිරිවැටුම මත 0.25% ක අනුපාතිකයක් අදාළ වේ. හිමිකම් නොකී ආර්ථික සේවා ගාස්තු වේ නම්, එය ඉදිරියට ගෙන ගිය හැකි අතර ඉදිරි පස් අවුරුදු කාලය තුළ ගෙවිය යුතු ආදායම් බදු වලට එය හිලව් කළ හැකිය. 2017 අයවැය යෝජනා අනුව 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වූ පරිදි අදාළ පිරිවැටුම මත 0.50% ක් දක්වා අදාළ අනුපාතිකය වැඩිවිය යුතු අතර, ප්‍රවර්තන වර්ෂය ද ඇතුලුව වසර 03 ක් දක්වා අදාළ කාලපරිච්ඡේදය සීමා කළයුතු වේ.

2004 අංක 11 දරන මුදල් පනතේ ප්‍රතිපාදන හා එහි සංශෝධන ප්‍රකාර, ආර්ථික සේවා ගාස්තුව, 2004 අප්‍රේල් 01 දින සිට හඳුන්වා දෙන ලදී. දැනට ආර්ථික සේවා ගාස්තුව, මුක්ත පිරිවැටුමින් 0.25% තෙක් ගෙවිය යුතු වන අතර ආදායම් බදු වෙතින් එය අඩු කරනු ලැබේ. හිමිකම් නොකී ආර්ථික සේවා ගාස්තු වේ නම් එය ඉදිරියට ගෙන යා හැකි අතර ඉදිරි පස් අවුරුදු කාලය තුළ ගෙවිය යුතු ආදායම් බදු වලට එය හිලව් කළ හැකිය.

2.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශය →

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ල.ගි.ප්‍ර. 7) අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කර ගෙනය. මුදල් හා මුදල් සමානයන්, කිසියම් මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන වලින් සමන්විත වන අතර, වටිනාකම වෙනස්වීමේ නොසැලකිය යුතු තරම් වන අවදානමකට බඳුන් වෙයි. අතැති මුදල්, බැංකු වල තැන්පත් කර ඇති මුදල් ශේෂයන් හා කෙටි දැනුම්දීමකින් ලබා ගත හැකි මුදල්, මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ.

2.13 නියාමන ප්‍රතිපාදන →

2.13.1 තැන්පතු සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව අදාළ වන ව්‍යවස්ථාපිත අනුපාතිකය වන 0.10% ක් ලෙස, බැංකුව විසින් යෝග්‍ය තැන්පතු පදනම මත රක්ෂණ වාරිකය ගණනය කරයි. රක්ෂණ නියාමන මගින් දක්වා ඇති පරිදි සෑම කාර්තුවක් අවසානයේ සිටම දින 15 ක කාලසීමාවක් ඇතුළත අදාළ වාරිකය බැංකුව විසින් ගෙවා ඇත.

2.13.2 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතෙහි 14 වන වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර 2013 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බෝග රක්ෂණ අයබද්ද හඳුන්වා දෙනු ලැබූ අතර, එය ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවිය යුතු වේ. මේ වන විට බදු පසු ලාභයෙන් 1% ක් බෝග රක්ෂණ අයබදු ලෙස ගෙවිය යුතුය.

2.14 වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් →

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ විස්තර පිටු අංක 351 හි සටහන් අංක 46 මගින් දැක්වේ.

2.15 නිකුත් කරන ලද මුත් වාර්තා කරන දිනට බල නොපැවැත්වෙන ප්‍රමිතීන් →

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් නිකුත් කර ඇති පහත සඳහන් ශ්‍රී ලංකා වාර්තා කරන ප්‍රමිතීන්, බැංකුව හා සමූහය විසින් දැනට උපයෝගී කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති මත බලපෑමක් ඇති කළ හැකි අතර, අනාගත මූල්‍ය ප්‍රකාශ කෙරෙහිද බලපෑමක් ඇති කළ හැකිය.

2.15.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9) මූල්‍ය උපකරණ: වර්ගීකරණය හා ගණනය කිරීම

2014 ජූලි මස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9) මූල්‍ය උපකරණ ප්‍රමිතීන් (අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ මණ්ඩලය අනුව) නිකුත් කරන ලදී. එමගින් 2018 ජනවාරි 01 දින හෝ ඉන් පසුව වාර්ෂික කාලසීමාවන් සඳහා වන (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) ප්‍රමිතීන් ආදේශ වනු ඇත.

බැංකුව විසින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් නිර්ණය කිරීමේ කාලසීමාවක් (මූලික බලපෑම් ඇගැයීමේ අභ්‍යාසය) සහ ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවක් (විසඳුම් සැලසුම් කිරීම) ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලං.මූ.වා ප්‍රමිතීන් ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ බැංකුව විසින් සැලකිය යුතු විශ්ලේෂණයක් සිදු කළ අතර, එතෙක් තාවකාලික ගිණුම්කරණ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබිණි.

ශ්‍රී ල.මූ.වා. ප්‍රමිතීන් 9 හි මූලික විශේෂාංග පහත දැක්වේ:

2.15.1.1 වර්ගීකරණය සහ මිනීම

වර්ගීකරණය සහ මිනීම අතින් ගත්විට උපකරණ වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ විශේෂාංග හා වත්කම් කළමනාකරණය කිරීම සඳහා ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය යන සංකලනය මත පදනම්ව හිමිකම් උපකරණ සහ ව්‍යුත්පන්න හැර සියලු මූල්‍ය වත්කම් ඇගයීමට නව ප්‍රමිතිය අත්‍යවශ්‍ය වනු ඇත.

ව්‍යාපාරික ආකෘතිය ඇගයීම

සිය අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය වත්කම් කළමනාකරණය කරන අයුරු හොඳින්ම පිළබිඹු වන මට්ටමට බැංකුව විසින් එහි ව්‍යාපාරික ආකෘතිය තීරණය කරනු ලබයි. බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයෙන් උපකරණය යන පදනම නොව වඩාත් ඉහළ මට්ටමේ කළඹ එකතුව මත ඇගයීමට ලක් වන අතර, පහත සඳහන් නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ:

- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්යසාධනය සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් අගයන අයුරු හා ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත වාර්තා කරනු ලබන අයුරු.
- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනයට බලපානු ලබන අවදානම් (සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම්) හා විශේෂයෙන්ම එකී අවදානම් කළමනාකරණය කරන අයුරු.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් හානිපූරණය කෙරෙන අයුරු (උදා: වශයෙන් කළමනාකරණය කරනු ලබන වත්කම් වල සාධාරණ වටිනාකම මත නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත හානිපූරණය කෙරේද).
- අපේක්ෂිත වාර ගණන, වටිනාකම හා විකුණුම් සිදු කරනු ලබන කාලසීමාව යනාදියද බැංකු මගින් කරනු ලබන ඇගයීමේදී වැදගත් අංගයක් වේ.

ආතති සිදුවීම් හා වියහැකි නරකම සිදුවීම් සැලකිල්ලට නොගෙන පිළිගත හැකි අපේක්ෂිත සිදුවීම් මත පදනම්ව ව්‍යාපාරික ආකෘතිය ඇගයීම සිදු කෙරේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව බැංකුවේ මුල් අපේක්ෂාවට වඩා වෙනස් අයුරින් මුදල් ප්‍රවාහ හඳුනාගනු ලැබේ නම්, එකී ව්‍යාපාරික ආකෘතියෙහි රඳවාගනු ලබන සෙසු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය බැංකුව විසින් වෙනස් නොකරන අතර, අලුතින් ජනිත හෝ අලුතින් මිලට ගනු ලැබූ මූල්‍ය වත්කම් අගය කිරීමේදී එකී විස්තර අන්තර්ගත කරනු ලැබේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ විශේෂාංග පරීක්ෂා කිරීම

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව වශයෙන් මුල් මුදල හා පොළිය ගෙවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වේදැයි හඳුනා ගැනීම පිණිස බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත නියමයන් අගයනු ලබයි. මෙම පරීක්ෂාවේදී මුල් මුදල නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමෙහි ජීවකාලය තුළ එය වෙනස් විය හැකිය. (උදා: වශයෙන් මුල් මුදල යළි ගෙවීම හෝ අධිමිල/වට්ටම් ක්‍රමක්ෂය වීම් මත)

ණය දීමේ ක්‍රියාවලිය තුළ වඩාත් වැදගත් පොළී සම්බන්ධ සාධක වන්නේ ණය අවදානම සහ මුදල් වල කාලීන අගය පිළිබඳ සලකා බැලීමයි. ඉහත කී ඇගයීම සිදුකිරීම පිණිස මූල්‍ය වත්කම පවතින මුදල් වර්ගය සහ පොළී අනුපාතිකය අදාළ වන කාලසීමාව ආදී කරුණු බැංකුව විසින් සලකා බලා විනිශ්චයකට එළඹෙයි.

අවදානමට ඇති අවම නිරාවරණය වීම් හෝ වෙනස් වීම් හඳුන්වා දෙනු ලබන ගිවිසුම්ගත නිරාවරණය වීම් වලට වඩා මූලික ණය දීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොමැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, හිඟ මුදල් මත පමණක් මුල් මුදල් හා පොළී ගෙවීම් වලට තුඩු නොදෙයි. එවන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ලාභ අලාභ අනුව ගණනය කළ යුතු වේ.

මූලික බලපෑම් ඇගයීමේ අභ්‍යාසයට අනුව මූල්‍ය වත්කම් වර්ගීකරණයට අදාළව බැංකුවේ මූල්‍ය ප්‍රකාශයට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

2.15.1.2 මූල්‍ය වත්කම් හානිකරණය

අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපත්තිය අධීක්ෂණය

"මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මිනීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 39 වෙනුවට ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 ආදේශවීම තුළින් බැංකුවේ හානිකරණ ප්‍රතිපාදන වෙනසකට බඳුන්වනු ඇත.

ආරම්භයේ පටන් සැලකිය යුතු ණය අවදානම් වර්ධනයක් නොමැති විටකදී ණය පාඩු දීමනාව මාස 12 කට අපේක්ෂිත ණය පාඩු ලෙස ගණනය වෙයි. එසේ නොමැති වූ විට වත්කමක ජීවකාලය තුළ පැන නැගීමට ඉඩ ඇති ණය පාඩු මත පදනම්ව අපේක්ෂිත ණය පාඩු දීමනාව තීරණය වෙයි.

මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යනු වාර්තාකරනු ලබන දිනෙන් මාස 12 ක් තුළ මූල්‍ය උපකරණ මත පැහැර හැරීමේ සිදුවීම් මගින් ජනිත අපේක්ෂිත ණය පාඩු මගින් නියෝජනය කරනු ලබන ජීවකාල අපේක්ෂිත ණය පාඩු කොටසකි. බැංකුව විසින් සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම යම් මූල්‍ය උපකරණයකට ණය අවදානම මූලික හඳුනා ගැනීමේ පටන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිදැයි මැනීමේ ඇගයීමක් කිරීමේ ප්‍රතිපත්තියක් ගෙන ඇත. එබඳු ක්‍රියාවලි මත පදනම්ව බැංකුව විසින් 1 අදියර, 2 අදියර, 3 අදියර ලෙස ණය කාණ්ඩ ගත කරනු ලබයි.

1 වන අදියර ණය පාඩුව හඳුනා ගනු ලැබූ විට බැංකුව විසින් මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු මත පදනම්වූ දීමනාවක් බැංකුව විසින් හඳුනා ගනු ලබයි. ණය අවදානම වර්ධනය වී ඇති විට සහ 2 වන අදියරෙන් ණය යළි වර්ගීකරණය කර ඇති විට එම පහසුකම් 1 වන අදියරේ ණය වලට ඇතුළත් වේ. 1 වන අදියරේ ඇගයීම සාමූහිකව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2 වන අදියර ආරම්භයේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් ණය මගින් පෙන්වනු ලබන විට බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ණය අවදානම වර්ධනය වී ඇති සහ 2 වන අදියරෙනි යළි වර්ගීකරණය වී ඇති ණය පහසුකම් 2 වන අදියරේ ණය යටතට අයත් වේ. 2 වන අදියරේ ඇගයීම සාමූහිකව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

3 වන අදියර ණය හානිකරණය වී ඇති/ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වාර්තා කරන උද්ගත විය හැකි පාඩු පිළිබඳ විෂයානුබද්ධ සාක්ෂි සහිත ණය 3 වන අදියරේ ඇගයීම සාමූහිකව/වෙන් වෙන්ව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ණය අවදානම සැලකිය යුතු ලෙස වර්ධනයවීම

යම් උපකරණයක් හා උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය පාඩු හෝ ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා බඳුන්වී දැයි තීරණය කරගනු පිණිස අපේක්ෂිත ණය පාඩු යටතට ගැනෙන සියලු වත්කම් බැංකුව විසින් අබණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් සිදු වී ඇත්දැයි බැංකුව විසින් අගයනු ලබයි. පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන ලද විට ණය අවදානම සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති බව බැංකුව විසින් සලකනු ලබයි.

- ගෙවීමට නියමිතව දින 30 ඉක්මවූ පහසුකම්
- ප්‍රතිව්‍යුහගත පහසුකම්
- ගනුදෙනුකරුවෙකු/පහසුකමක් නිරීක්ෂක ලැයිස්තුවට මාරු කිරීම ආදී වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වර්ධනය කරනු ලබන ද්විතීයික ගුණාත්මක දර්ශක.

වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය

වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු නමුත් වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය ආරම්භයේ පටන් සැලකියුතු ණය ක්ෂයවීම් තිබී ඇත්දැයි යන නිර්ණායක මත පදනම්ව 1 වන හෝ 2 වන අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලබයි.

බැංකුවේ සැලකිය යුතු ණය පහත යාම් සනිටුහන් කර ගැනීමේදී පහත නිර්ණායක සලකා බලනු ලබයි:

- උපකරණ මූලාරම්භයේදී සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි දැනට පවතින මූල්‍ය උපකරණ වල කොන්දේසි හෝ අනුපාතික වල වෙනස්කම්
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණවල ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපොළවල සැලකිය යුතු වෙනස්කම් දර්ශක
- ණයකරුවෙකුගේ ණය/හිමිකම් කොටස් උපකරණ වල අගයෙහි වෙනස්කම් ආදී ණයකරුට සම්බන්ධ වෙනත් තොරතුරු
- ණයකරු සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහතට ගැනීම හෝ අභ්‍යන්තර වශයෙන් ණය අවදානම ඇගයීමට යොදා ගනු ලබන චර්යාත්මක ලකුණු වල පහත වැටීම.
- දැනට පවතින හෝ ඉදිරියට පුරෝකථනය කළ අහිතකර ව්‍යාපාරික වෙනස්වීම්, ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම් වලට තුඩුදෙන මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයන්.
- ආදායමෙහි සත්‍ය හෝ අපේක්ෂිත අඩුවීම, මෙහෙයුම් අවදානම ඉහළයාම, ප්‍රාග්ධන හිඟය, වත්කමෙහි ගුණාත්මක බව අඩුවීම, ද්‍රවශීල කළමනාකාරීත්වයට අදාළ ගැටළු වලට අදාළව ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵල වල සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීම්
- එකම ණයකරුගේ වෙනත් මූල්‍ය උපකරණ මත ණය අවදානම සැලකිය යුතු ලෙස වර්ධනයවීම.
- ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම් වලට තුඩු දෙන ණයකරුගේ නියාමන, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයෙහි සිදුවන සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු අහිතකර වෙනස්වීම්

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම

සඵල පොළී අනුපාතිකයට ආසන්න ලෙස වට්ටම් සපයන ලදුව අපේක්ෂිත මුදල් ප්‍රාප්තිය මිනීමට භාවිත කරන සම්භාවිතාවය අතින් බර තැබූ සිදුවීම් ත්‍රිත්වය මත පදනම්ව බැංකුව විසින් අපේක්ෂිත ණය පාඩු ගණනය කරනු ලබයි. මුදල් හිඟය යනු ගිවිසුම් අනුව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හා ගිවිසුම ප්‍රකාර යම් ආයතනයක් විසින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර පරතරයයි.

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි සැකෙවින් දක්වා ඇති අතර, ප්‍රධාන සාධක පහත පරිදි වේ:

පැහැර හැරීමේ සම්භාවිතාවය – මෙය වූ කලී යම් කාලසීමාවක් තුළ ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව පිළිබඳ ඇස්තමේන්තුවයි. යම් පහසුකමක් මීට පෙර හඳුනාගෙන නොතිබිණි නම් සහ තවමත් කළඹට අයත් නම්, ඇගයීමට බඳුන් වූ කාලපරිච්ඡේදය තුළ යම් කාලසීමාවකදී පමණක් පැහැර හැරීම සිදුවිය හැකිය.

පැහැර හැරීමට නිරාවරණයවීම – මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත ලේඛනගත කර මුල් මුදල සහ පොළිය ආපසු ගෙවීමද ඇතුළුව ව්‍යාර්තා කළ දිනට පසුව නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණයවීමේ තක්සේරුවයි.

පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව – මෙය වූ කලී යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විටක උද්ගත වන පාඩුව ඇස්තමේන්තු කිරීමයි. කිසියම් පාර්ශ්වයක් උපචිතවීමද ඇතුළුව ණය හිමියන් විසින් ලබා ගැනීමට අපේක්ෂිත සහ ලබා ගැනීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමට නිරාවරණයවීමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි.

ප්‍රක්ෂේපිත තොරතුරු

අපේක්ෂිත ණය පාඩු ආකෘතියේදී බැංකුව විසින් ආර්ථික සාධක ලෙස පහත සඳහන් ආකාරයේ පුළුල් පරාසයක ගුණාත්මක/ප්‍රමාණාත්මක ප්‍රක්ෂේපිත තොරතුරු මත රඳා පවතී:

ප්‍රමාණාත්මක	ගුණාත්මක
දළ දේශීය නිෂ්පාදිත වර්ධනය	රාජ්‍ය ප්‍රතිපත්ති
උද්ධමනය	කාර්මික ව්‍යාපාරයේ තත්ත්වය
විරැකියාව	නියාමනයන්හි බලපෑම
පොළී අනුපාත	
හුවමාරු අනුපාතික	

2.15.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 15) "ගනුදෙනුකරුවන් සමඟ පවතින ගිවිසුම් මත ආදායම"

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.15 මගින් කොපමණ ආදායමක් කෙදිනට වාර්තා කළ යුතුද යන්න තීරණය කිරීම පිණිස විස්තීරණ රාමුවක් ස්ථාපිත කෙරෙයි. ඒ මගින් ශ්‍රී ලං.ගි.ප්‍ර. 18 – "ආදායම", ශ්‍රී ලං.ගි.ප්‍ර. 11 – "ඉදිකිරීම් ගිවිසුම්" සහ IFRIC – 13 "පාරිභෝගික පක්ෂපාත වැඩසටහන්" යනාදී දැනට ක්‍රියාත්මක වන ආදායම් වාර්තා කිරීමේ ප්‍රමිතීන් හා නිර්වචනයන් ප්‍රතිශ්ඨාපනය කරයි. 2018 ජනවාරි 01 දින හෝ ඉන් පසුව එළඹෙන මූල්‍ය වර්ෂ සඳහා මෙම ප්‍රමිතිය බල පැවැත්වෙයි.

මෙකී ප්‍රමිතීන් බල පැවැත්වෙන කල්හි, බැංකුව හා සමූහය විසින්ද එම ප්‍රමිතීන් අනුගමනය කරනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයක් සම්පූර්ණ කිරීමට ඉදිරියේදී නියමිත බැවින් මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරනු ලබන දිනට මූල්‍ය බලපෑම නිශ්චිතවම ඇස්තමේන්තු කළ නොහැක.

2.15.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 16) – කල්බදු

කල්බදු හඳුනා ගැනීම, ගණනය කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන ප්‍රතිපත්ති මෙම ප්‍රමිතීන් මගින් දැක්වෙයි. මෙහි අරමුණ වන්නේ කල්බදු හිමියා විසින් එම ගනුදෙනු විශ්වසනීය ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගැනීමයි. යම් ආයතනයක මූල්‍ය ප්‍රවාහය, මූල්‍ය තත්ත්වය හා ක්‍රියාකාරිත්වය මත කල් බදු මගින් ඇති කරලන බලපෑම තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්හට මෙම තොරතුරු ඉවහල් වේ. මෙම ප්‍රමිතිය මගින් පහත ප්‍රමිතීන් හා අර්ථකථන අවලංගු වේ:

(අ) LKAS 17 කල්බදු

(ආ) IFRIC 4 යම් එකඟවීමක් කල්බදු වලින් සමන්විතදැයි තීරණය කිරීම

(ඇ) SIC 15 මෙහෙයුම් කල්බදු දිරිගැන්වීම් සහ

(ඈ) SIC 27 කල්බදුවල නෛතික ස්වරූපයට අයත් ගනුදෙනු ඇගයීම

2019 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තා කිරීම් පරිච්ඡේද සඳහා ආයතන විසින් මෙම ප්‍රමිතිය යොදා ගනු ලැබෙයි. එම ප්‍රමිතීන් ක්‍රියාත්මක වන විට බැංකුව හා සමූහය විසින් ද එම ප්‍රමිතීන් අනුගමනය කරනු ඇත.

සවිස්තරාත්මක සමාලෝචනයක අවසානයට පැමිණ නොමැති හෙයින් මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරනු ලබන දින වන විට මූල්‍යමය බලපෑම් සාධාරණ ලෙස විනිශ්චය කළ නොහැකි විය.

3. දළ ආදායම →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම හා ආදායම, විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා දළ ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හඳුනා ගැනීමට ප්‍රථම වෙනත් විශේෂිත නිර්ණායක ඒ ඒ ආදායමට අදාළ සටහන් යටතේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
පොළී ආදායම	**103,399,962**	86,390,039	**104,245,541**	87,142,784
ගාස්තු හා කොමිස් ආදායම	**782,776**	650,164	**785,077**	651,160
වෙළඳාම් කටයුතු වලින් ශුද්ධ ලාභය/(අලාභය)	**1,206,408**	(39,270)	**1,520,740**	(136,897)
මූල්‍ය ආයෝජන වලින් ශුද්ධ ලාභය/(අලාභය)	**707,491**	40,923	**707,491**	40,923
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	**1,720,272**	357,288	**796,897**	340,640
දළ ආදායම	**107,816,909**	87,399,144	**108,055,746**	88,038,610

4. ශුද්ධ පොළී ආදායම →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී ආදායම සහ පොළී වියදම හඳුනා ගැනීම

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා හා විකිණීම සඳහා පවතින වත්කම් ලෙස වර්ග කරන ලද පොළී සහිත මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ සඳහා පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළී අනුපාත භාවිතයෙනි. මෙය මූල්‍ය උපකරණයෙන් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ ඊට අඩු කාලසීමාවක් තුළ තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් සුදුසු විටකදී මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි පවතින ශුද්ධ අගයට නිශ්චිතව අඩුකරන අනුපාතයයි. මෙම ගණනය කිරීම සඳහා මූල්‍ය උපකරණයෙහි සියලුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි (උදාහරණ වශයෙන් කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගනු ලබන අතර, මූල්‍ය උපකරණයට සෘජුවම සම්බන්ධ හා සඵල පොළී අනුපාතයෙහි සංකලිත කොටසක් වන කිසියම් ගාස්තු හෝ වර්ධක පිරිවැය මීට ඇතුළු වන මුත් අනාගත ණය පාඩු ඊට අන්තර්ගත නොවේ.

සමූහය විසින් එහි ගෙවීම් හෝ ලැබීම්වල තක්සේරු අගයන් සංශෝධනය කෙරෙයි නම්, මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ධාරණ අගයද ගලපනු ලබයි. මුල් සඵල පොළී අනුපාත මත පදනම්ව අදාළ ගැලපීම් වලින් පසු ධාරණ අගය ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වාර්තා කරනු ලබයි. කෙසේ වුවද, ලද මුදලෙහි ඉහළ ගිය අයකර ගැනීම් හැකියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ තක්සේරු පසුව වැඩි කරනු ලබන ප්‍රතිවර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා තක්සේරුව වෙනස් කළ දින සිටම එම වැඩිකිරීම්වල බලපෑම සඵල පොළී අනුපාතිකයට කළ ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

හානිකරණ අලාභය හේතු කොට ගෙන මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තා කළ අගය අඩුවූ විටද හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතයම භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරෙයි.

4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
4. (අ) පොළී ආදායම →				
මුදල් හා මුදල් සමානයන්	**51,967**	37,992	**51,967**	37,992
බැංකුවල ඇති තැන්පතු	**710,462**	597,916	**710,462**	597,916
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**–**	–	**–**	–
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**1,337,694**	1,370,010	**1,854,041**	1,816,446
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**3,178,875**	2,751,558	**3,180,780**	2,756,295
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	**40,580,453**	29,937,593	**40,411,921**	29,916,980
මූල්‍ය ආයෝජන – විකිණීම සඳහා පවතින	**568,219**	36,612	**725,318**	195,556
මූල්‍ය ආයෝජන – කල් පිරීම තෙක් දරා සිටින	**56,972,292**	51,658,359	**57,311,051**	51,821,600
මුළු පොළී ආදායම	**103,399,962**	86,390,039	**104,245,541**	87,142,784
4. (ආ) පොළී වියදම් →				
බැංකුවට ගෙවිය යුතු	**–**	–	**267,689**	44,951
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**60,161,942**	44,365,840	**60,161,942**	44,365,840
වෙනත් ණය ගැනීම්	**17,502,883**	16,550,970	**17,777,965**	17,036,696
යටත්කාලීන වගකීම්	**780,000**	6,411	**780,000**	6,411
මුළු පොළී වියදම්	**78,444,825**	60,923,221	**78,987,596**	61,453,898
ශුද්ධ පොළී ආදායම	**24,955,137**	25,466,818	**25,257,945**	25,688,886
4. (ඇ) රජයේ සුරැකුම්පත් වලින් ලත් ශුද්ධ පොළී ආදායම →				
පොළී ආදායම	**58,878,205**	53,064,981	**59,890,410**	53,833,602
(අඩු කළා): පොළී වියදම්	**–**	–	**–**	–
ශුද්ධ පොළී ආදායම	**58,878,205**	53,064,981	**59,890,410**	53,833,602

4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි) →

4. (ඈ) ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු වන රජයේ සුරැකුම්පත් සඳහා රදවා ගත් බදු වලට හිමි කාල්පනික බදු බැර →

2006 අංක 10 දරන සශෝධිත දේශීය ආදායම් බදු පනතෙහි 137 වන වගන්තිය ප්‍රකාර රජයේ සුරැකුම්පත් මගින් සිදු කරන වෙළඳපොළ ගනුදෙනු වලින් උපයන පොළී ආදායමින් 1/9 ක කොටසකට සමාන කාල්පනික බදු බැර සඳහා හිමිකම සමූහය වෙත ඇත.

ඒ අනුව රජයේ සුරැකුම්පත් මගින් සිදු කරන ද්විතීයික වෙළඳපොළ ගනුදෙනුවලින් සමූහය උපයන ශුද්ධ ආදායම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති අතර, එහි ප්‍රතිඵල ලෙස කාල්පනික බදු බැර බැංකුව සඳහා රුපියල් මිලියන 4,787 ක්ද (2016 රුපියල් මිලියන 4,447) සමූහය සඳහා රුපියල් මිලියන 4,815 (2016 රුපියල් මිලියන 4,467) ක්ද වේ.

4. (ඉ) ලැබිය යුතු කාල්පනික බදු →

අය කර ගත හැකි මුදල් අඩු කිරීමෙන් අනතුරුව ලැබිය යුතු කාල්පනික බදු ප්‍රමාණය, මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30 හි දක්වා ඇත.

5. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුකරුවන්ට සපයනු ලබන විවිධ වූ සේවාවන්ගෙන් සමූහය, ගාස්තු සහ කොමිස් ආදායම උපයාගන්නා අතර, එම සේවාවන් කාණ්ඩ දෙකකට බෙදා වෙන් කළ හැකිය.

(අ) යම් කාලසීමාවක් පුරා සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගන්නා ගාස්තු හා කොමිස් ආදායම

යම් කාලසීමාවක් පුරා සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම එම කාලසීමාව පුරා උපචිත කර හඳුනාගනු ලැබේ.

(ආ) ගනුදෙනු සේවා සැපයීම වෙනුවෙන් ලද ගාස්තු හා කොමිස් ආදායම

තෙවන පාර්ශව වෙනුවෙන් සිදුකරන ගනුදෙනු සාකච්ඡා කිරීම් හෝ යළි සලකා බැලීම් වලින් ලද ගාස්තු හා කොමිස් ආදායම් එම ගනුදෙනු සම්පූර්ණ වීමෙන් අනතුරුව හඳුනාගනු ලබයි. කිසියම් කාර්යයක් ඉටුකිරීම හා සම්බන්ධවී ඇති ගාස්තු හෝ ගාස්තු කොටස් එම කාර්යය ඉටුකිරීමෙන් අනතුරුව හඳුනාගනියි.

ගනුදෙනු හා සේවා ගාස්තු වලට අදාළ ගාස්තු හා කොමිස් වියදම් එම සේවාවන් ලැබීමෙන් පසුව හඳුනාගනියි. ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට ගිණුම්ගත කරයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ගාස්තු හා කොමිස් ආදායම	**782,776**	650,164	**785,077**	651,160
ගාස්තු හා කොමිස් වියදම	**(109,082)**	(137,432)	**(113,037)**	(140,122)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**673,694**	512,732	**672,040**	511,038
උපයන ලද්දේ				
ණය	**675,382**	547,761	**675,382**	547,760
කාඩ්පත්	**(43,413)**	(76,986)	**(43,413)**	(76,986)
වෙනත්	**41,726**	41,957	**40,071**	40,264
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**673,694**	512,732	**672,040**	511,038

6. වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී ආදායම/විදේශ විනිමය හුවමාරුවෙන් ලත් ආදායම හැරුණුවිට වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වලට අදාළ ලාභාංශ හා සාධාරණ අගය වෙනස්වීම් මත ඇතිවන සියලුම ලාභ සහ අලාභ වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ආදායමට ඇතුලත්ය.

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
විදේශ විනිමය				
අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන්	**200,639**	296,380	**200,639**	296,380
පොළී අනුපාත – වෙළඳපොළ ගැලපීම් ලාභ/(අලාභ) හා වෙනත්	**973,468**	(72,705)	**1,287,800**	(170,332)
හිමිකම් – වෙළඳපොළ ගැලපීම් ලාභ/(අලාභ) හා වෙනත්	**334,601**	(314,945)	**334,601**	(314,945)
වෙනත් – පොළී අනුපාතික හුවමාරු	**(302,300)**	52,000	**(302,300)**	52,000
එකතුව	**1,206,408**	(39,270)	**1,520,740**	(136,897)

7. ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(අලාභ) →

බැංකුව/සමූහය විසින් වාර්තා කරන දිනට කිසිදු මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කර නොමැත.

8. මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභය/(අලාභය) →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

විකිණීම සඳහා පවතින ආයෝජන, ණය සහ ලැබිය යුතු දෑ වලට අදාළ ශුද්ධ ලාභ සහ සියළුම උපලබ්ධි වූ හා උපලබ්ධි නොවූ සාධාරණ අගය වෙනස්වීම්, මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(අලාභ)වල ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
විකිණීම සඳහා පවතින වත්කම්				
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත්	**707,491**	40,923	**707,491**	40,923
එකතුව	**707,491**	40,923	**707,491**	40,923

9. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

i. දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභය/(අලාභය)

ඉවත් කරනු ලබන දිනට වත්කම්වල ධාරණ අගය හා ශුද්ධ විකුණුම් මිල අතර වෙනස මගින් දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභ/(අලාභ) තීරණය වේ. සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ හිමිකම විකුණුම්කරු වෙත මාරු කරනු ලබන වර්ෂයේදී මෙය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

ii. විදේශ විනිමය ලාභ/(අලාභ)

සෑම වාර්තාකරණ දිනකටම විදේශ විනිමය තත්ත්වය යලි පරිවර්තනය කෙරෙයි. විනිමය අනුපාතික වෙනස්වීම මත ඇතිවන ලාභ/(අලාභ) ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

iii. ලාභාංශ ආදායම

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන වලින් ඉපයෙන ලාභාංශ හඳුනාගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
දේපල, පිරියත, උපකරණ විකිණීමෙන් ලත් ලාභ	**2,826**	70,016	**2,824**	70,014
විදේශ විනිමය යළි අගය කිරීමෙන් ලත් ලාභ/(අලාභ)	**111,687**	16,726	**111,687**	16,726
හිමිකම් කොටස් – ලාභාංශ ආදායම	**163,707**	137,747	**163,743**	137,774
පරිපාලිත සමාගමෙන් ලත් ලාභාංශ ආදායම	**922,350**	14,850	**–**	–
වෙනත්	**519,702**	117,950	**518,643**	116,126
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	**1,720,272**	357,288	**796,897**	340,640

10. ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණය →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මිනීම අනුව ණය හා ලැබිය යුතු දෑ – බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙනුවෙන් සිදුකළ හානිකරණ ප්‍රතිපාදනයේ වෙනස්වීම් සමූහය විසින් හඳුනාගනු ලබයි. හානිකරණය ඇගයීම වෙනුවෙන් උපයෝගී කරගත් ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් අංක 23 (ඈ) මගින් විස්තර කෙරෙයි. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හා ණය සහ ලැබිය යුතු දෑ වල ධාරණ අගයෙහි සිදුවන ස්ථාවර අඩුවීමකදී ද සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන වෙනස්කිරීම්/(නැවත වාර්තා කිරීම්) සිදු කරනු ලබයි. තවද, මූල්‍ය නොවන වත්කමක ධාරණ අගය එම වත්කමෙහි ඇස්තමේන්තුගත නැවත අය කරගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවලදී ද බැංකුව/සමූහය විසින් හානිකරණ අලාභ හඳුනාගනු ලැබෙයි.

10. ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණය (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ණය හා ලැබිය යුතු දෑ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් [සටහන 23(ඈ)]	**693,233**	(99,693)	**693,233**	(99,693)
එකතුව	**693,233**	(99,693)	**693,233**	(99,693)

11. සේවක මණ්ඩල වියදම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

i. නිර්වචිත දායකත්ව සැලසුම් →

සමූහය විසින් නිර්වචිත දායකත්ව සැලසුමක් මෙහෙයවනු ලබයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත දැක්විය හැකි දායකත්වය තීරණය වනුයේ සේවකයින් විසින් සමූහය වෙත ලබා දෙන සේවයට සමානුපාතිකව වන අතර, එය "සේවක මණ්ඩල වියදම්" යටතේ වාර්තා කරනු ලබයි. ගෙවිය යුතු දායකත්ව මුදල්, වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. සමූහය විසින් පහත සඳහන් නිර්වචිත දායකත්ව සැලසුම් වෙනුවෙන් එහි දායකත්වය දක්වනු ලබයි:

(අ) සේවක අර්ථසාධක අරමුදල

,බැංකුව හා සේවකයින් විසින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැරුණු විට) පිළිවෙලින් 12% ක් හා 8% ක් බැගින් අර්ථසාධක අරමුදලට දායක වනු ලබයි. බැංකුවේ අර්ථසාධක අරමුදල වූ කලී සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමැතිය ලද අරමුදලකි. බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් හට වාර්ෂිකව 8% ක ප්‍රතිලාභයක් සහතික කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම සහ එහි සේවකයින් විසින් 12% සහ 8% බැගින් පිළිවෙලින් දායක කරනු ලබයි.

(ආ) සේවක භාරකාර අරමුදල

සමූහය විසින් අතිකාල දීමනා හැර සේවකයින්ගේ මාසික දළ වැටුපින් 3% ක් සේවක භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි) →

ii. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් →

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.ගි.ප්‍ර. 19) සේවක ප්‍රතිලාභවලට අනුව සෑම නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් මත පදනම්ව ඒ ඒ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන වෙනම කරනු ලබන ජීවගණක තක්සේරුවක් මත දායකත්වය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
වැටුප් සහ ප්‍රසාද දීමනා	**5,576,762**	4,701,071	**5,604,513**	4,728,359
දායකවීම – සේවක අර්ථසාධක අරමුදල	**404,151**	354,545	**404,994**	355,301
දායකවීම – සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	**101,038**	88,637	**101,249**	88,826
දායකවීම – සේවක විශ්‍රාම අරමුදල – I (සටහන 11 (අ) හා 34(අ) 1)	**392,077**	577,594	**392,077**	577,797
දායකවීම – සේවක විශ්‍රාම අරමුදල – II (සටහන 11 (ආ) හා 34(අ) 2)	**97,240**	251,758	**97,572**	252,043
විශ්‍රාම පාරිතෝෂිකය (සටහන 34 (අ) 4)	**5,571**	14,590	**5,815**	14,837
විශ්‍රාමික සේවක වෛද්‍යාධාර යෝජනා ක්‍රමය (සටහන 34 (අ) 3)	**96,108**	71,698	**96,108**	71,698
වෙනත්	**213,558**	175,477	**216,486**	177,653
එකතුව	**6,886,505**	6,235,370	**6,918,813**	6,266,515

11. (අ) සේවක විශ්‍රාම වැටුප් අරමුදල – 1 සඳහා දායකත්වය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**392,077**	577,594	**392,077**	577,797

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජීවගණක සංගමයෙහි අධිසාමාජික පියල් එස්. ගුණතිලක සහ සමාගමෙහි පියල් එස්. ගුණතිලක මහතා 2017 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. [යොමුව සටහන් අංක 34 (අ)].

11. (ආ) සේවක විශ්‍රාම වැටුප් අරමුදල – 11 සඳහා දායකත්වය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**97,240**	251,758	**97,572**	252,043

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් අරමුදල – II ස්ථාපිත කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජීවගණක සංගමයෙහි අධිසාමාජික, පියල් එස්. ගුණතිලක සහ සමාගමෙහි පියල් එස්. ගුණතිලක මහතා 2017 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. [සටහන් අංක 34 (අ)].

12. වෙනත් වියදම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

දැරිය යුතු වන පිරිවැය සහ ආදායමට සම්බන්ධ නිශ්චිත අයිතමවල ඉපයීම් අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් වියදම් හඳුනාගනු ලබයි. කාර්යක්ෂම තත්ත්වයන් යටතේ දේපල, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමේදී හා ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේදී පැන නගින සියලු වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි දක්වා ඇත. පසුගිය සිදුවීමක් හේතුවෙන් සමූහය වෙත වත්මන් බැඳීමක් ඇති විට (නෛතික හෝ සම්ප්‍රයුක්ත) එකී බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කෙරෙන සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වියහැකි අතර, එමගින් බැඳීමේ ප්‍රමාණය පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වන අතර, සෙසු වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකයන්	**1,929**	1,879	**3,089**	2,755
විගණක පාරිශ්‍රමිකයන්	**5,478**	3,141	**5,988**	3,606
බෘත්තීය හා නීති වියදම්	**25,126**	38,359	**25,126**	38,359
දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම්	**315,741**	289,683	**316,492**	290,314
බදු දේපල ක්‍රමක්ෂය/වැඩිදියුණු කිරීම්	**11,415**	7,198	**11,415**	7,198
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	**96,391**	35,512	**96,444**	35,512
භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ ගාස්තු [සටහන 30 (අ)]	**320,000**	533,333	**320,000**	533,333
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	**2,828,558**	2,707,353	**2,832,989**	2,711,216
වෙනත්	**556,273**	492,080	**495,573**	446,624
එකතුව	**4,160,911**	4,108,538	**4,107,116**	4,068,918

13. ආදායම් බදු වියදම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.ගි.ප්‍ර. 12) හි ආදායම් බදු අනුව බදු වියදම් යනු කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය නිශ්චය කිරීමේදී ප්‍රවර්තන බද්ද සහ විලම්බිත බදු සඳහා ඇතුලත් කරනු ලබන සමාහාර අගයයි. හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම්හි සෘජුවම දක්වනු ලබන අයිතමවලට අදාළ වන සීමාව හැරුණුවිට ආදායම් බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන වර්ෂය මෙන්ම ඊට පෙර වර්ෂ සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවිය යුතු හෝ අය කර ගත යුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. එම ප්‍රමාණ ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද බදු අනුපාත හා බදු නීති, ශේෂපත්‍ර දිනට හෝ ඉන් පසුව නීතිගත කර ඇත. ඒ අනුව, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා එහි පරිශිෂ්ඨයන්හි ප්‍රතිපාදනයන්ට අනුව පහත අනුපාත යොදා ගනිමින් වර්ෂයට අදාළ ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

13. ආදායම් බදු වියදම් (සම්බන්ධයි) →

විලම්බිත බදුකරණය

වගකීම් ක්‍රමය උපයෝගී කරගනිමින් වාර්තාකරණ දිනට වත්කම් හා වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කිරීමේ අරමුණ පිණිස හඳුනාගන්නා අගය අතර, ඇති සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්බිත බද්ද සඳහා ප්‍රතිපාදනය කෙරේ.

සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම් වලට අදාළ විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. පාවිච්චි නොකළ බදු අලාභ හා පාවිච්චි නොකළ බදු බැර අයකර ගැනීමට ප්‍රමාණවත් අනාගත බදු වන ලාභ ලැබෙතැයි ගම්‍ය වනතාක් දුරට ඉදිරියට ගෙන ආ පාවිච්චි නොකළ බදු අලාභ සහ පාවිච්චි නොකළ බදු බැර සඳහා විලම්බිත බදු වත්කමක් හඳුනාගත යුතුය.

සෑම වාර්තාකරන දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන්ම කපාහැරීමට උපයෝගී කර ගැනීමේ වාසිය ලැබීමට ප්‍රමාණවත් තරම් බදු වන ලාභ ලැබෙතැයි තවදුරටත් හව්‍ය නොවන තෙක් විලම්බිත බදු වත්කමේ ධාරණ අගය අඩු කරනු ලබයි. හඳුනාගනු නොලැබ ඇති විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරන දිනක දීම යළි තක්සේරු කරන අතර, අනාගත බදු වන ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට ඇති හැකියාව දැන් හව්‍ය වන තාක් දුරට හඳුනා ගනු ලබයි.

වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඉන්පසුව බොහෝ දුරට නීතිගත තත්වයට පත්ව ඇති බදු අනුපාත සහ බදු නීති පදනම් කරගෙන වත්කම් උපලබ්ධිවූ හෝ වගකීම් පියවූ වර්ෂයට උපයෝගී කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ප්‍රවර්තන බදු වියදම්				
ප්‍රවර්තන වර්ෂයේ බදු වියදම්	**4,328,136**	3,896,240	**4,503,829**	3,930,455
පසුගිය වර්ෂ සඳහා (අධි)/ඌණ වෙන් කිරීම්	**–**	(2,726)	**(310)**	(6,856)
විලම්බිත බදු වියදම්				
තාවකාලික වෙනස්වීම් [යොමුව සටහන 13 (ආ)]	**90,883**	(88,243)	**91,546**	(88,604)
එකතුව	**4,419,019**	3,805,271	**4,595,065**	3,834,995
සඵල බදු අනුපාතිකය (%)	**31.50**	28.60	**33.68**	28.63
සඵල බදු අනුපාතිකය [(විලම්බිත බදු හැර) (%)]	**30.85**	29.27	**33.00**	29.29

13. (අ) බදු වියදම් සැසඳුම →

බදු පෙර ලාභය	**14,028,719**	13,302,987	**13,645,212**	13,397,277
වර්ෂය සඳහා ආදායම් බදු (ගිණුම්කරණ ලාභය මත 28%)	**3,928,041**	3,724,836	**3,820,659**	3,751,238
එකතු කළා: බදු කටයුතු සඳහා අඩු කළ නොහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ ප්‍රතිඵල	**2,854,015**	2,089,332	**2,881,503**	2,100,179
අඩු කළා: බදු කටයුතු සඳහා අඩු කළහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ ප්‍රතිඵල	**2,453,920**	1,917,928	**2,198,334**	1,920,962
වර්ෂය සඳහා බදු වියදම	**4,328,136**	3,896,240	**4,503,829**	3,930,455

13. ආදායම් බදු වියදම් (සම්බන්ධයි) →

13. (ආ) ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු සකස් වී ඇත්තේ පහත පරිදියෑ →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
විලම්බිත බදු වත්කම්	**–**	–	**(663)**	361
විලම්බිත බදු වගකීම්	**90,883**	(88,243)	**90,883**	(88,243)
ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු වියදම/(බැර)	**90,883**	(88,243)	**91,546**	(88,604)

14. කොටසක ඉපැයුම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහය විසින් එහි සාමාන්‍ය කොටස්වල මූලික හා තනුක කොටසක ඉපැයීම් දත්ත ඉදිරිපත් කරනු ලබයි. බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය එම වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් මූලික කොටසක ඉපයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදා ඊට සියළුම තනුකික භව්‍ය සාමාන්‍ය කොටස් සඳහා වූ බලපෑම ගැලපීමෙන් තනුක කොටසක ඉපැයුම ගණනය කෙරෙයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
සාමාන්‍ය කොටස් හිමිකරුවන් සඳහා වන ශුද්ධ ලාභය	**9,609,700**	9,497,716	**9,050,147**	9,562,282
තනුක වීමේ බලපෑම සඳහා කරන ලද ගැලපීම්	**–**	–	**–**	–
සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට බෙදාහරින ලද ශුද්ධ ලාභය තනුකවීමේ බලපෑම සඳහා ගැලපීමෙන් පසු	**9,609,700**	9,497,716	**9,050,147**	9,562,282
කොටසක මූලික ඉපැයුම් සඳහා හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**620,000**	320,000	**620,000**	320,000
තනුක වීමේ බලපෑම	**–**	–	**–**	–
කොටසක මූලික ඉපැයුම් සඳහා හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**620,000**	320,000	**620,000**	320,000
සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.)	**15.50**	29.68	**14.60**	29.88
සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.)	**15.50**	29.68	**14.60**	29.88

14. කොටසක ඉපැයුම් (සම්බන්ධයි) →

14. (අ) කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව →

	පවතින සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ජනවාරි 01 දිනට නිකුත් වූ කොටස් සංඛ්‍යාව	**620,000**	320,000	**620,000**	320,000
එකතු කළා: වර්ෂය තුළ නිකුත් කළ කොටස් සංඛ්‍යාව	**50,000**	300,000	**–**	–
කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**670,000**	620,000	**620,000**	320,000

15. ගණනය කරන පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලං.ගි.ප්‍ර.39) මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා මිනීම අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ගීකරණය යටතේ මූල්‍ය උපකරණවල ධාරණ අගය පහත පරිදි සාරාංශගත කර ඇත.

15. (අ) බැංකුව 2017 →

	වෙළඳාම සඳහා දරා සිටින රු. '000	කල්පිරෙන තෙක් දරා සිටින රු. '000	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	විකිණීම සඳහා පවතින රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	ඉදිරි රැකුම් රු. '000	එකතුව රු. '000
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	–	–	**3,849,627**	–	–	–	**3,849,627**
මහ බැංකුව වෙතැති ශේෂයන්	–	–	–	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	–	–	**23,438,104**	–	–	–	**23,438,104**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	**1,360,714**	**1,360,714**
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**6,472,314**	–	–	–	–	–	**6,472,314**
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වත්කම්	–	–	–	–	–	–	–
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	–	–	**27,714,565**	–	–	–	**27,714,565**
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	–	–	**360,309,866**	–	–	–	**360,309,866**
මූල්‍ය ආයෝජනයන්	–	**544,273,077**	–	**5,693,829**	–	–	**549,966,906**
මූල්‍ය වත්කම් එකතුව	**6,472,314**	**544,273,077**	**415,312,162**	**5,693,829**	–	**1,360,714**	**973,112,095**

15 ගණනය කරන පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි) →

15. (අ) බැංකුව 2017 (සම්බන්ධයි) →

	වෙළඳාම සඳහා දරා සිටින	සාධාරණ අගයට නම් කරන ලද	ක්‍රමක්ෂය පිරිවැය	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වගකීම්						
බැංකුවලට ගෙවිය යුතු	–	–	**180,439**	–	–	**180,439**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	**956,937**	**956,937**
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම්	–	–	–	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	–	**737,212,640**	–	–	**737,212,640**
වෙනත් ණය ගැනීම්	–	–	**217,955,777**	–	–	**217,955,777**
යටත්කාලීන වගකීම්	–	–	**6,006,411**	–	–	**6,006,411**
මූල්‍ය වගකීම් එකතුව	–	–	**961,355,267**	–	**956,937**	**962,312,204**

15. (ආ) බැංකුව – 2016 →

	වෙළඳාම සඳහා දරා සිටින	කල්පිරෙන තෙක් දරා සිටින	ක්‍රමක්ෂය පිරිවැය	විකිණීම සඳහා පවතින	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	–	–	4,619,699	–	–	–	4,619,699
මහ බැංකුව වෙතැති ශේෂයන්	–	–	–	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	–	–	19,013,572	–	–	–	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	20,290,588	–	–	–	–	–	20,290,588
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වත්කම්	–	–	–	–	–	–	–
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	–	–	31,834,072	–	–	–	31,834,072
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	–	–	291,976,942	–	–	–	291,976,942
මූල්‍ය ආයෝජනයන්	–	505,824,398	–	6,227,764	–	–	512,052,162
මූල්‍ය වත්කම් එකතුව	20,290,588	505,824,398	347,444,284	6,227,764	–	2,728,445	882,515,480

15. ගණනය කරන පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි) →

15. (අ) බැංකුව – 2016 (සම්බන්ධයි) →

	වෙළඳාම සඳහා දරා සිටින	සාධාරණ අගයට නම් කරන ලද	ක්‍රමක්ෂය පිරිවැය	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වගකීම්						
බැංකුවලට ගෙවිය යුතු	–	–	115,391	–	–	115,391
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	–
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම්	–	–	–	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	–	657,280,315	–	–	657,280,315
වෙනත් ණය ගැනීම්	–	–	207,039,909	–	–	207,039,909
යටත්කාලීන වගකීම්	–	–	6,006,411	–	–	6,006,411
මූල්‍ය වගකීම් එකතුව	–	–	870,442,026	–	–	870,442,026

15. (ඇ) සමූහය – 2017 →

	වෙළඳාම සඳහා දරා සිටින	කල්පිරෙන තෙක් දරා සිටින	ක්‍රමක්ෂය පිරිවැය	විකිණීම සඳහා පවතින	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	–	–	**3,854,086**	–	–	–	**3,854,086**
මහ බැංකුව වෙතැති ශේෂයන්	–	–	**94**	–	–	–	**94**
බැංකුවල ඇති තැන්පතු	–	–	**23,438,104**	–	–	–	**23,438,104**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	**1,360,714**	**1,360,714**
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**9,389,950**	–	–	–	–	–	**9,389,950**
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වත්කම්	–	–	–	–	–	–	–
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	–	–	**27,971,234**	–	–	–	**27,971,234**
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	–	–	**358,766,093**	–	–	–	**358,766,093**
මූල්‍ය ආයෝජනයන්	–	**547,924,390**	–	**7,713,852**	–	–	**555,638,242**
මූල්‍ය වත්කම් එකතුව	**9,389,950**	**547,924,390**	**414,029,611**	**7,713,852**	–	**1,360,714**	**980,418,516**

	වෙළඳාම සඳහා දරා සිටින	සාධාරණ අගයට නම් කරන ලද	ක්‍රමක්ෂය පිරිවැය	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වගකීම්						
බැංකුවලට ගෙවිය යුතු	–	–	**828,433**	–	–	**828,433**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	**956,937**	**956,937**
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම්	–	–	–	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	–	**737,212,640**	–	–	**737,212,640**
වෙනත් ණය ගැනීම්	–	–	**222,771,969**	–	–	**222,771,969**
යටත්කාලීන වගකීම්	–	–	**6,006,411**	–	–	**6,006,411**
මූල්‍ය වගකීම් එකතුව	–	–	**966,819,453**	–	**956,937**	**967,776,390**

15. ගණනය කරන පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි) →

15. (ඇ) සමූහය – 2016 →

	වෙළඳාම සඳහා දරා සිටින	කල්පිරෙන තෙක් දරා සිටින	ක්‍රමක්ෂය පිරිවැය	විකිණීම සඳහා පවතින	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	–	–	4,627,629	–	–	–	4,627,629
මහ බැංකුව වෙතැති ශේෂයන්	–	–	477	–	–	–	477
බැංකුවල ඇති තැන්පතු	–	–	19,013,572	–	–	–	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	27,303,207	–	–	–	–	–	27,303,207
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වත්කම්	–	–	–	–	–	–	–
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	–	–	31,834,072	–	–	–	31,834,072
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	–	–	291,178,121	–	–	–	291,178,121
මූල්‍ය ආයෝජනයන්	–	507,624,954	–	8,122,516	–	–	515,747,470
මූල්‍ය වත්කම් එකතුව	27,303,207	507,624,954	346,653,871	8,122,516	–	2,728,445	892,432,992

	වෙළඳාම සඳහා දරා සිටින	සාධාරණ අගයට නම් කරන ලද	ක්‍රමක්ෂය පිරිවැය	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද	ඉදිරි රැකුම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වගකීම්						
බැංකුවලට ගෙවිය යුතු	–	–	2,858,673	–	–	2,858,673
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	–	–	–
ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කළ වෙනත් මූල්‍ය වගකීම්	–	–	–	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	–	657,280,315	–	–	657,280,315
වෙනත් ණය ගැනීම්	–	–	212,629,427	–	–	212,629,427
යටත්කාලීන වගකීම්	–	–	6,006,411	–	–	6,006,411
මූල්‍ය වගකීම් එකතුව	–	–	878,774,826	–	–	878,774,826

16. මුදල් හා මුදල් සමානයන් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වටිනාකම වෙනස්වීම නොවැදගත් තරම් වන අවදානමකට යටත් අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු, කෙටි දැනුම් දීමකින් ලබාගත හැකි මුදල් යනාදිය මුදල් හා මුදල් සමාන දෑ යන්නට ඇතුළත්ය. මුදල් හා මුදල්වලට සමානයන්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ක්‍රමක්ෂය පිරිවැයට දක්වයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
අතැති මුදල්	**944,759**	691,527	**944,769**	691,537
බැංකුවල ඇති ශේෂයන්	**2,892,643**	3,881,589	**2,897,093**	3,889,509
කෙටි දැනුම් දීමකින් ආපසු ලබා ගතහැකි මුදල්	**12,224**	46,583	**12,224**	46,583
එකතුව	**3,849,627**	4,619,699	**3,854,086**	4,627,629

17. මහ බැංකුව වෙතැති ශේෂයන් →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ව්‍යවස්ථාපිත ශේෂයන්	**–**	–	**94**	477
එකතුව	**–**	–	**94**	477

18. බැංකු වල ඇති තැන්පතු →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව සහ සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය සඳහා යොදවනු ලබන හා සාධාරණ අගය වෙනස්වීමේ අවදානම නොසැලකිය හැකි තරම් වන බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු මේ යටතට අයත් වේ. ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ නාමික අගයට හෝ දළ වටිනාකමට දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ශ්‍රී ලංකාවේ බැංකු වල ඇති තැන්පතු	**23,438,104**	19,013,572	**23,438,104**	19,013,572
එකතුව	**23,438,104**	19,013,572	**23,438,104**	19,013,572

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී අනුපාතික, මූල්‍ය උපකරණවල මිල, වෙළඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාතික, ණය අවදානම් හා දර්ශක වල වෙනස්වීම් මත අගය, සකස් කර ගන්නා මූල්‍ය උපකරණ, ව්‍යුත්පන්නයන් වේ. ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති විට ව්‍යුත්පන්න වෙළඳාම සඳහා ඇති ලෙස වර්ගීකරණය වෙයි. සමූහය විසින් පොළී අනුපාතික (SWAPS) හා විදේශ විනිමය ඉදිරි ගිවිසුම් යනාදි ව්‍යුත්පන්න භාවිතා කරනු ලබයි.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත වන ව්‍යුත්පන්න හැරුණුවිට සෙසු ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර, එකී සාධාරණ අගය ධනාත්මක වන්නේ නම් වත්කම් ලෙස සලකන අතර, සාධාරණ අගය ඍණාත්මක වන්නේ නම් වගකීම් ලෙස සැලකෙයි. ව්‍යුත්පන්නවල සාධාරණ අගයේ වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ආදායම් වලට ඇතුළත් වේ.

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න

විදේශ විනිමය අනුපාතික හෝ පොළී අනුපාතික සම්බන්ධ අවදානම් රැකුම්ගත කිරීම සඳහා සමූහය විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වලට එළඹෙයි. මෙකී ව්‍යුත්පන්න සාධාරණ වටිනාකමට මනිනු ලබයි. ඉදිරි රැකුම් කාර්යක්ෂම වන අවස්ථාවලදී, සාධාරණ වටිනාකමට මනිනු ලැබූ ව්‍යුත්පන්න සහ පිරිවැයට/ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් හෝ වගකීම් මගින් මූල්‍ය ප්‍රකාශනය තුළ පැන නගින අස්ථාවර භාවය ඉවත් කිරීම සඳහා සමූහය විසින් ඉදිරි රැකුම් ගිණුම්කරණ නොගැලපීම් යොදා ගනී.

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්

වාර්තා කරනු ලබන සෑම කාලසීමාවක් අවසානයේදීම මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයට ගණනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් ලෙස නම් කෙරෙන සහ එසේ නම් කිරීමට සුදුසු වන ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම්වල සඵල කොටස, මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයේ ලාභ/අලාභ යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු ලැබේ. එසේ සඵල නොවන කොටසකට අදාළ සාධාරණ අගයෙහි කිසියම් ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙන් එක්වරම හඳුනාගනු ලැබේ.

ඉදිරි රැකුම් අයිතම මගින් ලාභය හෝ අලාභයට බලපෑමක් ඇති කෙරෙන කාල සීමාවන්හිදී වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කරනු ලබයි. කෙසේ වුවද ඉදිරි රැකුම්ගත පුරෝකථන ගනුදෙනුවල ප්‍රතිඵල ලෙස මූල්‍ය නොවන වත්කම් හෝ මූල්‍ය නොවන වගකීමක් හඳුනා ගැනෙන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි කලින් හඳුනාගන්නා ලද ලාභ හා අලාභ, හිමිකම් වෙතින් ඉවත්කර වත්කමෙහි හෝ වගකීමෙහි මූලික පිරිවැය ගණනය කිරීමෙහි ඇතුළත් කරනු ලබයි.

ඉදිරි රැකුම්ගත උපකරණයක් කල් ඉකුත්වන විට හෝ විකුණනු ලබන විට හෝ ඉදිරි රැකුමක් තවදුරටත් අදාළ ගිණුම්කරණ නිර්නායක සමග අනුකූල නොවන විට ආදායම් ප්‍රකාශයෙහි පුරෝකථන ගනුදෙනුව හඳුනා ගැනෙන තෙක් ඒ වන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති කිසියම් සමුච්චිත ලාභයක් හෝ අලාභයක් හිමිකම් වෙත රඳවා ගැනෙයි. පුරෝකථන ගනුදෙනුවක් තවදුරටත් සිදු වෙතැයි අපේක්ෂා නොකරන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලැබ ඇති සමුච්චිත ලාභය හෝ අලාභය, එක්වරම ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කරනු ලබයි.

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සම්බන්ධයි) →

19.1 ව්‍යුත්පන්න වත්කම් →

බැංකුව සහ සමූහය

දෙසැම්බර් 31 දිනට	වත්කම් 2017 රු. '000	නාමික වටිනාකම - 2017 රු. '000	වත්කම් 2016 රු. '000	නාමික වටිනාකම - 2016 රු. '000
විදේශ විනිමය ඉදිරි ගිවිසුම				
ඉදිරි හුවමාරු මිලදී ගැනීම්	–	–	27,750	3,743,750
ඉදිරි හුවමාරු විකිණීම්	**650**	**306,400**	–	–
විදේශ විනිමය ව්‍යුත්පන්න/මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්				
විදේශ විනිමය හුවමාරු කිරීම් (Swaps) – [සටහන් – (19.3)]	**1,360,064**	**28,106,213**	2,700,695	73,474,097
එකතුව	**1,360,714**	**28,412,613**	2,728,445	77,217,847

19.2 ව්‍යුත්පන්න වගකීම් →

බැංකුව සහ සමූහය

දෙසැම්බර් 31 දිනට	වත්කම් 2017 රු. '000	නාමික වටිනාකම - 2017 රු. '000	වත්කම් 2016 රු. '000	නාමික වටිනාකම - 2016 රු. '000
විදේශ විනිමය ඉදිරි ගිවිසුම				
ඉදිරි හුවමාරු මිලදී ගැනීම්	**139,200**	**3,064,600**	–	–
ඉදිරි හුවමාරු විකිණීම්	–	–	–	–
විදේශ විනිමය ව්‍යුත්පන්න/මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්				
විදේශ විනිමය හුවමාරු කිරීම් (Swaps) – [සටහන් – (19.3)]	**817,737**	**38,201,771**	–	–
එකතුව	**956,937**	**38,201,771**	–	–

19.3 විදේශ විනිමය හුවමාරු (Swaps) →

2013 සැප්තැම්බර් 18 දින පස් අවුරුදු විදේශ ණය ගැනීමක් මගින් බැංකුව ඇමරිකන් ඩොලර් මිලියන 750 ක් රැස්කර ගෙන ඇති අතර එයට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව සමග වාර්ෂිකව සහ මාසිකව අලුත් කිරීමේ පදනම මත පිළිවෙලින් ඇමරිකන් ඩොලර් මිලියන 183.425 ක් සහ ඇමරිකන් ඩොලර් මිලියන 187.5 ක් වන හුවමාරු ගිවිසුම් දෙකකට එළඹ ඇත.

2014 සැප්තැම්බර් 10 දිනද පස් අවුරුදු විදේශ ණය ගැනීමක් මගින් බැංකුව තවත් ඇමරිකන් ඩොලර් මිලියන 250 ක් රැස්කර ගෙන ඇති අතර එයට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව සමග මාසිකව අලුත් කිරීමේ පදනම මත ඇමරිකන් ඩොලර් මිලියන 249.31 ක් වන හුවමාරු ගිවිසුමකට එළඹ ඇත.

හුවමාරු ගිවිසුමෙහි අරමුණ වනුයේ ශ්‍රී ලංකා රුපියල්/ඇමරිකන් ඩොලර් හුවමාරු අනුපාතික වෙනස්වීම් මත ඉහත විදේශ විනිමය ණය සම්බන්ධයෙන් පැන නැගිය හැකි අවදානම රැකුම්ගත කිරීමයි.

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සම්බන්ධයි) →

19.3 විදේශ විනිමය හුවමාරු (Swaps) (සම්බන්ධයි) →

හුවමාරු ගිවිසුම් (Swaps) පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

19.3 (අ) හුවමාරු ගිවිසුම් (Swaps) 1 සහ 2

විස්තර	ඉදිරි රැකුමෙහි විස්තර	
ඉදිරි රැකුම් උපකරණ	හුවමාරු ගිවිසුම් – 1 හුවමාරු ගිවිසුම් – 2	ප්‍රතිපාර්ශ්වය – ශ්‍රී ලංකා මහ බැංකුව කාල්පනික අගය – ඇමරිකන් ඩොලර් මිලියන 183.425 මුළු විදේශ ණය මුදලින් 24.5% ඇමරිකන් ඩොලර් මිලියන 187.5 සඳහා ගිවිසුම 2017 මැයි 09 වන දින අවසන් විය.
ඉදිරි රැකුම්ගත අයිතම		පස් අවුරුදු ඇමරිකන් ඩොලර් මිලියන 750 ජ්‍යෙෂ්ඨ බැඳුම්කරය (අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු පොළිය සමග) මුල් මුදල 2018 සැප්තැම්බර් 18 දින මුළුමනින් ආපසු ගෙවිය යුතුය.
මුදල් ප්‍රවාහ ඇතිවේ යැයි බලාපොරොත්තු වන කාලපරිච්ඡේදය	හුවමාරු ගිවිසුම් - 1	වාර්ෂිකව
වර්ෂය තුල වෙනත් විස්තීර්න ආදායම්හි හඳුනාගත් වටිනාකම	හුවමාරු ගිවිසුම් - 1 හුවමාරු ගිවිසුම් - 1	වාර්ෂිකව ශ්‍රී ලංකා රුපියල් මිලියන 290.074 ක් මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සංචියට බැර කරන ලදී.
2017 දෙසැම්බර් 31 දිනට ඉදිරි රැකුම්ගත අයිතමවල සාධාරණ අගය		රුපියල් මිලියන 114,922.5
2017 දෙසැම්බර් 31 දිනට ඉදිරි රැකුම්ගත උපකරණවල සාධාරණ අගය	හුවමාරු ගිවිසුම් - 1	රුපියල් මිලියන 1,360
මීට පෙර ඉදිරි රැකුම් උපකරණ ගිණුම්කරණය කරන ලද එහෙත් එය සිදුවීම තවදුරටත් අපේක්ෂා නොකරන පුරෝකථනය කරන ලද ගනුදෙනු		නොමැත
කාලපරිච්ඡේදය තුළ හිමිකම් වලින් ලාභ හෝ අලාභ වශයෙන් යළි වර්ගීකරණය කළ වටිනාකම		නොමැත

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සම්බන්ධයි) →

19.3 විදේශ විනිමය හුවමාරු (Swaps) (සම්බන්ධයි) →

19.3 (අ) හුවමාරු ගිවිසුම් 3

විස්තර	ඉදිරි රැකුමෙහි විස්තර	
ඉදිරි රැකුම් උපකරණ	හුවමාරු ගිවිසුම්	ප්‍රතිපාර්ශ්වය – ශ්‍රී ලංකා මහ බැංකුව කාල්පනික අගය – ඇමරිකන් ඩොලර් මිලියන 249.31 මුළු විදේශ ණය මුදලින් 99.72% අධිමිලට ඇමරිකන් ඩොලර් මිලියන 249.31 ක කාල්පනික අගයක් සඳහා බැංකුව විසින් මහ බැංකුව සමග ඉහත ගිවිසුම 2017 ඔක්තෝබර් 25 වන දින අලුත් කරන ලදී.
ඉදිරි රැකුම්ගත අයිතම		පස් අවුරුදු ඇමරිකන් ඩොලර් මිලියන 250 ජ්‍යෙෂ්ඨ බැඳුම්කරය (අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු පොළිය සමග) මුල් මුදල 2019 සැප්තැම්බර් 10 දින මුළුමනින් ආපසු ගෙවිය යුතුය.
මුදල් ප්‍රවාහ ඇතිවේ යැයි බලාපොරොත්තු වන කාලපරිච්ඡේදය		ත්‍රෛමාසිකව
වර්ෂය තුළ වෙනත් විස්තීර්ණ ආදායම්		නොමැත
2017 දෙසැම්බර් 31 දිනට ඉදිරි රැකුම්ගත අයිතමවල සාධාරණ අගය		ශ්‍රී ලංකා රුපියල් මිලියන 38,307.5
2017 දෙසැම්බර් 31 දිනට ඉදිරි රැකුම්ගත උපකරණවල සාධාරණ අගය		නොමැත
මීට පෙර ඉදිරි රැකුම් උපකරණ ගිණුම්කරණය කරන ලද එහෙත් එය සිදුවීම තවදුරටත් අපේක්ෂා නොකරන පුරෝකථනය කරන ලද ගනුදෙනු		නොමැත
කාලපරිච්ඡේදය තුළ හිමිකම් වලින් ලාභ හෝ අලාභ වශයෙන් යළි වර්ගීකරණය කළ වටිනාකම		නොමැත

19.3 (ඇ) විනිමය හුවමාරු හිමිකම් වලට අදාළව වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලැබූ වටිනාකම

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
හුවමාරු ගිවිසුම් - 01	**290,074**	1,850	**290,074**	1,850
හුවමාරු ගිවිසුම් - 02	–	72,597	–	72,597
හුවමාරු ගිවිසුම් - 03	–	(211,703)	–	(211,703)
එකතුව	**290,074**	(137,256)	**290,074**	(137,256)

20. වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.ගි.ප්‍ර. 39) මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනීම යටතේ මූල්‍ය වත්කමක් ප්‍රධාන වශයෙන් අත්පත් කරගෙන ඇත්තේ නුදුරු කාලයේදී විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ අරමුණින් වන හෝ කෙටිකාලීන ලාභාපේක්ෂාවෙන් එක්ව කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹක කොටසක් ලෙස රඳවා තබාගෙන ඇති විට ඒවා වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඉදිරි රැකුම් සම්බන්ධයක් යටතේ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් නොකරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ.

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනාගනු ලබයි. ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාර හෝ ගෙවීම් සිදු කිරීමේ අයිතිය ස්ථාපිත වූ පොළී ආදායම් හා වියදම් ශුද්ධ පොළී ආදායමෙහි වාර්තා කරන අතර, ලාභාංශ ආදායම වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනා ගනියි.

නුදුරු කාලයේදී විකිණීමට ඇති අපේක්ෂාව තව දුරටත් අදාළ වන්නේ දැයි තීරණය කිරීමට සමූහය විසින් ව්‍යුත්පන්නයන් නොවන වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් අගයනු ලබයි. සක්‍රීය වෙළඳපොළක් නොමැතිවීම හේතුකොට ගෙන මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීමට අපොහොසත් වනවිට සහ නුදුරු අනාගතයේදී ඒවා විකිණීම සඳහා වන කළමනාකරණ අපේක්ෂාව සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති විට, සමූහයට ඉතා විරල අවස්ථාවන්හිදී පමණක් මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය සඳහා සලකා බැලිය හැකිය.

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් වලට වෙළඳාම සඳහා දරා සිටින රාජ්‍ය සුරැකුම්පත් සහ ගනුදෙනු කළහැකි සුරැකුම්පත් ඇතුළත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
වෙළඳාම සඳහා දරා සිටින				
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	**–**	–	**499,798**	1,438,757
භාණ්ඩාගාර බැඳුම්කර	**4,114,978**	17,194,677	**6,532,816**	22,768,539
හිමිකම් සුරැකුම්පත් [යොමුව සටහන 20 (අ)]	**2,357,336**	3,095,911	**2,357,336**	3,095,911
එකතුව	**6,472,314**	20,290,588	**9,389,950**	27,303,207

20. වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි) →

20. (අ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය →

දෙසැම්බර් 31 දිනට	2017			2016		
	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000
1. බැංකු රක්ෂණ සහ මූල්‍ය ක්ෂේත්‍රය						
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**485,180**	**76,303**	**65,245**	435,587	71,292	62,453
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ඡන්දය රහිත)	**268,731**	**33,862**	**27,901**	240,504	31,644	27,467
ඩී එෆ් සී සී බැංකුව	**430,000**	**85,787**	**52,723**	430,000	85,787	52,085
හැටන් නැෂනල් බැංකුව (ඡන්දය රහිත)	**284,964**	**49,599**	**54,946**	240,468	41,864	45,177
ලංකා ඔරික්ස් ලීසිං සමාගම	**28,060**	**3,171**	**3,191**	606,900	68,594	43,507
ලංකා ඔරික්ස් ෆිනෑන්ස් සමාගම	**4,550,000**	**50,340**	**17,096**	4,550,000	50,340	11,698
සම්පත් බැංකුව (ඡන්දය රහිත)	**128,723**	**31,222**	**40,106**	1,230,988	310,433	318,298
යුනියන් බෑන්ක් පීඑල්සී	**245,000**	**6,009**	**3,174**	245,000	6,009	3,803
		336,293	**264,382**		665,963	564,488
2. ආහාරපාන සහ දුම්කොළ ක්ෂේත්‍රය						
කාගිල්ස් සිලෝන් පීඑල්සී	**114,320**	**21,003**	**22,608**	598,040	109,872	115,312
		21,003	**22,608**		109,872	115,312
3. රසායනික හා ඖෂධ ක්ෂේත්‍රය						
සී අයි සී හෝල්ඩින්ග්ස් පීඑල්සී	**135,839**	**15,558**	**8,959**	135,839	15,558	12,089
සී අයි සී හෝල්ඩින්ග්ස් පීඑල්සී (ඡන්දය රහිත)	**13,700**	**1,183**	**704**	13,700	1,183	921
හේකාබ් පීඑල්සී	**447,211**	**83,786**	**64,341**	447,211	83,786	66,330
		100,527	**74,004**		100,527	79,340
4. ඉදිකිරීම් හා ඉංජිනේරු ක්ෂේත්‍රය						
ඇක්සෙස් ඉන්ජිනියරින් පීඑල්සී	**3,470,023**	**132,692**	**80,975**	3,470,023	132,692	85,093
කලම්බු ඩොක්යාර්ඩ් පීඑල්සී	**1,234,706**	**275,603**	**107,193**	1,234,706	275,603	92,787
		408,295	**188,168**		408,295	177,880

20. වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි) →

20. (අ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය (සම්බන්ධයි) →

දෙසැම්බර් 31 දිනට	2017			2016		
	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000
5. විවිධාංගකෘත ක්ෂේත්‍රය						
එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී	**2,593,516**	**306,499**	**138,738**	2,593,516	306,499	166,690
බ්‍රවුන්ස් කැපිටල් පීඑල්සී	**–**	**–**	**–**	2,900,000	13,279	3,441
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී	**14,367,669**	**71,838**	**36,938**	33,606,200	168,031	43,199
සිලෝන් තියටර්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**74,585**	**13,073**	**13,282**	750,265	131,498	92,881
හේලීස් පීඑල්සී	**123,026**	**41,512**	**29,196**	114,294	39,199	30,514
ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**2,660,190**	**465,818**	**391,140**	2,660,190	465,818	381,407
රිචර්ඩ් පීරිස් ඇන්ඩ් කම්පනි පීඑල්සී	**6,463,907**	**60,911**	**82,450**	12,001,659	113,095	96,125
වැලිබල් වන් පීඑල්සී	**3,143,693**	**72,975**	**55,020**	3,143,693	72,975	57,507
		1,032,626	**746,764**		1,310,394	871,764
6. හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය						
ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටිස් පීඑල්සී	**1,366,132**	**106,609**	**71,324**	1,366,132	106,609	76,997
එයිටිකන් ස්පෙන්ස් හොටෙල් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**2,102,133**	**188,903**	**61,110**	2,102,133	188,903	90,003
සිලෝන් හොටෙල්ස් කෝපරේෂන් පීඑල්සී	**3,975,017**	**128,776**	**62,888**	3,793,842	128,776	78,403
ජෝන් කීල්ස් හොටෙල්ස් පීඑල්සී	**5,541,205**	**103,475**	**48,216**	5,541,205	103,475	58,627
ලයිට් හවුස් හොටෙල්ස් පීඑල්සී	**1,175,667**	**71,492**	**52,080**	1,175,667	71,492	61,729
මහවැලි රීච් හොටෙල්ස් පීඑල්සී	**133,300**	**4,884**	**2,373**	133,300	4,884	2,742
මාරවිල රිසෝට්ස් පීඑල්සී	**1,900**	**16,063**	**3,569**	1,899,556	16,063	4,508
කින්ග්ස්බරි පීඑල්සී	**4,669,876**	**105,764**	**62,337**	4,669,876	105,765	71,572
ජෙට්වින්ග් සිම්ෆනි ලිමිටඩ්	**1,300,000**	**19,500**	**19,500**	–	–	–
		745,466	**383,397**		725,967	444,581
7. ආයෝජන භාර						
රේණුකා හෝල්ඩින්ග්ස් පීඑල්සී	**–**	**–**	**–**	5,356,146	235,077	111,749
රේණුකා හෝල්ඩින්ග්ස් පීඑල්සී (ඡන්දය රහිත)	**466,438**	**11,307**	**8,302**	466,438	11,307	8,210
		11,307	**8,302**		246,384	119,959
8. ඉඩම් සහ දේපල ක්ෂේත්‍රය						
ඕවර්සීස් රියැලිටි(සිලෝන්) පීඑල්සී	**943,473**	**23,777**	**16,419**	943,473	23,777	18,658
		23,777	**16,419**		23,777	18,658

20. වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි) →

20. (අ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය (සම්බන්ධයි) →

දෙසැම්බර් 31 දිනට	2017			2016		
	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000
9. නිෂ්පාදන ක්ෂේත්‍රය						
ටීජේ ලංකා පීඑල්සී	**40,095**	**1,480**	**1,348**	–	–	–
ලංකා සෙරමික් පීඑල්සී	**89,191**	**12,069**	**13,229**	445,955	60,344	54,062
රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී	**1,748,679**	**221,888**	**197,981**	1,834,159	232,734	210,380
ටෝකියෝ සිමෙන්ට් කම්පනි (ලංකා) පීඑල්සී	**688,992**	**29,029**	**44,964**	574,160	29,030	33,780
ටෝකියෝ සිමෙන්ට් කම්පනි (ලංකා) (ඡන්දය රහිත)	**611,060**	**22,602**	**35,649**	509,217	22,602	25,931
ඇලුමෙක්ස් පීඑල්සී	**16,150**	**277**	**294**	46,150	791	913
		287,345	**293,465**		345,501	325,066
10. වැවිලි ක්ෂේත්‍රය						
නමුණුකුල වැවිලි සමාගම	–	–	–	150,000	12,432	10,931
		–	–		12,432	10,931
11. බලශක්ති ක්ෂේත්‍රය						
රිසස් එනර්ජි පීඑල්සී	**203,341**	**4,653**	**3,639**	203,341	4,653	4,323
එල් වී එල් එනර්ජි ෆන්ඩ්	**4,606,600**	**46,066**	**46,066**	–	–	–
		50,719	**49,705**		4,653	4,323
12. විදුලි සංදේශ සේවා ක්ෂේත්‍රය						
ඩයලොග් ඇක්සියාටා පීඑල්සී	**3,790,960**	**94,332**	**49,105**	6,790,960	168,982	70,506
		94,332	**49,105**		168,982	70,506
13. වෙළඳ ක්ෂේත්‍රය						
බ්‍රවුන්ස් සහ සමාගම පීඑල්සී	**985,000**	**315,149**	**77,820**	985,000	315,149	81,229
		315,149	**77,820**		315,149	81,229
14. ඒකක භාර						
කොමර්ෂල් ඉක්විටි ෆන්ඩ්	**556,793**	**10,000**	**11,139**	556,793	10,000	11,147
සී බැන්ක් යුනිට් ට්‍රස්ට්	**7,604,797**	**85,110**	**172,058**	7,604,797	85,110	200,729
		95,110	**183,197**		95,110	211,876
එකතුව		**3,521,949**	**2,357,336**		4,533,006	3,095,911

21. ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත අවස්ථාවලදී සමූහය විසින් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කරනු ලබයි:

- වෙනත් පදනමකින් වත්කම් ගිණුම්කරණයේදී ඇතිවිය හැකි හඳුනා ගැනීමේ හෝ මිනීමේ අසංගතතාවයක්, සාධාරණ අගයට නම් කිරීමෙන් නැතිවී හෝ බොහෝ දුරට අඩුවී යන විට
- ලිඛිත මූල්‍ය කළමනාකරණ හෝ ආයෝජන උපාය මාර්ගයන්ට අනුව කළමනාකරණය කරන සහ ඒවායේ කාර්ය සාධනය සාධාරණ අගය පදනම් කරගෙන අගය කරන මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් හෝ එම දෙවර්ගයෙන් යුතු කාණ්ඩයක කොටසක් වන මූල්‍ය වත්කම්.
- ගිවිසුමේ අවශ්‍යතා පරිදි වෙනත් ආකාරයකින් මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස විකරණය කළහැකි අනුයුක්ත ව්‍යුත්පන්න එකක් හෝ ඊට වැඩි ගණනක් අඩංගු වන මූල්‍ය වත්කම්.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් මත ශුද්ධ ලාභය හෝ අලාභය යටතේ වාර්තා කෙරෙයි. පොළී ආදායම හෝ පොළී වියදම යටතේ පිළිවෙලින් පොළී ඉපයීම හෝ වියදම් සඵල පොළී අනුපාතික භාවිතයෙන් වාර්තා වන අතර, ගෙවීම් සිදු කිරීමේ අයිතිය තහවුරු වූ විට .වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ ලාභාංශ ආදායම වාර්තා වෙයි.

සමූහය විසින් කිසිදු මූල්‍ය වත්කමක් මූලික හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කර නොමැත.

22. ණය හා ලැබිය යුතු දෑ – බැංකු →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ණය හා ලැබිය යුතු දෑ – බැංකු කාණ්ඩයට පහත දෑ හැර සක්‍රීය වෙළඳපොළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් අයත් වේ.

- සමූහය විසින් වහාම හෝ නුදුරු කාලයේදී විකිණීමට අපේක්ෂිත හෝ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ දෑ
- සමූහය විසින් මූලික හඳුනා ගැනීමේදී විකිණීම සඳහා පවතින ලෙස නම් කළ දෑ
- ණය ඉකුත්වීම හේතුවෙන් හැරුණුකොට සමූහයට එහි මූලික ආයෝජනය ප්‍රමාණවත් ලෙස මුළුමනින්ම නැවත අයකරගත නොහැකි දෑ

ණය හා ලැබිය යුතු දෑ – බැංකු යන්නට බැකුවලින් ලැබියයුතු වටිනාකම් අයත් වේ. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව ණය හා ලැබිය යුතු දෑ, සඵල පොළී අනුපාතික භාවිත කරමින් අගය අඩුවීම සඳහා ප්‍රතිපාදන තබමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන්නේ සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වන ගාස්තු සහ පිරිවැය හා අත්පත් කර ගැනීමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සහ ගාස්තුවක් සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. හානිකරණය මගින් උද්ගතවූ අලාභ ආදායම් ප්‍රකාශයෙහි ණය සහ අනෙකුත් අලාභ හානිකරණ යටතේ වාර්තා කරනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
දළ ණය හා ලැබිය යුතු දෑ	**27,714,565**	31,834,072	**27,971,234**	31,834,072
අඩු කළා: කේවල හානිකරණය	**–**	–	**–**	–
ශුද්ධ ණය හා ලැබිය යුතු දෑ	**27,714,565**	31,834,072	**27,971,234**	31,834,072

22. ණය හා ලැබිය යුතු දෑ – බැංකු (සම්බන්ධයි) →

22. (අ) නිමැවුම් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** රු. '000	2016 රු. '000	**2017** රු. '000	2016 රු. '000
ණය සහ ලැබිය යුතු දෑ				
කෙටිකාලීන ණය	–	6,297,207	–	6,297,207
දිගුකාලීන ණය	**20,283,997**	18,503,946	**20,283,997**	18,503,946
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**2,766,684**	2,406,732	**3,023,353**	2,406,732
ණයකර	**4,094,279**	4,126,976	**4,094,279**	4,126,976
සුරැකුම්කරණය/භාරකාර සහතිකපත්	**569,605**	499,210	**569,605**	499,210
දළ එකතුව	**27,714,565**	31,834,072	**27,971,234**	31,834,072

22. (ආ) ව්‍යවහාර මුදල් වශයෙන් විශ්ලේෂණය →

බැංකු වලින් ලැබිය යුතු සියලුම ණය හා ලැබිය යුතු දෑ ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කර ඇත.

23. ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන් කාණ්ඩයට පහත දෑ හැර සක්‍රීය වෙළඳපොළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් අයත් වේ.

- සමූහය විසින් වහාම හෝ නුදුරු කාලයේදී විකිණීමට අපේක්ෂිත හෝ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ දෑ.
- සමූහය විසින් මූලික හඳුනා ගැනීමේදී විකිණීම සඳහා පවතින ලෙස නම් කළ දෑ
- ණය ඉකුත්වීම හේතුවෙන් හැරුණුකොට සමූහයට එහි මූලික ආයෝජනය ප්‍රමාණවත් ලෙස මුළුමනින්ම නැවත අයකරගත නොහැකි දෑ

මූලික ගණනය කිරීම් වලින් අනතුරුව ණය හා ලැබිය යුතු දෑ, සළුල පොළී අනුපාතික භාවිත කරමින් අගය අඩුවීම සඳහා ප්‍රතිපාදන තබමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන්නේ සළුල පොළී අනුපාතිකයෙහි අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු සහ පිරිවැය හා අත්පත් කර ගැනීමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සහ ගාස්තුවක් සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයට පොළී ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. හානිකරණය මගින් උද්ගතවූ අලාභ ආදායම් ප්‍රකාශයෙහි, ණය සහ අනෙකුත් අලාභ හානිකරණ යටතේ වාර්තා කරනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** රු. '000	2016 රු. '000	**2017** රු. '000	2016 රු. '000
දළ ණය හා ලැබිය යුතු දෑ	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893
අඩු කළා: කේවල හානිකරණය	–	–	–	–
සාමූහික හානිකරණය [යොමුව – 23 (ඇ)]	**2,298,341**	1,731,772	**2,298,341**	1,731,772
ශුද්ධ ණය හා ලැබිය යුතු දෑ	**360,309,866**	291,976,942	**358,766,093**	291,178,121

23. ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගණුදෙනුකරුවන් (සම්බන්ධයි) →

23. (අ) නිමැවුම් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ණය හා ලැබිය යුතු දෑ				
උකස් ණය	**23,939,944**	20,852,188	**23,939,944**	20,852,188
සේවක ණය	**5,057,767**	4,090,448	**5,057,767**	4,090,448
කාලීන ණය				
කෙටිකාලීන	**684,797**	–	**684,797**	–
දිගුකාලීන	**321,221,287**	257,549,045	**321,221,287**	257,549,045
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**2,826,289**	2,496,838	**1,282,516**	1,698,017
වෙනත්				
ණය සුරැකුම්පත්/භාරකාර සහතිකපත්	**3,083,997**	2,695,185	**3,083,997**	2,695,185
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
වෙනත්	**3,719,127**	3,950,010	**3,719,127**	3,950,010
දළ එකතුව	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893

23. (ආ) කර්මාන්ත වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
කෘෂිකාර්මික සහ ධීවර	**14,282,395**	10,869,217	**14,282,395**	10,869,217
නිෂ්පාදන	**505,113**	505,113	**505,113**	505,113
සංචාරක	**49,042**	81,090	**49,042**	81,090
ප්‍රවාහන	**1,042,138**	983,022	**1,042,138**	983,022
ඉදිකිරීම්/නිවාස	**67,530,740**	65,006,143	**67,530,740**	65,006,143
වාණිජ	**1,239,568**	1,237,814	**1,239,568**	1,237,814
වෙනත්				
මූල්‍ය හා ව්‍යාපාරික සේවා	**10,169,034**	6,899,422	**10,169,034**	6,899,422
යටිතල	**76,080,169**	60,412,604	**76,080,169**	60,412,604
බලශක්ති	**8,525,567**	10,254,573	**8,525,567**	10,254,573
අධ්‍යාපනය	**31,844,099**	23,701,503	**31,844,099**	23,701,503
රජය	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
පුද්ගලික/උකස්/වෙනත්	**149,265,341**	111,683,213	**147,721,568**	110,884,392
දළ එකතුව	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893

23. ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගණුදෙනුකරුවන් (සම්බන්ධයි) →

23. (ඇ) ව්‍යවහාර මුදල් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ශ්‍රී ලංකා රුපියල්	**334,526,456**	273,730,701	**332,982,683**	272,931,880
ඇමෙරිකානු ඩොලර්	**28,081,751**	19,978,013	**28,081,751**	19,978,013
දළ එකතුව	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893

23. (ඇ) වර්ෂය තුළ සාමූහික හානිකරණයන්ගේ වෙනස්වීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කේවල හානිකරණ ඇගයීම

ක්‍රමක්ෂය පිරිවැයට පවතින (බැංකුවලින් අයවිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා ලැබිය යුතු දෑ මෙන්ම කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන වැනි) මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, වෙන් වෙන්ව ගත්විට හෝ සාමූහිකව ගත්විට සැලකිය යුතු මූල්‍ය වත්කම්වල හානිකරණය පිළිබඳ හෝ වෙන් වෙන්ව ගත්විට සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් වල හානිකරණය පිළිබඳ විෂයය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් පළමුව ඇගයීමක් සිදුකරනු ලබයි. වෙන් වෙන්ව ඇගයීමක් සිදුකරන ලද මූල්‍ය වත්කම්වල හානිකරණය සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය තීරණය කරන්නේ නම් එකී වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුලත් කර, ඒ සියල්ලම හානිකරණය පිළිබඳ සාමූහික ඇගයීමකට ලක් කරයි. වෙන් වෙන් වශයෙන් හානිකරණය සම්බන්ධව කළ ඇගයීමේදී හානිකරණය පිළිබඳ අගය අඩුවීම් ඇති බවට හෝ දිගටම පවතින බවට හඳුනා ගන්නා මූල්‍ය වත්කම් මෙකී සාමූහික ඇගයීමට යොදා නොගනී.

හානිකරණයක් සිදුවී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්නම්, වත්කමෙහි ධාරණ අගය සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි වත්මන් අගය (දැනට ඇති නොවුණු අනාගතයේදී ඇති විය හැකි බවට අපේක්ෂිත ණය පාඩු හැරුණු කොට) අතර වෙනස අනුව එකී අලාභය මනිනු ලබයි. වත්කමෙහි ධාරණ අගය ගැලපීම ගිණුමක් මගින් අඩු කරනු ලබන අතර, ආදායම් ප්‍රකාශයෙහි එම අලාභය වාර්තා කරනු ලබයි. හානිකරණය වන්නා වූ අලාභ ගණනය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමෙහි අඩුකළ ධාරණ අගය මත පොළී ආදායම නොකඩවා උපචිත කිරීම සිදු කරයි. පොළී සහ සමාන ආදායම්හි කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කෙරෙයි.

ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාත මත වට්ටම් කරනු ලබයි. යම් ණය මුදලක පොළී අනුපාතය විචල්‍ය නම්, හානිකරණ අගය ගණනය කිරීම සඳහා වත්මන් සඵල පොළී අනුපාතය යොදා ගනී. සමූහය විසින් ගනුදෙනු කළ හැකි වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස යළි වර්ගීකරණය කර ඇත්නම් හානිකරණ අලාභ ගණනය කිරීම සඳහා යොදා ගන්නේ යළි වර්ගීකරණ දිනයේදී තීරණය කරනු ලබන නව සඵල පොළී අනුපාතයයි. සුරැකුම් වශයෙන් තබන ලද මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකමට ගණනය කිරීමේදී එම උකස් තබන ලද දේපල විකිණීමට හැකි හෝ නොහැකි වුවද, අදාළ මුදල් ප්‍රවාහයෙන් තීරණය වන්නේ එම සුරැකුම් ලබාගැනීමේ හා විකිණීමේ පිරිවැය අඩුකළ වටිනාකමය.

අනාගතයේදී යළි අයකර ගතහැකි බවට යථාර්තවාදී අදහසක් නොමැතිවිට සහ සියලු සුරක්ෂිතයන් උපලබ්ධි වී ඇති විට හෝ සමූහයට මාරුකර ඇති විට ණය ඊට අනුබද්ධ ගැලපීම් මගින් ලියා හැරීම සිදුකරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී හානිකරණය සඳහා අදාළ ගැලපීම් සිදුකිරීමෙන් පසු සිදුවූ සිද්ධියක් නිසා තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළ යාමක් හෝ පහළ යාමක් සිදුවුවහොත් ගැලපුම් ගිණුම ගලපා මීට පෙර හඳුනාගත් හානිකරණ පාඩුව වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලබයි. අනාගතයේදී, ලියාහරින ලද හානිකරණයන් අය කර ගනු ලැබුවහොත් එය ණය අලාභ වියදම් වෙත බැර කරනු ලබයි.

23. ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන් (සම්බන්ධයි) →

23. (ඈ) වර්ෂය තුළ සාමූහික හානිකරණයන්ගේ වෙනස්වීම් (සම්බන්ධයි) →

සාමූහික හානිකරණ ඇගයීම

වෙන් වෙන්ව අගයනු ලබන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය විසින් තීරණය කරනු ලැබුවහොත් සමාන ණය අවදානම් ගුණාංග පවතින මූල්‍ය වත්කම් සහිත කාණ්ඩයක වත්කමක් ලෙස එම මූල්‍ය වත්කම ඇතුළත් කර හානිකරණය සම්බන්ධයෙන් සාමූහිකව ඇගයීමට ලක් කරනු ලැබේ.

සාමූහික හානිකරණය පිළිබඳ ඇගයීමේ අරමුණ වෙනුවෙන් සමූහයේ අභ්‍යන්තර ණය වර්ගීකරණ ක්‍රමයට අනුව මූල්‍ය වත්කම් කාණ්ඩ ගත කරනු ලබයි. මෙහිදී වත්කම් වර්ගය, ක්ෂේත්‍රය, භූගත පිහිටීම, සුරැකුම් වර්ග, පසුකාලීන ණය ගෙවීම් තත්ත්වය සහ වෙනත් අදාළ සාධක වැනි ණය අවදානම් ලක්ෂණ සැලකිල්ලට ගනු ලබයි.

හානිකරණය පිළිබඳව සාමූහිකව අගයනු ලබන මූල්‍ය වත්කම් කාණ්ඩයක අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කරනුයේ කාණ්ඩයේ වත්කම් වලට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත වත්කම් වල අතීත අලාභ අත්දැකීම් මත පදනම් වෙමිනි. අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි තක්සේරු කළ වෙනස්වීම්, වසරින් වසර නිරීක්ෂණය කළ හැකි අන්තවලට, සම්බන්ධ වෙනස්වීම් (විරැකියා අනුපාත, දේපළ මිල, පාරිභෝගික භාණ්ඩ මිල, ගෙවීමේ තත්ත්වයන් හෝ කාණ්ඩයට ඇති වූ අලාභ හා ඒවායේ ප්‍රමාණය දක්වන වෙනත් කරුණු ආදියේ වෙනස්වීම්) පිළිබිඹු කරයි. තක්සේරු කරන ලද අලාභ හා සත්‍ය අලාභ අත්දැකීම් අතර වෙනස්කම් අවම කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සඳහා යොදගනු ලබන ක්‍රමවේද හා උපකල්පන නිරතුරුව සමාලෝචනය කෙරෙයි.

ප්‍රති ගිවිසුම්ගත ණය හානිකරණය

ඇප ලෙස ඉදිරිපත් කරන ලද දේපළ අයිතිකරුගෙන් ලබාගැනීම වෙනුවට හැකි සෑම අවස්ථාවකදීම ණය ගෙවීමේ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට බැංකුව උත්සාහ ගනියි. ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම සහ නව ණය කොන්දේසිවලට එළඹීම යනාදිය මීට ඇතුලත් වේ. කොන්දේසි පිළිබඳව යළි ගිවිසගැනීම් වලට එළඹීමෙන් අනතුරුව, කොන්දේසි අලුත් කිරීමට පෙර පැවති මුල් සඵල පොළී අනුපාත අනුව හානිකරණය ගණනය කරන අතර, ගෙවිය යුතු දින ඉකුත් වූ ණය ලෙස එම ණය මුදල තවදුරටත් සලකනු නොලබයි. අදාළ සියලු නිර්නායක සපුරා ඇති බවට හා ඉදිරි ගෙවීම් සිදු කෙරෙන බවට සහතික වීම පිණිස කළමනාකාරිත්වය විසින් යළි ගිවිසගත් ණය අඛණ්ඩව සමාලෝචනයට බඳුන් කරයි. මෙකී ණය මුල් සඵල පොළී අනුපාතය භාවිතයෙන් වෙන් වෙන්ව හෝ සාමූහික වශයෙන් හානිකරණය පිළිබඳ ඇගයීම්වලට දිගින් දිගටම ලක් කරනු ලබයි.

සුරැකුම් තක්සේරුකරණය

මූල්‍ය වත්කම්වල අවදානම අවම කර ගැනීම පිණිස සමූහය විසින් හැකි අවස්ථාවලදී සුරැකුම් උපයෝගී කරගනු ලබයි. මුදල්, රත්රන්, රාජ්‍ය සුරැකුම්පත් යනාදී විවිධ ස්වරූපයෙන් සුරැකුම් පවතියි. මෙලෙස සුරැකුම් ලෙස රඳවාගනු ලබන මූල්‍ය වත්කම් ආගණනය කිරීම සඳහා බැංකුව විසින් හැකිතාක් දුරට සක්‍රීය වෙළඳපොළ දත්ත උපයෝගී කර ගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
සාමූහික හානිකරණ				
ආරම්භක ශේෂය	**1,731,772**	3,092,209	**1,731,772**	3,092,209
ලාභාලාභ ගිණුමට ගැලපීම් (සටහන් අංක 10)	**693,233**	(99,693)	**693,233**	(99,693)
වර්ෂය තුළ ශුද්ධ කපා හැරීම්	**(126,664)**	(1,260,744)	**(126,664)**	(1,260,744)
අවසාන ශේෂය	**2,298,341**	1,731,772	**2,298,341**	1,731,772

24. මූල්‍ය ආයෝජනයන් – විකිණීම සඳහා පවතින →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හිමිකම් හා ණය සුරැකුම්පත්, විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන යන්නට අයත් වේ. වෙළඳාම සඳහා දරා සිටින හෝ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ ආයෝජන ලෙස වර්ගීකරණය නොවුණු ආයෝජන මේ යටතට අයත් වේ. මේ යටතට ගැනෙන ණය සුරැකුම්පත් වනුයේ, නිශ්චිතව නොදක්වන කාලසීමාවක් තුළ රඳවා තබාගෙන ද්‍රවශීලතා අවශ්‍යතා මත හෝ වෙළඳපොළ තත්ත්වයන්ගේ වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙස විකිණිය හැකි ණය සුරැකුම්පත්ය.

මූලික ගණනය කිරීම් වලින් අනතුරුව විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන පසුව සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබයි. විකිණීම සඳහා පවතින ආයෝජන යටතේ ඇති ප්‍රකාශිත වෙළඳපොළ මිලක් නොමැති හා සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස ගණනය කළ නොහැකි හිමිකම් කොටස් ආයෝජන පිරිවැයට ගණනය කරනු ලබයි. විකිණීම සඳහා පවතින ආයෝජන සංචිතයේ හිමිකම් යටතේ උපලබ්ධි නොවූ ලාභ හා පාඩු සෘජුවම හඳුනා ගැනෙයි. ආයෝජනයක් සිදු කිරීමෙන් අනතුරුව උත්පාදිත හා ඊට පෙර හිමිකම් යටතේ ගණනය කළ සමුච්චිත ලාභ හෝ අලාභ මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය) යටතේ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කෙරෙයි. එකම සුරැකුමක් යටතේ අයෝජන කිහිපයක් සමූහය සතුවූ විට ඒවායෙහි විකිණීමේ කටයුතු පැමිණි පිළිවෙලට සිදු කරනු ලබයි. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන රඳවා තබාගෙන ඇති අතර උපයා ගන්නා පොළිය, සළුල පොළී අනුපාතික භාවිතයෙන් ලද පොළී ආදායම ලෙස වාර්තා වෙයි. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන රඳවා ගන්නා අතරතුර උපයනු ලබන ලාභාංශ, ගෙවීම් සිදු කිරීමේ අයිතිය තහවුරු වූ පසුව, ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වාර්තා කරනු ලැබේ. එවන් ආයෝජනයන්හි අගය අඩුවීමෙන් පැන නගින පාඩු, ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය ආයෝජන මත අගය හානිකරණය වීමේ අලාභ යටතේ ගණනය කරන අතර, විකිණීම සඳහා පවතින ආයෝජන සංචිතයෙන් ඉවත් කරනු ලැබේ.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය

විකිණීම සඳහා පවතින ආයෝජනවල ඇතුළත් ණය සුරැකුම්පත් ඇතුළු මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන්, යම් ආයෝජනයක අගය අඩු වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීමක් සිදුකරනු ලබයි.

විකිණීම සඳහා පවතින ලෙස වර්ගකර ඇති ණය උපකරණ සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය පවතින මූල්‍ය වත්කම් වලට සමාන නිර්ණායක මත පදනම්ව හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් වෙන් වෙන් වශයෙන් ඇගයීම් කරනු ලබයි. කෙසේ වුවද, අඩු වූ අගය ලෙස වාර්තා වන්නේ ක්‍රමක්ෂය පිරිවැය සහ වත්මන් සාධාරණ අගය අතර වෙනස ලෙස ගණනය වන සමුච්චිත අලාභයෙන් ආදායම් ප්‍රකාශයෙහි මුල් වාර්තා කළ එම ආයෝජනය මත හානිකරණය අඩුකළ පසු ලැබෙන අගයයි. අනාගත පොළී ආදායම, අඩු කරන ලද ධාරණ අගය මත පදනම් වන අතර, හානිකරණ අලාභය මැනීමේ අරමුණින් අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් සඳහා යොදාගත් පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලැබේ. පොළී ආදායම, පොළී හා සමාන ආදායමෙහි කොටසක් ලෙස වාර්තා වේ. පසුකාලීන කාලසීමාවකදී, ණය උපකරණයේ සාධාරණ වටිනාකම ඉහළ ගියහොත් සහ එම ඉහළ යාම ආදායම් ප්‍රකාශයෙහි හානිකරණයක් වාර්තා වූවාට පසු හටගත් ණය සිද්ධියකට සම්බන්ධ නම්, හානිකරණ අලාභය, ආදායම් ප්‍රකාශය හරහා ප්‍රති ගැලපීමක් කරනු ලබයි.

විකිණීම සඳහා පවතින ආයෝජනයක් ලෙස වර්ග කළ හිමිකම් ආයෝජන සම්බන්ධයෙන් ගත්විට ආයෝජනයක සාධාරණ වටිනාකම එහි පිරිවැයට වඩා සැලකිය යුතු හෝ දීර්ඝකාලීන පහත වැටීමිද විෂය මූලික සාක්ෂි සඳහා ඇතුළත් වේ. මෙහිදී "සැලකිය යුතු" ලෙස බැංකුව සාමාන්‍යයෙන් අදහස් කරන්නේ 20%ක ප්‍රතිශතයක් වන අතර, "දීර්ඝ කාලීන" ලෙස සලකන්නේ සාමාන්‍යයෙන් මාස 6 කට වඩා වැඩි කාලසීමාවකි. හානිකරණය පිළිබඳ සලකන විට අත්පත්කර ගැනීමේ පිරිවැය සහ වත්මන් සාධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන සමුච්චිත අලාභයෙන්, වෙනත් විස්තීර්ණ ආදායමිහි මින් පෙර වාර්තා කළ එම ආයෝජනය මත හානිකරණ ප්‍රමාණය අඩුකර, හිමිකම් කාණ්ඩයෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කරනු ලබයි. ආදායම් ප්‍රකාශය හරහා හිමිකම් ආයෝජනය මත වූ හානිකරණ අලාභයන් ප්‍රති ගැලපීම් සිදු නොකෙරෙයි. හානිකරණයෙන් පසු සාධාරණ වටිනාකමෙහි ඉහළයාම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

24. මුල්‍ය ආයෝජනයන් – විකිණීම සඳහා පවතින (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** රු. '000	2016 රු. '000	**2017** රු. '000	2016 රු. '000
නිල ලැයිස්තුගත ආයෝජන				
හිමිකම් සුරැකුම්පත් [සටහන – 24 – (අ)]	**3,876,570**	3,332,148	**3,876,570**	3,332,148
ණය සුරැකුම්පත් [සටහන – 24 – (ආ)]	**–**	–	**199,920**	199,839
වෙනත් ආයෝජන				
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර [සටහන – 24 – (ඇ)]	**81,390**	2,104,031	**1,900,493**	3,797,944
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත් [සටහන – 24 – (ඈ)]	**1,171,488**	–	**1,171,488**	–
නිල ලැයිස්තුගත නොවන ආයෝජන				
හිමිකම් සුරැකුම්පත් [සටහන – 24 – (ඉ)]	**564,381**	791,585	**565,381**	792,585
විකිණීම සඳහා පවතින ශුද්ධ ආයෝජන	**5,693,829**	6,227,764	**7,713,852**	8,122,516

24. (අ) නිල ලැයිස්තුගත ආයෝජන – හිමිකම් සුරැකුම්පත් – බැංකුව සහ සමූහය →

	2017			2016		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී	**11,262,707**	**1,655,816**	**2,773,004**	9,523,878	1,301,845	2,118,873
ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	**13,158,700**	**445,642**	**369,522**	13,158,700	445,643	474,913
පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී	**43,668,157**	**784,405**	**734,044**	43,668,157	784,405	738,362
		2,885,863	**3,876,570**		2,531,893	3,332,148

24. (ආ) නිල ලැයිස්තුගත ආයෝජන – ණය සුරැකුම්පත් – සමූහය →

	2017			2016		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
පැන් ඒෂියා බැන්ක් කෝපරේෂන් පීඑල්සී	**500,000**	**50,000**	**51,234**	500,000	50,000	51,234
පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී	**945,000**	**94,500**	**95,735**	945,000	94,500	95,735
එච්ඩීඑෆ්සී බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා	**386,800**	**38,680**	**39,154**	386,800	38,680	39,154
සෙලාන් බැන්ක් පීඑල්සී	**129,400**	**12,940**	**13,717**	129,400	12,940	13,717
		196,120	**199,920**		196,120	199,839

24. මූල්‍ය ආයෝජනයන් – විකිණීම සඳහා පවතින (සම්බන්ධයි) →

24. (ඇ) වෙනත් ආයෝජන – භාණ්ඩාගාර බැඳුම්කර →

	2017 – බැංකුව			2016* බැංකුව		
	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර	**76,000**	**74,709**	**81,390**	2,175,000	2,012,176	2,104,031
		74,709	**81,390**		2,012,176	2,104,031

	2017 – සමූහය			2016 – සමූහය		
	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර	**1,751,000**	**2,037,829**	**1,900,493**	3,850,000	3,975,296	3,797,944
		2,037,829	**1,900,493**		3,975,296	3,797,944

24. (ඈ) වෙනත් ආයෝජන – භාණ්ඩාගාර බිල්පත් →

	2017 – බැංකුව සහ සමූහය			2016 – බැංකුව සහ සමූහය		
	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය	නාමික අගය	ආයෝජන පිරිවැය	සාධාරණ අගය
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත්	**1,200,000**	**1,164,059**	**1,171,488**	–	–	–
		1,164,059	**1,171,488**		–	–

24. මූල්‍ය ආයෝජනයන් – විකිණීම සඳහා පවතින (සම්බන්ධයි) →

24. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන – හිමිකම් සුරකුම්පත් →

	2017 – බැංකුව			2016 – බැංකුව		
	කොටස් ගණන	පිරිවැය රු. '000	පිරිවැය/ සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	පිරිවැය/ සාධාරණ අගය ඩ
ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය	**30,450**	**57,364**	**57,364**	30,450	57,364	57,364
ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	**16,452,126**	**164,521**	**506,890**	16,452,126	164,521	734,094
(අඩු කළා): හානිකරණය		–	–		–	–
		222,012	**564,381**		222,012	791,585

	2017 – සමූහය			2016 – සමූහය		
	කොටස් ගණන	පිරිවැය රු. '000	පිරිවැය/ සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	පිරිවැය/ සාධාරණ අගය රු. '000
ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය	**30,450**	**57,364**	**57,364**	30,450	57,364	57,364
ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	**16,452,126**	**164,521**	**506,890**	16,452,126	164,521	734,094
ආයෝජනය – ශ්‍රී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය	**100,000**	**1,000**	**1,000**	100,000	1,000	1,000
(අඩු කළා): හානිකරණය		–	–		–	–
		223,012	**565,381**		223,012	792,585

නිල ලැයිස්තුගත නොකළ විකිණීම සඳහා පවතින හිමිකම් කොටස් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැරුණු විට) ඒවායේ සාධාරණ අගය පිළිගත හැකි පරිදි ඇස්තමේන්තු කළ නොහැකි නිසා, පිරිවැයට වාර්තා කර ඇත. මෙකී ආයෝජන සඳහා වෙළඳපොළක් නොමැති අතර, ඒවා දීර්ඝ කාලීනව රඳවා ගැනීමට බැංකුව අපේක්ෂා කරයි. නිරීක්ෂණය කළහැකි දත්ත පදනම් කරගත් ඇගයීම් ආකෘතියක් යොදා ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් ආයෝජනයන්හි සාධාරණ අගය තීරණය කර ඇත.

25. කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනයන් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කල්පිරෙන තෙක් රඳවා ගැනීමට සමූහයට අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීමේ කාලසීමාවක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන ලෙස සැලකෙයි. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන සඵල පොළී අනුපාත භාවිත කර අගය හානිකරණය අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ සඵල පොළී අනුපාතයෙහි අන්‍යෝන්‍ය කොටසක් වන ගාස්තු සහ අත්පත් කර ගැනීමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සහ ගාස්තුවක්ද සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයෙහි පොළී සහ සමාන ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. එවැනි ආයෝජන මගින් උද්ගත වූ හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශයේ ණය සහ අනෙකුත් හානිකරණ අලාභ යටතේ හඳුනාගනු ලැබේ.

කල්පිරෙන තෙක් දරා සිටින ආයෝජන අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් කල්පිරීමට පෙර (ඇතැම් නිශ්චිත වාතාවරණ යටතේ හැරුණු විට) විකිණීමට හෝ ප්‍රතිවර්ගීකරණය කිරීමට සමූහය ක්‍රියා කළහොත් සම්පූර්ණ කාණ්ඩයම දෝෂ සහගත වන හෙයින්, එය විකිණීම සඳහා පවතින ආයෝජනයක් ලෙස යළි වර්ගීකරණය කළයුතු වේ. තවද, ඊළඟ වර්ෂ දෙක ඇතුළත කිසිදු මූල්‍ය වත්කමක් කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන ලෙස වර්ග කිරීමට සමූහයට නොහැකිවනු ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	**35,115,115**	17,279,328	**35,115,115**	17,279,328
භාණ්ඩාගාර බැඳුම්කර	**450,001,836**	430,456,075	**453,653,149**	432,256,631
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර – ඇමරිකන් ඩොලර්	**59,156,126**	58,088,995	**59,156,126**	58,088,995
(අඩු කළා): හානිකරණයන්	**–**	–	**–**	–
කල් පිරෙන තෙක් දරා සිටින ශුද්ධ ආයෝජන	**544,273,077**	505,824,398	**547,924,390**	507,624,954

බැංකුව විසින් 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 48,382 ක් වූ (2016 – රුපියල් මිලියන 63,413) කල් පිරෙන තෙක් දරා සිටින භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ඇප ලෙස තබා ඇති අතර සමූහය සඳහා එම අගය රුපියල් මිලියන 56,229 ක් වේ. (2016 – රුපියල් මිලියන 73,809).

26. පාලිත සමාගම්වල ආයෝජනයන් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාලිත සමාගම්වල ආයෝජන, හානිකරණය වෙනුවෙන් දීමනා අඩුකළ පසු පිරිවැයට ගණනය කර බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ. කිසියම් හානිකරණ ඇඟවීමක් ඇත්දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරන දිනකදීම පාලිත සමාගම් වල ශුද්ධ වත්කම්, සමාලෝචනය කරනු ලබයි. කිසියම් හානිකරණයක් සිදුවී ඇති බවට ඇඟිවීමක් වේ නම්, ආයෝජනයේ යළි අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබන අතර, ශුද්ධ වත්කම්වල අලාභයෙහි මට්ටමට හානිකරණ අලාභය හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනට	**2017**	2016	**2017**		2016	
	හිමිකම් ප්‍රතිශත %	හිමිකම් ප්‍රතිශත %	**පිරිවැය * රු. '000**	**අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව ** රු. '000**	පිරිවැය * රු. '000	අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව ** රු. '000
නිල ලැයිස්තුගත නොවන හිමිකම් කොටස්						
එන්.එස්.බී.ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්	**100**	100	**900,000**	**1,944,687**	150,000	1,691,209
(එකක් රු. 10 බැගින්වූ සාමාන්‍ය කොටස් 90,000,000)						
අඩු කළා: හානිකරණය			**–**	**–**	–	–
ශුද්ධ එකතුව			**900,000**	**1,944,687**	150,000	1,691,209

** වර්ෂය තුළ ප්‍රසාද දීමනා ලාභාංශ ලෙස රුපියල් මිලියන 750 ක් වටිනා කොටස් පරිපාලිත සමාගම විසින් නිකුත් කරන ලදී.*

*** පරිපාලිත සමාගම්වල ආයෝජන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුකරණය, ශුද්ධ වත්කම් මත 2017.12.31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව සිදුකර ඇත.*

27. දේපල, පිරියත සහ උපකරණ →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හඳුනාගැනීමේ පදනම

වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් සහ වත්කම් හා සබැඳි අනාගත ප්‍රතිලාභ, සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවයන් ඇති විටක දේපල, පිරියත හා උපකරණ පොත්වල හඳුනාගනු ලබයි. වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ වන පිරිවැයද ඇතුළත්ව දේපල, පිරියත හා උපකරණ මූලිකවම පිරිවැයට ගණනය කරනු ලබයි.

මිනීමේ පදනම

වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මුල් වරට එහි පිරිවැයට මනිනු ලබයි. පිරිවැය යන්නට වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව අදාළ කළහැකි පිරිවැය සහ පසුකාලීන පිරිවැය ඇතුලත් වේ. තමන් විසින්ම ඉදිකළ වත්කමක පිරිවැය යන්නට සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ වත්කම් කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ කලහැකි අනෙකුත් පිරිවැය මෙන්ම වත්කම ස්ථානගත කර ඇති වැඩ බිමෙන් ගලවා දැමීම, ඉවත් කිරීම සහ භූමිය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වන පිරිවැයෙහි මුල් ඇස්තමේන්තුව සහ ප්‍රාග්ධනිත කරන ලද ණය ගැණුම් පිරිවැය ඇතුළත් වේ. පරිගණක උපකරණවල ක්‍රියාකාරීත්වයේ සංකලිත කොටසක් වන මිලදී ගත් පරිගණක මෘදුකාංග, පරිගණක උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරයි.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ වූ ඵලදායී ජීවකාල වලින් යුක්ත වන විට එම කොටස් වෙන් වෙන්වූ දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස හඳුනාගනු ලැබේ.

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

පිරිවැය ආකෘතිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැරුණුවිට සෙසු දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහය විසින් පිරිවැය ආකෘතිය උපයෝගී කරගනු ලබන අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සම්බන්ධ අමතර පිරිවැයද ඇතුලත්ව, සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පසු අගයට වර්තා කරනු ලබයි.

ප්‍රත්‍යාගණන ආකෘතිය

සමූහය විසින් සමස්ත සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි කාණ්ඩයටම ප්‍රත්‍යාගණන ආකෘති උපයෝගි කරගනු ලබයි. ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට වත්කමෙහි සාධාරණ වටිනාකමින් පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකළ පසු අගය වන ප්‍රත්‍යාගණිත අගයට එම දේපල පවත්වාගෙන යනු ලබයි. ශේෂපත්‍ර දිනට ඇති සාධාරණ වටිනාකම හා ධාරණ අගය අතර සැලකියයුතු වෙනසක් නොමැති බව සහතික කරනු වස් චක්‍රීය පදනම මත සමූහයෙහි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සෑම තෙවසරකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී ධාරණ අගයෙහි සිදුවන කිසියම් වැඩිවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන අතර, ප්‍රාග්ධන සංචිතය යටතේ හිමිකම් වලට එකතු කිරීම හෝ ආදායම් ප්‍රකාශයට සටහන් කරන ලද එම වත්කමට අදාළ පෙර ප්‍රත්‍යාගණිත අඩුවීමක් ප්‍රතිවර්තනය කිරීම සඳහා යොදාගනු ලබයි.

මෙබඳු වාතාවරණයක් යටතේ, ඇතිවන ඉහළයාම පෙර ලියා හැරීමේ අගය දක්වා ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. ධාරණ අගයෙහි යම් අඩුවීමක් වේ නම්, එය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගත යුතුය. කෙසේ වුවද එම වත්කමට අදාළව ප්‍රාග්ධන සංචිතයෙහි පවතින යම් බැර ශේෂයක් වේ නම් එම අගය තෙක් ප්‍රත්‍යාගණය අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් වෙත හර කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන එම අඩුවීම මගින් ප්‍රාග්ධන සංචිත යටතේ සමුච්චිත හිමිකම් වල අගය අඩුවෙයි. යම් වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරි වන යම් ශේෂයක් වේ නම්, එය විශ්‍රාම යාම මත හෝ එම වත්කම් ඉවත් කිරීම මත රඳවාගනු ලබන ඉපැයීම් වෙත සෘජුවම මාරු කරනු ලබයි.

හඳුනාගැනීම අත්හැරීම

විකුණා බැහැර කිරීමේදී හෝ එය පාවිච්චි කිරීමෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල, පිරියත හා උපකරණ පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමේදී පැන නගින කිසියම් ලාභයක් හෝ අලාභයක් (වත්කමෙහි ධාරණ අගය සහ බැහැරලීමේ ශුද්ධ අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙයි) එම වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙහි “වෙනත් මෙහෙයුම් ආදායම්” යටතේ හඳුනාගනු ලබයි.

ප්‍රාග්ධනීත කළ හැකි කෙරිගෙන යන වැඩ

ප්‍රාග්ධනීත කිරීමට අපේක්ෂා කරන, ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මේ යටතට අයත් වේ. මේවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරන ලද පිරිවැයට දක්වා ඇත. කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියා කළ හැකි තත්ත්වයට සහ ස්ථානයට පත්වූ පසු එම ප්‍රාග්ධනීත කළ හැකි කෙරිගෙන යන වැඩ, අදාළ වත්කම වෙත මාරු කරනු ලැබේ.

ණය පිරිවැය

බැංකුව විසින් දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළ ප්‍රාග්ධනීත කළ හැකි ණය පිරිවැය නොවීය.

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

ක්ෂයවීම්

දේපල පිරියත සහ උපකරණ පිරිවැය, ඒවායේ තක්සේරු කළ ඵලදායී ජීවකාලය තුළ අවශේෂ වටිනාකම දක්වා සරළ මාර්ග ක්‍රමය උපයෝගී කරගනිමින්, ක්ෂයවීම් ගණනය කර ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි. ඉඩම් වල ක්ෂයවීමක් නොසැලකෙයි. හඳුනාගනු ලැබූ වත්කම් කාණ්ඩවලට අදාළ ක්ෂයවීම් අනුපාතික පහතින් දක්වා ඇත.

කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්

2017.01.01 දින සිට කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලි වලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනීත කිරීම සඳහා බැංකුව විසින් තීරණය කර ඇත. එදින සිට බලපැවැත්වෙන පරිදි බදු කාලසීමාව තුළදී එකී වැඩිදියුණු කිරීම් ක්‍රමක්ෂය කරනු ලැබේ.

වත්කම් වර්ගය	වාර්ෂික ක්ෂයවීම් අනුපාතිකය%
කල්බදු දේපල, කුලියට/බදු දීම සඳහාබ සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්	බදු කාලසීමාව තුළදී
සින්නක්කර ගොඩනැගිලි	වාර්ෂිකව 2.5% බැගින්
කාර්යාල හා විවිධ උපකරණ	වාර්ෂිකව 10% බැගින්
මෝටර් වාහන	වාර්ෂිකව 20% බැගින්
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	වාර්ෂිකව 20% බැගින්
ලීබඩු හා සවිකිරීම්	වාර්ෂිකව 10% බැගින්

2017 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි පරිගණක දෘඪාංග ශා මෘදුකාංග මත ක්ෂයවීමේ අනුපාතිකය අයිතමයේ ඵලදායී ජීව කාලය සලකා බලමින් 25% සිට 20% දක්වා සංශෝධනය කර ඇත.

සමූහය විසින් පරිහරණය කිරීමට හැකි දින සිට භාවිතයෙන් ඉවත් කරන දිනය දක්වා ක්ෂයවීම් ප්‍රතිපාදනය කරයි.

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

27. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව 2017 →

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි*	පරිගණක දෘඩාංග	කාර්යාලීය උපකරණ, ලී බඩු හා සවිකිරීම්	වෙනත්	කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය							
2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**5,565,220**	**488,317**	**2,061,817**	**1,650,968**	**344,735**	**77,280**	**10,188,337**
ගැලපීම්	**(1,500)**	**1,500**	**(128)**	**–**	**–**	**(15,785)**	**(15,913)**
එකතු කිරීම්	**43,065**	**58,194**	**393,032**	**122,621**	**4,878**	**167,681**	**789,471**
ප්‍රත්‍යාගණනය	**4,496,752**	**–**	**–**	**–**	**–**	**–**	**4,496,752**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(83,404)**	**–**	**–**	**–**	**–**	**–**	**(83,404)**
ඉවත් කිරීම්	**–**	**–**	**(184,696)**	**(39,106)**	**(11)**	**(43,065)**	**(266,878)**
2017 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**10,020,133**	**548,011**	**2,270,025**	**1,734,483**	**349,602**	**186,111**	**15,108,365**
අඩු කළා: සමුච්චිත ක්ෂයවීම්							
2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**41,214**	**65,881**	**1,732,391**	**988,753**	**240,447**	**–**	**3,068,686**
ගැලපීම්	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
වර්ෂය තුල අයකිරීම්	**42,190**	**11,415**	**111,180**	**125,860**	**36,512**	**–**	**327,157**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(83,404)**	**–**	**–**	**–**	**–**	**–**	**(83,404)**
ඉවත් කිරීම්	**–**	**–**	**(184,293)**	**(35,146)**	**(11)**	**–**	**(219,450)**
2017 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**–**	**77,296**	**1,659,278**	**1,079,467**	**276,948**	**–**	**3,092,989**
අඩු කළා: හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**10,020,133**	**470,715**	**610,747**	**655,016**	**72,654**	**186,111**	**12,015,376**

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

27. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව 2016

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි*	පරිගණක උපාංග	කාර්යාලීය උපකරණ, ලී බඩු හා සවිකිරීම්	වෙනත්	කෙරිගෙන යන වැඩ - ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය							
2016 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	5,498,292	474,060	1,877,980	1,512,787	290,826	134,375	9,788,320
ගැලපීම්	(35,475)	–	(16,661)	–	–	(46,268)	(98,404)
එකතු කිරීම්	102,403	14,257	208,230	180,577	53,914	56,101	615,482
ප්‍රත්‍යාගණනය	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	–	–	(7,732)	(42,396)	(5)	(66,928)	(117,061)
2016 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	5,565,220	488,317	2,061,817	1,650,968	344,735	77,280	10,188,337
අඩු කළා: සමුච්චිත ක්ෂයවීම්							
2016 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	–	58,683	1,639,704	915,173	207,690	–	2,821,250
ගැලපීම්	–	–	(3,371)	–	–	–	(3,371)
වර්ෂය තුළ අයකිරීම්	41,214	7,198	103,790	115,289	32,762	–	300,253
ඉවත් කිරීම්	–	–	(7,732)	(41,709)	(5)	–	(49,446)
2016 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	41,214	65,881	1,732,391	988,753	240,447	–	3,068,686
අඩු කළා: හානිකරණය	–	–	–	–	–	–	–
2016 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	5,524,006	422,436	329,426	662,215	104,288	77,280	7,119,651

** බදුකර දේපල, බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි යටතට 2017 දෙසැම්බර් 31 දිනට ඇතුළත් බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි ආශ්‍රිත නොනිමි වැඩ අගය රුපියල් මිලියන 5.3 කි.*

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

27. (ආ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය 2017

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි*	පරිගණක දෘඩාංග	කාර්යාලීය උපකරණ, ලී බඩු හා සවිකිරීම්	වෙනත්	කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය							
2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**5,565,220**	**488,317**	**2,065,843**	**1,652,758**	**344,734**	**77,444**	**10,194,317**
ගැලපීම්	**(1,500)**	**1,500**	**(128)**	**–**	**–**	**(15,949)**	**(16,077)**
එකතු කිරීම්	**43,065**	**58,194**	**394,787**	**122,914**	**4,878**	**167,681**	**791,519**
ප්‍රත්‍යාගණනය	**4,496,752**	**–**	**–**	**–**	**–**	**–**	**4,496,752**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(83,404)**	**–**	**–**	**–**	**–**	**–**	**(83,404)**
ඉවත් කිරීම්	**–**	**–**	**(184,937)**	**(39,154)**	**(11)**	**(43,065)**	**(267,167)**
2017 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**10,020,133**	**548,011**	**2,275,565**	**1,736,518**	**349,601**	**186,111**	**15,115,940**
අඩු කළා: සමුච්චිත ක්ෂයවීම්							
2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**41,214**	**65,881**	**1,735,142**	**989,810**	**240,447**	**–**	**3,072,494**
ගැලපීම්	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
වර්ෂය තුළ අයකිරීම්	**42,190**	**11,415**	**111,776**	**126,015**	**36,512**	**–**	**327,908**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(83,404)**	**–**	**–**	**–**	**–**	**–**	**(83,404)**
ඉවත් කිරීම්	**–**	**–**	**(184,534)**	**(35,192)**	**(11)**	**–**	**(219,737)**
2017 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**–**	**77,296**	**1,662,384**	**1,080,633**	**276,948**	**–**	**3,097,261**
අඩු කළා: හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**10,020,133**	**470,715**	**613,181**	**655,886**	**72,653**	**186,111**	**12,018,679**

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

27. (ආ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය 2016

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි*	පරිගණක දෘඪාංග	කාර්යාලීය උපකරණ, ලී බඩු හා සවිකිරීම්	වෙනත්	කෙරිගෙන යන වැඩ - ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය							
2016 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	5,498,292	474,060	1,883,308	1,514,177	290,825	134,375	9,795,038
ගැලපීම්	(35,475)	–	(16,661)	–	–	(46,268)	(98,404)
එකතු කිරීම්	102,403	14,257	208,230	180,995	53,914	56,265	616,064
ප්‍රත්‍යාගණනය	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	–	–	(9,034)	(42,414)	(5)	(66,928)	(118,381)
2016 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	5,565,220	488,317	2,065,843	1,652,758	344,734	77,444	10,194,317
අඩු කළා: සමුච්චිත ක්ෂයවීම්							
2016 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	–	58,683	1,643,238	916,135	207,690	–	2,825,746
ගැලපීම්	–	–	(3,371)	–	–	–	(3,371)
වර්ෂය තුළ අයකිරීම්	41,214	7,198	104,309	115,400	32,762	–	300,883
ඉවත් කිරීම්	–	–	(9,034)	(41,725)	(5)	–	(50,764)
2016 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	41,214	65,881	1,735,142	989,810	240,447	–	3,072,494
අඩු කළා: හානිකරණය	–	–	–	–	–	–	–
2016 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	5,524,006	422,436	330,701	662,948	104,287	77,444	7,121,823

** බදුකර දේපල, බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි යටතට 2017 දෙසැම්බර් 31 දිනට ඇතුළත් බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි ආශ්‍රිත නොනිමි වැඩ අගය රුපියල් මිලියන 5.3 කි.*

27 (ඇ) ප්‍රත්‍යාගණනය →

වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවෙහි ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. අතේ දුරින් සිදුවූ මෑත කාලීන වෙළඳපොළ ගනුදෙනුවලදී හෝ සක්‍රීය වෙළඳපොළෙහි නිරීක්ෂණය කළ හැකි මිල සැලකිල්ලට ගනිමින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. ඒ අනුව රුපියල් මිලියන 4,508.48 ක ප්‍රත්‍යාගණිත අතිරික්තයක් 2017 වසරේදී ප්‍රත්‍යාගණිත සංචිතයට බැර කරන ලදී. එමෙන්ම පෙර වර්ෂය හා සසඳන විට රුපියල් මිලියන 11.73 ක් ඊට ගලපා තිබිණි.

27. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි) →

27. (ඉ) බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි →

ඉඩම් හා ගොඩනැගිලි ශේෂයට රුපියල් මිලියන 7,996.2 ක සින්නක්කර ඉඩම් අගයක් ඇතුළත්ය.

27. (ඊ) වගකීම් සඳහා ඇප ලෙස සහතික කරන ලද දේපල, පිරියත හා උපකරණ →

දේපල, පිරියත හා උපකරණ කිසිවක් වගකීම් සඳහා ඇප වශයෙන් තබා නොමැත.

27. (එ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ →

වාර්තාකරණ දින දක්වා භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත දක්වා ඇති පරිදි වේ.

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000
පරිගණක දෘඩාංග	**1,370,615**	1,525,529
කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම්	**271,677**	270,382
අස්පෘශ්‍ය වත්කම්	**433,977**	401,879
වෙනත් – විවිධ උපකරණ	**27,840**	160,881

28. අස්පෘශ්‍ය වත්කම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මිලදී ගත් පරිගණක මෘදුකාංගවල වටිනාකම සමූහයේ අස්පෘශ්‍ය වත්කම් ගණනයට ඇතුළත් වේ.

හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනීමට හැකි විට සහ ඊට අදාළව අනාගතයේදී අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමේ හවුතාවයක් ඇතිවිටදීය.

මැනීමේ පදනම

වෙන් වෙන්ව අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් මුල් වරට හඳුනා ගැනීමේදී අගය කරනු ලබන්නේ ඒවායේ පිරිවැයටයි. ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ එසේ අත්පත් කර ගත් දිනට ඒවායේ සාධාරණ වටිනාකමයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත ප්‍රත්‍යාගණන හානිකරණ අලාභයක් අඩු කළ පසු අගයට ඉදිරියට ගෙනයා යුතුයි.

28. අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි) →

ඵලදායී ජීවකාලය හා ක්‍රමක්ෂය වීම්

සමූහය අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවකාලය සීමිත හෝ අසීමිත ද යන්න තක්සේරු කරනු ලබයි. සීමිත ජීවකාලයකින් යුත් අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඵලදායී ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය සහ ක්‍රමක්ෂය, ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතුවේ. වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීවකාලයක් හෝ වත්කම් වල අන්තර්ගත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජන රටාවේ වෙනස්වීම් සඳහා ගිණුම් තබනු ලබන්නේ සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙනි. මේවා ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ජීවකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ අදාල අස්පෘශ්‍ය වත්කම්වල කාර්යයට අනුරූප වියදම් කාණ්ඩය යටතේ හඳුනාගනු ලබයි.

හඳුනා ගැනීම අත්හැරීම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනීම අත්හරිනු ලබන්නේ එය ඉවත් කිරීමකදී හෝ එය භාවිතා කිරීම මගින් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොලැබෙන විටදීය. අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීමෙන් පැන නගින ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් මිල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කම ඉවත් කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

අසීමිත ඵලදායී ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමූහය සතුව නොපවතී. සමූහයේ පරිගණක මෘදුකාංගවල තක්සේරු කරන ලද ඵලදායී ජීවකාලය වසර 4 කි. (වාර්ෂිකව 25% බැගින්)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
පිරිවැය				
ආරම්භක ශේෂය	**639,336**	504,410	**641,306**	506,380
එකතු කිරීම්	**319,428**	134,926	**319,828**	134,926
ඉවත් කිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**958,764**	639,336	**961,134**	641,306
(අඩු කළා): සමුච්චිත ක්‍රමක්ෂය				
ආරම්භක ශේෂය	**482,065**	446,553	**484,035**	448,523
වර්ෂය සඳහා අයකිරීම්	**96,391**	35,512	**96,444**	35,512
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**578,456**	482,065	**580,479**	484,035
ශුද්ධ පොත් අගය	**380,308**	157,271	**380,655**	157,271

29. විලම්බිත බදු වත්කම්/වගකීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

විලම්බිත බදුකරණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පිටු අංක 289 හි සටහන් අංක 13 හි දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
29.(අ) විලම්බිත බදු වත්කම් →				
විලම්බිත බදු වත්කම්	**–**	–	**588**	228
ආදායම් ප්‍රකාශය	**–**	–	**(588)**	360
විලම්බිත බදු වත්කම්	**–**	–	**–**	588
29.(ආ) විලම්බිත බදු වගකීම් →				
විලම්බිත බදු වගකීම්	**416,180**	504,423	**415,592**	504,423
ආදායම් ප්‍රකාශය	**90,883**	(88,243)	**91,546**	(88,243)
ශුද්ධ විලම්බිත බදු වගකීම	**507,063**	416,180	**507,138**	416,180

30. වෙනත් වත්කම් →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
කල්පිත බදු/ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (සටහන 4. ඉ)	**7,184,079**	5,813,616	7,212,333	5,833,897
ලැබිය යුතු දෑ	2,195,402	3,601,388	2,448,403	3,710,443
පොළී සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ (ජ්‍යෂ්ඨ පුරවැසි)	**8,150,352**	4,332,737	**8,150,352**	4,332,737
තැන්පතු සහ කලින් ගෙවීම්	**363,458**	199,139	**363,458**	199,139
මහා භාණ්ඩාගාරයට ගෙවන ලද අත්තිකාරම් (සටහන – අ)	**4,480,000**	4,800,000	**4,480,000**	4,800,000
විශ්‍රාම අරමුදල II සඳහා ගෙවන ලද අත්තිකාරම් [සටහන 34 (අ) 2]	**46,384**	80,656	**46,384**	80,656
විවිධ ණයගැතියෝ	**27,436**	35,022	**27,436**	35,022
පෙර ගෙවූ සේවක වන්දි	**3,115,069**	2,362,379	**3,115,069**	2,362,379
වෙනත් ලැබිය යුතු දෑ	**133,509**	536,502	**133,509**	536,502
එකතුව	**25,695,689**	21,761,440	**25,976,944**	21,890,777

30. වෙනත් වත්කම් (සම්බන්ධයි) →

සටහන (අ)

මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම අනුව බැංකුව විසින් 2012 වර්ෂයේ රුපියල් මිලියන 6,000 ක් සහ 2013 වර්ෂයේ රුපියල් මිලියන 2,000 ක් අත්තිකාරම් වශයෙන් මහා භාණ්ඩාගාරයට ගෙවන ලද අතර, මහා භාණ්ඩාගාරය විසින් තහවුරු කරන ලද පරිදි එය 2014 වර්ෂයේ පටන් වර්ෂ 6 ක කාලයක් තුළ ලාභයට එරෙහිව ගලපනු ලැබේ. 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ 10 ක කාලයක් තුළ ලාභයට එරෙහිව රුපියල් මිලියන 5,333 ක ශේෂය ගැලපීමට මහා භාණ්ඩාගාරය එකඟවී ඇත. අනතුරුව 2017 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ 15 ක කාලයක් තුළ ලාභයට එරෙහිව රුපියල් මිලියන 4,800 ක ශේෂයක් ගැලපීමට භාණ්ඩාගාරය එකඟවී ඇත.

31. බැංකුවලට ගෙවිය යුතු →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

අයිරා පහසුකම්, ඒක්ෂණ ණය සහ පාලිත සමාගමෙහි ප්‍රතිමිලදී ගැනුම් මීට ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සළුල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් තැන්පතු ඒවායෙහි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. මේවා මත ගෙවිය යුතු/ගෙවූ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි පොළී වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	**–**	–	**647,994**	2,743,282
වෙනත් පහසුකම්	**180,439**	115,391	**180,439**	115,391
එකතුව	**180,439**	115,391	**828,433**	2,858,673

32. වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කාලීන තැන්පතු සහ ඉතුරුම් තැන්පතු වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ යන්නට අයත් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සළුල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් තැන්පතු ඒවායෙහි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. තැන්පතු මත ගෙවූ/ගෙවිය යුතු පොළී ආදායම් ප්‍රකාශයෙහි පොළී වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුළු මුදල	**737,212,640**	657,280,315	**737,212,640**	657,280,315
එකතුව	**737,212,640**	657,280,315	**737,212,640**	657,280,315

32. වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු (සම්බන්ධයි) →

32. (අ) නිමැවුම් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ඉතුරුම් තැන්පතු	**188,191,882**	176,347,004	**188,191,882**	176,347,004
ස්ථාවර තැන්පතු	**549,020,758**	480,933,311	**549,020,758**	480,933,311
එකතුව	**737,212,640**	657,280,315	**737,212,640**	657,280,315

32.(ආ) ව්‍යවහාරික මුදල් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ශ්‍රී ලංකා රුපියල්	**727,849,199**	648,802,789	**727,849,199**	648,802,789
ඇමරිකානු ඩොලර්	**5,924,264**	5,330,985	**5,924,264**	5,330,985
යුරෝ	**1,211,334**	1,245,906	**1,211,334**	1,245,906
මහා බ්‍රිතාන්‍ය පවුම්	**1,207,599**	1,076,387	**1,207,599**	1,076,387
ඕස්ට්‍රේලියානු ඩොලර්	**1,020,083**	824,248	**1,020,083**	824,248
ජපන් යෙන්	**161**	–	**161**	–
එකතුව	**737,212,640**	657,280,315	**737,212,640**	657,280,315

33. වෙනත් ණය ගැනීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

33.1 ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරුකුම්පත් →

අනාගතයේ නිශ්චිත දිනයක ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම යටතේ විකුණන ලද සුරුකුම්පත්, මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයෙහි වාර්තා කිරීම අත්හැරීම සිදු නොකරනු ලබයි. මන්දයත්, එම හිමිකමෙහි සියලු සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් රඳවා ගන්නා බැවිනි. ඊට අදාළව හිමිවන මුදල්, ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයෙහි සමූහයට ලබාදුන් ණයක් ලෙස පිළිබිඹු කරමින් මූල්‍ය වගකීම් වශයෙන් දක්වනු ලබයි. මෙහිදී ගනුදෙනුවෙහි ආර්ථික යථා ස්වභාවය පිළිබිඹු කරමින් උපචිත පොළිය, ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරුකුම්පත් යටතේ වගකීමක් ලෙස ඇතුළත් කෙරෙයි. විකුණුම් මිල සහ ප්‍රතිමිළදී ගැණුම් මිල අතර වෙනස පොළී වියදම් ලෙස සලකනු ලබන අතර, ගිවිසුමෙහි කාලසීමාව පුරාවට සඵල පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලබයි.

33.2 ජ්‍යෙෂ්ඨ බැඳුම්කර (Senior Notes) නිකුත් කිරීම් →

දීර්ඝ කාලීන අරමුදල් අවශ්‍යතා මත බැංකුව විසින් ජාත්‍යන්තර බැඳුම්කර (ඇමරිකානු ඩොලර් ඒකක) මගින් ණයට ගනු ලබන අරමුදල් මේ මගින් නියෝජනය වෙයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් නිකුත් කරන ලද ජ්‍යෙෂ්ඨ බැඳුම්කර ඒවායෙහි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ගෙවන ලද/ගෙවිය යුතු පොළිය, ලාභ හෝ අලාභ යටතේ හඳුනාගනු ලබයි.

වාර්තාකරණ දිනට පවතින විදේශ මුදල් ණය සුරුකුම්පත්, එදිනට පවතින මධ්‍ය විනිමය හුවමාරු අනුපාතය භාවිතයෙන් ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කෙරෙයි. වාර්තාකරණ දිනට යලි පරිවර්තනය කිරීම මත පැනනගින විදේශ මුදල් අගයෙහි වෙනස ලාභය හෝ අලාභය යටතේ හඳුනාගනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරුකුම්පත්	**61,253,161**	54,111,728	**66,069,353**	59,701,246
නිකුත් කළ ජ්‍යෙෂ්ඨ බැඳුම්කර (Senior notes) [සටහන 33 – (අ)]	**156,702,616**	152,928,181	**156,702,616**	152,928,181
එකතුව	**217,955,777**	207,039,909	**222,771,969**	212,629,427

33. (අ) නිකුත් කළ ජ්‍යෙෂ්ඨ බැඳුම්කර →

නිකුත් කළ ජ්‍යෙෂ්ඨ බැඳුම්කර	පොළී ගෙවියයුතු වාර ගණන	නිකුත්කළ දිනය	කල්පිරෙන දිනය	කූපන් පොළී අනුපාතය %	**2017** **රු. '000**	2016 රු. '000
ඇමරිකන් ඩොලර් මිලියන 750 ක ජ්‍යෙෂ්ඨ බැඳුම්කර (Senior notes)	අර්ධ වාර්ෂිකව	18.09.2013	18.09.2018	8.875	**117,831,970**	114,980,416
ඇමරිකන් ඩොලර් මිලියන 250 ක ජ්‍යෙෂ්ඨ බැඳුම්කර (Senior notes)	අර්ධ වාර්ෂිකව	10.09.2014	10.09.2019	5.150	**38,870,646**	37,947,765
					156,702,616	152,928,181

34. වෙනත් වගකීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී, ගාස්තු සහ වියදම්, විශ්‍රාම වැටුප්, නිවාඩු මුදල් කිරීම් හා වෙනත් වියදම් සඳහා සිදු කරනු ලබන ප්‍රතිපාදන වෙනත් වගකීම් යටතට අයත්වේ. වාර්තාකරණ දිනට ගෙවිය යුතු අගයන් අනුව මෙම වගකීම් වාර්තා ගත කර ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
විවිධ ණයහිමියෝ	**119,903**	91,375	**124,903**	92,487
ගෙවිය යුතු පොළී	**–**	88,054	**–**	88,054
විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I සඳහා ප්‍රතිපාදන [සටහන 34 (අ) (1)]	**2,750,601**	1,252,553	**2,750,601**	1,252,553
වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන [සටහන 34(අ)(3)]	**960,830**	644,377	**960,830**	644,377
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන [සටහන 34 (අ) (4)]	**–**	–	**1,234**	1,260
ක්‍රමක්ෂය නොවූ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු (Swaps) දින 1 ලාභ/අලාභ (සටහන් අංක 19.2)	**1,099,322**	2,448,670	**1,099,322**	2,448,670
වෙනත් ගෙවිය යුතු දෑ	**4,131,769**	4,075,027	**4,170,571**	4,081,104
එකතුව	**9,062,425**	8,600,056	**9,107,460**	8,608,506

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් →

බැංකුව සතුව විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රම දෙකක් පවතී. ඒවා 1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I සහ 1995 ඔක්තෝබර් 01 දිනට පසුව සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II ලෙස දැක්විය හැකි අතර, විශ්‍රාමික සේවකයින් සඳහා වන වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්ද බැංකුව සතුව පවතී.

මෙකී යෝජනා ක්‍රමවල වත්කම්, බැංකුවේ වත්කම් වලින් ස්වාධීනව පවතින අතර, අදාළ අරමුදල්වල නීතිරීති/භාර ඔප්පුවල ප්‍රතිපාදන ප්‍රකාර කළමනාකාරිත්වය හා බැංකු සේවකයින් නියෝජනය වන කළමනාකරුවන්/භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කෙරෙයි.

මෙම අරමුදල්වල පාලිත නීති ප්‍රකාර අවම වශයෙන් වසර 02 කට වරක් ජීවගණක තක්සේරුවක් සිදු කළ යුතු වන අතර, සාමාජිකයින් විසින් පත් කල බැංකුවේ විගණන කටයුතුවලින් ස්වාධීනවූ වරලත් ගණකාධිකාරී ආයතනයක් හෝ ආයතන මගින් සිදු කරනු ලබන වාර්ෂික විගණන වලට මෙකී අරමුදල් බඳුන් වේ.

34. (අ) 1. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I

ජීවගණක ඇගයීම, ඇමරිකන් එක්සත් ජනපද ජීවගණක සංගමයෙහි අධි සාමාජික, පියල් එස්. ගුණතිලක සහ සමාගමෙහි පියල් එස්. ගුණතිලක මහතා විසින් 2017 දෙසැම්බර් 31 දින සිදු කරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් විසින් උපයාගනු ලැබූ අපේක්ෂිත ප්‍රතිලාභයන්හි ජීවගණක වත්මන් අගය ගණනය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය උපයෝගී කරගන්නා ලදී.

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 1. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබූ ශුද්ධ වත්කම්/(වගකීම්)				
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	**13,552,607**	13,198,392	**13,552,607**	**13,198,392**
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්	**(16,303,208)**	(14,450,945)	**(16,303,208)**	**(14,450,945)**
එකතුව	**(2,750,601)**	(1,252,553)	**(2,750,601)**	**(1,252,553)**
(ආ) ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රමාණය				
ප්‍රවර්තන සේවා පිරිවැය	**137,244**	155,778	**137,244**	**155,981**
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	**254,833**	421,816	**254,833**	**421,816**
ශුද්ධ ප්‍රතිලාභ වියදම්	**392,077**	577,594	**392,077**	**577,797**
(ඇ) වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති ප්‍රමාණය				
ප්‍රතිපාදන ගැලපීම්	–	(796,913)	–	(796,913)
ප්‍රත්‍යක්ෂ (ලාභ)/අලාභ	**526,139**	1,017,720	**526,139**	1,017,720
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**1,062,775**	(2,400,266)	**1,062,775**	(2,400,266)
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**(90,866)**	84,779	**(90,866)**	84,779
සැලසුම්ගත වත්කම් මත පොළී ආදායමෙහි වෙනස	–	153,482	–	153,482
එකතුව	**1,498,048**	(1,941,199)	**1,498,048**	(1,941,199)
(ඈ) සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ:				
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි ආරම්භක අගය	**13,198,392**	12,189,981	**13,198,392**	**12,189,981**
සැලසුම්ගත වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ	**1,479,280**	966,365	**1,479,280**	**966,365**
තථ්‍ය සේවය දායකත්වය	**392,077**	1,642,381	**392,077**	**1,642,381**
ගෙවූ ප්‍රතිලාභ	**(1,608,008)**	(1,515,555)	**(1,608,008)**	**(1,515,555)**
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**90,866**	(84,779)	**90,866**	**(84,779)**
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි අවසාන ශේෂය	**13,552,607**	13,198,392	**13,552,607**	**13,198,392**

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 1 ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** රු. '000	2016 රු. '000	**2017** රු. '000	2016 රු. '000
(ඉ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ				
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි ආරම්භක ශේෂය	**14,450,945**	15,651,403	**14,450,945**	15,651,403
පොළී පිරිවැය	**1,734,113**	1,541,663	**1,734,113**	1,541,663
ප්‍රවර්තන සේවා පිරිවැය	**137,243**	155,980	**137,243**	155,980
ගෙවූ ප්‍රතිලාභ	**(1,608,008)**	(1,515,555)	**(1,608,008)**	(1,515,555)
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**1,062,775**	(2,400,266)	**1,062,775**	(2,400,266)
බැඳීම් මත ජීවගණක (ලාභ)/අලාභ	**526,140**	1,017,720	**526,140**	1,017,720
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි අවසාන ශේෂය	**16,303,208**	14,450,945	**16,303,208**	14,450,945
(ඊ) සැලසුම්ගත වත්කම් වලට පහත අයිතමයන් ඇතුළත්ය				
භාණ්ඩාගාර බැඳුම්කර	**7,438,650**	7,114,705	**7,438,650**	**7,114,705**
භාණ්ඩාගාර බිල්පත්	**237,424**	2,577,678	**237,424**	**2,577,678**
ස්ථාවර තැන්පතු	**267,939**	673,231	**267,939**	**673,231**
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්	**242,285**	262,843	**242,285**	**262,843**
ණයකර	**4,699,545**	2,230,133	**4,699,545**	**2,230,133**
භාරකාර සහතිකපත්	**100,000**	–	**100,000**	–
ලංකා බැංකුවේ තැන්පත් මුදල්	**52**	11,194	**52**	**11,194**
වෙනත් වත්කම්	**566,712**	328,609	**566,712**	**328,609**
එකතුව	**13,552,607**	13,198,392	**13,552,607**	**13,198,392**

	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I **2017**	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I 2016
(උ) ජීවගණක උපකල්පන		
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය (%)	**6.50**	6.50
වට්ටම් අනුපාතිකය (%)	**11.00**	12.00
ජීවන වියදම් දීමනාවෙහි ඉදිරි වැඩිවීම (%)	**4.50**	4.50
මර්ත්‍යතාව	**GA 1983** මර්ත්‍යතා වගුව	GA 1983 මර්ත්‍යතා වගුව
විශ්‍රාම යාමේ වයස	**අවුරුදු 57**	අවුරුදු 57
සාමාන්‍ය ගෙවීම් ක්‍රමය	**මාසිකව**	මාසිකව

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 1. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I (සම්බන්ධයි) →

සේවක පිරිවැටුම් අනුපාතිකය

වයස	**2017 %**	2016 %
20	**2**	2
25	**1.5**	1.5
30	**1**	1
35	**1**	1
40	**1**	1
45	**1**	1
50	**1**	1
55	**–**	–

(ඌ) පහත දැක්වෙන උපකල්පනයන්ගේ වැඩිවීම/අඩුවීම මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මත ඇති කෙරෙන බලපෑම පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.

	බැංකුව සහ සමූහය			
	2017		2016	
	1% වැඩිවීම	1% අඩුවීම	1% වැඩිවීම	1% අඩුවීම
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය	**16,333,406**	**16,274,156**	14,497,686	14,406,862
වට්ටම් අනුපාතිකය	**15,240,433**	**17,513,994**	13,543,373	15,481,918

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 2. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II

ජීවගණක ඇගයීම ඇමරිකා එක්සත් ජනපද ජීවගණක සංගමයෙහි අධි සාමාජික, පියල් එස්. ගුණතිලක සහ සමාගමෙහි පියල් එස්. ගුණතිලක මහතා විසින් 2017 දෙසැම්බර් 31 දින සිදු කරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් විසින් උපයාගනු ලැබූ අපේක්ෂිත ප්‍රතිලාභයන්හි ජීවගණක වත්මන් අගය, ගණනය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය උපයෝගී කරගන්නා ලදී.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
(අ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ශුද්ධ වත්කම්/(වගකීම්)				
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය	**1,527,607**	1,086,586	**1,527,607**	1,086,586
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්	**(1,481,223)**	(1,005,930)	**(1,481,223)**	(1,005,930)
එකතුව	**46,384**	80,656	**46,384**	80,656
(ආ) ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රමාණය				
ප්‍රවර්තන සේවා පිරිවැය	**106,574**	152,794	**106,906**	153,075
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	**(9,334)**	98,964	**(9,334)**	98,964
ශුද්ධ ප්‍රතිලාභ වියදම්	**97,240**	251,758	**97,572**	252,039
(ඇ) වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති ප්‍රමාණය				
ප්‍රතිපාදන ගැලපීම්	–	–	–	–
ප්‍රත්‍යක්ෂ (ලාභ)/අලාභ	**16,090**	23,289	**16,090**	23,289
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**236,887**	(507,585)	**236,887**	(507,585)
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**4,947**	(51,278)	**4,947**	(51,278)
සැලසුම්ගත වත්කම් මත පොළී ආදායමෙහි වෙනස	–	2,916	–	2,916
එකතුව	**257,924**	(532,658)	**257,924**	(532,658)

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 2. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II (සම්බන්ධයි)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
(අ) සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ				
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි ආරම්භක අගය	**1,086,586**	218,065	**1,086,586**	218,065
සැලසුම්ගත වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ	**130,046**	18,360	**130,046**	18,360
තථ්‍ය සේවය දායකත්වය	**321,223**	802,686	**321,223**	802,686
ගෙවූ ප්‍රතිලාභ	**(5,302)**	(3,804)	**(5,302)**	(3,804)
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**(4,947)**	51,278	**(4,947)**	51,278
සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි අවසාන ශේෂය	**1,527,607**	1,086,586	**1,527,607**	1,086,586
(ඉ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ				
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් ආරම්භක ශේෂය	**1,005,930**	1,220,714	**1,005,930**	1,220,714
පොළී පිරිවැය	**120,712**	120,240	**120,712**	120,240
ප්‍රවර්තන සේවා පිරිවැය	**106,906**	153,075	**106,906**	153,075
ගෙවූ ප්‍රතිලාභ	**(5,302)**	(3,804)	**(5,302)**	(3,804)
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**236,887**	(507,585)	**236,887**	(507,585)
බැඳීම් මත ජීවගණක (ලාභ)/අලාභ	**16,090**	23,289	**16,090**	23,289
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල අවසාන ශේෂය	**1,481,223**	1,005,930	**1,481,223**	1,005,930
(ඊ) සැලසුම්ගත වත්කම්වලට පහත අයිතමයන් ඇතුළත්ය				
භාණ්ඩාගාර බැඳුම්කර	**1,376,780**	937,115	**1,376,780**	937,115
භාණ්ඩාගාර බිල්පත්	**–**	65,000	**–**	65,000
ස්ථාවර තැන්පතු	**140,747**	63,487	**140,747**	63,487
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිළදී ගත් සුරැකුම්පත්	**2,161**	–	**2,161**	–
ඉතුරුම්	**1,006**	186	**1,006**	186
වෙනත් වත්කම්	**6,913**	20,798	**6,913**	20,798
එකතුව	**1,527,607**	1,086,586	**1,527,607**	1,086,586

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 2. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II (සම්බන්ධයි)

	2017 %	2016 %
(උ) ජීවගණක උපකල්පන		
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය (%)	**6.50**	6.50
වට්ටම් අනුපාතිකය (%)	**11.00**	12.00
ජීවන වියදම් දීමනාවෙහි ඉදිරි වැඩිවීම (%)	**4.50**	4.50
මර්ත්‍යතාව	**GA 1983 මර්ත්‍යතා වගුව**	GA 1983 මර්ත්‍යතා වගුව
විශ්‍රාම යාමේ වයස	**අවුරුදු 57**	අවුරුදු 57
සාමාන්‍ය ගෙවීම් ක්‍රමය	**මාසිකව**	මාසිකව

සේවක පිරිවැටුම් අනුපාතිකය

වයස	%	%
20	**2**	2
25	**1.5**	1.5
30	**1**	1
35	**1**	1
40	**1**	1
45	**1**	1
50	**1**	1
55	**–**	–

(ඌ) පහත දැක්වෙන උපකල්පනයන්ගේ වැඩිවීම/අඩුවීම මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මත ඇති කෙරෙන බලපෑම පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.

	බැංකුව සහ සමූහය			
	2017		2016	
	1% වැඩිවීම	1% අඩුවීම	1% වැඩිවීම	1% අඩුවීම
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය	**1,666,712**	**1,323,749**	1,145,953	887,635
වට්ටම් අනුපාතිකය	**1,244,336**	**1,784,570**	846,718	1,208,269

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 3. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්‍රාමික සේවකයින් සඳහා වන වෛද්‍යාධාර යෝජනා ක්‍රමය

ජීවගණක ඇගයීම ඇමරිකා එක්සත් ජනපද ජීවගණක සංගමයෙහි අධි සාමාජික, පියල් එස්. ගුණතිලක සහ සමාගමෙහි පියල් එස්. ගුණතිලක මහතා විසින් 2017 දෙසැම්බර් 31 දින සිදු කරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් විසින් උපයාගනු ලැබූ අපේක්ෂිත ප්‍රතිලාභයන්හි ජීවගණක වත්මන් අගය, ගණනය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය උපයෝගී කරගන්නා ලදී.

දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000
(අ) මූල්‍ය වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ශුද්ධ වත්කම්/(වගකීම්)		
සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගය	**283,336**	300,986
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්	**(1,230,477)**	(937,788)
අඩු කළා		
සේවක දායකත්වය	**(13,689)**	(7,575)
එකතුව	**(960,830)**	(644,377)
(ආ) ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වටිනාකම		
ප්‍රවර්තන සේවා පිරිවැය	**9,393**	4,746
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	**86,715**	66,952
ශුද්ධ ප්‍රතිලාභ වියදම්	**96,108**	71,698
(ඇ) වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති වටිනාකම		
ප්‍රතිපාදන ගැලපීම්	**–**	47,471
ප්‍රත්‍යක්ෂ (ලාභ)/අලාභ	**235,163**	232,764
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**94,023**	(177,376)
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**(12,733)**	(11,788)
සැලසුම්ගත වත්කම් මත පොළී ආදායමෙහි වෙනස	**–**	3,480
එකතුව	**316,453**	94,550
(ඈ) සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ		
සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගයෙහි ආරම්භක අගය	**300,986**	340,170
සැලසුම්ගත වත්කම් වල අපේක්ෂිත ප්‍රතිලාභ	**25,820**	21,909
තථ්‍ය සේව්‍ය දායකත්වය	**96,108**	71,698
සහභාගිකරුවන්ගේ තථ්‍ය දායකත්වය	**6,114**	7,575
ගෙවූ ප්‍රතිලාභ	**(158,425)**	(152,154)
සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ)	**12,733**	11,788
සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගයෙහි අවසාන ශේෂය	**283,336**	300,986

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 3. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්‍රාමික සේවකයින් සඳහා වන වෛද්‍යාධාර යෝජනා ක්‍රමය (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000
(ඉ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ		
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් ආරම්භක ශේෂය	**937,788**	937,468
පොළී පිරිවැය	**112,535**	92,341
ප්‍රවර්තන සේවා පිරිවැය	**9,393**	4,746
ගෙවූ ප්‍රතිලාභ	**(158,425)**	(152,154)
උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ	**94,023**	(177,376)
බැඳීම් මත ජීවගණක (ලාභ)/අලාභ	**235,163**	232,764
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල අවසාන ශේෂය	**1,230,477**	937,788
(ඊ) සැලසුම්ගත වත්කම් වලට පහත අයිතමයන් ඇතුළත්ය		
භාණ්ඩාගාර බැඳුම්කර	**154,270**	121,764
භාණ්ඩාගාර බිල්පත්	**–**	234,960
ස්ථාවර තැන්පතු	**99,224**	6,005
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්	**7,615**	18,450
භාරකාර සහතිකපත්	**83,342**	–
ඉතුරුම්	**484**	265
වෙනත් ගෙවීම්	**(61,599)**	(80,458)
එකතුව	**283,336**	300,986

(උ) ජීවගණක උපකල්පන

	2017 **%**	2016 %
වෛද්‍ය පිරිවැය උද්ධමන අනුපාතිකය	**5.00**	5.00
වට්ටම් අනුපාතිකය	**11.00**	12.00

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 4. පාරිතෝෂික සැලසුම – බැංකුව සහ සමූහය

බැංකුව

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II පිහිටුවීමත් සමග 1995 ඔක්තෝබර් 01 දින හෝ ඊට පසු සේවයට බැඳුණු සේවකයින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වන බැවින්, සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙහි අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් කියනු නොලබයි. කෙසේ වුවද විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් කීමට ප්‍රථම සේවා පාරිතෝෂික ගෙවීමක් ඇති විට බැංකුව ඒවා මුදල් පදනම යටතේ හඳුනාගනී.

සමූහය

පරිපාලිත සමාගමෙහි කාර්ය මණ්ඩලය විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් කියනු නොලබයි. එහෙයින් 1983 අංක 12 දරන පාරිතෝෂික පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර ඔවුහු පාරිතෝෂික සැලසුමෙහි සාමාජිකත්වය අඛණ්ඩව දරනු ලබති.

	2017		2016	
	බැංකුව රු. '000	සමූහය රු. '000	බැංකුව රු. '000	සමූහය රු. '000
(අ) ශුද්ධ ප්‍රතිලාභ වියදම් (සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගත්)				
ප්‍රවර්තන සේවා පිරිවැය	–	**119**	–	115
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	–	**125**	–	132
ශුද්ධ ප්‍රතිලාභ වියදම්	–	**244**	–	247
(ආ) සේවා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන				
ජනවාරි 01 දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්	–	**1,260**	–	1,346
පොළී වියදම	–	**125**	–	132
ප්‍රවර්තන සේවා පිරිවැය	–	**119**	–	115
ගෙවූ ප්‍රතිලාභ	–	**–**	–	–
බැඳීම් මත ජීවගණක (ලාභ)/අලාභ	–	**(270)**	–	(333)
දෙසැම්බර් 31 දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්	–	**1,234**	–	1,260

34. වෙනත් වගකීම් (සම්බන්ධයි) →

34. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි) →

34. (අ) 4. පාරිතෝෂික සැලසුම – බැංකුව සහ සමූහය (සම්බන්ධයි)

(ඇ) ජීවගණක උපකල්පන

		සමූහය	
		2017 ٪	2016 ٪
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය		**6.59**	6.50
වට්ටම් අනුපාතිකය		**10.63**	10.00
මර්ත්‍යතාව		**0**	0
සේවක පිරිවැටුම් අනුපාතිකය සහ ඉදිරි සේවා කාලයෙහි සාමාන්‍යය			
වයස් කාණ්ඩය	30-34	35-39	40<
සේවක පිරිවැටුම් අනුපාතිකය	0%	0%	0%
ඉදිරි සේවා කාලයෙහි සාමාන්‍යය – වර්ෂ	30	23	16

(ඇ) පහත දැක්වෙන උපකල්පනයන්ගේ වැඩිවීම/අඩුවීම මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මත ඇති කෙරෙන බලපෑම පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැක.

	සමූහය			
	2017		2016	
	1٪ වැඩිවීම	1٪ අඩුවීම	1٪ වැඩිවීම	1٪ අඩුවීම
ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය	**183**	**219**	226	190
වට්ටම් අනුපාතිකය	**226**	**191**	183	220

උපකල්පන

මූල්‍ය උපකල්පන – වට්ටම් අනුපාතිකය, වැටුප් වර්ධක අනුපාතිකය

ජනවිකාස මත පදනම්වූ උපකල්පන – මර්ත්‍යතාව, සේවක පිරිවැටුම, ආබාධිතබව, විශ්‍රාම ගැනීමේ වයස

35. යටත්කාලීන වගකීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සඳහා සමූහය විසින් ණයට ගනු ලැබූ අරමුදල් මේ මගින් නියෝජනය වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට සමූහය විසින් නියම කරනු ලබන අවස්ථාවලදී හැරුණුකොට මූලික හඳුනාගැනීමෙන් අනතුරුව මෙම අරමුදල් සඵල පොළී අනුපාතික ක්‍රමය උපයෝගී කරගනිමින් එහි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ගෙවූ/ගෙවිය යුතු පොළිය ලාභය හෝ අලාභයෙහි දක්වනු ලැබේ.

ණයකර නිකුත් කිරීමෙහි මූලික අරමුණ වනුයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත ඉහළ නැංවීම සඳහා හා බැංකුවෙහි වත්කම් හා වගකීම් කළඹ අතර කල්පිරීම්හි නොගැලපීම් අඩුකිරීම සඳහා බැංකුවේ ප්‍රාග්ධනය ඉහළ නංවාලීමයි.

බැංකුව මෙම නිකුතුවල මුළු ප්‍රතිපාදන භාවිතය තුළින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල වත්කම් සංචිතය ව්‍යාප්ත කර ගැනීමට අදහස් කරයි.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ජනවාරි 01 දිනට ශේෂය	**6,000,000**	–	**6,000,000**	–
වර්ෂය තුළ ලබාගත් ණය	**–**	6,000,000	**–**	6,000,000
වර්ෂය තුළ ආපසු ගෙවීම්/නිදහස් කිරීම්	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය (ක්‍රමක්ෂය පොළියට ගැලපීමට පෙර) (සටහන 35.1)	**6,000,000**	6,000,000	**6,000,000**	6,000,000
ගෙවිය හැකි ක්‍රමක්ෂය පොළියෙහි ශුද්ධ බලපෑම	**6,411**	6,411	**6,411**	6,411
දෙසැම්බර් 31 දිනට ගලපන ලද ශේෂය	**6,006,411**	6,006,411	**6,006,411**	6,006,411

2017 දෙසැම්බර් 31 දින බැංකුවේ යටත්කාලීන වගකීම්, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි ප්‍රතිපාදන යටතේ පෞද්ගලික ස්ථාපන ලෙස 2016 දෙසැම්බර් 29 දින නිකුත් කරන ලද රු. 100/- ශ්‍රේණිගත කළ සුරැකුම් රහිත යටත්කාලීන සහ නිදහස් කළ හැකි ණයකර රුපියල් 6,000,000,000.00 වලින් සමන්විත වේ. එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් මෙම යටත්කාලීන වගකීම් නිකුත් කිරීමේ භාරකාරීත්වය දරයි. ලංකා ෆිච් රේටින් ආයතනය මෙම වගකීම් AA+(lka) යටතට වර්ගීකරණය කර ඇත.

35.1 යටත්කාලීන වගකීම් කාණ්ඩ →

කාණ්ඩය	නාමික අගය	පොළී අනුපාතිකය	ආපසු ගෙවීමේ නියමයන්	නිකුත් කළ දිනය	කල් පිරීමේ දිනය	වාර්ෂික ඵලදායීතාව		බැංකුව		සමූහය	
						2017 %	2016 %	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
බැංකුව විසින් නිකුත් කළ ස්ථාවර අනුපාතිකය 13%	6,000,000	13% වා.පොා.	අර්ධ වාර්ෂිකව	29 දෙසැම්බර් 2016	29 දෙසැම්බර් 2021	**13.42**	13.42	**6,000,000**	6,000,000	**6,000,000**	6,000,000
වසරකට පසු ගෙවියයුතු එකතුව								**6,000,000**	6,000,000	**6,000,000**	6,000,000

නිකුත් කරන්නාගේ විසුරුවා හැරීමකදී, ඉහත වගකීම් නිකුත් කරන්නාගේ සියලුම ණයහිමියන් සහ තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් වලට යටත් වනු ඇත.

36. ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය →

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
අනුමත කළ				
ජනවාරි 01 දිනට එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් බිලියන 01	**10,000,000**	10,000,000	**10,000,000**	10,000,000
නිකුත් කළ හා ගෙවා නිමි ශේෂය ජනවාරි 01 දිනට				
එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 620	**6,200,000**	3,200,000	**6,200,000**	3,200,000
වර්ෂය තුළ සාමාන්‍ය කොටස් නිකුතුව				
එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 50	**500,000**	3,000,000	**500,000**	3,000,000
එකතුව	**6,700,000**	6,200,000	**6,700,000**	6,200,000

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වගන්තියෙහි උප වගන්ති 3 අනුව, බැංකුව විසින් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 50 ක් හිමිකම් නොපෑ තැන්පතු සංචිතය උපයෝගී කරගනිමින් භාණ්ඩාගාර ලේකම් වෙත 2017 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලදී. (පිටු අංක 342 හි හිමිකම් නොපෑ තැන්පතු සංචිතය සටහන් අංක 38.1 වෙත යොමු වන්න.)

37. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල →

1988 අංක 30 දරණ බැංකු පනතෙහි 20 (1) වගන්තියෙහි දැක්වෙන උපදෙස් පරිදි ව්‍යවස්ථාපිත අරමුදල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් 50% කට සමාන වන තෙක් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට හෝ ලාභය වෙනත් ස්ථානයකට මාරු කිරීමට පෙර බදු පසු ලාභයෙන් 5% ක් ද, ඉන් අනතුරුව එම සංචිත අරමුදල බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනයට සමාන වනතෙක් එම ලාභයෙන් 2% ක්ද වශයෙන් වෙන් කරමින් ව්‍යවස්ථාපිත සංචිත අරමුදල ගොඩනගනු ඇත.

1988 අංක 30 දරණ බැංකු පනතෙහි 20 (2) වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණු සඳහා පමණක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදලෙහි ශේෂය භාවිතා කරනු ලැබේ.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ආරම්භක ශේෂය	**2,522,467**	2,047,581	**2,522,467**	2,047,581
වර්ෂය තුළ මාරුකිරීම් – බදු පසු ලාභයෙන් 5%	**480,485**	474,886	**480,485**	474,886
අවසන් ශේෂය	**3,002,952**	2,522,467	**3,002,952**	2,522,467

38. වෙනත් සංචිත →

බැංකුව – 2017 →

	2017.01.01 දිනට ආරම්භක ශේෂය රු. '000	වෙනස්වීම්/ මාරුකිරීම් රු. '000	**2017.12.31 දිනට අවසාන ශේෂය රු. '000**
පොදු සංචිතය	15,740,879	2,000,000	**17,740,879**
ප්‍රත්‍යාගණන සංචිතය	3,296,565	4,496,752	**7,793,317**
විකිණීම සඳහා පවතින සංචිතය	1,378,818	(33,581)	**1,345,237**
ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිත	1,850	290,074	**291,924**
අනෙකුත් සංචිත (සටහන 38.1, 38.2)	725,695	392,891	**1,118,586**
එකතුව	21,143,806	7,146,136	**28,289,941**

බැංකුව – 2016 →

	2016.01.01 දිනට ආරම්භක ශේෂය රු. '000	වෙනස්වීම්/ මාරුකිරීම් රු. '000	**2016.12.31 දිනට අවසාන ශේෂය රු. '000**
පොදු සංචිතය	18,839,027	(3,098,147)	15,740,879
ප්‍රත්‍යාගණන සංචිතය	3,296,565	–	3,296,565
විකිණීම සඳහා පවතින සංචිතය	1,631,862	(253,044)	1,378,818
ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිත	139,106	(137,256)	1,850
අනෙකුත් සංචිත (සටහන 38.1, 38.2)	3,269,686	(2,543,992)	725,695
එකතුව	27,176,246	(6,032,439)	21,143,806

සමූහය – 2017 →

	2017.01.01 දිනට ආරම්භක ශේෂය රු. '000	වෙනස්වීම්/ මාරුකිරීම් රු. '000	**2017.12.31 දිනට අවසාන ශේෂය රු. '000**
පොදු සංචිතය	15,740,879	2,000,000	**17,740,879**
ප්‍රත්‍යාගණන සංචිතය	3,296,565	4,496,752	**7,793,317**
විකිණීම සඳහා පවතින සංචිතය	1,096,758	131,662	**1,228,420**
ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිත	1,850	290,074	**291,924**
අනෙකුත් සංචිත (සටහන 38.1, 38.2, 38.3)	1,219,656	483,590	**1,703,246**
එකතුව	21,355,707	7,402,077	**28,757,786**

38. වෙනත් සංචිත (සම්බන්ධයි) →

සමූහය – 2016 →

	2016.01.01 දිනට ආරම්භක ශේෂය රු. '000	වෙනස්වීම්/ මාරුකිරීම් රු. '000	**2016.12.31 දිනට අවසාන ශේෂය රු. '000**
පොදු සංචිතය	18,839,027	(3,098,147)	15,740,879
ප්‍රත්‍යාගණන සංචිතය	3,296,565	–	3,296,565
විකිණීම සඳහා පවතින සංචිතය	1,452,761	(356,003)	1,096,758
ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිත	139,106	(137,256)	1,850
අනෙකුත් සංචිත (සටහන 38.1, 38.2, 38.3)	3,743,793	(2,524,138)	1,219,656
එකතුව	27,471,252	(6,115,544)	21,355,707

38.1 හිමිකම් නොපෑ තැන්පතු සංචිතය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ආරම්භක ශේෂය	**723,509**	3,267,505	**723,509**	3,267,505
කොටස් ප්‍රාග්ධනයට මාරුකිරීම්	**(500,000)**	(3,000,000)	**(500,000)**	(3,000,000)
වර්ෂය තුළ මාරුකිරීම්	**892,892**	456,004	**892,892**	456,004
අවසාන ශේෂය	**1,116,401**	723,509	**1,116,401**	723,509

1995 අංක 28 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 30 වන වගන්තියෙන් සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වන වගන්තිය ප්‍රකාර දස වසරක කාලයක් ඉතුරුම් තැන්පතු හෝ ස්ථාවර තැන්පතු ගිණුම්ක නිශ්ක්‍රීයව පවතින අරමුදල්, හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කළ යුතුය. ඒ අනුව 2017 වර්ෂය තුළ රුපියල් මිලියන 892.9 ක ශුද්ධ අගයක් එම සංචිතයට මාරු කර තිබේ.

38.2 විශේෂ සංචිතය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ආරම්භක ශේෂය	**2,186**	2,182	**2,186**	2,182
වර්ෂය තුළ මාරුකිරීම්	**(1)**	4	**(1)**	4
අවසාන ශේෂය	**2,185**	2,186	**2,185**	2,186

38. වෙනත් සංචිත (සම්බන්ධයි) →

38.2 විශේෂ සංචිතය (සම්බන්ධයි) →

නිශ්ක්‍රීය අරමුදල් එකතුව රු. 10/- ට වඩා අඩු අවස්ථාවලදී ගනුදෙනුකරුවන්ගේ නිදි ගිණුම්වලින් මාරු කරන අරමුදල්, විශේෂ සංචිතය මගින් නියෝජනය වෙයි.

විශේෂ සංචිත හා හිමිකම් නොපෑ සංචිත ප්‍රාග්ධනීකරණය කළහැකි අතර, එලෙස ප්‍රාග්ධනීකෘත අගයට සරිලන කොටස් භාණ්ඩාගාර ලේකම් නමට නිකුත් කළ හැකිය. නිකුත් කළ සහ ගෙවා නිමි කොටස් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළබිඹු වන රුපියල් මිලියන 6,700 ක කොටස් ප්‍රාග්ධනය හිමිකම් නොපෑ තැන්පතු සංචිතය වරින්වර ප්‍රාග්ධනීකරණය තුළින් නිකුත් කරන ලදී.

38.3 විශේෂ අවදානම් සංචිතය (එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ආරම්භක ශේෂය	**–**	–	**493,961**	474,107
වර්ෂය තුළ මාරුකිරීම් – බදු පසු ලාභයෙන් 25%	**–**	–	**90,699**	19,854
අවසාන ශේෂය	**–**	–	**584,660**	493,961

ප්‍රාථමික අලෙවිකරු පද්ධතියෙහි අඛණ්ඩතාවය සුරක්ෂිතබව හා ස්ථාවරත්වය වර්ධනය පිණිසත්, ප්‍රාථමික අලෙවිකරු ප්‍රාග්ධන සංචිතය ගොඩනැංවීම සඳහාත් 2004 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ බදු පසු ලාභයෙන් යම් ප්‍රතිශතයක් පහත පරිදි වාර්ෂිකව විශේෂ අවදානම් සංචිතයට මාරු කළ යුතු වේ.

I. රුපියල් මිලියන 400 ට වඩා අඩු ප්‍රාග්ධන අරමුදලක් පවත්වාගෙන යනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් වාර්ෂිකව බදු පසු ලාභයෙන් 50% ක්.

II. රුපියල් මිලියන 400 ට වඩා වැඩි ප්‍රාග්ධන අරමුදලක් පවත්වාගෙන යනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් වාර්ෂිකව බදු පසු ලාභයෙන් 25% ක්.

වෙනත් සංචිත

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
වෙනත් සංචිත එකතුව	**1,118,586**	725,695	**1,703,246**	1,219,656

39. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලං.ගි.ප්‍ර. 37 හි නිර්වචිත ආකාරයට අවිනිශ්චිත අනාගත සිදුවීමක් මගින් පැවැත්ම තහවුරු කෙරෙන අතීත සිදුවීම් වලින් පැන නැගිය හැකි බැඳීමක් හෝ ආර්ථික ප්‍රතිලාභ ගලායාමේ භව්‍යතාවයක් නොමැති හෝ බැඳීමේ ප්‍රමාණය විශ්වාසනීය ලෙස මැනිය නොහැකි ප්‍රවර්තන බැඳීමක්, අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ.

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලනු පිණිස, බැංකුව ආපසු හැරවිය නොහැකි විවිධ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්වලට සම්බන්ධ වේ. මේ අතර මූල්‍ය ඇපකර, ණයවර ලිපි සහ ණයදීම සඳහා වෙනත් ලබා නොගත් බැඳීම් ඇතුළත් වේ. ණයවර ලිපි සහ ඇපකර මගින් සාමාන්‍යයෙන් ආනයනයට හෝ අපනයනයට අදාළ නිශ්චිත කටයුතු වලදී ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමට බැංකුව වෙත බැඳීමක් ඇති කරයි. ණය සම්බන්ධයෙන් එක හා සමාන අවදානමක් ඇපකර සහ ණය පොරොත්තු ලිපි මගින් ඇති කෙරෙයි.

අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන නොමැති අතර, එම සිදුවීම විරල නොවන විට මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
බැඳීම්				
භාවිතයට නොගත් ණය පහසුකම් වෙත බැඳීම්	**14,963,565**	22,727,130	**14,963,565**	22,727,130
වෙනත් බැඳීම් – වක්‍ර ණය පහසුකම්	**78,648**	74,149	**78,648**	74,149
ප්‍රාග්ධන බැඳීම් (සටහන 39.1)	**1,260,213**	468,580	**1,260,213**	468,580
	16,302,426	23,269,859	**16,302,426**	23,269,859
අසම්භාව්‍ය වගකීම්				
සංලේඛන ණය	**276,003**	109,948	**276,003**	109,948
ඇපකර	**1,741,883**	1,590,253	**1,741,883**	1,590,253
	2,017,886	1,700,201	**2,017,886**	1,700,201
බැඳීම් සහ අසම්භාව්‍යතා එකතුව	**18,320,312**	24,970,060	**18,320,312**	24,970,060

39. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් (සම්බන්ධයි) →

39.1 ප්‍රාග්ධන බැඳීම් →

මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිපාදන වෙන් නොකරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
අනුමත කළ සහ ගිවිසුම්ගත කළ	**1,187,213**	408,380	**1,187,213**	408,380
අනුමත කළ නමුත් ගිවිසුම්ගත නොකළ	**73,000**	60,200	**73,000**	60,200
	1,260,213	468,580	**1,260,213**	468,580

40. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා රජය හා රාජ්‍ය පාලිත ආයතන සමග වර්ෂය සඳහා හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දිනට පවතින මූල්‍ය ගනුදෙනු, සාමූහික පදනමක් යටතේ පහත හෙළිදරව් කර ඇත.

40. (අ) රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමග ගනුදෙනු →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
වත්කම්				
රජයට දුන් ණය	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
රාජ්‍ය සුරැකුම්පත් මත සිදු කරන ලද ආයෝජන	**550,064,186**	525,123,106	**556,857,496**	535,630,193
රජයේ හා රජයේ පාලිතයන්ගේ ආයෝජන	**151,145,775**	127,543,373	**151,145,775**	127,543,373
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්	**1,660,634**	2,220,500	**1,672,197**	2,232,062
ලැබිය යුතු බදු/(කාල්පනික බදු)	**7,184,079**	5,813,616	**7,212,333**	5,833,897
තැපැල්පතිගේ ජංගම ගිණුම	**351,107**	314,534	**351,107**	314,534
රජයට වෙනත් අත්තිකාරම් ගෙවීම්	**4,480,000**	4,800,000	**4,480,000**	4,800,000
රජයෙන් ලැබිය යුතු දෑ – අනෙකුත්	**8,426,009**	5,919,297	**8,426,009**	5,919,297
	725,386,790	673,809,427	**732,219,917**	684,348,357

40. සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ හෙළිදරව් කිරීම (සම්බන්ධයි) →

40. (අ) රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමග ගනුදෙනු (සම්බන්ධයි) →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
වගකීම්				
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**2,198,575**	–	**2,198,575**	–
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	**51,917,316**	21,708,120	**27,297,637**	27,297,637
බදු ගෙවීම්				
ආදායම් බදු	**4,419,019**	3,805,271	**4,595,065**	3,834,995
එකතු කළ අගය මත බදු	**3,082,619**	2,405,618	**3,168,299**	2,423,091
ජාතිය ගොඩනැංවීමේ බදු	**411,016**	385,670	**422,440**	388,482
ඒකාබද්ධ අරමුදලට දායකවීම් – ලාභාංශ/අයබදු	**5,111,114**	12,026,000	**5,111,114**	12,027,650
	13,023,768	18,622,560	**13,296,918**	18,674,217

40.(ආ) පරිපාලිත සමාගම සමග ගනුදෙනු (සී/ස එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්) →

බැංකුව ඉහත සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි රුපියල් මිලියන 900 ක් ආයෝජනය කර ඇත. වර්ෂය තුළ සමාගම විසින් සිය අරමුදල්, භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සහ ප්‍රතිමිලදී ගැනීම් උපකරණවල විධිමත් පදනමකින් ආයෝජනය කර ඇත. බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනයන් සමාගම මගින් සිදුකර ඇති අතර ඒ සඳහා සේවා ගාස්තු වශයෙන් රුපියල් මිලියන 58.7 ක් ගෙවා ඇත. (2016 – රුපියල් මිලියන 52.6) වර්ෂය තුළ රුපියල් මිලියන 922.35 ක ලාභාංශ බැංකුව වෙත ලැබී ඇත. (2016 – රුපියල් මිලියන 14.85)

බැංකුව විසින් එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සමග වාර්තාකරණ දින වන විට පහත ශේෂයන් පවත්වා ගන්නා ලදී.

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	**2017 රු. '000**	2016 රු. '000
වත්කම්		
අන්තර් සමාගම් ජංගම ගිණුම	**51**	300
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්	**1,564,600**	810,000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී	**1,326**	383
වෙනත් ලැබීම්	**955**	1,764
වගකීම්		
වෙනත් ගෙවීම්	**750**	–

40. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම (සම්බන්ධයි) →

40. (ඇ) බැංකුවේ පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු →

වර්ෂාවසානයට බැංකුව හා බැංකුවේ පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු සාරාංශගතව පහතින් දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ජාතික ඉතිරිකිරීමේ බැංකු සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය I				
වගකීම්				
ස්ථාවර තැන්පතු	**263,813**	844,854	**263,813**	844,854
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**242,643**	14,800	**242,643**	14,800
ණයකර	**1,700,000**	1,700,000	**1,700,000**	1,700,000
වත්කම්				
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	–	1,525,000	–	1,525,000
තැන්පතු මත ණය	–	170,490	–	170,490
ජාතික ඉතිරිකිරීමේ බැංකු සේවක අර්ථසාධක අරමුදල				
වගකීම්				
ස්ථාවර තැන්පතු	–	241,000	–	241,000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**36,637**	20,000	**36,637**	20,000
ණයකර	**125,000**	125,000	**125,000**	125,000
වත්කම්				
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**28,068**	–	**28,068**	–
වගකීම්				
ජාතික ඉතිරිකිරීමේ බැංකු සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II				
ස්ථාවර තැන්පතු	**140,373**	66,300	**140,373**	66,300
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**3,137**	–	**3,137**	–
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්‍රාමික සේවකයන් සඳහා වන වෛද්‍යාධාර ක්‍රමය				
ස්ථාවර තැන්පතු	**101,405**	6,967	**101,405**	6,967
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**8,253**	17,516	**8,253**	17,516
වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල				
ස්ථාවර තැන්පතු	**19,763**	20,800	**19,763**	20,800
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**5,078**	–	**5,078**	–

40. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම (සම්බන්ධයි) →

40. (ඈ) ප්‍රධාන කළමනාකාරිත්වය සමග ගනුදෙනු →

(i) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ පරිපාලිත සමාගමේ අධ්‍යක්ෂ ධුරය හොබවන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීන් ප්‍රධාන කළමනාකාරිත්වයට ඇතුළත්වේ.

(ii) ප්‍රධාන කළමනාකාරිත්වය විසින් ලබා ගත් ණය හා අත්තිකාරම් පහත දැක්වේ.

	බැංකුව සහ සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000
ණය හා අත්තිකාරම්	**82,294**	52,660

(iii) සභාපතිතුමා, අධ්‍යක්ෂකවරුන් සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ 2017 වර්ෂය තුළ, පාරිශ්‍රමික සහ ගාස්තු රුපියල් මිලියන 69.11 ක් විය. (2016 වර්ෂයේදී එය රුපියල් මිලියන 70.52 කි.)

40. (ඉ) සම්බන්ධිත පාර්ශ්වයන්ට දෙන ලද ශුද්ධ ප්‍රතියෝජනය →

(ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ ආයතනික යහපාලන විධානයේ අංක 3 (8) (11) (ඉ) ට අනුව හෙළිදරව් කිරීමකි.)

	බැංකුව සහ සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000
ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ලබාදුන්		
ණය හා අත්තිකාරම්	**82,294**	52,660
ශුද්ධ ප්‍රතියෝජන එකතුව	**82,294**	52,660
නියාමන ප්‍රාග්ධනය	**32,808,403**	29,667,577
ශුද්ධ ප්‍රතියෝජනය, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස	**0.3**	0.2

40. (ඊ) වෙනත් සම්බන්ධිත පාර්ශ්ව වෙතින් ලැබිය යුතු →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් – එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී	**31,300**	157,400	**31,300**	157,400
එන්ට්‍රස්ට් සෙකියුරිටීස් වෙතින් ලැබියයුතු	**96,068**	38,540	**96,068**	38,540
	127,368	195,940	**127,368**	195,940

40. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම (සම්බන්ධයි) →

40. (උ) වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ප්‍රතිමිලදී ගැනීම් ණය – එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී	**–**	2,637,795	**–**	2,637,795
වෙනත් ගෙවීම් – එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී	**633,133**	607,985	**633,133**	607,985
	633,133	3,245,780	**633,133**	3,245,780

41. සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ලවය ලෙස යොදා ගත් වටිනාකම				
කොටස් හිමිකරුවන්ගේ අරමුදල්	**40,221,778**	32,245,580	**41,266,465**	33,786,788
හරය ලෙස යොදා ගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව මුළු කොටස් ගණන	**670,000**	620,000	**670,000**	620,000
සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් අගය (රු.)	**60.03**	52.01	**61.59**	54.49

42. බදු පෙර ලාභයේ ඇති මූල්‍ය නොවන අයිතම →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
දේපල, පිරියත හා උපකරණ ක්ෂයවීම්	**315,741**	289,683	**316,492**	290,314
බදු දේපල ක්‍රමක්ෂය	**11,415**	7,198	**11,415**	7,198
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	**96,391**	35,512	**96,444**	35,512
ණය හා ලැබිය යුතු දෑ මත හානිකරණය	**693,233**	(99,693)	**693,233**	(99,693)
දේපල, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය	**(2,826)**	(70,016)	**(2,824)**	(70,014)
ආයෝජන සුරැකුම් වලින් වට්ටම් වැඩිවීම් සහ අධිමිල ක්‍රමක්ෂය	**(721,202)**	1,048,604	**(1,009,119)**	1,165,960
විදේශ මුදල් ප්‍රත්‍යාගණනය	**(111,687)**	(16,726)	**(111,687)**	(16,726)
ප්‍රසාද කොටස්/ලාභාංශ ලැබීම්	**(750,000)**	–	**–**	–
මූල්‍ය ආයෝජනවලින් ලැබීම්/වෙනත්	**(707,491)**	(40,923)	**(724,991)**	(40,923)
එකතුව	**(1,176,426)**	1,153,639	**(731,037)**	1,271,628

43. මෙහෙයුම් වත්කම් වල වෙනස්වීම →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වල වෙනස්වීම්	**1,657,805**	869,583	**1,657,805**	869,583
ණය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවත්වාගෙන යන කල්පිරීම තෙක් රඳවාගත් හිමිකම් කොටස් වල ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	**(23,930,314)**	1,680,328	**(21,398,172)**	(776,569)
බැංකු වලට දෙන ලද ණය හා ලැබිය යුතු දෑ ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	**4,119,507**	(8,116,249)	**3,862,838**	(8,098,247)
ගනුදෙනුකරුවන්ට දෙන ලද ණය හා ලැබිය යුතු දෑ ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	**(69,026,157)**	(43,844,407)	**(68,281,204)**	(43,040,691)
වෙනත් වත්කම් වල වෙනස්වීම්	**(3,802,125)**	(5,351,671)	**(3,954,044)**	(5,454,009)
එකතුව	**(90,981,284)**	(54,762,416)	**(88,112,777)**	(56,499,933)

44. මෙහෙයුම් වගකීම් වල වෙනස්වීම් →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	**2017 රු. '000**	2016 රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වල වෙනස්වීම්	**956,937**	–	**956,937**	–
බැංකුවල තැන්පතු, ගනුදෙනුකාර තැන්පතු සහ නිකුත් කළ ණය සුරැකුම්පත් වල වෙනස්වීම්	**80,874,270**	61,504,606	**78,778,982**	64,212,785
වෙනත් වගකීම්වල වෙනස්වීම්	**(757,526)**	106,892	**(720,668)**	103,812
එකතුව	**81,073,681**	61,611,498	**79,015,251**	64,316,597

45. බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන්

බැංකුකරණ ව්‍යාපාරයේ ස්වභාවය අනුව නීති කෘත්‍යයන් යනු නොවැළැක්විය හැකි සිදුවීමකි. එවැනි නෛතික හිමිකම් සමග කටයුතු කිරීම සඳහා බැංකුවට ස්ථාපිත කෙටුම්පතක් ඇත. ප්‍රතිඵලයන්හි නිශ්චිතභාවය සම්බන්ධයෙන් වෘත්තීය උපදෙස් ලබාගත් පසු සහ අලාභයන් සාධාරණ අගයකට තක්සේරු කළ පසු, අදාළ නෛතික හිමිකම් වලින් මූල්‍ය ස්ථාවරයට විය හැකි අහිතකර බලපෑම් සඳහා බැංකුව තම ගිණුම් වලට ගැලපීම් සිදුකරනු ලබයි. ප්‍රතිඵලයන්හි අවිනිශ්චිතභාවය හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශන වලට කිසිදු ගැලපීමක් සිදු නොකළ, වර්ෂ අවසානයට ඇති බැංකුවට විරුද්ධ නොවිසඳුනු නඩු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

දෙසැම්බර් 31 දිනට	**2017**	2016
විනිශ්චය සභා/අධිකරණ		
කම්කරු විනිශ්චය සභා	**5**	6
කම්කරු කොමිෂන් සභා	**0**	1
කාර්මික අධිකරණය	**0**	2
මහේස්ත්‍රාත් අධිකරණය	**4**	8
දිස්ත්‍රික් අධිකරණය	**30**	32
මහාධිකරණය, සිවිල් අභියාචන මහාධිකරණය, පළාත්බද මහාධිකරණය	**4**	5
අභියාචනාධිකරණය	**6**	8
ශ්‍රේෂ්ඨාධිකරණය	**1**	3

46. මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්තා කරනු ලබන දින හා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලද දින අතර සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම් වාර්තාකරණ දිනට පසු සිදුවීම් ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං.ගි.ප්‍ර. 10) හි වාර්තා කරන දිනට පසු සිදුවීම් ප්‍රකාර වාර්තා කරනු ලබන දිනට පසු ඇතිවූ සැලකියයුතු සියලුම සිදුවීම් අවශ්‍ය පරිදි සැලකිල්ලට ගෙන සුදුසු ගැලපුම්/හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශයන්හි සිදුකර ඇත.

පහත හෙළිදරව් කරන ලද සිදුවීම් හැරුණු කොට වාර්තාකරණ දිනට පසුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් හෝ ගැලපීම් කළයුතු ආකාරයේ සිදුවීම් සිදුවී නොමැත.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධ කිරීම

2016 අයවැය යෝජනා මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ අතර, වාර්තාකරන දින වනවිට බැංකුව එම යෝජනාව පිළිබඳ ඇගයීමේ නියැලී සිටියි.

47. සංසන්දනාත්මක තොරතුරු →

වඩාත් සුදුසු ඉදිරිපත් කිරීමක් සඳහා ප්‍රවර්තන වර්ෂයේ වර්ගීකරණය හා තහවුරු කර ගැනීමට සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිවර්ගීකරණය කොට ඉදිරිපත් කොට ඇත.

වර්ෂය තුළ ප්‍රතිවර්ගීකරණ වාර්තා නොවිනි.

48. මූල්‍ය අවදානම් කළමනාකරණය →

48.1 අවදානම් කළමනාකරණ ව්‍යුහය →

විවිධ අවදානම් සහ එබඳු අවදානම් හඳුනාගැනීමේ යාන්ත්‍රණ, අවදානම් කළමනාකරණය කිරීමේ සහ අවම කිරීමේ සඵලදායී විධික්‍රම ආවරණය කෙරෙන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, ජාතික ඉතිරිකිරීමේ බැංකු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ව්‍යුහයට අයත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය යටතේ බැංකුවේ අවදානම් කළමනාකරණ ව්‍යුහය පවතින අතර, අවදානම් කළමනාකරණ වගකීම ඉටු කරලීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇත. අවදානම් කළමනාකරණ අංශය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා ස්වාධීනව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි. බැංකුවේ අවදානම් කළමනාකරණයෙහි ප්‍රමාණවත් බව සහ සඵලදායී බව තහවුරු කිරීම පිණිස මෙම කළමනාකරණ කමිටු විසින් අදාළ ව්‍යාපාරික අංශ සහ අවදානම් කළමනාකරණ අංශයෙන් වරින්වර ලැබෙන වාර්තා සුපරීක්ෂාකාරී අවධානයෙන් යුතුව සමාලෝචනයට බඳුන් කරනු ලබයි.

පහත විධායක කළමනාකරණ අනුකමිටු අතිශයින් නිවැරදිව සෑම අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයකම අවධානම් කරුණු සම්බන්ධීකරණය කිරීමට වගකීමට බැඳේ.

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව
- වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
- ණය කමිටුව
- ආයෝජන කමිටුව
- තොරතුරු තාක්ෂණ මාර්ගෝපදේශ කමිටුව
- මානව සම්පත් කමිටුව
- මෙහෙයුම් කාර්ය සමාලෝචන කමිටුව
- අලෙවි කමිටුව
- කළමනාකරණ කමිටුව

අභ්‍යන්තර විගණන අංශය මගින් අවදානම් කළමනාකරණ පාලන හා ක්‍රියාපටිපාටි නිතිපතා හා අහඹු ලෙස සමාලෝචනය කෙරෙන අතර, එම ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කෙරෙයි.

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද →

මූල්‍ය උපකරණ වලින් පැන නගින මතු සඳහන් අවදානම් ප්‍රභේද වලට බැංකුව නිරාවරණය වෙයි.

අ. ණය අවදානම

ආ. ද්‍රවශීලතා අවදානම

ඇ. වෙළඳපොළ අවදානම

(i) විදේශ විනිමය අවදානම

(ii) හිමිකම් අවදානම

(iii) පොළී අනුපාතික අවදානම

ඈ. මෙහෙයුම් අවදානම

අ. ණය අවදානම

ශේෂ පත්‍රයෙන් පරිබාහිර හෝ ශේෂ පත්‍රය තුළ බැංකු මෙහෙයුම් වලින් ඇති විය හැකි, ප්‍රතිපාර්ශවයන් හෝ ණයකරුවන් මූල්‍ය හෝ ගිවිසුම්ගත බැඳීම් ඉටු නොකිරීමට අසමත්වීම තුළින් අලාභ ඇතිවීමේ හැකියාව, ණය අවදානමයි. ලබා නොගත් ණය බැඳීම් මගින් පැන නගින ණය අවදානම් ශේෂපත්‍රයෙන් පරිබාහිර අවදානම් වන අතර, පාරිභෝගික ණය, ආයතනික ණය, බැංකු හා මූල්‍ය ආයතන සඳහා පිරිනමන ණය, රජයට හා රාජ්‍ය ආයතන වෙත පිරිනමන ණය ආදී මූල්‍ය නිමැයුම් හි කල්පිත අගය තුළින් පැන නගින අවදානම් ශේෂපත්‍රය තුළ දැක්වෙන අවදානම් වේ.

i. බැංකුවේ ණය අවදානම් නිරාවරණයවීම

බැංකුවේ දෙවන ප්‍රධානතම ව්‍යාපාරය මත ඇති සමස්ත ණය නිරාවරණයවීම්, 38.5% කි. (අවදානම් රහිත සුරැකුම්හි ආයෝජනය, මුළු වත්කම් වලින් 54.8% කි.) එහෙයින්, බැංකුව විසින් ණය අවදානම, ප්‍රධාන වර්ගයේ අවදානමක් ලෙස සලකන නමුදු බැංකුවට බලපාන ණය අවදානමෙහි ප්‍රමාණය සංසන්දනාත්මකව බැලූ විට අඩුය.

බැංකුවට බලපාන ණය නිරාවරණයවීම් ප්‍රධාන ප්‍රභේද 2 ක් මත හට ගනී. එනම්, බැංකුවලට ණයදීම් හා ආයතනික, සිල්ලර ණයකරුවන්, රජය හා රාජ්‍ය ආයතන වැනි වෙනත් ගනුදෙනුකරුවන්ට ණය දීම්ය.

ණය අවදානමට ඇති ශුද්ධ නිරාවරණයවීම්

මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය අවදානමට ඇති උපරිම හා ශුද්ධ නිරාවරණයවීම් පහත වගුව මගින් දැක්වේ. (ශුද්ධ නිරාවරණයවීම් ගණනය කිරීමේදී, ලබාගෙන ඇති ඇපකර වල සාධාරණ අගය, අවදානම් රහිත වත්කම් වල ආයෝජන සහ රජයේ ඇපකර සහ හානිකරණ ප්‍රතිපාදන වටිනාකම් අඩුකර ඇත.)

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

දෙසැම්බර් 31 දිනට	2017		2016	
	ණය අවදානමට ඇති උපරිම නිරාවරණයවීම රු. '000	ශුද්ධ නිරාවරණයවීම රු. '000	ණය අවදානමට ඇති උපරිම නිරාවරණයවීම රු. '000	ශුද්ධ නිරාවරණයවීම රු. '000
බැංකුව				
මුදල් හා මුදල් සමානයන්	**3,849,627**	**2,904,867**	4,619,699	3,938,171
මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	**–**	–	–
බැංකුවල ඇති තැන්පතු	**23,438,104**	**23,438,104**	19,013,572	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	**1,360,714**	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**6,472,314**	**2,357,336**	20,290,588	3,095,911
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	**–**	**–**	–	–
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**27,714,565**	**24,947,881**	31,834,072	29,429,326
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	**360,309,866**	**108,372,745**	291,976,942	86,307,208
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**5,693,829**	**4,440,951**	6,227,764	4,123,732
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**544,273,077**	**–**	505,824,398	–
දළ එකතුව	**973,112,095**	**167,822,598**	882,515,480	148,636,365

දෙසැම්බර් 31 දිනට	2017		2016	
	ණය අවදානමට ඇති උපරිම නිරාවරණයවීම රු. '000	ශුද්ධ නිරාවරණයවීම රු. '000	ණය අවදානමට ඇති උපරිම නිරාවරණයවීම රු. '000	ශුද්ධ නිරාවරණයවීම රු. '000
සමූහය				
මුදල් හා මුදල් සමානයන්	**3,854,086**	**2,909,317**	4,627,629	3,936,092
මහ බැංකුව වෙතැති ශේෂයන්	**94**	**94**	477	477
බැංකුවල ඇති තැන්පතු	**23,438,104**	**23,438,104**	19,013,572	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	**1,360,714**	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**9,389,950**	**2,357,336**	27,303,207	3,095,911
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	**–**	**–**	–	–
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**27,971,234**	**25,204,551**	31,834,072	29,429,326
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	**358,766,093**	**108,372,745**	291,178,121	86,307,208
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**7,713,852**	**4,641,872**	8,122,516	4,324,572
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**547,924,390**	**–**	507,624,954	–
දළ එකතුව	**980,418,517**	**168,284,733**	892,432,992	148,835,603

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

ii. ණය කළඹ කළමනාකරණය

ණය සුරැකුම් සහ අනෙකුත් ණය ප්‍රසාරණය

ප්‍රතිපාර්ශවකරුවන්ගේ ණය අවදානමේ තක්සේරුව මත අවශ්‍ය වන ණයසුරැකුම් වල අගය සහ වර්ගය තීරණය වෙයි. ණය සුරැකුම් වල වර්ගය අනුව පිළිගැනීම සහ තක්සේරුව අනාවරණය වන පරිදි නිර්නායක සකස් කර ඇත. බැංකුව විසින් පිළිගනු ලබන ප්‍රධාන සුරැකුම් වර්ග පහත දක්වා ඇත.

අ. වාණිජ ණය – රාජ්‍ය ඇපකර, ස්ථාවර වත්කම් හා ජංගම වත්කම් මත උකස්, භාණ්ඩ තොග, ආයතනික හා පුද්ගලික ඇපකරුවන්.

ආ. පාරිභෝගික ණය – නේවාසික දේපල, රත්රන්, වාහන, පුද්ගලික ඇපකරුවන්.

නිමැවුම් හා ක්ෂේත්‍රය අනුව ණය අවදානම සංකේන්ද්‍රනය

බැංකුව විසින් නිමැවුම් හා ක්ෂේත්‍රය අනුව ණය අවදානමෙහි සංකේන්ද්‍රනය අධීක්ෂණය කරනු ලබයි. බැංකුවේ ණය කළඹෙහි (ණය සහ ලැබියයුතු දෑ වෙනත් ගනුදෙනුකරුවන්) සංකේන්ද්‍රන අවදානමෙහි විශ්ලේෂණයක් පහත දැක්වේ.

නිමැවුම් අනුව සංකේන්ද්‍රනය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්				
උකස් ණය	**23,939,944**	20,852,188	**23,939,944**	20,852,188
කාර්ය මණ්ඩල ණය	**5,057,767**	4,090,448	**5,057,767**	4,090,448
කාලීන ණය				
කෙටිකාලීන	**684,797**	–	**684,797**	–
දිගුකාලීන	**321,221,287**	257,549,045	**321,221,287**	257,549,045
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්	**2,826,289**	2,496,838	**1,282,516**	1,698,017
වෙනත්				
සුරැකුම්පත් ණය/භාරකාර සහතිකපත්	**3,083,997**	2,695,185	**3,083,997**	2,695,185
රජයට ලබාදුන් ණය	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
වෙනත්	**3,719,127**	3,950,010	**3,719,127**	3,950,010
දළ එකතුව	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

ක්ෂේත්‍රය අනුව සංකේන්ද්‍රනය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** රු. '000	2016 රු. '000	**2017** රු. '000	2016 රු. '000
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්				
කෘෂිකාර්මික හා ධීවර	**14,282,395**	10,869,217	**14,282,395**	10,869,217
නිෂ්පාදන	**505,113**	505,113	**505,113**	505,113
සංචාරක	**49,042**	81,090	**49,042**	81,090
ප්‍රවාහන	**1,042,138**	983,022	**1,042,138**	983,022
ඉදිකිරීම්/ නිවාස	**67,530,740**	65,006,143	**67,530,740**	65,006,143
වාණිජ	**1,239,568**	1,237,814	**1,239,568**	1,237,814
මූල්‍ය හා ව්‍යාපාරික සේවා	**10,169,034**	6,899,422	**10,169,034**	6,899,422
යටිතල පහසුකම්				
මාර්ග සංවර්ධන සහ වෙනත්	**76,080,169**	60,412,604	**76,080,169**	60,412,604
බලශක්ති	**8,525,567**	10,254,573	**8,525,567**	10,254,573
වෙනත් සේවා				
අධ්‍යාපන	**31,844,099**	23,701,503	**31,844,099**	23,701,503
වෙනත් ගනුදෙනුකරුවන්				
රජය	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
පුද්ගලික/උකස්/වෙනත්	**149,265,341**	111,683,213	**147,721,568**	110,884,392
දළ එකතුව	**362,608,207**	293,708,714	**361,064,434**	292,909,893

මූල්‍ය වත්කම් පන්ති අනුව ණය ගුණාත්මකබව

2017 දෙසැම්බර් 31 දිනට	ගෙවීමට නියමිත දින ඉකුත් නොවූ හා හානිකරණය වී නොමැති රු. '000	ගෙවීමට නියමිත දින ඉකුත්වූ නමුත් හානිකරණය වී නොමැති රු. '000	කේවල හානිකරණය රු. '000	එකතුව රු. '000
වත්කම්				
මුදල් හා මුදල් සමානයන්	**3,849,627**	–	–	**3,849,627**
බැංකුවල ඇති තැන්පතු	**23,438,104**	–	–	**23,438,104**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	–	–	**1,360,714**
වෙළඳාම සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	**6,472,314**	–	–	**6,472,314**
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**27,714,565**	–	–	**27,714,565**
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන් (දළ)*	**335,414,770**	**27,193,437**	–	**362,608,207**
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**5,693,829**	–	–	**5,693,829**
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**544,273,077**	–	–	**544,273,077**
	948,216,999	**27,193,437**	–	**975,410,436**

* හානිකරණය සඳහා සාමූහිකව අගයා ඇත.

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

ගෙවීමට නියමිත දින ඉකුත් වූ නමුත් හානිකරණය වී නොමැති (උදා: එක් දිනක් හෝ ඊට වැඩි දින සඳහා හිඟ මුදල් සහිත) ණය, මූල්‍ය වත්කම් පන්ති අනුව විශ්ලේෂණය

	ගෙවීමට නියමිත දින ඉකුත් වූ නමුත් හානිකරණය නොවූ				
දෙසැම්බර් 31 දිනට – 2017	දින 1-30 අතර රු. '000	දින 31-60 අතර රු. '000	දින 61-89 අතර රු. '000	දින 90 ට වැඩි රු. '000	එකතුව රු. '000
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන් (දළ)	**18,897,148**	**4,101,928**	**1,052,673**	**3,141,688**	**27,193,437**
	69%	**15%**	**4%**	**12%**	**100%**

මූල්‍ය වත්කම් පන්ති අනුව ණය ගුණාත්මකබව

2016 දෙසැම්බර් 31 දිනට	ගෙවීමට නියමිත දින ඉකුත් නොවූ හා හානිකරණය වී නොමැති රු. '000	ගෙවීමට නියමිත දින ඉකුත්වූ නමුත් හානිකරණය වී නොමැති රු. '000	කේවල හානිකරණය රු. '000	එකතුව රු. '000
වත්කම්				
මුදල් හා මුදල් සමානයන්	4,619,699	–	–	4,619,699
බැංකුවල ඇති තැන්පතු	19,013,572	–	–	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	2,728,445	–	–	2,728,445
වෙළඳාම සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	20,290,588	–	–	20,290,588
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	31,834,072	–	–	31,834,072
ණය හා ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන් (දළ)*	268,252,090	25,456,624	–	293,708,714
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	6,227,764	–	–	6,227,764
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	505,824,398	–	–	505,824,398
	858,790,628	25,456,624	–	884,247,252

* *හානිකරණය සඳහා සාමූහිකව අගයා ඇත.*

ගෙවීමට නියමිත දින ඉකුත් වූ නමුත් හානිකරණය වී නොමැති (උදා: එක් දිනක් හෝ ඊට වැඩි දින සඳහා හිඟ මුදල් සහිත) ණය, මූල්‍ය වත්කම් පන්ති අනුව විශ්ලේෂණය

	ගෙවීමට නියමි දින ඉකුත් වූ නමුත් හානිකරණය නොවූ				
දෙසැම්බර් 31 දිනට – 2016	දින 1-30 අතර රු. '000	දින 31-60 අතර රු. '000	දින 61-89 අතර රු. '000	දින 90 ට වැඩි රු. '000	එකතුව රු. '000
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන් (දළ)	15,572,198	4,029,783	466,969	5,387,675	25,456,624
	61%	16%	2%	21%	100%

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

(අ) ද්‍රවශීලතා අවදානම

ශේෂපත්‍රය තුළ හෝ ඉන් පරිබාහිරව ගිවිසුම්ගත සහ අසම්භාව්‍ය මූල්‍ය බැඳීම් සඳහා ගෙවීම් සැලකියයුතු අලාභයක් නොමැතිව ඉටු කිරීමට බැංකුවට ඇති නොහැකියාව ද්‍රවශීලතා අවදානම වේ.

ද්‍රවශීලතා වත්කම් සංකේන්ද්‍රණය

සිය තැන්පතු වලින් 60% ක්, රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට බැංකුවට පැවරී ඇති නියාමන අවශ්‍යතාව හේතුවෙන් ඉහළ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයක් පවත්වා ගැනීමට බැංකුවට සිදුවේ. ව්‍යවස්ථාපිත අවශ්‍යතාව වන 20% ට වඩා බෙහෙවින් වැඩි 73.4% ක ද්‍රවශීලතා අනුපාතයක් බැංකුව විසින් දැනට පවත්වාගෙන යනු ලබයි. බැංකුවේ සමස්ත ද්‍රවශීල වත්කම වෙතින් 88.4% ක් නියෝජනය වන්නේ රාජ්‍ය සුරැකුම්පත් වල කර ඇති ආයෝජනයන් මගිනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** **රු. '000**	2016 රු. '000	**2017** **රු. '000**	2016 රු. '000
ද්‍රවශීලතා වත්කම් අනුපාතය				
වර්ෂාවසානයට	**73.4**	72.6	–	–
ජූනි 30 දිනට	**74.1**	75.2	–	–
වර්ෂාරම්භයේදී	**72.6**	81.1	–	–
තැන්පතු සඳහා දළ ණය සහ ලැබිය යුතු දෑ	**52.9**	49.5	**52.8**	49.4
මුළු වත්කම්වලට ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ	**38.3**	35.5	**38.0**	35.0

(ඇ) වෙළඳපොළ අවදානම

වෙළඳපොළ මිල ගණන්වල සංචලනයන් විශේෂයෙන් පොළී අනුපාතික වල, විදේශ විනිමය අනුපාතිකවල හා හිමිකම් කොටස් මිල ගණන්වල වෙනස්කම් හේතුකොට ගෙන බැංකුව කෙරෙහි බලපාන වෙළඳපොළ අවදානම ඇති වේ. ණය හා වෙළඳපොළ ද්‍රවශීල අවදානම ආදී වෙනත් මූල්‍ය අවදානම් මගින් වෙළඳපොළ අවදානම බොහෝ විට ව්‍යාප්ත වෙයි. ශේෂ පත්‍රයෙන් පරිබාහිර මෙන්ම ශේෂපත්‍රය තුල වන සිදුවීම් මත මෙම අලාභ ඇති වීමේ අවදානම හටගනු ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවට බලපාන වෙළඳපොළ අවදානම් ප්‍රභව

පහත සඳහන් ප්‍රභවයන් තුලින් බැංකුව වෙළඳපොළ අවදානමට නිරාවරණයවීම හට ගනි.

- භාණ්ඩාගාර සුරැකුම් කළඹ (රාජ්‍ය සුරැකුම් සහ අනුමැතිය ලත් වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්)
- ප්‍රතිමිලදීගැනීම් සහ ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගැනීම් ගනුදෙනු
- විදේශ විනිමය හා සම්බන්ධ බැංකු මෙහෙයුම්
- හිමිකම් ආයෝජන
- ව්‍යුත්පන්න
- අනුපාතික සංවේදී වත්කම් – වගකීම් නොගැලපීම

(i) විදේශ විනිමය අවදානම

විදේශ ව්‍යවහාර මුදල් වර්ග දෙකක් අතර විනිමය අනුපාතිකයෙහි අනපේක්ෂිත වෙනස්වීම් වලට නිරාවරණයවීම මගින් ඇතිවන මූල්‍ය අවදානම, විදේශ විනිමය අවදානමයි. (මෙය විනිමය අනුපාතික අවදානම/ව්‍යවහාර මුදල් අවදානම ලෙසද හැඳින්වෙයි.) විදේශ විනිමය අවදානම අවම කර ගැනීම සඳහා බැංකුව විසින් හුවමාරු ගිවිසුම් හා ඉදිරි විදේශ මුදල් ගිවිසුම් වලට එළඹ ඇත. (සටහන් අංක 19)

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

(ii) හිමිකම් අවදානම

කොටස් වෙළඳපොළ විචල්‍යයන් හේතුවෙන් පුද්ගලික ආයෝජන ක්ෂයවීමෙන් යම් පුද්ගලයෙකුට මුදල් අහිමි වීමේ අවදානම, හිමිකම් අවදානමයි.

හිමිකම් මත ආයෝජනයන්, සමස්ත වත්කම් වෙතින් 0.7% නියෝජනය කරන අතර, නිල ලැයිස්තුගත කළ හා නොකළ හිමිකම් කොටස් ආයෝජන ප්‍රතිශත පිළිවෙලින් 0.6% ක් හා 0.1% ක් බැගින් වේ. එහෙයින්, හිමිකම් අවදානමට බැංකුව විශාල වශයෙන් නිරාවරණය වීමක් නොමැත. කෙසේ වුවද, හිමිකම් ආයෝජන මත ප්‍රතිලාභ කෙරෙහි කොටස් වෙළඳපොළෙහි අහිතකර චලනයන් බලපාන ලදී. උපායමාර්ගික හේතු, ආර්ථික සංවර්ධනය හා වෙළඳපොළ පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ හේතුකොට ගෙන නිල ලැයිස්තුගත නොකළ සමාගම්වල ආයෝජනය කරනු ලබයි.

(iii) පොළී අනුපාතික අවදානම

ඕනෑම පොළී අනුපාතික සම්බන්ධතාවයකදී හෝ ප්‍රතිලාභ වක්‍රයේ හැඩයේදී අනුපාතික දෙකක් අතර ව්‍යාප්තියේදී ආයෝජනයක වටිනාකම, පොළී අනුපාතික පූර්ණ මට්ටමේදී වෙනස්වීමේ අවදානම, පොළී අනුපාතික අවදානමයි. මුළු ශේෂ පත්‍ර වගකීම්වලින් 73.2% ක් නියෝජනය කරනු ලබන තැන්පතු, බැංකුවේ අරමුදල් සපයන ප්‍රධානතම ප්‍රභවයයි. මින් 25.5% ක් ඉතුරුම් තැන්පතුද 74.5% ක් ස්ථාවර තැන්පතුද නියෝජනය කරයි.

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පොළී අනුපාතික සංවේදී වාර්තාව පහත දක්වා ඇත.

බැංකුව	මාස 0 සිට 1 දක්වා රු. '000	මාස 0 සිට 3 දක්වා රු. '000	මාස 0 සිට 6 දක්වා රු. '000	මාස 0 සිට 12 දක්වා රු. '000
පොළී සහිත වත්කම්	**24,623,909**	**55,545,413**	**117,380,701**	**317,160,492**
බැංකු ශේෂයන් සහ තැන්පත් කිරීම්	**1,008,772**	**5,089,312**	**11,196,556**	**23,820,867**
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**1,840**	**91,793**	**112,824**	**243,775**
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**2,852,671**	**3,056,673**	**3,133,604**	**9,672,848**
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන්	**14,598,625**	**22,722,801**	**33,705,077**	**90,557,830**
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**–**	**942**	**1,173,177**	**1,173,177**
කල්පිරීම තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**6,162,001**	**24,583,892**	**68,059,463**	**191,691,995**
පොළී සහිත වගකීම්	**199,860,658**	**456,013,831**	**585,765,770**	**901,999,449**
බැංකුවලට ගෙවිය යුතු	**180,439**	**180,439**	**180,439**	**180,439**
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**141,589,236**	**391,222,111**	**520,951,317**	**722,143,176**
වෙනත් ණය ලබා ගැනීම්	**58,090,983**	**64,611,281**	**64,627,603**	**179,669,423**
යටත්කාලීන වගකීම්	**–**	**–**	**6,411**	**6,411**
ශුද්ධ අනුපාතික සංවේදී වත්කම් (වගකීම්)	**(175,236,749)**	**(400,468,418)**	**(468,385,069)**	**(584,838,957)**
පොළී අනුපාතික සංවේදී අනුපාතය (%)	**12**	**12**	**20**	**35**

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

2017 දෙසැම්බර් 31 දිනට සමූහයේ පොළී අනුපාතික සංවේදී වාර්තාව පහත දක්වා ඇත.

සමූහය	මාස 0 සිට 1 දක්වා රු. '000	මාස 0 සිට 3 දක්වා රු. '000	මාස 0 සිට 6 දක්වා රු. '000	මාස 0 සිට 12 දක්වා රු. '000
පොළී සහිත වත්කම්	**24,733,224**	**55,873,361**	**118,297,374**	**317,688,693**
බැංකු ශේෂයන් සහ තැන්පත් කිරීම්	**1,008,772**	**5,089,312**	**11,196,556**	**23,820,867**
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**11,055**	**119,439**	**362,206**	**936,629**
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	**2,938,228**	**3,313,343**	**3,390,273**	**9,929,518**
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන්	**14,601,636**	**22,731,835**	**33,718,484**	**89,014,056**
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**–**	**942**	**1,258,300**	**1,428,546**
කල්පිරීම තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**6,173,533**	**24,618,490**	**68,371,555**	**192,559,077**
පොළී සහිත වගකීම්	**201,826,112**	**460,344,267**	**590,474,124**	**907,463,634**
බැංකු වලට ගෙවිය යුතු	**918,412**	**828,433**	**828,433**	**828,433**
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**141,589,236**	**391,222,111**	**520,951,317**	**722,143,176**
වෙනත් ණය ලබා ගැනීම්	**59,318,464**	**68,293,723**	**68,687,963**	**184,485,614**
යටත්කාලීන වගකීම්	**–**	**–**	**6,411**	**6,411**
ශුද්ධ අනුපාතික සංවේදී වත්කම් (වගකීම්)	**(177,092,888)**	**(404,470,906)**	**(472,176,750)**	**(589,774,941)**
පොළී අනුපාතික සංවේදී අනුපාතය (%)	**12**	**12**	**20**	**35**

2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පොළී අනුපාතික සංවේදී වාර්තාව පහත දක්වා ඇත.

බැංකුව	මාස 0 සිට 1 දක්වා රු. '000	මාස 0 සිට 3 දක්වා රු. '000	මාස 0 සිට 6 දක්වා රු. '000	මාස 0 සිට 12 දක්වා රු. '000
පොළී සහිත වත්කම්	39,406,492	67,316,653	150,571,506	209,818,308
බැංකු ශේෂයන් සහ තැන්පත් කිරීම්	6,078,068	7,918,434	11,247,714	21,224,972
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	139,446	799,686	1,246,754	2,332,650
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	2,839,753	3,122,269	4,344,333	12,389,001
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන්	11,439,739	17,663,032	26,793,434	54,413,298
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	22,800	70,422	82,383	82,383
කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන	18,886,686	37,742,810	106,856,888	119,376,004
පොළී සහිත වගකීම්	153,559,463	401,743,980	524,858,634	689,298,959
බැංකු වලට ගෙවිය යුතු	115,391	115,391	115,391	115,391
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	121,412,238	359,588,812	469,593,750	631,721,042
වෙනත් ණය ලබා ගැනීම්	32,031,834	42,039,777	55,143,082	57,456,115
යටත්කාලීන වගකීම්	–	–	6,411	6,411
ශුද්ධ අනුපාතික සංවේදී වත්කම් (වගකීම්)	(114,152,971)	(334,427,327)	(374,287,128)	(479,480,651)
පොළී අනුපාතික සංවේදී අනුපාතය (%)	26	17	29	30

48. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි) →

48.2 අවධානයට ලක්වන අවදානම් ප්‍රභේද (සම්බන්ධයි) →

2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ පොළී අනුපාතික සංවේදී වාර්තාව පහත දක්වා ඇත.

සමූහය	මාස 0 සිට 1 දක්වා රු. '000	මාස 0 සිට 3 දක්වා රු. '000	මාස 0 සිට 6 දක්වා රු. '000	මාස 0 සිට 12 දක්වා රු. '000
පොළී සහිත වත්කම්	39,723,960	68,269,053	152,100,000	211,712,532
බැංකු ශේෂයන් සහ තැන්පත් කිරීම්	6,078,068	7,918,434	11,247,714	21,224,972
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	368,617	1,487,197	2,397,580	4,410,106
ණය හා ලැබිය යුතු දෑ – බැංකු	2,839,753	3,122,269	4,344,333	12,389,001
ණය හා ලැබිය යුතු දෑ – වෙනත් ගනුදෙනුකරුවන්	11,441,800	17,669,214	26,801,409	53,614,477
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	50,194	152,604	156,591	164,565
කල්පිරීම තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	18,945,528	37,919,335	107,152,373	119,909,411
පොළී සහිත වගකීම්	155,713,763	407,396,496	531,404,579	697,631,758
බැංකුවලට ගෙවිය යුතු	1,299,946	2,858,673	2,858,673	2,858,673
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	121,412,238	359,588,812	469,593,750	631,721,042
වෙනත් ණය ලබා ගැනීම්	33,001,579	44,949,011	58,945,745	63,045,632
යටත්කාලීන වගකීම්	–	–	6,411	6,411
ශුද්ධ අනුපාතික සංවේදී වත්කම් (වගකීම්)	(115,989,803)	(339,127,443)	(379,304,579)	(485,919,226)
පොළී අනුපාතික සංවේදී අනුපාතය (%)	26	17	29	30

(ඇ) මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ බිඳ වැටීම් සහිත අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින්, පද්ධති හෝ බාහිර සිදුවීම් නිසා අලාභ හටගැනීමේ අවදානම, මෙහෙයුම් අවදානම ලෙස බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව නිර්වචනය කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ආකෘතිය

වඩාත් කාර්යක්ෂම, පාරදෘෂ්‍ය, ලාභදායී සහ තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වන මෙහෙයුම් අවදානම් කළමනාකරණ ව්‍යුහයක් බැංකුව සතු වේ. මනා ව්‍යුහගත පාලනයක්, ප්‍රතිපත්තිමය ආකෘතිකයක් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඊට ඇතුළත්ය. අවදානම් කළමනාකරණ අංශයෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය මගින් බැංකුවේ මෙහෙයුම් අවදානම් පිළිබඳව අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

49. කල් පිරීමේ විශ්ලේෂණය →

බැංකුව	මාස 3 දක්වා රු. '000	මාස 3 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 3 දක්වා රු. '000	වසර 3 සිට 5 දක්වා රු. '000	වසර 5 කට වැඩි රු. '000	**2017.12.31 දිනට එකතුව රු. '000**	2016.12.31 දිනට එකතුව රු. '000
කල් පිරීමේ ගිවිසුම් සහිත වත්කම් (පොළී සහිත වත්කම්)							
මුදල් හා මුදල් සමාන දෑ	382,763	–	–	–	–	**382,763**	2,211,401
බැංකු වල ඇති තැන්පතු	4,706,549	18,731,555	–	–	–	**23,438,104**	19,013,572
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	91,793	151,982	535,258	3,335,945	–	**4,114,978**	17,194,677
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	942	1,172,235	–	26,045	53,657	**1,252,878**	2,104,032
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	3,056,673	6,616,175	17,241,717	800,000	–	**27,714,565**	31,834,072
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	22,722,801	67,835,029	83,264,461	57,112,104	129,375,471	**360,309,866**	291,976,942
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	24,583,892	167,108,102	77,891,419	93,900,259	180,789,405	**544,273,077**	505,824,398
	55,545,413	261,615,078	178,932,855	155,174,353	310,218,533	**961,486,232**	870,159,094
වෙනත් වත්කම් (පොළී රහිත වත්කම්)							
මුදල් හා මුදල් සමාන දෑ	3,466,864	–	–	–	–	**3,466,864**	2,408,298
මහ බැංකුව වෙතැති ශේෂයන්	–	–	–	–	–	**–**	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	650	1,360,064	–	–	–	**1,360,714**	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය ආයෝජන	589,334	1,768,002	–	–	–	**2,357,336**	3,095,911
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	–	–	–	–	4,440,951	**4,440,951**	4,123,732
පාලිත සමාගම්වල ආයෝජනයන්	–	–	–	–	900,000	**900,000**	150,000
දේපල, පිරියත හා උපකරණ	–	–	–	–	12,015,376	**12,015,376**	7,119,651
අස්පෘශ්‍ය වත්කම්	–	–	–	–	380,308	**380,308**	157,271
වෙනත් වත්කම්	712,063	7,168,611	7,173,278	5,004,266	5,637,471	**25,695,689**	21,761,440
	4,768,911	10,296,677	7,173,278	5,004,266	23,374,106	**50,617,238**	41,544,748
මුළු වත්කම්	60,314,324	271,911,755	186,106,133	160,178,619	333,592,639	**1,012,103,470**	911,703,842
කල් පිරීමේ ගිවිසුම් සහිත වගකීම් (පොළී සහිත වත්කම්)							
බැංකුවලට ගෙවිය යුතු	180,439	–	–	–	–	**180,439**	115,391
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	391,222,111	330,921,064	8,725,472	4,138,492	2,205,501	**737,212,640**	657,280,315
වෙනත් ණය ගැනීම්	64,611,281	115,058,141	38,286,355	–	–	**217,955,777**	207,039,909
යටත්කාලීන වගකීම්	–	6,411	–	6,000,000	–	**6,006,411**	6,006,411
	456,013,831	445,985,616	47,011,827	10,138,492	2,205,501	**961,355,267**	870,442,026
වෙනත් වගකීම් (පොළී රහිත වත්කම්)							
ප්‍රවර්ථන බදු වගකීම්	956,937	–	–	–	–	**956,937**	–
විලම්බිත බදු වගකීම්	–	–	–	–	507,063	**507,063**	416,180
වෙනත් වගකීම්	2,288,755	2,500,117	480,835	474,946	3,317,771	**9,062,425**	8,600,056
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	–	–	–	–	6,700,000	**6,700,000**	6,200,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	–	–	–	–	3,002,952	**3,002,952**	2,522,467
වෙනත් සංචිත	–	–	–	–	28,289,941	**28,289,941**	21,143,806
රඳවාගත් ඉපැයීම්	–	–	–	–	2,228,885	**2,228,885**	2,379,307
	3,245,692	2,500,117	480,835	474,946	44,046,612	**50,748,203**	41,261,816
මුළු වගකීම්	459,259,523	448,485,733	47,492,662	10,613,438	46,252,113	**1,012,103,470**	911,703,842

49. කල් පිරීමේ විශ්ලේෂණය (සම්බන්ධයි) →

සමූහය	මාස 03 දක්වා රු. '000	මාස 03 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 3 දක්වා රු. '000	වසර 3 සිට 5 දක්වා රු. '000	වසර 5 කට වැඩි රු. '000	**2017.12.31 දිනට එකතුව රු. '000**	2016.12.31 දිනට එකතුව රු. '000
කල් පිරීමේ ගිවිසුම් සහිත වත්කම් (පොළී සහිත වත්කම්)							
මුදල් හා මුදල් සමාන දෑ	382,763	–	–	–	–	**382,763**	2,211,401
බැංකුවල ඇති තැන්පතු	4,706,549	18,731,555	–	–	–	**23,438,104**	19,013,572
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	119,439	817,191	966,361	4,433,644	695,979	**7,032,614**	24,207,296
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	942	1,427,604	744,564	865,955	232,836	**3,271,901**	3,997,784
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	3,313,342	6,616,175	17,241,717	800,000	–	**27,971,234**	31,834,072
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	22,731,835	66,282,222	83,264,461	57,112,104	129,375,471	**358,766,093**	291,178,121
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	24,618,490	167,940,586	78,430,928	95,273,989	181,660,397	**547,924,390**	507,624,954
	55,873,360	261,815,333	180,648,031	158,485,692	311,964,683	**968,787,100**	880,067,200
වෙනත් වත්කම් (පොළී රහිත වත්කම්)							
මුදල් හා මුදල් සමාන දෑ	3,471,323	–	–	–	–	**3,471,323**	2,416,228
මහ බැංකුව වෙතැති ශේෂයන්	94	–	–	–	–	**94**	477
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	650	1,360,064	–	–	–	**1,360,714**	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය ආයෝජන	589,334	1,768,002	–	–	–	**2,357,336**	3,095,911
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	–	–	–	–	4,441,951	**4,441,951**	4,124,732
දේපල, පිරියත හා උපකරණ	–	–	–	–	12,018,679	**12,018,679**	7,121,823
අස්පෘශ්‍ය වත්කම්	–	–	–	–	380,655	**380,655**	157,271
විලම්බිත බදු වත්කම්	–	–	–	–	–	**–**	588
වෙනත් වත්කම්	855,666	7,196,866	7,282,677	5,004,266	5,637,470	**25,976,944**	21,890,777
	4,917,067	10,324,932	7,282,677	5,004,266	22,478,755	**50,007,697**	41,536,253
මුළු වත්කම්	60,790,427	272,140,265	187,930,708	163,489,958	334,443,438	**1,018,794,797**	921,603,453
කල් පිරීමේ ගිවිසුම් සහිත වගකීම් (පොළී සහිත වත්කම්)							
බැංකුවලට ගෙවිය යුතු	828,433	–	–	–	–	**828,433**	2,858,673
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	391,222,111	330,921,064	8,725,472	4,138,492	2,205,501	**737,212,640**	657,280,315
වෙනත් ණයගැනීම්	68,293,723	116,191,891	38,286,355	–	–	**222,771,969**	212,629,427
යටත්කාලීන වගකීම්	–	6,411	–	6,000,000	–	**6,006,411**	6,006,411
	460,344,267	447,119,366	47,011,827	10,138,492	2,205,501	**966,819,453**	878,774,826
වෙනත් වගකීම් (පොළී රහිත වත්කම්)							
ව්‍යුත්පන්න වගකීම්	956,937	–	–	–	–	**956,937**	–
ප්‍රවර්ථන බදු වගකීම්	–	137,344	–	–	–	**137,344**	17,153
විලම්බිත බදු වගකීම්	–	–	–	–	507,138	**507,138**	416,180
වෙනත් වගකීම්	2,301,971	2,530,702	480,835	474,946	3,319,006	**9,107,460**	8,608,506
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	–	–	–	–	6,700,000	**6,700,000**	6,200,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	–	–	–	–	3,002,952	**3,002,952**	2,522,467
වෙනත් සංචිත	–	–	–	–	28,757,786	**28,757,786**	21,355,707
රඳවාගත් ඉපැයීම්	–	–	–	–	2,805,727	**2,805,727**	3,708,614
	3,258,908	2,668,046	480,835	474,946	45,092,609	**51,975,344**	42,828,627
මුළු වගකීම්	463,603,175	449,787,412	47,492,662	10,613,438	47,298,110	**1,018,794,797**	921,603,453

50. මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම →

50.1 සාධාරණ වටිනාකමට වාර්තා කළ මූල්‍ය උපකරණ →

▶ ගිණුම්කරණ ප්‍රතිපත්ති

තක්සේරු තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සාධාරණ වටිනාකමට වාර්තා කළ මූල්‍ය උපකරණ සඳහා සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන ආකාරය පිළිබඳව විස්තරයක් පහත දක්වා ඇත. වෙළඳපොළ සහභාගීත්වය දරන්නෙකු විසින් එම උපකරණ ආගණනය කිරීමේදී කරනු ලබන උපකල්පන පිළිබඳ බැංකුවේ ඇස්තමේන්තුව ඒවායේ අන්තර්ගත වේ.

ව්‍යුත්පන්න

i. විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම

වෙළඳපොළ ඒ හා සමාන ගිවිසුම් සඳහා අදාළ නිල ලැයිස්තුගත මිල ගණන් උපයෝගී කර ගනිමින් විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම් බැංකුව විසින් වටිනාකම තක්සේරු කිරීමට ලක් කරයි.

ii. විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (SWAPS)

පවතින විදේශ විනිමය අනුපාතික හා විදේශ විනිමය ඉදිරි අනුපාතික ආදී විවිධ සාධක ඇතුළත් කරමින් තක්සේරු කරන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් දරා සිටින ව්‍යුත්පන්න නිමැවුම් (විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (SWAPS)/මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්) තක්සේරු කර ඇත.

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්

i. රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර

රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර වලින් සමන්විත තක්සේරු කරන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් තක්සේරු කරනු ලබයි. නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වට්ටම් කල මුදල් ප්‍රවාහ තක්සේරු කරන ආකෘති භාවිතයෙන් බැංකුව විසින් සුරැකුම් තක්සේරු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ වෙළඳපොළ දත්ත සහ අතරමැදියන්ගේ ප්‍රකාශන, ප්‍රවර්තන පොළී අනුපාතික වලට අදාළ උපකල්පන මෙකී නිරීක්ෂණ දත්ත වලට අයත් වේ.

ii. හිමිකම් සුරැකුම්

සක්‍රීය වෙළඳපොළ තුළ එක හා සමාන සුරැකුම් සඳහා ඇති නිල ලැයිස්තුගත කළ අගයන් යොදා ගනිමින් බැංකුව විසින් හිමිකම් සුරැකුම් තක්සේරු කරනු ලබයි.

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

සක්‍රීය වෙළඳපොළ තුළ එක හා සමාන සුරැකුම් සඳහා ඇති නිල ලැයිස්තුගත කළ අගයන් යොදා ගනිමින් බැංකුව විසින් නිල ලැයිස්තු ගත කළ හිමිකම් සුරැකුම් තක්සේරු කරනු ලබයි. නිරීක්ෂණය කළ හැකි දත්ත මත පදනම් වූ තක්සේරු කරන ආකෘතියක් යොදා ගනිමින් නිල ලැයිස්තු ගත නොකළ හිමිකම් සුරැකුම් වල සාධාරණ වටිනාකම ගණනය කර ඇත.

50.2 සාධාරණ වටිනාකම සහ සාධාරණ වටිනාකම් ධුරාවලිය නීර්ණය කිරීම →

තක්සේරු කරන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම තීරණය කිරීමට හා හෙළිදරව් කිරීමට බැංකුව විසින් පහත සඳහන් ධුරාවලින් අනුගමනය කරයි.

1 මට්ටම — එක හා සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපොළ තුළ ඇති නිල ලැයිස්තුගත කළ (ගැලපීම් සිදු නොකළ) මිල.

2 මට්ටම — වාර්තා කරන ලද සාධාරණ වටිනාකම මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන සියලු කරුණු, සෘජුවම හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි වෙනත් තාක්ෂණික ක්‍රම.

3 මට්ටම — වාර්තා කරන ලද සාධාරණ වටිනාකම මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන කරුණු, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත මත පදනම් නොවූ තාක්ෂණික ක්‍රම.

50. මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

50.2 සාධාරණ වටිනාකම සහ සාධාරණ වටිනාකම් ධූරාවලිය නීර්ණය කිරීම (සම්බන්ධයි) →

සාධාරණ වටිනාකම් ධූරාවලි මට්ටමින් සාධාරණ වටිනාකමට වාර්තා කර ඇති මූල්‍ය උපකරණවල විශ්ලේෂණයක් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

	බැංකුව			
2017 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1 රු. '000	මට්ටම 2 රු. '000	මට්ටම 3 රු. '000	එකතුව රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම	**650**	**–**	**–**	**650**
විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් (SWAPS)	**–**	**–**	**1,360,064**	**1,360,064**
වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්				
රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	**4,114,978**	**–**	**–**	**4,114,978**
හිමිකම් සුරැකුම්පත්	**2,357,336**	**–**	**–**	**2,357,336**
විකිණීම සඳහා පවතින				
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත	**3,876,570**	**–**	**–**	**3,876,570**
වෙනත් ආයෝජන – රාජ්‍ය සුරැකුම්පත්	**1,252,878**	**–**	**–**	**1,252,878**
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත නොවන	**–**	**506,890**	**–**	**506,890**
මූල්‍ය වත්කම් එකතුව	**11,602,412**	**506,890**	**1,360,064**	**13,469,366**

	බැංකුව			
2016 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1 රු. '000	මට්ටම 2 රු. '000	මට්ටම 3 රු. '000	එකතුව රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම	27,750	–	–	27,750
විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් (SWAPS)	–	–	2,700,695	2,700,695
වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්				
රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	17,194,677	–	–	17,194,677
හිමිකම් සුරැකුම්පත්	3,095,911	–	–	3,095,911
විකිණීම සඳහා පවතින				
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත	3,332,148	–	–	3,332,148
වෙනත් ආයෝජන – රාජ්‍ය සුරැකුම්පත්	2,104,031	-	-	2,104,031
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත නොවන	–	734,094	–	734,094
මූල්‍ය වත්කම් එකතුව	25,754,518	734,094	2,700,695	29,189,306

50. මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

50.2 සාධාරණ වටිනාකම සහ සාධාරණ වටිනාකම් ධුරාවලිය නීර්ණය කිරීම (සම්බන්ධයි) →

	සමූහය			
2017 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1 රු. '000	මට්ටම 2 රු. '000	මට්ටම 3 රු. '000	එකතුව රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම	**650**	–	–	**650**
විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් (SWAPS)	–	–	**1,360,064**	**1,360,064**
වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්				
රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	**7,032,614**	–	–	**7,032,614**
හිමිකම් සුරැකුම්පත්	**2,357,336**	–	–	**2,357,336**
විකිණීම සඳහා පවතින				
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත	**3,876,570**	–	–	**3,876,570**
ණය සුරැකුම්පත් – ණයකර	–	**199,920**	–	**199,920**
වෙනත් ආයෝජන – රාජ්‍ය සුරැකුම්පත්	**3,071,981**	–	–	**3,071,981**
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත නොවන	–	**506,890**	–	**506,890**
මූල්‍ය වත්කම් එකතුව	**16,339,150**	**706,810**	**1,360,064**	**18,406,025**

	සමූහය			
2016 දෙසැම්බර් 31 දිනට	මට්ටම 1 රු. '000	මට්ටම 2 රු. '000	මට්ටම 3 රු. '000	එකතුව රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
විනිමය ඉදිරි ගිවිසුම් මිලදී ගැනීම	27,750	–	–	27,750
විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් (SWAPS)	–	–	2,700,695	2,700,695
වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම්				
රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	24,207,296	–	–	24,207,296
හිමිකම් සුරැකුම්පත්	3,095,911	–	–	3,095,911
විකිණීම සඳහා පවතින				
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත	3,332,148	–	–	3,332,148
ණය සුරැකුම්පත් – ණයකර	–	199,839	–	199,839
වෙනත් ආයෝජන – රාජ්‍ය සුරැකුම්පත්	3,797,944	–	–	3,797,944
හිමිකම් සුරැකුම්පත් – නිල ලැයිස්තුගත නොවන	–	734,094	–	734,094
මූල්‍ය වත්කම් එකතුව	34,461,049	933,933	2,700,695	38,095,677

50. මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

50.3 මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

බැංකුව

දෙසැම්බර් 31 දිනට	2017		2016	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	**3,849,627**	**3,849,627**	4,619,699	4,619,699
මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	**–**	–	–
බැංකු වල ඇති තැන්පතු	**23,438,104**	**23,438,104**	19,013,572	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	**1,360,714**	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**6,472,314**	**6,472,314**	20,290,588	20,290,588
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	**27,714,565**	**27,579,470**	31,834,072	30,571,117
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	**360,309,866**	**360,506,041**	291,976,942	289,348,586
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**5,693,829**	**5,693,829**	6,227,764	6,227,764
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**544,273,077**	**543,880,618**	505,824,398	474,362,481
මුළු මූල්‍ය වත්කම්	**973,112,095**	**972,780,717**	882,515,480	847,162,253
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	**180,439**	**180,439**	115,391	115,391
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**956,937**	**956,937**	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**737,212,640**	**735,574,071**	657,280,315	655,297,898
වෙනත් ණය ගැනීම්	**217,955,777**	**217,955,777**	207,039,909	207,039,909
යටත්කාලීන වගකීම්	**6,006,411**	**6,006,411**	6,006,411	6,006,411
මුළු මූල්‍ය වගකීම්	**962,312,203**	**960,673,636**	870,442,026	868,459,609

50. මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

50.3 මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම →

සමූහය

දෙසැම්බර් 31 දිනට	2017		2016	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	**3,854,086**	**3,854,086**	4,627,629	4,627,629
මහ බැංකුව වෙතැති ශේෂයන්	**94**	**94**	477	477
බැංකුවල ඇති තැන්පතු	**23,438,104**	**23,438,104**	19,013,572	19,013,572
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,360,714**	**1,360,714**	2,728,445	2,728,445
වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම්	**9,389,950**	**9,389,950**	27,303,207	27,303,207
ණය සහ ලැබිය යුතු දෑ – බැංකු	**27,971,234**	**27,836,139**	31,834,072	30,571,117
ණය සහ ලැබිය යුතු දෑ – අනෙකුත් ගනුදෙනුකරුවන්	**358,766,093**	**358,962,267**	291,178,121	288,549,764
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන	**7,713,852**	**7,713,852**	8,122,516	8,122,516
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	**547,924,390**	**547,610,506**	507,624,954	476,022,040
මුළු මූල්‍ය වත්කම්	**980,418,516**	**980,165,712**	892,432,992	856,938,767
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	**828,433**	**828,433**	2,858,673	2,858,673
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**956,937**	**956,937**	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**737,212,640**	**735,574,071**	657,280,315	655,297,898
වෙනත් ණය ගැනීම්	**222,771,969**	**222,771,969**	212,629,427	212,629,427
යටත්කාලීන වගකීම්	**6,006,411**	**6,006,411**	6,006,411	6,006,411
මුළු මූල්‍ය වගකීම්	**967,776,390**	**966,137,822**	878,774,826	876,792,409

50. මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම (සම්බන්ධයි) →

50.4 සාධාරණ වටිනාකම සහ සාධාරණ වටිනාකම් ධූරාවලිය නීර්ණය කිරීම →

සාධාරණ වටිනාකමට පවත්වා නොගත් මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ වටිනාකම

මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ වටිනාකම වාර්තා නොකළ මූල්‍ය උපකරණ සඳහා සාධාරණ වටිනාකම් තීරණය කිරීම පිණිස උපයෝගී කර ගත් ක්‍රමවේද සහ උපකල්පන පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

සාධාරණ වටිනාකමට ආසන්න ධාරණ අගය ඇති වත්කම්

කෙටිකාලීන කල්පිරීම් සහිත මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් (වසරකට අඩු ආරම්භක කල්පිරීමක් සහිත) සඳහා අදාළ ධාරණ අගය ඒවායේ සාධාරණ වටිනාකමට ආසන්න බව උපකල්පනය කර ඇත. නිශ්චිත කල්පිරීමක් නොමැති ඉතිරිකිරීමේ තැන්පතු සඳහාද මෙම උපකල්පනය අදාළ වේ.

වරින් වර ගෙවනු ලබන පොළී සහිත ගනුදෙනුකරුවන්ගෙන් ලබා ගන්නා දිගුකාලීන තැන්පතු සහ විචල්‍ය අනුපාතික යටතේ ගනුදෙනුකරුවන්ට පිරිනමන ණය හා අත්තිකාරම්ද සාධාරණ වටිනාකමට පවත්වාගෙන යාම සඳහා සලකා බලනු ලබයි.

ස්ථාවර අනුපාත මූල්‍ය උපකරණ

කෙටිකාලීන ණය පහසුකම් සඳහා සාධාරණ වටිනාකම් ලෙස ධාරණ අගයන් සලකනු ලබයි. කල්පිරීම තෙක් දරා සිටින සුරැකුම්වල සාධාරණ වටිනාකම ඇගයීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත, ඊට සමාන ගනුදෙනු කළහැකි සුරැකුම් වෙනුවෙන් යොදාගත් අනුපාතික භාවිතා කරන ලදී. සමාලෝචිත වර්ෂයෙහි සිව්වන කාර්තුව තුළ නව ණය ප්‍රදානය කරනු ලැබූ වෙළඳපොළ අනුපාතික යොදා ගනිමින් ස්ථාවර පොළී අනුපාතික සහිත ණය හා ලැබියයුතු දෑ සාධාරණ වටිනාකම අගයන ලදී. කල්පිරීමේදී පොළී ගෙවනු ලබන සහ එක් වසරකට වඩා වැඩි මුල් කාලසීමාවක් සහිත ස්ථාවර තැන්පතු වලට සමාලෝචිත වර්ෂයෙහි සිව්වන කාර්තුව තුළ ගනුදෙනුකරුවන්ට ලබාදුන් දැනට පවතින වෙළඳපොළ අනුපාතික අනුව වට්ටම් ලබා දෙන ලදී.

51. ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව) →

අරමුණ →

බැංකුවේ අවදානම් රුචිකත්වය හා අනුගාමීවන පරිදි සකස් කළ උපායමාර්ගික අරමුණු ඉටු කරගැනීමට ප්‍රමාණවත් ප්‍රාග්ධන ආවරණ රඳවා ගැනීමත් නියාමන අවශ්‍යතා වලට සරිලන පරිදි ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමත් බැංකුවට අවශ්‍ය වේ.

නියාමන ප්‍රාග්ධනය →

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකාබද්ධ හා කේවල පදනම මත නියාමන අවශ්‍යතා පැනවීමද අධීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි. බාසල් III මාර්ගෝපදේශ අවලංගු කිරීමෙන් අනතුරුව 2017 ජූලි 01 දින සිට බල පැවැත්වෙන පරිදි නියාමන ප්‍රාග්ධනය හා කිසියම් අමතර අවදානම් ආවරණය පිණිස බාසල් III නියාමනවල ප්‍රතිපාදන හා බැංකුව අනුකූල විය යුතුය. 2017 මැද භාගයේ සිට අරඹා 2019 වන විට විසම පදනම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත බාසල් III ප්‍රාග්ධන නියාමන, බාසල් II යටතේ හඳුන්වා දුන් උපස්ථම්භන ත්‍රිත්වය මත එනම්, අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය සහ වෙළඳපොළ විනයානුකූලබව යන ස්ථම්භ මත පදනම්ව අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

51. ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව) (සම්බන්ධයි) →

බැංකුව විසින් අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණකරණ ප්‍රවේශය ද වෙළඳපොළ අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණකරණ ඕනුම් ප්‍රවේශයද මෙහෙයුම් ණය අවදානම සම්බන්ධයෙන් මූලික දර්ශක ප්‍රවේශය ද දැනට භාවිත කරනු ලබයි. පොදු හිමිකම් ප්‍රාග්ධනය ප්‍රතිනිර්වචනය කිරීම තුළින් සහ ප්‍රාග්ධන සංරක්ෂණ අවරෝධකය සහ දේශීය ක්‍රමික වැදගත් බැංකු මත ප්‍රාග්ධන අධිභාර ආදී නව ප්‍රාග්ධන අවරෝධක හඳුන්වාදීම තුළින් ප්‍රාග්ධනයෙහි ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව විශේෂයෙන්ම හර ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා බාසල් III මගින් අවධාරණය කෙරෙයි. ශ්‍රී ලංකා මහ බැංකු බාසල් III නියාමනය අනුව 2019 වන විට සියලුම දේශීය ක්‍රමික වැදගත් බැංකු 14% ක අවම සමස්ත ප්‍රාග්ධන අනුපාතයක් පවත්වාගෙන යාම අවශ්‍ය වෙයි.

නියාමන ප්‍රාග්ධනය, ස්ථර I ප්‍රාග්ධනය සහ ස්ථර II ප්‍රාග්ධනය යන ද්විත්වයෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා වලට බැංකුව හා සමූහ සැම විටම අනුකූල වී ඇත.

නියාමන ප්‍රාග්ධන අනුපාතය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2017** බාසල් III	2016 බාසල් III	**2017** බාසල් III	2016 බාසල් III
පොදු හිමිකම් ස්ථර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 6.25%)	**11.93**	11.31	**12.65**	12.03
ස්ථර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 2017 – 7.75%)	**11.93**	11.31	**12.65**	12.03
සමස්ථ ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 2017 – 11.75%)	**15.31**	13.86	**16.00**	14.54

අතිරේක තොරතුරු

නිමැවුම් හා සේවාවන් – 372

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) – 376

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) – 378

2016 අංක 01 දරන බැංකු පනතේ නියෝගයෙහි III උපලේඛන ප්‍රකාර බාසල් III හෙළිදරව් කිරීම් – 379

අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් – 392

සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2008-2017 – 397

තැන්පතු විශ්ලේෂණය – 399

ගෝලීය වාර්තාකරණ මුලපිරීම් දර්ශකය (GRI) – 400

අනුරූප බැංකු – 404

විදේශ විනිමය හුවමාරු සමාගම් – 405

යුරෝජයිරෝ සාමාජිකත්වය – 407

මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව – 408

ආයතනික තොරතුරු – 412

GRI 102-2

නිමැවුම් හා සේවාවන්

1. තැන්පතු නිමැවුම් කළඹ

ඉතිරිකිරීමේ නිමැවුම්

සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම

වයස අවුරුදු 7ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට රුපියල් 100/- ක අවම මූලික තැන්පතුවකින් සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමක් ඇරඹිය හැකිය. ගිණුම් හිමියන් හට ඕනෑම ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛාවකින් හෝ කෙටිපණිවිඩ බැංකුකරණය හෝ අන්තර්ජාල බැංකුකරණය හරහා මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීමේ පහසුකම ඇත.

“හපන්’ ළමා ඉතිරිකිරීමේ ගිණුම

වයස අවුරුදු 8 ත් 16 ත් අතර ළමුන් සඳහා හා වයස අවුරුදු 1 ත් 7 ත් අතර සිඟිත්තන් සඳහා සැලසුම් කරන ලද ළමා ඉතිරිකිරීමේ ගිණුම් දෙවර්ගයකි. “හපන් ගිණුම” හා “පුංචි හපන් ගිණුම”. මෙම ගිණුම් දෙවර්ගය උදෙසාම සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමකට හිමිවන පොළියට වඩා 1% ක පොළී අනුපාතිකයක් හිමිවේ.

“ඉතුරුමිතුරු” ඉතිරිකිරීමේ ගිණුම

යොවුන් පරපුර ඉතිරිකිරීමට දිරිමත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුමක් වන මෙම ගිණුම මගින් වයස අවුරුදු 16 ත් 30 ත් අතර යෞවන යෞවනියන් හට සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම්වලට හිමි පොළියට වඩා 0.5% ක වැඩිපුර පොළියක් හිමිවේ. “ඉතුරුමිතුරු” ගිණුම් හිමියන්ට වයස අවුරුදු 35 වනතෙක් මෙම ගිණුම ඔස්සේ ඉහළ පොළී අනුපාතයක් භුක්ති විඳිය හැකිය.

“ස්ත්‍රී” ඉතිරිකිරීමේ ගිණුම

වයස අවුරුදු 16 න් ඉහළ සමාජයේ විවිධ භූමිකාවන් නිරූපනය කරන කාන්තාවන්ට සිය ජීවිතයේ විවිධ ජයග්‍රහණයන් සැමරීම සඳහා මෙන්ම යහපත් හෙට දිනක් උදෙසා ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා අත්වැලක් සැපයීම අරමුණු කරගෙන වැඩි වරප්‍රසාද පෙරදැරිව “ස්ත්‍රී” ඉතිරිකිරීමේ ගිණුම සැලසුම් කර ඇත. මෙම ගිණුම් හිමියන්හට බැංකුවෙන් 1% පොළී අනුපාතික අඩුවීමක් යටතේ රන් සහන ණය ලබාගැනීමේ හැකියාව ඇත. එමෙන්ම මේ වන විට මෙම සහනය දිරිය ස්ත්‍රී ණය ලෙස හඳුන්වනු ලබන අතර, මෙම සහනය තවදුරටත් පුළුල් කරමින් ඉකෝ/පෞද්ගලික/බුද්ධි ණය සඳහා ද පිරිනමනු ලබයි.

“එන්.එස්.බී. පෙන්ෂන් ප්ලස්” ගිණුම

“එන්.එස්.බී. පෙන්ෂන් ප්ලස්” ගිණුම වූකලී එකවර මුදලක් ආයෝජනය කිරීමෙන් හෝ නිශ්චිත කාලසීමාවක් මුළුල්ලේ තෝරාගත් අගයක් ආයෝජනය කිරීම මගින් පවත්වා ගතහැකි දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයකි. රුපියල් 100,000/- ක අවම ශේෂයක් සහිත ගිණුම් හිමියන්ට මේ ඔස්සේ වයස අවුරුදු 55 දී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ භුක්ති විඳීමේ අවස්ථාව උදාවේ.

“හැපී” ඉතිරිකිරීමේ ගිණුම

“හැපී” ඉතිරිකිරීමේ ගිණුමක් හිමි ඔබට වැඩියෙන් ඉතිරි කරමින් 7% ක උපරිමය දක්වාවූ ඉහළ පොළී අනුපාතික ලබාගත හැකි වන අතර, මුදල් ආපසු ගැනීමේදී කිසිදු සීමාවක් නොපැනවේ. රුපියල් 1000/- ක අවම ආරම්භක තැන්පතුවකින් වයස අවුරුදු 16 වැඩි ඕනෑම පුද්ගලයෙකුට මෙම ගිණුම ආරම්භ කළ හැකිය.

“ස්මයිල්” ඉතිරිකිරීමේ ගිණුම

වයස අවුරුදු 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට තනි පුද්ගල ගිණුම් වශයෙන් හෝ බද්ධ ගිණුමක් ලෙස මෙම ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකිය. රුපියල් 100/- ක අවම තැන්පතුවකින් ආරම්භ කළ හැකි මෙම ගිණුමේ මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම දිවයින පුරා පිහිටි ඕනෑම ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛාවකින් හෝ තැපැල් කාර්යාලයකින්/උප තැපැල් කාර්යාලයකින් සිදු කළ හැකිය.

“පස් අවුරුදු” ඉතිරිකිරීමේ ගිණුම

මෙය දීර්ඝකාලීන ඉතුරුම් සැලසුමක් ප්‍රිය කරන ඕනෑම වයස් කාණ්ඩයක ගනුදෙනුකරුවන් සඳහා විවෘත, ඉහළ පොළී අනුපාතික රැගත් ජාතික ඉතිරිකිරීමේ බැංකු ඉතුරුම් ගිණුම් ක්‍රමයකි. රුපියල් 100/-, රුපියල් 200/-, රුපියල් 300/-, රුපියල් 400/-, රුපියල් 500/-, හෝ රුපියල් 1,000/-, හෝ ගුණාකාරවලින් විවෘත කර මාස 60 ක් පුරාවට මාසිකව එම මුදල් ප්‍රමාණය තැන්පත් කරමින් ගිණුම මෙහෙයවිය යුතු වේ. මෙම තැන්පතු මුදල අදාළ මාසය තුළ ඔබට පහසු ඕනෑම දිනයකදී ගිණුමෙහි තැන්පත් කළ හැකිය.

කාලීන තැන්පතු

නිශ්චිත කාලසීමාවක් තුළ නිශ්චිත පොළී අනුපාතික යටතේ පොළී උපයාගත හැකි කාලීන තැන්පතු පවත්වාගෙන යාමේ අවස්ථාව බැංකුව වෙතින් හිමිවන අතර, කල්පිරීමට ප්‍රථම අවශ්‍ය අවස්ථාවලදී අදාළ පොළී අනුපාතික යටතේ ස්ථාවර තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාවද තිබේ. මෙම තැන්පතු ත්‍රෛමාසික හා පස් අවුරුදු තෙක් කාලසීමා යටතේ ආයතනික, විවිධ සමිති සමාගම් ජ්‍යෙෂ්ඨ පුරවැසි හා ළමා යන කාණ්ඩ වෙනුවෙන් ආරම්භ කළ හැකිය.

එන්එස්බී ස්ථාවර තැන්පතු

වයස අවුරුදු 16 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට තනි පුද්ගල/බද්ධ ගිණුම් වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කළ හැකි අතර, දෙමාපියන්ට සහ භාරකරුවන් හට වයස අවුරුදු 16 ට වඩා අඩු දරුවන් වෙනුවෙන් ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකිය. මාස 12 ක කාලසීමාවක් සඳහා අදාළ ස්ථාවර තැන්පතුවක අවම ආරම්භක ශේෂය රුපියල් 1,000/- කි. මාසික පොළියක් උපයා ගැනීම සඳහා අවශ්‍ය අවම

තැන්පතුව රුපියල් 25,000/- කි. ඊට අමතරව මාස 3, 6, 12, 24, 36 හෝ 60 සඳහා ස්ථාවර තැන්පතු ආරම්භ කළ හැකිය. එමෙන්ම ඔබට ස්ථාවර තැන්පතු ශේෂය මත ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව ද ඇත.

ගෞරව ස්ථාවර තැන්පතු

අවුරුදු 55 ට වැඩි ඕනෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු හට ගෞරව ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කළ හැකි අතර එමගින් බැංකුවේ සාමාන්‍ය ස්ථාවර තැන්පතුවලට වඩා 0.5% ක වැඩිපුර පොළියක් ඔවුන්ට හිමි වේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු හට රුපියල් 25,000/- ක අවම තැන්පතුවකින් ගෞරව ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ හැකි අතර, උපරිම තැන්පතු සීමාව රුපියල් මිලියන 20 කි.

ප්‍රාර්ථනා ළමා ඉතුරුම් සහතිකපත්

මෙය දරුවන් වෙනුවෙන් වෙන්වුණු, සහතික පත්‍රය මිලදී ගන්නා දිනයේම පොළී හිමිවන, ආකර්ෂණීය පොළී අනුපාතික සහිත දිගුකාලීන තැන්පතු ක්‍රමයකි. දරුවාගේ වයස අවුරුදු 16 දී ප්‍රාර්ථනා සහතික පත්‍රය කල්පිරේ.

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර ගිණුම

මෙය වයස අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නියමිත ස්ථාවර තැන්පතු ගිණුමක් වන අතර, තැන්පත් කළහැකි උපරිම මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1.5 වන අතර, තැන්පතු හිමියෙකු හට ගිණුම කල්පිරීමේදී 15% ක පොළී අනුපාතිකයක් යටතේ පොළී හිමිවේ.

විදේශ මුදල් ඉතිරිකිරීමේ ගිණුම්/කාලීන තැන්පතු

බැංකුව මගින් අනේවාසික ශ්‍රී ලාංකිකයින් සඳහා මෙන්ම නේවාසික ශ්‍රී ලාංකිකයින් උදෙසා ද විදේශ මුදල් ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාමේ පහසුකම් සලසනු ලබයි. විදේශයක රැකියාවක නියුතු ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට හෝ විදේශ මුදල් අතැති හෝ විදේශ මුදල් ප්‍රේෂණ ලබන ඕනෑම නේවාසික පුරවැසියෙකු හට මෙම ගිණුමක් විවෘත කළ හැකිය. ආමුඛ ආයෝජන ගිණුම් ආයෝජන අරමුණු උදෙසා විවෘත කළ හැකි වේ.

2. ණය කළඹ

පාරිභෝගික ණය

නිවාස හා දේපල ණය

නව නිවාසයක් මිලදී ගැනීම, නිවාස අලුත්වැඩියාව, නිවාස ඉදිකිරීම හෝ නව නිවසක් ඉදිකිරීමේ පරමාර්ථයෙන් ඉඩමක් මිලදී ගැනීමට හෝ වෙනත් පිළිගත් මූල්‍ය ආයතනයකින් ගත් නිවාස ණයක් පියවීම යනාදී අරමුණු සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණය ලබාගත හැකිය. විවිධ ගනුදෙනුකාර කාණ්ඩවලට ලබාගත හැකි නිවාස ණය නිමැවුම් පහත පරිදි වේ:

- ගේ දොර
- අලංකාර
- රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ණය
- සොඳුරු පියස - අඩු ආදායම්ලාභී සමූහය සඳහා

පුද්ගලික ණය

පාරිභෝගික භාණ්ඩ, සෞඛ්‍ය සේවා, විදේශ සංචාර, සූර්ය කෝෂ හා අධ්‍යාපන කටයුතු උදෙසා පුද්ගලික ණය පහසුකම් බැංකුව වෙතින් ගනුදෙනුකරුවන්ට සැලසෙයි. මෙහිදී ස්ථාවර දේපල ඇප වශයෙන් සලකා හෝ ජීවිත රක්ෂණාවරණයට යටත් ගනුදෙනුකරුගේ ජීවිත රක්ෂණ වටිනාකම හෝ ගනුදෙනුකරුට අයත් රාජ්‍ය සුරැකුම්පත් සුරැකුම් ලෙස සලකා කටයුතු කරනු ලබයි. තවද මෙම ණය මුදල් පුද්ගල ඇප මතද පිරිනමනු ලබයි. පුද්ගල ණය මුදලෙහි ප්‍රමාණය හා ආපසු ගෙවිය යුතු වන කාලසීමාව සුරැකුම හා ණයකරු මත තීරණය වෙයි. විවිධ පුද්ගලික ණය වර්ග පහත පරිදි වේ:

- සාමාන්‍ය පුද්ගලික ණය
- බුද්ධි ණය
- විශේෂ විශ්‍රාමික ණය
- චාරිකා ණය
- ඉකෝ ණය

එන්.එස්.බී. ඔටෝ ලෝන්

ලියාපදිංචි නොකළ නව වාහන සඳහාද, ලියාපදිංචි කළ වාහන සඳහාද ඔටෝ ලෝන් වාහන ණය ලබාගත හැකිය. දැනට ලබාගෙන ඇති ණය මුදලක් පියවීම සඳහාද මේ යටතේ ණය ලබාගත හැකි අතර, ණය අයදුම්පත ඉදිරිපත් කර දින දෙක තුනක් ඇතුළත ණය මුදල ලබාගත හැකිය.

තැන්පතු මත ණය – කඩිනම් ණය

ගිණුම් හිමියන්ට ඔවුන්ගේ තැන්පතු වලට එරෙහිව මෙම ණය මුදල් ලබාගත හැක. බැංකුව විසින් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සුරැකුම් වශයෙන් රඳවාගෙන එම තැන්පතු වලින් 90% ක් දක්වා ණය මුදල් ලබා දෙනු ලබයි.

එන්.එස්.බී. ඉකෝ ලෝන්

මෙම ණය සූර්ය විදුලිබල උත්පාදන උපකරණ සවිකිරීම සඳහා ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට පහසුකම් සැපයීම සඳහා නිර්මාණය කර ඇත. මෙමගින් ඔවුන්ට එකම විදුලි බිල ඉතිරි කරගත හැකි අතරම, පරිසර හිතකාමීද විය හැක.

රන් සහන උකස් ණය සේවය

පාරිභෝගිකයන්හට මේ පහසුකම යටතේ බැංකුව වෙතින් සාපේක්ෂව අඩු පොළී අනුපාතයක් යටතේ රන් සුරැකුම් මත ක්ෂණික ණය ලබාගත හැකිය. රන් භාණ්ඩ පරීක්ෂාව පූර්ණ ස්වයංක්‍රිය උපකරණ ආශ්‍රයෙන් සිදු කරනු ලබයි. උකස් රන් භාණ්ඩ සඳහා කොටස් වශයෙන් ද ගෙවීම් සිදුකළ හැකිය.

ආයතනික ණය

